කළ යුත්තේ කුමක්ද?

වී. අයි. ලෙනින්

https://liberationbase.wordpress.com

අනුවාදය: උ. මු. අබයරත්න

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: කළ යුත්තේ කුමක්ද?
කතෘ/පරිවර්තක: වී. අයි. ලෙනින්/ උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2011-11-06
ඩිජිටල් සංස්කරණයන්: V1:2011-11-06, V2:2019-05-30
පිටු ගණන: 279
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Email: slradical@ymail.com

© සිංහල අනුවාදය, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්. 1977.

පටුන

ප්‍රකාශකයින්ගෙන් වචනයක් 5
පෙරවදන 11

I පොතේගුරුවාදය සහ 'විවේචනය කිරීමේ නිදහස' 15
අ) 'විවේචනය කිරීමේ නිදහස' යන්නෙහි අර්ථය කුමක්ද? 15
ආ) 'විවේචනය කිරීමේ නිදහස' ගැන කියන අළුත් පක්ෂවාදීහු 20
ඇ) රුසියාවෙහි විවේචනය 26
ඈ) න්‍යායික අරගලයේ වැදගත්කම ගැන එංගල්ස්ගෙන් 34

II පොදු ජනතාවගේ සාංසිද්ධිකතාවය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විඥානය 40
අ) සාංසිද්ධික උත්සන්නියේ ආරම්භය 41
ආ) සාංසිද්ධිකතාවයට නමස්කාර කිරීම. "රබෝචය මිස්ල්" 46
ඇ) "ස්වයං විමුක්ති කණ්ඩායම" සහ "රබෝචිය දියල්" පත්‍රය 57

III වෘත්තීය සමිතිවාදී දේශපාලනය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය 70
අ) දේශපාලන උද්ඝෝෂණය හා ආර්ථිකවාදීන් විසින් එය සීමා කරනු ලැබීම 71
ආ) මර්තිනව් ප්ලෙහානව්ගේ අරුත්සරුබව වැඩි කළ හැටි 83
ඇ) දේශපාලන හෙ කිරීම සහ වි ක්‍රියාකාරිත්වයෙහි ළුහුණු වීම . .
ඈ) ආර්ථිකවාදය හා ත්‍රස්තවාදය අතර ඇති පොදු දෙය

කුමක්ද? 94
ඉ) කම්කරු පංතිය — ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පෙරමුණු සටන් කරු වශයෙන් 99
ඊ) නැවතත් ‘අපවාද කාරයෝ’, නැවතත් ‘ව්‍යාකූල කරන්නෝ’ 118

IV ආර්ථිකවාදීන්ගේ පැරණි තාලය හා විප්ලවවාදීන්ගේ සංවිධානය 122

අ) පැරණි තාලය යනු කුමක්ද? 123
ආ) පැරණි තාලය හා ආර්ථිකවාදය 127
ඇ) කම්කරුවන්ගේ සංවිධානය සහ විප්ලවවාදීන්ගේ සංවිධානය 136
ඈ) සංවිධාන කටයුතුවල විෂය ප්‍රමාණය 154
ඉ) ‘රහස් කුමණ්ත්‍රනකාරී’ සංවිධානය සහ ‘ප්‍රජාතන්ත්‍රවාදය’ 162
ඊ) ප්‍රාදේශීය සහ සමස්ත රුසියානු වැඩ 172

V සමස්ත රුසියානු දේශපාලන ප්‍රවෘත්ති පත්‍රයක් සඳහා ‘සැලැස්ම’ 184

අ) “පටන් ගත යුත්තේ කොතැනින්ද?” යන ලිපියෙන් අමනාප වූයේ කවුද? 185
ආ) ප්‍රවෘත්ති පත්‍රයකට සාමූහික සංවිධායකයෙක් විය හැකිද? 192
ඇ) අපට අවශ්‍ය කුමන වර්ගයේ සංවිධානයක්ද? 206

අවසානය 214

පරිශිෂ්ටය. “ඉස්ක්‍රා” පත්‍රය “රබෝචිය දියල” පත්‍රය හා සමග එක්සත් කිරීමේ පරිශ්‍රමය 218

* “කළ යුත්තේ කුමක්ද?” නිදෙස් කිරීම් 227

සටහන් 229
නාමාවලිය 265

ගමයේ කොමියුනි[illegible] පක්ෂයේ මධ්‍යම කාරක මාක්ස්වාදය-ලෙනින්[illegible]දය පිළිබඳ විද්‍යායතනය නෑකාව තරු සටහනින් පෙන්වා ඇත.

ප්‍රකාශකයින්ගෙන් වචනයක්

වී. අයි. ලෙනින්ගේ “කළ යුත්තේ කුමක්ද? අප ව්‍යාපාරයේ දැවෙන ප්‍රශ්න” නැමැති කෘතිය ලියන ලද්දේ 1901 සරත් සමය හා 1902 පෙබරවාරි අතර කාලය තුළදීය.

එම කාලයේදී රුසියාවෙහි විප්ලවවාදී අර්බුද තව දුරටත් උග්‍රවීම හා තියුණුවීම සිදුවිය; සර්වබලධාරී ඒකාධිපති-රදළවාදී ක්‍රමයට විරුද්ධව විප්ලවවාදී ව්‍යාපාරය වඩාත් පුළුල් ස්වරූපයක් ගත්තේය. පිටර්ස්බර්ග්, යෙකතිරිනොස්ලාව්, රස්තෝව්-නා-දෙනු බතූම් යන නගරවල 1902 පෙබරවාරි — මාර්තු වල සිදු වූ කම්කරුවන්ගේ පෙළපාලි හා වැඩ නැවැත්වීම්ද, සරාතව්, වීල්නො, බකූ, නිෂ්නි නොව්ගරද්, හා වෙනත් නගරවල පැවැත්වූ මැයිදින පෙළපාලිද කම්කරු පංතියේ පිබිදී එන සටන්කාමීත්වය සහ දේශපාලනමය පැසුණු බුද්ධිය පෙන්නුම් කරන පැහැදිලි සාක්ෂි විය. ඉඩම් හිමියන්ට විරුද්ධව ගොවියෝද කැරලි ගැසූහ. රුසියාවේ බොහෝ පලාත් ගොවි කැළඹීම්වලින් ග්‍රහණ විය. “පීඩනයට විරුද්ධව අරගලයේදී මියයාම අරගලයකින් තොරව නිරාහාව මියයෑමට වඩා උතුම්යයි ගොවියෝ තීරණය කළහ. ඔවුන්ගේ තීරණය ඉතාමත්ම නිවැරැදිය” (වී.අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, 7 වැනි වෙළුම, 195 වැනි පිටුව).

මෙම අවස්ථාවේදී රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ විප්ලවවාදී කොටසෙහි දෘෂ්ටිමය හා සංවිධානාත්මක සමගිය සඳහාද, අවස්ථාවාදයට විරොධීවූද, ප්‍රතිකණ්ඩායම් හා කවවලින් නිදහස් නවතම පක්ෂයක් — කම්කරු පංතියේ දේශපාලන මාර්ගෝපදේශකයා ද, සර්වබලධාරී ඒකාධිපතිවාදය හා ධනවාදයට විරුද්ධ අරගලයේ සංවිධායකයා හා නායකයාද වන පක්ෂයක් — නිර්මාණය කිරීම් සඳහාද ලෙනින්වාදී “ඉස්ක්‍රා” පත්‍රය ගෙන ගිය සටන අති මහත් වැදගත්කමක් ඉසිලීය.

1902 මාර්තු මස මුද්‍රණයෙන් පිටවූ වී.අයි. ලෙනින්ගේ ‘‘කළ යුත්තේ කුමක්ද?’’ කෘතිය මාක්ස්වාදී කම්කරු පක්ෂයක් ගොඩනැගීමේ සටනේදී ශ්‍රෙෂ්ඨ කාර්යභාරයක් ඉටුකළේය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු විප්ලවවාදී මාක්ස්වාදය පිළිබඳ එම ශ්‍රෙෂ්ඨතම කෘතියෙහි තම ක්ෂණික ප්‍රශ්නවලට: එනම්, කම්කරු ව්‍යාපාරයේ විඥාණාත්මක කොටස්වල හා සාංසිද්ධික කොටස්වල සම්බන්ධතාවය පිළිබඳවද, උග්‍රවී ඇති ධනපති-ප්‍රජාතන්ත්‍රික විප්ලවය තුළ රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කාර්යභාරය පිළිබඳවද, සටන්කාමී විප්ලවවාදී නිර්ධන පංතික පක්ෂයක් නිර්මාණය කිරීමේ සංවිධානාත්මක විධි, මාර්ග හා ක්‍රම පිළිබඳවද පිළිතුරු සොයාගත්හ.

‘‘කළ යුත්තේ කුමක්ද?’’ පොත රුසියාවේ පැවති ජාත්‍යන්තර අවස්ථාවාදයේ (බර්න්ෂ්ටයින්වාදයේ) එක් විවිධත්වයක් ලෙස ලෙනින් විසින් සලකන ලද ‘ආර්ථිකවාදය’ට දෘෂ්ටිමය පරාජයක් ගෙන දුන්නේය. ලෙනින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර ඇති අවස්ථාවාදී මූලයන් පැහැදිලි කළේය: එනම්, කම්කරු පංතිය කෙරෙහි ඇති ධනපති පංතියේ හා ධනවාදී දෘෂ්ටියේ බලපෑම, කම්කරු ව්‍යාපාරයේ සාංසිද්ධිකතාව ඉදිරිපිට වන්දනාමාන කිරීම හා කම්කරු ව්‍යාපාරය තුළ සමාජවාදී විඥාණය පහත්කොට සැලකීම ය.

නිර්ධන පංතියේ සමාජවාදී දෘෂ්ටිය සහ ධනවාදී දෘෂ්ටිය අතර අඛණ්ඩ හා කිසි දිනෙක එකඟ නොවන අරගලයක් පවතින බව ලෙනින් පෙන්නුම් කළේය: ‘‘...තෝරා ගැනීමට තිබෙන්නේ එක්කෝ ධනෙශ්වර නැතහොත් සමාජවාදී දෘෂ්ටිය යන දෙකෙන් එකක් පමණකි. මැද මාර්ගයක් නොමැත... එහෙයින් කුමන හෝ ආකාරයකින්වත් සමාජවාදී දෘෂ්ටිය ලඝු කොට දැක්වීම හෝ ලේශමාත්‍ර වශයෙන් හෝ ඉන් ඉවතට හැරීම යනුවෙන් අදහස් වන්නේ ධනේශ්වර දෘෂ්ටිය ශක්තිමත් කිරීමයි’’ (පිටු 53—54). සමාජවාදී විඥාණය ඇතිවන්නේ කම්කරු ව්‍යාපාරයේ සාංසිද්ධිතාවයෙන් නොවන බවත්, එය කම්කරු ව්‍යාපාරය තුළට ගෙන එනු ලබන්නේ විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයක් විසින් බවත් ලෙනින් පැහැදිලි කළේය. නිර්ධන පංතික පක්ෂයක් සතු වැදගත් කර්තව්‍ය වන්නේ අවස්ථාවාදීන්ට — කම්කරු ව්‍යාපාරය තුළ ධනවාදී දෘෂ්ටිය බදගත්තවුන් හා පතුරුවා හරින්නන්ට — විරුද්ධවද, සමාජවාදී දෘෂ්ටියේ පිරිසුදුභාවය සඳහාද සටන් කිරීමය.

කම්කරු ව්‍යාපාරය සඳහාද, කම්කරු පංතියේ විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයේ සියළුම ක්‍රියාකාරිත්වයන් සඳහාද විද්‍යාත්මක සමාජවාදී න්‍යායයේ ඇති ශ්‍රෙෂ්ඨ වැදගත්කම ලෙනින් විවෘත කළේය: ‘‘...පෙරමුණු සටන්කරු කාර්යභාරය ඉටුකිරීමෙහි සමත් වන්නේ ඉතාමත් දියුණු න්‍යායෙන් මග පෙන්වීම ලබන පක්ෂය පමණක්ය’’ (පිටුව 37). රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයෙහි වර්ධනයේ ඓතිහාසික විශේෂතාවය හා එය ඉදිරිපිට ඇති විප්ලවවාදී කර්තව්‍යයන් සලකා බලන කල ඉතාමත් දියුණු න්‍යායක වැදගත්කම රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සඳහා විශේෂයෙන්ම බලපාන බව ලෙනින් සඳහන් කළේය.

රුසියානු නිර්ධන පංතියේ සහ ඔවුන්ගේ පක්ෂයේ උපක්‍රමවලට අඩිතාලම් දැමීම කෙරෙහි ‘‘කළ යුත්තේ කුමක්ද?’’ කෘතියෙහි දැඩි සැලකිල්ල යොමුකර ඇත. සර්වබලධාරී ඒකාධිපති-රදළවාදී ක්‍රමයට විරුද්ධ බහුජන ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරයේ නායකත්වය කම්කරු පංතිය ගතයුතු බවත්, ඔවුන්ට එය ගත හැකි බවත් රුසියානු සමාජයේ සියළුම විප්ලවවාදී හා විරුද්ධවාදී බලවේගයන්ගේ පෙරමුණු බල ඇණිය බවට ඔවුන් පත්විය යුතු බවත් ලෙනින් ලීවේය. එම නිසා සර්වබලධාරී ඒකාධිපතිවාදය පිළිබඳ සකලවිධ දේශපාලන හෙළිදරව් කිරීම් සංවිධානය කිරීම රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් කර්තව්‍යයක් වූ අතර එය නිර්ධන පංතිය හැඩගැස්වීමේ තත්වයන්ගෙන් එක් වැදගත් අංගයක්ද විය. එය රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ වූ දැවෙන ප්‍රශ්නවලින් එකකි. ‘ආර්ථිකවාදීහු’ නිර්ධන පංතියේ පංති අරගලය කෙරෙහි වැරදි හා විනාශකාරී දෘෂ්ටියක් අනුගමනය කරමින් එහි ක්ෂේත්‍රය ආර්ථික හා වෘත්තීය අරගලයට සීමා කළහ. එම වෘත්තීය සමිතිවාදී දේශපාලනය, නොවැලැක්විය හැකි ලෙස, කම්කරු ව්‍යාපාරය ධනවාදී දෘෂ්ටියට හා ධනවාදී දේශපාලනයට යටත්වීම කරා මෙහෙයවීය. ලෙනින්, එම අවස්ථාවාදී ප්‍රතිපත්තියට විරුද්ධව, සමාජවාදය සඳහා නිර්ධන පංතික සටන තුළද, සමාජයේ සංවර්ධනය තුළද නිර්ධන පංතික අරගලයේ මූලික වැදගත්කම පිළිබඳ ශ්‍රෙෂ්ඨ මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටියට පදනම් දමා ඉදිරිපත් කළේය. ‘‘...පංතිවලට ඉතාමත් අවශ්‍ය හා තීරණාත්මක උවමනාවන් ඉටු කළ හැක්කේ පොදු දේශපාලන වෙනස් කිරීම් මගින් පමණක් වන හෙයිනි. විශේෂයෙන්ම නිර්ධන පංතියේ මූලික ආර්ථික උවමනාවන් ඉටු කළ හැක්කේ, ධනේශ්වර පංතියේ ඒකාධිපතිත්වය වෙනුවට නිර්ධන පංති ඒකාධිපතිත්වයක් පිහිටුවන දේශපාලන විප්ලවයක් මගින් පමණකි. (පිටු 61)

නිර්ධන පංතියේ සංවිධානාත්මක කර්තව්‍යයේ ක්ෂේත්‍රය තුළ පවතින සාංසිද්ධිකතාවය ඉදිරිපිට ‘ආර්ථිකවාදීන්ගේ’ වන්දනාමාන කිරීමද, පක්ෂය ගොඩනැගීමේ කාර්යයේදී ඔවුන්ගේ ‘‘ආධුනිකභාවය ද නිසා

රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට මහත් විනාශයක් සිදු විය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍යයන් වෘත්තීය සමිතිවාදය දක්වා පහත හෙළීම තුළත්, කම්කරු පංතියේ සංවිධාන මෝස්තර දෙකක් එකට සංකලනය කිරීම: එනම්, කම්කරුවන්ගේ ආර්ථික අරගලය සංවිධානය කිරීම සඳහා වෘත්තීය සංගම් හා කම්කරු පංතියේ පංතිමය සංවිධානයේ උසස්තම ආකාරය වශයෙන් දේශපාලන පක්ෂය සංකලනය කිරීම තුළත්, 'ආර්ථිකවාදීන්'ගේ ආධුනිකත්වය ලෙනින් දුටුවේය. එසේම රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ප්‍රථම සහ ඉතාමත්ම වැදගත් කර්තව්‍ය වන්නේ විප්ලවවාදීන්ගේ සමස්ත රුසියානු මධ්‍යගත සංවිධානයක් බිහිකිරීම, එනම්, බහුජනතාව සමග අඛණ්ඩ සම්බන්ධකම් පවත්වන, කම්කරු පංතියේ විප්ලවකාරී අරගලයට නායකත්වය දිය හැකි දේශපාලන පක්ෂයක් බිහිකිරීම බව ලෙනින් සැලකුවේය. එවැනි සංවිධානයක් නිර්මාණය කිරීම අරම්භ කළ යුත්තේ කෙසේද, කුමන මගක් ගත යුතුද යන්න ලෙනින්, ''කළ යුත්තේ කුමක්ද?'' කෘතියෙන් විස්තරාත්මක ලෙස පැහැදිලි කළේය.

''...පක්ෂ අරගලවලින් පක්ෂයට ශක්තිය යහ ජීවන බලය ලැබේ; පක්ෂයේ දුර්වලකම දක්වන බලවත්ම සාක්ෂිය එහි ලිහිල් විසුරුණු ස්වභාවය හා සීමා සටහන් නොපැහැදිලි වීමයි; පක්ෂය ශුද්ධ කිරීමෙන් එය වඩාත් ශක්තිමත් වේ...''
(ලසාල් මාක්ස් වෙත යැවූ 1852 ජූනි 24 දින ලිපියෙන්)

කතෘගේ මුල් අරමුණ වූයේ ‘‘පටන් ගත යුත්තේ කොතැනින්ද?’’[2] යන (1901 මැයි, ‘‘ඉස්ක්‍රා’’[3] අංක 4 හි පළ කරන ලද) ලිපියෙන් ප්‍රකාශිත අදහස් මෙම කෘතියෙන් සවිස්තර ලෙස ගෙන හැර දැක්වීමය. එම ලිපියෙන් (සහ බොහෝ පෞද්ගලික විමසීම්වලට හා ලිපිවලට පිළිතුරු වශයෙනුත් යළි) දෙන ලද පොරොන්දුව ඉටු කිරීමෙහි ලා ප්‍රමාද වීම ගැන පාඨකයා වෙත අපගේ කණගාටුව ප්‍රකාශ කළ යුතු වෙමු. මෙම ප්‍රමාදයට එක් හේතුවක් වූයේ පසුගිය (1901) ජූනි මාසයේදී විදේශගත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන සියල්ලම එක්සත් කිරීමට දරන ලද ප්‍රයත්නය යි[4]. එම ප්‍රයත්නය සාර්ථක වීනි නම්, ‘‘ඉස්ක්‍රා’’ පත්‍රයේ සංවිධානය පිළිබඳ වූ අදහස් වෙනත් ආකාරයකින් ඉදිරිපත් කිරීම සිදුවන්නට තිබුණ හෙයින් එහි ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටීම ස්වාභාවික දෙයක් විය. එබඳු යහ සාධනයක් වී නම්, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ ප්‍රවණතාවයන් දෙකක් තිබීමේ තත්වය කෙසේ හෝ ඉතා ඉක්මනින්ම කෙළවර වෙතැයි අපේක්ෂා කළ හැකිව තිබුණි. පාඨකයා දන්නා ලෙසට එම ප්‍රයත්නය අසාර්ථක විය. ‘‘රබෝචිය දියල’’[5] පත්‍රය, එහි අංක 10 කලාපයෙන් ‘ආර්ථිකවාදය’[6]ට නැඹුරු වෙමින් ගත් නව නැම්මෙන් පසුව එම ව්‍යායාමය අසාර්ථක වීම නො වැලැක්විය හැකි වූ බව පෙන්වා දීමට අපි අදහස් කරමු. මෙම ප්‍රවණතාවය නිශ්චිත ස්වභාවයක් නොමැති හා නොපැහැදිලි එකකි; එනිසාම එය දුරලීම වඩාත් අපහසු වන්නේය; එය නොයෙක් ආකාරයේ ස්වරූපයෙන් තහවුරු වීමෙහි සමත්ය. එනිසා ඊට විරුද්ධව අධිෂ්ඨාන සහගත අරගලයක් කිරීමේ එකාන්ත අවශ්‍යතාවය පෙනිනි. මුල් සැලැස්ම වෙනස් කර කෘතිය සැලකිය යුතු ලෙසින් විශාල කරන ලද්දේ එහෙයිනි.

‘‘පටන් ගත යුත්තේ කොතැනින්ද?’’ යන ලිපියෙන් මතුකළ ප්‍රශ්න තුන එහි ප්‍රධාන තේමාව කර ගැනීමට අදහස් කෙරිනි. ඒවා

නම්, අපගේ දේශපාලන උද්ඝෝෂණයේ ස්වභාවය හා එහි ප්‍රධාන වශයෙන් ඇතුලත් කරුණු, අපගේ සංවිධානමය කර්තව්‍යයන්, එක්වර හා නොයෙක් පැතිවලින් සමස්ත රුසියානු සංවිධානයක් ගොඩ නැගීම සඳහා සැලැස්ම යන මේ ප්‍රශ්න වෙති. මේවා කතෘගේ සිත තුළ දීර්ඝ කාලයක් තිස්සේ බල පැවති ප්‍රශ්න වෙති. ''රබෝචය ගසියත''[7] පත්‍රය පුනරුත්ථාපනය කිරීමට දැරුණු අසාර්ථක ප්‍රයත්න අතුරෙන් එකකදී (පස්වන පරිච්ඡේදය බලන්න) එය මගින් මෙම ප්‍රශ්න ඉස්මතු කිරීමට තැත් කරන ලදී. කෘතිය මෙම ප්‍රශ්න තුන පිළිබඳ විශ්ලේෂණයකට සීමා කොට, වාද විවාදවලට නො එළඹ නැතහොත් ඉන් සම්පූර්ණයෙන්ම පාහේ වැලකී, හැකිතාක් දුරට ඒකාන්ත ලෙස අපගේ අදහස් ඉදිරිපත් කිරීමට මුලින් අරමුණු කරගත් නමුත් එසේ කිරීම කිසිසෙත් ප්‍රායෝගික නොවන බව කරුණු දෙකක් හේතු කොට ගෙන ස්ඵුට විය. එක් අතකින් 'ආර්ථිකවාදය' අප සිතුවාට වඩා දුර්වාරණීය බව ඔප්පු වී ඇත (අප 'ආර්ථිකවාදය' යන පාඨය යොදන්නේ 1901 දෙසැම්බර් ''ඉස්ක්‍රා'' පත්‍රයේ අංක 12 කලාපයේ පළ කරන ලද හා එමෙන්ම මෙම කෘතියේ සම්පිණ්ඩනයක් යයි කිව හැකි ''ආර්ථිකවාදයේ ආරක්ෂකයන් සමග සාකච්ඡාවක්'' යන මැයෙන් යුත් ලිපියෙහි පැහැදිලි කර ඇති පරිදි පුළුල් අරුතක් දීමටය). ඉහත සඳහන් ප්‍රශ්න තුන ගැන වූ මත භේද පැහැදිලි කිරීම, විස්තරාත්මක කරුණු පිළිබඳ වෙනස්කම් ඔස්සේ නොව, ඊට වඩා හොඳින් රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ ප්‍රවණතා දෙකෙහි මූලික ප්‍රතිපාක්ෂික භාවය අනුව ඉටු කළ හැකි බව ඉඳුරාම පැහැදිලි විය. අනිත් අතට, ''ඉස්ක්‍රා'' පත්‍රය මගින් අපගේ අදහස් ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීම 'ආර්ථිකවාදීන්'ගේ විමතියට හේතු වීමෙන් ඇත්ත වශයෙන් අප බොහෝ විට භාෂා දෙකකින් කථා කරන බවත්, එනිසා ab ovo* පටන් නොගෙන එකඟත්වයක් ඇති කර ගත නොහැකි බවත්, සියළු 'ආර්ථිකවාදීන්' සමඟ මත භේදයට තුඩු දුන් අපගේ මූලික අදහස් සියල්ලම ක්‍රමාණුකූල ලෙස 'පැහැදිලි කිරීම' පිණිස ප්‍රත්‍යක්ෂ උදාහරණ රැසක් ඉදිරිපත් කරමින් හැකිතාක් සරලතම ශෛලියෙන් උත්සාහයක් දැරිය යුතු බවත් පෙනී ගියේය. 'පැහැදිලි කිරීමට' එවැනි ප්‍රයත්නයක් දැරීමට මම තීරණය කෙළෙමි. එසේ කළේ, එයින් කෘතියෙහි විශාලත්වය බෙහෙවින් වැඩි වන බවත්, එය මුද්‍රණය කිරීම ප්‍රමාද වන බවත් හොඳින් වටහා ගෙන ය. ''පටන් ගත යුත්තේ කොතැනින්ද?'' යන ලිපියෙන් දුන් පොරොන්දුව ඉටු කළ හැකි වෙනත් ගක් නො දුටිමි. ප්‍රමාදය ගැන මෙසේ කණගාටුව පළ කිරීමට අමතරව ෘතියෙහි ඇති බලවත් සාහිත්‍යමය දුර්වලකම් ගැනද කණගාටු වෙමි. ට වැඩ කරන්නට සිදු වූයේ ඉතාමත් ඉක්මන්කාරී ලෙස හා වෙනත් නොයෙක් කර්තව්‍යයන් ඉටු කිරීමට සිදුවීමෙන් ඇති වූ නිරන්තර ාධා මධ්‍යයේ ය.

දැනුදු මෙම කෘතියෙහි ප්‍රධාන තේමාව වන්නේ ඉහත සඳහන් ප්‍රශ්න තුන පිරික්සීමයි. එහෙත් මෙම කටයුත්ත වඩාත් පොදු ස්වභාවයක් ගන්නා ප්‍රශ්න දෙකකින් ආරම්භ කිරීම අවශ්‍ය බව මට අවබෝධ විය. එම ප්‍රශ්න තුන නම්, 'විවේචනය කිරීමේ නිදහස' යන 'අහිංසක' සහ 'ස්වභාවික' උද්‍යෝග පාඨයක් හරියටම යුද්ධාභියෝගයක් ලෙස ගෙන අප කටයුතු කරන්නේ මන්ද යන්න හා සාංසිද්ධික බහුජන ව්‍යාපාරය හා සම්බන්ධයෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට භාර වන කාර්ය කොටස ගැන වූ මූලික ප්‍රශ්නය පිළිබඳව වත් අපට සමථයක් ඇති කර ගත නොහැක්කේ මන්ද යන්නත්ය. එපමණක් නොව, දේශපාලන උද්ඝෝෂණයේ ස්වභාවය සහ හරය පිළිබඳව අපගේ අදහස් විස්තර කර ගෙන යන විට එය වෘත්තීය සමිතිවාදී දේශපාලනය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය අතර ඇති වෙනස විස්තර කිරීමක් බවට පත් විය. තවද, සංවිධානමය කර්තව්‍යයන් පිළිබඳව අපගේ අදහස් විස්තර කිරීමේදී, එය 'ආර්ථිකවාදීන්' සතුටු කරන සුළු ආධුනික ක්‍රමත්, අප කියන පරිදි විප්ලවවාදීන් සංවිධානය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවයත් අතර ඇති වෙනස පැහැදිලි කිරීමක් බවට පත් විය. එපමණක් නොව, සමස්ත රුසියානු දේශපාලන ප්‍රවෘත්ති පත්‍රයක් ඇරඹීමට විරුද්ධව ඉදිරිපත් කරන ලද කරුණු පිළිගත නොහැකි හෙයින්ද, අපට අවශ්‍ය සංවිධානය පිහිටුවීම සඳහා අප සෑම පැත්තෙන්ම එකවර වැඩ කළ යුත්තේ කෙසේද යන්න ගැන ''පටන් ගත යුත්තේ කොතැනින්ද?'' යන ලිපියෙන් මා මතු කළ ප්‍රශ්නයට නියම පිළිතුරක් දී නොමැති හෙයින්ද එවැනි පුවත් පතක් සඳහා වූ 'සැලැස්ම' වඩ වඩාත් බලවත් ලෙස ඉදිරිපත් කරන්නෙමි. අවසාන වශයෙන්, අප හා 'ආර්ථිකවාදීන්' භේද භින්න වීම වැලැක්වීමට හැකි සියල්ලක්ම අප කළ නමුත් එය නො වැලැක්විය හැකි වූ බවත්, ''රබෝචිය දියල'' පත්‍රය 'ආර්ථිකවාදය නිරවුල් ලෙස ඉදිරිපත් නොකළත්, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මුළු මහත් කාල පරිච්ඡේදයකටම අදාළ විශේෂ අංග ලක්ෂණයක් වූ අවුල් සහගත භාවය හා වැනෙනසුලු භාවය එය විසින් අංග සම්පූර්ණ හා සිත් කාවදින ලෙස ඉදිරිපත් කරනු ලැබීම නිසා එම පත්‍රය විශේෂ තත්වයක්, කැමති නම්, 'ඓතිහාසික' යයි කිව හැකි තත්වයක් ගත් බවත්, එනිසාම

---

* මුල සිටම. සංස්කාරක

එය සමග කෙරෙන විවාදය වැඩි විස්තර සහිත යයි බැලූ බැල්මට පෙනෙනු ඇති වුවද, මෙම කාල පරිච්ඡේදයේ කෙළවරක් නොදැක අපට ප්‍රගතියක් නො ලැබිය හැකි හෙයින් එම විවාදය වැදගත් තත්වයක් ගන්නා බවත් කෘතියෙහි අන්තිම කොටසින් පෙන්වා දීමට බලාපොරොත්තු වෙමි.

1902 පෙබරවාරි

එන්. ලෙනින්

I

පොතේගුරුවාදය සහ 'විවේචනය කිරීමේ නිදහස'

අ) 'විවේචනය කිරීමේ නිදහස' යන්නෙහි අර්ථය කුමක්ද?

වත්මන් කල ඉතාමත් හැඩකාර සටන් පාඨය වන්නේත්, සියළුම රටවල සමාජවාදීන් සහ ප්‍රජාතන්ත්‍රවාදීන් අතර කෙරෙන තර්ක විතර්ක වලදී බහුලතම ලෙස භාවිතා වන්නේත් 'විවේචනය කිරීමේ නිදහස' යන උද්‍යෝග පාඨය වන බව නිසැකය. ආරාවුල්කාරී එක් පාර්ශ්වයක් විවේචනය කිරීමේ නිදහස සඳහා උදුරම් ලීලාවෙන් කරන ආයාචනයන්ට වඩා අරුමයක් තවත් නැතැයි බැලූ බැල්මට පෙනී යා හැක. යුරෝපීය රටවල් බහුතරයෙහි විද්‍යාව සහ විද්‍යාත්මක විමර්ශන සඳහා නිදහස ව්‍යවස්ථාගත නීතියෙන් සහතික කර තිබීමට එරෙහිව පුරෝගාමී පක්ෂ තුළ හඬ නැගීමක් සිදුවී තිබේද? හැරුනු, හැරුනු තැන මෙම උද්‍යෝග පාඨය උච්ඡාරණය වනු ඇසූ, එහෙත්, ආරාවුල් කරුවන් අතර පවත්නා අසමථයේ හරය විනිවිද නොදුටු ප්‍රේක්ෂකයාගේ අදහස වනු ඇත්තේ ''මෙහි නම් කිසියම් දෝෂයක් තිබිය යුතුය'' යන්නයි. ''මෙම උද්‍යෝග පාඨය විකට නමක් මෙන් භාවිතයෙන් සුජාත කරණයට පත්වන හා බොහෝ දුරට වර්ගනාම තත්වයට පත්වන පිළිගත් පාඨයන්ගෙන් එකක් වන බව පැහැදිලි ය.''

වර්තමාන ජාත්‍යන්තර* සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුළ

---

* ආනුෂංගික වශයෙන් ගත් කළ, නූතන සමාජවාදය කෙරෙහි දක්නට ලැබෙන මෙම කාරණය නිසා, සමාජවාදය තුළ වන විවිධ ප්‍රවණතාවයන් අතර සිදුවන සට්ඨනය ජාතික තත්වයේ සිට ජාත්‍යන්තර තත්වයට පත්ව ඇති බැවින්, එය සමහරවිට අපූර්ව හා ඊටම ආවේණික ආකාරයකින් අස්වැසුම්ශීලී වන බව කිව හැක. ඉහතදී, ලසාල්වාදීන් හා එයිසෙනාහ්ට්ස්[8] අතරද, ගෙඩ්වාදීන් හා පොසිබිලිස්ට්වරු[9] අතරද,

ප්‍රවණතාවයන් දෙකක් ජනිතව ඇති බව ඇත්ත වශයෙන්ම කිසිවෙකුටත් රහසක් නොවේ. මෙම ප්‍රවණතාවයන් අතර සිදුවන සට්ඨනය වරක් ගිනියම් වී දැල්වෙයි, තවත් වරෙක තුනී වී ගොය් මහ ලොකු 'සමාදන යෝජනා' නැමති අළු යට දැල්වෙමින් පවතී. 'යල්පැනගිය පොතේගුරුවාදී' මාක්ස්වාදය කෙරෙහි විවේචනාත්මක ආකල්පයක් ගන්නා 'නව' ප්‍රවණතාවයෙහි හරය මනා ලෙස පැහැදිලි වනසේ බර්න්ෂ්ටයින් එය ඉදිරිපත් කර ඇත; මිලෙරාන් එය ක්‍රියාත්මක කරන හැටි පෙන්වා දී ඇත.

සමඉා–ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ විප්ලවයේ පක්ෂයක තත්වයෙන් වෙනස් වී සමාජ ප්‍රතිසංස්කරණවල ප්‍රජාතන්ත්‍රික පක්ෂයක් විය යුතුය. බර්න්ෂ්ටයින් ඔහුගේ දේශපාලන ඉල්ලීම හොඳින් ගලපාගත් 'නව' තර්ක රැසකින්ම වටකර සුරක්ෂිත කර තිබේ. සමාජවාදය විද්‍යාත්මක පදනමක් මත පිහිටුවීමටත්, ඉතිහාසය පිළිබඳ වූ භෞතිකවාදී සංකල්පයේ දෘෂ්ටි කෝණය අනුව එහි අවශ්‍යතාවය හා අනිවාරණීය භාවය ප්‍රදර්ශනය කිරීමටත් ඇති හැකියාව ප්‍රතික්ෂේප කෙරිනි. දුප්පත්කම වැඩි වී යාම, නිර්ධන පංති කරණයේ ක්‍රියාදමය හා ධනේශ්වර ප්‍රතිවිරෝධතාවයන් උත්සන්න වීම යන සත්‍යයන් ප්‍රතික්ෂේප කෙරිනි. 'අවසාන අරමුණ' ගැන වූ සංකල්පය පවා ප්‍රතික්ෂේප කෙරිනි. එමෙන්ම, නිර්ධන පංති ආඥාදායකත්වය පිළිබඳ අදහසද මුළුමනින්ම ඉවත දමන ලදී. ලිබරල්වාදය හා සමාජවාදය අතර ප්‍රතිපත්තිමය වශයෙන් පවතින ප්‍රතිපාක්ෂික භාවය ප්‍රතික්ෂේප කරන ලදී. වැඩි දෙනාගේ කැමැත්ත අනුව ආණ්ඩු පාලනය කෙරෙන, ස්ථිර වශයෙන්ම ප්‍රජාතනත්‍රවාදී වන සමාජයක ක්‍රියාත්මක කළ නොහැකියයි කියා පංති අරගලය පිළිබඳ න්‍යාය යනාදිය ප්‍රතික්ෂේප කරන ලදී.

එසේ, විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්වාදයේ සිට තීරණාත්මකව සමාජ-ප්‍රතිසංස්කරණවාදය වෙත හැරෙන්නැයි කරන ඉල්ලීම හා සමාගම්ව, ඊට කිසිසේත් නොදෙවැනි තීරණාත්මක ස්වභාවයකින් සියළුම මූලික මාක්ස්වාදී අදහස්වලට එරෙහි ධනේශ්වර විවේචනයන් වෙතට හැරීමද සිදුවිය. මාක්ස්වාදය ගැන වූ මෙම විවේචනයන් දේශපාලන වේදිකාවෙන්ද, විශ්වවිද්‍යාල මහාචාර්ය අසුන්වලින්ද, පත්‍රිකා මහා රාශියකින්ද, වියත් සංගෘහිත කෘති මාලාවක් මගින්ද දීර්ඝ කාලයක් තිස්සේ මෙහෙයවන ලද හෙයිනුත්, උගත් පංතියේ තරුණ පරපුර දශක ගණනක් තිස්සේම මෙම විවේචනයන්ගෙන් පෝෂණය කර ක්‍රමාණුකූල ලෙස ඇති දැඩි කර සිටින හෙයිනුත් ජුපිටර් දෙවියාගේ හිසෙන් පැන නගින මිනර්වා දෙව්දුව[15] මෙන්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ 'නව විවේචනාත්මක' ප්‍රවණතාවය අංග සම්පූර්ණ ස්වභාවයෙන් මතු වී ඒම විමතියට කරුණක් නොවේ. මෙම නව ප්‍රවණතාවයෙහි අංගෝපාංග වර්ධනය වී සකස්වීමක් අවශ්‍ය වූයේ නැත. ඒවා ගෙඩි පිටින්ම ධනේශ්වර සාහිත්‍යයෙන් ගෙන සමාජවාදී සාහිත්‍යයට මාරු කරන ලදී.

එමතුද නොවේ. බර්න්ෂ්ටයින්ගේ න්‍යායික විවේචන හා දේශපාලන අභිප්‍රායයන් යමෙකුට තවමත් නොපැහැදිලි නම්, 'නව ක්‍රමය' සිත් කාවදින ලෙසට ක්‍රියාත්මක කර දැක්වීමට ප්‍රන්ස ජාතිකයන් උනන්දු වූහ. "පංති අරගලවලදී අන් සෑම දේශයකටම වඩා, සෑම අවස්ථාවකදීම තීරණයක් දක්වා සටන් වදින රට" (මාක්ස්ගේ "Der 18 Brumaire" යන පොතට එංගල්ස්ගේ පෙරවදන) වශයෙන් ප්‍රන්සය ලබා තිබුණ පැරණි කීර්තිය සාධාරණ වූ බව එය මේ අවස්ථාවේදී ද ඔප්පු කළේය. ප්‍රන්ස සමාජවාදීන් න්‍යාය ගැන කථා කිරීමට නොව ක්‍රියාත්මක වීමට පටන් ගෙන ඇත. ප්‍රන්සයේ වඩාත් උසස් දියුණුවකට පත්වී තිබෙන දේශපාලන තත්වයන් නිසා නොපමාවම 'බර්න්ෂ්ටයින්වාදය ක්‍රියාත්මක කිරීමට'ත් එහි සියළු ප්‍රතිඵල නෙළා ගැනීමටත් ඔවුනට ඉඩ ලැබී තිබේ. ප්‍රායෝගික බර්න්ෂ්ටයින්වාදයේ විශිෂ්ට ආදර්ශයක් මිලෙරාන්ගෙන් ලැබී තිබේ. ඔහුගේ ආරක්ෂාවට හා ගුණවර්ණනයට බර්න්ෂ්ටයින් හා වොල්මර් එතරම් ලැදියාවකින් උත්සුක වූයේ හේතු විරහිතව නොවේ. ඇත්තෙන්ම, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සාරානුකූල වශයෙන් ගත් කල හුදෙක් සමාජ ප්‍රතිසංස්කරණ පක්ෂයක් වේ නම්, ඒ බව විවෘත ලෙස පිළිගැනීමට තරම් ධෛර්යක් ඇත්තේ නම්, එවිට, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකුට

ජේබියන්වරු හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්[10] අතරද, "නරෝද්නය වෝලිය" අනුගාමිකයන් හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්[11] අතරද වූ ආරාවුල් හුදු ජාතික ලක්ෂණ පමණක් පිළිබිඹු කරමින්, එකිනෙකට වෙනස් මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරයක් ගෙන හුදෙක් ජාතිකමය රාමුව තුළට සීමාවී තිබුණි. වර්තමාන කාලයේදී (දැන් පැහැදිලි වී ඇති පරිදි) ඉංග්‍රීසි ජේබියන්වරුද, ප්‍රංශ ආණ්ඩු පාක්ෂිකයන්ද,[12] ජර්මන් බර්න්ෂ්ටයින්වාදීන්ද,[13] රුසියානු විවේචකයින්ද[14] යන මේ සියළු දෙනාම එකම පවුලකට අයත් වෙති; ඔවුනොවුන් මහ ඉහළින් අගය කර ගනිති; එකිනෙකාගෙන් උගෙන ගනිති; එමෙන්ම එකාවන්ව, 'පොතේගැරුවාදී' මාක්ස්වාදීන්ට විරුද්ධව අවි ගනිති. සමාජවාදී අවස්ථාවාදයට විරුද්ධව කරන මෙම ප්‍රථම සැබෑ ජාත්‍යන්තර සටනේදී විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රමාණවත් තරම් ශක්තිමත් වී, මේ දක්වා යුරෝපයේ රජ කර තිබෙන දේශපාලන ප්‍රතිගාමිත්වය සමහරවිට කෙළවර කිරීමට හැකිවන තරම් තත්වයට පත් වනු ඇත.

ධනේශ්වර ඇමති මණ්ඩලයකට සම්බන්ධවීමේ අයිතිය තිබෙනවා පමණක් නොව, ඒ සඳහා නිතරම ප්‍රයත්න දැරීමද කළ යුතු වේ. ප්‍රජාතන්ත්‍රය යනුවෙන් සාරානුකූලව අදහස් කරන්නේ පංති ආධිපත්‍ය නැති කිරීම නම්, සමාජවාදී ඇමතිවරයෙක් පංති සහයෝගිතාවය ගැන වතුර කථා පවත්වමින් සමස්ත ධනේශ්වර ලෝකයම සතුටු නොකළ යුත්තේ මන්ද? පොලිස් කාරයන් විසින් කම්කරුවන් වෙඩිතබා දැමීමෙන් සිය–දහස්වන වරටත් පංතිවල ප්‍රජාතන්ත්‍රික සහයෝගයේ නියත ස්වභාවය කෙබඳුද යත් හෙළිදරව් වී තිබිය දී වුවද, ඔහු ඇමති මණ්ඩලය තුළ නොසිටිය යුත්තේ මන්ද? තොන්ඩුවේ, කසයේ හා පිටුවාහල් කිරීමේ වීරයා (knouteur, pendeur et déportateur) යන අපර නාමයෙන් හැර වෙනත් නමකින් දන් ප්‍රන්ස සමාජවාදීන් විසින් නොහඳුන්වනු ලබන සාර් අධිරාජයා සමාදරයෙන් පිළිගැනීමට ඔහු පෞද්ගලිකවම සහභාගී නොවිය යුත්තේ මන්ද? සමස්ත ලෝකයාම හමුවේ මෙසේ සමාජවාදය අන්ත නින්දවට හා ආත්ම-අවමානයට භාජනය කිරීම සඳහාත්, අපගේ ජයග්‍රහණය සහතික කරන එකම පදනම වන වැඩ කරන ජනතාවගේ සමාජවාදී විඥානය දූෂණය කිරීමෙනුත් ලබන තෑග්ග කුමක්ද? එම තෑග්ග නම්, පම්පෝරි සහිතව ඉදිරිපත් කෙරෙන කුම්මැහි ප්‍රතිසංස්කරණ පිළිබඳ වූ යෝජනා ක්‍රම පමණකි. මේවා ඉතාමත් අල්ප — ස්වල්පය. මීට වඩා බොහෝ ප්‍රතිසංස්කරණ ධනේශ්වර ආණ්ඩුවලින් ලබා ගෙන ඇත!

සමාජවාදයේ නව ‘විවේචනාත්මක’ ප්‍රවණතාවය අන් කිසිවක් නොව, නව වර්ගයක අවස්ථාවාදය බව උවමනාවෙන් ඇස්පියා නොගන්නා කෙනෙකුට නොපෙනී යා නොහැක. අප මිනිසුන් ගැන නිගමනවලට එළඹෙන්නේ ඔවුන්ගේ දිස්න විහිදුවන නිල ඇඳුම් අනුව හෝ ඔවුන් තමන්ට පටබැඳගන්නා උදාර විරුදවලී අනුව නොවන්නේ නම්, ඔවුන් කරන හා ඉඳුරාම කියන දෙයින් නම්, ‘විවේචනය කිරීමේ නිදහස’ යනුවෙන් අදහස් කෙරෙන්නේ, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාවාදයක් සඳහා නිදහස බවත්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සමාජ ප්‍රතිසංස්කරණවල ප්‍රජාතන්ත්‍රික පක්ෂයක් බවට පරිවර්තනය කිරීමේ නිදහස බවත්, සමාජවාදය තුළට ධනේශ්වර අදහස් හා ධනේශ්වර අංගෝපාංගයන් රිංගවීමේ නිදහස බවත් පැහැදිලි වනු ඇත.

නිදහස යනු උතුම් වචනයකි. එහෙත් කර්මාන්ත සඳහා නිදහස යන සටන් පාඨය යටතේ ඉතාමත් කොල්ලකාරී යුද්ධ කරන ලදී; වැඩ කිරීමේ නිදහස යන සටන් පාඨය යටතේ වැඩ කරන ජනතාව මංකොල්ල කන ලදී. ඒ සහජ කුහකත්වයම, ‘විවේචනය කිරීමේ නිදහය’ යන පාඨයේ වර්තමාන භාවිතය විෂයෙහි අන්තර්ගතය. තමන් විද්‍යාව අතින් දියුණුවට පත්ව ඇතැයි නිසැකව දන්නා අය අළුත් අදහස් හා සමග පරණ අදහස්ද තවදුරටත් එකට තැබිය යුතුයයි නොඉල්ලනු ඇත. ඔවුන් ඉල්ලනු ඇත්තේ පරණ අදහස් වෙනුවට අළුත් අදහස් ආදේශ කරන ලෙසය. ‘‘විවේචනය කිරීමේ නිදහස දිනේවා!’’ යනුවෙන් අද ඇසෙන සෝෂාව හිස් පීප්පය පිළිබඳ උපමා කථාව ඉතා බලවත් ලෙස සිහියට නංවන්නකි.

තදින් එකට බැඳුනු කණ්ඩායමක් වශයෙන් දැඩිව එකිනෙකාගේ අත් අල්ලා ගෙන ප්‍රපාත සහිත හා දුෂ්කර මාර්ගයක ගමන් කරමින් සිටින අපි සැම පැත්තෙන්ම සතුරන්ගෙන් වටවී සිටින්නෙමු. අපට ඉදිරියට යාමට සිදුවී තිබෙන්නේ නිරතුරුවම මෙන් ඔවුන්ගෙන් එල්ලවන තුවක්කු ප්‍රහාරය අසු අස්සේය. අපි සතුරාට විරුද්ධව සටන් කිරීමේ කටයුත්ත ඉටු කිරීම සඳහා නිදහසේ අනුමතකරගත් තීරණයකින් එකට බැඳී සිටින්නෙමු. සමගිකාරී මාර්ගය වෙනුවට අරගලයේ මාර්ගය තෝරා ගැනීම හේතුකොට ගෙන විශේෂ කණ්ඩායමක් වශයෙන් වෙන්වී සිටීම සම්බන්ධයෙන් ආරම්භයේ පටන්ම අපට දෝෂාරෝපනය කරන පිරිසක් පදිංචිව සිටින අසල ඇති මඩ වගුරට පසුබැසීමට නොවේ, අපගේ තීරණය. එහෙත් මඩ වගුරට යමුයි අප අතර සිටින සමහර දෙනෙක් හඬ නගන්නට පටන් ගනිති. එවිට අප ඔවුන් ලජ්ජාවට පත්කිරීමට පටන්ගත් කල ‘‘අහෝ නුඹලාගේ නොදියුණුකමක මහත! වඩා හොඳ පාරෙන් ගමන් කරන ලෙස නුඹලාට ආරාධනා කිරීමට අපට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීමට තරම් නුඹලාට ලජ්ජා නොමැතිද?’’ යනුවෙන් ඔවුන් පිළිවදන් දෙති. ඇත්ත තමයි මහත්වරුනි! අපට ආරාධනා කිරීමට පමණක් නොව ඔබට උවමනා අතක යාමටත්, මඩ වගුරට වුවද යාමටත් ඔබට නිදහස තිබේ. ඇත්ත වශයෙන්ම ඔබට සුදුසු නියම තැන මඩ වගුර බව අපි අදහස් කරමු. ඔබ එහි යනු සඳහා සියළු ආධාර දීමට අප සූදානම්ය. එහෙත් අපගේ අත් පමණක් අත්හරින්න. අප වෙතින් අල්ලා ගන්න එපා. නිදහස යන උතුම් වචනය කැත කරන්න එපා. අප කැමති අතක යාමට අපටද ‘නිදහස’ ඇත. මඩ වගුරට විරුද්ධව පමණක් නොව මඩ වගුර වෙත හැරෙනවුන්ටද විරුද්ධව සටන් කිරීමේ නිදහස අපට ඇත.

ආ) 'විවේචනය කිරීමේ නිදහස' ගැන කියන අලුත් පක්ෂවාදීහු

''විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ''[16] පුවත්පත වන ''රබෝචිය දියල'' පත්‍රය (අංක 10 කලාපය) මෑත කාලයේදී මෙම (''විවේචනය කිරීමේ නිදහස'') උද්‍යෝග පාඨය උදුරම් ලීලාවෙන් ඉදිරිපත් කර තිබේ. එය ඉදිරිපත් කර තිබෙන්නේ න්‍යායික සිද්ධාන්තයක් වශයෙන් නොව, ''විදේශ තුළ ක්‍රියාකරන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන එක්සත් කළ හැකිද?'' යන ප්‍රශ්නයට පිළිතුරක් වශයෙනි; දේශපාලන ඉල්ලීමක් වශයෙනි — ''කල්පවත්නා එක්සත් වීමකට නම් විවේචනය කිරීමේ නිදහස තිබිය යුතුය'' (පිටු 36).

මෙම ප්‍රකාශය අනුව යන නිශ්චිත නිගමනයන් දෙකකි: 1. ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ සාමාන්‍ය වශයෙන් පවත්නා අවස්ථාවාදී ප්‍රවණතාවයට ආරක්ෂාව සැලසීමට ''රබෝචිය දියල'' පත්‍රය ඉදිරිපත් වී තිබේ; 2. ''රබෝචිය දියල'' පත්‍රය රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ අවස්ථාවාදය රැකීම සඳහා නිදහස ඉල්ලයි. මෙම නිගමනයන් පරීක්ෂා කර බලමු.

''අන්තර්ජාතික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කන්ද හා ජිරොන්ඩ[17] අතර පිපිරීමක් ඇති විය හැකියයි කියමින් ''ඉස්ක්‍රා'' සහ ''සර්යා''[18] පත්‍ර අනාවැකි පළ කිරීමට දක්වන කැමැත්ත'' ගැන ''රබෝචිය දියල'' පත්‍රය 'විශේෂයෙන්ම' අමනාප වී තිබේ.*

''රබෝචිය දියල'' පත්‍රයේ කතෘ තැන්පත් බ. ක්‍රිචෙව්ස්කි මෙසේ ලියයි: ''සාමාන්‍ය වශයෙන් කියතොත්, කන්ද හා ජිරොන්ඩ ගැන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සාමාජිකත්වය තුළින් ඇසෙන කථාවෙන් ඓතිහාසික කරුණු නොගැඹුරු ලෙස සම කරනු ලැබේ. එය මාක්ස්වාදියෙකුගේ පැනෙන් ජනිත වීම පුදුමයකි. සමාජ දර්ශන ඉතිහාසඥයන් සිතනු හැකි පරිදි කන්ද සහ ජිරොන්ඩ නියෝජනය කළේ ප්‍රකෘති ස්වභාවයන් නැතහොත් බුද්ධිමය ප්‍රවණතාවයන් අතර වූ වෙනසක් නොව, පංති නැතහොත් ස්තර අතර වෙනසකි; එක් අතකින් මධ්‍යම ධනේශ්වර පංතියත්, අනික් අතින් සුළු ධනේශ්වර පංතිය හා නිර්ධන පංතියත් අතර වෙනසය. එසේ වුවද, නූතන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ පංති උවමනාවන් පිළිබඳව ගැටුමක් නොමැත. ඉතාමත් අන්ත බර්න්ෂ්ටයින්වාදීන් ඇතුළු කොටගත් මුළු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයම, එහි විවිධ ප්‍රභේද සියල්ලම (කිචෙව්ස්කිගේ අවධාරණය) පිහිටා ඇත්තේ නිර්ධන පංතියේ පංති උවමනාවන් සහ එහි දේශපාලන හා ආර්ථික විමුක්තිය සඳහා වූ පංති අරගලයේ පදනම මතය.''

නිර්භීත ලෙස සහතික වීමකි! බර්න්ෂ්ටයින්වාදය එතරම් සීඝ්‍ර ලෙස පැතිරී යාමට උපස්තම්භක වූයේ, මෑත අවුරුදුවලදී 'උගත්' ස්තරය පුළුල් ලෙස සමාජවාදී ව්‍යාපාරයට සම්බන්ධවීම නිසාමය යන කරුණ මීට බොහෝ කලකට පෙර සටහන් කරන ලද්දක් වන නමුත් බ. ක්‍රිචෙව්ස්කි එය අසා නැද්ද? එපමණක් නොවේ; වැදගත්ම කාරණය මෙයයි. ''ඉතාමත් අන්ත බර්න්ෂ්ටයින්වාදීන්'' පවා පිහිටා ඇත්තේ නිර්ධන පංතියේ දේශපාලන සහ ආර්ථික විමුක්තිය සඳහා වූ පංති අරගලයේ පදනම මතය යන ඔහුගේ අදහස අප කතෘතැන ගොඩ නගා ගෙන ඇත්තේ කුමන කරුණු මතද? කිසිවෙකු නොදනී. මෙසේ අධිෂ්ඨාන සහගත ලෙස ඉතාමත් අන්ත බර්න්ෂ්ටයින්වාදීන් ආරක්ෂා කිරීම තර්ක හෝ කරුණු දැක්වීම මගින් කිසිසේත් සනාථ කර නැත. ඉතාමත් අන්ත බර්න්ෂ්ටයින්වාදීන් තමන් ගැනම කියා ගන්නා දෙය තමන්ද පුණරුච්ඡාරනය කළ කල්හි තමාද සහතිකවී කරන එම ප්‍රකාශයන් ඒත්තු ගැන්වීමට කරුණු අනවශ්‍යයයි ඔහු සිතනු විය හැක. එහෙත් කිසියම් ප්‍රවණතාවයක නියෝජිතයන් ඔවුන් ගැනම කියා ගන්නා දේ හැර වෙනත් කිසිවක් පදනම් කර නොගෙන මුළු මහත් ප්‍රවණතාවයක්ම ගැන නිගමනයන්ට එළඹීමට වඩා 'නොගැඹුරු' තවත් දෙයක් ගැන සිතනු හැකිද? පක්ෂ සංවර්ධනය ගැන වූ එකිනෙකට වෙනස් වන හා එකිනෙකට ප්‍රතිවිරුද්ධත්වය පවා ඇති ක්‍රම නැතහොත් මාර්ග දෙක ගැන අනතුරුව කරන ලද 'දේශනයට' වඩා නොගැඹුරු තවත් දෙයක් ගැන සිතනු හැකිද (''රබෝචිය දියල'' පිටු 34—35)? වෙනත් වචනවලින් කියතොත්, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විවේචනය කිරීමේ පූර්ණ නිදහස පිළිගනිති. එහෙත් ප්‍රන්ස සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් එය පිළිනොගනිති;

---

* ''ඉස්ක්‍රා'' අංක 2 (1901 පෙබරවාරි) පත්‍රයේ ප්‍රධාන ලිපියෙන් විප්ලවවාදී නිර්ධන පංතිය තුළ දක්නට ලැබෙන (විප්ලවවාදී සහ අවස්ථාවාදී) ප්‍රවණතාවයන් දෙකත්, දහ අටවැනි ශතවර්ෂයේ විප්ලවවාදී ධනේශ්වර පංතිය තුළ වූ (''කන්ද'' යනුවෙන් හඳුන්වන ලද ජැකොබින්වරු සහ ජිරොන්ඩවරු) ප්‍රවණතාවයන් දෙකත් සංසන්දනය කෙරිනි. ලිපිය ලියන ලද්දේ ප්ලෙහානව් විසිනි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ 'ජැකොබින්වාදය' ගැන කැඩෙට්වරු,[19] ''බිස්සග්ලාවිවරු''[20] හා මෙන්ෂෙවික්වරු[21] මේදක්වාම සඳහන් කරති. එහෙත් මෙම ආකල්ප ප්‍රථම වතාවට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ දක්ෂිණාංශයට විරුද්ධව යොද ගැනීමට ප්ලෙහානව් යොමුවූයේ කෙසේද? ඒ ගැන නිහඬව සිටීමට නැතහොත් අමතක කිරීමට ඔවුන් වැඩි කැමැත්තක් දක්වති. (1907 මුද්‍රණයෙහි කතෘගේ සටහන. සංස්කාරක)

එමෙන්ම ‘නොරිස්සුම නැමති වස’ පෙන්නුම් කෙරෙන්නේද ඔවුන්ගේම ආදර්ශයෙනි.

මේ ගැන අපට කිව හැක්කේ, ‘ඉලවායිස්කි ක්‍රමයට’ පදගත අර්ථයෙන් පමණක් ඉතිහාසය වටහා ගන්නා අයද සමහරවිට මාක්ස්වාදී නාමය ආරෝපනය කරගන්නා බව ඔප්පු කිරීමට බ. ක්‍රිචෙව්ස්කි සැපයූ උදහරණයක් සාක්ෂියක් වන බව පමණකි. ජර්මන් සමාජවාදී පක්ෂයේ සමගිය හා ප්‍රන්ස සමාජවාදී පක්ෂයේ අසමගිය පැහැදිලි කිරීම සඳහා මේ දෙරටෙහි ඉතිහාසයේ විශේෂ අංග ලක්ෂණ ගැන සෙවීමවත්, එක රටක වූ යුද්ධ අර්ධ–ඒකාධිපති තත්වය හා අනික් රටෙහි වූ සමූහාණ්ඩු පාර්ලිමේන්තුවාදය අතර ඇති අසමානත්වය සැලකිල්ලට ගැනීමවත්, කොමියූනයේ[22] ප්‍රතිඵල හා සමාජවාදීන්ට විරුද්ධ අතිවිශේෂ නීතියෙහි[23] ප්‍රතිඵල විශ්ලේෂණය කර බැලීමවත්, දෙරටෙහි ආර්ථික ජීවිතය හා ආර්ථික සංවර්ධනය සංසන්දනය කිරීමවත්, එසේත් නැතහොත්, ‘ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අසමසම දියුණුව’ ඇතිවූයේ වැරදි න්‍යායන්ට (මුල්බර්ගර්, ඩූරිං,* කතීඩර්-සමාජවාදීන්[26]) පමණක් නොව, වැරදි උපක්‍රමවලටද (ලසාල්) යනාදියට විරුද්ධව ඉතිහාසයේ පෙර නොදක්නා ලද විරු දෘඪතර අරගලයක් හා සමග බව සිහිපත් කිරීමවත් කිසිසේත් අවශ්‍ය නැත. ඒ සියල්ලම අනවශ්‍යය! ප්‍රන්සයන් ඔවුනොවුන් අතර රණ්ඩු කර ගන්නේ ඔවුන්ගේ නොරිස්සුම නිසාය; ජර්මන්වරු හොඳ ළමයින් වන හෙයින් එක්සත්ව සිටිති.

තවද, මෙම අසමසම පණ්ඩිත වාක්‍ය ප්‍රකාශ කර ඇත්තේ බර්න්ෂ්ටයින්වාදීන්ගේ රැකවරණ සුනු විසුනු කෙරෙන සත්‍ය කරුණ ‘බිඳහෙළීමේ’ අරමුණ ඇතිව බව සටහන් කර ගන්න. බර්න්ෂ්ටයින්වාදීන් පිහිටා සිටින්නේ නිර්ධන පංතියේ පංති අරගලයේ පදනම මතද, නැද්ද යන ප්‍රශ්නය ඉතිහාසයේ සිද්ධීන් අනුව පමණක් පූර්ණ හා තිරසර වශයෙන් පිළිතුරු දිය හැකි වන එකකි. එහෙයින්, මෙම කාරණය සම්බන්ධයෙන් ප්‍රන්සයේ ආදර්ශය අතිශයින් වැදගත්ය; ඒ බර්න්ෂ්ටයින්වාදීන්, ස්වාධීනව, ඔවුන්ගේම පාද මත නැගී සිටීමට උත්සාහ දැරූ එකම රට එය වන හෙයිනි. එසේ කිරීමේදී, ඔවුනට ඔවුන්ගේ ජර්මන් හවුල් කරුවන්ගේ උණුසුම් අනුමැතිය (හා ප්‍රමාණයක් දුරට රුසියානු අවස්ථාවාදීන්ගේ අනුමැතියත් — ‘‘රබෝචිය දියල’’ අංක 2—3, පිටු 83—84) ලැබිනි. ප්‍රන්සයන්ගේ ‘නොරිස්සුම’ ගැන කරන සඳහන (නස්ද්‍රියෝව්[27] අරුතෙන්) ‘ඓතිහාසික’ වශයෙන් වැදගත් වුවද, එය යොදගෙන ඇත්තේ ඉතාමත් අප්‍රසන්න සත්‍ය කාරණා වසං කිරීමට යොද ගන්නා කෝපාවිෂ්ඨ බිනුමක් ලෙසටය.

බ.ක්‍රිචෙව්ස්කිට හා ‘විවේචනය කිරීමේ නිදහසේ’ අනෙකුත් නිමක් නැති වීරයන්ට ජර්මන්වරු තෑගිකර දීමටද අපගේ අදහසක් නොමැත. ‘ඉතාමත් අන්ත බර්න්ෂ්ටයින්වාදීන්ට’ තවමත් ජර්මන් පක්ෂ සාමාජිකත්වය තුළ ඉඩ දී තිබේ නම්, එසේ කර ඇත්තේ බර්න්ෂ්ටයින්ගේ ‘සංශෝධන’ දැඩි ලෙස ප්‍රතික්ෂේප කළ හැනෝවර් යෝජනාවටත්,[28] (උපායශීලී භාෂාවෙන් සකස් කර ඇති නමුදු) බර්න්ෂ්ටයින්ට කළ ඍජු අවවාදයක් ඇතුලත් ලූබෙක් යෝජනාවටත්[29] ඔවුන් යටත් වන තාක් දුරට වේ. ජර්මන් පක්ෂයේ යහපත පිළිබඳ ස්ථාවරය අනුව බලන කල උපක්‍රමශීලීභාවය සුදුසුවීද, නැතහොත් මෙම අවස්ථාවේදී හොඳ රණ්ඩුවකට වඩා නරක සාමයක් යහපත් වීද යන්න විවාදයට හේතුවන කරුණක් විය හැක. කොටින් කියතොත් බර්න්ෂ්ටයින්වාදය ප්‍රතික්ෂේප කිරීම පිණිස යොද ගන්නා ලද ක්‍රම අතුරෙන් කුමන එකක හෝ යෝග්‍යතාවය ගැන වූ අදහස් වල විවිධත්වයක් තිබීමට ඉඩ තිබේ. එහෙත් ජර්මන් පක්ෂය දෙවරක්ම බර්න්ෂ්ටයින්වාදය ප්‍රතික්ෂේප කළ බව කිසිවෙකුටත් නොපෙනී යා නොහැක. එබැවින් ‘‘ඉතාමත් අන්ත බර්න්ෂ්ටයින්වාදීන් පිහිටා සිටින්නේ නිර්ධන පංතිය එහි දේශපාලන හා ආර්ථික විමුක්තිය සඳහා කරන අරගලයේ පදනම උඩය’’ යන මතය ජර්මන් ආදර්ශයෙන් තහවුරු වන්නේයයි කල්පනා කරතොත් එයින් අදහස් වන්නේ

---

* එංගල්ස් ඔහුගේ ප්‍රහාරයන් ඩූරිං වෙත එල්ල කළ කල්හි, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ නියෝජිතයන් බොහෝ දෙනෙක් ඩූරිං ගේ අදහස් වෙතට නැඹුරු වූහ. ඒ අනුව, රළු පරළු බව, නොරිස්සුම, සහෝදරත්වයට නොගැලපෙන වාරය ආදිය පිළිබඳ චෝදනා පක්ෂ සම්මේලනයේදී, ප්‍රසිද්ධියේම පවා එංගල්ස් වෙත දමා ගසන ලදී. ‘‘පාඨකයන් අතිබහුතරය’’ එංගල්ස්ගේ ලිපි ගැන ‘‘සතුටක් නොදක්වන හෙයින්’’ ඒවා “Vorwärts”[24] හි පළ කිරීම තහනම් කිරීමේ යෝජනාවක් මොස්ට් සගයින් සමග (1877 සම්මේලනයට[25]) ඉදිරිපත් කළේය. ඒවා පළ කිරීමෙන් පක්ෂයට බලවත් හානියක් සිදුවී ඇති බවත්, ඩූරිං ද පක්ෂයට සේවාවක් කර ඇති බවත් වාල්තයිහ් (Vahlteich) ප්‍රකාශ කළේය. ‘‘පක්ෂයේ යහපත සඳහා අපි සැම දෙනාම උපයෝගි කරගත යුත්තෙමු. පණ්ඩිතයන්ට උවමනා නම් ඔවුන් විවාදයෙහි යෙදූනාවේ. එහෙත් ඒවා පැවැත්වීමට නිසි තැන “Vorwärts” පත්‍රය නොවේ’’ (“Vorwärts”, අංක 65, 1877 ජූනි 6). ‘විවේචනය කිරීමේ නිදහස’ ආරක්ෂා කිරීම පිළිබඳ තවත් නිදර්ශනයක් අපට මෙයින් දැක්ක හැකිය. ජර්මන් වරුන්ගෙන් නිදර්ශන ඉදිරිපත් කිරීමට එතරම් කැමැත්තක් දක්වන නීත්‍යානුකූල විවේචකයන් හා නීති විරෝධී අවස්ථාවාදීන්ද ඒ ගැන උවමනාවෙන් සිතා බැලීම මනාය!

අපගේ ඇස් ඉදිරිපිටම සිදුවන දෙය වටහා ගැනීමට සම්පූර්ණයෙන්ම අසමත් වන බවකි.*

''රබෝචිය දියල'' පත්‍රය මෙයින් නොනැවතී, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය හමුවේ 'විවේචනය කිරීමේ නිදහස' ඉල්ලන බවත්, බර්න්ෂ්ටයින්වාදය ආරක්ෂා කරන බවත් අප දැක ඇත. අප අපගේ 'විවේචකයින්'ට සහ බර්න්ෂ්ටයින්වාදීන්ට අසාධාරණ වී ඇතැයි එම පත්‍රය ප්‍රත්‍යක්ෂ කරගෙන තිබෙන බවත් පෙනේ. එහෙත් ඒ කුමන අයටද? කවුද? කොහේදීද? කවදද? අසාධාරණය වූයේ කුමකින්ද? මේ ගැන වචනයක් වත් නැත. එකම රුසියානු විවේචකයෙක් හෝ එකම බර්න්ෂ්ටයින්වාදියෙක් හෝ ''රබෝචිය දියල'' පත්‍රය විසින් නම් කරනු නොලැබේ! අපට සිතා බැලීමට ඉතිරිවන්නේ විය හැකි කරුණු දෙකකින් එකක් පමණකි. එක්කෝ අසාධාරණ සැලකිල්ලට ලක් වූයේ ''රබෝචිය දියල'' පත්‍රයමය (අංක 10 ලිපි දෙකෙහි සඳහන් වන්නේ ''සර්යා'' හා ''ඉස්ක්‍රා'' පත්‍ර අතින් ''රබෝචිය දියල'' පත්‍රයට විඳින්නට සිදුවූ අතවර ගැන වන හෙයින් මෙය සනාථ වේ). එය

---

* ජර්මන් පක්ෂය තුළ වූ බර්න්ෂ්ටයින්වාදය ගැන කරුණු සඳහන් කිරීමට පමණක් නිතරම සීමා වූ ''රබෝචිය දියල'' පත්‍රය තම අදහස් ප්‍රකාශ කිරීමෙන් සම්පූර්ණයෙන්ම 'වැළකී සිටියේය.' නිදර්ශනයක් වශයෙන් ස්ටුට්ගාට් සම්මේලනයේ[30] — අංක 2-3, පිටු 66 — වාර්තා බලන්න. ඒකභත්වයක් නොමැති කරුණු සියල්ලම 'උපක්‍රම' බවට පෙරළා එහි සඳහන් කර ඇති අතර සම්මේලනයේ අති බහුතරය පැරණි විප්ලවවාදී උපක්‍රමවලට පක්ෂ බව පමණක් ප්‍රකාශ කර ඇත. තවද, අංක 4-5, පිටු 25 සිට — ඇතුලත් කර තිබෙන්නේ හැනෝවර් සම්මේලනයේ කථාවල පුනරුච්ඡාරනයකුත් සමග බේබෙල්ගේ යෝජනාවේ නැවත මුද්‍රණයක් පමණකි. ඊහැර වෙනත් කිසි දෙයක් එහි නොමැති බව අපට පෙනේ. බර්න්ෂ්ටයින්ගේ අදහස් විවේචනය කිරීම ගැන 'විශේෂ ලිපියක්' මගින් විවරණය කිරීම නැවතත් (අංක 2-3 පරිදි) කල් දමා ඇත. අංක 4-5 පිටු 33 හි පහත සඳහන් කොටස කියවන්නට ලැබීමෙන් අපගේ කුතුහලය තවත් ඇවිස්සෙයි: ''බේබෙල් විස්තර කළ අදහස්වලට සම්මේලනයේ අතිවිශාල පිරිසකගේ සහයෝගය ඇත.'' ඊළඟට පේළි කීපයකට පසුව ''බර්න්ෂ්ටයින්ගේ අදහස්වලට පක්ෂව ඩේවිඩ් කථා කළේය... කළ කී දේ සියල්ල අවසානයේ(!) බලන කල බර්න්ෂ්ටයින් හා ඔහුගේ මිතුරන් පිහිටා සිටින්නේ පංති අරගලයේ පදනම මතයයි පෙන්වාදීමට ඔහු ප්‍රථමයෙන්ම උත්සාහ කළේය...''. මෙය 1899 දී ලියන ලද අතර, 1901 සැප්තැම්බරයේදී බේබෙල් නිවැරදි බව තමන් තවදුරටත් විශ්වාස නොකරන බව පෙන්වන ''රබෝචිය දියල'' පත්‍රය ඩේවිඩ්ගේ අදහස් තමන්ගේම අදහස් ලෙසට පුණරුච්ඡාරනය කරයි!

එසේනම්, තමන් බර්න්ෂ්ටයින්වාදයට කිසිම සහයෝගිතාවයක් නොදක්වන බව තරයේ පුන පුනා කියන ''රබෝචිය දියල'' පත්‍රයට, 'ඉතාමත් අන්ත බර්න්ෂ්ටයින්වාදීන්' හා 'විවේචනය කිරීමේ නිදහස' ආරක්ෂාවට යමක් නොකියා තමන්ගේ ආරක්ෂාවට කරුණු කිව නොහැක්කේ මන්ද යන රහස පැහැදිලි කරන්නේ කෙසේද? නැතහොත් අසාධාරණ ලෙස සලකා ඇත්තේ තුන්වැනි කෙනෙකුටය. එසේ නම්, එම අය නම් නොකිරීමට ඇති හේතුව කුමක්ද?

මේ අනුව බලන කල, ''රබෝචිය දියල'' පත්‍රය (අප පහත පෙන්නුම් කර ඇති පරිදි) ආරම්භයේ පටන්ම ගෙනගිය හැංගිමුත්තන් ක්‍රීඩාව තව දුරටත් කරගෙන යන බව පෙනේ. එපමණක් නොව, මෙතරම් පාරට්ටු කරන 'විවේචනය කිරීමේ නිදහස' මෙපරිද්දෙන් ප්‍රථමවරට ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීම ගැනද තවදුරටත් සටහන් කර ගනිමු. එයින් ඇත්ත වශයෙන්ම සිදු වූයේ සැනෙකින්ම සියළු විවේචනවලින් වැලකී සිටීමේ තත්වයට පහත වැටීම පමණක් නොව, ස්වාධීනව අදහස් ප්‍රකාශ කිරීමෙන්ද මුළුමනින් වැලකී සිටීමේ තත්වයටද වැටීමය. අවනම්බුකාරී රෝගයක් (ස්තරවේර්ගේ උචිත පාඨයකි) මඟ හරින පරිද්දෙන් රුසියානු බර්න්ෂ්ටයින්වාදය ගැන සඳහන් කිරීමෙන් මඟහරින ''රබෝචිය දියල'' පත්‍රයම, මෙම රෝගයට ප්‍රතිකාර වශයෙන්, රෝගයේ ජර්මන් ප්‍රභේදයට නියමිත බෙහෙත් සීට්ටුව වචනයක් පාසා පිටපත් කර ගැනීමට යෝජනා කරයි! විවේචනය කිරීමේ නිදහස වෙනුවට නින්දිත (ඊටත් එහා — මුග්ධ) අනුකරණය! නූතන අන්තර්ජාතික අවස්ථාවාදයට අන්තර්ගත එකම සමාජ හා දේශපාලන අංගෝපාංගයන්, ජාතික විශේෂත්වයන් අනුව විවිධාකාරයෙන් අනාවරණය වේ. එක් රටක අවස්ථාවාදීන් බොහෝ කලක සිට වෙනම ධජයක් යටතේ පෙරට ආහ; වෙනත් රටක ඔවුන් න්‍යාය නොතකා හැර උන්නතිකාමීන්-සමාජවාදීන්ගේ ප්‍රතිපත්තිය අනුගමනය කළහ; තුන්වැනි රටක විප්ලවීය පක්ෂයේ සාමාජිකයන් සමහර දෙනෙක් අවස්ථාවාදීන්ගේ කඳවුරට පැනගොස් සිටින අතර, ඔවුන් ස්වකීය අරමුණු ඉටු කරගැනීමට උත්සාහ කරන්නේ ප්‍රතිපත්ති හා නව උපක්‍රම සම්බන්ධයෙන් කරන විවෘත අරගලයකින් නොව, ක්‍රමාණුකූල, අදෘශ්‍යමාන සහ දඬුවම් ලැබීමට තරම් වරදක් යයි කිව නොහැකි ආකාරයට පක්ෂය දූෂණය කිරීමෙනි; තවත් හතරවැනි රටක එලෙසම පැනගියවුන් දේශපාලන වහල්භාවය යටතේ සිටිමින් එම ක්‍රමම අනුගමනය කරන්නේ 'නීත්‍යානුකූල' සහ 'නීතිවිරෝධී' වැඩ ඉතාමත් අමුතුම තාලයකට ඒකාබද්ධ කරමිනි; මේ ආදී වශයෙනි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් එක්සත් කිරීමට කොන්දේසියක්

වශයෙන් ඉදිරිපත් කෙරෙන විවේචනය කිරීමේ හා බර්න්ෂ්ටයින්වාදයේ නිදහස ගැන කථා කරන විට ඒ හා සමගම රුසියානු බර්න්ෂ්ටයින්වාදය ප්‍රකට වන්නේ කුමන නියායෙන්ද යන්නත්, එයින් ලැබී ඇති ඵල ප්‍රයෝජන මොනවාද යන්නත් ගැන කථා නොකර සිටීම කිසිවක් නොකීමේ අරමුණ ඇතිව කථා කිරීම හා සමානය.

''රබෝචිය දියල'' පත්‍රය කීමට අකැමතිවූ (නැතහොත් සමහරවිට එයට වටහාගත නොහැකිවූ) දෙය වචන කීපයකින් හෝ කීමට උත්සාහ කරන්නෙමු.

ඇ) රුසියාවෙහි විවේචනය

අපගේ පරීක්ෂණයට භාජනය වූ කාරණය හා සම්බන්ධයෙන් රුසියාවේ දක්නට ලැබෙන ප්‍රධාන කැපී පෙනෙන අංග ලක්ෂණය නම්, එක් අතකින් සාංසිද්ධික කම්කරු ව්‍යාපාරයේ ආරම්භයත්, අනික් අතින් ප්‍රගතිශීලී මහජන මතය මාක්ස්වාදය වෙතට නැඹුරු වීමත් හා සමගම, එකිනෙකට නොගැලපෙන බව මැනවින් පෙනෙන කොටස් පොදු හතුරාට (යල්පිනූ සමාජ හා දේශපාලන ලෝකාවබෝධයට) විරුද්ධව සටන් කිරීම පිණිස එකම ධජයක් යටතේ ඒකාබද්ධ වීමද සලකුණු වීමයි. අප සඳහන් කරන්නේ 'නීත්‍යානුකූල මාක්ස්වාදය'[31] බලවත්ව තිබූ කාලය ගැනය. පොදුවේ සලකතොත්, මෙය එක්දහස් අටසිය අසූ ගණන්වල, නැතහොත් අනූ ගණන්වල ආරම්භයේදී සිදුවිය හැකි දෙයක් ලෙස කිසිවෙකු විශ්වාස නොගන්නා තරම් හැම අතින්ම කුතුහලය දනවන ආශ්චර්යමත් දෙයකි. සර්වබලධාරී ඒකාධිපති පාලනයක් පවතින්නාවූද, පැන නගින ඉතාමත් සිහිති දේශපාලන අප්‍රසන්න තාවය පවා වද බන්ධනයෙන් මැඩුනාවූද, දරුණු දේශපාලන ප්‍රතික්‍රියා බල පැවැත්වූ රටක ඊසොප්ගේ මෙන්වූ භාෂා විලාෂයකින් හෝ විප්ලවවාදී මාක්ස්වාදයේ න්‍යාය පාලනයට යටත් සාහිත්‍ය තුළට බලෙන් කඩා වැදී 'උනන්දුවක් දක්වන' සියල්ලන්ම එය වටහා ගන්නා තත්වයක් ඇති විය. (විප්ලවවාදී) ''නරෝද්නය වෝලිය'' සංවිධානයේ න්‍යාය පමණක් භයානක යයි සැලකීමටත්, එහි අභ්‍යන්තර පරිණාමය නොදුටු නිසා ඊට විරුද්ධව කෙරෙන ඕනෑම විවේචනයක් ගැන උදම් වීමටත් ආණ්ඩුව පුරුදුව සිටියේය. සිදුවී තිබෙන දෙය ආණ්ඩුවට අවබෝධ වීමට පෙර, මෙහෙයා ගැනීමට දුෂ්කර පුවත්පාලන හමුදව තමන් පිටට අළුත් සතුරෙක් පැන ඇති බව සොයා ගැනීමට පෙර (අපගේ රුසියානු සම්මතයන් අනුව) බොහෝ කලක් ගතවිය. ඒ අතර වාරයේ මාක්ස්වාදී පොත් වැල නොකැඩී පළ කෙරුනි. මාක්ස්වාදී සහරා හා පුවත්පත් ආරම්භ විය. සැම කෙනෙක්ම පාහේ මාක්ස්වාදියෙක් විය. මාක්ස්වාදීන්ට අධික ලෙස ප්‍රශංසා පිරිනැමිනි. මාකස්වාදී පොතපත අසාමාන්‍ය තරම් පහසුවෙන් අලෙවි කළ හැකිවීම ගැන ප්‍රකාශකයන් උද්දම වූහ. එනිසා මෙම වාතාවරණයට හසුවුනු මාක්ස්වාදී කෝඩුකාරයන් අතර 'හිස උදුම්මාගත්'[32] එක ලේඛකයකුට වඩා සිටීම ඉතාමත් ස්වාභාවික දෙයකි.

මෙම කාල පරිච්ඡේදය ගතවී අතීතයට එක්වුනු දෙයක් ලෙසට සලකා දැන් අපට ඒ ගැන සන්සුන්ව කථා කළ හැක. අපගේ සාහිත්‍ය මතුයෙහි මාක්ස්වාදය පුබුදු වී ආ කෙටි කාල පරිච්ඡේදය උදවූයේ සීමාන්තික හා මැදහත් අදහස් දරන අය අතර ඇතිවූ සන්ධානයක් හේතුකොට ගෙන බව නොරහසකි. මෙයින් පසු කී අය ඇත්ත වශයෙන්ම ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන් වූහ. (ඔවුන්ගේ පසු කාලීන 'විවේචනාත්මක' සංවර්ධනයෙන් ඉතා පැහැදිලිව ඔප්පුවූ) මෙම කාරණය, එම 'සන්ධානය' පවතින සමයේ වුවද, සමහරෙකුගේ කල්පනාවට නැගුනි*.

තතු එසේ වූ කල්හි, අනාගත 'විවේචකයන්' හා සමග සන්ධානයට එළඹුනු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු පසුව ඇතිවූ 'අවුල' සම්බන්ධයෙන් ප්‍රධාන වගකිව යුත්තෝ නොවෙත්ද? මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර, ඊට ඔව් යනුවෙන් පිළිතුරුද දෙන හඬක් ඉතා අකම්පයශීලී අදහසක් දරන අය වෙතින් සමහරවිට ඇසේ. එහෙත් ඔවුන් සම්පූර්ණයෙන්ම වැරදිය. විශ්වාස නොකටයුතු අය සමග වුවද, තාවකාලික සන්ධානයනට එළඹීමට බිය වන්නේ තමන් ගැනම විශ්වාසයක් නැතියවුන් පමණකි. එවැනි සන්ධානයනට නොඑළඹ පැවතෙනු හැකි එකද දේශපාලන පක්ෂයක් හෝ නොමැත. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් නීත්‍යානුකූල මාක්ස්වාදීන් හා සමග ඇති කරගත් සම්බන්ධය, ඊට ආවේනික ස්වභාවය අනුව, ඔවුන්ගේ ප්‍රථම තථ්‍ය දේශපාලන සන්ධානය වේ. මෙම සන්ධානයට ස්තූති වන්නට නරෝද්නික්වාදය විස්මයාකාර තරම් සීඝ්‍ර ලෙස පරාජයට පත් කළ හැකිවිය; මාක්ස්වාදී අදහස් (දියාරු කළ ආකාරයෙන් හෝ) පුළුල් ලෙස පැතිරී ගියේය. එපමණක් නොව, එම සන්ධානය ඇති කරගන්නා ලද්දේ කිසිම 'කොන්දේසියකින්' තොරවද නොවේ. ''රුසියාවේ

---

* මෙම සඳහන කර ඇත්තේ කේ. ටූලින් විසින් ස්ත්‍රුවේට විරුද්ධව එල්ල කර ලියන ලද ලිපියක් ගැනය. ලිපිය පදනම් වූයේ ''ධනේශ්වර සාහිත්‍යය තුළ පෙනෙන මාක්ස්වාදයේ පිළිබිඹුව'' යන රචනය මතය.

ආර්ථික සංවර්ධන ප්‍රශ්නය පිළිබඳ තොරතුරු''[33] නැමති පොත ප්‍රවෘත්ති පාලක විසින් 1895 දී ගිනිබත් කරන ලදී. නීත්‍යානුකූල මාක්ස්වාදීන් සමග පැවැති සාහිත්‍යමය එකඟත්වය දේශපාලන සන්ධානයකට සැසඳිය හැකි නම්, මෙම පොත දේශපාලන ගිවිසුමක් හා සමාන වේ.

භේදය ඇතිවූයේ 'මිත්‍රයන්' ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන් වීමේ හේතුවෙන් නොවේ. සත්‍යය එහි අනිත් පැත්තය. රුසියාවේ පවතින තත්වය අනුව, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් ඉදිරියට මතුවී එන තරමට, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවණතාවයේ නියෝජිතයන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට සුදුසු හා එහි ස්වාභාවික මිත්‍රයන් වෙති. එසේ වුවද, එවැනි සන්ධානයක් ඇතිවීමට නම් කම්කරු පංතියේ යහපත කෙළින්ම ධනේශ්වර පංතියේ යහපතට ප්‍රතිවිරුද්ධ වන බව කම්කරු පංතියට හෙළිදරව් කිරීමේ සම්පූර්ණ අවකාශය සමාජවාදීන්ට තිබීම ඉටුවිය යුතු අවශ්‍යම කොන්දේසියකි. එහෙත්, නීත්‍යානුකූල මාක්ස්වාදීන් වැඩි දෙනෙකුගේ පක්ෂපාතිත්වය ලත් බර්න්ෂ්ටයින්වාදීන් සහ 'විවේචනාත්මක' ප්‍රවණතාවය, සමාජවාදීන්ට මෙම අයිතිය දීම ප්‍රතික්ෂේප කළ අතරම, මාක්ස්වාදය දියාරු කිරීමෙන්ද, සමාජ විප්ලවය හා නිර්ධන පංති ආඥාදායකත්වය පිළිබඳ අදහස අඥාණ එකක් බව ප්‍රකාශ කිරීමෙන්ද, කම්කරු පංති ව්‍යාපාරය හා පංති අරගලය පටු වෘත්තීය සමිතිවාදය බවටත්, සුළු සහ ක්‍රමික ප්‍රතිසංස්කරණ සඳහා වූ 'යථාර්ථවාදී' අරගලයක් බවටත් පත්වන සේ එය බාල කිරීමෙන්ද, සමාජවාදී විඥානය දුර්වල කිරීමෙහි යෙදුනේය. මෙයින් වූයේ නිදහස සඳහා සමාජවාදයට ඇති අයිතිය ධනේශ්වර පංතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමකි. එනිසා එය සමාජවාදයේ පැවැත්මට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීමක් විය. ප්‍රායෝගික වශයෙන් ගත් කල මෙහි අර්ථය වූයේ නැගී එන කම්කරු පංති ව්‍යාපාරය ලිබරල්වාදීන්ගේ අණ්ඩක් බවට හරවා ගැනීමට යත්න දැරුන බවයි.

එවැනි තත්වයන් යටතේ භේදය ස්වාභාවික වශයෙන්ම අවශ්‍ය දෙයක් විය. එහෙත් මෙම භේදයේ නිරායාස අර්ථය වූයේ ඉතා පහසුවෙන් ලබා ගත හැකි හා ඉතා පුළුල් ලෙස පැතිරී ගිය 'නීත්‍යානුකූල' පොතපත කෙරෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ඇති කිරීම සහ එම කාරණය හේතුකොට ගෙන රුසියාවේ 'අමුතු' අංග ලක්ෂණය ප්‍රකාශිත වීමය. 'විවේචනයේ' ධජය ඔසවාගත් 'හිටපු මාක්ස්වාදීන්' මාක්ස්වාදය 'බිඳහෙළීමේ' ඒකාධිකාරය කර ගහගෙන මෙම සාහිත්‍ය තුළ කඳවුරු බැඳගත්හ. එතැන් පටන් 'විශුද්ධිතා විරෝධය' හා 'විවේචනය කිරීමේ නිදහස දිනේවා' වැනි චිත්තාකර්ෂණීය (දැනට ''රබෝචිය දියල'' පත්‍රය ප්‍රතිරාවය කරන) වදන් මෝස්තරයක් බඳුව ව්‍යවහාර වන්නට පටන් ගති. කීර්තිමත් (හෙරෝස්ට්‍රටිස් අර්ථයෙන් කීර්තිමත්) බර්න්ෂ්ටයින්ගේ කෘතියේ[34] රුසියානු සංස්කරණ තුනක්ම පළ කිරීමෙන්ද, බර්න්ෂ්ටයින්ගේ, ප්‍රකපෝවිච් මහතාගේ හා වෙනත් අයගේ කෘති සුබාතව් විසින් (''ඉස්ක්‍රා'' අංක 10) නිර්දේශ කරනු ලැබීමෙන්ද පෙනෙන්නේ පුවත් පාලකයාත්, පොලිස් කාරයාත් මෙම මෝස්තරයට විරුද්ධ වීමෙහි සමත් නොවූ බවයි. මෙයින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් පිට ඉතා හාර දුර කර්තව්‍යයක්, නව ප්‍රවණතාවයට විරුද්ධව සටන් කිරීමේ කර්තව්‍ය පැවරුනි. සම්පූර්ණයෙන්ම පිටස්තර වූ බාධක නිසා මෙම කර්තව්‍ය තවත් නො ඇදහිය හැකි තරම් දුෂ්කර එකක් බවට පත්විය මෙම ප්‍රවණතාවය පොතපතට පමණක් සීමා වූයේද නැත. 'විවේචනය' වෙත හැරීමක් සමගම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරකවරුන් අතර 'ආර්ථිකවාදයේ' මෝහනයක්ද පැතිර ගියේය.

නීත්‍යානුකූල විවේචනය සහ නීතිවිරෝධී ආර්ථිකවාදය අතර සම්බන්ධය හා අන්‍යෝන්‍ය ආධාරය පැන නැංග ආකාරයම පවා කුතුහලය දනවන මාතෘකාවකි. එය විශේෂ ලිපියක මාතෘකාවකට සෑහෙන්නකි. මෙම සම්බන්ධය නිසැකවම පැවති බව පමණක් මෙහිදී සඳහන් කිරීම ප්‍රමාණවත්ය. විය යුතු පරිද්දෙන්ම "Credo"* ලියවිල්ල ඉමහත් අපකීර්තියට පාත්‍ර වූයේ, මෙම සම්බන්ධ නොවලහා ගෙන හැර දැක්වීම හා ඉන් 'ආර්ථිකවාදයේ' මූලික ප්‍රවණතාවය එළියට දැමූ නිසා මිස අන්කිසි හේතුවක් නිසා නොවේ. කම්කරුවන් ආර්ථික අරගලය ගෙනයා යුතු බවත්, (මෙහිදී ට්‍රේඩ් යුනියන්වාදී අරගලය කීවා නම් වඩාත් නිවැරදි වන්නට තිබුණි: එයට කම්කරු පංති දේශපාලනයත් නියත වශයෙන්ම අයත් වන බැවිනි) දේශපාලන 'අරගලය' සඳහා මාක්ස්වාදී බුද්ධිමතුන් ලිබරල්වාදීන් සමග ඒකාබද්ධ විය යුතු බවත් එම ලියවිල්ලෙහි සඳහන්ය. ඒ අනුව බලන කල 'ජනතාව අතර' වෘත්තීය සමිතිවාදී වැඩ කිරීම යන්නෙන් මෙම කර්තව්‍යයෙහි ප්‍රථම කොටස ඉටු කිරීමත්, නීත්‍යානුකූල විවේචනය යන්නෙන් එහි දෙවන කොටස ඉටු කිරීමත් අදහස් කෙරිනි. ආර්ථිකවාදයට විරුද්ධ කරන සටනේදී මෙම ලියවිල්ල කොතරම් අගනේදැයි කිවහොත්, "Credo" ලියවිල්ල නොතිබිනි නම්, එකක් ගොතා ගැනීම වුවද වටිනා කටයුත්තක් වන්නට තිබුණි.

---

* ඇදහීමේ සංකේතයකි, වැඩ පිළිවෙළකි, දෘෂ්ටිය පිළිබඳ ප්‍රකාශනයකි. සංස්කාරක

"Credo" ලියවිල්ල ගොතන ලද්දක් නොවේ. එහෙත් එය පළ කරන ලද්දේ එහි කතෘවරුන්ගේ කැමැත්ත ඇතිව නොවේ; සමහර විට ඔවුන්ගේ අකැමැත්ත පිට විය හැකිය. කෙසේ හෝ වේවා, කථිකයාගේ අදහස්වල සම්පිණ්ඩණයක් පමණක් බෙදා හැර, එයට "Credo" යන නම තබා, ඊට විරෝධය ප්‍රකාශය සමග පුවත්පත්වල පළකිරීම පවා කරන ලදැයි කියන පැමිණිලි, මෙම නව වැඩ පිළිවෙළ[*] එළියට ඇද දැමීමට සහභාගි වුනු මෙම කෘතියේ කතෘ අසා ඇත! අප මේ සිද්ධිය ගැන සඳහන් කරන්නේ, අපගේ ආර්ථිකවාදයේ දක්නා ඉතාමත් අපූරු අංග ලක්ෂණය වන ප්‍රසිද්ධියට ඇති බිය එයින් හෙළිදරව් වන නිසාය. මෙම අංග ලක්ෂණය "Credo" ලියවිල්ලේ කතෘවරුන් කෙරෙහි පමණක් නොව, ආර්ථිකවාදීන් කෙරෙහි පොදුවේ දක්නට ලැබෙන්නකි. ඉතාමත් සෘජු ලෙස හා අවංක ලෙස කථා කරන ආර්ථිකවාදයේ පක්ෂවාදියා වන ''රබෝචය මිස්ල්''[36] පත්‍රයද, ("Vade-mecum"[37] ලිපි සංග්‍රහයෙහි 'ආර්ථිකවාදී' ලියවිලි පළ කිරීම ගැන කෝපාවිෂ්ට වුනු) ''රබෝචිය දියල'' පත්‍රයද, කීව් කාරක සභාවේ "Profession de foi"[38] නැමති ලියවිල්ල හා එහි ප්‍රතික්ෂේපය[**] පළ කිරීමට අවුරුදු දෙකට පෙර ඉඩ නොදුන් එම කාරක සභාවද, වෙනත් 'ආර්ථිකවාදයේ' නියෝජිතයන් රාශියක්ද කෙරෙහි එම ලක්ෂණය පවතින බව අනාවරණය විය.

මෙසේ විවේචනයට බිය වීමට හේතුව හුදු කපටිකම ම නොවේ. (සමහර විට කපටිකමද පාවිච්චි කෙරේ: නව ප්‍රවණතාවයේ ලාබාල හා තවමත් දුර්වල ළපැටියන් ප්‍රතිපාක්ෂිකයන්ගේ ප්‍රහාරයනට ලක් කිරීම දුර දර්ශී නොවේ!). 'ආර්ථිකවාදීන්' වැඩි දෙනා, සැබවින්ම, න්‍යායික තර්ක විතර්ක, කණ්ඩායම්වාදී මතභේද, පුළුල් දේශපාලන ප්‍රශ්න, විප්ලවවාදීන් සංවිධානය කිරීම සඳහා සැලසුම් යනාදිය දෙස බලන්නේ ('ආර්ථිකවාදය'ට ආවේනික ස්වභාවය අනුව විය යුතු පරිද්දෙන්ම) සරොසිනි. ''ඒසියල්ලම විදේශවල සිටින අයට භාර දෙන්න!''යි තරමක ස්ථිර ගතියක් දක්වන 'ආර්ථිකවාදියෙක්' දිනක් මට කීය. එයින් ප්‍රකාශ වූයේ ඉතාමත් පුළුල් ලෙස පැතිර තිබෙන (තවත් වෘත්තීය සමිතිවාදී) අදහසකි: අපගේ සැලකිල්ල යොමු වන්නේ මෙහි කම්කරු පංති ව්‍යාපාරය ගැනය; අපගේ ප්‍රදේශවල කම්කරු සංවිධාන ගැනය; අන් සියල්ලම න්‍යායාචාරීන්ගේ නිර්මාණමාත්‍රයන් වෙති. ''රබෝචිය දියල'' අංක 10 හා සමග එක්ව ''ඉස්ක්‍රා'' අංක 12 ලිපියෙහි කතෘවරු ප්‍රකාශ කළ පරිදි 'න්‍යාය අභිවාදනය කිරීමකි'

රුසියානු 'විවේචනයේ' සහ රුසියානු බර්න්ෂ්ටයින්වාදයේ විශේෂ අංග ලක්ෂණ එසේ වූ කල්හි, වචන මාත්‍රයෙන් පමණක් නොව, ක්‍රියාවෙන් අවස්ථාවාදයට විරුද්ධත්වය දැක්වීමට උත්සාහ කරන අපගේ කර්තව්‍ය විය යුත්තේ කුමක්ද? යන ප්‍රශ්නය දැන් මතු වේ. ප්‍රථමයෙන්ම, නීත්‍යානුකූල මාක්ස්වාදය බලපැවැත්වූ කාලයේ හරිහැටි ආරම්භ වී නො තිබුණු, රහසිගත ලෙස වැඩ කරමින් සිටි සහෝදරවරුන්ගේ කර පිට අළුතෙන් පැවරී තිබුණු, න්‍යායික කටයුතු යළිත් ආරම්භ කිරීමට ඔවුන් ප්‍රයත්න දැරිය යුතුව තිබුණි. එවැනි කාර්‍යයක් ඉටු නොකරන ලද විට ව්‍යාපාරයේ සංවර්ධනයක් කිසිසේත් ඇතිවිය හැකිව නොතිබුණි. දෙවැනිව, සැලකිය යුතු පරිමාණයකින් ජනතාවගේ සිත් විකෘති කිරීමෙහි යෙදී තිබුණු නීත්‍යානුකූල විවේචනය' ට විරුද්ධව ඔවුන් ක්‍රියාශීලී ලෙස සටන් කළ යුතුව තිබුණි. තුන්වැනිව, දැන හෝ නොදැන අපගේ වැඩ පිළිවෙළ හා උපක්‍රම කෙළෙසීමට දරන ප්‍රයත්න හෙළිදරව් කරමින් හා ප්‍රතික්ෂේප කරමින්, ක්‍රියාත්මක ව්‍යාපාරය තුළ අවුල් සහගත හා වැනෙන සුලු භාවයට විරුද්ධව ඔවුන් ක්‍රියාශීලී ලෙස සටන් කළ යුතුව තිබුණි.

කවුරුත් දන්නා ලෙසට ''රබෝචිය දියල'' පත්‍රය මෙයින් කිසිවක් කළේ නැත. මෙම සුප්‍රසිද්ධ කාරණය ගැන විවිධ අංගවලින් සලකා බලා කරුණු සඳහන් කිරීමේ අවස්ථාව මතුයෙහි අපට ලැබෙනු ඇත. එසේ වුවද, 'විවේචනය කිරීමේ නිදහස' ඉල්ලීමත්, අපගේ දේශීය විවේචනය හා රුසියානු 'ආර්ථිකවාදයේ' විශේෂත්වයනුත් අතර පවතින බරපතල ප්‍රතිවිරෝධය පමණක් මෙහිදී පෙන්වා දෙනු කැමැත්තෙමු. මෙහිදී ''රබෝචිය දියල'' පත්‍රයේ අදහස අනුමත කරමින් ''විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය'' සම්මත කළ යෝජනාවෙහි වැකිය යම්තමින් කියවීම ප්‍රමාණවත් වේ.

---

[*] මෙම සඳහන කර තිබෙන්නේ "Credo" ලියවිල්ල සම්බන්ධයෙන් දහහත් දෙනා පළකළ විරෝධය ගැනය. මෙම විරෝධය ප්‍රකාශය කෙටුම්පත් කිරීමට මෙම කෘතියේ කතෘ (1899 අවසානයේදී) සහභාගි විය.[35] විරෝධය ප්‍රකාශය සහ "Credo" ලියවිල්ල 1900 වසන්තයේදී විදේශයෙහි පළ කරන ලදී. "Credo" ලියවිල්ලේ කතෘ වූයේ මැඩම් කුස්කෝවා බවත්, එවකට විදේශගත 'ආර්ථිකවාදීන්' අතුරෙන් ප්‍රකපෝවිච් මහතා ඉතාමත් ප්‍රමුඛයෙකු වූ බවත්, ඈ ලියූ (මා හිතන හැටියට ''බිලෝය'' පත්‍රයේ) ලිපියකින් අනාවරණය වී ඇත. (1907 සංස්කරණයට කතෘගේ සටහන. සංස්කාරක.)

[**] අපට ලැබී ඇති තොරතුරු අනුව කීව් කාරක සභාවේ සාමාජිකත්වය ඉන් පසුව වෙනස් වී ඇත.

‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වැඩිදුර සංවර්ධනය උදෙසා, මෙම න්‍යායෙහි පංති සහ විප්ලවීය ස්වභාවයට පටහැනි නොවන තාක් දුරට, පක්ෂපාත පතපොත මගින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය විවේචනය කිරීමේ නිදහස අවශ්‍ය බව අපි පිළිගනිමු’’. (‘‘සම්මේලන දෙකක්’’, පිටු 10)

මේ පෙළඹීමට හේතුව? මෙම යෝජනාවේ ‘‘මුල් කොටස ලුබෙක් සම්මේලනයේදී බර්න්ෂ්ටයින් ගැන අනුමත කළ යෝජනාවට අනුරූපීය’’... මෙම පිටපත් කිරීම හේතු කොට ගෙන ඔවුන්ගේ testimonium paupertatis අසරණභාවය කොතරම් හොඳින් ස්ඵුට වී හෙළිදරව් වන්නේද යනු ‘සංගම්වාදීන්’ගේ නිවට ආත්මය නිසා ඔවුනට නොපෙනුනි!.. ‘‘එහෙත් ... ලුබෙක් සම්මේලනයටත් වඩා මෙහි දෙවන කොටසින් විවේචනය කිරීමේ නිදහස සීමා කෙරේ.’’

එසේනම් ‘‘විදේශගත සංගමයේ’’ යෝජනාව එල්ල කර තිබෙන්නේ රුසියානු බර්න්ෂ්ටයින්වාදීන්ට විරුද්ධවද? නො එසේ නම් ලුබෙක් ගැන සඳහන් කිරීම අන්ත මෝඩ කමකි! ඒ අතරම එයින් ‘‘විවේචනය කිරීමේ නිදහස සීමා කෙරුණු’’ බව කීම සත්‍ය නොවේ. ජර්මානුන්, ඔවුන්ගේ හැනෝවර් යෝජනාව සම්මත කර ගැනීමේදී, කරුණු එකින් එක ගනිමින් හරියටම බර්න්ෂ්ටයින් යෝජනා කළ සංශෝධන ප්‍රතික්ෂේප කළහ. එමෙන්ම ලුබෙක් යෝජනාවෙන් බර්න්ෂ්ටයින් පෞද්ගලික නමින් සඳහන් කර ඔහුට අවවාදයක් කළහ. කෙසේ හෝ වේවා, රුසියානු ‘විවේචනය’ හෝ රුසියානු ‘ආර්ථිකවාදය’ පෙනෙන්නට තිබෙන බවක් ගැන අපගේ ‘නිදහස්’ අනුකරණ කාරයන් එකද සඳහනක්වත් කරන්නේ නැත. මෙම කරුණ සඳහන් නොවීම නිසාත්, විශේෂයෙන්ම ‘ඊනියා ආර්ථිකවාදය’ (‘‘සම්මේලන දෙකක්’’, පිටු. 8, ඡේදය 1) හා අවස්ථාවාදය යන දෙකම එකක් බව හඳුනා ගැනීමට ‘‘විදේශගත සංගමය’’ නො කැමති වීම නිසාත්, න්‍යායෙහි විප්ලවීය ස්වභාවය ගැන පමණක් සඳහන් කිරීමෙන් සිදුවන්නේ වැරදි අර්ථ නිරූපනයකට මහත්සේ ඉඩ සැලසීමයි. එහෙත් මේ සියල්ල සඳහන් කළේ අතිරේක වශයෙනි. ප්‍රධාන කාරණය වන්නේ, රුසියාවේ විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් සම්බන්ධයෙන් හා ජර්මනියේ විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් සම්බන්ධයෙන් අවස්ථාවාදීන් ගන්නාවූ ස්ථාවරයන් එකිනෙකට හාත්පසින්ම පටහැනි වීමයි. අප දන්නා පරිදි, තිබෙන දෙය රැක ගැනීමට: කවුරුත් දන්නා සහ දශක ගණනාවක අත් දැකීමෙන් සියළු විස්තර පැහැදිලි වී තිබෙන වැඩ පිළිවෙළ හා උපක්‍රම රැකගැනීමට කැමති වෙති. එනමුත් ‘විවේචකයන්’ වෙනස් කිරීම් අපේක්ෂා කළද, මෙම විවේචකයන් නියෝජනය කරන්නේ ක්ෂුද්‍ර ප්‍රමාණ අඩුතරයක් වන නිසාත්, ඔවුන් සංශෝධනවාදී ප්‍රයත්න දරන්නේ ඉතාමත් බිය සුළු ස්වභාවයෙන් වන නිසාත්, ඔවුන්ගේ ‘‘නව නිපැයුම්’’ උද්‍යෝග රහිතව ප්‍රතික්ෂේප කිරීමෙන් බහුතරය අරමුණු කරන්නේ කුමක්ද යන්න කෙනෙකුට වටහා ගත හැක. එසේ වුවද රුසියාවේදී තිබෙන දෙය රැක ගැනීමට කැමති වන්නේ විවේචකයින් හා ‘ආර්ථිකවාදීන්’ ය. දිගටම ඔවුන් මාක්ස්වාදීන් ලෙස පිළිගැනීමත්, මෙතෙක් ඔවුන් පූර්ණ ලෙස භුක්ති විඳි ‘විවේචනය කිරීමේ නිදහස’ සහතික කිරීමත් අපෙන් ඉටුවිය යුතුයයි ඔවුහු බලාපොරොත්තු වෙති (මක්නිසාදයත්, ඔවුන් කිසිකලෙකත් කිසිම වර්ගයක පක්ෂ බැඳුම් පිළිනොගත් හෙයිනි*; එපමණක් නොව, අනුශාසනා මගින් හෝ විවේචනය කිරීමේ නිදහස ‘සීමා කිරීමට’ පොදුවේ පිළිගත් පක්ෂ මණ්ඩලයක් අපට තිබුණේ නැත). ‘වර්තමාන ව්‍යාපාරයේ ස්වෛරිභාවය’ පිළිගන්නා ලෙස ‘ආර්ථිකවාදීහු’ විප්ලවවාදීන්ට කියති (‘‘රබෝචිය දියල’’ අංක 10, පිටු 25). එයින් කියන්නේ පවත්නා දෙයෙහි ‘සුජාත භාවය’ පිළිගන්නා ලෙසය. ‘ද්‍රව්‍යමය අංගෝපාංගයන්ගේ හා ද්‍රව්‍යමය වාතාවරණයේ අන්තර් ක්‍රියාකාරිත්වයෙන් තීරණය වන’ මාර්ගයෙන් ව්‍යාපාරය ‘ඉවතට හැරවීමට’ උත්සාහ නොදරන ලෙස ඔවුහු ‘දෘෂ්ටිවාදීන්ට’

---

* රුසියාව හා ජර්මනිය අතර මූලික වෙනස පෙන්නුම් කරන කරුණ වූ ප්‍රසිද්ධ පක්ෂ බැඳීම් හා පක්ෂ සම්ප්‍රදයයන් නොතිබීම, අන්ධානුකරණය නිසා ඇතිවිය හැකි අන්තරාය දනවන අවවාදයක් ලෙසින් සියළුම මාක්ස්වාදී බුද්ධිමතුන්ට වැටහී යායුතුව තිබුණි. එහෙත් රුසියාවේ ‘විවේචනය කිරීමේ නිදහස’ කොතෙක් දුර යන්නේදැයි පැහැදිලි කිරීමට නිදර්ශනයක් මෙන්න. රුසියානු විවේචක බුල්ගාකව් මහතා අවුස්ත්‍රියානු විවේචක හෙර්ට්ස් වෙත පහත සඳහන් දෝෂාරෝපනය කරයි. ‘‘හෙර්ට්ස්ගේ නිගමනයන් ස්වාධීන වුවද, මෙම කාරණය ගැන (සමුපකාර සමිති ගැන) ඔහු පමණට වඩා දැඩි ලෙස පක්ෂයේ අදහස් කෙරෙහි එල්බ සිටින බව පෙනේ. ඔහු විස්තර කරුණු සම්බන්ධයෙන් එය සමග එකතු නොවුවත්, පොදු ප්‍රතිපත්තිය ඉවත ලීමට තරම් ශක්තියක් ඔහුට නැත’’ (’’ධනේශ්වරවාදය හා කෘෂිකර්මය’’, වෙළුම 11, පිටු. 287). සම්පූර්ණ දේශපාලන වහල්භාවයේ පවතින රටක, එහි වැසියන් දහසකින් නවසිය අනූ නව දෙනෙක්ම දේශපාලන දසත්වයෙන් ඇට මිදුළු දක්වා දූෂණය වී, පක්ෂ ගෞරවයක් හෝ බැඳුම් කොහෙත්ම නොමැතිව සිටියදී, එරටේ වැසියෙක්, පමණට වඩා දැඩි ලෙස ‘‘ඔහුගේ පක්ෂයේ අදහසෙහි එල්බ සිටීම’’ ගැන ව්‍යවස්ථානුකූල රාජ්‍යයක පුරවැසියෙකුට උද්ධච්ඡ ලෙස චෝදනා කරයි! විවේචනය කිරීමේ නිදහස ගැන යෝජනා සකස් කිරීම හැර කිරීමට වෙනත් දෙයක් අපගේ නීතිවිරෝධී සංවිධාන වලට නැත්තේමය...

කියති (“ඉස්ක්‍රා” අංක 12, “ලිපිය”). ‘වර්තමාන තත්වයන් යටතේ කම්කරුවන්ට යෙදෙනු හැකි අරගලය’ බලාපොරොත්තු වන අරගලය වශයෙන්ද, ‘වර්තමාන කාලය තුළ ඔවුන් ඇත්ත වශයෙන්ම යෙදී සිටින අරගලය’ කළ හැකි එකම අරගලය වශයෙන්ද පිළිගැනීමට ඔවුනට උවමනා **වී** ඇත (“රබෝචය මිස්ල්” පත්‍රයේ “විශේෂ අතිරේකය”,[39] පිටු. 14). ඊට ප්‍රතිවිරුද්ධ තත්වයක් ගන්නා විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වන අපි සාංසිද්ධිකතාවය, එනම්, ‘වර්තමාන අවස්ථාවේ’ පවත්නා දෙය හමුවේ වැඳ වැටීම ගැන නොසතුටු වෙමු. මෑත අවුරුදුවල බල පැවති උපක්‍රම වෙනස් කරන ලෙස අපි ඉල්ලමු. “අප එක්සත් වීමට පෙර, අප එක්සත් වනු පිණිස, ප්‍රථමයෙන්ම ස්ථිර හා නිශ්චිත සීමා රේඛාවන් සලකුණු කළ යුතු (“ඉස්ක්‍රා” පත්‍රය පළ කිරීම ගැන නිවේදනයෙන්*)” වන බව අපි ප්‍රකාශ කරමු. කොටින් කියතොත්, වෙනස් කිරීම ප්‍රතික්ෂේප කරන ජර්මාන්නු පවත්නා දෙය වෙනුවෙන් පෙනී සිටිති. පවත්නා දෙය වෙනස් කරන ලෙස ඉල්ලන අපි එයට සේවය කිරීම හෝ එය සමග එකඟත්වයක් ඇති කර ගැනීම **හෝ** ප්‍රතික්ෂේප කරමු.

ජර්මන් යෝජනා ‘නිදහස්’ ලෙස පිටපත් කරගන්නා අපේ අය මෙම ‘සුළු’ වෙනස දැකීමෙහි අසමත් විය!

ආ) න්‍යායික අරගලයේ වැදගත්කම ගැන එංගල්ස් ගෙන්

“රබෝචිය දියල” පත්‍රයේ ‘විවේචනය කිරීමේ නිදහසේ’ වීරයන් ආයුධ සන්නද්ධව නැගී සිටින්නේ ‘පොතේගුරුවාදය, න්‍යායවාදය’, ‘පක්ෂය දරදඬු කිරීම — බලෙන් චින්තනය අවහිර කිරීමේ අනිවාර්ණීය ඵලවිපාකය’ යන මේ සතුරන්ට විරුද්ධවය. මෙම ප්‍රශ්නය දෛනික කාර්‍ය්‍ය මාලාවට ඇතුලත් කර තිබීම ගැන අපි සතුටු වෙමු. අප තවත් ප්‍රශ්නයක් ඊට එකතු කරන්නෙමු.

විනිශ්චය කාරයෝ කවරහුද?

ප්‍රකාශකයින්ගේ නිවේදන දෙකක් අප හමුවේ ඇත. ඉන් එකක් “විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය කාලාන්තරිකව පළ කරන පුවත්පත වන “රබෝචිය දියල” සඳහා වැඩ පිළිවෙළ”ය. අනික “ශ්‍රම විමුක්ති කණ්ඩායමේ”[40] ප්‍රකාශනයන් නැවත ආරම්භ කරන බවට නිවේදනය”යි. දෙකෙහිම දිනම 1899 වේ. මේ වන විට ‘මාක්ස්වාදයේ අර්බුදය’ ගැන බොහෝ කාලයක් තිස්සේ සාකච්ඡා වී තිබුණි. එහෙත් අපට දක්නට ලැබෙන්නේ කුමක්ද? මෙම කාරණය ගැන කිසිම සඳහනක් හෝ, මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් නව පත්‍රය ගන්නට බලාපොරොත්තු වන ප්‍රතිෂ්ඨාව ගැන නිශ්චිත ප්‍රකාශයක් හෝ ඉන් පළමු නිවේදනයෙහි දක්නට නොලැබේ.1901 දී “විදේශගත සංගමයේ” තුන්වැනි සම්මේලනයෙන්[41] අනුමත කරන ලද මෙම වැඩ පිළිවෙළෙහි හෝ එහි අතිරේක වල හෝ, එයට මුහුණ පාන්නට සිදුවී ඇති න්‍යායික කටයුතු හා හදිසි කර්තව්‍යයන් ගැන වචනයක් වත් සඳහන්ව නැත (“සම්මේලන දෙකක්”, පිටු 15—18).මෙම ප්‍රශ්න නිසා සමස්ත ලෝකයේම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සිත් කැළඹුනු නමුත්, මෙම මුළු කාලය තුළම “රබෝචිය දියල” පත්‍රයේ කතෘ මණ්ඩලය එම ප්‍රශ්න ගැන සැලකිල්ලක් දැක්වූයේ නැත.

අනිත් අතට, මෑත අවුරුදුවලදී න්‍යාය ගැන උනන්දුව හීන වී ගොස් ඇති බව පෙන්නුම් කරන අනික් නිවේදනය, “නිර්ධන පංතියේ විප්ලවීය ව්‍යාපාරයේ න්‍යායික පැත්ත ගැන සුපරීක්ෂාකාරී අවධානය” යොමු කරන ලෙස ඉල්ලමින්, “බර්න්ෂ්ටයින්වාදයත්, අපගේ ව්‍යාපාරය තුළ ඇති අනිකුත් විප්ලව විරෝධී ප්‍රවණතාවයනුත් අනුකම්පා විරහිත ලෙස විවේචනය” කළ යුතු බවද කියයි. මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙන ආකාරය “සර්යා” පත්‍රයේ අද දක්වා කලාපවලින් පෙනේ.

චින්තනය වර්ධනය කිරීම සම්බන්ධයෙන් දක්වන නොසැලකිල්ල හා ඇති අසරණකම, චින්තනය දරදඬු කිරීම ආදියට එරෙහිව ඉදිරිපත් කරන මහා ශබ්දික වදන්වලින් ආවරණය කරනු ලබන බව අපට පෙනේ. මහත් සේ පාරට්ටු කරන විවේචනය කිරීමේ නිදහසෙන් අදහස් කෙරෙන්නේ එක් න්‍යායක් වෙනුවෙන් තවත් න්‍යායක් ආදේශ කිරීම නොව, මනාව මෙනෙහි කළ අංග සම්පූර්ණ න්‍යාය සියල්ලෙන්ම නිදහස ඉල්ලීමය. (බොහෝ කලකට පෙර ජර්මන් මාක්ස්වාදීන්ද දැක තිබෙන පරිදි) මෙය යුරෝපයටම පොදු කාරණයකි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ උදහරණයෙන් එය හොඳින් පැහැදිලි වේ. එයින් අදහස් වන්නේ සාරසංග්‍රහවාදය හා ප්‍රතිපත්ති විරහිත භාවය වේ. අප ව්‍යාපාරයේ තත්වය ගැන යන්තමින් හෝ දන්නා අයට ප්‍රත්‍යක්ෂ වනු ඇති පරිදි මාක්ස්වාදය පුළුල් ලෙස පැතිරී යාම හා සමග න්‍යායික මට්ටම යම් තරමකින් පහත වැටුනි. ව්‍යාපාරයේ ඇති ප්‍රායෝගික වැදගත්කම හා එහි ප්‍රායෝගික සාර්ථක තත්වය නිසා,

---

* වී. අයි. ලෙනින්, “‘“ඉස්ක්‍රා” කතෘ මණ්ඩලයේ නිවේදනය” බලන්න. සංස්කාරක

ඉතා අල්ප න්‍යායික අභ්‍යාසයක් ලැබූ, නැතහොත් එය කොහෙත්ම නොලැබූ අය බොහෝ දෙනෙක් ඊට සම්බන්ධ වූහ. "වැඩ පිළිවෙළවල් දුසිමකට වඩා තථ්‍ය ව්‍යාපාරයේ සෑම පියවරක්ම වැදගත් වන්නේය"[42] යන මාක්ස්ගේ ප්‍රකාශය, "රබෝචිය දියල" පත්‍රය විසින් විජයග්‍රාහී ලීලාවෙන් උපුටා දක්වනු ලැබීම කොතරම් ඔළු මොට්ටල දෙයක්ද යනු අපට සිතා ගත හැකිය. න්‍යායික අවුල් වියවුල් සහිත කාලයක මෙම වචන පුණරුච්ඡාරනය කිරීම, අවමංගල්‍යයකදී දුක්වන අයට "ශුභ උපන් දින උත්සවයක් වේවා!" යයි ප්‍රාර්ථනා කිරීම වැන්නකි. එපමණක්ද නොවේ. මෙම වචන උපුටා ගෙන තිබෙන්නේද මාක්ස්ගේ ගෝතා ප්‍රෝග්‍රෑම් නම් වැඩ පිළිවෙළෙනි.[43] ප්‍රතිපත්ති සකස් කිරීමේදී සාරසංග්‍රහවාදය අනුගමනය කිරීම මාක්ස් ඉතා තියුණු ලෙස හෙළා දැක තිබේ. ඔබට එක්සත්වීමට උවමනා නම් ව්‍යාපාරයේ ප්‍රායෝගික අරමුණු ඉටුවන ආකාරයට එකඟත්වයක් ඇති කරගන්න; එහෙත් ප්‍රතිපත්ති ගැන කේවෙල් කිරීමට ඉඩ නොදෙන්න; න්‍යායික 'සහනයන්' නොදෙන්න, යනුවෙන් මාක්ස් පක්ෂ නායකයන් වෙත ලියා යැවීය. මාක්ස්ගේ අදහස වූයේ මෙය නමුත්, ඔහුගේ නම පාවිච්චිකරමින් න්‍යායෙහි වැදගත්කම ලඝුකොට දක්වති!

විප්ලවීය න්‍යාය නොමැතිව විප්ලවීය ව්‍යාපාරයක් තිබිය නොහැක. ඉතාමත් පටු ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ මෝහනයක් සමග අතිනත් ගෙන අවස්ථාවාදයේ හැඩ කාර දේශනා පැවැත්වෙන මෙවැනි කාලයක මෙම අදහස කොතරම් අවධාරණය කළත් වැඩි නැත. තවත් කරුණු තුනක් හේතුකොට ගෙන රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට න්‍යායෙහි අගය තව තවත් වැඩි වන නමුත් එම කරුණු බොහෝ විට අමතක කරනු ලැබේ. ඉන් ප්‍රථම කරුණ නම්, අපගේ පක්ෂය තවමත් සකස් වෙමින් පැවතීමත්, මේ එහි අංගෝපාංගයක් පැහැදිලි වෙමින් පවත්නා අවස්ථාව වීමත්, ව්‍යාපාරය නිවැරදි මාවතෙන් ඉවතට හැරවීමට උත්සාහ කරන අනිකුත් විප්ලවවාදී චින්තනයන් හා සමග ඇති අරගල කිසිසේත් සංසිඳී නොතිබීමත්ය. ඒ හැරත් මෑත අතීතයද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන විප්ලවවාදී ප්‍රවණතාවයන් (බොහෝ කලකට පෙර 'ආර්ථිකවාදීන්'ට අනතුරු හඟවමින් අක්සෙල්රොද් කියා තුබූ පරිදි) නව ජීවනයක් ලැබූ කාලයක්ද විය. එනිසා බැලූ බැල්මට 'නොවැදගත්' වරදක් ලෙසට පෙනී යා හැකි දෙයකින්, මෙම තත්වයන් යටතේ, ඉතාමත් ඛේදජනක ප්‍රතිඵල ඇතිවීමට ඉඩ තිබෙන හෙයින්, කණ්ඩායම්වාදී ආරාවුල් හා මති මාත්‍ර අතර ඇති වෙනස්කම් පැහැදිලි කර ගැනීම අවස්ථාවෝචිත නොවේයයි සිතනු හැක්කේ අදූරදර්ශී පුද්ගලයන්ට පමණකි. අවුරුදු ගණනාවක් ඉදිරියට රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ඉරණම කෙබඳුදැයි තීරණය වනු ඇත්තේ කුමන නම් මති 'මාත්‍රය' ශක්තිමත් කෙරෙනවාද යන්න මත විය හැකිය.

දෙවැනුව, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සාරාර්ථය අනුවම එය ජාත්‍යන්තර ව්‍යාපාරයකි. මෙයින් අදහස් කෙරෙන්නේ අප ජාත්‍යෝන්මාදයට විරුද්ධව සටන් කළ යුතු බව පමණක් නොව, තරුණ රටක ජනිතව මතුවන ව්‍යාපාරයක් සාර්ථක වන්නේ අනෙකුත් රටවල අත්දැකීම් උපයෝගි කරගතහොත් පමණක්ය යන්නද වේ. මෙම අත්දැකීම් උපයෝගි කර ගැනීම පිණිස ඒවා ගැන දැන ගැනීම පමණක් හෝ අළුත්ම යෝජනා නිකමට පිටපත් කර ගැනීම හෝ ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා මෙම අත්දැකීම් විවේචනාත්මක ලෙස අගය කර, ස්වාධීන වශයෙන් ඒවා අත් හද බැලීමේ හැකියාව අවශ්‍ය වේ. මෙම කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන න්‍යායික බලවේග හා දේශපාලන (හා එමෙන්ම විප්ලවවාදී) අත්දැකීම් සම්භාරය කෙබඳුද යනු නූතන පංති ව්‍යාපාරයේ දැවැන්ත වර්ධනය හා අතුපතර විහිදීම ගැන අවබෝධයක් ඇති කෙනෙකුට වැටහෙනු ඇත.

තුන්වැනිව, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ජාතික කර්තව්‍යයන් ලෝකයේ අන් කිසිම සමාජවාදී පක්ෂයකට කිසිදක මුහුණ පෑමට සිදුවූ ආකාරයක ඒවා නොවේ. සර්වබලධාරී ඒකාධිපති වියගසෙන් මුළු ජනතාවම මුදා ගැනීමේ කර්තව්‍ය විසින් අපට පවරනු ලබන දේශපාලන හා සංවිධාන යුතුකම් ගැන කරුණු සඳහන් කිරීමේ අවස්ථාවක් තව ඉදිරියට සැලසේ.පෙරමුණු සටන්කරු කාර්යභාරය ඉටුකිරීමෙහි සමත් වන්නේ ඉතාමත් දියුණු න්‍යායෙන් මග පෙන්වීම ලබන පක්ෂය පමණක්ය යන්න මෙහිදී ප්‍රකාශ කරනු කැමැත්තෙමු. මෙහි අර්ථය පිළිබඳව යථාවබෝධයක් ලබනු පිණිස රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පූර්වගාමීන් වූ ගෙර්ට්සන්, බෙලින්ස්කි, චෙර්නිෂේව්ස්කි සහ හැත්තෑ ගණන්වල තරුමඬලක් සේ දීප්තිය විහිදූ විප්ලවවාදීන් සිහියට නගන ලෙස පාඨකයාගෙන් ඉල්ලමු. එහෙත් එතරමින් පමණක් නොසෑහෙන ලෙසද ඉල්ලමු!

සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙහිදී න්‍යායෙහි ඇති වැදගත්කම ගැන 1874 දී එංගල්ස් කී දෙය උපුටා දක්වමු. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී මහා අරගලයේ ඇත්තේ අප නිතර විස්තර කිරීමට පුරුද්දක් කොට ගෙන තිබෙන පරිදිවූ (දේශපාලන හා ආර්ථික) අංශ දෙකක් නොවේ. එංලේස් එහි අංශ තුනක් තිබෙන බව පිළිගෙන මුල් අංශ දෙක හා සමග න්‍යායික අරගලය ද සම මට්ටමක තැබීය. ප්‍රායෝගික හා දේශපාලන වශයෙන් ශක්තිමත් වී තිබුණු ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයට ඔහු කළ නිර්දේශ, අද පවතින ප්‍රශ්න හා වාද විවාද ගැන

සලකා බලන කල, ඉතාමත් උපදේශාත්මක වන හෙයින්, පොත් ඉතිහාසයේ ඉතාමත් දුර්ලභ ගණයේ කෘතියක් වන ඔහුගේ “Der deutsche Bauernkrieg”* නැමති පොතෙන් දීර්ඝ කොටසක් උපුටා දැක්වීම ගැන පාඨකයා අප සමග උරණ නොවෙතියි සිතමු.

‘‘සෙසු යුරෝපයට වඩා වාසිදායක කරුණු දෙකක් ජර්මන් කම්කරුවනට ඇත. ප්‍රථමයෙන්ම ඔවුහු යුරෝපයේ ඉතාමත් න්‍යායික ජනතාවට අයත් වෙති. එමෙන්ම, එම න්‍යාය පිළිබඳ හැඟීම, ඊනියා ‘උගත් පංති’ කෙරෙන් මුළුමනින්ම පාහේ ගිලිහී ගිය නමුත්, කම්කරුවන් එය රැක ගත්හ. පැවති එකම සමාජවාදය වන ජර්මන් විද්‍යාත්මක සමාජවාදයට පූර්වගාමී වූ ජර්මන් දර්ශනය, විශේෂයෙන්ම, හේගල්ගේ දර්ශනය නොමැතිව, එය කිසි කලෙකත් ජනිත නොවන්නට තිබිණි. කම්කරුවන් අතර න්‍යායික හැඟීමක් නොතිබෙන්නට, සිදුවී තිබෙන තරමට විද්‍යාත්මක සමාජවාදය ඔවුන්ගේ ලේ මස් තුළට කිසි සේත් ඇතුළු නොවනු ඇත. එක් අතකින් සියළු න්‍යාය කෙරෙහි දක්වනු ලබන උදසීනත්වය අනුව බලන කල මෙය අපරිමිත වාසියකි. ඉංග්‍රිසි කම්කරු පංති ව්‍යාපාරයේ එක් එක් වෘත්තීය සමිති ඉතාමත් විශිෂ්ඨ ලෙස සංවිධානය වී ඇතත් එම ව්‍යාපාරය ඉතා හෙමින් ගාටන තත්වයක පැවතීමට එක් ප්‍රධාන හේතුවකි, න්‍යාය සම්බන්ධයෙන් දක්වන උදසීනත්වය. අනිත් අතට, පෘධොන්වාදය,[44] එහි මුල් ස්වභාවය මගින් ප්‍රන්ස හා බැල්ජියන් වරු අතරද, බකූනින් එයට දුන් විකට ස්වරූපය මගින් ස්පාඤ්ඤ හා ඉතාලි වරු අතරද ඇති කළ අනාදරය හා අවුල ගැන සලකා බලන කල එම වාසිය පෙනී යයි.

‘‘දෙවැනි වාසිය නම්, කාල පිළිවෙළ අනුව කියතොත් ජර්මානුන් අන්තිමම කම්කරු පංති ව්‍යාපාරයට එළඹීමයි. ජර්මන් න්‍යායික සමාජවාදය රැඳී පවත්නේ සෙන්-සිමෝන්, පුරියේ හා ඕවන් යන විකාර සංකල්පනා හා මනෝරාජික අදහස් දැරුවා වූ නමුත් මහා චින්තකයන් අතර සදාකාලිකවම වැජඹෙනු නිසැකවන, අප දැන් විද්‍යාත්මක ලෙස ඔප්පු කරන කරුණු රාශියක් ස්වකීය බුද්ධි මහිමයෙන් ඒ කල්තියා දුටු, මහා පුරුෂයන් තිදෙනාගේ උර මත බව එය කිසි කලෙකත් අමතක නොකරනු ඇත. එමෙන්ම, ඉංග්‍රිසි හා ප්‍රන්ස ව්‍යාපාර ඉතා ඉහළ මිළක් ගෙවා ලබාගත් අත්දැකීම් වලින් ජර්මනියේ ප්‍රායෝගික කම්කරු ව්‍යාපාරයට පහසුවෙන් ප්‍රයෝජන ගත හැකි බවත්, ඒකාලයේ එම ව්‍යාපාරවලට බොහෝ දුරට වැලැක්විය නොහැකිවූ වැරදි දැන් මග හැරිය හැකි බවත්, තමන් එම ඉංග්‍රිසි හා ප්‍රන්ස ව්‍යාපාරවල උර මත වර්ධනය වූ බවත් එය කිසි කලෙකත් අමතක නොකළ යුතුය. ඉංග්‍රිසි වෘත්තීය සමිතිවල හා ප්‍රන්ස කම්කරුවන්ගේ දේශපාලන අරගල වල පූර්වාදර්ශයන් නොමැති වන්නට, පැරිස් කොමියුනයෙන් ලද අත්දැකීම් නොමැති වන්නට අප දැන් කොතැනක සිටිනු ඇද්ද?

‘‘දුර්ලභ විචාර බුද්ධියක් ප්‍රදර්ශනය කරමින් ජර්මන් කම්කරුවන් තමන් ලත් වාසිදායක තත්වයෙන් ප්‍රයෝජන ගෙන තිබෙන බව ප්‍රසංශාත්මකව ප්‍රකාශ කළ යුතුය. කම්කරු පංති ව්‍යාපාරයක් ඇතිවීමෙන් පසු ප්‍රථම වතාවට අරගලයේ අංශත්‍රයම — න්‍යායික, දේශපාලන හා ප්‍රායෝගික-ආර්ථික (ධනපතියනට විරුද්ධත්වය) — සංගත ලෙස හා එවායේ අන්තර් සම්බන්ධය ඇතිව ක්‍රමාණුකූල ලෙස ගෙනයනු ලැබේ. ජර්මන් ව්‍යාපාරයේ ශක්තිය හා අපරාජිත භාවය රඳා පවත්නේ මෙම සමකේන්ද්‍රිකයයි කිවහැකි ප්‍රහාරය තුළය.

‘‘එක් අතකින් මෙම වාසිදායක තත්වයන් නිසාද, අනික් අතට ඉංග්‍රිසීන්ගේ අන්තරාවතත විශේෂතාවයන් හා ප්‍රන්ස ව්‍යාපාරය බලෙන් මර්දනය කරනු ලැබීම නිසාද, ජර්මන් කම්කරුවන් දැනට නිර්ධන පංති අරගලයේ පෙරමුණ දරන තත්වයට පත්ව ඇත. ඔවුනට මෙම තත්වය දැරීමට සිදුවීම් අනුව කොතරම් කලක් ඉඩ ලැබේද යන්න ගැන අනාවැකි පළ කළ නොහැකිය. එහෙත් ඔවුන් මෙම තත්වය දරන තාක් කල් ඊට ගැලපෙන ලෙස කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමු. මේ සඳහා අරගලයේ හා උද්ඝෝෂණයේ සෑම ක්ෂේත්‍රයකම දරන ප්‍රයත්නයන් දෙගුණ තෙගුණ කිරීම අවශ්‍ය වේ. සියළුම න්‍යායික ප්‍රශ්න සම්බන්ධයෙන් වඩ වඩාත් පැහැදිලි විනිවිද දක්නා අවබෝධයක් ලබා ගැනීමත් පැරණි ලෝකාවබෝධයෙන් උරුම කොට ලද්දවූ සම්ප්‍රදයික අදහස්වල බලපෑමෙන් තමන් වඩ වඩාත් නිදහස් වීමත්, සමාජවාදය විද්‍යාවක් බවට පත්ව ඇති නිසා, එය විද්‍යාවක් ලෙස ක්‍රියාවට නැගිය යුතු, එනම් එය අධ්‍යයනය කළ යුතු බව නිතරම සිත්හි දරා ගෙන සිටීමත්, නායකයන්ගේ විශේෂ යුතුකම වන්නේය. ඉටු කළ යුතු කර්තව්‍ය නම්, එසේ ලබාගත් වඩාත් පැහැදිලි අවබෝධය ජනතාව හා කම්කරුවන් අතර වඩාත් දැඩි උනන්දුවෙන් ප්‍රචලිත කිරීමය; පක්ෂයේ හා වෘත්තීය සමිතිවල යන දෙකෙහිම සංවිධාන කටයුතු වඩ වඩාත් දැඩි ලෙස එකට වෙළීමය...

‘‘...මේ ආකාරයෙන් ජර්මන් කම්කරුවන් පෙරට යතහොත්, ඔවුන් සටන් පෙරමුණේ ගෞරවනීය තත්වයක් දරනු ඇත — කිසියම් රටක කම්කරුවන් මෙම ව්‍යාපාරයේ මුලින් ගමන් කිරීම ව්‍යාපාරයේ

---

*Dritter Abdruck. Leipzig, 1875. Verlag der Genossenschaftsbuchdruckerei (‘‘ජර්මනියේ ගොවි යුද්ධය’’. තුන්වැනි මුද්‍රණය. ලයිප්සිග්, 1875. සමූපකාර ප්‍රකාශකයෝ. සංස්කාරක)

යහපතට කිසිසේත් අදාල නොවන හෙයින් ඔවුන් මුලින් ගමන් කරනු ඇතැයි කිව නො හේ; එමෙන්ම බලාපොරොත්තු රහිත උග්‍ර දුෂ්කරතාවයන් නැතහොත් හාරදූර සිදුවීම් හමුවේ වැඩි ධෛර්‍යයකින්, වැඩි අධිෂ්ඨානයකින් හා ශක්තියකින් කටයුතු කිරීමට ඔවුනට සිදුවූ විටෙක, ඔවුන් ඊට මුහුණ දීමට තරම් සන්නද්ධ තත්වයක සිටිනු ඇත.''

එංගල්ස්ගේ කියමන අනාවැකියක් බඳුවිය. අවුරුදු කීපයක් ඇතුළත පනවන ලද සමාජවාදීන්ට විරුද්ධ අතිවිශේෂ නීතිය මගින් ජර්මන් කම්කරුවන් බලාපොරොත්තු නොවූ දුෂ්කර තත්වයන්ට පත් කරන ලදී. සන්නද්ධ ලෙස සටනට ඉදිරිපත් වීමෙන් ඔවුහු එම දුෂ්කරතාවයන්ට මුහුණ දී ජය ලැබීමට සමත් වූහ.

රුසියානු නිර්ධන පංතිය ඊටත් වඩා උග්‍ර අපරිමේය දුෂ්කරතාවයන්ට ලක් වනු ඇත. ව්‍යවස්ථාවක් ඇති රටක සමාජවාදීන්ට විරුද්ධ අතිවිශේෂ නීතිය අහුවූ මිට්ටෙකු නම්, රුසියානු නිර්ධන පංතියට සටන් කිරීමට සිදුවන්නේ යෝධ මෘගයෙකුට විරුද්ධවය. ඕනෑම රටක නිර්ධන පංතියට මුහුණ දෙන්නට සිදුවී තිබෙන සියළුම හදිසි කර්තව්‍යයන් අතුරෙන් ඉතාමත් විප්ලවවාදී වූ හදිසි කර්තව්‍ය ඉතිහාසය මගින් අප හමුවේ තබා ඇත. යුරෝපීය ප්‍රතිගාමිත්වයේ පමණක් නොව (දැන් සඳහන් කිරීම සුදුසු වන) ආසියාතික ප්‍රතිගාමිත්වයේද ඉතාමත් ශක්තිමත් බල කඳවුරු විනාශ කිරීමේ මෙම කර්තව්‍ය ඉටු කිරීම තුළින් රුසියානු නිර්ධන පංතිය අන්තර්ජාතික විප්ලවවාදී නිර්ධන පංති ව්‍යාපාරයේ පෙරමුණු බල ඇණිය බවට පත්වනු ඇත. එක් දහස් අටසිය හැත්තෑ ගණන්වල ව්‍යාපාරයට වඩා සිය දහස් ගුණයකින් සුවිසල් හා ගැඹුරු අපගේ ව්‍යාපාරය, එය තරම්ම කැපවූ අධිෂ්ඨානයකින් හා ප්‍රාණවත්භාවයකින් ප්‍රබෝධමත් කොට ගතහොත්, අප පූර්වගාමී හැත්තෑ ගණන්වල විප්ලවවාදීන් කලින් දිනාගත් ඒ පදවිනාමය ලබා ගත හැකිය යන විශ්වාසය ඇති කර ගැනීමට අපට අයිතියක් තිබේ.

II

පොදු ජනතාවගේ සාංසිද්ධිකතාවය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විඥානය

අපගේ ව්‍යාපාරය හැත්තෑ ගණන් වල ව්‍යාපාරයට වඩා බෙහෙවින් සුවිසල් බවත්, එම ව්‍යාපාරයට ජීව ගුණය දුන් කැප වීමෙන් යුත් අධිෂ්ඨානයටත්, ශක්තියටත් සමාන ජීව ගුණයකින් අප ව්‍යාපාරය ප්‍රබෝධමත් කරගත යුතු බවත් අපි කීවෙමු. වර්තමාන ව්‍යාපාරයේ ශක්තිය ජනතාවගේ (විශේෂයෙන්ම කාර්මික නිර්ධන පංතියේ) පිබිදීම මත රැඳී පවතී; විප්ලවවාදී නායකයන් තුළ විඥානය හා ක්‍රියාරම්භක ශක්තිය නොමැති වීම මත එහි දුර්වලතාවය රැඳී පවතී. මෙම කාරණය ගැන මෙතෙක් කිසිවෙකු සැක නොකළේයයි සිතමු.

එසේ වුවද, මෙම ප්‍රශ්නය ගැන මෙතෙක් පිළිගත් සියළුම මත බිඳ හෙළීමේ තර්ජනය රැගත් පුදුම එළවන සොයා ගැනීමක් මෑතදී සිදු විය. මෙම සොයා ගැනීම කළේ ''රබෝචිය දියල'' පත්‍රයයි. ''ඉස්ක්‍රා'' සහ ''සර්යා'' පත්‍ර සමග ගෙන ගිය විවාදයේ දී, එක් එක් කරුණු ගෙන ස්වකීය විරුද්ධත්වය දැක්වීමට සීමා නොවූ එය, 'පොදු අසම්මතියක්' පැන නගින්නේ වඩාත් ගැඹුරු හේතුවක් නිසා යයිද, ඒ ව්‍යාපාරයේ ''සාංසිද්ධික ස්වභාවයත් විඥානීය 'ක්‍රමානුකූල' හාවයත් යන දෙකෙහි සාපේක්ෂ වැදගත්කම අගය කිරීමේදී දක්වන වෙනස'' නිසා යයිද පෙන්නුම් කිරීමට උත්සාහ කළේය. ''රබෝචිය දියල'' පත්‍රය එහි දෝෂාරෝපණය ඉදිරිපත් කළේ ''සංවර්ධනයේ වාස්තවික නැතහොත් සාංසිද්ධික ස්වභාවයේ වැදගත්කම සුළු කොට තැකීමක්''* කෙරෙන බව කියමිනි. මේ ගැන අපි මෙසේ කියමු: ''ඉස්ක්‍රා'' සහ ''සර්යා'' පත්‍ර සමග ''රබෝචිය දියල'' පත්‍රය ගෙන ගිය විවාදයෙන් 'පොදු අසම්මතිය' පිළිබඳ සොයා ගැනීමට එය යොමු වීම හැර වෙනත් ප්‍රතිඵලයක් නොලැබුණත්, එම සොයා ගැනීම පමණක් වුවද අපට සැලකිය යුතු සතුටක් ගෙන දේ: මෙම තීසිසය එතරම්ම වැදගත්ය; රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර අද පවත්වන න්‍යායික හා දේශපාලන අසමගිකම්වල හරවත්ම කොටස එයින් එතරම්ම හොඳින් හෙළිදරව් වේ.

මේ හේතුකොට ගෙන විඥානය හා සාංසිද්ධිකතාවය අතර සම්බන්ධය පිළිබඳ ප්‍රශ්නය ගැන අතිවිශාල පොදු උනන්දුවක් දක්නට ලැබේ. එනිසා මේ ප්‍රශ්නය ගැන බොහෝ දුරට සවිස්තර ලෙස කරුණු සඳහන් කළ යුතුය.

අ) සාංසිද්ධික උත්සන්නියේ ආරම්භය

එක් දහස් අටසිය අනූ ගණන්වල මැද හාගයේ රුසියාවේ උගත් තරුණ ජන සමස්තයම මාක්ස්වාදී න්‍යායෙහි නිමග්නව සිටි ආකාරය ඉහත පරිච්ඡේදයෙන් පෙන්වා දුනිමු. 1896 සුප්‍රසිද්ධ සාන්ත පිටර්ස්බර්ග්

---

*''රබෝචිය දියල'' අංක 10, 1901 සැප්තැම්බර්, පිටු 17—18. අවධාරණය ''රබෝචිය දියල'' පත්‍රයෙහි විය.

කාර්මික සංග්‍රාමයෙන්[45] අනතුරුව සිදුවූ වැඩ වර්ජනද එවැනිම පොදු ස්වභාවයක් ගත්තේය. එම වැඩ වර්ජන රුසියාවේ සියළුම ප්‍රදේශවලට පැතිරීම නිසා නැගී එන බහුජන ව්‍යාපාරයේ ගැඹුර හොඳින් විද්‍යාමාන විය... 'සාංසිද්ධික ස්වභාවය' ගැන කථා කරතොත් අන් සියල්ලටම වඩා සැබැවින්ම සාංසිද්ධික වශයෙන් ගිණිය යුත්තේ මෙම වැඩ වර්ජන ව්‍යාපාරයයි. නමුත් සාංසිද්ධිකතාවය ඒකාකාර නොවේ. හැත්තෑ ගණන්වල හා හැට ගණන්වලත් (දහ නව වැනි ශත වර්ශයේ මුල් අර්ධයේ පවා) වැඩ වර්ජන ඇතිවිය. එම වැඩ වර්ජන හා සමාගම්ව 'සාංසිද්ධික' ලෙස යන්ත්‍ර ආදිය විනාශ කිරීමත් සිදුවිය. මෙම 'කැරළි' හා සමග සසඳා බලන විට අනූ ගණන්වල වැඩ වර්ජන 'විඥාන ස්වභාවයක් දැක්වූ' බව කීම නිවැරදි විය හැක. මේ කාලය තුළ කම්කරු පංති ව්‍යාපාරය ලැබූ ප්‍රගතිය එතරම් හොඳින් එම වැඩ වර්ජනවලින් සලකුණු කෙරිනි. 'සාංසිද්ධික ස්වභාවයෙන්' සාරානුකූලව නියෝජනය වන්නේ බීජාංකුර ආකාරයේ විඥානය මිස අන්කිසිවක් නොවන බව මෙයින් පෙනේ. පෞරාණික කැරළිවලින් පවා ප්‍රකාශිත වූයේ විඥානයේ යම් ප්‍රමාණ පිබිදීමකි. තමන් පීඩාවට පත් කරන ක්‍රමයේ සදාකාලික බව කියන ඔවුන්ගේ කාලාන්තර විශ්වාසය කම්කරුවන් කෙරෙන් තුරන් වන්නට විය; එමෙන්ම දසාකාරයෙන් බලධාරීන්ට යටත් වීමේ ක්‍රියා මාර්ගය නිශ්චිත වශයෙන්ම අත්හැර දමමින්, සාමූහිකව විරෝධය දැක්වීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගැනීමට පටන් ගෙන ඇතැයි මා නොකියතත්, ඉවෙන් මෙන් ඒ ගැන දැන ගන්නට පටන් ගත්හ. එහෙත් මෙය සිදුවූයේ අරගලයකට වඩා අවදනම යටතේ නැතහොත් පළි ගැනීමේ ස්වභාවයෙන් කඩා පැනීමක ස්වරූපයෙනි. අනූ ගණන්වල වැඩ වර්ජනවලදී ඊට වඩා දීප්තිමත් විඥාන ආලෝක ධාරාවන් දකින්නට ලැබුණි; නිශ්චිත ඉල්ලීම් ඉදිරිපත් කිරීමත්, වැඩ වර්ජනය සඳහා සුපරීක්ෂාකාරී ලෙස කල්යල් නියම කර ගැනීමත්, දන්නා වෙනත් ස්ථානවල ඇති වූ මෙවැනි සිදුවීම් හා අවස්ථා ගැන සාකච්ඡා කිරීමත් ආදිය සිදුවිය. කැරළි වූකලී, පීඩාවට පත් වූවන්ගේ සරල විරෝධය පෑමක් වූ අතර, ක්‍රමානුකූල වැඩ වර්ජනවලින් පිළිබිඹු වූයේ බීජාංකුර අවධියේ පංති අරගලයයි. එහෙත් එය බීජාංකුර අවධිය පමණකි. මෙම වැඩ වර්ජන පමණක් තනිකර ගත් කළ ඒවා හුදු වෘත්තීය සමිතිවාදී අරගල වූහ. ඒවා තවමත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අරගල බවට පත්ව නොතිබිණි. කම්කරුවන් හා ස්වාමි වරුන් අතර ප්‍රතිවිරෝධයන් පිබිදීම එයින් සලකුණු විය. එහෙත් ස්වකීය උවමනාවන් මුළු මහත් නූතන දේශපාලන හා සමාජ ක්‍රමයම සමග නොපෑහෙන්නක් ලෙසින් පවතින ප්‍රතිරෝධය පිළිබඳ විඥානය කම්කරුවන්ට ලැබී තිබුණේ නැත; ලැබීමට හැකියාවක්ද තිබුණේ නැත. ඒ දක්වාම ඔවුන්ගේ විඥානය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී විඥානය නොවිය. 'කැරළි' හා සමග සසඳා බලන කල අනූ ගණන්වල වැඩ වර්ජන දැවැන්ත ප්‍රගතියක් පෙන්නුම් කළ නමුත්, මෙම අර්ථයෙන් බලන කල ඒවා හුදු සාංසිද්ධික ව්‍යාපාරයක්ම වූයේය.

කම්කරුවන් අතර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී විඥානය තිබිය නොහැකි වූ බව අපි කියා ඇත්තෙමු. එය පිටතින් ඔවුන් වෙත ගෙන ඒමට හැකිව තිබුණි. කම්කරු පංතියට ස්වකීය අධ්‍යාපනයෙන්ම පමණක් ඇති කරගත හැකි වන්නේ වෘත්තීය සමිතිවාදී විඥානය එනම්, ස්වාමි වරුන්ට විරුද්ධව සටන් කිරීම සඳහා සහ ඊට අවශ්‍ය නීති සම්පාදනය කරවීමට ආණ්ඩුවලට බල කිරීම ආදිය සඳහා සංගම් තුළ එක්සත් විය යුතුය යන අවබෝධය පමණක්ය යනු සියළුම රටවල ඉතිහාසයෙන් පෙනේ.* එසේ වුවද දේපල හිමි පංතිවලට අයත් උගතුන් විසින් පැහැදිලි කරන ලද දර්ශනවාදී, ඓතිහාසික හා ආර්ථික න්‍යායන් තුළින් සමාජවාදී න්‍යාය ජනිත විය. නවීන විද්‍යාත්මක සමාජවාදයේ නිර්මාතෘවරයන් වූ මාක්ස් හා එංගල්ස්ද සමාජ තත්වය අනුව ධනේශ්වර බුද්ධිමත් ගණයට අයත් වූහ. ඒ ලෙසටම රුසියාවේද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායික ධර්මය කම්කරු පංතියේ සාංසිද්ධික වර්ධනයෙන් සම්පූර්ණයෙන්ම නිදහස්ව පැන නැංගේය. එය පැන නැංගේ විප්ලවවාදී-සමාජවාදී බුද්ධිමතුන් අතර චින්තනය දියුණු වීමේ ස්වාභාවික හා අනිවාරණීය ප්‍රතිඵලයක් වශයෙනි. සාකච්ඡාවට බඳුන්ව ඇති කාලයවන මධ්‍යම අනූ ගණන් වලදී, මෙම ධර්මයෙන් "ශ්‍රම විමුක්ති කණ්ඩායමේ" සම්පූර්ණ කරගත් වැඩ පිළිවෙළ නියෝජනය වූනා පමණක් නොව, ඒ වනවිට රුසියාවේ විප්ලවවාදී තරුණ බහුතරයද එයට පක්ෂව සිටියේය.

එම නිසා වැඩ කරන ජනතාවගේ සාංසිද්ධික පිබිදීමත්, විඥාන ජීවිතයක හා විඥාන අරගලයක අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයත් යන කරුණු දෙකද, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායෙන් සන්නද්ධ වූ හා කම්කරු පංතිය දෙසට නැමුණු තරුණ පරපුරක්ද අපට ඇත. ඒ කාලයේ ප්‍රථම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් (එවකට තවමත් කෙටුම්පත්

---

* සමහරු සිතන ලෙසට වෘත්තීය සමිතිවාදය මුළුමනින්ම 'දේශපාලනයෙන්' තොර නොවේ. වෘත්තීය සමිති නිතරම යම් යම් දේශපාලන (එහෙත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන) උද්ඝෝෂණ හා අරගල ගෙන ගියහ. වෘත්තීය සමිති දේශපාලනය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය අතර වෙනස ගැන මීළඟ පරිච්ඡේදයෙහි සඳහන් කරමු.

තත්වයේ තිබුණු ‘‘උද්ඝෝෂණය ගැන’’ යන කුඩා පොතෙහි අන්තර්ගත හා නියත ලෙසම ප්‍රයෝජනවත් වූ හෝඩුවාවන් ඔස්සේ යමින්) ඉතාමත් උත්සුක්ත ලෙස ආර්ථික උද්ඝෝෂණය ගෙන ගිය නමුත්, ඔවුන් මෙය තමන්ගේ එකම කාර්ය ලෙස නොසැලකූ බව නිතර අමතක කෙරුණු (හා සංසන්දනීය වශයෙන් අප්‍රසිද්ධ) එහෙත් මෙහිලා සඳහන් කළ යුතු විශේෂයෙන්ම වැදගත් වන කාරණයකි. එපමණක් නොව, මුල් ආරම්භයේ පටන්ම ඔවුහු රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සඳහා, ඉතාමත් දුරගාමී පොදු ඓතිහාසික කර්තව්‍යයන්ද, විශේෂයෙන්ම, සර්වබලධාරී ඒකාධිපතිත්වය පෙරළා දැමීමේ කර්තව්‍යයද නියම කර ගත්හ. ඒ අනුව ‘‘කම්කරු පංති විමුක්ති අරගල සංගමය’’[46] ආරම්භ කළ සාන්ත පීටර්ස්බර්ග් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් කණ්ඩායම 1895 අවසානයේ පමණ ‘‘රබෝචිය දියල’’ නම් පත්‍රයක ප්‍රථම කලාපය සකස් කළහ. මෙම කලාපය මුද්‍රණය සඳහා යැවීමට සූදානම්ව තිබියදී 1895 දෙසැම්බර් 8 දින රාත්‍රියේ කණ්ඩායමේ සාමාජිකයෙකු වූ ආ. ආ. වනේයෙව්* ගේ නිවස වැටලූ පොලිසිය එය අල්ලාගත් හෙයින් ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ ප්‍රථම සංස්කරණය දහවල් එළිය දුටුවේ නැත. (සමහර විට තව අවුරුදු තිහකට පමණ පසුව පොලිස් දෙපාර්තමේන්තුවේ පැරණි ලේඛන අතරින් සොයා ගැනීමට හැකිවනු ඇති). “රුස්කයා ස්තරිනා’’සංගරාවක[47]කවර හෝ දැකිය හැකි මෙය මෙම කලාපයේ ප්‍රධාන ලිපියෙන් රුසියාවේ කම්කරු පංතියේ ඓතිහාසික කර්තව්‍යයන් සැකෙවින් විස්තර කර, දේශපාලන නිදහස ලබා ගැනීමට මුල් තැන දෙන ලදී. ‘‘අප ඇමති වරුන් කල්පනා කරන්නේ කුමක් ගැන ද?’’ යන ලිපියක්ද මෙම කලාපයට ඇතුලත් විය. එය, පොලිසිය මගින් මූලික අධ්‍යාපන කාරක සභා මර්දනය කිරීම ගැන ලියා තිබුණකි. ඊට අමතරව සාන්ත පීටර්ස්බර්ග් නගරයෙන් හා තවත් වෙනත් පෙදෙස්වලින් (නිදර්ශනයක් වශයෙන් යරස්ලාවල් පළාතේ කම්කරුවන් ඝාතනය කිරීම ගැන වැනි[48]) ලිපි සමහරක්ද විය. අප කරුණු වරදවා තේරුම් නොගන්නේ නම්, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මෙම ‘ප්‍රථම ප්‍රයත්නය’ හුදෙක් ප්‍රාදේශීය ප්‍රයත්නයක් නොවූ බවත්, එය කොහෙත්ම ‘ආර්ථිකවාදී’ නොවූ බවත්, ඒකාධිපති විරෝධී විප්ලවවාදී ව්‍යාපාරය හා වැඩ වර්ජන ව්‍යාපාරය එක්සත් කිරීමත්, ප්‍රතිගාමී අන්ධ භක්තික ප්‍රතිපත්තියෙන් පීඩිත වූවන් සමාජ-ප්‍රජාතන්ත්‍රයේ පැත්ත ට දිනාගැනීමත් අරමුණු කළ එකක් බවත් පෙනෙනු ඇත. එවැනි පත්‍රයක්, ප්‍රධාන නගරයේ කම්කරුවන්ගේ සහ විප්ලවවාදී බුද්ධිමතුන්ගේ උණුසුම් පිළි ගැනීමටත්, පුළුල් ලෙස ප්‍රචාරය වීමටත් ඉඩ තිබුණු බව, එකල ව්‍යාපාරයේ තත්වය ගැන යම්තමින් හෝ දන්නා කිසිවෙකුටත් අවිශ්වාස කිරීමට ඉඩක් තිබුණේ නැත. මෙම ව්‍යායාමය අසාර්ථක වීමෙන් පෙනී ගියේ, එකල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට විප්ලවවාදී පළ පුරුද්ද හා ප්‍රායෝගික පුහුණුව නොතිබුණු හෙයින් ඔවුන් එකල හදිසි අවශ්‍යතාවය ඉටු කිරීමට නොහැකිව සිටි බව පමණකි. සාන්ත පීටර්ස්බර්ග් ‘‘රබෝචි ලිස්තොක්’’[49] පත්‍රයද, විශේෂයෙන්ම ‘‘රබෝචයා ගසෙත’’ සහ 1898 වසන්තයේදී පිහිටුවන ලද රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ ‘‘මැනිපෙස්ටෝ’’[50] යන පත්‍රද ගැන කිව යුත්තේ එයමය. එවකට සිටි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් නිසි සූදානමින් නොසිටීම ගැන ඔවුනට සිහිනෙන් හෝ දෝෂාරෝපනය කිරීමට අපි කිසිසේත් අදහස් නොකරමු. එහෙත් එම ව්‍යාපාරයේ අත් දැකීම්වලින් ප්‍රයෝජන ගැනීම හා එයින් ප්‍රායෝගික පාඩම් ඉගෙන ගැනීම පිණිස, එහි එක් හෝ අනික් දුර්වලකමට හේතුව හා එහි බරපතලකම ගැන අපි මැනවින් වටහා ගත යුතු වෙමු. එහෙයින් 1895—1898 කාලය තුළ ක්‍රියාශීලීව සිටි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගෙන් කොටසක් (සමහර විට බහුතරය වුවද) එකලදී පවා, ‘සාංසිද්ධික’ ව්‍යාපාරයේ මූලාරම්භයේදීම පවා, ඉතාමත් පුළුල් වැඩ පිළිවෙළක් හා සටන්කාමී උපායික ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇතැයි යුක්ති සහගත ලෙස කල්පනා කළ බව තහවුරු කිරීම බෙහෙවින් වැදගත්ය.* විප්ලවවාදීන්ගෙන්

---

* ආ. ආ. වනේයෙව්, පිටුවහල් කිරීමට පෙර හුදකලාව සිරකර සිටියදී වැළඳුනු ක්ෂයරෝගයෙන් 1899 දී නැගෙන හිර සයිබීරියාවේදී මිය ගියේය. ඉහත සඳහන් තොරතුර පළ කිරීමට හැකි බව අප තීරණය කළේ එහෙයිනි. එම තොරතුරු ආ. ආ. වනේයෙව් කිට්ටුවෙන් හා කෙළින්ම ආශ්‍රය කළ අයගෙන් ලබා ගත් නිසා එහි නිවැරදිබව සහතික කළ හැකිය.

* ‘‘අනූ ගණන්වල අවසාන භාගයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කටයුතු කෙරෙහි සතුරු ආකල්පයක් අනුගමනය කිරීමෙන් ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය කරන්නේ සුළු ඉල්ලීම සඳහා අරගල කරනු හැර එවකට වෙනත් දෙයක් කිරීමට තත්වයන් නොතිබුණු බව අමතක කිරීමය’’යි ‘ආර්ථිකවාදීන්’ගේ ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පත්‍රවලට ලිපිය’’ මගින් ඔවුන් ප්‍රකාශ කරති (‘‘ඉස්ක්‍රා’’ අංක 12). ‘තත්වයන් නොතිබුණු’ බවට දෙන සහතිකය කෙළින්ම සත්‍යයට ප්‍රතිවිරුද්ධ බව ඉහත සඳහන් කරුණුවලින් පෙනේ. අනූ ගණන්වල අවසානයේ පමණක් නොව මධ්‍යම අනූ ගණන්වල පවා සුළු ඉල්ලීම් සඳහා කරන අරගලවලට අමතරව අනිකුත් වැඩ කිරීම සඳහා සියළු තත්වයන්

වැඩි දෙනෙකුට පුහුණුවක් නොතිබීම සාකල්‍යයෙන්ම ස්වාභාවික දෙයක් වූ හෙයින්, එයින් කිසියම් විශේෂ භීතියක් ඇති වීමට ඉඩක් නොතිබුණි. කර්තව්‍යයන් නිවැරදි ලෙස නියම කරගත් පසු, එම කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා යළි යළිත් ප්‍රයත්න දැරීමට අවශ්‍ය ශක්තිය ඇති කල්හි තාවකාලික අසාර්ථක වීම වලින් නියෝජනය වන්නේ අර්ධ දුර්භාග්‍යයක් පමණකි. උවමනාව ඇතොත් හා දුර්වලකම පිළිගන්නේ නම්, විප්ලවවාදී අත්දැකීම් හා සංවිධානමය කුසලතාවයන් අත් කර ගත හැකි වේ. විප්ලවවාදී කාර්‍යයෙහිදී දුර්වලකම් පිළිගැනීම, ඒවා ඉවත් කිරීමට යායුතු දුරෙන් අඩකටත් වඩා ගෙවීමට සමානය.

එහෙත් මෙම විඥානය අඳුරු වන්නට පටන්ගත් කල (සඳහන් කරන ලද කණ්ඩායම්වල සාමාජිකයන් අතර එය ඉතා ප්‍රාණවත්ව පැවතුනි), දුර්වලකම් යහගුණයන් සේ සැලකීමට සූදනම් වන, සාංසිද්ධිකතාවය ඉදිරියේ දසත්වයෙන් යටහත් පහත් වීමේ සිය ක්‍රියා කලාපයට න්‍යායික පදනමක් පවා නිර්මානය කිරීමට තැත් කරන අය — හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පත්‍ර පවා—ඉදිරිපත් වූ කල, අර්ධ දුර්භාග්‍ය සම්පූර්ණ දුර්භාග්‍යයක් බවට පරිවර්තනය වේ. මෙම ප්‍රවණතාවයෙන් නිසි නිගමන වලට එළඹීමට සුදුසු කාලය පැමිණ ඇති බවත්, එහි ඇතුලත් දේ ‘ආර්ථිකවාදය’ යනුවෙන් වැරදි ලෙසට හා පමණකට වඩා පටු ලෙසට නම් කර ඇති බවත් සඳහන් කරමු.

ආ) සාංසිද්ධිකතාවයට නමස්කාර කිරීම. ‘‘රබෝචය මිස්ල්’’

සාංසිද්ධිකතාවයට වහල් වීම සාහිත්‍ය තුළ විද්‍යාමාන වීම ගැන සඳහන් කිරීමට පෙර, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ පසු කාලයේ ගැටුන ප්‍රවණතාවයන් දෙක සාන්ත පීටර්ස්බර්ග් නගරයේ වැඩ කරන සහෝදරවරු අතර පැන නැගී වර්ධනය වූයේ කුමන තත්වයන් යටතේද යන්න පැහැදිලි වීමට හේතුවන (ඉහත සඳහන් මාර්ගයෙන් අප වෙත දන්වන ලද) පහත සඳහන් ස්වභාව නිරූපී කාරණය සටහන් කරගනු කැමැත්තෙමු. 1897 ආරම්භයේ ආ. ආ. වනේයෙව් සහ ඔහු සමග වැඩ කළ සහෝදරවරු පිරිසක්, ඔවුන් පිටුවහල් කරනු ලැබීමට පෙර පෞද්ගලික රැස්වීමකට[51] සහභාගි වූහ. ‘‘කම්කරු පංතියේ විමුක්ති අරගල සංගමයේ’’ ‘වයස්ගත’ හා ‘තරුණ’ සාමාජිකයන් එහි රැස්වී සිටියහ. ප්‍රධාන වශයෙන් සාකච්ඡා කෙරුනේ සංවිධානය පිළිබඳ ප්‍රශ්නය ගැනය. විශේෂයෙන්ම, ‘‘කම්කරුවන්ගේ අන්‍යොන්‍ය යහසාධක අරමුදලේ රෙගුලාසි’’ ගැනය. ඒවායේ අවසාන කෙටුම්පත ‘‘ලිස්ටොක් ‘‘රබෝත්නිකා’’’’ පත්‍රයෙහි[52], අංක 9—10 (පිටු 40) හි පළ කරන ලදී. (සාන්ත පීටර්ස්බර්ග් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විහිළුවට ‘ඩිසෙම්බරිස්ට්’ වරුන් යන නමින් හැඳින්වූ) ‘වයස්ගත’ සාමාජිකයන් හා (පසු කාලයේ ‘‘රබොචයා මිස්ල්’’ පත්‍රයේ වැඩ කටයුතු වලදී ක්‍රියාත්මක ලෙස සහභාගි වුනු) ‘තරුණ’ සාමාජිකයන් කීප දෙනෙක් අතර තියුණු මත වෙනස්කම් ක්ෂණිකව පෙනීයන ලෙසට තියුණු සාකච්ඡාවක් ඇති විය. ප්‍රසිද්ධියට පත් කරන ලද රෙගුලාසිවල ප්‍රධාන ප්‍රතිපත්තිවලට පක්ෂව ‘තරුණ’ සාමාජිකයන් කථා කළහ. අවශ්‍යව තිබෙන්නේ මෙය නොව, කම්කරුවන්ගේ නොයෙක් යහසාධක අරමුදල්, ශිෂ්‍යයින්ගේ ප්‍රචාරක කව ආදී සියල්ලටම ඉහළින් සිටින විප්ලවවාදීන්ගේ සංවිධානයක් වන තත්වයට ‘‘අරගල සංගමය’’ තහවුරු කිරීම බව ‘වයස්ගත’ සාමාජිකයන් තර්ක කළහ. මෙම අසමථයන් භේදයක ආරම්භය වූ බව ආරාවුල්කාරී දෙපාර්ශ්වයම කිසිසේත් දැන නොසිටි බව කීම අවශ්‍ය නොවේ. එපමණක් නොව, ඔවුහු මෙම අසමථයන් තනි වූ හා අනියම් ඒවා වශයෙන් සැලකූහ. එසේ වුවද, රුසියාවෙහිත් ‘ආර්ථිකවාදය’ පැතිරී ගියේ ‘වයස්ගත’ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට විරුද්ධව අරගලයකින් තොරව නොවන බව මෙම කරුණෙන් පැහැදිලි වේ (අද ‘ආර්ථිකවාදීන්’ මෙම කරුණ අමතක කිරීමට පුරුදුව සිටිති). මෙම අරගලයේ සටහන් වශයෙන් ගත හැකි ‘ලියවිලි’ රැසක් ඉතිරි වී නොමැතිනම් ඊට එකම හේතුව වූයේ එවකට පැවති කවවල සාමාජිකත්වය නිරතුරුවම වෙනස් වූ හෙයින්, ඒවා අවිච්ඡේද ස්වභාවයකින් පවත්වා ගත නොහැකි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අදහස් වෙනස්කම් ලියවිලි කිසිවක සටහන් නොකිරීමය.

‘‘රබොචයා මිස්ල්’’ පත්‍රය ආරම්භ කිරීමත් සමග ‘ආර්ථිකවාදය’ දහවල් එළියට පමුණුවන ලදී. එහෙත් ඒ එක පැහැර සිදුවූවක් නොවීය. නොයෙක් නගරවල දක්නට ලැබුණ නව ප්‍රවණතාවයේ සාර්ථකත්වයට හා අසාර්ථකත්වයට අහම්බෙන් සිදුවූ දේ කොතරම් දුරට හේතු විනිද

පැවතුනි; නායකයන්ට අවශ්‍ය පුහුණුව නොතිබීම හැර අනිකුත් සියළුම තත්වයන් තිබුණේය. දෘෂ්ටිවාදීන්, නායකයන් වන අපට ප්‍රමාණවත් පුහුණුවක් නොතිබුණු බව පිළිගන්නවා වෙනුවට ‘තත්වයන් නොතිබීම’ වෙත, කිසිම දෘෂ්ටිවාදියෙකුට වෙනස් කළ නොහැකි, ව්‍යාපාරයේ මාර්ගය නිගමනය කරන ද්‍රව්‍යමය වටපිටාවෙන් පැන නගින ප්‍රතිඵලය වෙත වරද පැවරීමට ‘ආර්ථිකවාදීහු’ උත්සාහ කරති. මෙය කුමක්ද? සාංසිද්ධිකතාවය හමුවේ දසත්වයෙන් යටහත් පහත්කම් දැක්වීමක් මිස වෙන කුමක්ද? ‘දෘෂ්ටිවාදීන්’ ඔවුන්ගේම දුර්වලකම් වලින් මෝහනය වීම හැර වෙන කුමක්ද?

යන්නත්, එම ප්‍රවණතාවයෙන් ප්‍රකාශිත වූයේ පැහැදිලි ප්‍රවණතාවයක්ද නැතහොත් යම් යම් පුද්ගලයන්ගේ නුපුරුදුකම්ද යන්නත් ගැන තීරණයකට බැස ගැනීමට 'නව' ප්‍රවණතාවයට පක්ෂවාදී හෝ විපක්ෂවාදී අයට අවස්ථාවක් නොමැති තත්වයක් පැවති හෙයින් එසේ තීරණයක් නොමැතිව කොතෙක් කල් ගත වූයේද යන්නත් වටහා ගැනීම පිණිස රුසියානු අධ්‍යයන කවවල ක්‍රියාකාරිත්වයට පසුබිම් වූ කත්වයන් හා ඒවායේ මන්දයුෂ්ක ස්වභාවය ගැන අපි පැහැදිලිව සිතා බැලිය යුතු වෙමු (මෙය කළ හැක්කේ අත්දැකීම් ලැබූ අයට පමණකි). නිදර්ශනයක් වශයෙන් ගල් අච්චුවෙන් ගත් ''රබොචයා මිස්ල්'' පත්‍රයේ ප්‍රථම පත්‍ර පිටපත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අති බහුතරයට කිසිදක ලැබුණේ නැත. ප්‍රථම පත්‍රයේ ප්‍රධාන ලිපිය ගැන අපට සඳහන් කළ හැකි වී තිබෙන්නේ ව්. ඉ.[53] විසින් ලියන ලද ලිපියක එය (''ලිස්තොක් 'රබොත්නිකා' '' අංක 9—10, පිටු 47 සිට ඉදිරියට) ඇතුලත් කර තිබුණු හෙයිනි. ඉහත සඳහන් කරන ලද පත්‍රවලට හා පත්‍ර සඳහා වූ යෝජනා ක්‍රමවලට වඩා බෙහෙවින් වෙනස් වූ අළුත් පත්‍රය ගැන පමණට වඩා උත්සුක්ත ලෙස වර්ණනා කිරීමට ඔහු අමතක කළේද නැත.* මෙම ප්‍රධාන ලිපියෙන් ''රබොචය මිස්ල්'' පත්‍රයේ සහ පොදු වශයෙන් 'ආර්ථිකවාදයේ' ජීව ගුණය පැහැදිලි ලෙස මතුකර දක්වන නිසා ඒ ගැන සවිස්තර ලෙස කරුණු දැක්වීම වටනේය.

නිල් කෝට් කාරයන්ගේ''[54] ආයුධවලින් කම්කරු පංතියේ ඉදිරි ගමන නැවැත්විය නොහැකියයි කීමෙන් අනතුරුව ප්‍රධාන ලිපියෙහි මෙසේ සඳහන් වෙයි: ''...කම්කරු පංති ව්‍යාපාරයේ පෞරුෂත්වයට හේතු වී තිබෙන්නේ, අන්තිමේදී කම්කරුවන් ඔවුන්ගේ ඉරණම ඔවුන් අතටම ගැනීමයි; එය නායකයන්ගේ අතින් ඉවතට ගැනීමයි.'' ඊට පසුව මෙම මූලික අදහස ඉතාමත් විස්තර සහිතව ඉදිරිපත් කර ඇත. ඇත්ත වශයෙන්ම, නායකයන් (එනම් ''අරගල සංගමයේ'' සංවිධායකයන් වන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්) පොලිසිය විසින් කම්කරුවන්ගේ අතින් උදුරාගන්නා ලදී.** එහෙත් පෙන්නුම් කර ඇත්තේ කම්කරුවන් ඔවුන්ගේ නායකත්වයට විරුද්ධව සටන් කරමින් සිටි බවක් හා නායකවරුන්ගේ වියගසින් ඔවුන් නිදහස ලත් බවකි! විප්ලවවාදී සංවිධානය තහවුරු කර ගැනීම සහ දේශපාලන කටයුතු ව්‍යාප්ත කිරීම පිණිස හඬ නගනු වෙනුවට පිරිසිදු වෘත්තීය සමිතිවාදී අරගලය දක්වා පසු බැසීමට කැඳවීම් කරන ලදී. 'දේශපාලන අරමුණ කිසි විටෙකත් අමතක නොකිරීමට දරන උත්සාහයෙන් ව්‍යාපාරයේ ආර්ථික පදනම වැසී යන' බවත්, කම්කරු පංතියේ ආදර්ශ පාඨය විය යුත්තේ 'ආර්ථික තත්වයන් සඳහා අරගලය'(!) බවත්, ඊටත් වඩා අගේට 'කම්කරුවන්ට කම්කරුවන්' යන්නත් ප්‍රකාශයට පත් කරන ලදී. 'වෙනත් සංවිධාන සියයකට වඩා ව්‍යාපාරයට අගනේ' වැඩ වර්ජන අරමුදල්ය යන ප්‍රකාශයද (1897 ඔක්තෝබරයේදී කරන ලද මෙම ප්‍රකාශය, 1897 ආරම්භයේදී 'ඩිසෙම්බරිස්ට්' වරුන් හා 'තරුණ' සාමාජිකයන් අතර ඇතිවූ විවාදය හා සමග සසඳා බලන්න), එවැනි වෙනත් ප්‍රකාශයන්ද කරන ලදී. අප ඉලක්ක කර ගන්නේ 'ඉස්තරම්' කම්කරුවන් නොව, 'සාමාන්‍ය', පොදු කම්කරුවන්ය; 'දේශපාලනය කීකරු ලෙස නිතරම ආර්ථිකය පසු පස්සේ එයි'* ආදී වශයෙන් වූ චිත්තාකර්ෂණීය වදන් ප්‍රකාශ කිරීම ජනප්‍රිය මෝස්තරයක් බවට පත් වූ අතර, ව්‍යාපාරය වෙත ඇදී ආ විශාල තරුණ පිරිස් අතුරෙන් බහුතරය දන සිටියේ නීත්‍යානුකූල ප්‍රකාශන වලින් විග්‍රහ කර දක්වන ලද්ද වූ පරිද්දෙන් මාක්ස්වාදයෙන් ශේෂමාත්‍රයක් පමණක් වූ හෙයින් මෙම චිත්තාකර්ෂණීය වදන් එම තරුණ කොටස් කෙරෙහි නොවැලැක්විය හැකි ලෙසට තදින් බල පෑවේය.

---

* විශේෂයෙන් විදේශයන්හි 'ආර්ථිකවාදය' ගැන පූර්ණ වශයෙන් අර්ථ නිරූපනය කර තිබූ කලෙක, 1898 දී, ''රබොචයා මිස්ල්'' පත්‍රයේ ගුණ වර්ණනා කළේ නොබෝ කලකින් ''රබෝචිය දියල'' පත්‍රයේ කතෘ වරයෙක් වශයෙන් පත්වූ ව්. ඉ. ම බව මෙහිලා සඳහන් කළ යුතුය.

** මෙම උපමාව නිවැරදි බව පහත සඳහන් ස්වභාව නිරූපී කාරණයෙන් පෙනේ. 'ඩිසෙම්බරිස්ට්' වරුන් සොයා ගැනීමට හා සිරභාරයට ගැනීමට උපකාර වූයේ ඔවුන් සම්බන්ධව සිටි කණ්ඩායම හා සමග සම්බන්ධකම් ඇතිව සිටි දන්ත වෛද්‍යවරයෙකු වූ එන්. එන්. මිහයිලව් නම් ප්‍රයෝගකාරී ඔත්තු කරුවෙකු බව ශ්ලුසල්බර්ග් මහා මාර්ගයේ කම්කරුවන් අතර පැතිර යාම නිසා කම්කරුවන් කොතරම් කෝපාවිෂ්ට වූයේද යත්, ඔවුහු මිහයිලව් මරා දැමීමට තීරණය කළහ.

* මෙම උධෘතයන් ගෙන ඇත්තේ ''රබොචයා මිස්ල්'' පත්‍රයේ එම කලාපයේම ප්‍රධාන ලිපියෙනි. 'රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මෙම ව. ව. ලා'[55] කොතරම් නම් න්‍යායික පුහුණුවක් ලබා තිබුණේද යන්න කෙනෙකුට වටහා ගත හැකිය. සැබෑ ව. ව. මහතා දේශපාලනය හා ආර්ථිකය අතර සම්බන්ධය ගැන මීට සමාන අදහස් දරන නිසා ඔහු 'ප්‍රතිගාමී කටයුතු වලට අති දක්ෂයෙක්' ලෙසට හඳුන්වා, මාක්ස්වාදීන් ඔහුට විරුද්ධව ලිපි ලේඛන යුද්ධයක් කරගෙන යන අවස්ථාවක මොවුන් 'ආර්ථික භෞතිකවාදයේ' අශෝභන දියාරු ප්‍රකාශයන් රැව් පිළිරැව් දෙවන්නට වූහ.

දේශපාලන විඥනය සම්පූර්ණයෙන්ම සාංසිද්ධිකතාවයෙන් යටපත් කර දමන ලදී — ඒ ව. ව. මහතාගේ 'අදහස්' පුනරුච්ඡාරණය කළ 'සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ' සාංසිද්ධිකතාවයෙනි; රූබලයකට තවත් කොපෙක් එකක් එකතු කිරීම ඕනෑම සමාජවාදයකට හෝ දේශපාලනයකට වඩා වටිනා බවත්, ''තමන් සටන් කරන්නේ කිසියම් අනාගත පරම්පරාවකගේ යහපත පිණිස නොව තමන්ගේ හා තම දරුවන්ගේ යහපත පිණිස බැව් දැනගෙන සටන් කළ යුතු'' (''රබොචයා මිස්ල්'' අංක 1 පත්‍රයේ ප්‍රධාන ලිපිය) බවත් කියන තර්කවලින් ඇදී ගිය කම්කරුවන්ගේ සාංසිද්ධිකතාවයෙනි. කවදත්, මෙවැනි වදන් බටහිර යුරෝපීය ධනේශ්වර පංතියේ ප්‍රියතම ආයුධ විය. (ජර්මන් 'සමාජ-දේශපාලඥ' හිර්ශ් මෙන්) සමාජවාදය කෙරෙහි වූ වෛරයෙන් මඩනා ලද ඔවුන්, ඉංග්‍රිසි වෘත්තීය සමිතිවාදය ස්වකීය දේශභූමිවල රෝපනය කිරීමට හා කම්කරුවන් පිරිසිදු වෘත්තීය සමිති අරගලයේ* යෙදීමෙන් සටන් කරන්නේ ඔවුන් හා ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් මිස කිසියම් අනාගත පරම්පරාවක් වෙනුවෙන් වූ කිසියම් සමාජවාදයක් සඳහා නොවන බව කම්කරුවන්ට දේශනා කිරීමට බලවත් පරිශ්‍රමයක් දැරූහ. දැන් 'රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ව.ව. වරු' මෙම ධනේශ්වර වාක්‍ය ඛණ්ඩයන් පුනරුච්ඡාරණය කිරීමට කටයුතු කර ඇත. අපට, කාලීන මත වෙනස්කම් තවදුරටත් විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇති කරුණු තුනක් මෙම අවස්ථාවේදී සටහන් කිරීම වැදගත්ය.**

ප්‍රථමයෙන්ම, අප සඳහන් කළ පරිදි දේශපාලන විඥනය සාංසිද්ධිකතාවය මගින් සම්පූර්ණයෙන්ම යටත් කිරීම වුවද සිදුවූයේ සාංසිද්ධික ලෙස ය. මෙය තුන් තේරවිල්ලක් මෙන් පෙනී යා හැකි නමුත් අවාසනාවන්ත සත්‍ය එයමය. එය සිදුවූයේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ අදහස් දෙකක් අතර කෙරුන විවෘත අරගලයක ප්‍රතිඵලයක් වශයෙන් එක් අදහසක් පරාජය කර අනික ජය ගැනීමෙන් නොවේ. එය සිදුවූයේ පොලිස්කාරයන් විසින් 'උදුරාගෙන යන ලද' 'වයස්ගත' විප්ලවවාදීන්ගේ සංඛ්‍යාව වැඩි වීමත්, වේදිකාරූඪ වන 'රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ' 'තරුණ ව.ව. ලා' වැඩි වීමත් යන කරුණු හේතු කොට ගෙනය. මේකාලයේ රුසියානු ව්‍යාපාරයට සහභාගි නොවුවත්, එහි සූලභ හෝ ආග්‍රාහණය කළ කෙනෙකු වුවද සිදුවී ඇති දෙය ඉඳුරාම මෙය බව මැනවින් දන්නවා ඇත. එසේද වුවත්, කවුරුත් පාහේ දන්නා මෙම කාරණය ගැන කියවන්නා හොඳින් පැහැදිලි කරගත යුතුයයි අප බලවත් ලෙස කියන්නේ, 'රබෝචිය දියල' පත්‍රයේ ප්‍රථම සංස්කරණයේ සඳහන් කරුණු හා 'වයස්ගත' හා 'තරුණ' අය අතර 1897 ඇතිවූ විවාදයේ කරුණුද තතු පැහැදිලි වන ආකාරයට ගෙන හැර දක්වන්නේ, මෙම කරුණු ගැන පුළුල් ජනතාව (නැතහොත් වඩාත් තරුණ පරම්පරාව) නොදනිතියි සිතාගෙන, ස්වකීය 'ප්‍රජාතන්ත්‍රවාදය' ගැන කියා පාන අය කටයුතු කරන හෙයිනි. මෙම කාරණය ගැන ඉදිරියේදී නැවත සඳහන් කරන්නෙමු.

දෙවැනිව, 'ආර්ථිකවාදයේ' ප්‍රථමතම ශාස්ත්‍රීය ප්‍රකාශනයේම ඉතාමත් අරුම සහගත ලක්ෂණයක් දක්නට ලැබේ. එයින්, වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර පවතින අසමථයන්ගේ ස්වභාවය නිරූපනය වන නිසා එම අසමථයන් සියල්ලම ගැන වටහා ගැනීමට එය ඉවහල් වේ. එම ලක්ෂණය නම්, 'පිරිසිදු හා පැහැදිලි කම්කරු ව්‍යාපාරයට' පක්ෂපාත වූද නිර්ධන පංති අරගලය හා සමග සමීප 'ඓන්ද්‍රීය' (''රබෝචිය දියල'' පත්‍රයේ වචන) සම්බන්ධකම් පැවැත්වීම වන්දනීයත්වයට නංවන්නා වූද, කම්කරු නොවන බුද්ධිමතුන්ට (සමාජවාදී බුද්ධිමතුන්ට පවා) විරුද්ධ වන්නා වූද අය, ස්වකීය මත සනාථ කිරීම හා නිවැරදි බව පෙන්වීම සඳහා ධනේශ්වර 'පිරිසිදු වෘත්තීය සමිතිවාදීන්' ගේ තර්ක යොදා ගැනීමයි. මෙයින් පෙනෙන්නේ ආරම්භයේ පටන්ම ''රබෝචය මිස්ල්'' පත්‍රය අවිඥන ලෙස "Credo" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට පටන් ගත් බවය. මෙයින් පෙනෙන්නේ, කැමති වුවත්, නැතත්, සාංසිද්ධිකතාවයට කෙරෙන සෑම වන්දනාමානයකින්ම, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ 'විඥන ස්වභාවයෙන්' ඉටුවන කාර්ය්‍ය ලඝු කොට දැක්වීමට කරන සෑම කටයුත්තකින්ම, යන ඒ සියල්ලෙන්ම, කම්කරුවන් කෙරෙහි පානු ලබන ධනේශ්වර දෘෂ්ටිය ශක්තිමත් කෙරෙන බවයි, — (මෙය ''රබෝචිය දියල'' පත්‍රයට තේරුම් ගත නොහැක). 'දෘෂ්ටියෙහි

---

* ජර්මන් වරුන්ට 'Nur-Gewerkschaftler' යන විශේෂ පාඨයක් පවා ඇත. එහි අර්ථය 'පිරිසිදු වෘත්තීය සමිති' අරගලයේ පක්ෂවාදියා යනුයි.

** අප කාලීන යන වචනය අවධාරණය කරන්නේ, බොරු පක්ෂපාතකමක් දක්වමින් උරහිස් නටවා මෙසේ කියන අයගේ ප්‍රයෝජනය පිණිසය:''රබෝචය මිස්ල්''පත්‍රයට දැන් පහර ගැසීම පහසුය. එහෙත් දැන් එය යටගිය ඉතිහාසයට එක්වූ දෙයක් නොවේද? Mutato nomine de te fabula narratur (නම වෙනස් කර ගතහොත් කථාව ඔබ ගැන ය. සංස්කාරක) යි අපි එම හොර උපායකයන්ට පිළිතුරු දෙමු. ඔවුන් ''රබෝචය මිස්ල්'' පත්‍රයේ අදහස් වලට සම්පූර්ණයෙන්ම යටත් වී සිටින බැව් ඉදිරියේදී ඔප්පු කරනු ලැබේ.

වැදගත්කම අභිවාදනය කිරීම'* හා විඥාන ස්වභාවයෙන් ඉටුවන කාර්ය කොටස අතිශයෝක්තියෙන් කීම** යනාදිය ගැන දොඩන අය සියළු දෙනාම කල්පනා කරන්නේ කම්කරුවන් 'ඔවුන්ගේ ඉරණම නායකයන් වෙතින් උදුරා ගනිත්' නම් එපමණින්ම පිරිසිදු හා පැහැදිලි කම්කරු පංති ව්‍යාපාරය තමන්ගේම දෘෂ්ටියක් නිර්මානය කරගනු ඇත යනුයි. නමුත් මෙය බරපතල වැරදීමකි. ඉහත සඳහන් කරුණුවලට අමතරව, අවුස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කෙටුම්පත් වැඩ පිළිවෙළ ගැන වූ කාල් කෞට්ස්කිගේ පහත සඳහන් කියමනද උපුටා දක්වන්නෙමු***:

''ආර්ථික සංවර්ධනය හා පංති අරගලය විසින් සමාජවාදී නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන තත්වයන් පමණක් නොව, සමාජවාදය අවශ්‍ය දෙයකැයි යන විඥානය ද (අවධාරණය කා. ක. ගේ ය) සෘජු ලෙසම නිර්මානය කරනු ලබන බව මාක්ස් අවධාරණයෙන් ප්‍රකාශ කළේයයි අපගේ සංශෝධනවාදීන් බොහෝ දෙනෙක් විශ්වාස කරති. එමෙන්ම ධනේශ්වර ක්‍රමයේ ඉතාමත් සංවර්ධිත රටවූ එංගලන්තය අනික් ඕනෑම රටකට වඩා විඥත භාවය අතින් පසුවී සිටින බවද මෙම විවේචකයින් සත්ත කර කියති. කෙටුම්පත අනුව බලන කල, මෙසේ ප්‍රතික්ෂේප කෙරෙන හා විශුද්ධ මාක්ස්වාදී අදහසක් යයි කියන මෙය, වැඩ පිළිවෙළ කෙටුම්පත් කළ කාරක සභාව විසින්ද පිළිගන්නා ලදැයි කෙනෙකුට සිතා ගැනීමට ඉඩ තිබේ. ''ධනේශ්වර සංවර්ධනය නිසා නිර්ධන පංතිකයන් වැඩි වන තරමට, අනිවාර්ය ලෙස ධනේශ්වර පංතියට විරුද්ධව සටන් කිරීමට සිදුවේ. නිර්ධන පංතිය ඒ සඳහා සුදුසු තත්වයට පැමිණේ.'' සමාජවාදය පිහිටුවීමේ හැකියාව සහ එහි අවශ්‍යතාවය ගැන එම පංතියට විඥානය උදවේ? මේ අනුව බලන කල සමාජවාදී විඥානය යනු නිර්ධන පංතියේ පංති අරගලයේ අවශ්‍ය සහ සෘජු ප්‍රතිඵලයක් වන බව පෙනේ. එහෙත් මෙය සාකල්‍යයෙන්ම අසත්‍යය ය. නිර්ධන පංතියේ පංති අරගලයේ මෙන්ම න්‍යාය ධර්මයක් වශයෙන් සමාජවාදයේ ද මුල් විහිදී තිබෙන්නේ නූතන ආර්ථික සම්බන්ධකම් අතර වන බවත්, එමෙන්ම, නිර්ධන පංති අරගලය හා සමානවම සමාජවාදයද පැන නගින්නේ ධනේශ්වරය විසින් ජනතාව අතර උදකරන දරිද්‍රතාවයට හා දුක්ඛිත තත්වයට විරුද්ධව කරන අරගලයෙන් වන බවත් සැබෑය. එහෙත් සමාජවාදය හා පංති අරගලය මතුවන්නේ එකට මෙනි; එකකින් අනික මතුවන ආකාරයට නොවේ. එකක් පැන නගින්නේ අනිකට වෙනස් තත්වයන් යටතේය. නවීන

---

* ''ඉස්ක්‍රා'' අංක 12 හි 'ආර්ථිකවාදීන්' ගේ ලිපිය.

** ''රබෝචිය දියල'' අංක 10.

*** "Neue Zeit"[56], 1901—02, XX, 1, අංක 3, පිටු 79. කෞට්ස්කි සඳහන් කරන කාරක සභා වාර්තා (පසුගිය වසර අගදී) වියනා සම්මේලනය[57] විසින් සුළු සංශෝධන සහිතව සම්මත කරන ලදී.

සමාජවාදී විඥානය ඇතිවිය හැක්කේ ගැඹුරු විද්‍යාත්මක දැනුම පදනම් කරගෙන පමණකි. නවීන ආර්ථික විද්‍යාවද නවීන තාක්ෂණික ශිල්පය තරමටම සමාජවාදී නිෂ්පාදනයට ඇත්තෙන්ම අවශ්‍ය වන කොන්දේසියකි. නිර්ධන පංතිය කොතරම් ආශා කළත් එයට ඒ දෙකෙන් එකක්වත් නිර්මාණය කරගත නොහැක. ඒ දෙකම පැන නගින්නේ නවීන සමාජ ක්‍රියාදාමයෙනි. විද්‍යාවේ ප්‍රගමනය සිදුවන්නේ නිර්ධන පංතිය නැමති වාහනයෙන් නොවේ; ධනේශ්වර බුද්ධිමතුන් මගිනි (අවධාරණය කා. ක. ගේය): සමාජවාදයේ සමාරම්භය වූයේ මෙම ස්ථරයේ එක් එක් සාමාජිකයන්ගේ සිත් තුළය. ඔවුන්, ඒ ගැන බුද්ධි වර්ධනය ලත් නිර්ධන පංතිකයනට දන්වූ පසු, තත්වය අනුව ඉඩකඩ තිබෙන ලෙසට එය ඒ අය විසින් නිර්ධන පංති අරගලය සඳහා යොදගන්නා ලදී. එනිසා සමාජවාදී විඥානය යනු නිර්ධන පංති අරගලයට පිටතින් ඇතුල් කරන ලද්දක් (von außen Hineingetragenes) මිස එය අභ්‍යන්තරයෙන් සාංසිද්ධික වශයෙන් (urwüchsig) පැන නැගුනු දෙයක් නොවේ. ඒ අනුව, නිර්ධන පංතියේ තත්වය පිළිබඳ විඥානය හා එහි කර්තව්‍ය ගැන විඥානය එය තුළට කැවීම (වචනාර්ථයෙන් කියතොත් උරාගන්නට සැලැස්වීම) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍ය වන බව පැරණි හැයින්පෙල්ඩ් වැඩ පිළිවෙළෙහි සඳහන් කර ඇත්තේ ඉතාමත් නිවැරදි ලෙසටය. විඥානය පංති අරගලයෙන් ස්වයංජාත වී නම් මෙය අවශ්‍ය නොවේ. පැරණි වැඩ පිළවෙළේ මෙම අදහස පිටපත් කරගෙන එය අළුත් කෙටුම්පතෙහි ඉහත සඳහන් අදහසට බද්ධ කරන ලදී. එහෙත් එනිසා චින්තාවලිය සම්පූර්ණයෙන්ම බිඳී ගියේය...''

වැඩ කරන ජනතාවගේ අරගලයේ ක්‍රියාදාමය අතරතුරදී ඔවුන් විසින්ම සකස් කර ගත හැකි වන දෘෂ්ටියක් ගැන කීමට නොහැකි හෙයින්* තෝරා ගැනීමට තිබෙන්නේ එක්කෝ ධනේශ්වර නැතහොත්

---

* දෘෂ්ටියක් නිර්මාණය කර ගැනීමේදී කම්කරුවන් විසින් ඉටු කරනු ලබන වැඩ කොටසක් නොමැතියයි යන්න මෙයින් කිසිසේත් අදහස් නොවේ. එහෙත්, ඔවුන් ඊට සහභාගි වන්නේ කම්කරුවන් වශයෙන් නොව ප්‍රුඩෝන්ලා වෙයිට්ලින්ග්ලා ලෙසට සමාජවාදී නායකයන් වශයෙනි. වෙනත් වචන වලින් කියතොත්, ස්වකීය යුගයේ දැනුම අඩු වැඩි පමණින් ලබා ගැනීමට හා එම දැනුම සංවර්ධනය කර ගැනීමට හැකි කල්හි ඔවුහු ඊට සහභාගි වෙති. එහෙත් මෙය වැඩි වැඩියෙන් කිරීමට වැඩ කරන ජනයාට හැකි වනු පිණිස පොදුවේ කම්කරුවන්ගේ විඥාන මට්ටම උසස් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුය. 'කම්කරුවන් සඳහා සාහිත්‍ය' යන කෘතිම සීමාවන්ට කොටු නොවී, කම්කරුවන් වැඩි වැඩියෙන් පොදු පොතපත හැදෑරීමට යොමු කිරීමට කටයුතු යෙදීම අවශ්‍ය ය. මෙහිදී 'කොටු නොවී' යන්නට වඩා 'කොටුකර නොතබා' යන්න යෙදීම වඩා නිවැරදිය. බුද්ධිමතුන් සඳහා ලියන ලද සියළුම පතපොත කියවීමට කම්කරුවන්

සමාජවාදී දෘෂ්ටිය යන දෙකෙන් එකක් පමණකි. මැද මාර්ගයක් නොමැත. (මිනිසා ‘තුන්වැනි’ දෘෂ්ටියක් නිර්මාණය කර නොමැත. එපමණක් නොව, පංති ප්‍රතිවිරෝධතාවයන්ගෙන් බෙදී ගිය සමාජයක පංතියකට නැති, නැතහොත් පංති අභිබවා සිටින දෘෂ්ටියක් තිබෙනුද නොහැකිය). එහෙයින් කුමණ හෝ ආකාරයකින්වත් සමාජවාදී දෘෂ්ටිය ලඝු කොට දැක්වීම හෝ ලේශමාත්‍ර වශයෙන් හෝ ඉන් ඉවතට හැරීම යනුවෙන් අදහස් වන්නේ ධනේශ්වර දෘෂ්ටිය ශක්තිමත් කිරීමයි. සාංසිද්ධිකතාවය ගැන බොහෝ සෙයින් කථා කරනු ලැබේ. එනමුත් කම්කරු පංති ව්‍යාපාරයේ ‘සාංසිද්ධික’ සංවර්ධනයෙන් එය ධනේශ්වර දෘෂ්ටියට යටත් වන තැනට යොමුවේ; “Credo” වැඩ පිළිවෙළෙහි ක්‍රියා මාර්ගය අනුව සංවර්ධනය වීමට යොමුවේ. එසේ වන්නේ, කම්කරු පංතියේ සාංසිද්ධික ව්‍යාපාරය යනු වෘත්තීය සමිතිවාදය, Nur-Gewerkschaftlerei වන හෙයිනි; එමෙන්ම, වෘත්තීය සමිතිවාදය යනුවෙන් අදහස් වන්නේ කම්කරුවන් ධනේශ්වර පංතියේ දෘෂ්ටියට වහල් වීමේ තත්වයට පත්වීම වන හෙයිනි. සාංසිද්ධිකතාවයට විරුද්ධව සටන් කිරීමත්, ධනේශ්වර පංතියේ බලපෑමට හසුවීමට කම්කරු පංති ව්‍යාපාරය දරන මෙම සාංසිද්ධික හා වෘත්තීය සමිතිවාදී උත්සාහයෙන් එය ඉවතට යොමු කිරීමත්, එය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව යටතට ගෙන ඒමත් අපගේ කර්තව්‍ය වන්නේ, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍ය වන්නේ එහෙයිනි. එනිසා, ද්‍රව්‍යමය මූලධර්ම හා ද්‍රව්‍යමය වටපිටාව අතර සිදුවන්නාවූ අන්තර් ක්‍රියා කාරිත්වයෙන් නිශ්චය කෙරෙන එයින් ඉවතට කම්කරු පංතිය යොමු කිරීමට ඉතාමත් ප්‍රබුද්ධ දෘෂ්ටිවාදීන් වුවද සමත් නොවෙතියි යනුවෙන්, ‘‘ඉස්ක්‍රා’’ අංක 12 හි පළකරන ලද ‘ආර්ථිකවාදී’ ලිපියෙහි කතෘවරු යොදගත් වාක්‍ය සමාජවාදය ප්‍රතික්ෂේප කිරීමක් හා සමාන වේ. ලේඛක හා මහජන කටයුතු පිළිබඳ සටන් භූමියට අවතීර්ණ වන සෑම කෙනෙක්ම කළයුතු වන සේ, මෙම කතෘ වරුන්ද, තමන් කියන දේ ගැන නිර්භයව, ස්ථිරව හා දැඩි ලෙස සලකා බැලීමට සමත් වී නම්, ඔවුන්ගේ ‘‘හිස් ලය මත ඔවුන්ගේ වැඩකට නැති දෑත් බැදගෙන සිටීමත්’’... කම්කරු ව්‍යාපාරය ‘ඉතාමත් අබාධිත ක්‍රියාමාර්ගය ඔස්සේ,’ එනම්, ධනේශ්වර වෘත්තීය සමිති මාර්ගය ඔස්සේ, ඇද ගෙන යන ස්ත්‍රුවේලාට හා ප්‍රකපෝවිච්ලාට සටන් භූමිය භාර දීම හෝ, එසේ නැතහොත්, එම ව්‍යාපාරය පූජක හෝ පොලිස් ‘දෘෂ්ටිය’[58] ඔස්සේ ඇද ගෙන යන සුබාතව්ලාට භාර දීමක් හැර තමන්ට කිරීමට ඇති වෙනත් දෙයක් නොමැති බව ඔවුනට පෙනෙනු ඇත.

අපි ජර්මන් නිදර්ශනය ගැන සිහිපත් කරමු. ලසාල් ජර්මන් කම්කරු ව්‍යාපාරයට කළ සේවය කුමක්ද? එය නම්, (ෂුල්ට්සේ-ඩෙලිට්ෂ් හා එවැනි අයගේ ආධාර ඇතිව) ක්‍රමිකවාදී වෘත්තීය සමිතිවාදය කරා ගමන් කරමින් තිබූ ව්‍යාපාරය එම මාර්ගයෙන් ඉවතට යොමු කිරීමයි. එවැනි කර්තව්‍යයක් සාර්ථක කිරීම පිණිස කළ යුතු වූයේ, සාංසිද්ධිකතාවයේ වැදගත්කම සුළු කොට තැකීම, ක්‍රියාදමයක් වන උපක්‍රම හා මූලධර්ම සහ වටපිටාව අතර සිදුවන අන්තර් ක්‍රියාකාරිත්වය යනාදිය ගැන කථා කිරීමට වඩා හාත්පසින්ම වෙනස් දෙයකි. සාංසිද්ධිකතාවයට විරුද්ධව දරුණු අරගලයක් කිරීමට සිදුවිය. නිදර්ශනයක් වශයෙන් ක්‍රමිකවාදී පක්ෂයේ බල පවුරක් වී සිටි බර්ලින් වැඩ කරන ජනතාව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතාමත් කදිම බල කඳවුරක් බවට පරිවර්තනය කළ හැකි වූයේ අවුරුදු ගණනක් තිස්සේ පැවති එවැනි අරගලයකින් පසුව පමණකි. (ප්‍රකපෝවිච්ගෙන් ජර්මන් ව්‍යාපාරයේ ඉතිහාසයත්, ස්ත්‍රුවේගෙන් එහි දර්ශනයත් ඉගෙන ගන්නා අය කෙසේ සිතනු හැකි වුවද) තවමත් මෙම අරගලය කිසි ලෙසකින්වත් අවසන් වී නොමැත. ජර්මන් කම්කරු පංතිය දැනුදු දෘෂ්ටිවාද කීපයක් අතර බෙදී සිටින බව කිව හැක. එක් කොටසක් කතෝලික රාජපාක්ෂිකවාදී වෘත්තීය සමිති තුළ සංවිධානය වී සිටිති. තවත් කොටසක් ඉංග්‍රීසි වෘත්තීය සමිතිවාදය වන්දනය කරන ධනේශ්වරයන් විසින් ආරම්භ කරන ලද හිර්ෂ්-දුන්කෙර් සමිති[59] තුළ සංවිධානය වී සිටිති. තුන්වැනි කොටස සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී වෘත්තීය සමිති තුළ සංවිධානය වී සිටිති. මෙහි අන්තිමට සඳහන් කළ කණ්ඩායම සංඛ්‍යාවෙන් අනිත් කණ්ඩායම් අභිබවා සිටින නමුත්, එම තත්වය දිනා ගැනීමෙහි සමත් වූයේ හා රැක ගැනීමෙහි සමත් වන්නේ අනිකුත් දෘෂ්ටිවාද සියල්ලටම විරුද්ධව ස්ථිරසාර අරගලයක් කිරීමෙන් පමණකි.

එහෙත් සාංසිද්ධික ව්‍යාපාරය මගින්, ඉතාමත් අබාධිත ව්‍යාපාරය මගින් ධනේශ්වර දෘෂ්ටියේ ආධිපත්‍යයට මඟ පෑදෙන්නේ කෙසේද? යනු පාඨකයා විමසනු ඇත. ධනේශ්වර දෘෂ්ටිය සමාජවාදී දෘෂ්ටියට වඩා බොහෝ කලින් ආරම්භවීමත්, වඩා හොඳින් සංවර්ධනය වී තිබීමත්, එය පැතිරවීම සඳහා මෙතෙකැයි කිව නොහැකි තරම් අධික

කැමති වන අතර, කම්කරුවන්ට පැක්ටරිවල තත්වයන් ගැන කරුණු ටිකක් කීමත්, බොහෝ කාලයක් තිස්සේ දැන සිටි දෙය නැවත නැවතත් කීමත් ප්‍රමාණවත් යයි අදහස් කරන්නේ (නරක) බුද්ධිමතුන් කීප දෙනෙක් පමණකි.

තර මාධ්‍ය සමූහයක් එය සතුව තිබීමත් නිසා එසේ වේ.* කිසි රටක සමාජවාදී ව්‍යාපාරය ලාබාලවූ තරමට එය සමාජවාදී නොවන දෘෂ්ටිය ශක්තිමත් වීමට දරන සියළු ප්‍රය නයන්ට විරුද්ධව වඩ වඩාත් බලවත් ලෙස අරගල කළයුතු වේ; ‘විඥුත ස්වභාවය අභිවාදනය කිරීම’ ආදිය ගැන ඝෝෂා කරන උපදේශකයන්ගෙන් ප්‍රවේසම් වන ලෙස වඩාත් අධිෂ්ඨාන සහගතව කම්කරුවන්ට අනතුරු හඟවා තැබිය යුතුය. ව්‍යාපාරයේ ළදරු අවධියේ ලක්ෂණයක් වන නොරුස්නා ගතිය ගැන ‘ආර්ථිකවාදී’ ලිපියේ කතෘවරු ‘‘රබෝචිය දියල’’ පත්‍රය හා සමග එකහඬින් දෝෂාරෝපනය කරති. ඊට අපි මෙසේ පිළිතුරු දෙන්නෙමු: ඔව්, අපගේ ව්‍යාපාර ළදරු අවධියේ පවතින බව ඇත්තය. එය වේගයෙන් වැඩී යනු පිණිස, සාංසිද්ධිකතාවයට වහල් වීම තුළින් එහි වර්ධනයට බාධාකරන්නවුන් නොරිස්සීමේ ගතිය එය තුළට කාවැද්දිය යුතුය. තමන්, අරගලයේ සියළුම තීරණාත්මක අවධි සම්බන්ධයෙන් බොහෝ කලක් තිස්සේ අත්දැකීම් ලත් ‘පරණ අය’ වශයෙන් බොරුවට ඇඟවීම තරම් හාස්‍යජනක වෙනත් දෙයක් නැත.

තුන්වැනිව, ‘ආර්ථිකවාදය’ යන පාඨයෙන් නව ප්‍රවණතාවයේ නියම ස්වභාවය පැහැදිලි වන්නේ නැතැයි යන්න ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයේ පළමුවැනි කලාපයෙන් පෙන්වා දී ඇත (එහෙත් එක් හෝ අනෙක් ආකාරයෙන් මෙම නිලනාමය තහවුරු වී තිබෙන නිසා, එය අත්හැරීමට අපි අදහස් නොකරමු). ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය සම්පූර්ණයෙන්ම දේශපාලන අරගලය ප්‍රතික්ෂේප නොකරයි. එහි ප්‍රථම කලාපයෙහි පළ කෙරුනු කම්කරුවන්ගේ අන්‍යොන්‍ය යහ සාධක අරමුදලක් සඳහා වූ රෙගුලාසිවල ආණ්ඩුවට විරුද්ධව සටන් කිරීම ගැන සඳහනක් කර ඇත. එසේ වුවද ‘දේශපාලනය කීකරු ලෙස නිතරම ආර්ථිකය පසු පස්සේ ගමන් කරන්නේ’ යයි ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය විශ්වාස කරයි (‘අන් කුමන රටකටත් වඩා රුසියාවේ ආර්ථික අරගලය දේශපාලන අරගලයෙන් අභේද්‍ය’ යයි යනු ස්වකීය වැඩ පිළිවෙළින් සත්තකර කීමෙන් ‘‘රබෝචිය දියල’’ පත්‍රය මෙම තීසිසයෙහි වෙනසක් කරයි). දේශපාලනය යනුවෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය අදහස් කරන්නේ නම්, ‘‘රබෝචය මිස්ල්’’ හා ‘‘රබෝචිය දියල’’ පත්‍රය කියන දේ අත්‍යන්තයෙන්ම වැරදිය. අප දන්නා ආකාරයට බොහෝ විට කම්කරුවන්ගේ ආර්ථික අරගලය (අභේද්‍ය ලෙස නොවූවද) ධනේශ්වර දේශපාලනය හා පූජක දේශපාලනය ආදිය සමග සම්බන්ධව පවතී. දේශපාලනය යනුවෙන් අදහස් කෙරෙන්නේ වෘත්තීය සමිති දේශපාලනය නම්, එනම්, කම්කරුවන්ගේ තත්වයෙන් පැන නගින පීඩාව අඩු කරගැනීම සඳහා, එහෙත් මෙම තත්වයන් අහෝසි නොකරන, කම්කරුවා ප්‍රාග්ධනයට යටත් කිරීම අහෝසි නොකරන පියවරයන් ආණ්ඩුවෙන් දිනා ගැනීම පිණිස සියළුම කම්කරුවන් පොදු ලෙස පරිශ්‍රම දැරීම නම්, ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ තීසිස නිවැරදිය. එසේ පරිශ්‍රම දැරීම, සමාජවාදයට සතුරු වන ඉංග්‍රිසි වෘත්තීය සමිතිවාදීන්ටද, කතෝලික කම්කරුවන්ටද, ‘සුබාතව්’ කම්කරුවන්ටද, යනාදීන්ට පොදු දෙයකි. නොයෙක් නොයෙක් ආකාරයේ දේශපාලනය ඇත. එබැවින් ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය සාංසිද්ධිකතාවයට හා එහි අවිඥතා ස්වභාවයට වන්දනය කරන විට, එය ඒ තාක් දුරටම දේශපාලන අරගලය ප්‍රතික්ෂේප නොකරන බව අපට පෙනේ. එය කම්කරු පංති ව්‍යාපාරයෙන්ම සාංසිද්ධික ලෙස පැන නගින දේශපාලන අරගලය (කම්කරුවන්ගේ දේශපාලන අභිප්‍රායයන් හා ඉල්ලීම් යන්න වඩා උචිතය) මුළුමනින්ම පිළිගන්නා අතරම, සමාජවාදයේ පොදු කර්තව්‍යයනට හා රුසියාවේ වර්තමාන තත්වයට ගැලපෙන විශේෂ වූ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක් ස්වාධීනව සකස් කර ගැනීමේ කටයුත්ත ඒකාන්ත ලෙස ප්‍රතික්ෂේප කරයි. ‘‘රබෝචිය දියල’’ පත්‍රයත් එම වරදම කරන බව තවත් ඉදිරියේදී පෙන්වා දෙන්නෙමු.

ඇ) ‘‘ස්වයං විමුක්ති කණ්ඩායම’’[60] සහ ‘‘රබෝචිය දියල’’ පත්‍රය

‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයෙහි ප්‍රථම කලාපයෙහි ඇතුලත් වූ, අප්‍රසිද්ධ හා දැනට බොහෝ දුරට අමතක වී ඇති ප්‍රධාන ලිපිය ගැන මෙතරම් දීර්ඝ ලෙස කරුණු සඳහන් කළේ, පසුව නිමක් නැති කුඩා

---

* කම්කරු පංතිය සාංසිද්ධික වශයෙන් සමාජවාදය වෙත ඇදී යන බව නිතර කියනු ලැබේ. සමාජවාදය අන් කිසිම න්‍යායකට වඩා ගැඹුරු ලෙස හා නිවැරදි ලෙස කම්කරු පංතියේ දරිද්‍රතාවයට හේතුව හෙළිදරව් කරන අතර, එම හේතුව නිසා එය කම්කරුවන්ට වඩාත් පහසුවෙන් වටහා ගැනීමට හැකිවීමේ අර්ථයෙන් එය සම්පූර්ණයෙන්ම සත්‍ය වේ. එහෙත් එය එසේ වන්නේ එම න්‍යාය ස්වයං උවමනාවෙන්ම සාංසිද්ධිකතාවයට ඉඩ නොදුනහොත් හා තමන්ට සාංසිද්ධිකතාවය යටත් කරගතහොත් පමණකි. සාමාන්‍ය වශයෙන් මෙය සිදු නොවෙතැයි බලාපොරොත්තු වන නමුත් ‘‘රබෝචිය දියල’’ පත්‍රය අමතක කරන්නේද, විකෘති කරන්නේද මෙය මය. කම්කරු පංතිය සාංසිද්ධික වශයෙන් සමාජවාදය වෙත ඇදී යයි; එසේ වුවද, ඉතාමත් පුළුල් ලෙස පැතිරී තිබෙන (හා නිරතුරුව හා නේකාකාර ලෙස නව ජීවනයක් දෙනු ලබන) ධනේශ්වර දෘෂ්ටිය ඊටත් වැඩි තරමින් එහි ආධිපත්‍ය කම්කරු පංතිය කෙරෙහි විහිදුවයි.

කඳුරු මෙන් එළිමහනට ඇදුනු පොදු චින්තා ඕසය ඉතාමත් සිත්කාවදිනසේ ප්‍රථම වරට ප්‍රකාශ වූයේ එම ලිපියෙන් වූ බැවිනි. ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයේ ප්‍රථම සංස්කරණය හා එහි ප්‍රධාන ලිපිය ගැන ප්‍රශංසා කිරීමේදී, එම ලිපිය ‘තියුණු හා උද්වේගකාරී’ ලෙස ලියා ඇතැයි ව්. ඉ. කියා තිබීම ඉතාමත් නිවැරදිය (‘‘ලිස්තොක් ‘‘රබෝත්නිකා’’’’ අංක 9—10, පිටු 49). තමන්ට කීමට අළුත් දෙයක් ඇතැයි යන නිශ්චිත අවබෝධයෙන් යුතු සෑම මිනිසෙක්ම, ඔහුගේ අදහස් ඉතා පැහැදිලිව කැපී පෙනෙන සේ ‘උද්වේගකාරී ලෙස’ ලියයි. ‘උද්වේගකාරිත්වය’ නොමැත්තේ දෙගිඩියාවෙන් පසුවෙන අයට පමණකි; දිනක ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයේ උද්වේගකාරිත්වයට ප්‍රශංසා කර, තවත් දිනෙක එහි ප්‍රතිපාක්ෂිකයන්ගේ ‘උද්වේගකාරී විතර්කයට’ පහර දිය හැක්කේ එවැනි අයට පමණකි.

‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයේ ‘‘විශේෂ අතිරේකය’’ ගැන මෙහිදී යමක් කීමට අදහස් නොකරමු (වෙනත් කිසිම කෘතියකට වඩා ස්ථිරසාර ලෙස ‘ආර්ථිකවාදී’ අදහස් ප්‍රකාශ කරන එය ගැන මෙම කෘතියෙහි පහත නොයෙක් අවස්ථාවලදී සඳහන් කිරීමට අපට සිදු වනු ඇත). එහෙත් (1899 ජූලි ලන්ඩනයේ ‘‘නකනූනි’’[61] අංක 7 හි යළි පළ කරන ලද) ‘‘කම්කරු ස්වයං විමුක්ති කණ්ඩායමේ ආයාචනය’’ (1899 මාර්තු) ගැන එහුඬින් සඳහන් කරන්නෙමු. ‘‘රුසියාවේ කම්කරුවන්ගේ පිබිදීම ආරම්භ වූවා පමණක් බවත්, ඔවුන් සිය වටපිටාව නිරීක්ෂණය කිරීම ආරම්භ කළා පමණක් බවත්, අරගලයෙහි යෙදීමට ලැබෙන ප්‍රථම මාධ්‍යයම කෙරෙහි ඔවුන් ඉවෙන් මෙන් එල්බ ගන්නා’’ බවත් ‘‘ආයාචනයේ’’ කතෘවරු නිවැරදි ලෙස කියති. එහෙත් මෙයින් ඔවුන් බැස ගන්නේ ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය බැස ගන්නා වැරදි නිගමනයටමය. එසේ නිගමනයට බැසගන්නේ ඉවෙන් මෙන් යනු අවිඥාන (සාංසිද්ධික) භාවය වන හෙයින් අරගලයට සහාය වීම පිණිස සමාජවාදීන් ඉදිරිපත් විය යුතු බව අමතක කිරීමෙනි; එමෙන්ම නවීන සමාජයේ අරගලයෙහි යෙදීමට ‘ලැබෙන ප්‍රථම’ මාධ්‍යය වෘත්තීය සමිති අරගලය වන බවත්, ‘ලැබෙන ප්‍රථම’ දෘෂ්ටිය ධනේශ්වර (වෘත්තීය සමිති) දෘෂ්ටිය වන බවත් අමතක කිරීමෙනි. එමෙන්ම මෙම කතෘවරු දේශපාලනයද අමතක නොකරති; ඔවුන් කරන්නේ ව. ව. කියන දෙය, එනම්, දේශපාලනය උඩු ව්‍යුහය වන නිසා, ‘දේශපාලන උද්ඝෝෂණයද, ආර්ථික අරගලයට පක්ෂව ගෙනයන උද්ඝෝෂණයේ උඩු ව්‍යුහය විය යුතුය’ යන්නද, ‘එය එම ආර්ථික අරගලයේ පදනමෙන් පැන නැගී එහි අඩිපාරේ ගමන් කළ යුතුය’ යන්නද නිකම් (නිකම්!) දෝංකාර දෙවීම පමණකි.

‘‘රබෝචිය දියල’’ පත්‍රය ක්‍රියාකාරිත්වය ඇරඹූයේ ‘ආර්ථිකවාදීන්’ ‘ආරක්ෂා කිරීමට’ ඉදිරිපත් වීමෙනි. අක්සල්රොඩ්ගේ සුප්‍රසිද්ධ පත්‍රිකාවෙන්* ඔහු ‘ආර්ථිකවාදීන්ට’ අනතුරු හැඟවීමක් කළ විට, ඔහු සඳහන් කළේ කුමන තරුණ සහෝදරවරු ගැනද යනු නොදන්නා’ බව කීමෙන් ‘‘රබෝචිය දියල’’ පත්‍රය (අංක 1, පිටු 141—142) ඇද බැවේ අන්ත මුසාවකි: මෙම මුසාවාදය සම්බන්ධයෙන් අක්සල්රොඩ් හා ප්ලෙහානව් සමග ඇවිලිගිය විවාදයේදී, (‘ආර්ථිකවාදීන්’ වෙත අක්සල්රොඩ් එල්ල කළ පටු ස්වභාවය පිළිබඳ වූ) ‘මෙම අයුක්ති සහගත චෝදනාවෙන් සියළුම විදේශගත තරුණ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ආරක්ෂා කිරීම පිණිස විමත ආකාරයෙන්’ තමන් ප්‍රයත්න දැරූ බව ‘රබෝචිය දියල’’ පත්‍රයට පිළිගැනීමට සිදුවිය. යථාර්ථ වශයෙන් මෙම චෝදනාව සම්පූර්ණයෙන්ම යුක්ති සහගත විය. වෙනත් අයට මෙන්ම ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ කතෘ මණ්ඩලයේ සිටි ව්. ඉ. ටද එය අදාල වන බව එම පත්‍රය දැන සිටියේය. එම විවාදය අතරතුර මගේ ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍යයන්’’ යන පත්‍රිකාව පිළිබඳ අර්ථ නිරූපනය කිරීමේදී අක්සල්රොඩ් සම්පූර්ණයෙන්ම නිවැරදි වූ බවත්, ‘‘රබෝචිය දියල’’ පත්‍රය සම්පූර්ණයෙන්ම වැරදි වූ බවත් මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. මෙම පත්‍රිකාව ලියන ලද්දේ 1897 දී ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය පළවීමට පෙර, සාන්ත පීටර්ස්බර්ග් ‘‘අරගලයේ සංගමය’’ තුළ, ඉහත මා ස්වභාව විස්තර දක්වා ඇති, මුල් ප්‍රවණතාවය ප්‍රබල වී ඇතැයි මා නිවැරදිව කල්පනා කළ අවස්ථාවේදීය. තවද, මෙම ප්‍රවණතාවය 1898 වර්ෂයෙන් අඩක් ගෙවෙන තෙක්ම පාහේ ප්‍රබලව පැවතුනි. එනිසා ‘ආර්ථිකවාදයේ’ අන්තරායක් පවතින බව ප්‍රතික්ෂේප කිරීමට ‘‘රබෝචිය දියල’’ පත්‍රය දරන ප්‍රයත්නයේදී,1897—1898 කාලය තුළ සාන්ත පීටර්ස්බර්ග්හි බලපෑ ‘ආර්ථිකවාදී’ අදහස් වල බලකිරීම නිසා එළිදුටු අදහස් ඇතුලත් පත්‍රිකාවක් ගැන සඳහන් කිරීමට එම පත්‍රයට කිසිම අයිතියක් නොමැත.**

---

* ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමාන කර්තව්‍යයන් හා උපක්‍රම’’. ජිනීවා, 1898. 1897 දී ‘‘රබෝචයා ගසියත’’ පත්‍රයට ලියූ ලිපි දෙක.

** (‘අක්සල්රොඩ් සඳහන් කළේ කුමන තරුණ සහෝදරවරු ගැනද යනු අපි නොදනිමු යන’) ප්‍රථම මුසාව සනාථ කිරීමට ‘‘රබෝචිය දියල’’ පත්‍රය දුන් එහි පිළිතුරෙන්, ‘‘‘‘කර්තව්‍යයන්’’ ගැන සමාලෝචනය පළ කිරීමෙන් පසුව, ‘‘කර්තව්‍ය’’ වල (පිටු 9) විස්තර

එහෙත් ‘‘රබෝචිය දියල’’ පත්‍රය කළේ ‘ආර්ථිකවාදීන්’ ‘ආරක්ෂා කිරීම’ පමණක් නොවේ. එයත් ‘ආර්ථිකවාදීන්’ කළ මූලික වැරැද්දම කළේය. මෙම වියවුල ප්‍රභව වූයේ ‘‘රබෝචිය දියල’’ වැඩ පිළිවෙළෙහි එන පහත දැක්වෙන රචනයට දෙන ලද අර්ථ නිරූපනයෙහි ව්‍යාකූල භාවයෙනි. ‘‘අපගේ අදහස අනුව, රුසියානු සාමාජ ජීවිතයේ ඉතාමත් වැදගත් වන, ප්‍රධාන වශයෙන් කර්තව්‍යයන් නිගමනය කරන (අවධාරණය අපගේය) හා සංගමයේ ප්‍රකාශන කටයුතුවල ස්වභාවය නිගමනය කරන කාරණය වන්නේ, මෑත අවුරුදු වලදී පැන නැගී තිබෙන පොදු ජන කම්කරු පංති ව්‍යාපාරයයි’’ (අවධාරණය ‘‘රබෝචිය දියල’’ පත්‍රයෙහිය). පොදු ජන ව්‍යාපාරය ඉතාමත් වැදගත් කාරණයක් වන බවට තර්ක අවශ්‍ය නොවේ. එහෙත් මෙහි ප්‍රධාන ප්‍රශ්නය වන්නේ පොදු ජන කම්කරු ව්‍යාපාරය විසින් ‘කර්තව්‍යයන් නිගමන කෙරෙන්නේය’ යන ප්‍රකාශය අයෙක් වටහා ගන්නේ කෙසේද යන්නයි. එය තේරුම් කිරීම දෙආකාරයකින් එකක් අනුව කළ හැක. එක්කෝ එයින් අදහස් කෙරෙන්නේ සාංසිද්ධිකතාවයට නමස්කාර කිරීමයි; එනම්, (‘‘රබෝචය මිස්ල්’’, ‘‘සවයං විමුක්ති කණ්ඩායම’’ හා අනිකුත් ‘ආර්ථිකවාදීන්’ අර්ථ නිරූපනය කරන ලෙසට) කම්කරු පංති ව්‍යාපාරය පවත්නාම පරිද්දෙන් ගෙන, ඊට උපකාරක වන සේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කාර්යභාරය පහත හෙළී ඒම එසේ නැතහොත් ඉන් අදහස් කෙරෙන්නේ, පොදු ජන ව්‍යාපාරය විසින් අප හමුවේ තබනු ලබන නව න්‍යායික, දේශපාලන හා සංවිධාන කර්තව්‍යයන්, එම ව්‍යාපාරය පැනනැගීමට පෙර අපට තෘප්තිදායක ලෙස ඉටු කළ හැකිවූ කර්තව්‍යයන්ට වඩා බෙහෙවින් සංකීර්ණ වන බවය. ‘‘රබෝචිය දියල’’ පත්‍රය මෙයින් ප්‍රථම අර්ථ නිරූපනය දෙසට බරවී ඇති අතර, තවදුරටත් ඒ දෙසටම නැඹුරු වෙයි. එය නව කර්තව්‍යයන් සම්බන්ධයෙන් නිශ්චිත කිසිවක් කියා නැතත්, ‘පොදු ජන ව්‍යාපාරය’ අප හමුවේ තබන කර්තව්‍යයන් පැහැදිලි ලෙස අවබෝධ කර ගැනීමේ හා ඒවා සපුරාලීමේ අවශ්‍යතාවයෙන්, එම ව්‍යාපාරය විසින් අප නිදහස් කරනු ලබන බවත් ඇඟවීමට එය නිරතුරුවම තර්ක කිරීම නිසා මේ බව පැහැදිලි වේ. අප මෙහිදී පෙන්වා දිය යුතුව ඇත්තේ සර්වබලධාරී ඒකාධිපති රජය පෙරළා දැමීම පොදු ජන ව්‍යාපාරයේ ප්‍රථම කර්තව්‍ය ලෙස කිසිසේත් නියම කළ නොහැකි යයි ‘‘රබෝචිය දියල’ පත්‍රය කල්පනා කළ බවත්, එය එම කර්තව්‍ය (පොදු ජන ව්‍යාපාරයේ නාමයෙන්) හදිසි දේශපාලන ඉල්ලීම් සඳහා කරන අරගලයක (‘‘පිළිතුර’’, පිටු 25) තත්වයට පහත හෙලූ බවත් පමණකි.

මෙම වරදම* යළිත් කරමින් ‘‘රබෝචිය දියල’’ අංක 7 හි

කෙරෙන අප ව්‍යාපාරයේ තත්වයේ සිට පියවරක් ආපස්සට තැබීමක් වන එක් පැත්තකට බරවූ ආර්ථිකවාදය කරා යාමේ ප්‍රවණතාවයක් සමහර රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් තුළ මතුවී ඇත; එසේ නැතහොත් එක්තරා දුරකට පැහැදිලි ලෙස සලකුණුවී ඇත.’’ යන්න ලිවීමෙන් තවත් මුසාවක් එකතු කළේය. මෙය කියන ලද්දේ 1900 පළ කළ ‘‘පිළිතුරෙහි’’ය. එහෙත් (සමාලෝචනය ඇතුලත්) ප්‍රථම ‘‘රබෝචිය දියල’’ පත්‍රය 1899 අප්‍රේල් මාසයේදී නිකුත්විය. ඇත්ත වශයෙන්ම ‘ආර්ථිකවාදය’ පැන නැගුනේ 1899 දීද? නැත. ‘ආර්ථිකවාදයට’ එරෙහිවූ රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ප්‍රථම විරෝධය (“Credo” ලියවිල්ලට විරෝධය) පළ කරන ලද්දේ 1899 දීය. ‘‘රබෝචිය දියල’’ පත්‍රය ඉතා හොඳින් දන්නා ලෙසට ‘ආර්ථිකවාදය’ පැන නැගුනේ 1897 දීය. 1898 නොවැම්බර් වන විටත් වි. ඉ. ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයට ප්‍රශංසා කරමින් සිටියේය (‘‘ලිස්තොක් ‘රබොත්නිකා’ ’’ අංක 9—10 බලන්න).

* නිදර්ශනයක් වශයෙන් දේශපාලන අරගලයේ ‘අවධි න්‍යාය’ නැතහොත් ‘බිය ගුළු වටවංගු’ න්‍යාය පහත සඳහන් ලෙසට මෙම ලිපියෙන් ප්‍රකාශ කර තිබේ. ‘‘සමස්ත රුසියාවටම පොදු ස්වභාවයක් ඇති දේශපාලන ඉල්ලීම්, ප්‍රථමයෙන්ම’’ (මෙය ලියන ලද්දේ 1900 අගෝස්තු මාසයේදී!) ‘‘ආර්ථික අරගලයේ යෙදී සිටින නියමිත කම්කරු ස්ථරය (එම වචනම!) ලබාගත් අත්දැකීම්වලට කෙසේ හෝ සම විය යුතුය. දේශපාලන උද්ඝෝෂණයෙහි යෙදෙනු යුත්තේ මෙම. අත්දැකීම් පදනම් කරගෙන පමණකි(!) ආදී වශයෙනි (පිටු 11). ආර්ථිකවාදී මිථ්‍යා දෘෂ්ටියේ අමූලික බොරු චෝදනාවක් යයි ඔහු සලකන දෙයක් ගැන විරෝධය ප්‍රකාශ කරන කතෘ වරයා(පිටු 4 හි) ශෝකාකූල ලෙස හා විශ්චිත ස්වරයකින් මෙසේ ප්‍රකාශ කරයි: ‘‘මාක්ස්ගේ හා එංගල්ස්ගේ න්‍යාය අනුව, යම්යම් පංතිවල ආර්ථික උවමනාවන් විසින් ඉතිහාසයේ තීරණාත්මක කාර්ය කොටසක් ඉටු) කෙරෙන බවත්, ඒ අනුව, විශේෂයෙන්ම නිර්ධන පංතිය, එහි ආර්ථික උවමනාවන් සඳහා කරන අරගලය, අන් සියල්ලටම වඩා, එහි පංති සංවර්ධනයට හා විමුක්ති අරගලයට ඉතාමත් වැදගත් විය යුතු බවත් නොදන්නා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා කවුද? (අවධාරණය අපගේය). ‘ඒ අනුව’ යන වචන මෙතැනට කොහෙත්ම නොගැලපේ. ආර්ථික උවමනාවන් තීරණාත්මක කාර්ය කොටසක් ඉටු කළ පමණින්, ආර්ථික (එනම්, වෘත්තීය සමිති) අරගලය අන් සියල්ලටම වඩා වැදගත්ය යන්න යම්තමින් හෝ අදහස් නොවේ; පංතිවලට ඉතාමත් අවශ්‍ය හා ‘තීරණාත්මක’ උවමනාවන් ඉටුකළ හැක්කේ පොදු දේශපාලන වෙනස් කිරීම් මගින් පමණක් වන හෙයිනි. විශේෂයෙන්ම නිර්ධන පංතියේ මූලික ආර්ථික උවමනාවන් ඉටු කළ හැක්කේ

‘‘රුසියානු ව්‍යාපාරයේ ආර්ථික හා දේශපාලන අරගලය’’ යන සිරස්තලය යටතේ එහි කතෘ බ. ක්‍රිචේව්ස්කි පළකළ ලිපිය අත් හැර දමා කෙළින්ම ‘‘රබෝචිය දියල’’ අංක 10 ට යන්නෙමු. ‘‘සර්යා’’ සහ ‘‘ඉස්ක්‍රා’’ පත්‍රවලට විරුද්ධව ක්‍රිචේව්ස්කි හා මර්තිනව් ඉදිරිපත් කළ විවිධ විරෝධතාවයන් පිළිබඳව විස්තර විභාග කිරීමටද අපි අදහස් නොකරමු. මෙහිදී අප උනන්දුවක් දක්වන්නේ ‘‘රබෝචිය දියල’’ පත්‍රය එහි දහවැනි කලාපයෙන් ගත් ස්ථාවරයට මුල්වූ ප්‍රතිපත්තිවල පදනම ගැන පමණකි. එනිසා,

‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සිය අත් බැඳගන්නේ නැත. එය, එහි කටයුතු කලින් සිතාගත් කිසියම් එක සැලැස්මකට හෝ ක්‍රමයකට සීමා කරන්නේ නැත; පක්ෂයේ ප්‍රයෝජනයට ගත හැකිව තිබෙන බලවේගයන්ට ගැලපෙන ආකාරයේ අරගල මාධ්‍යයන් එය පිළිගනියි’’ ආදී වශයෙනි. (‘‘ඉස්ක්‍රා’’, අංක 1)*

යන ප්‍රකාශයත්:

‘‘සියළුම තත්වයන් යටතේ සහ සෑම කල්හිම දේශපාලන අරගල කිරීමේ හොඳ පුහුණුවක් ලැබූ ශක්තිමත් සංවිධානයක් නොමැතිව, දූඩි ප්‍රතිපත්තිවලින් ආලෝකය ලබන හා ස්ථිරසාර ලෙස ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමානුකූල ක්‍රියා සැලැස්මක් කිසිසේත් තිබිය නොහැක. උපක්‍රමය යන නාමයට තරම් වන්නේ එවැනි සැලැස්මක් පමණකි’’ ‘‘ඉස්ක්‍රා’’, අංක 4).**

යන ප්‍රකාශයත් අතර ‘අත්‍යන්ත ප්‍රතිවිරෝධයක්’ තිබෙන බව ‘‘රබෝචිය දියල’’ පත්‍රයට පෙනීයාමේ අද්භූත කාරණය ගැන පරීක්ෂා නොකරමු.

උපක්‍රම ගැන කියතොත්, යථා යෝග්‍ය වන්නාවූ සියළුම මාධ්‍යයන් ප්‍රතිපත්තයක් වශයෙන් පිළිගැනීමත්, නියමිත දේශපාලන අවස්ථාවකදී

ධනේශ්වර පංතියේ ඒකාධිපතිත්වය වෙනුවට නිර්ධන පංති ඒකාධිපතිත්වයක් පිහිටුවන දේශපාලන විප්ලවයක් මගින් පමණකි. ක්‍රිචේව්ස්කි ‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ව. ව. ලාගේ’ (-ආර්ථිකය පසුපස දේශපාලනය ගමන් කරයි, ආදී වූ) තර්කද, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ බර්න්ෂ්ටයින්වාදීන්ගේ (නිදර්ශනය — කම්කරුවන් දේශපාලන විප්ලවය ගැන කල්පනා කිරීමට පෙර, ප්‍රථමයෙන්ම, ‘ආර්ථික බලය’ ලබාගත යුතු බව ඔප්පු කිරීමට වොල්ට්මන් එවැනි තර්ක ඉදිරිපත් කළේය) තර්කද පුනරුච්ඡාරනය කරයි.

* වී. අයි. ලෙනින් ‘‘අප ව්‍යාපාරයේ දැවෙන ප්‍රශ්න’’ බලන්න. සංස්කාරක

** වී. අයි. ලෙනින් ‘‘පටන් ගත යුත්තේ කොතැනින්ද?’’ බලන්න. සංස්කාරක

දූඩි ලෙස අනුගමනය කරනු ලබන සැලැස්මක් සඳහා වූ ඉල්ලීමත් යන දෙක එකට පටලවා ගැනීම යනු ව්‍යාධි සුව කිරීම සඳහා වෛද්‍ය විද්‍යාව මගින් විවිධ ප්‍රතිකාර ක්‍රම පිළිගෙන තිබීමත්, නියමිත ව්‍යාධියක් සුවකිරීම සඳහා කිසියම් නියමිත ප්‍රතිකාර ක්‍රමයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් යන දෙක එකට පටලවා ගැනීම හා සමාන දෙයකි. කෙසේ හෝ වේවා, මෙහි වැදගත් කාරණය වන්නේ, සාංසිද්ධිකතාවයට නමස්කාර කිරීම යනුවෙන් අප හඳුන්වා ඇති රෝගයට ගොදුරු වූ ‘‘රබෝචිය දියල’’ පත්‍රයම එම රෝගයට ‘ප්‍රතිකාර කිරීමේ ක්‍රමය’ පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමයි. ‘සැලැස්මක් ලෙස ගත් උපක්‍රම මාක්ස්වාදයේ මූලික ජීවගුණයට පටහැනි වේ’ (අංක 10, පිටු 18) යනුවෙන්ද, උපක්‍රම නම් ‘‘පක්ෂය හා සමග එකට වැඩෙන පක්ෂ කර්තව්‍යයන් වර්ධනය වීමේ ක්‍රියාදාමයකි’’ (පිටු 11, අවධාරණය ‘‘රබෝචිය දියල’’ පත්‍රයේය) යනුවෙන්ද වූ පුදුම සහගත සොයා ගැනීම් වෙතට එය යොමු වූයේ එහෙයිනි. මෙම කියමන විශාරද උපදේශවාක්‍යයක් බවට පත්වීමටත්, ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ ‘ප්‍රවණතාවයේ’’ නිත්‍ය සිහිවටනයක් බවට පත්වීමටත් සෑම ඉඩක්ම ඇත. ‘‘යන්නේ කොහේද?’’ යන ප්‍රශ්නයට ප්‍රධාන පත්‍රයෙන් පිළිතුර දෙන්නේ, ව්‍යාපාරය යනු එම ව්‍යාපාරයේ ආරම්භක ස්ථානයේ පටන් එය අනතුරුව ගිය තැන් දක්වා වූ දුර වෙනස් කිරීමේ ක්‍රියාදමයකියි කියමිනි. මෙම අසමසම වියත් භාෂිතය කුතුහල දනවන්නක් පමණක් නොවේ (එපමණක් වී නම් ඒ ගැන දිග දුරට සඳහන් කිරීම අවශ්‍ය නොවේ). එය මුළු ප්‍රවණතාවයකම වැඩ පිළිවෙළ වන්නේය. ඒ අතරම, (‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයේ ‘‘විශේෂ අතිරේකයෙන්’’) පහත සඳහන් වචන වලින් එර්. එම්. විසින් ප්‍රකාශිත වැඩ පිළිවෙළද එයම වේ: ගෙන යා හැකි අරගලය ගෙන ගිය මනාය. ගෙන යා හැකි අරගලය යනු නියමිත අවස්ථාවක සිදු වෙමින් පවතින අරගලයයි. මෙය නම් අකැමැත්තක් නොදක්වා සාංසිද්ධිකතාවයට ගැලපෙන සේ තමන් සකස් වන සීමා රහිත අවස්ථාවාදයේ ප්‍රවණතාවයයි.

‘‘සැලැස්මක් ලෙස ගත් උපක්‍රම මාක්ස්වාදයේ ජීවගුණයට පටහැනිය!’’ මෙය මාක්ස්වාදයට අපවාදයකි. එයින් අදහස් කෙරෙන්නේ අපට විරුද්ධව නරෝද්නික්වාදීන්[62] කළ අරගලයේදී ඔවුන් ඔසවාගත් විකට රූපයේ හැඩය මාක්ස්වාදයට ආරෝපනය කිරීම ය. එයින් අදහස් කෙරෙන්නේ, පංති විඥානය ඇති සටන් කරුවන්ගේ පුරෝගාමීත්වය හා ශක්තිය ලඝු කොට දැක්වීමකි. එහෙත් ඊට හාත්පසින් වෙනස් ආකාරයෙන්, මාක්ස්වාදය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාගේ

පුරෝගාමීත්වයට හා ධෛර්‍යයට යෝධ අනුබලයක් දෙයි; ඔහුට පුළුල්තම සිතුවිලි විවෘත කර දෙයි; අරගලය සඳහා 'සාංසිද්ධික ලෙස' නැගී එන්නා වූ දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ගේ දැවැන්ත බලවේගය සුදුසු ලෙස කටයුතු කිරීම සඳහා (යයි යමෙකුට කිව හැකි ලෙසට) ඔහු හමුවේ තබයි. දේශපාලන නායකයන් වරින් වර ඉදිරිපත් කළ සැලසුම් වලින් ජාත්‍යන්තර සමජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මුළු ඉතිහාසයම පිරී ඇත. ඉන් සමහරකින් ඒවායේ කතෘ වරුන්ගේ දුර දර්ශී භාවයත්, දේශපාලන සහ සංවිධානමය අදහස් වල නිවැරදි භාවයත් තහවුරු වේ; අනිත් ඒවායින් ඔවුන්ගේ අදූරදර්ශී භාවයත්, දේශපාලන වැරදිත් හෙළිදරව් වේ. ජර්මනිය, එහි ඉතිහායයේ තීරණාත්මක සන්ධිස්ථානයකට එළඹෙමින්, අධිරාජ්‍යය පිහිටුවීම, රීක්ස්ටාග් මන්ත්‍රණ සභාව විවෘත කිරීම සහ සර්වජනඡන්දය දීම සිදුවූ අවස්ථාවේ ලිබ්ක්නෙහ්ට් වෙත එක සැලැස්මකුත්, ශ්වයිට්සර් වෙත තවත් සැලැස්මකුත් තිබුණේය. ජර්මන් සමාජවාදීන්ගේ හිස මත සමාජවාදය විරෝධී නීතිය කඩා වැටුනු විට මොස්ට් හා හාසල්මාන්ට එක සැලැස්මක් තිබිණ. ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙන ලෙසට හිටි අඩියේම ආයාචනා කිරීමට ඔවුන් සූදානම්ව සිටිය, හේහ්බර්ග්, ශ්‍රාම් හා (එක්තරා ප්‍රමාණයකට) බර්න්ෂ්ටයින් වෙත වෙනත් සැලැස්මක් තිබිණි. එයින් දේශනා කිරීමට පටන් ගන්නා ලද්දේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අසාධාරණ ලෙස තදපරුෂ බවක් හා විප්ලවවාදී බවක් දැක්වීමෙන් ඔවුන්ම කළ ප්‍රකෝප කිරීම් හේතුකොට ගෙන එම නීතිය පනවන ලද හෙයින්, දැන් හොඳට හැසිරීමෙන් ඔවුන් සමාව දිනාගත යුතු බවයි. නීති විරෝධී පත්‍රයක්[63] සූදානම් කර පළ කිරීමේ කටයුත්ත ඉටුකළ අය විසින් ඉදිරිපත් කරන ලද තවත්, තුන්වැනි, සැලැස්මක්ද විය. අනුගමනය කළයුතු මාර්ගය තෝරා ගැනීම පිළිබඳව කෙරුනු අරගලයෙන් පසුව වර්ෂ ගණනක් ඉකුත් වූ තැන, තෝරාගත් මාර්ගයෙහි සුදුසුකම ගැන ඉතිහාසය විසින් තීරණය කරනු ලැබූ පසු, ආපසු හැරී බලා, පක්ෂය හා සමග එකට වැඩෙන පක්ෂ කර්තව්‍යයන්ගේ වර්ධනය පිළිබඳව උපදේශ වාක්‍ය ප්‍රකාශ කිරීම පහසුය. එසේ වුවද, අවුල් වියවුල් පවත්නා අවස්ථාවක,* රුසියානු 'විවේචකයින්' හා 'ආර්ථිකවාදීන්' විසින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය වෘත්තිය සමිති වාදයේ මට්ටමට පිරිහෙළනු ලබද්දී, පැරණි වැරදි ප්‍රතිරාවය දෙවන 'සැලැස්මක් වන උපක්‍රම' පිළිගන්නා ලෙස ත්‍රස්තවාදීන් බලකර සිටිද්දී, යමෙක් මෙබඳු පණ්ඩිත වාක්‍ය බිණීමට සීමාවී සිටින්නේ නම්, එය හේ තමන්ටම දීගන්නා 'දුගීභාවය පිළිබඳ සහතිකයක්' වන්නේය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතුරෙන් බොහෝ දෙනෙක් මන්දෝත්සාහී සහ උදසීන භාවයෙන්ද 'දේශපාලන ප්‍රචාරය උද්ඝෝෂණය සහ සංවිධාන කටයුතු සඳහා'* ප්‍රමාණවත් තරම් අවකාශ නොමැතිකමින්ද, විප්ලවීය කටයුතු පුළුල් ලෙස සංවිධානය කිරීමට සැලසුම් නොමැතිකමින්ද පෙළෙමින් සිටි අවස්ථාවක 'සැලැස්ම ලෙස ගත් උපක්‍රම මාක්ස්වාදයේ ජීවගුණයට පටහැනි' වන බව ප්‍රකාශ කිරීම යනු න්‍යායික වශයෙන් මාක්ස්වාදය දියාරු කිරීමක් පමණක් නොව, ව්‍යවහාරය අතින් පක්ෂය ආපස්සට ඇදගෙන යාමක්ද වන්නේය.

''රබෝචිය දියල'' පත්‍රය මෙසේද දේශනා කරයි: ''විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාගේ කර්තව්‍ය වන්නේ, ඔහු කරන විඥත කටයුතු වලින් වාස්තවික සංවර්ධනය වේගවත් කිරීම පමණකි; එය වැලැක්වීම හෝ එම සංවර්ධනය වෙනුවට ඔහුගේ ම මනෝමූල සැලසුම් ආදේශ කිරීම හෝ නොවේ.'' ''ඉස්ක්‍රා'' පත්‍රය මේ සියල්ලම න්‍යායික වශයෙන් දනී. එහෙත් උපක්‍රම සම්බන්ධයෙන් මාක්ස්වාදය දරන්නාවූ න්‍යාය ධර්මවාදී අදහස හේතු කොට ගෙන, එය විප්ලවවාදී කටයුතු විෂයෙහිදී විඥත කටයුතු කෙරෙහි යුක්තියුක්ත ලෙස දක්වන අතිශය වැදගත් සැලකිල්ල, ව්‍යවහාරයේදී සංවර්ධනයේ වාස්තවික නැතහොත් සාංසිද්ධික ස්වභාවයේ වැදගත්කම ලඝුකොට තැකීමේ තත්වයට පත්වේ'' (පිටු 18).

මෙය ච. ව. මහතාට සහ ඔහුගේ සහෝදරවරුන්ටම ගැලපෙන අසාමාන්‍ය න්‍යායික අවුලක් පිළිබඳ නිදර්ශනයකි. අපේ දර්ශනිකයාගෙන් අපි මෙසේ අසන්නෙමු. මනෝමූල සැලැස්ම නිර්මාණය කරන්නෙකු විසින් වාස්තවික සංවර්ධනය 'ලඝුකොට තකනු' ලැබිය හැක්කේ කෙසේද? එය සිදුවිය හැක්කේ, වාස්තවික සංවර්ධනය මගින් සමහර පංති හෝ ස්ථරයන්, සමහර ජාතීන් හෝ ජාතීන්ගේ කණ්ඩායම් ආදිය නිර්මාණය හා ශක්තිමත් වන බව, නැතහොත් විනාශවන හෝ දුර්වල වන බව අමතක කිරීමෙන් හා ඒ අනුව ජාත්‍යන්තර දේශපාලන බලවේග පෙළගැසීමක් නැතහොත් විප්ලවවාදී පක්ෂ සම්මත කරගන්නා කිසියම් ස්ථාවරයක් ආදිය පිළිබඳව නිගමනයකට බැසීමට යොමු වීම තුළින් බව පැහැදිලිය. සැලසුම් නිර්මාණය කරන තැනැත්තේ

---

* නව තත්වයට මුහුණ දීම සඳහා 'සැලැස්මක් වන උපක්‍රම' තෝරා ගැනීමේදී සමාජවාදීන් ප්‍රථමයෙන් දැක්වූ දෙගිඩියාව හා අධිෂ්ඨාන ශූන්‍ය භාවය ගැන විස්තරයද ඇතුලත් ''ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතිහාසය'' නමින් මේරින්ග් ලියූ පොතෙහි එම විස්තරය අඩංගු පරිච්ඡේදයේ සිරස්තලය යොදා තිබුණේ Ein Jahr der Verwirrung (අවුල් වියවුල් සහිත අවුරුද්දක්) යනුවෙනි.

* ''ඉස්ක්‍රා'' අංක 1 හි ප්‍රධාන ලිපිය. (වී. අයි. ලෙනින් ''පටන් ගත යුත්තේ කොතැනින්ද?'' බලන්න. සංස්කාරක)

කළේ එය නම්, ඔහු වැරදිකරු වන්නේ සාංසිද්ධිකතාවය ලඝුකොට තැකීම සම්බන්ධයෙන් නොව විඥත ස්වභාවය ලඝුකොට තැකීම සම්බන්ධයෙනි. එසේ වන්නේ, වාස්තවික සංවර්ධනය මනා ලෙස වටහා ගැනීමට අවශ්‍ය ‘විඥනය’ ඔහුට නොතිබුණු බව එයින් පෙනෙන හෙයිනි. එනිසා, සාංසිද්ධික භාවයේ හා විඥත භාවයේ ‘සාපේක්ෂ වැදගත්කම තක්සේරු කිරීම’ ගැන කථා කිරීමෙන්ම ‘විඥනය’ කොහෙත්ම නොමැති බව හෙළිදරව් වේ. ‘සංවර්ධනයේ සාංසිද්ධික අංගෝපාංගයන්’ සමහරක් මිනිස් අවබෝධයට හසු කර ගැනීමට කිසියම් හෝ හැකියාවක් තිබේ නම්, එවිට ඒවා වැරදි ලෙස තක්සේරු කිරීම යනු ‘විඥත ස්වභාවය ලඝු කොට තැකීමක්’ හා සමාන වේ. එහෙත්, ඒවා වටහා ගැනීමට අපට නොහැකි නම්, ඒවා ගැන අපි නොදන්නෙමු නම්, එනිසාම අපට ඒ ගැන කථා කළ නොහැක. එසේනම් ක්‍රිචෙව්ස්කි සාකච්ඡා කරන්නේ කුමක් ගැනද? (ඔහු ප්‍රකාශ කර ඇති අන්දමට “ඉස්ක්‍රා” පත්‍රයේ ‘මනෝමූල සැලසුම්’ වැරදි සහගත යයි ඔහු කල්පනා කරන්නේ නම්, එම සැලසුම් විසින් අමතක කෙරෙන වාස්තවික කරුණු මොනවාද, යනු ප්‍රථමයෙන් පැහැදිලි කර, ඒවා අමතක කිරීමට තරම් දේශපාලන විඥනය නොමැතිවීම ගැන, ඔහුගේම වචනවලින් කියතොත්, “විඥත භාවය ලඝු කොට තැකීම” ගැන “ඉස්ක්‍රා” පත්‍රයට චෝදනා කළයුතුව තිබුණේ ඉන් පසුව පමණකි. කෙසේ හෝ වේවා, ඔහු මනෝමූල සැලසුම් ගැන අප්‍රසන්නව, ‘සාංසිද්ධිකතාවය ලඝුකොට තැකීම’ (!!) හැර වෙනත් තර්කයක් ඉදිරිපත් කිරීමෙහි අසමත්ව සිටීනම්, එවිට පෙනී යන්නේ, (1) න්‍යායික වශයෙන් ඔහු මාක්ස්වාදය වටහා ගන්නේ බෙල්තව්ගෙන්[64] සෑහෙන තරම් සමච්චල්වී සිටින කරේයිව් හා මිහයිලෝව්ස්කි මෙන් වන බවත්, (2) අපගේ නීත්‍යානුකූල මාක්ස්වාදීන් බර්න්ෂ්ටයින්වාදය වෙතද, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ‘ආර්ථිකවාදය’ වෙතද ඇදගෙන ගිය ‘සංවර්ධනයේ සාංසිද්ධික ස්වභාවය” ගැන ඔහු ප්‍රයෝගික වශයෙන් ඉතාමත් සතුටු වී සිටින බවත් හා කුමන තත්වයක් යටතේ වුවද රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය ‘සාංසිද්ධික’ සංවර්ධනයේ මාර්ගයෙන් ඉවතට යොමු කිරීමට ඉටාගෙන සිටින අය කෙරෙහි වූ ‘කෝපයෙන් ඔහු පුපුරමින් සිටින’ බවත් පමණකි.

තවද, ඉන් පසුව සඳහන්ව ඇත්තේ, නිශ්චිත වශයෙන්ම විහිළු ස්වභාවයක් ගන්නා දේය. “ස්වභාවික විද්‍යාවේ සොයාගැනීම් සියල්ලක්ම එසේ තිබියදී, මිනිසුන් උත්පාද වන්නේ පරණ ක්‍රමයටම වන මෙන්, සමාජ විද්‍යාවේ සොයාගැනීම් සියල්ලමත්, විඥන සටන්කරුවන්ගේ සංඛ්‍යාව වැඩි වීමත් එසේ තිබියදී අනාගතයේදීත් නව සමාජ ක්‍රමයක් බිහිවන්නේ ප්‍රධානවශයෙන් ප්‍රකෘති ස්වභාවයේ පිපිරීම තුළිනි” (පිටු 19). ලොවට දරුවන් ගෙන ඒමට ඕනෑම කෙනෙක් සමත් වෙතියි අපගේ සීයාවරු ඔවුන්ගේ පරණකාලේ නුවණින් ප්‍රකාශ කළාක් මෙන්ම, නව සමාජ ක්‍රමයේ සාංසිද්ධික උත්පත්තියට ඕනෑම කෙනෙකුට හවුල් විය හැකි යයි (නර්චිසිස් තුපරිලව් වැනි[65]) නව සමාජවාදීන්ද, දැන් ඔවුන්ගේ නුවණ මෙහෙයා කියති. ඕනෑම කෙනෙකුට හැකි බව අපි ද විශ්වාස කරමු. ඒ වර්ගයේ හවුල්වීම සඳහා කළයුතුවන්නේ, ‘ආර්ථිකවාදය’ ප්‍රබල වූ කල එයටද, ත්‍රස්තවාදය මතුවන විට එයටද ඉඩදී යටත් වීම පමණකි. ත්‍රස්තවාදයෙන් මෝහනය වීමට විරුද්ධව අනතුරු හැඟවීමේ ස්වරය නාද කරවීම මේ වර්ෂයේ වසන්තයේදී එතරම්ම වැදගත් කර්තව්‍යයක් වී තිබියදී, “රබෝචිය දියල” පත්‍රය එයට ‘අළුත්’ දෙයක් වූ ගැටළුවක් ඉදිරියේ විශ්චිතව තුෂ්නිම්භූත වූයේ ඒ අනුවය. දැන් ඉන් හය මසකට පසුව, එම ප්‍රශ්නයේ කාලෝචිත භාවය අඩුවී ගිය තැන, “ත්‍රස්තවාදී හැඟීම් පැන නැගීමට විරුද්ධව ක්‍රියා කිරීම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍යයක් නොවන බව හා නොවිය යුතු බව අපි අදහස් කරමු” යන (“රබෝචිය දියල” අංක 10, පිටු 23) ප්‍රකාශයත් “ක්‍රමාණුකූල හා ආක්‍රමණශීලි ත්‍රස්තය අවස්ථාවෝචිත නොවන බව සම්මෙලනය කල්පනා කරයි” (“සම්මේලන දෙකක්”, පිටු 18) යන සම්මේලන යෝජනාවත් යන දෙකම අප වෙත එකවර ඉදිරිපත් කරයි. මෙය කොතරම් අලංකාර ලෙසට පැහැදිලිද? ගැලපෙන සුළුද?! විරුද්ධව ක්‍රියා නොකරන නමුත්, අවසථාවෝචිත නොවන බව ප්‍රකාශ කරන අතර, එය ද ප්‍රකාශ කර ඇත්තේ ක්‍රමාණුකූල නොවන හා ආරක්ෂාශීලී ත්‍රස්තය ‘යෝජනාවේ’ පරිමාණයට හසු නොවන ආකාරයටය. කථා කරන එහෙත් කිසිවක් නොකියන මිනිසෙක් වැරදි නොවන ලෙසට ස්වයං-රක්ෂණය කර ගන්නා සේ, එවැනි **යෝ**ජනාවක්ද ඉතාමත් ආරක්ෂා සහිත හා වැරදි වැලැක්වීමට සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කර තිබෙන එකක් බව පිළිගත යුතුය. එවැනි යෝජනාවක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නේ යෝජනාවේ අන්තිම කෙළවර රැඳී සිටීමේ හැකියාව පමණකි. ත්‍රස්තය පිළිබඳ ප්‍රශ්නය අළුත් එකකැයි කීම ගැන “ඉස්ක්‍රා” පත්‍රය, “රබෝචිය දියල” පත්‍රයට සමච්චල් කළ විට, “රබෝචිය දියල” පත්‍රය කළේ ‘විදේශගත ලේඛකයන් කණ්ඩායමක් විසින් අවුරුදු පහළොවකටත් උඩදී උපක්‍රමීය ප්‍රශ්න සම්බන්ධයෙන් යෝජනා කරන ලද විසදීම් පක්ෂ සංවිධානය මත පැටවීමට තරම් නො ඇදහිය හැකි විළිබිය නොමැතිකමක්’ (පිටු 24) “ඉස්ක්‍රා” පත්‍රයට ඇතැයි උදහසින් චෝදනා කිරීමය. සැබෑ ලෙසටම විළිබිය නොමැතිකමකි. විඥත

ස්වභාවය ගැන කොතරම් නම් අධිතක්සේරුවක්ද? ප්‍රථමයෙන් න්‍යායික වශයෙන් ප්‍රශ්න කල්තබා විසඳාගෙන, ඉන්පසු එම විසඳීමේ නිරවද්‍යතාවය ගැන සංවිධානයට, පක්ෂයට හා ජනතාවට අවබෝධ කිරීමට දරන ප්‍රයත්නයකි!* ප්‍රකෘතිය ප්‍රතිරාවය කරමින්, කිසිම කෙනෙක් මත කිසිම දෙයක් 'පටවන්නේ' නැතිව සෑම 'නැම්මක්' ම සමග එක්කෝ 'ආර්ථිකවාදයේ' නැතහොත් ත්‍රස්තවාදයේ පැත්තට පැද්දී ගියේ නම් මීට වඩා කොතරම් හොඳද? ලෝකායත ප්‍රඥාවෙහි මෙම මහා ශික්ෂාව පවා පොදු නිගමනයක් බවට හරවා ගන්නා ''රබෝචිය දියල'' පත්‍රය 'රූපයක් නොමැති අවුල් ජාලයකට උඩින් පියාසර කරන ජීවබලයක් මෙන් ඔවුන්ගේ වැඩ පිළිවෙළ ව්‍යාපාරයට හරස් කොට තබත්' යැයි (පිටු 29) ''ඉස්ක්‍රා'' සහ ''සර්යා'' පත්‍රවලට චෝදනා කරයි. එහෙත්, සාංසිද්ධික ව්‍යාපාරයට ඉහළින් පියාසර කරන්නාවූ පමණක් නොව, එම ව්‍යාපාරය 'තම වැඩ පිළිවෙළේ මට්ටමට' ඉහළට තල්ලු කරන්නාවූ ද 'ජීවබලයක්' වීම හැර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට හිමි වෙන කුමන කාර්යයක්ද? ව්‍යාපාරයේ වල්ගයට වී ඇදී යාම ඇත්තෙන්ම එහි කාර්යය නොවේ. එසේ කිරීම ඉතාමත් හොඳ අර්ථයෙන් ගතහොත් ඉන් ව්‍යාපාරයට සිදුවන යහපතක් නැත; එය නරකම අර්ථයෙන් ගතහොත් එය අතිශයින්ම හානිකරය. එසේවුවද, ''රබෝචිය දියල'' පත්‍රය 'ක්‍රියාදමයක් වන උපක්‍රම' අනුගමනය කරනු හැර, එය ප්‍රතිපත්තියක තත්වයට ඔසවා තැබීම ද කරයි. එනිසා එම ප්‍රවණතාවය, අවස්ථාවාදය වශයෙන් විස්තර කරනවාට වඩා (වල්ගය යන වචනයෙන් ගත්) වල්ගාවාදය යනුවෙන් විස්තර කිරීම උචිතය. එමෙන්ම, නිතරම ව්‍යාපාරය පසුපස යාමට හා එහි වල්ගය වීමට අධිෂ්ඨාන කර ගෙන සිටින අය සම්පූර්ණ වශයෙන් හා සදාකාලිකවම 'සංවර්ධනයේ සාංසිද්ධික ස්වභාවය ලඝු කොට තැකීමට' හසු නොවන සේ සුරක්ෂිතව සිටින බව පිළිගත යුතුව ඇත.

* * *

රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ 'නව ප්‍රවණතාවය' විසින් කරන ලද මූලික වරද නම් සාංසිද්ධිකතාවයට නමස්කාර කිරීම බවත්, ජනතාවගේ සාංසිදධිකතාවය නිසාම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විඥනය උසස් මට්ටමක පැවතීමේ අවශ්‍යතාවය වටහා ගැනීමට එය අසමත් වීම බවත්, අපට අවබෝධ වී ඇත. ජනතාවගේ උත්සන්නිය මහත් වූ තරමටම, ව්‍යාපාරය වඩාත් ව්‍යාප්ත වූ හා වේගවත් වූ තරමටම, ඊට වඩා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ න්‍යායික, දේශපාලන හා සංවිධිත කටයුතු විෂයෙහි විඥන ස්වභාවය වැඩියෙන් තිබීම අවශ්‍ය වේ.

රුසියාවේ සාංසිද්ධික ජනතා උත්සන්නිය කොතරම් වේගවත් ලෙස සිදුවීද (හා තවදුරටත් සිදු වන්නේද) යත් මෙම යෝධ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා තරුණ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් සූදානමක් ඇතිව නොසිටි බව ඔප්පු විය. මෙම සූදානමක් නොමැතිකම අපගේ පොදු දුර්භාග්‍යයයි. සියළුම රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ දුර්භාග්‍යයයි. ජනතා උත්සන්නිය ඇතිවී, අවිච්ඡේද ලෙස පැතිරී ගියේය; එය පැවතුනේ එය ආරම්භ වූ ප්‍රදේශවල පමණක් නොවේ. (කම්කරු පංති ව්‍යාපාරයේ බලපෑම යටතේ) එය අළුත් ප්‍රදේශවලටත්, අළුත් ජනතා ස්ථරයන්ටත් පැතිර ගියේය (තරුණ ශිෂ්‍යයන් අතර, පොදු වශයෙන් බුද්ධිමතුන් අතර හා ගොවි ජනයා අතර පවා කැළඹිලි නව පණක් ලද්දේය). එහෙත් විප්ලවවාදීන්, ඔවුන්ගේ 'න්‍යාය' හා ක්‍රියාකාරිත්වය යන දෙකම සම්බන්ධයෙන් උත්සන්නිය පිටුපසින් ගාටමින් සිටියහ. සමස්ත ව්‍යාපාරයටම නායකත්වය දීමෙහි සමත්, ස්ථායී හා නොකඩවා කටයුතු කරන සංවිධානයක් පිහිටුවීමට ඔවුහු සමත් නොවූහ.

''රබෝචිය දියල'' පත්‍රය අපගේ න්‍යායික කර්තව්‍යයන් ලඝුකොට තැකූ බවත්, හැඩකාර 'විවේචනය කිරීමේ නිදහස' යන චිත්තාකර්ෂණීය පාඨය 'සාංසිද්ධික ලෙස ප්‍රතිරාවය කළ බවත් පළමුවැනි පරිච්ඡේදයෙන් සනාථ කෙළෙමු. මෙම චිත්තාකර්ෂණීය පාඨය ප්‍රතිරාවය දෙවූ අයට, අවස්ථාවාදී 'විවේචකයන්ගේ' ස්ථාවරයනුත්, ජර්මනියේ සහ රුසියාවේ විප්ලවවාදීන්ගේ ස්ථාවරයනුත් කෙළින්ම එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ බව වටහා ගැනීමට තරම් 'විඥනය' තිබුණේ නැත.

මෙසේ සාංසිද්ධිකතාවයට නමස්කාර කිරීම, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ දේශපාලන කර්තව්‍යයන්හිදී සහ සංවිධාන කර්තව්‍යයන්හිදී ප්‍රකාශිත වූයේ කෙසේද යන්න ඉදිරියේ එන පරිච්ඡේද වලින් පෙන්වා දෙන්නෙමු.

---

* කම්කරු විමුක්ති කණ්ඩායම ත්‍රස්තය පිළිබඳ ප්‍රශ්නය න්‍යායික වශයෙන් විසඳීමේදී, පසුකාලීන විප්ලවවාදී ව්‍යාපාරයේ අත්දැකීම් වලින් පොදු නිගමනයන්ට එළඹගත් බවද අමතක කළයුතු නොවේ.

III

වෘත්තීය සමිතිවාදී දේශපාලනය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය

නැවතත් ''රබෝචිය දියල'' පත්‍රයට ප්‍රශංසා කරමින් පටන් ගනිමු. මර්තිනව් ''ඉස්ක්‍රා'' පත්‍රය සමග එකඟ නොවන්නා කරුණු සම්බන්ධයෙන් ඔහු ''රබෝචිය දියල'' අංක 10 හි පළකළ ලිපියට සිරස්තලය කොට ගෙන තිබුණේ ''එළිදරව්කාරී සාහිත්‍ය සහ නිර්ධන පංති අරගලය'' යන්නය. වෙනස්කම්වල හරය ඔහු ඉදිරිපත් කළේ පහත සඳහන් පරිදිය. ''එහි (කම්කරු පංති පක්ෂයේ) වර්ධනයට බාධාකාරී ක්‍රමය හෙළිදරව් කිරීමට පමණක් සීමාවී අපට සිටිය නොහැක. නිර්ධන පංතියේ හදිසි ප්‍රවර්තන උවමනාවන් සම්බන්ධයෙන්ද අප ක්‍රියාකාරී විය යුතුය... ''ඉස්ක්‍රා'' පත්‍රය... ඇත්ත වශයෙන් අපගේ රටේ තත්වය විශේෂයෙන් දේශපාලන තත්වය හෙළිදරව් කරන විප්ලවවාදී විරුද්ධ පිළේ පත්‍රයකි... කෙසේ හෝ වේවා, අපි කම්කරු පංතියේ යහපත පිණිස නිර්ධන පංති අරගලය සමග සමීප ඓන්ද්‍රීය සම්බන්ධකම් ඇතිව කටයුතු කරමු; දිගටම කටයුතු කරන්නෙමු'' (පිටු 63). මෙම සූත්‍රය ප්‍රකාශයට පත් කිරීම ගැන මර්තිනව්ට කෘතඥ නොවී බැරිය. ''රබෝචිය දියල'' පත්‍රය සමග ඇති අපගේ අසමඑයන් පමණක් නොව, දේශපාලන අරගලය පිළිබඳ ප්‍රශ්නයේදී 'ආර්ථිකවාදීනුත්' අපත් අතර ඇති පොදු අසමඑයන්ද බොහෝ දුරට එම සූත්‍රයේ ආලිංගනයට හසුව ඇති හෙයින් එය ගැන ඇතිවන්නේ අති මහත් පොදු උනන්දුවකි. 'ආර්ථිකවාදීන්' මුළුමනින්ම 'දේශපාලනය' ප්‍රතික්ෂේප නොකරන බවත්, එහෙත් නිරන්තරවම ඔවුන් දේශපාලනය පිළිබඳ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයෙන් බැහැර වෙමින් වෘත්තීය සමිතිවාදී සංකල්පය කරා යොමු වන බවත් අපි පෙන්වාදී ඇත්තෙමු. මාර්තිනව්ද ගන්නේ හරියටම ඒ මාර්ගයමය. එනිසා, මෙම ප්‍රශ්නය පිළිබඳවූ 'ආර්ථිකවාදී' වරදෙහි අනුරූපය වශයෙන් ඔහුගේ අදහස් ගන්නෙමු. මෙම තෝරා ගැනීම සම්බන්ධයෙන්, ''''රබෝචය මිස්ල්'' පත්‍රයේ විශේෂ අතිරේකයේ'' කතෘවරුන්ට වත්, ''ස්වයං විමුක්ති කණ්ඩායම'' නිකුත් කළ ප්‍රකාශනයේ කතෘවරුන්ට වත්, එසේත් නැතහොත්, ''ඉස්ක්‍රා'' අංක 12 හි පළකරන ලද 'ආර්ථිකවාදී' ලිපියෙහි කතෘවරුන්ට වත් උරණවීමට හේතුවක් නොමැති බව ඔප්පු කිරීමට උත්සාහ ගන්නෙමු.

අ) දේශපාලන උද්ඝෝෂණය හා ආර්ථිකවාදීන් විසින් එය සීමා කරනු ලැබීම

ආර්ථික (කම්හල් හා සේවා) තත්වයන් හෙළිදරව් කරමින් 'සාහිත්‍ය' පළ කිරීමක් හා සමග සමකාලීනව රුසියානු කම්කරුවන්ගේ ආර්ථික* අරගලය පුළුල් ලෙස පැතිරී යාම හා ශක්තිමත් වීම සිදුවූ බව කවුරුත් දනිති. 'පත්‍රිකා' ප්‍රධාන වශයෙන් මිඩංගු කරන ලද්දේ පැක්ටරි ක්‍රමය හෙළිදරව් කිරීම සඳහා වූ අතර, නොබෝ කලින් හෙළිදරව් කිරීම සඳහා අනුරාගයක් බඳු උනන්දුවක් කම්කරුවන් අතර පිබිදුනි. කම්කරුවන්ගේ දුක්බර පැවැත්ම, දැරිය නොහැකි තරම් අසීරු වැඩ හා අයිතිවාසිකම් නොමැතිකම ගැන සම්පූර්ණ සත්‍ය තොරතුරු කියන අළුත් පන්නයේ පත්‍රිකාවක් සැපයීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අධ්‍යයන කව කැමති බවත්, එය කිරීමට ඒවා සමත් බවත් කම්කරුවන්ට අවබෝධ වූ වහාම පැක්ටරි හා වැඩපලවලින් අප වෙත ලිපි එවන්නට, ඇත්ත වශයෙන් ගංගාවක් ගලන මෙන් ලිපි එවන්නට ඔවුහු පටන්ගත්හ. මෙම 'එළිදරව්කාරී සාහිත්‍යයෙන්' එළිදරව්වට අදාල පැක්ටරියෙහි පමණක් නොව හෙළිදරව් කරන ලද කරුණු පිළිබඳ පුවත පැතිරී ගිය සියළුම පැක්ටරිවලද අතිමහත් ආන්දෝලනයක් ඇති විය. එපමණක් නොව විවිධ ව්‍යවසායයන්හි හා විවිධ සේවාවල කම්කරුවන්ගේ දුප්පත්කම හා අඟහිඟකම බොහෝ දුරට එක සමාන හෙයින් 'කම්කරුවන්ගේ ජීවිතය පිළිබඳ සත්‍යයෙන්' සියළු දෙනාම කැළඹී ගියේය. ඉතාමත් නොදියුණු කම්කරුවන් තුළ පවා 'මුද්‍රණ ද්වාරයෙන් පළ කිරීමට' ඇතිවූ බලවත් උනන්දුව අනුරාගයක් බඳු විය. කොල්ලකෑම හා පීඩනය මත පදනම් වී ඇති සමස්ත වර්තමාන සමාජ ක්‍රමයටම විරුද්ධව ගෙනයන මේ ප්‍රාරම්භක යුද්ධ ක්‍රමය සඳහා වූ එම අනුරාගය උතුම්. හෙළිදරව් කිරීම් හේතුකොට ගෙන කම්කරුවන් බෙහෙවින් කැළඹිල්ලට පත්වූහ. ඒ අනුව, ඉතාමත් බරපතල සාපරාධී තත්වයන් ඉවත් කිරීම සඳහා ඔවුන් අතරින් පොදු ඉල්ලීම් මතු වීමත් වැඩ වර්ජන මගින් ඉල්ලීම්

---

* මෙහි හා මෙම පොත මුළුල්ලේම ආර්ථික අරගලය යනුවෙන් අප අදහස් කරන්නේ (අප අතර පිළිගත් යෙදුම අනුව) 'ප්‍රායෝගික ආර්ථික අරගලය'යි; එය, එංගල්ස් හැඳින්වූ, ඉහත උපුටා දක්වා ඇති කොටසෙහි 'ධනපතියනට ප්‍රතිරෝධනය' යනුවෙන් සඳහන් කර ඇති අරගලය සහ නිදහස් රටවල සංවිධානය වූ සේවා සින්ඩිකල් නැතහොත් වෘත්තීය සමිතිවාදී අරගලය ද බවත් වැරදි අවබෝධයක් ඇති වීම වැලැක්වීම උදෙසා සඳහන් කරමු.

ශක්තිමත් කිරීමේ සූදනමක් ඔවුන් තුළ ජනිත වීමත් සිදුවිය. එනිසා මෙම ‘පත්‍රිකා’ අතුරෙන් බහුතරය ඇත්ත වශයෙන්ම යුද්ධ ප්‍රකාශ කිරීමක් විය. අවසානයේදී මෙම පත්‍රිකා යුද්ධ ප්‍රකාශ කිරීමක් වශයෙන් පිළිගැනීමට ස්වාමි වරුන්ටම සිදුවිය. ඉන් බොහෝ අවස්ථාවල සටන් ආරම්භ වන තෙක්වත් නොසිට ඔවුන් ක්‍රියාත්මක වීමෙන් මේ බව පැහැදිලි වේ. නිතරම පාහේ දක්නට ලැබුණු පරිද්දෙන්, හෙළිදරව් කිරීම් ප්‍රකාශයට පත්කළ පමණින්ම ඒවා ප්‍රතිඵලදයක විය; ශක්තිමත් සදචාරමය බලපෑමක් වශයෙන් ඒවා වැදගත් තත්වයක් ගත්තේය. පත්‍රිකාව පළවූ පමණින්ම, ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සියල්ල හෝ ඉන් කොටසක් දෙන ලද අවස්ථා බොහෝය. කොටින් කියතොත් ආර්ථික (පැක්ටරි) හෙළිදරව් කිරීම් ආර්ථික අරගලයේ වැදගත් ලීවරයක් විය. තවදුරටත් එසේම වන්නේය. කම්කරුවන්ට ඔවුන්ගේ ආරක්ෂාව සලසා ගැනීමේ අවශ්‍යතාවය ඉස්මතු කරන ධනවාදය පවතින තාක් කල් හෙළිදරව් කිරීම්වල වැදගත්කමද තවදුරටත් පවතිනු ඇත. යුරෝපයේ ඉතාමත් දියුණු රටවල කිසියම් නොදියුණු ‘කර්මාන්තයක’, නැතහොත් අමතක කර දමන ලද දේශීය කර්මාන්ත අංශයක අක්‍රමිකතාවයන් හෙළිදරව් කිරීම පංති විඥනය පුබුදු කිරීමටත් වෘත්තීය සමිති අරගලය ආරම්භ කිරීමටත් සමාජවාදය පැතිරවීමටත්* ආරම්භක පියවරක් වශයෙන් ප්‍රයෝජනවත් වන බව තවමත් දක්නට ලැබේ.

මෑත කාලය තුළ රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වැඩි දෙනෙක් මුළුමනින්ම පාහේ ඇලී ගැලී සිටියේ හෙළිදරව් කිරීමේ කටයුත්තෙහිය. ඔවුන් කොතරම් දුරට එම කටයුත්තෙහි ඇලී ගැලී සිටියේද යන්න වටහා ගැනීමට ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය ගැන මතක් කිරීම පමණක් ප්‍රමාණවත් වේ. මෙම කර්තව්‍ය තනිකොට ගත් කල එය තවමත්, සාරානුකූල වශයෙන්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කටයුත්තක් නොවන බවත්, එය හුදෙක් වෘත්තීය සමිති කටයුත්තක් පමණක් වන බවත්, එහි නිමග්නව සිටීම නිසා ඔවුනට සැබවින්ම අමතක වී ගියේය. හෙළිදරව් කිරීම නියත වශයෙන්ම ලියා තිබුණේ නියමිත කර්මාන්තයක කම්කරුවන් හා ඔවුන්ගේ ස්වාමි වරුන් අතර සම්බන්ධය ගැනය. ඒවායින් ඉටුවූ එකම සේවය වූයේ ශ්‍රම ශක්තිය විකුණන අය, තමන්ගේ ‘වෙළෙඳ භාණ්ඩය’ වඩාත් හොඳ මිළකට විකිණීමටත්, පැහැදිලි වාණිජමය ගනු දෙනුවක් සම්බන්ධයෙන් මිළට ගන්නා අය සමග සටන් කිරීමටත් ඉගෙන ගැනීම පමණකි. මෙම හෙළිදරව් කිරීම (විප්ලවවාදීන්ගේ සංවිධානය විසින් ඒවා නිසි ලෙස ප්‍රයෝජන ගන්නා ලද්දේ නම්) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කටයුතුවල ආරම්භයක් හා ඒවායේ එක් කොටසක් වශයෙන් ප්‍රයෝජනවත් වන්නට තිබුණි. එසේ වුවත්, එම හෙළිදරව් කිරීම ඔස්සේම ‘පිරිසිදු වෘත්තීය සමිති’ අරගලයක් හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන කම්කරු පංති ව්‍යාපාරයක් කරා යොමු වීමටද ඉඩ තිබුණි (සාංසිද්ධිකතාවයට වන්දනාමාන කිරීමේ ආකල්පයක් ඇති වී නම් නිසැකවම එසේ වන්නට තිබුණි). සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් කම්කරු පංති අරගලයට නායකත්වය දෙන්නේ ශ්‍රම ශක්තිය සඳහා වඩාත් හොඳ මිළක් ලබා ගැනීමට පමණක් නොව, තමන් ධනවතුන්ට විකිණෙනු පිණිස දේපල නැතියවනට බල කෙරෙන සමාජ ක්‍රමය අහෝසි කිරීමද සඳහාය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය කම්කරු පංතිය නියෝජනය කරන්නේ, කිසියම් ස්වාමි වරුන් කණ්ඩායමක් සමග වූ එහි සම්බන්ධකම්වලට පමණක් විෂය වන ආකාරයෙන් නොව, නවීන සමාජයේ සියළුම පංති හා සංවිධාන වූ දේශපාලන බලවේගයක් ලෙසින් රාජ්‍යයද ස්මග වූ එහි සම්බන්ධකම්වලටත් විෂය වන ආකාරයෙනි. එහෙයින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් තනිකර ආර්ථික අරගලයට පමණක් සීමා නොවිය

---

* මෙම පරිච්ඡේදයෙහි අප සඳහන් කරන්නේ පුළුල් හෝ පටු අර්ථයෙන්වූ දේශපාලන අරගලය ගැන පමණකි. එබැවින් (මර්තිනව් විසින් පරණ කැලි පූට්වූ කර ලියන ලද ‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය හා කම්කරු පංතිය’’ යන කුඩා පොතෙහි සඳහන් පරිදි, — ‘‘සම්මේලන දෙකක්’’, පිටු 27). ආර්ථික අරගලය සම්බන්ධයෙන් ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය ‘ඉවසනවා වැඩිය’ යන ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ චෝදනාව අමතර කාරණයක් ලෙස සඳහන් කරන්නේ කුතුහල වශයෙන් පමණකි. තෝරාගන්නා ඕනෑම අවුරුද්දක් තුළ ‘‘ඉස්ක්‍රා’’ පත්‍රයෙහි කාර්මික කොටසෙහි ආර්ථික අරගලය පිළිබඳව කෙරුණු සාකච්ඡාවන් ගෙන චෝදනයන් (බොහෝ ආශා කරන පදිරි) ඒවා හොණ්ඩර නැතහොත් රීම් ගණනින් ගණන් බැලුවත්, ‘‘රබෝචිය දියල’’ සහ ‘‘රබෝචය මිස්ල්’’ යන පත්‍ර දෙකෙහිම එම කොටස් එකට ගෙන සසඳා බැලුවත් පසු කී පත්‍ර බොහෝ සේ පසු බා සිටින බව පහසුවෙන්ම පෙනී යනු ඇත. මෙම සරල සත්‍ය ඔවුනට අවබෝධ වී ඇති හෙයින්,ඔවුන්ගේ පටලැවිල්ල පැහැදිලිව අනාවරණය වන ආකාරයේ තර්ක ඉදිරිපත් කරන තත්වයට ඔවුන් වැටී ඇති බව පෙනේ. ‘‘ ‘ඉස්ක්‍රා’ පත්‍රය කැමති වුවත් නැතත් (!) ජීවිතයේ මග හැරිය නොහැකි බලකිරීම (!) සැලකිල්ලට ගෙන කම්කරු පංති අරගලය සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් (!!) ලිපි පළ කිරීමටවත් එයට සිදුවී ඇතැ’’යි ඔවුහු ලියති (‘‘සම්මේලන දෙකක්’’, පිටු 27). මෙය නම් ඔරොත්තු දිය නොහැකි තර්කයකි!

යුතුය යනුත්, ආර්ථික හෙළිදරව් කිරීම් ඔවුන්ගේ කටයුතුවල ප්‍රධාන දෙය වීමට ඉඩ නොදිය යුතුය යනුත් එයින් අදහස් වේ. කම්කරු පංතියට දේශපාලන අධ්‍යාපනය දීම හා එහි දේශපාලන විඥනය සංවර්ධනය කිරීම සඳහා අපි ක්‍රියාශීලී විය යුත්තෙමු. දැන් ‘‘සර්යා’’ සහ ‘‘ඉස්ක්‍රා’’ ‘ආර්ථිකවාදයට’ විරුද්ධව ප්‍රථම පහර ගසා ඇති හෙයින් ‘සියළු දෙනාම මෙයට එකඟය’ (එහෙත් සමහර අය එකඟ වන්නේ වචනයෙන් පමණක් වන බව නොබෝ කලකින් අපට පෙණෙනු ඇත).

දේශපාලන අධ්‍යාපනයට අඩංගු විය යුත්තේ කුමක්ද යන ප්‍රශ්නය පැන නගී. සර්වබලධාරී ඒකාධිපතිත්වය කෙරෙහි වූ කම්කරු පංතියේ විරෝධය පිළිබඳ ප්‍රචාරයට එය සීමා කළ හැකිද? කිසිසේත් එසේ කළ නොහැකිය. කම්කරුවන් දේශපාලන වශයෙන් පීඩාවට පත්කර සිටින බව ඔවුනට තේරුම් කර දීමද (කම්කරුවන්ගේ උවමනාවන් ස්වාමි වරුන්ගේ උවමනාවන්ට ප්‍රතිවිරුද්ධ වන බව ඔවුනට තේරුම් කර දීම ප්‍රමාණවත් නො වූවා සේම) ප්‍රමාණවත් නොවේ. මෙම පීඩාවෙහි සෑම නිශ්චිත නිදර්ශනයක්ම සම්බන්ධයෙන් (ආර්ථික පීඩාවේ නිශ්චිත නිදර්ශනයන් වටා උද්ඝෝෂණය කිරීමට අප පටන් ගෙන තිබෙන ලෙසට) උද්ඝෝෂණය කළ යුතු වේ. මෙම පීඩාව, සමාජයේ විවිධතම පංති කෙරෙහි බලපාන හෙයින්ද, වෘත්තීයමය, ප්‍රජා, පෞද්ගලික, පවුල්, ආගමික, විද්‍යාත්මක ආදී වශයෙන් වූ ජීවිතයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සෑම ක්ෂේත්‍රයකදීම දක්නට ලැබෙන හෙයින්ද, සර්වබලධාරී ඒකාධිපතිත්වය සෑම පැත්තකින්ම දේශපාලන වශයෙන් හෙළිදරව් කිරීම භාරගෙන එය සංවිධානය කිරීමට අපි කටයුතු නොකරන්නමෝ නම්, කම්කරුවන්ගේ දේශපාලන විඥනය දියුණු කිරීමේ අප කර්තව්‍ය සපුරාලීමෙහි අප නොයෙදෙන බව පැහැදිලි නොවන්නේද? පීඩාව පිළිබඳ නිශ්චිත අවස්ථා වටා උද්ඝෝෂණය කිරීම පිණිස (ආර්ථික උද්ඝෝෂණය කිරීම සඳහා පැක්ටරි අක්‍රමිකතාවයන් හෙළිදරව් කළ යුතු වූවාක් මෙන්ම) එම අවස්ථා හෙළිදරව් කළ යුතුය.

මෙය මනාව පැහැදිලි දෙයකැයි අයෙකු සිතනු ඇත. එහෙත් දේශපාලන විඥනය එහි සෑම පැත්තෙන්ම සංවර්ධනය කිරීම ගැන ‘සියළු දෙනාම’ එකඟ වන්නේ වචනයෙන් පමණක් බව හෙළිදරව් වේ. නිදර්ශනයක් වශයෙන් ‘‘රබෝචිය දියල’’ පත්‍රය අංග සම්පූර්ණ දේශපාලන හෙළිදරව් කිරීම සංවිධානය කිරීමේ කර්තව්‍ය ඉටු කරනු (නැතහොත් සංවිධානය කිරීම ආරම්භ කරනු) තබා, එම කර්තව්‍ය භාර ගෙන කරගෙන යන ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය පවා එයින් ඉවතට ඇදගෙන යාමට යත්න දරයි. මෙයට කන් දෙන්න: ‘‘කම්කරු පංතියේ දේශපාලන අරගලය යනු හුදෙක් (කිසිසේත් ‘හුදෙක්’ කිව නොහැක) ආර්ථික අරගලයේම ඉතාමත් සංවර්ධිත, පුළුල් හා ඵලදායක ආකාරයයි’’ (‘‘රබෝචිය දියල’’ පත්‍රයේ 1 වැනි කලාපයෙහි පිටු. 3 හි පළ කළ එහි වැඩ පිළිවෙළ). ‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් දැන් මුහුණ පා සිටින්නේ ආර්ථික අරගලයටම හැකි තාක් දුරට දේශපාලන ස්වරූපයක් දීමේ කර්තව්‍යයටය’’ (මර්තිනව්, 10 වැනි කලාපය, පිටුව 42). ‘‘ආර්ථික අරගලය යනු බහු ජනතාව ක්‍රියාකාරී දේශපාලන අරගලය කරා යොමු කරවීම සඳහා වඩාත් පුළුල් ලෙස උපයෝගී කර ගන්නා මාධ්‍යය යි’’ (විදේශගත සංගමයේ[66] සම්මේලනයෙන් අනුමත වූණු යෝජනාව සහ එහි ‘සංශෝධන’: ‘‘සම්මේලන දෙකක්’’, පිටු 11 හා 17). පාඨකයාට පෙනෙනු ඇති ලෙසට, මේ සියල්ල ‘‘රබෝචිය දියල’’ පළමුවැනි පත්‍රයේ පටන් එහි අළුත්ම ‘කතෘ වරුන්ට උපදෙස්’ දක්වාම එම පත්‍රය හාත්පස විනිවිද ගොස් ඇත. ඒ සියල්ලෙන්ම ප්‍රකාශ වන්නේ දේශපාලන උද්ඝෝෂණය හා අරගලය සම්බන්ධයෙන් වූ එකම අදහසක් බව පැහැදිලිය. සියළුම ‘ආර්ථිකවාදීන්’ අතර බල පවත්නා අදහස වන ආර්ථික උද්ඝෝෂණය පසුපස දේශපාලන උද්ඝෝෂණය යා යුතුය යන මෙම මතය පරීක්ෂා කර බලමු. පොදු ජනතාව දේශපාලන අරගලයට ඇද ගැනීම සඳහා ‘‘ඉතාමත් පුළුල් ලෙස යොදා ගත හැකි මාධ්‍යය’’ ආර්ථික අරගලය වන්නේය යන්න ඇත්ත වශයෙන්ම* පිළිගත හැකි සත්‍යයක් ද? එය සම්පූර්ණයෙන්ම අසත්‍යය. ආර්ථික අරගලය හා සම්බන්ධයෙන් පමණක් නොව, දක්නට ලැබෙන්නාවූ පොලිස් දුෂ්ඨත්වය හා සර්වබලධාරී ඒකාධිපතිත්වයේ

---

* අප ‘ඇත්ත වශයෙන්ම’ යයි කියන්නේ, ‘‘රබෝචිය දියල’’ පත්‍රය සමස්ත පක්ෂයේම පොදු ප්‍රතිපත්ති හා පොදු කර්තව්‍යයන් ගැන කථා කරන හෙයිනි. ආර්ථික කටයුතු පසුපස දේශපාලනය යා යුතු අවස්ථා නිසැකවම ව්‍යවහාරයේදී පැන නගින නමුත්, සමස්ත රුසියාවටම අදාල වන ලෙසට සකස් කළ යෝජනාවක ඒ ගැන කිව හැක්කේ ‘ආර්ථිකවාදීන්ට’ පමණකි. ‘තනිකර ආර්ථිකමය වූ පදනමක්’ මත ‘ආරම්භයේ පටන්ම’ දේශපාලන උද්ඝෝෂණය ගෙනයාමට ඉඩ ලැබෙන අවස්ථා ඇති වන බව සැබවි. එහෙත් අවසානයේදී ‘‘රබෝචිය දියල’’ පත්‍රය නිගමනය කළේ ‘මෙය කිසිසේත් අවශ්‍ය නොවේ’ (‘‘සම්මේලන දෙකක්’’, පිටු 11). ‘දේශපාලනඥයන්’ හා විප්ලවවාදීන් සිය උපක්‍රම නිගමනය කර ගැනීමේදී සමාජ-ප්‍රජාතන්ත්‍රයේ වෘත්තීය සමිති කර්තව්‍යයන් අමතක නොකරන බවත්, එපමණක් නොව, එම කර්තව්‍යයන් සාර්ථක ලෙස සපුරාලීමෙහි සමත් වන්නේද ඔවුන් පමණක් වන බවත් ඊළඟ පරිච්ඡේදයෙන් පෙන්වා දෙන්නෙමු.

බලහත් කාර කම් පිළිබඳ ඕනෑම හා සැම අවස්ථාවක්ම වුවද‘පොදු ජනයා’ ඇද ගැනීමේ ‘මාධ්‍යයක් වශයෙන් පුළුල් ලෙස යොදා ගැනීමේ’ හැකියාව අතින් අල්පමාත්‍ර වශයෙන් හෝ සුළු පටු නොවේ. ගම් පරිපාලකයන්[67] සහ දුප්පත් ගොවීන්ට කස පහර දීමත්, නිලධාරීන්ගේ දූෂණ සහ නගරවල ‘පොදු ජනයාට’ කරන පොලිස් සැලකිලිත්, දුර්භික්ෂයට පත් ජනතාවට විරුද්ධව සටන් කිරීම සහ අවබෝධය හා දැනුම ලබා ගැනීමට දරන ප්‍රයත්නයන් යටපත් කිරීමත් බල පුළුවන් කාර කමින් අයබදු ගැනීම සහ නිකායවාදීන් ලුහුබැඳීමත්, ශිෂ්‍යයන්ට හා ලිබරල් බුද්ධිමතුන්ට බැරෑක්ක ක්‍රමයෙන් සංග්‍රහ කිරීමත්, යන මේවා සහ දක්නට ලැබෙන එවැනි අනෙකුත් දහසක් දුෂ්ඨකම් කෙළින්ම ආර්ථික’ අරගලයට සම්බන්ධ නොවුවත්, ජනතාව දේශපාලනයට ඇද ගැනීම සඳහා පොදු වශයෙන් ‘පුළුල් ලෙස යොදා ගත හැකි’ මාධ්‍යයන් හා අවස්ථා බවට පත්වීමේ සුදුසුකම් අතින් අඩුවක් තිබේද? ඇත්ත එහි අනිත් පැත්තය. කම්කරුවන්ට (තමන්ම නැතහොත් තමන්ට සමීප ලෙස සම්බන්ධ අය මුල් කොට ගෙන) දුෂ්ඨ පාලනයෙන්, හිංසනයෙන් හා අයිතිවාසිකම් නොමැති කමින් පීඩා විඳින්නට සිදුවූ අවස්ථා සියල්ලෙහිම එකතුව අතුරෙන්, හුදු වෘත්තීය සමිති අරගලයම නිසා ඔවුන් පොලිස් දුෂ්ඨත්වයට ලක් වූ අවස්ථා ගණන ඉතා සුළු කොටසක් බව නිසැකවම කිව හැකිය. එසේ වූකල, පොදු වශයෙන් කියතොත් ‘පුළුල් ලෙස යොදා ගැනීමේ’ හැකියාව අතින් නො අඩු වූ අතිරේක මාධ්‍යයන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට අවශ්‍යව තිබියදී, එක මාධ්‍යයක් පමණක් ‘ඉතාමත් පුළුල් ලෙස යොදා ගත හැකි’ වන බව ප්‍රකාශ කිරීමෙන් දේශපාලන උද්ඝෝෂණයේ විෂය ප්‍රමාණය කල්තියා සීමා කිරීමට අපට ඇති උවමනාව කුමක්ද?

අඳුරු දුරාතීතයෙහි (හරියට අවුරුද්දකට පෙර!..) ‘‘රබෝචිය දියල’’ පත්‍රය මෙසේ ලිවේය: ‘‘එක වැඩ වර්ජනයකින්, නැතහොත් කුමන තත්වයක් යටතේ වුවත් වැඩ වර්ජන කීපයකින් පසුව,’’ ‘‘ඔවුනට විරුද්ධව ආණ්ඩුව විසින් පොලිසිය හා හමුදාව එවනු ලැබූ වහාම’’, ‘‘පොදු ජනතාව හදිසි දේශපාලන ඉල්ලීම් වටහා ගැනීමට පටන් ගනිති’’ (අංක 7, 1900 අගෝස්තු, පිටු 15). දැන් මෙම අවධි පිළිබඳ අවස්ථාවාදී න්‍යාය ප්‍රතික්ෂේප කර ඇති විදේශගත සංගමය අපගේ අදහසට ගරු කිරීමක් දක්වමින්, ‘සමාරම්භයේ පටන්ම දේශපාලන උද්ඝෝෂණය නිතරම ආර්ථික පදනමක් මත ගෙනයාමේ කිසිම උවමනාවක් නැතැ’’යි ප්‍රකාශ කරයි (‘‘සම්මේලන දෙකක්’’, පිටු 11). ‘ආර්ථිකවාදීන්’ කොතරම් දුරට ගැඹුරට සමාජවාදය පිරිහෙළා ඇද්ද යනු රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අනාගත ඉතිහාසඥයාට ඒත්තු ගැනීම පිණිස දීර්ඝ තර්ක ගණනාවකට වඩා සංගමය විසින් එහි පරණ වැරදිවලින් කොටසක් ඉවත ලීම ඉවහල් වනු ඇත! එහෙත් එක්තරා ආකාරයකින් දේශපාලනය සීමා කිරීම අත් හැරීමෙන්, වෙනත් ආකාරයක සීමා කිරීමට අප එකඟ කරවා ගත හැකියයි විදේශගත සංගමය කල්පනා කරන්නේ නම් එය මහත් නිවට කමකි. ආර්ථික අරගලය හැකි පුළුල්තම පදනමින් ගෙනයා යුතු බවත්, දේශපාලන උද්ඝෝෂණය සඳහා එයින් නිතරම ප්‍රයෝජන ගත යුතු බවත්, එහෙත් පොදු ජනතාව ක්‍රියාත්මක දේශපාලනයට ඇද ගැනීම පිණිස පුළුල්තම වශයෙන් යොදා ගත හැකි මාධ්‍ය ආර්ථික අරගලය ලෙස සැලකීමේ ‘කිසිම උවමනාවක් නැතැ’ යි මෙහිදී ද කීවා නම් වඩාත් තර්කානුකූල නොවේද?

යුදෙව් කම්කරු සංගමයේ (බුන්ඩ්)[68] හතරවැනි සම්මේලනයේ යෝජනාවක අඩංගු ‘හොඳම මාධ්‍ය’ යන වචන වෙනුවට ‘පුළුල්තම වශයෙන් යොදා ගත හැකි මාධ්‍ය’ යන වාක්‍ය ඛණ්ඩය තමන් විසින් ආදේශ කරනු ලැබීම වැදගත් කරුණක් ලෙස සංගමය සලකයි. මේ යෝජනා දෙකෙන් කොයි එක වඩා හොඳ ද යනු කීම අපට අපහසු බවට පාපෝච්චාරණය කරමු. අපගේ අදහසේ හැටියට යෝජනා දෙකම ඉතාම නරකය. විදේශගත සංගමය හා බුන්ඩ් සංවිධානය යන දෙකම දේශපාලනයට ආර්ථිකවාදී හා වෘත්තීය සමිතිවාදී අර්ථ නිරූපනයන් දීමේ (සමහර විට සම්ප්‍රදයේ බලපෑම නිසා නොදැනුවත්වම) වරදට වැටෙති. මෙසේ කිරීමේදී, ඒ සඳහා ‘හොඳම’ යන වචනය යොදාගත්තත්, නැතහොත් ‘පුළුල්තම වශයෙන් යොදා ගත හැකි’ යන වචන යොදාගත්තත් එයින් කිසිදු සැලකිය යුතු වෙනසක් සිදු නොවේ. විදේශ සංගමය කීවේ පුළුල්තම ලෙස (‘යොදා ගත හැකි’ නොව) යොදා ගනු ලබන මාධ්‍ය ‘ආර්ථික පදනමක් මත දේශපාලන උද්ඝෝෂණය කිරීම’ බව නම්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සංවර්ධනයේ එක්තරා කාලසීමාවක් සම්බන්ධයෙන් එය නිවැරදි වන්නට තිබුණි. ‘ආර්ථිකවාදීන්’ සම්බන්ධයෙන් හා 1898—1901 කාලයේ ක්‍රියා කාරක වරුන් (වැඩි දෙනා නොවේ නම්) බොහෝ දෙනෙකු සම්බන්ධයෙන් එය නිවැරදි වන්නට තිබුණි. ඊට හේතුව, මෙම ප්‍රායෝගික ‘අර්ථිකවාදීන්’ (දේශපාලන උද්ඝෝෂණ කළේම නම් එය කළතාක් දුරට දේශපාලන උද්ඝෝෂණය යොදාගත්තේ තනිකරම පාහේ ආර්ථික වූ පදනමක් මත වීමය. අප දැක ඇති පරිදි එවැනි දේශපාලන උද්ඝෝෂණයක් ගෙන යාම ‘‘රබෝචයා මිස්ල්’’ පත්‍රය හා ‘‘ස්වයං විමුක්ති කණ්ඩායම’’ විසින් පිළිගත් අතර නිර්දේශද කරන ලදී! ප්‍රයෝජනවත් ආර්ථික උද්ඝෝෂණ කටයුත්ත හා සමාගම්ව

හානිකාර ලෙස දේශපාලනය සීමා කෙරෙන බව බලවත් ලෙස පෙන්වාදීමේ යුතුකම ''රබෝචිය දියල'' පත්‍රයට තිබුණි. එසේ නොකර ඒ වෙනුවට එය ප්‍රකාශ කරන්නේ ('ආර්ථිකවාදීන් විසින්') පුළුල්තම ලෙස යොදා ගනු ලබන මාධ්‍ය, පුළුල්තම ලෙස යොදා ගත හැකි මාධ්‍ය වන බවයි! අප මොවුන් 'ආර්ථිකවාදීන්' වශයෙන් හඳුන්වන විට අප වෙත අනේක විධ අවලාද එල්ල කරනවා හැර වෙනත් කිසිවක් කිරීමට ඔවුන් අපොහොසත් වීම පුදුමයක් නොවේ; අපට 'ව්‍යාකූල කරන්නෝ', 'කඩාකප්පල් කාරයෝ', 'පාප්ගේ දූතයෝ' හා 'අපවාද කාරයෝ'* යයි කියුනු ලැබේ. අප විසින් ඔවුන් මාරාවේශ කෝපයට පත්කරන ලදැයි කියමින් ඔවුහු මුළු ලෝකයටම පැමිණිලි කරමින් යති. එමෙන්ම, 'කිසිම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයක දැන් 'ආර්ථිකවාදයේ' පැහැයවත් නැතැ' යි දිවුරමින් මෙන් කියති.** අහෝ! ඒ අපවාදකාර දුෂ්ඨ දේශපාලනඥයෝ! ඔවුන් මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ඇති හුදු වෛරය නිසා, අනුන් මාරාවේශ ලෙස අමනාපයට පත්කරනු පිණිස උවමනාවෙන්ම 'ආර්ථිකවාදය' නිර්මාණය කළා නොවේද?

'ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීම' පිළිබඳ කර්තව්‍ය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය හමුවේ තබන මර්තිනව්ගේ මෙම වචනවල අර්ථය කුමක්ද? ආර්ථික අරගලය යනු කම්කරුවන්, ඔවුන්ගේ ශ්‍රම ශක්තිය අලෙවි කිරීමේදී, වඩාත් හොඳ මිළක් ලබා ගැනීමටත්, වඩාත් හොඳ ජීවන හා සේවා තත්වයන් ලබා ගැනීමටත්, ස්වාමිවරුන්ට විරුද්ධව කරන සාමූහික අරගලයයි. මෙය අවශ්‍යයෙන්ම වෘත්තීය සමිති අරගලයකි. මක්නිසාදයත්, විවිධ වෘත්තිවල සේවා තත්වයන් බෙහෙවින් වෙනස් වන හෙයින් හා එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම තත්වයන් වැඩි දියුණු කර ගැනීමට කරන අරගලය ගෙනයා හැක්කේ වෘත්තීය සංවිධාන පදනම් කරගෙන (බටහිර රටවල වෘත්තීය සමිති මගින් හා රුසියාවේ තාවකාලික වෘත්තීය සංගම හා පත්‍රිකා ආදිය මගින්) පමණක් වන හෙයිනි. එනිසා 'ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීම' යනුවෙන් වැටහෙන්නේ (මර්තිනව් තම ලිපියේ ඊළඟ පිටුවේ සඳහන් කරන පරිදි, පිටු 43) 'ව්‍යවස්ථාදායක හා පරිපාලන පියවරයන්' මගින් එක් එක් විශේෂ වෘත්තියෙහි සේවා තත්වයන් වැඩි දියුණු කරන ලෙස ඉදිරිපත් කරන මෙම ඉල්ලීම් දිනා ගැනීම සඳහා උත්සාහ දැරීමයි.

---

* ''සම්මේලන දෙකක්''හි යොදා ඇත්තේ මේ වචනමය, පිටු 31, 32, 28 හා 30.

** ''සම්මේලන දෙකක්'', පිටු 32.

කම්කරුවන්ගේ වෘත්තීය සමිති සියල්ලක්ම කර තිබෙන්නේත්, කරන්නේත් මෙයමය. මනාසේ විද්‍යාත්මක (හා 'මනාසේ' අවස්ථාවාදී) වෙබ් මහතාගේ සහ මහත්මියගේ කෘති කියවන්න. බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති මීට බොහෝ කලින් 'ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීමේ' කර්තව්‍ය පිළිගෙන ඇති අතර බොහෝ කලක් තිස්සේ එම කර්තව්‍ය ඉටු කිරීමේ නිරතව සිටි බව ඔබට පෙනෙනු ඇත. එම සමිති වැඩ වර්ජනය කිරීමේ නිදහස සඳහාද, සමූපකාර හා වෘත්තීය සමිති ව්‍යාපාර වලට ඇති නීතිමය බාධාවන් ඉවත් කරනු සඳහාද, කාන්තාවන් හා ළමයින් ආරක්ෂා කිරීමේ නීති පැනවීම සඳහාද, සෞඛ්‍ය සහ පැක්ටරි නීති මගින් ශ්‍රමික සේවා තත්වයන් වැඩි දියුණු කිරීම සඳහාද ආදී වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ සටන් කර ඇත.

මේ අනුව 'ආර්ථික අරගලටම දේශපාලන ස්වරූපයක් දීම' පිළිබඳ වූ මෙතරම් ගාම්භීර හඬක් නංවන පම්පෝරි විප්ලවකාරී පාඨය ප්‍රයෝජනවත් වන්නේ, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය, වෘත්තීය සමිතිවාදී දේශපාලනයේ තත්වයට පිරිහෙළීමට දරන සම්ප්‍රදායික ප්‍රයත්න වසංකිරීම සඳහා ආවරණයක් වශයෙනි. ආර්ථික ප්‍රතිසංස්කරන සඳහා වූ අරගල අත්‍යන්තයෙන්ම අළුත් දෙයක් ලෙස අප වෙත ඉදිරිපත් කෙරෙන්නේ, ''සිද්ධාන්ත විප්ලවයක් ඇතිකිරීම, ජීවිතයේ විප්ලවයක් ඇතිකිරීමටටත් වඩා ඉහළින්''* තබන්නේ යයි කියා චෝදනා කරනු ලබන ''ඉස්ක්‍රා'' පත්‍රයේ එක පැත්තකට බර වූ ගතිය නිවරද කිරීමේ නියායෙනි. ''ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීම'' යන වාක්‍ය කොටසින් අදහස් කරන්නේ ආර්ථික ප්‍රතිසංස්කරණයක් සඳහා අරගල කිරීම මිස ඊට වැඩි කිසිවක් නොවේ. මර්තිනව් ඔහුගේම වචනවල අර්ථය ගැන මෙනෙහි කර බැලුවේනම් ඔහුට මෙම නිගමනයට එළඹෙන්නට තිබුණි. ''ඉස්ක්‍රා'' පත්‍රය වෙත තමන්ගේ ප්‍රබලතම ප්‍රහාරය එල්ල කරන ඔහු, ''ආර්ථික සූරා කෑම, විරක්ෂාව, දුර්භික්ෂය ආදියට විරුද්ධව ව්‍යවස්ථාදායක හා පරිපාලනමය පියවරයන් ගන්නා ලෙස කියා ආණ්ඩුවට නිශ්චිත ඉල්ලීම් ඉදිරිපත් කිරීම අප

---

* ''රබෝචිය දියල'' අංක 10, පිටු. 60. අපගේ ව්‍යාපාරයේ නූතන අවුල් සහගත තත්වයට ''වැඩ පිළිවෙළවල් දූසිමකට වඩා සැබෑ ව්‍යාපාරයේ සෑම පියවරක්ම වැදගත් වේ.'' යන මතය මර්තිනව්ට අවශ්‍ය පරිදි වෙනස් කර ගෙන මෙසේ යොදගෙන ඇත. ඉහතදී අප එහි ස්වභාව නිරූපනය දක්වා ඇත. ඇත්ත වශයෙන් මෙය, ''සියළු අගය ඇත්තේ ව්‍යාපාරයෙහිය; අරමුණෙහි අගයක් නැත'', යන බර්න්ෂ්ටයින් වාක්‍යයෙහි රුසියානු පරිවර්තනය පමණකි.

පක්ෂයට කළ හැකිව හා කළ යුතුව තිබිණි'' යි කියයි ('රබෝචිය දියල' අංක 10 පිටු 42—43). පියවරයන් ගන්නා ලෙස කියා නිශ්චිත ඉල්ලීම් යන මෙයින් අදහස් වන්නේ සමාජ ප්‍රතිසංස්කරණ සඳහා ඉල්ලීම් නොවේද? අපක්ෂපාත පාඨකයාගෙන් අපි නැවතත් මෙසේ අසමු. 'රබෝචිය දියල' වාදීන් (කාලීන වශයෙන් භාවිතා වන මෙම හැඩ නැති නිල නාමය! සම්බන්ධයෙන් සමාවන්න) 'ඉස්ක්‍රා' පත්‍රය සමග මත භේද වීමට තුඩු දුන් කරුණ වශයෙන් ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා අරගල කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ රචනය පෙන්වන විට, ඔවුන් ගුප්ත බර්න්ෂ්ටයින් වාදීන් ලෙසට හැදින්වීමෙන් අප ඔවුනට අවමානයක් කරනවාද?

විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය, තම කටයුතුවල කොටසක් වශයෙන්, ප්‍රතිසංස්කරණය සඳහා වූ අරගලය නිතරම ඇතුලත් කර ගත්තේය, ඇතුලත් කර ගන්නේය. එහෙත් එය 'ආර්ථික'' උද්ඝෝෂණය ප්‍රයෝජනයට ගන්නේ විවිධ පියවරයන් සඳහා ඉල්ලීම් ආණ්ඩුව වෙත ඉදිරිපත් කිරීමට පමණක් නොව, ආණ්ඩුව සවීබලධාරි ඒකාධිපතිත්වයක් වී තිබීම කෙලවර කරන ලෙස (මූලික වශයෙන්) ඉල්ලනු සඳහාය. එපමණක් නොව මෙම ඉල්ලීම තනිකරම ආර්ථික අරගලය මත පදනම් නොකර, පොදු වශයෙන් ජන හා දේශපාලන ජීවිතයේ ප්‍රකට කරුණු සියල්ලම මත පදනම් කරගෙන ආණ්ඩුවට ඉදිරිපත් කිරීම ස්වකීය යුතුකම ලෙස එය සලකයි. කොටින් කියතොත්, සමස්තයෙහි කොටසක් වශයෙන්ද, නිදහස හා සමාජවාදය සඳහා වූ විප්ලවවාදී අරගලයෙහි කොටසක් වශයෙන්ද, ප්‍රතිසංස්කරණය සඳහා අරගලය එයට යටත් කෙරේ. එසේ වුවද අවධි පිළිබඳ න්‍යායයට පුනර්ජීවනයක් දී නවතාවයකින් එය ඉදිරිපත් කරන මර්තිනව්, දේශපාලන අරගලය සංවර්ධනය කිරීම සඳහා තනිකරම පාහේ ආර්ථික වූ මාවතක් නියම කිරීමට පරිශ්‍රම දරයි. විප්ලවවාදී ව්‍යාපාරය වර්ධනය වන මෙම අවස්ථාවේ විශේෂ 'කර්තව්‍යක්' ලෙස ප්‍රතිසංස්කරනය සඳහා අරගලය ඉදිරිපත් කිරීම පක්ෂය ආපසු ඇදගෙන යාමකි; එමෙන්ම, එය 'ආර්ථිකවාදීන්' හා ලිබරල් අවස්ථාවාදීන් යන දෙකොට්ඨාශයේම ග්‍රහණයට හසුවීමකි.

එපමණක් නොවේ. 'ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීම' යන පම්පෝරි තීසිසය අස්සේ ප්‍රතිසංස්කරණ සඳහා වූ අරගලය ලජ්ජාවෙන් මෙන් සහවා තැබූ මර්තිනව්, විශේෂ කාරණයක් ඉදිරිපත් කරන පරිද්දෙන් තනිකරම ආර්ථික (ඇත්ත වශයෙන්ම තනිකරම පැක්ටරි) ප්‍රතිසංස්කරණ පිළිබඳ අදහස ඉදිරියට දැම්මේය. ඔහු එසේ කළේ කුමණ හේතුවක් නිසාදැයි අපි නොදනිමු. සමහර විට අපරික්ෂාකාරිත්වය නිසා විය හැකිද? එහෙත් 'පැක්ටරි' ප්‍රතිසංස්කරණ වලට වඩා යමක් ඔහුගේ සිතෙහි වී නම්, එවිට අප ඉහත සඳහන් කර ඇති ඔහුගේ තීසිසය අර්ථශූන්‍ය වෙයි. සමහර විට ඔහු එසේ කළේ, ආණ්ඩුව විසින් දෙනු හැක්කේ සහ දෙනු ඇත්තේ ආර්ථික ක්ෂේත්‍රයේ සහනයන් පමණකැයි ඔහු අදහස් කළ නිසා විය හැකිද?* එය එසේ නම් එය අරුම පුදුම රැවටීමකි. කසපහර දීම, ගමන් අවසර පත්, මුක්ති ගෙවීම්[69], ආගමික නිකායන්, පුවත් පාලනය ආදී වූ කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදයක ක්ෂේත්‍රයනහිදී සහනයන් ලබාගත හැකිය; සහනයන් දෙනු ලැබේ. ආණ්ඩුව පැත්තෙන් බලන කල, ආර්ථික සහන (නැතහොත් ව්‍යාජ සහන) ඉතාමත් ලාභදායක සහන වෙති; ඒ එය මෙම සහන මාර්ගයෙන් වැඩකරන ජනතාවගේ විශ්වාසය දිනාගැනීමට අපේක්ෂා කරන හෙයිනි. මේ හේතුව නිසා, අප ආර්ථික ප්‍රතිසංස්කරණ ගැන වැඩියෙන් අගය කරන බවට, ආදී වශයෙන් වූ විශ්වාසයක් (නැතහොත් වැරදි හැඟීම්) ඇතිවීමට, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වන අපි, කුමණ හෝ තත්ත්වයන් යටතේ වුවද, නැතහොත් මොනම ආකාරයකින් වුවද කිසිසේත් ඉඩ නොදිය යුතු වෙමු. ඉහත සඳහන් කර ඇති නීති සම්පාදනමය සහ පරිපාලනමය පියවරයන් සඳහා වූ නිශ්චිත ඉල්ලීම් ගැන සඳහන් කරමින් ''එවැනි ඉල්ලීම් මගින් ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකි නිසා ඒවාට කම්කරුවන්ගේ ක්‍රියාත්මක සහයෝගය ලැබෙනු ඇති හෙයින් ඒවා හුදු පුහු ඝෝෂාවක් පමණක් නොවනු ඇතැ'' යි මර්තිනව් ලියයි. අප ආර්ථිකවාදීන් නොවෙමු. අහෝ නැත! අප කරන්නේ බර්න්ෂ්ටයින් ලා ප්‍රකපෝවිච්ලා, ස්ත්‍රැවේලා, එර්. එම්. ලා හා tutti quanti** මෙන් නිශ්චිත ප්‍රතිඵලවල 'ප්‍රත්‍යක්ෂ භාවය' ඉදිරියේ දස ලීලාවෙන් දනින් වැටීම පමණකි! අපට වුවමනා කරන්නේ (නර්චිසිස් තුපරිලව් හා සමග) 'ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තු විය නොහැකි' සියළු දේම හුදු 'පුහු ඝෝෂාව' පමණක් වන බව වටහා දීමට පමණකි! අප උත්සාහ කරන්නේ වැඩකරන ජනතාව ''ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල පිළිබඳ කිසිම බලාපොරොත්තුවක් නොමැතිව පවා සර්වබලධාරී ඒකාධිපතිත්වයට එරෙහිව සෑම අවස්ථාවකදීම විරෝධය පෑමට ක්‍රියාත්මක ලෙස

---

* පිටු 43 ''කිසියම් ආර්ථික ඉල්ලීම් ආණ්ඩුවට ඉදිරිපත් කරන ලෙස අප කම්කරුවන්ට උපදෙස් දෙන විට, අප එසේ කරන්නේ සර්ව බලධාරී ඒකාධිපති ආණ්ඩුවට ආර්ථික ක්ෂේත්‍රයෙහි සමහර සහනයන් දීමට අවශ්‍යයෙන්ම සිදුවී ඇති පරිදි එය එම සහන දීමට සූදානම් හෙයිනි.''

** ඔවුන්ගේ

සහයෝගය දැක්වීමට අසමත් වූ කලෙක (තමන්ගේ නරුම ස්වභාවය වැඩකරන ජනතාවගේ කර පිට දමා සිටියදීම) එම ජනතාව එසේ සහයෝගය දැක්වීමේ හැකියාව දූනටම ඔප්පුකර තිබුනේ නැතිනම් කළ යුතු ආකාරයට තර්ක කිරීම පමණකි.

නිදර්ශනයක් වශයෙන් මර්තිනව්ම ඉදිරිපත් කරන විරක්ෂා සහ දුර්භික්ෂ සහන සඳහා වූ එම පියවරයන්ම ගනිමු. ‘‘රබෝචිය දියල’’ පත්‍රය දී තිබෙන පොරොන්දු අනුව පෙනී යන්නේ, එය ‘ප්‍රතිඵල බලාපොරොත්තුවිය හැකි’ නීති සම්පාදක හා පරිපාලනමය පියවරයන් සඳහා වූ නිශ්චිත (පණත් ආකාරයෙන්ද) ඉල්ලුම් මාලාවක් කෙටුම්පත් කිරීමෙහි සහ එහි විස්තර සකස් කිරීමෙහි යෙදී සිටින බවය. ඒ අතර ‘සිද්ධාන්තවල විප්ලවයක් ඇතිකිරීම, ජීවිතයේ විප්ලවයක් ඇතිකිරීමටත් වඩා ඉහළින් තබා නිතරම කටයුතු කරන’ ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය විරක්ෂාව හා ධනපති ක්‍රමය අතර ඇති අඛංඩ සම්බන්ධය විස්තර කර පෙන්වීමට උත්සාහ දැරීමෙහිත්, ‘දුර්භික්ෂය එන බවට’ අනතුරු හැඟවීමෙහිත් දුර්භික්ෂයට ගොදුරු වුවන්ට ‘විරුද්ධව’ පොලිසියේ ‘සටන’[70] හා ‘බරපතල වැඩ ඇතිව දරුණු ලෙස බන්ධනාගාර ගත කිරීම’[71] හෙළිදරව් කිරීමෙහිත් නිරතවී ඇත. ‘‘සර්යා’’ පත්‍රය කළේ දුර්භික්ෂය සම්බන්ධයෙන් ලියන ලද ‘ස්වදේශ කටයුතු සමාලෝචනය’ නැමැති කෘතියෙන් කොටසක් උද්ඝෝෂණික පත්‍රිකාවක් වශයෙන් යළි මුද්‍රණය කිරීමය. එහෙත් අහෝ දෙවියනි! මෙම විශුද්ධි න්‍යාය ධර්ම වාදීන් කොතරම් නොහික්මවිය හැකි ලෙසකට එක පැත්තකට බරවී සිටිත්ද? ‘ජීවිතයම නගන හඬට ඔවුන් කොතරම් බිහිරිද? ඔවුන්ගේ ලිපිවල ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තුවිය හැකි’ එකද ‘නිශ්චිත’ ඉල්ලීමක්වත් නොවිය! අහෝ භයන්කාරය. මෙය ඇදහිය හැකිද? අසරන න්‍යාය ධර්මවාදීන්! උපක්‍රම යනු වර්ධනය පිළිබඳ වූ හා වර්ධනය වන දෙය පිළිබඳ වූ ක්‍රියාදමයක් වන බවද, ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දිය යුතු බවද ඉගෙන ගැනීමට ඔවුන් ක්‍රිචෙව්ස්කි හා මර්තිනව් වෙත යැවීම සුදුසුය.

‘‘ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කම්කරුවන් ගෙනයන ආර්ථික අරගලයේ (‘ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය’!!) තිබෙන ක්ෂණික විප්ලවවාදී වැදගත් කමට අමතරව එහි මෙම වැදගත්කමද ඇත: කම්කරුවන්ට දේශපාලන අයිතිවාසිකම් අහිමි බව එයින් නිතරම ඔවුනට අවබෝධ වේ’’ (මර්තිනව්, පිටු 44). මෙම ඡේදය උපුටා දක්වන්නේ ඉහතින් සිය දහස් වරටත් කියා පෑ දෙය නැවතවරක් කීමට නොවේ. මෙම විශිෂ්ට සූත්‍රය ඉදිරිපත් කිරීම ගැන මර්තිනව්ට විශේෂ ස්තුතියක් කිරීමටය. ‘ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කම්කරුවන්ගේ ආර්ථික අරගලය’, මෙය මොන තරම් අගනා කියමනක්ද! පොදු සහනය පතා සියළුම කම්කරුවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා*, කම්කරුවන් කැඳවීමෙන් ආරම්භ කළ තැන් පටන්, අවධි පිළිබඳ න්‍යාය ඔස්සේ යමින් ‘පුළුල්තම ලෙස යොදා ගත හැකි’ ආදී වශයෙන් වූ සම්මේලන යෝජනාවෙන් කෙළවර වුනු ‘ආර්ථික වන්දනයේ’ සාර ගර්භ හරය මෙම අදහසින් පැහැදිලි ලෙසත්, සංක්ෂිප්ත ලෙසත් ප්‍රකාශ කරන අතර ‘ආර්ථිකවාදීන්’ අතර පවතින අර්ධ අසමථයන් හා ප්‍රභේදමාත්‍ර වෙනස් කම්ද අනුකරනය කළ නොහැකි තරම් දක්ෂ ලෙසට මෙයින් ඉවත් කෙරේ. ‘ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය’ යනු නියත වෘත්තීය සමිතිවාදී දේශපාලනයයි. එය තවමත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයෙන් බොහෝ ඈතය.

ආ) මර්තිනව් ප්ලෙහානව්ගේ අරුත්සරුබව වැඩි කළ හැටි

‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ ලමනෝසව්ලා කොතරම් නම් විශාල පිරිසක් මෑතකදී අප අතර මතුවී සිටිත්ද!’’ යි එක් දිනක් සහෝදරයෙක් ඇසීය. ඔහු එසේ ඇසුවේ, ‘ආර්ථිකවාදය’ වෙත නැඹුරු වූ බොහෝ දෙනෙක් ‘අවශ්‍යයෙන්ම ඔවුන්ගේම වැටහීම අනුව’ (නිදර්ශනයක් වශයෙන්, කම්කරුවන්ට අයිතිවාසිකම් අහිමිබව යන කල්පනා කිරීමට ආර්ථික අරගලය විසින් ඔවුන් උනන්දු කෙරේය යනු වැනි) මහා සත්‍යයන් වෙත එළඹීමටත්, එසේ කිරීමේදී, උපන් ප්‍රාඥයන් මෙන් විප්ලවවාදී ව්‍යාපාරයේ හා විප්ලවවාදී චින්තනයේ පසුගිය සංවර්ධනයන් ඉතාමත් නිසරු ලෙස නොසලකා හැරීමටත් දක්වන්නාවූ රුචිය ගැන සිත්හි ඇතිවය. ලමනෝසව්-මර්තිනව් හරියටම එවැනි ප්‍රඥයෙකි. ඔහු ‘ඔහුගේම වැටහීම අනුව’, බොහෝ ඉහතදි අක්සල්රොද් විසින් කියන ලද දෙය වෙත එළඹෙන්නේ කෙසේද යන්න දැක ගැනීමට ඔහුගේ ‘‘හදිසි ප්‍රශ්න’’ යන ලිපිය යම්තමින් කියවීම ප්‍රමාණවත් වේ (අපේ ලමනෝසව් එහි අක්සල්රොද් යන වචනයක්වත් සඳහන් කර නැත). නිදර්ශනයක් වශයෙන් ධනේශ්වර පංතියේ එක් එක් ස්ථරයන්ගේ විරුද්ධත්වය ආදිය අපට අමතක කළ නොහැකි බව ඔහු වටහා ගැනීමට පටන්ගෙන තිබෙන්නේ කෙසේද? (රබෝචිය දියල අංක 9, පිටු 61, 62,

---

* ‘‘රබෝචය මිස්ල්’’, ‘‘විශෙෂ අතිරේකය’’, පිටු 14.

71: මෙය රබෝචිය දියල පත්‍රය අක්සල්රොද්ට දුන් පිළිතුර සමග සසඳන්න, පිටු 22, 23, 24) එහෙත්, අඳෝමැයි! ඔහු තවමත් ''එළඹෙනවා'' තවමත් ''පටන්ගන්නවා'' පමණකි. ඊට වඩා දුර ගොස් නැත. ඔහු අක්සල්රොද්ගේ අදහස් වටහාගෙන තිබෙන්නේ ඉතාමත් අල්ප වශයෙන් වන හෙයින් ''ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය'' ගැන කතා කරයි. ''රබෝචිය දියල'' පත්‍රය අවුරුදු තුනක්ම තිස්සේ (1898—1901) අක්සල්රොද්ගේ අදහස් අවබෝධ කර ගැනීමට උත්සාහ ගත් නමුත් එය තවමත් සාර්ථක වී නැත! ''මනුෂ්‍ය වර්ගයා මෙන්ම'' සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයත් තමන් සඳහා නියම කරගන්නේ ජයගත හැකි කර්තව්‍යයන් පමණක් වීම මෙයට හේතුවක් විය හැකිද?

එහෙත් ලමනෝසව්ලා විශිෂ්ඨත්වයක් දරන්නේ බොහෝ දේ ගැන ඔවුන්ගේ ඇති නොදන්නාකම පමණක් නිසා නොව (එසේ වී නම් එය අභාග්‍යයෙන් අඩක් පමණි) ඔවුන්ගේම නොදන්නා කම ගැන දැනුමක් නොමැති නිසාද වේ. තව දුරටත් කරදර නොවී ප්ලෙහානව් අරුත්සරු කිරීමට ඔවුන් වෙහෙස වනුයේ මෙම නියම අභාග්‍ය විසිනි.

''ප්ලෙහානව් ඔහුගේ (රුසියාවේ දුර්භික්ෂයට විරුද්ධව සටනේදී සමාජවාදීන්ගේ කර්තව්‍යයන් යන) පොත ලිවීමෙන් පසු බොහෝ කාලයක් ගතවී ඇතැ'' යි ලමනෝසොව්-මර්තිනොව් කියයි. ''කම්කරු පංතියේ ආර්ථික අරගලයට දශකයක් තිස්සේ නායකත්වය දුන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්... පක්ෂයේ උපක්‍රම සඳහා පුළුල් න්‍යායික පදනමක් සකස් කර ගැනීමට තවමත් සමත් වී නැත. මේ ප්‍රශ්නය දැන් උග්‍ර අවස්ථාවකට පැමිණ ඇත. එබැවින්, එවැනි න්‍යායික පදනමක් නිශ්චය කර ගැනීමට අපි කැමැත්තෙමු නම්, කලකට ඉහතදී ප්ලෙහානව් විසින් විස්තර කරන ලද උපක්‍රම පිළිබඳ ප්‍රතිපත්ති සැලකිය යුතු පමණින් අරුත් සරු කිරීමට අපට නියත වශයෙන්ම සිදුවනු ඇත... ප්‍රචාරය හා උද්ඝෝෂණය අතර වෙනස ගැන දැන් අප කරන විස්තරය, ප්ලෙහානව්ගේ විස්තරයට වඩා වෙනස් විය යුතු වේ. [මර්තිනව්, ප්ලෙහානව් කී දෙය වචන මාත්‍ර වශයෙන් උපුටා දක්වා තිබේ: ''ප්‍රචාරකයෙක් එක පුද්ගලයෙකුට හෝ පුද්ගලයන් කීප දෙනෙකුට අදහස් රැසක් ඉදිරිපත් කරයි; උද්ඝෝෂකයෙක් එක අදහසක් හෝ අදහස් කීපයක් ජනතාවට ඉදිරිපත් කරයි''] ප්‍රචාරය යනුවෙන් අප වටහා ගන්නේ, වර්තමාන සමාජය මුළුමනින්ම හෝ ඉන් කොටසක් ගෙන, එය දක්නට ලැබෙන ආකාරයෙන්, පුද්ගලයන්ට වැටහෙන ලෙසට හෝ එසේ නැතහොත් පොදු ජනතාවට වැටහෙන ආකාරයට ඒ ගැන විප්ලවවාදී ලෙස තේරුම් කිරීමයි. උද්ඝොෂණය යන්නෙන්, වචනයේ ස්ථීර අර්ථයෙන්ම (මෙම වචනම) අපට වැටහෙන්නේ, නියමිත හා පැහැදිලි ක්‍රියාවන්හි නිරතවන ලෙස පොදු ජනතාවට හඬ නැගීම සහ කෙලින්ම විප්ලවවාදී ලෙස සමාජ ජීවිතයට මැදිහත් වීම සඳහා නිර්ධන පංතිය උනන්දු කරවීමය.''

මර්තිනව්ට ස්තුති වන්නට වඩාත් ස්ථීර සහ වඩාත් අරුත්සරු වචන මාලාවක් සොයා ගැනීම ගැන රුසියානු සහ ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට ශුභප්‍රාර්ථනා කරමු. අප මෙතෙක් කල් කල්පනා කළේ, (ප්ලෙහානව් සහ ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සියළුම නායකයන්ද සමග) ප්‍රචාරකයා, නිදර්ශනයක් වශයෙන් විරක්ෂාව ගැන කරනු ඉදිරිපත් කරිමේදී, අර්බුදවල ධනේශ්වර ස්වභාවය ගැනත් නූතන සමාජයේ ඒවා ඇතිවීම නොවැලැක්විය හැකි වීමට හේතුත්, සමාජය සමාජවාදී සමාජයක් බවට පරිවර්තනය කරීමේ අවශ්‍යතාවයත් ආදිය පැහැදිලි කළ යුතු බවයි. කොටින් කියතොත් ඔහු ''අදහස් රැසක්'' ඉදිරිපත් කළ යුතුය. ඇත්ත වශයෙන්ම ඒ කොතරම් විශාල අදහස් සංඛ්‍යාවක්දැයි කිවහොත්, ඒවා ඒකීය සමස්තයක් වන බව වටහා ගනු ඇත්තේ (සංසන්දනීය වශයෙන්) ස්වල්ප දෙනෙකු පමණකි. එසේ වුවද, උද්ඝෝෂකයා එම මාතෘකාව ගැනම කථා කිරීමේදී ඔහුගේ ප්‍රේක්ෂක සමූහයාට ඉතාමත් පැහැදිලිව පෙනෙන, ඉතාමත් ප්‍රකට කරුණක්, නිදර්ශන වශයෙන් විරක්ෂාගත පවුලක හාමත නිසා සිදු වූ මරණය, වැඩිවන දුප්පත්කම ආදී වූ කරුණු උදහරන වශයෙන් ගෙන කවුරුත් දන්නා එය උපයෝගී කර ගනිමින්, එක අදහසක් එනම්, ධනය වැඩිවීමත්, දුප්පත්කම වැඩිවීමත් අතර ප්‍රතිවිරෝධයක් පැවතීමේ තේරුමක් නැතිකම වැනි අදහසක් ''පොදු ජනතාවට'' ඉදිරිපත් කිරීමට ස්වකීය ප්‍රයත්නයන් මෙහෙය වයි. දරාගත නොහැකි අයුක්තියට විරුද්ධව ජනතා නොසන්සුන්කම සහ කෝපය ඇවිස්සීමට කටයුතු කරන ඔහු, මෙම ප්‍රතිවිරුද්ධය පිළිබඳ වඩාත් අංග සම්පූර්ණ විග්‍රහයක් කිරීමට ප්‍රචාරකයාට ඉඩ තබයි. ඒ අනුව ප්‍රචාරකයා ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන්නේ මුද්‍රිත වැකිය මාර්ගයෙනි; උද්ඝෝෂකයා ජීවමය වචනයෙනි. උද්ඝෝෂකයාට ඇති ගුණාංග ප්‍රචාරකයාට අවශ්‍ය නොවේ. නිදර්ශන වශයෙන් කෞට්ස්කි හා ලපාර්ග් ප්‍රචාරකයන් යයි අපි කියමු. බේබෙල් හා ගෙඩ් උද්ඝෝෂකයින් යැයි කියමු. ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ තුන්වැනි ක්ෂේත්‍රයක්, තුන්වැනි කාර්යයක් වෙන්කර ''නිශ්චිත හා පැහැදිලි ක්‍රියාවන්හි නිරත වන ලෙස ජනතාවට හඬ නැගීම'' එම කාර්යය වශයෙන් ඇතුලත් කිරීම මහ බොරුවකි. මක්නිසාද යත්, ''හඬ නැගීම'' තනිකර ගත් කල එය න්‍යායික විග්‍රහයට, ප්‍රචාරක පත්‍රිකාවට හෝ උද්ඝෝෂක කතාවට හෝ

ස්වභාවිකවම හා අනිවාර්යයෙන්ම ඌණ පූරණ වන හෙයිනි; එසේ නොවන්නේ නම් එය සෑම විටම විධායික කාර්යයක් වන හෙයිනි. ධාන්‍ය බදුවලට විරුද්ධව ජර්මන් සමාජවාදීන් දැනට ගෙන යන අරගලය නිදර්ශනයක් වශයෙන් ගනිමු. න්‍යායවාදීහු වාණිජ ගිවිසුම් හා නිදහස් වෙළඳාම සඳහා සටන් කිරීමට ‘‘හඬ නගමින්’’ තීරු බදු ප්‍රතිපත්තිය ගැන පර්යේෂණ කෘතීන් ලියති; කලකට වරක් පළ කරන පුවත් පත් මගින් ප්‍රචාරකයා ද ප්‍රසිද්ධ කතා මගින් උද්ඝෝෂකයාද එයම කරයි. වර්තමාන අවස්ථාවාදී ධාන්‍ය බදු වැඩිකිරීමට විරුද්ධව ජනතාවගේ ‘‘ඒකාන්ත ක්‍රියාව’’ ඊට විරුද්ධව රික්ස්ටාග් පාර්ලිමේන්තුවට යැවීම සඳහා පෙත්සම් අත්සන් කිරීමේ ස්වරූපය ගනී. මෙම ක්‍රියාව සඳහා හඬනැගීම න්‍යායවාදීන්, ප්‍රචාරකයන් හා උද්ඝෝෂකයන් විසින් අනියත වශයෙන් කරනු ලැබේ. ඒ අතර අත්සන් එකතු කිරීම සඳහා ලැයිස්තු පැක්ටරි වලට සහ පෞද්ගලික ගෙවල්වලට ගෙනයාමේ නියත කාර්යය එම කටයුත්තෙහි යෙදෙන කම්කරුවන් විසින් කරනු ලැබේ. ‘‘මර්තිනව්ගේ වචන මාලාව’’ අනුව, කෞට්ස්කි හා බෙබෙල් යන දෙදෙනාම ප්‍රචාරකයින්ය. අත්සන් එකතු කරන අය උද්ඝොෂකයින්ය. මෙය පැහැදිලි නොවේද?

ජර්මන් නිදර්ශනය ගැන සඳහන් කරන විට Verballhornung යන ජර්මන් වචනය සිහියට නැගේ. එය වචනාර්ථයෙන් පරිවර්තනය කළ විට එහි අර්ථය ‘‘බාල්හෝන් කිරීම’’ යන්නයි. දහසය වැනි ශත වර්ෂයේ ලිප්සිග් හි සිටි ජොහාන් බාල්හෝන් නැමැති ප්‍රකාශකයා ළමා කියවීම් පොතක් පළ කළේය. සිරිත් ලෙස ඔහු එහි කුකුළකුගේ පින්තූරයක් ඇතුලත් කළේය. එහෙත් පිංතූරයේ කුකුළාට පොර කටු නොතිබුණු අතර ඌ අසල බිත්තර දෙකක්ද ඇඳ තිබුණි. මෙම පොතේ කවරයෙහි ‘‘ජොහාන් බාල්හෝන් විසින් සංශෝධිත මුද්‍රණය’’ යන වැකියද ඔහු මුද්‍රණය කළේය. එතැන් පටන් කිසියම් මුල් කෘතියකට වඩා අයහපත් ‘‘සංශෝධනයන්’’ Verballhornung බෝල්හෝන් කිරීම යනුවෙන් හැදින්වීමට ජර්මානුන් පුරුදුව සිටිති. ප්ලෙහානව්ගේ ‘‘අරුත් සරු කම වැඩි කිරීමට’’ මර්තිනව් උත්සාහ දරන ආකාරය දන්නා කෙනෙකුට බාල්හෝන් මතක්වීම වැලක්විය නොහැකිය.

අපේ ලමනොසොව් මෙම ‘‘වියවුල’’ නිර්මානය කළේ මන්ද? *ඉස්ක්‍රා* පත්‍රය ‘‘කාරණයේ එක පැත්තකට පමණක් අවධානය යොමු කරන බව, දශක එක හමාරකට පෙර ප්ලෙහානව් කළ ලෙසටම’’ පෙන්නුම් කිරීම සඳහාය. *ඉස්ක්‍රා* පත්‍රය හා සම්බන්ධයෙන් වූ කල, යටත් පිරිසෙයින් වර්තමාන වකවානුවේදීවත්, ප්‍රචාරක කර්තව්‍යයන්

වශයෙන් වුවද, එය කෙරෙහි පමණක් යොමු කරන අය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් නොවෙති. එසේ කියන්නේ, කම්කරු පංතියේ ස්වයං අවබෝධය, හුදෙක් පරිපූර්ණ න්‍යායික අවබෝධය සමග පමණක් නොමැකෙන ලෙස සම්බන්ධවී පවතින්නක් නොවන හෙයිනි; එය බැඳී තිබෙන්නේ, න්‍යායික අවබෝධයට වඩා, නවීන ජීවිතයේ පංති සියල්ලෙහි සම්බන්ධය පිළිබඳ වූ ප්‍රායෝගික අවබෝධය හා සමගයයි කීම වඩාත් නිවැරදි විය හැකි හෙයිනි. මේ නිසා, ජනතාව දේශපාලන ව්‍යාපාරයට ඇද ගැනීමට පුළුල්තම වශයෙන් යොදා ගත හැකි මාධ්‍ය ආර්ථික අරගලය වන බවට අපගේ ‘ආර්ථිකවාදීන්’ දේශනා කරන අදහස පිළිගැනීමෙන් ඇතිවන ප්‍රායෝගික ප්‍රතිඵල අනුව බලන කල එය ඉතාමත් හානිදායක හා ප්‍රතිගාමී අදහසකි. කම්කරුවා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු වීම පිණිස, ඉඩම් හිමියාගේ, පූජකයාගේ, රජයේ උසස් නිලධාරියාගේ සහ ගොවියාගේ, ශිෂ්‍යයාගේ හා පාදඩයාගේ පැහැදිලි පින්තූරයක් ඔහුගේ සිත තුළ තිබිය යුතුය; ඔහු ඔවුන්ගේ දුර්වල හා ශක්තිමත් තැන් දත යුතුය; සෑම පංතියකම හා සෑම ස්ථරයකම ආත්මාර්ථකාමී ව්‍යායාම හා ඒවාගේ නියම ‘අභ්‍යන්තර කටයුතු’ *වසං කර තැබීමට* යොදගන්නා චිත්තාකර්ෂණීය පාඨවල හා බොරු තර්කවල අර්ථය ඔහු ග්‍රහණය කර ගත යුතුය; යම් යම් ආයතනවලින් හා යම් යම් නීතිවලින් පිළිබිඹු වන්නේ කුමන උවමනාවන්ද යන්නත්, ඒ කෙසේද යන්නත් ඔහු වටහා ගත යුතුය. එහෙත් මෙම ‘පැහැදිලි පින්තූරය’ කිසිම පොතකින් ලබා ගත හැක්කක් නොවේ. එය ලබා ගත හැක්කේ, ජීවමාන උදහරණ වලින් හා නියමිත අවස්ථාවක අප වටා සිදුවන දේ ගැනත්, එක් එක් අය තමන්ට ආවේනික ක්‍රමය අනුව සමහරවිට කසු කුසු ගා කරන සාකච්ඡා, ඒ, ඒ සිදුවීම්, ඒ, ඒ සංඛ්‍යා ලේඛන, ඒ, ඒ උසාවි තීන්දු ආදිය ගැනත් සමීප විමසිල්ලෙන් යුතුව කරන හෙළිදරව් කිරීම් මගිනි. පොදු ජනතාව දේශපාලන කියාකාරිත්වයෙහි පුහුණු කිරීම සඳහා මෙම අංගසම්පූර්ණ දේශපාලන හෙළිදරව් කිරීම් අත්‍යවශ්‍ය මූලික කොන්දේසියක් වේ.

ජනයාට කෙරෙන මෘග පොලිස් සැලකිළි, ආගමික නිකායයන්ට තාඩන පීඩන කිරීම, ගොවීනට කස පහරදීම, දරුණු පුවත් පාලනය, සොල්දදුවන්ට වධදීම, ඉතාමත් අහිංසක සංස්කෘතික ව්‍යාපාරවලට කරන දරුණු අතවර, ආදියට ප්‍රතික්‍රියා වශයෙන් රුසියානු කම්කරුවන් දක්වන විප්ලවීය ක්‍රියාකාරිත්වය තවමත් අල්ප මාත්‍ර වන්නේ මන්ද? එසේ වන්නේ, එම ක්‍රියාකාරිත්වයෙන් ‘ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තු විය’ නොහැකි නිසා සහ එයින් සිදුවන ‘යහපත’ අඩු නිසා එම ක්‍රියාකාරිත්වයෙහි යෙදීමට ‘ආර්ථික අරගලය’ විසින්

ඔවුන් උනන්දු නොකෙරෙන නිසා විය හැකිද? එවැනි අදහසක් පිළිගැනීම යනු චෝදනා නොලැබිය යුත්තන්ට චෝදනා කිරීමක් වන බවත්, තමන්ගේම මුග්ධකමට (නැතහොත් බර්න්ෂ්ටයින්වාදයට) කම්කරුවන් වෙත දෙස් පැවරීමක් බවත් අපි නැවතත් කියමු. පොදුජන ව්‍යාපාරයට පිටු පසින් සිටීම ගැනත්, සියළුම සාපරාධී නොපනත්කම් ගැන ප්‍රමාණවත් තරම් පුළුල් ලෙස, සිත්කාවදින ලෙස හා වේගවත් ලෙස හෙළිදරව් කිරීමට නොහැකිවීම ගැනත් අප දොස් පවරාගත යුත්තේ අපටමය. අප එම කාර්‍ය්‍ය ඉටු කළ විට (එය අපට කළහැක) ස්වකීය ජීවිතයේ සෑම අවස්ථාවකදීම තමන්ට පීඩා කරන, තමන් මිරිකා ගෙන සිටින ඒ අශෝභන බලවේගයන්ම, ශිෂ්‍යයින්ට හා ආගමික නිකායයන්ටද, ගොවීන්ට හා කතෘවරුන්ටද නිග්‍රහ හා දරුණු පීඩා කරන බව ඉතාමත් නොදියුණු කම්කරුවාට පවා වැටහෙනු ඇත. එම හැඟුමෙන් මඩනා ලද ඔහු යටපත්කළ නොහැකි සේ ප්‍රතික්‍රියාකාරී වීමේ ආශාවකින් ඉපිලී යනු ඇත. එවිට එක් දිනක පුවත් පාලකයන්ට හූ කීමටත්, තවත් දිනක, ගොවි නැගිටීම මෘග ලෙස මර්දනය කළ ආණ්ඩුකාරයාගේ මන්දිරය ඉදිරිපිට පෙළපාලි දැක්වීමටත්, තවත් වෙන දිනක, මිථ්‍යාදෘෂ්ටිකයින් වද කිරීමේ ශුද්ධ පරීක්ෂණ කටයුතුවල යෙදී සිටින ලෝගු පොරවාගත් පොලිස්කාරයින්ට පාඩමක් උගැන්වීමටත් ආදිය සඳහා ඔහු දැනුම ලබනු ඇත. හැකි සියළුම දේ සම්බන්ධයෙන් කලට වේලාවට ජනතාව හමුවට හෙළිදරව් කිරීම් ගෙන ඒමට අප මෙතෙක් කර ඇති කටයුතු ඉතා ස්වල්පය; කිසිවක් කර නැතැයි කිවහැකි තරම්ය. මෙය අපගේ බලවත් යුතුකම බව අප බොහෝ දෙනෙක් තවමත් පිළි නොගන්නා අතර පැක්ටරි ජීවිතයේ පටු සීමාවන් තුළ කෙරෙන 'නීරස දිනපතා අරගලයේ' පිටුපසින් සාංසිද්ධික ලෙස ඇදීයති. එවැනි තත්වයක් යටතේ, 'දීප්තිමත් හා පරිපූර්ණ අදහස් ප්‍රචාරය (මර්තීනව්, පිටු 61) හා සමග සසඳන කල, නීරස දිනපතා අරගලයේ ඉදිරිගමනෙහි වැදගත්කම සුළු කොට දැක්වීමේ නැඹුරුවක් "ඉස්ක්‍රා" පත්‍රයෙන් පෙන්නුම් කෙරෙන්නේය' යි කීම පක්ෂය ආපස්සට ඇදගෙන යාමක් වේ; එය අපගේ සුදනමක් නැතිකම හා නොදියුණු කම මහත් සේ හුවා දැක්වීමකි.

පොදු ජනතාව සටනට කැඳවා හඬ නැගීම ගැන කිව යුත්තේ, උද්‍යෝගිමත් දේශපාලන උද්ඝෝෂණය හා ජීවමාන සහ සිත්කාවදින සුළු හෙළිදරව් කිරීම් ක්‍රියාත්මක වූ කල්හි එය නිතැතින්ම සිදුවන බවයි. කිසියම් අපරාධ කාරයෙක් අපරාධය කරන විටම අල්ලාගෙන, ප්‍රසිද්ධියේ හා සෑම තන්හිදීම ඔහු අපරාධකරුවා බව ප්‍රකාශ කිරීම ම 'හඬනැගීම්' ගණනාවකට වඩා ඵලදායකය. මෙහි ප්‍රතිඵලය කෙබඳුද යත්, පොදු ජනතාවට 'හඬනැඟුවේ' කවුදැයි යනුත්, පෙළපාලිය සඳහා වූ මේ නැතහොත් අතික් සැලැස්ම යෝජනා කළේ කවුදැයි යනුත් ආදිය කිව නොහැකි වනු ඇත. පොදු වශයෙන් නොව, වචනයේ නියම අර්ථයෙන් සටනට හඬනැගීම කරනු ලබන්නේ සටන ඇතිවන තැනදීය. එවැනි හඬනැඟීම් කළ හැකි වන්නේ තමන්ම සටනට අවතීර්ණ වන හා අප්‍රමාදව එසේ කරන අයට පමණකි. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රකාශකයන් වශයෙන් අපගේ කටයුත්ත වන්නේ දේශපාලන හෙළිදරව් කිරීම් හා දේශපාලන උද්ඝෝෂණ ගැඹුරට ගෙනයාම, ව්‍යාප්ත කිරීම හා උත්සන්න කිරීමය.

'සටනට කැඳවා හඬනැගීම' ගැන මෙහිදී වචනයක් කියනු කැමැත්තෙමු. කම්කරුවන්ට කිසිම ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵලයක් බලාපොරොත්තුවිය නොහැකිවූ කරුණක්, එනම්, ශිෂ්‍යයන් යුද්ධ හමුදාවට බඳවාගැනීම සම්බන්ධයෙන් ක්‍රියාශීලිව මැදිහත් වන ලෙසට, වසන්ත කාලයේ සිදුවීම්වලට[72] පෙර කම්කරුවන් කැඳවා හඬනැඟූ එකම පත්‍රය "ඉස්ක්‍රා" පත්‍රයයි. ශිෂ්‍යයන් 183 දෙනෙක් හමුදාවට බඳවා ගැනීම පිළිබඳව, ජනවාරි 11 දින නියෝගය පළවූ වහාම, කිසිම පෙළපාලියක් ආරම්භ වීමට පෙර, මෙම කාරණය ගැන ලිපියක් පළ කළ "ඉස්ක්‍රා" (පෙබරවාරි කලාපය, අංක 2) පත්‍රය 'ශිෂ්‍යයන්ගේ ආධාරයට යන ලෙස හඬනඟා කම්කරුවන්ට ආයාචනා කළේය'; ආණ්ඩුවේ උද්ධච්ඡ අභියෝගය විවෘතයේම පිළිගන්නා ලෙස එය 'ජනතාවට' හඬනඟා ආයාචනා කළේය. 'සටනට කැඳවීම' ගැන මර්තීනව් මෙතරම් කථා කරන නමුත්, ක්‍රියාකාරිත්වයේ විශේෂ ආකාරයක් ලෙසට පවා 'සටනට කැඳවා හඬනැගීම' යෝජනා කරන නමුත්, මෙම හඬනැගීම ගැන ඔහු වචනයක්වත් නොකීවේ මන්ද යන පුදුම එළවන කාරණය කෙසේ පැහැදිලි කළ හැකිද? මෙයින් පසුව, 'ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තුවිය හැකි' ඉල්ලීම් සඳහා අරගල කිරීමට ප්‍රමාණවත් තරම් 'හඬනැඟීම්' නිකුත් නොකළ නිසා "ඉස්ක්‍රා" පත්‍රය එක පැත්තකට බරවී යයි කියා ඊට චෝදනා කිරීම මර්තීනව්ගේ නරුමාලාපයක් නොවේද?

"රබෝචිය දියල" පත්‍රය ඇතුළු වූ අපගේ 'ආර්ථිකවාදීන්', තමන් නොදියුණු කම්කරුවන්ට ගැලපෙන සේ සකස් වූ හෙයින් සාර්ථකත්වයක් ලදහ. 'ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තුවිය හැකි' ඉල්ලීම් ආදිය ගැන මේ කියන කථා, රූබලයකට කොපෙක් එකක් එකතු කිරීම පිළිබඳ පරණ සින්දුවේම අළුත් තාලයක් පමණක් වන බව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරුවා සහ විප්ලවවාදී කම්කරුවා (එවැනි කම්කරුවන්ගේ සංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී) වටහාගනු

ඇති හෙයින් ඔහු ඒ සියල්ලම කෝපයෙන් ඉවත ලනු ඇත. එවැනි කම්කරුවෙක්, ‘‘රබෝචය මිස්ල්’’ සහ ‘‘රබොචිය දියල’’ පත්‍ර වලට මෙසේ කියනු ඇත: මහත්වරුනි, ඔබ කඩිමුඩියේ දහලන්නේ නිරපරාදේය; අපටම කරගත හැකි කටයුත්තට ඔබ මෙතරම් අධික ලෙස උනන්දුවෙන් ඇඹිලි ගැසීමෙන් ඔබේ නිසි කාර්‍යයන් පැහැර හරින්නෙහිය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාගේ කර්තව්‍ය වන්නේ ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීම යයි ඔබ සත්ත වෙමින් කීමේ ඇති කිසිම සාමාර්ථයක් නොමැත. එය ආරම්භය පමණක් මිස, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ප්‍රධාන කර්තව්‍යය නොවේ. ඊට හේතුව, රුසියාව ඇතුලත්ව, සමස්ත ලෝකයේම ආර්ථික අරගලයට දේශපාලන ස්වරූපයක් දීමේ මූලිකත්වය පොලිසිය විසින් ගනු ලැබීමයි; එමෙන්ම ආණ්ඩුව ආධාර කරන්නේ කාටද යන්න තේරුම් ගැනීමට කම්කරුවන් ඉගෙන ගන්නා හෙයිනි*. නව ඇමෙරිකාවක් සොයාගත්

---

* දේශපාලන කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහිදී, ‘ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීමට’ කරන ඉල්ලීමෙන් ඉතාමත් සිත්කාවදින ලෙස ප්‍රකාශිත වන්නේ සාංසිද්ධිකතාවයට යටත් පහත්කම් දක්වීමය. ආර්ථික අරගලය බොහෝ අවස්ථාවල සාංසිද්ධික ලෙස දේශපාලන ස්වරූපයක් ගත්තේය. එයින් කියන්නේ, ‘විප්ලවවාදී රෝග බීජ — බුද්ධිමතුන්’ නොමැතිව, පංති විඥනය ඇති සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මැදිහත්වීම නොමැතිව, එසේ වන බවයි. නිදර්ශනයක් වශයෙන් සමාජවාදීන්ගේ කිසිම මැදිහත්වීමක් නොමැතිව, ඉංග්‍රීසි කම්කරුවන්ගේ ආර්ථික අරගලය දේශපාලන ස්වරූපයක් ගත්තේය. එසේ වුවද, ආර්ථික පදනමක් මත දේශපාලන උද්ඝෝෂණය කළ පමණින්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍ය අවසානයකට පත් නොවේ. ඔවුන්ගේ කර්තව්‍ය වන්නේ, ආර්ථික අරගලයෙන් කම්කරුවන් අතර ජනිතවන දේශපාලන විඥනයේ ගිනි පුලිඟු උපයෝගි කරගනිමින්, කම්කරුවන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන විඥනයේ මට්ටමට ඉහළට නංවාලීම සඳහා, වෘත්තීය සමිතිවාදී දේශපාලනය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අරගලය බවට පරිවර්තනය කිරීමයි. එසේ වුවද, මර්තිනව්ලා කරන්නේ, කම්කරුවන් අතර සාංසිද්ධික ලෙස පහළවන දේශපාලන විඥනය ඉහළට නැංවීම සඳහා උනන්දු දීම නොව, ඒ වෙනුවට සාංසිද්ධිකතාවයට ආචාර කර, කම්කරුවන්ට දේශපාලන අයිතිවාසිකම් නොමැති බව තේරුම් ගැනීමට, ආර්ථික අරගලය විසින් ඔවුන් ‘පොළඹවනු’ ලබන බව නැවත නැවතත් කෙළවරක් නොමැතිව පුනරුච්ඡාරනය කිරීමයි. මහත්වරුනි, ඔබගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් මොනවාද යන්න වටහා ගැනීමට, සාංසිද්ධික ලෙසින් ප්‍රබෝධ වන වෘත්තීය සමිතිවාදී දේශපාලන විඥනය විසින් ඔබ ‘පොලඹවනු’ නොලැබීම අවාසනාවකි.

කලෙක මෙන්, ඔබ මෙතරම් කලබැගැනියක් කරන ‘ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව වූ කම්කරුවන්ගේ ආර්ථික අරගලය’, වැඩ වර්ජන ගැන අසා ඇති එහෙත් සමාජවාදය ගැන කිසිවක් අසා නැති, ඉතාමත් පිටිසර පෙදෙස් ද ඇතුලත්ව, රුසියාවේ සෑම ප්‍රදේශයකම සිටින කම්කරුවන් විසින් දැනටමත් කරගෙන යනු ලැබේ. ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තුවිය හැකි පැහැදිලි ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන්, කම්කරුවන් වන අප අතර, ඔබ දිරිගැන්වීමට බලාපොරොත්තුවන ක්‍රියාකාරිත්වය අපි දැනටමත් දක්වා ඇත්තෙමු; එමෙන්ම, අපගේ සැමද සීමාසහිත වෘත්තීය සමිති කටයුතු වලදී, බොහෝවිට බුද්ධිමතුන්ගේ කිසිම ආධාරයක් නොමැතිව, අපි මෙම පැහැදිලි ඉල්ලීම් ඉදිරිපත් කරමු. එහෙත් එබඳු ක්‍රියාකාරිත්වය අපට ප්‍රමාණවත් වන්නේ නැත. ‘ආර්ථික’ දේශපාලන ලුනු කැඳ පමණක් අපට පොවන්නට අප ළමයින් නොවේ. අනිත් අය දන්නා සියල්ලම අපටත් දැනගන්නට උවමනාය. දේශපාලන ජීවිතයේ සියළුම අංශ ගැන ඉගෙන ගන්නටත්, සෑම දේශපාලන සිදුවීමකටම ක්‍රියාශීලී ලෙස සහභාගි වන්නටත් අපට උවමනාය. අපට මෙය කරගත හැකි වනු පිණිස, අප දැනටමත් දන්නා දේ* ගැන බුද්ධිමතුන් අපට අඩුවෙන් කථා කළ යුතුය; අප නොදන්නා දෙය හා අපගේ පැක්ටරි හා ‘ආර්ථික’ අත්දැකීම් වලින්

---

* ‘ආර්ථිකවාදියෙකුට’ කම්කරුවෙක් කියන මෙම මනඃකල්පික කථාව සත්‍ය කරුණු මත පදනම් කරගත් බව ඔප්පු කිරීමට, කම්කරු පංති ව්‍යාපාරය ගැන ස්වයම්භූත දැනුමක් ඇති බව නිසැකව කිව හැකි ‘න්‍යාය ධර්මවාදීන්’ ට, අපට පක්ෂපාත වීමට කිසිත් කැමැත්තක් නොදක්වන සාක්ෂිකරුවන් දෙදෙනෙකු ගැන සඳහන් කරමු. ඉන් එක් සාක්ෂි කරුවෙක්, (‘‘රබෝචිය දියල’’ පත්‍රය පවා දේශපාලන පක්ෂ පත්‍රයක් ලෙස සලකන) ‘ආර්ථිකවාදියෙක්’ වන අතර, අනික් අය ත්‍රස්තවාදියෙකි. ප්‍රථම සාක්ෂිකරුවා, ‘‘රබෝචිය දියල’’ අංක 6 පත්‍රයේ ‘සාන්ත පීටර්ස්බර්ග් කම්කරු පංති ව්‍යාපාරය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රායෝගික කර්තව්‍යයන්’ යන ඉතාමත් සත්‍යවාදී සහ පැහැදිලි ලෙස ලියා ඇති ලිපියෙහි කතෘය. ඔහු පහත සඳහන් පරිදි කම්කරුවන් වර්ග කරයි. (1) පංති විඥනය ඇති විප්ලවවාදීන්; (2) අන්තර් ස්ථරය; (3) ඉතිරි පොදු ජනයා. අන්තර් ස්ථරය ‘බොහෝවිට තමන්ගේ හදිසි ආර්ථික උවමනාවන්ට වඩා දේශපාලන ජීවිතයේ ප්‍රශ්න ගැන උනන්දුවක් දක්වති. ආර්ථික උවමනාවන් හා පොදු සමාජ තත්වයන් අතර සම්බන්ධය එය තේරුම් ගෙන බොහෝ කල්ය. ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය මෙසේ කියුණු ලෙස විවේචනයට භාජනය කර ඇත. ‘එය එකම දෙය නැවත නැවතත් කියයි. අප බොහෝ කලක සිට දන්නා, බොහෝ කලකට පෙර කියවා ඇති දෙය නැවතත් කියයි’, ‘නැවතත් දේශපාලන සමාලෝචනයෙහි කිසි දෙයක් නැත’

අපට කිසිදක ඉගෙනගත නොහැකි දෙය වන දේශපාලන දැනුම ගැන අපට වැඩියෙන් කියන්න. බුද්ධිමතුන් වන ඔබට මෙම දැනුම ලබා ගත හැක. ඔබ මෙතෙක් කළාට වැඩියෙන් සිය දහස් ගුණයෙන් එය අප වෙත ගෙන ඒම ඔබගේ යුතුකමය. එය අප වෙත ගෙන ආයුත්තේ සාකච්ඡා, පොත් පොඩි හා ලිපි (ඒවා බොහෝවිට තරමක් නීරසය — අපගේ නොවක් ප්‍රකාශය ගැන සමාවන්න) මාර්ගයෙන් පමණක් නොවේ. එය ඉදුරාම කළ යුත්තේ, අපේ ආණ්ඩුව සහ ආණ්ඩු කරන පංති මේ අවස්ථාවේදී, ජීවිතයේ සියළුම අංශවලදී කරන්නේ කුමක්ද යන්න ගැන විචිත්‍ර හෙළිදරව් කිරීම් මගිනි. මෙම යුතුකම ඉටුකිරීමෙහි ලා වැඩි උනන්දුවක් දක්වන්න. 'වැඩකරන පොදු ජනතාවගේ ක්‍රියාකාරිත්වය ඉහළට නැංවීම' ගැන අඩුවෙන් කථා කරන්න. අප ඔබට වඩා බෙහෙවින් ක්‍රියාකාරීය. 'ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල' කිසිවක් හෝ බලාපොරොත්තු විය නොහැකි ඉල්ලීම්වලට පවා ආධාර කිරීමට එළිමහන් වීදි සටන් කිරීමට අපි සම්පූර්ණයෙන්ම සමත් වෙමු. අපගේ ක්‍රියාකාරිත්වය 'ඉහළට නැංවීම' ඔබගේ කටයුත්ත නොවේ. මන්දයත්, හරියටම ඔබට අඩුපාඩුවී තිබෙන්නේද ක්‍රියාකාරිත්වයම වන හෙයිනි. මහත්වරුනි, සාංසිද්ධිකතාවයට වහල් වී ඊට නමස්කාර කිරීම අඩුකර, ඔබගේම ක්‍රියාකාරිත්වය ඉහළට නැංවීම ගැන වැඩියෙන් කල්පනා කරන්න.

ඇ) ආර්ථිකවාදය හා ත්‍රස්තවාදය අතර ඇති පොදු දෙය කුමක්ද?

පසුගිය පා සටහනෙහි අප සඳහන් කළ 'ආර්ථිකවාදියා'ගේ හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීයාගේ මත දෙක අතර අහම්බෙන් මෙන් වූ එකඟතාවයක් පෙන්නුම් කෙරිනි. කෙසේ හෝ වේවා, පොදු වශයෙන් කථාකරන කල, 'ආර්ථිකවාදියා' සහ ත්‍රස්තවාදියා අතර අහම්බෙන් නොව අවශ්‍ය හා ආවේණික සම්බන්ධයක් ඇත. ඒ ගැන අපට පසුව සඳහන් කිරීමට සිදුවන අතර, එය මෙහිදී සඳහන් කිරීම අවශ්‍ය වන්නේ විප්ලවවාදී කටයුතුවලට අදාල අධ්‍යාපන ප්‍රශ්නය හා සම්බන්ධයෙනි. 'ආර්ථිකවාදීන්'ට හා වර්තමාන කාලීන ත්‍රස්තවාදීන්ට ඇත්තේ එකම පොදු ප්‍රභවයකි. එනම්, සාංසිද්ධිකතාවයට වහල් වීමය. එය පොදු කරුණක් වශයෙන් ගෙන පසුගිය පරිච්ඡේදයේ ඒ ගැන සඳහන් කෙළෙමු. දේශපාලන ක්‍රියාකාරිත්වය සහ දේශපාලන අරගලය විෂයෙහි එයින් ඇතිවන ප්‍රතිඵල සම්බන්ධයෙන් අපි මෙහිදී පරීක්ෂා කර බලමු. අප ඒකාන්ත ලෙස ප්‍රකාශ කරන මෙම කාරණය බැලූ බැල්මට ගැටළුවක් මෙන් පෙනෙන්නට පිළිවන. 'නීරස සෑමද අරගලය' ගැන අවධාරණය කරන අයත්, පුද්ගලයන්ගෙන් ඉතාමත් ආත්ම පරිත්‍යාගී අරගලය බලාපොරොත්තුවන අයත්, අතර වෙනස එතරම්ම විශාලය. එහෙත් එහි ගැටළුවක් නොමැත. 'ආර්ථිකවාදීන්' හා ත්‍රස්තවාදීන් නමස්කාර කරන්නේ සාංසිද්ධිකතාවයේ වෙනස් අන්තවලටය. 'ආර්ථිකවාදීන්' 'පිරිසිදු හා සරල කම්කරු ව්‍යාපාරයේ' සාංසිද්ධිකතාවයට නමස්කාර කරති. ඒ අතර ත්‍රස්තවාදීන් ආචාර කරන්නේ, විප්ලවවාදී අරගලය හා කම්කරු පංති ව්‍යාපාරය ඒකීය සමස්තයක් වශයෙන් ඒකාබද්ධ කර ගැනීමට හැකියාව හෝ අවස්ථාව හෝ නොමැති බුද්ධිමතුන්ගේ අනුරාගී කෝපයේ සාංසිද්ධිකතාවයටය. එම ඒකාබද්ධ කිරීම කළ හැකි දෙයකැයි යන විශ්වාසයට අහිමිවූ හා එම විශ්වාසය කිසි කලෙකත් නොදරූ අයට ඔවුන්ගේ කෝපය හා විප්ලවවාදී ශක්තිය මුදා ලීමට ත්‍රස්තය හැර වෙනත් මාර්ගයක් සොයා ගැනීම ඇත්තෙන්ම අපහසුයි. ඒ අනුව බලන කල, අප සඳහන් කළ සාංසිද්ධිකතාවයට වහල් වීමේ දෙ ආකාරයම, අපකීර්තිමත් "Credo" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ ආරම්භයක්ම මිස අන් කිසිවක් විය නොහැක. 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව' කම්කරුවන්ගේ 'ආර්ථික අරගලය' ඔවුන් ගෙන ගියා වේ ("Credo" කතෘගේ අදහස් මර්තිනව්ගේ වචන වලින් ප්‍රකාශ කිරීම ගැන එම කතෘට කණගාටුව ප්‍රකාශ කරමු. කම්කරුවන්ගේ ආර්ථික අරගලය දේශපාලන රජය හා සමග ගැටෙන' බව "Credo" වැඩපිළිවෙළෙන්ද කියා තිබෙන හෙයින් අපට එසේ කිරීමට අයිතිය ඇතැයි සිතමු), — ඒ අතර බුද්ධිමතුන් ඔවුන්ගේ ධෛර්යයෙන්, ඇත්ත වශයෙන්ම, ත්‍රස්තයේ ආධාරයෙන් ඔවුන්ගේ දේශපාලන අරගලය ගෙන ගියා වේ! මෙය ඉතාමත් තර්කානුකූල හා අනිවාර්ණීය නිගමනයකි. මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ආරම්භ කරන අයම පවා මෙහි

(පිටු 30—31). තවද, තුන්වන ස්ථරය වන ''වඩාත් තරුණ හා ඇවිස්සෙන සුලු කම්කරු කොටස, තැබෑරුමෙන් හා පල්ලියෙන් දූෂණය නොවූ සහ දේශපාලන පොත්පත් ලබා ගැනීමට කිසිම පහසුකමක් නැති කරම් වූ කම්කරු කොටස පවා දේශපාලන සිදුවීම් ගැන පිළිවෙළක් නොමැතිව සාකච්ඡා කරති; ශිෂ්‍ය කැරළි ආදිය සම්බන්ධයෙන් ඔවුනට ලැබෙන අසම්පූර්ණ පුවත් ගැන කල්පනා කරති.'' ත්‍රස්තවාදියා මෙසේ ලියයි: ''...තමන්ගේ නගරය ගැන නොව අනිත් නගරවල ජීවිතය ගැන ඇති සුළු විස්තර කරුණු ඔවුන් වරක් දෙවරක් කියවති. ඊට වඩා ඔවුන් කියවන්නේ නැත... කම්කරුවාගේ පත්‍රයක ආණ්ඩුව ගැන යමක් කියා නොතිබීම ඔවුනට අප්‍රසන්නය. එය කම්කරුවන් කුඩා ළමයින් ලෙසට ගෙන සැලකීමක් වන්නේය. කම්කරුවන් කුඩා ළමුන් නොවෙති.'' (විප්ලවවාදී-සමාජවාදී කණ්ඩායම පළ කරන ''ස්වබෝද''[73] පත්‍රය, පිටු 69—70).

අනිවාරණීය භාවය තේරුම් නොගන්නා නමුත් එම නිගමනය වෙනස් කළ යුතු නොවේ. ඉතාමත් යහපත් අපේක්ෂාවෙන් වුවද, ත්‍රස්ත කටයුතු සඳහා හෝ ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීම සඳහා හෝ හඩ නගන අයගේ විඥානය කුමක් වී නමුත්, ඉන් පරිබාහිරව දේශපාලන ක්‍රියාකාරිත්වය කෙරෙහි දක්නට ලැබෙන තර්කානුකූල ස්වභාවයක් තිබේ. අපායට යන පාරත් යහපත් අපේක්ෂාවන්ගෙන් අතුරන ලද්දක්ලු. මෙම අවස්ථාවෙදී 'ඉතාමත් අබාධික මාර්ගය ඔස්සේ', පිරිසිදු ධනේශ්වර "Credo" වැඩ පිළිවෙළෙහි මාර්ගය ඔස්සේ ඇදීයාමේ දෝෂයෙන් අයෙක්, ඔහුගේ යහපත් අපේක්ෂාවන් නිසා නිදහස් වන්නේ නැත. රුසියානු ලිබරල්වාදීන් — භක්තිමත් ලිබරල්වාදීන් සහ මාක්ස්වාදයේ වෙස් මුහුණක් පළඳින ලිබරල්වාදීන් — බොහෝ දෙනෙක්, ඉත සිතින්ම ත්‍රස්තය කෙරෙහි හිතවත්කම් දක්වීම හා වර්තමාන කාලයේ සීඝ්‍රයෙන් මතුවී තිබෙන ත්‍රස්තවාදී හැඩගැස්ම පෝෂණය කිරීමට උත්සාහ දැරීම කිසිසේත් අහඹුවක් නොවේ.

පී බී. අක්සල්රොද්, ඔහුගේ 'සංකල්පනා දෙකක්' සංක්ෂේපයෙන් ගෙනහැර දක්වීමේදී, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මෙම දෙගිඩියාවෙන් ඇතිවන ප්‍රතිඵල ගැන, 1897 අවසානයේ තරම් ඉහත කාලයක ("වර්තමාන කර්තව්‍යයන් හා උපක්‍රම") නිවැරදි ලෙස අනාවැකියක් බඳුව කියා තිබිණි. හැකි සෑම ආකාරයකින්ම කම්කරු පංතියට ආධාර කිරීම ස්වකීය අරමුණ කරගත්, එහෙත් එහි වැඩ පිළිවෙළට ත්‍රස්තය හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයෙන්, තමන් ඉවත් කළ "විප්ලවීය සමාජවාදී ස්වබෝද කණ්ඩායම" පිහිටුවීම අක්සල්රොද්ගේ එම පුදුම සහගත විනිවිද දක්නා බුද්ධිමහිමය යළිත් තහවුරු කරන්නක් විය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර පසුව ඇතිවූ සියළුම ආරාවුල් හා අසමඨයන්, බීජය තුළවූ පැලයක් මෙන්, මෙම සංකල්පනා දෙක තුළ ගැබ් වී තිබුණි.*

'ආර්ථිකවාදයේ සාංසිද්ධිකතාවයට විරුද්ධව නැගී සිටීමට අසමත් වන "රාබෝචිය දියල" පත්‍රය, එමෙන්ම ත්‍රස්තවාදයේ සාංසිද්ධිකතාවයටද විරුද්ධව නැඟී සිටීමට අසමත් වන්නේ මන්ද යන්න මෙම දෘෂ්ටි කෝනය අනුව බැලූ බැල්මට පැහැදිලි වේ. ත්‍රස්තවාදය ආරක්ෂා කිරීම සඳහා "ස්වබෝද" කණ්ඩායම ඉදිරිපත් කර තිබෙන විශේෂ තර්ක ගැන මෙහිදී සටහන් කර ගැනීම ප්‍රයෝජනවත්ය. ත්‍රස්තවාදයේ මර්දනීය කාර්ය කොටස 'සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන' ("විප්ලවවාදයේ පුනර් ජනනය," පිටු 64) එම කණ්ඩායම, ඒ වෙනුවට එහි ඇති 'ඇවිස්සුම්කාරී වැදගත්කම' ගැන අවධාරණය කරයි. මෙයින් ප්‍රථමයෙන්ම නිරූපනය වන්නේ, ත්‍රස්තවාදයම විසින් ඒකාන්ත ලෙස ඉල්ලා සිටින ලද, සම්ප්‍රදායික (සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පූර්ව) අදහස් චක්‍රය සිදීයාමේ හා පිරිහීයාමේ එක් අවස්ථාවක් ඉන් නියෝජනය වන ස්වභාවයයි. දැන් ආණ්ඩුව 'සන්ත්‍රාසයට පත්කළ' නොහැකි බව හා එනිසාම එය ත්‍රස්තය මගින් කඩාබිඳ දැමිය නොහැකි බව පිළිගැනීම යනු අරගල ක්‍රමයක් වශයෙන් හා වැඩ පිළිවෙළේ අනුමත ක්‍රියාකාරිත්ව ක්ෂේත්‍රයක් වශයෙන් ත්‍රස්තය නුසුදුසු සේ සලකා ඉවත ලීමෙක් වන්නේය. දෙවැනිව, වඩාත් හොඳින් නිරූපනය වන්නේ 'විප්ලවීය ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය අධ්‍යාපනය' ට අදල අපගේ හදිසි කර්තව්‍යයන් වටහා ගැනීමට අසමත්වීම පිළිබඳවූ නිදර්ශනයක ස්වභාවයයි. කම්කරු පංති ව්‍යාපාරය 'ඇවිස්සීමේ' හා ඊට 'බලවත් ජීවන ශක්තියක්' දීමේ මාධ්‍ය වශයෙන්, "ස්වබෝද" කණ්ඩායම විසින් ත්‍රස්තය ඉදිරිපත් කරන ලදී. මීට වඩා සර්වාකාරයෙන්ම ස්වයං නාශක වූ තවත් තර්කයක් ගැන සිතීම අපහසුය. විශේෂ

---

* මර්තිනව්, 'වඩාත් යතාර්ථවාදී (?) උභතෝකෝටික ප්‍රශ්නයක් ගැන සිතයි' ("සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සහ කම්කරු පංතිය", පිටු 19): "එක්කෝ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය නිර්ධන පංතියේ ආර්ථික අරගලයේ නායකත්වය කෙළින්ම භාරගෙන එමගින් (!) එය විප්ලවීය පංති අරගලයක් බවට පරිවර්තනය කරයි"... 'එමගින්', ඒ කියන්නේ ආර්ථික අරගලයට කෙළින්ම නායකත්වය දීම ගැන බව පෙනේ. වෘත්තීය සමිති අරගලයට පමණක් නායකත්වය දීම තුළින් වෘත්තීය සමිතිවාදී ව්‍යාපාරයක් විප්ලවීය පංති ව්‍යාපාරයක් බවට පරිවර්තනය වූ අවස්ථා එකක්වත් ගැන මර්තිනව්ට නිදර්ශනයක් දිය හැකිද? මෙම පරිවර්තනය ඇති කිරීම සඳහා සෑම පැත්තෙන්ම කරන දේශපාලන උද්ඝෝෂණයට 'කෙළින්ම නායකත්වය දීමට' අප කටයුතු කළයුතු බැව් ඔහුට තේරුම් ගත නොහැකිද?.. "නැතහොත් අනික් සංකල්පනාව: සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය කම්කරුවන්ගේ ආර්ථික අරගලයේ නායකත්වය ගැනීමෙන් වැලකී සිටියි... එනයින් තමන්ගේම තටු සිඳ ගනියි... ඉහත උපුටා දක්වා ඇති "රබොචිය දියල" පත්‍රයේ අදහස අනුව, වැලකී සිටින්නේ "ඉස්ක්‍රා" පත්‍රයයි. එහෙත් මෙහි පසුකී පත්‍රය, "රබෝචිය දියල" පත්‍රයට වඩා ආර්ථික අරගලයට නායකත්වය දීම සඳහා බොහෝ සෙයින් කටයුතු කරන බව අපි දැක ඇත්තේමු. එපමණක් නොව, එම පත්‍රය එම කටයුත්තට පමණක් සීමාවී නොසිටින බවද, එම කටයුත්ත ගැන සලකා ස්වකීය දේශපාලන කර්තව්‍යයන් පටු තත්වයට ගෙන එන්නේ නැති බවද අපි දැක ඇත්තෙමු.

‘ඇවිස්සුම් කාරකයන්’ නිර්මාණය කර නොගත්තාට, රුසියානු සමාජ ජීවිතයේ සෑහෙන තරම් දුෂ්ඨකම් සිදුවන්නේ නැද්ද? අනික් අතට රුසියාවේ දුෂ්ඨ පාලනයෙන්වත් කුපිතව ඇවිස්සෙන්නේ නැතියවුන්, ත්‍රස්තවාදී ස්වල්ප දෙනෙකුගේ තනිවූ ආණ්ඩු විරෝධී සටනකදී ‘නිකම්ම ඇඟලි ගැට කඩමින්’ බලා සිටිනු ඇති බව පැහැදිලි නොවේද? සත්‍ය කාරණය එම රුසියානු ජීවිතයේ සමාජ කෲරකම් වලින් වැඩ කරන පොදු ජනතාව ඉතා ඉහළ මට්ටමකින් කුපිතව ඇවිස්සෙන බවයි. එහෙත්, රුසියානු ජීවිතයේ තත්වයන් විසින්, අප සිතනවාට වඩා බොහෝ සෙයින් ඉදිරියට දමනු ලබන පොදු ජන අප්‍රසාදයේ බිංදු හා කඳුරු ඒකීය යෝධ මහෝඝයක් වන සේ එකට එකතු කර යොමු කිරීමට අප අසමත්ය. කම්කරු පංති ව්‍යාපාරයේ අති දැවැන්ත වර්ධනයක්, දේශපාලන සාහිත්‍ය ලබා ගැනීම සඳහා ඉහත සඳහන් පරිදි ඇති බලවත් ආයාසයක් අනුව, මෙය සාර්ථක කළ හැකි කර්තව්‍යයක් වන බව කිසි කෙනෙකුට කළ නොහැකි ලෙසට ඔප්පු වේ. අනික් අතට, ත්‍රස්තය සඳහා හඬ නැඟීමත්, ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීම සඳහා හඬ නැඟීමත් යනු, රුසියානු විප්ලවවාදීන්ගේ කර පිට දැනට පැවරී තිබෙන, ඉතාමත් හදිසි කාර්ය වන අංගසම්පූර්ණ දේශපාලන උද්ඝෝෂණය සංවිධානය කිරීම මග හැරීමේ එකිනෙකට වෙනස් ක්‍රම දෙකකි. උද්ඝෝෂණය වෙනුවට ත්‍රස්තය ආදේශ කිරීමට ‘‘ස්වබෝද’’ කණ්ඩායම ඇලුම් කරන අතර, ‘ජනතාව අතර උත්සන්න හා දැඩි උද්ඝෝෂණය ආරම්භ කළ වහාම ත්‍රස්තයේ ඇවිස්සුම්කාරී කාර්ය කොටස කෙළවර වේ’ යයි එය විවෘතව පිළිගනියි (‘‘විප්ලවවාදයේ පුනර් ජනනය’’, පිටු 68). වසන්තයේ ඇති වූ සිදුවීම්* සපයන සිත්කාවදින සාක්ෂි තිබිය දීම, එක කණ්ඩායමක් කෘතිම ‘ඇවිස්සුම් කාරකයන්’ සොයා යන අතර අනික් කණ්ඩායම ‘පැහැදිලි ඉල්ලීම්’ ගැන කථා කරතත්, ත්‍රස්තවාදීන් හා ‘ආර්ථිකවාදීන්’ යන කණ්ඩායම් දෙකම පොදු ජනතාවගේ විප්ලවීය ක්‍රියාකාරිත්වය ගැන අඩුවෙන් තක්සේරු කරන බව මෙයින් පෙනේ. සංවිධානය හා දේශපාලන හෙළිදරව් කිරීම පිළිබඳ කටයුතු විෂයෙහි ස්වකීය ක්‍රියාකාරිත්වය සංවර්ධනය කර ගැනීමට තරම් ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට මෙම කණ්ඩායම් දෙකම අසමත් වෙති. වර්තමානයේ හෝ වෙනත් කාලයක මෙම කර්තව්‍ය වෙනුවට ආදේශ කිරීමට සුදුසු විකල්පයක් වශයෙන් ගතහැකි වෙනත් කාර්යයක් නොමැත.

---

* 1901 වසන්තයේ ආරම්භවූ විශාල වීදි පෙළපාළි. (1907 සංස්කරණයට කර්තෘගේ සටහන).

ඉ) කම්කරු පංතිය — ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පෙරමුණු සටන් කරු වශයෙන්

අපගේ ක්‍රියාකාරිත්වය, සැබෑ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරිත්වයක් වීමට නම්, ඉතාමත් පුළුල් ලෙස දේශපාලන උද්ඝෝෂණය ගෙනයාම අත්‍යාවශ්‍ය වන බවත්, එනිසා සෑම පැත්තකින්ම දේශපාලන හෙළිදරව් කිරීම් අත්‍යාවශ්‍ය වන බවත් අපි දුටුවෙමු. එසේ වුවද, අප මෙම නිගමනයට එළඹියේ, දේශපාලන දැනුම හා දේශපාලන පුහුණුව ලබා ගැනීම සඳහා කම්කරු පංතියට තිබෙන බලවත් උවමනාව පමණක් පදනම් කරගෙනය. එහෙත්, ප්‍රශ්නය එපරිද්දෙන් ඉදිරිපත් කිරීමෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ, විශේෂයෙන්ම, වර්තමාන රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පොදු ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් අත්හැරෙන හෙයින්, එය පමණට වඩා පටු වේ. මෙම කරුණ වඩාත් පැහැදිලි ලෙස තේරුම් කිරීම සඳහා, ‘ආර්ථිකවාදීන්’ට ‘ආසන්නතම’ වූ අංශයක් වන ප්‍රායෝගික අංශයෙන් මාතෘකාවට ළඟා වන්නෙමු. කම්කරු පංතියේ විඥානය දියුණු කළ යුතු බවට කවුරුත් එකඟ වෙති. එහෙත් ප්‍රශ්නය නම් එය කරන්නේ කෙසේද යන්නය. ආර්ථික අරගලයෙන් කම්කරුවන් ‘උනන්දු කරනු ලබන්නේ’ කම්කරු පංතිය කෙරෙහි ආණ්ඩුව දක්වන ආකල්පය වටහා ගැනීමට පමණකි. එනිසා, ආර්ථික අරගලයේ රාමුව ඉතා පටු නිසා ‘ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීමට’ අප කොතරම් උත්සාහ කළත්, එම අරගලයේ සීමාව තුළ සිටිමින් අපට කම්කරුවන්ගේ විඥානය (සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මට්ටමට) සංවර්ධනය කළ හැකි නොවේ. එහෙත්, මර්තිනව්ගේ සූත්‍රයෙහි වටිනාකමක් අපට ඇත. එසේවන්නේ, කරුණු අවුල් කිරීමට මර්තිනව්ගේ ඇති කුසලතාවය එයින් පිළිබිඹු වන නිසා නොව, සියළුම ‘ආර්ථිකවාදීන්’ කරන වරද එයින් එක එල්ලේ ප්‍රකාශ වන හෙයිනි. එම මූලික වරද නම්, කම්කරුවන්ගේ අභ්‍යන්තරයෙන්ම කියන ලෙසට, ඔවුන්ගේ ආර්ථික අරගලයෙන්, එනම්, එම අරගලය පමණක් (නැතහොත් යටත් පිරිසෙයින් ප්‍රධාන) ආරම්භක ස්ථානය වශයෙන් ගෙන, එය පමණක් (නැතහොත් යටත්පිරිසෙයින් ප්‍රධාන) පදනම වශයෙන් ගෙන කටයුතු කිරීමෙන්, කම්කරුවන්ගේ දේශපාලන විඥානය සංවර්ධනය කළ හැකිය යන විශ්වාසය දැරීමයි. එවැනි අදහසක් මූලික වශයෙන්ම වැරදිය. ඔවුනට විරුද්ධව අප කරන විවාදයෙන් උදහස් වූ ඔවුන්, මෙම අසමථයන්ගේ මූලාශ්‍රයන් ගැන කල්පනා කිරීම ප්‍රතික්ෂේප කරන හෙයින්, එහි ප්‍රතිඵලයක් වශයෙන්

අප දෙගොල්ලට එකිනෙකා තේරුම්ගත නොහැකි වී ඇත. අප භාෂා දෙකකින් කථා කළා හා සමානය.

පංති දේශපාලන විඥනය කම්කරුවන් වෙත ගෙන ආ හැක්කේ පිටතින් පමණකි; එනම් ආර්ථික අරගලයට, කම්කරුවන් හා ස්වාමිවරුන් අතර වූ සම්බන්ධයේ ක්ෂේත්‍රයට පිටතිනි. මෙම දැනුම ලබා ගත හැකි එකම ක්ෂේත්‍රය, සියළුම පංති හා ස්ථරයන් රාජ්‍යයට හා ආණ්ඩුවට දක්වන සම්බන්ධය, සියළුම පංති අතර අන්තර් සම්බන්ධය, පිළිබඳ ක්ෂේත්‍රයයි. එම හේතුව නිසා, කම්කරුවන්ට දේශපාලන දැනුම ගෙන දීමට කළ යුත්තේ කුමක්ද යන ප්‍රශ්නයට දෙන පිළිතුර, බොහෝ ප්‍රායෝගික කාරක වරුන්, විශේෂයෙන්ම 'ආර්ථිකවාදය' වෙතම නැඹුරු වූ අය, බොහෝ අවස්ථාවල ඊට සතුටුදයක පිළිතුරක් යයි සිතන 'කම්කරුවන් අතරට යාම' පමණක් විය නොහැකිය. කම්කරුවන්ට දේශපාලන දැනුම ගෙන දීම සඳහා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ජනගහනයේ සියළුම පංති අතරට යායුතුය: ඔවුන් සිය හමුදාව සෑම දිසාවකටම පිටත් කළ යුතුය.

අප, උවමනාවෙන්ම මෙම කොරසැඩි සූත්‍රය තෝරා ගත්තේ, ඉතාමත් සරලව අපගේ අදහස් ප්‍රකාශ කර ඇත්තේ, උභතෝකෝටික ප්‍රකාශයක් කිරීමට අපේ ඇති ආශාවක් නිසා නොව, සමාවක් දිය නොහැකි ලෙසට 'ආර්ථිකවාදීන්' අමතක කර සිටින ඔවුන්ගේ කර්තව්‍ය ගැන වටහා ගැනීමට ඔවුන් 'උනන්දු කරවීම' ත්, වෘත්තීය සමිතිවාදී දේශපාලනය හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය අතර තිබෙන හා ඔවුන් වටහා ගැනීම ප්‍රතික්ෂේප කරන වෙනස තරයේ කීමත් සඳහාය. එනිසා උපේක්ෂා නොවී අවසානය දක්වා අප කියන්න අසන ලෙස පාඨකයාගෙන් ඉල්ලමු.

පසුගිය අවුරුදු කීපය තුළ ඉතාමත් ව්‍යාප්ති ආකාරයෙන් පැතිරී ගොස් තිබෙන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අධ්‍යයන කව වර්ගය ගෙන, එහි වැඩ කටයුතු පරීක්ෂා කර බලමු. එය 'කම්කරුවන් හා සමග සම්බන්ධකම්' පවත්වයි; එයින් සෑහීමට පත්වී, පැක්ටරිවල අක්‍රමිකතාවයන්ද, ධනේශ්වරයන් කෙරෙහි වූ ආණ්ඩුවේ පක්ෂපාතීභාවයද, පොලිසියේ දුෂ්ඨකම්ද තදබල ලෙස හෙළා දකිමින් පත්‍රිකා නිකුත් කරයි. කම්කරුවන්ගේ රැස්වීම් වලදී පැවැත්වෙන සාකච්ඡාවන් කිසි කලෙකත් මෙම මාතෘකාවල සීමාවෙන් ඔබ්බට නොයයි, — යතොත් ඒ ඉතා කලතුරකිනි. විප්ලවවාදී ව්‍යාපාරයේ ඉතිහාසය, ආණ්ඩුවේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය, රුසියාවේ හා යුරෝපයේ ආර්ථික පරිනාමය, නවීන සමාජයේ විවිධ පංතිවල තත්වයන්, යනාදිවූ කරුණු සම්බන්ධයෙන් පැවැත්වෙන දේශන හෝ සාකච්ඡා, ඉතා විරළය. සමාජයේ අනෙකුත් පංති සමග ක්‍රමානුකූල ලෙස සම්බන්ධකම් ඇති කර ගෙන ව්‍යාප්ත කිරීම ගැන කිසිම කෙනෙක් සිහිනෙන්වත් සිතන්නේ නැත. එවැනි කවවල සාමාජිකයන් වැඩි දෙනෙකුගේ මනෝ පින්තූර අනුව, හොඳ නායකයා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන නායකයෙකුට වඩා වෘත්තීය සමිති ලේකම් වරයෙකුගේ ස්වරූපය දරයි. එසේ කියන්නේ, නිදර්ශනයක් වශයෙන්, ඕනෑම ඉංග්‍රිසි වෘත්තීය සමිතියක ලේකම් වරයෙක් ආර්ථික අරගලය ගෙනයාමට කම්කරුවන්ට නිතරම ආධාර කරන හෙයිනි; පැක්ටරි තත්වයන් හෙළිදරව් කිරීමට ඔහු ඔවුනට ආධාර වන හෙයිනි; නීති වලත්, වැඩ වර්ජනය කිරීමට හා පිකට් කිරීමට (කිසියම් පැක්ටරියක වැඩ වර්ජනයක් සිදුවන විට සෑම අයටම දන්වීමට හා කරුණු පැහැදිලි කිරීමට) කරන අවහිරකම් වලත් අසාධාරන භාවය ද, ධනපති පංතියට අයත් විනිශ්චය මණ්ඩලවල විනිශ්චය කරුවන්ගේ පක්ෂග්‍රාහී කම්ද ආදීවූ කරුණු පෙන්නුම් කර දෙන හෙයිනි. කොටින් කියතොත්, සෑම වෘත්තීය සමිති ලේකම් වරයෙක්ම 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය' ගෙනයයි; ගෙනයාමට ආධාර කරයි. එහෙත්, තවමත්, මෙය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය නොවන බවත්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාගේ උත්තම අපේක්ෂාව විය යුත්තේ, වෘත්තීය සමිතිවාදී ලේකම් වරයෙකු වීම නොව ජනතාවගේ නියෝජිතයා වීම බවත්, ඔහු, දුෂ්ඨ පාලනය හා පීඩනය දක්නට ලැබෙන සෑම අවස්ථාවකම, එය පැන නගින ස්ථානය නොසලකා, ඉන් ගැහැටට පත්වන සමාජ ස්ථරය කුමක්ද යන්න නොසලකා, ඒ ගැන ක්‍රියාකාරී වීමෙහි සමත් විය යුතු බවත්, දක්නට ලැබෙන දුෂ්ඨ පාලනයේ හා පීඩනයේ අවස්ථා සියල්ලෙන්ම පොදු නිගමන වලට බැස ගනිමින්, පොලිස් හිංසනය හා ධනේශ්වර සූරාකෑම පිළිබඳව ඒකීය පින්තූරයක් ඉදිරිපත් කිරීමෙහි සමත් විය යුතු බවත්, සිය සමාජවාදී අවබෝධය හා සිය ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම් සියල්ලන්ම ඉදිරියේ තැබීම සඳහා සහ නිර්ධන පංතියේ විමුක්ති අරගලයෙහි තිබෙන ලෝක-ඓතිහාසික වැදගත්කම සෑම සියළු දෙනාටම පැහැදිලි කරදීම සඳහා සෑම සෙසු පටු හෝ සිදුවීමකින්ම ප්‍රයෝජන ගැනීමෙහි සමත් විය යුතු බවත් කොතරම් අවධාරණය කලත් එහි වරදක් නැත. නිදර්ශනයක් වශයෙන්, (එංගලන්තයේ ඉතාමත් ප්‍රබල වෘත්තීය සමිති අතුරෙන් එකක් වන බොයිලේරු තනන්නන්ගේ සමිතියේ චිර ප්‍රසිද්ධ ලේකම් හා නායකයා වන) රොබට් නයිට් වැනි නායකයෙක්, විල්හෙල්ම් ලිබ්ක්නෙහ්ට් හා සමග සංසන්දනය කර බලන්න; ඒ අතරම, මර්තිනව් “ඉස්ක්‍රා” පත්‍රය සමග ගැටෙමින්, එය සමග කරන විවාදයේදී, ඔහු

විස්තර කරන අසමානකම්, ඒ දෙදෙනාට ගැලපීමට උත්සාහ ගන්න. මම මර්තිනව්ගේ ලිපිය බලමින් සිටිමි. එසේ ගැලපීමේදී ඔබට මෙම කරුණු පෙනී යනු ඇත: රොබට් නයිට් වැඩි වශයෙන් යෙදුනේ ‘කිසියම් නිශ්චිත ක්‍රියාවල යෙදෙන ලෙස පොදු ජනතාවට හඬ නැඟීමෙහිය’ (මර්තිනව්... පිටු 39) ඒ අතර ලිබ්ක්නෙහ්ට් වැඩි වශයෙන් යෙදුනේ ‘සමස්ත වර්තමාන ක්‍රමයම ගැන, නැතහොත් එහි දක්නට ලැබෙන අංශ ගැන විප්ලවවාදී ලෙස පැහැදිලි කිරීමෙහිය’ (38—39). රොබට් නයිට් ‘නිර්ධන පංතියේ හදිසි ඉල්ලීම් සකස් කොට ඒවා දිනාගැනීමේ මාර්ග ගෙනහැර දක්වූ (41) අතර විල්හෙල්ම් ලිබ්ක්නෙහ්ට් එයද කරමින්ම, ඒ සමගම විවිධ විරුද්ධ පාර්ශවීය ස්ථරයන් සඳහා ‘නියත සටන් වැඩ පිළිවෙළක් පෙන්නුම් කරමින්’* ‘එම ස්ථරයන්ගේ කටයුතු මෙහෙයවීමෙන්’ ද වැලකුනේ නැත. (41) ‘හැකි තරමක් දුරට ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීමට’ රොබට් නයිට් උත්සාහ කළේය. (42). ‘කිසියම් ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තුවිය හැකි පැහැදිලි ඉල්ලීම් ආණ්ඩුව වෙත ඉදිරිපත් කිරීමට’ ඔහු උසස් ලෙස සමත් විය. (43). එහෙත් ලිබ්ක්නෙහ්ට් ඊට වඩා බොහෝ දුරට යෙදුනේ ‘එක පැත්තකට බරවූ’ ‘හෙළිදරව් කිරීම්’ වලය (40). රොබට් නයිට් ‘නිරස සැමදු අරගලයේ ඉදිරි ගමන’ කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වූ (61) අතර ලිබ්ක්නෙහ්ට් දීප්තිමත් හා පරිපූර්ණ අදහස් ප්‍රචාරය කෙරේ වැඩි සැලකිල්ලක් දක්වීය. (61). ලිබ්ක්නෙහ්ට් තමා අධ්‍යක්ෂණය කරමින් සිටි පත්‍රය ‘විප්ලවවාදී විරුද්ධ පාර්ශවයේ පත්‍රයක් බවට හරවා එමගින් අප රටේ තත්වය, විශේෂයෙන්ම, දේශපාලන තත්වය විස්තර කරමින් එය ජනගහනයේ විවිධතම ස්ථරයන්ගේ උවමනාවන්ට බලපෑ තාක් දුරට හෙළිදරව් කළේය; (63). එහෙත්, රොබට් නයිට් ‘නිර්ධන පංති අරගලය හා සමග සමීප ඓන්ද්‍රිය සම්බන්ධය ඇතිව කම්කරු පංතියේ යහපත පිණිස වැඩ කළේය’, (63). මෙහිදී ‘සමීප ඓන්ද්‍රිය සම්බන්ධය’ යනුවෙන් අදහස් කරන ලද්දේ, ක්‍රිචෙව්ස්කි හා මර්තිනව් උදහරණ ලෙස ගනිමින් අප ඉහත විස්තර කළ සාංසිද්ධික තාවයට වන්දනා කිරීම වන අතර, ‘එසේ කිරීමේදී එම බලපෑම වඩාත් සංකීර්ණ කෙරෙන්නේය යන අවබෝධය’ මර්තිනව් මෙන්ම ඇති කරගෙන ‘තමා බලපාන ක්ෂේත්‍රය සීමා කළ’ බවයි (63). කොටින් කියතොත්, මර්තිනව් සමාජ-ප්‍රජාතන්ත්‍රයේ යහපතට ඇති අකැමැත්තක් නිසා නොව, ප්ලෙහානව් වටහා ගැනීමට කරදර වෙනවා වෙනුවට, ඔහුට අරුත්සරු බවක් දීමට, එක්තරා දුරකට පමණ ඉක්මවා ගිය හුදු ඉක්මන්කාරී කම නිසා, de facto* ඔහු කළේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය වෘත්තීය සමිති වාදයේ මට්ටමට පහත හෙළීම බව ඔබට පෙනෙනු ඇත.

කෙසේ හෝ වේවා, අපි අපගේ තීසිසය වෙත ආපසු යමු. නිර්ධන පංතියේ දේශපාලන විඥනය සංවර්ධනය කිරීම අවශ්‍ය බව ඇත්තෙන්ම විශ්වාස කරන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා ‘ජනගහනයේ සියළුම පංති අතරට යායුතුය’ යි අපි කිවෙමු. මෙය කරන්නේ කොහොමද? මෙය කිරීමට තරම් ප්‍රමාණවත් බලවේග අපට තිබේද? සියළුම පංති අතර එබඳු වැඩ කිරීමට පදනමක් තිබේද? පංති දෘෂ්ටි කෝණයෙන් බලන කල, මෙය පසුබැසීමක් නැතහොත් පසුබැසීමට මග විවෘතවීමක් බව අදහස් නොවේද? යන මේ ප්‍රශ්න එයින් පැන නගී. ඒවා ගැන කරුණු සලකා බලමු.

න්‍යායවාදීන් වශයෙන්, ප්‍රචාරකයන් වශයෙන්, උද්ඝෝෂකයන් වශයෙන් හා සංවිධායකයන් වශයෙන් ‘ජනගහනයේ සියළුම පංති අතරට අප යායුතු’ ය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාගේ න්‍යායික කටයුතු ඉලක්ක කළ යුත්තේ විවිධ පංතිවල සමාජ හා දේශපාලන තත්වයෙහි යතාභූත අංග ලක්ෂණ සියල්ලම අධ්‍යයනය කිරීම වෙතය යන්න ගැන කිසිවෙකු තුළ සැකයක් නැත. එහෙත් පැක්ටරි ජීවිතයේ යතාභූත අංග ලක්ෂණ අධ්‍යයනය කිරීමට කරන කටයුතු හා සමග සංසන්දනය කරන විට මේ සම්බන්ධයෙන් කටයුතු කෙරෙන්නේ ඉතාමත් අල්ප වශයෙනි. ලෝහ කර්මාන්තයේ කිසියම් විශේෂ අංශයක් ගැන පවා අධ්‍යයනය කිරීමෙහි නියැලී සිටින අය කාරක සභා හා අධ්‍යයන කව වලදී කෙනෙකුට හමුවිය හැක. එහෙත්, වෙනත් සමාජ ස්ථරයන් අතර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී වැඩ කරගෙන යාමට මාධ්‍යයක් වශයෙන් ප්‍රයෝජනවත් විය හැකි, අප රටේ දැවෙන සමාජ හා දේශපාලන ප්‍රශ්නයක් ගැන තොරතුරු විස්තර එකතු කිරීමෙහි යෙදී සිටින සංවිධාන සමාජිකයින් කිසිවිටෙකවත් සොයා ගත නොහැකි තරම් විරළය. (මොනයම් හේතුවක් නිසා හෝ ඔවුනට ප්‍රායෝගික වැඩ අත් හැරීමට සිදුවූ අවස්ථා එමටය.) කම්කරු පංති ව්‍යාපාරයේ වර්තමාන නායකයන් වැඩි දෙනෙකුට පුහුණුවක් නොමැති කම ගැන කරුණු සඳහන් කිරීමේදී, මෙම කරුණ සම්බන්ධයෙන් පුහුණුවීම ගැනද සඳහන් නොකර බැරිය.

---

* නිදර්ශනයක් වශයෙන්, ප්‍රන්ස-ප්‍රැශියන් යුද්ධ කාලයේ දී සමස්ත ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ලිබ්ක්නෙහ්ට් සටන් වැඩ පිළිවෙළක් පෙන්නුම් කළේය. 1848 දී මාක්ස් හා එංගල්ස්ටත් වැඩි තරමින් ඔහු එසේ කළේය.

* යථාර්ථ වශයෙන්. සංස්කාරක

ඊට හේතුව, එයත් ‘නිර්ධන පංති අරගලය සමග සමීප ඓන්ද්‍රිය සම්බන්ධය’ පිළිබඳ වූ ‘ආර්ථිකවාදී’ සංකල්පය සමග බැඳී ඇති හෙයිනි. ඇත්ත වශයෙන්ම ප්‍රධාන කාරණය වන සියළුම ජනතා ස්ථරයන් අතර ප්‍රචාරය හා උද්ඝෝෂණය කිරීමයි. මේ හා සම්බන්ධයෙන් ගත් කල, බටහිර යුරෝපීය රටවල ප්‍රසිද්ධ රැස්වීම් වලට හා මහජන රැළි වලට සහභාගිවීමේ නිදහස සියළු දෙනාටම තිබෙන නිසාත්, පාර්ලිමේන්තුව තුළදී සියළුම පංතිවල නියෝජිතයන් ආමන්ත්‍රණය කිරීමේ නිදහස සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාට තිබෙන නිසාත්, ඔහුගේ කටයුතු සඳහා පහසු කමක් ඇත. අපට පාර්ලිමේන්තුවක් හෝ රැස්වීමේ නිදහස හෝ නැත. එසේ වුවත්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකුට කන් දීමට කැමති කම්කරුවන්ගේ රැස්වීම් පිළියෙළ කිරීමේ හැකියාව අපට ඇත. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාට කන්දීමට කැමති සියළුම සමාජ පංතිවල නියෝජිතයන්ගේ රැස්වීම් කැඳවීමේ මාර්ග හා මාධ්‍ය අප සොයා ගත යුතුය. ‘‘කොමියුනිස්ට්වාදීන් සෑම විප්ලවවාදී ව්‍යාපාරයකටම ආධාර කරන’’[74] බවත්, එම හේතුව නිසා, අපගේ සමාජවාදී අවබෝධය මොහොතකට හෝ අමතක නො කරම, සමස්ත ජනතාවම හමුවේ තිබෙන පොදු ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් විස්තර කිරීම හා ඒවා අවධාරණය කිරීම අප කළ යුතු බවත්, භාවිතයෙහිදී අමතක කරන තැනැත්තේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු නොවේ; සෑම පොදු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රශ්නයක්ම මතුකිරීමෙහිදී සහ විසඳීමෙහිදී අන් සියළු දෙනාටම ඉදිරියෙන් සිටීමට ඇති තමන්ගේ යුතුකම අමතක කරන තැනැත්තේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් නොවේ.

‘නමුත් සෑම කෙනෙක්ම මෙයට එකඟය’ යි නොඉවසිලිමත් පාඨකයා තදින් කියනු ඇත. එපමණක් නොව, විදේශගත සංගමයේ පසුගිය සම්මේලනය, ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ කර්තෘ මණ්ඩලය සඳහා අනුමත කළ උපදෙස්වලද නියත වශයෙන්ම මෙසේ සඳහන්ය: ‘සමාජ හා දේශපාලන ජීවිතයෙදී කෙළින්ම හෝ විශේෂ පංතියක් වශයෙන් හෝ, එසේ නැතහොත්, නිදහස සඳහා කරන අරගලයේ යෙදී සිටින සියළු විප්ලවවාදී බලවේගයන්ගේ පෙරටු බල ඇණිය වශයෙන් නිර්ධන පංතිය කෙරෙහි බලපාන සියළුම සිදුවීම් දේශපාලන ප්‍රචාරය හා උද්ඝෝෂණය සඳහා සුදුසු මාතෘකා වනු ඇත’. (‘සම්මේලන දෙකක්’ — පිටු 17. අවධාරණය අපගේය). මේවා ඉතාමත් නිවැරදි, ඉතාමත් යහපත් වචන බව සැබවි. ‘‘රබෝචිය දියල’’ පත්‍රය ඒවා තේරුම් ගන්නේ නම්, ඊළඟ හුස්මටම ඒවාට ප්‍රතිවිරෝධී දේ කීමෙන් එය වැළකී සිටින්නේ නම්, අපි අතිශයින්ම සතුටු වෙමු. එසේ කියන්නේ අප ‘පෙරටු බල ඇණිය’, ඉදිරියටම ගිය බල ඇණිය බව අපම විසින් කියා ගැනීම ප්‍රමාණවත් නොවන හෙයිනි. අප පෙරමුණෙහි ගමන් කරන බව අනිකුත් සියළුම බල ඇණිවලටද දැනෙන ආකාරයට අපි කටයුතු කළ යුතු වෙමු. තවද, පාඨකයාගෙන් මෙසේද අසමු. අප ‘පෙරටු බල ඇණිය’ වන බව කියන අපගේ වචන මාත්‍රය ඇදහීමට තරම් අනිකුත් ‘බල ඇණිවල’ නියෝජිතයෝ මෝඩයෝ වෙතිද? පහත සඳහන් පරිදි මනෝ පින්තූරයක් සිතට නගා ගන්න. උගත් රුසියානු උන්නතිකාමීන්ගේ නැතහොත් ලිබරල් ව්‍යවස්ථානුකූල වාදීන්ගේ ‘බල ඇණිය’ වෙත පැමිණෙන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් මෙසේ කියයි: පෙරටු බල ඇණිය වන්නේ අපය; ‘අප දැන් මුහුණ පා ඇති කර්තව්‍යය නම් හැකිතාක් දුරට ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීමයි’. උන්නතිකාමියා නැතහොත් ව්‍යවස්ථානුකූල වාදියා මඳක් හෝ බුද්ධිය ඇති අයෙක් නම් (රුසියානු උන්නතිකාමීන් හා ව්‍යවස්තානුකූල වාදීන් අතර බොහෝ බුද්ධිමත් පුද්ගලයන් ඇත.) ඔහු මෙම කථාව අසා, මුවින් නොබැන සිනාසී (බොහෝ අවස්ථාවල ඔහු උපාය දක්ෂයෙකි) තමන්ටම මෙසේ කියාගනු ඇත: ‘‘නුඹලාගේ ‘පෙරටු බල ඇණිය’ නිවටයන් ගෙන් සැදුනක් විය යුතුය! කම්කරුවන්ගේ ආර්ථික අරගලයට ම දේශපාලන ස්වරූපයක් දීම අපගේ කර්තව්‍ය බව, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ නියෝජිතයන්ගේ කර්තව්‍යය බව වත් ඔවුනට තේරෙන්නේ නැත. මන්ද? බටහිර යුරෝපයේ ධනේශ්වර පංතිය මෙන්, කම්කරුවන් දේශපාලනයට ඇදගැනීමේ උවමනාව අපටද තිබේ. එහෙත් ඒ වෘත්තීය සමිතිවාදී දේශපාලනයට මිස සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට නොවේ. කම්කරු පංතියේ වෘත්තීය සමිතිවාදී දේශපාලනය යනු කම්කරු පංතියේ ධනේශ්වර දේශපාලනයයි. ඒ අතර මෙම ‘පෙරටු බල ඇණිය’ ඉදිරිපත් කරන්නේ වෘත්තීය සමිතිවාදී දේශපාලනය විසින් ඉදිරිපත් කරනු ලබන කර්තව්‍යයමයි! ඔවුනට ඇති තාක් ඔවුන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් බව කියා ගත්තා වේ. ලේබලයක් ගැන කලබල වීමට තරම් මම ළදරුවෙක් නොවෙමි. එහෙත් ඔවුන් අර අනර්ථකාරී විශුද්ධි න්‍යාය ධර්මවාදීන්ගේ බලපෑමට හසුනොවිය යුතුය. අවිඥත ලෙස සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය වෘත්තීය සමිතිවාදී මාවතට පලවා හරින්නවුනට ‘විවේචනය කිරීමේ නිදහස දිය යුතුය’.

තවද, අපගේ ව්‍යාපාරය තුළ සම්පූර්ණයෙන්ම මෙන් සාංසිද්ධිකතාවය බලපවත්වද්දී, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය පෙරමුණු බල ඇණිය ලෙසට ගෙන අද කථා කරන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්, ‘සාංසිද්ධික ස්වභාවය ලඝුකොට තැකීම’ ට තරම්ද, දීප්තිමත් හා පරිපූර්ණ අදහස් ප්‍රචාරය හා සමග සංසන්දනය කරන කල නීරස සෑමද

අරගලයේ ඉදිරිගමනෙහි වැදගත්කම අඩුවෙන් තක්සේරු කිරීමට ආදී වූ දේට තරම්ද වෙන කිසිවකට බිය නොවන බව තේරුම් ගත් පසු ඔහුගේ මඳ සිනහව කොක් හඬ ලා සිනාසීමක් බවට පත්වනු ඇත! විඥාන භාවය සාංසිද්ධික තාවය ඉක්මවා යතැයි බිය වන හා අපට වඩා වෙනස් අදහස් දරන අය අතර පවා බලකර පිළිගැන්වෙන නිර්හිත 'සැලැස්මක්' ඉදිරිපත් කිරීමට බිය වන 'පෙරටු බල ඇණියක්'! මොවුන් පෙරටු බල ඇණිය' 'පසුබල ඇණිය' සමග පට ලවා ගන්නවා නොවේ ද?

මර්තිනව් ගේ පහත සඳහන් තර්කය හොඳින් විමසා බලමු. අක්‍රමික තාවයන් හෙළිදරව් කිරීමට "ඉස්ක්‍රා" පත්‍රය අනුගමනය කරන උපක්‍රමවලදී එය එක් පැත්තකට බර වන්නේයයිද, 'අප ආණ්ඩුවට එරෙහිව කොතරම් අවිශ්වාසය හා වෛරය පතුරුවා හැරියත්, එය පෙරළා දැමීම් සඳහා සෑහෙන තරම් සමාජ-ශක්තියක් උපදවා ගැනීමෙහි අප සමත් වන තෙක්, අපට අපගේ අරමුණ සාර්ථක කර ගතහැකි නොවන්නේය' යි මර්තිනව් 40 වැනි පිටුවේ කියා ඇත. මෙය නම්, පොදු ජන ක්‍රියාකාරිත්වය ඇති කිරීම පිණිස දක්වන සුපුරුදු බලවත් උවමනාව බවත්, ඒ සමගම ස්වකීය ක්‍රියාකාරිත්වය සීමාකර ගැනීමට යත්න දැරීම බවත් අපි මෙහිදී මැදිහත්වී කියනු කැමැත්තෙමු. එහෙත් දැනට ප්‍රධාන වන කාරණය එය නොවේ. එනිසා මෙහිදී ('පෙරළා දැමීම සඳහා') විප්ලවවාදී ශක්තිය ගැන මර්තිනව් කථා කරයි. ඉන් ඔහු බැස ගන්නා නිගමනය කුමක්ද? සාමාන්‍ය කාල වලදී, සමාජ ස්ථරයන්, අවශ්‍යයෙන්ම, වෙන් වෙන්ව ගමන් කරන හෙයින්, 'විවිධ සමාජ ස්ථරයන්ගේ කටයුතු එක්වරම මෙහෙයවීම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වන අපට කළ නොහැකි බව පැහැදිලිය; ඔවුන් සඳහා නියත වැඩ පිළිවෙළක් නියම කිරීම අපට කළ නොහැකිය; ඔවුන්ගේ දිනපතා අරගල කළ යුත්තේ කෙසේද යන්න නියම කිරීම අපට කළ නොහැකිය... ලිබරල් ස්ථරයන්ගේ හදිසි උවමනාවන් සඳහා වූ අරගලය් එනම්, ඔවුන් අපගේ දේශපාලන රාජ්‍ය පාලනය සමග මුහුණට මුහුණ ලා සිටින තත්වයට ගෙන එන අරගලය ගැන ඔවුන්ම බලාගන්නවා ඇත' (පිටු 41). මේ ලෙසට, විප්ලවවාදී ශක්තිය ගැනත්, සර්වබලධාරී ඒකාධිපතිත්වය පෙරළා දැමීමට ක්‍රියාශීලී ලෙස අරගල කිරීම ගැනත් කථා කරමින් පටන් ගත් මර්තිනව් වහාම වෘත්තීය සමිති ශක්තිය හා හදිසි උවමනාවන් සඳහා වූ ක්‍රියාශීලී අරගලය වෙතට හැරෙයි! ශිෂ්‍යයන්, ලිබරල්වාදීන්, ආදීන්ගේ 'හදිසි උවමනාවන්' සඳහා වූ ඔවුන්ගේ අරගලය අපට මෙහෙයවිය නොහැකි බව කීම අවශ්‍ය නොවේ. එහෙත්, වැදගත් ආර්ථිකවාදියාණනි, සාකච්ඡාවට බඳුන් වූ කරුණ එය නොවේ! අප සාකච්ඡා කරමින් සිටියේ සර්වබලධාරී ඒකාධිපතිත්වය පෙරළා දැමීමේ කටයුත්තට විවිධ සමාජ ස්ථරයන්ගෙන් ලබා ගත හැකි හා අවශ්‍ය වන සහභාගිත්වය ගැනය. තවද, 'විවිධ විරුද්ධ පාර්ශවීය ස්ථරයන්ගේ' මෙම කටයුතු අපට මෙහෙය විය හැකිවා පමණක් නොව, අප 'පෙරමුණු බල ඇණිය' වීමට කැමැත්තේ නම්, එය මෙහෙයවීම කිරීම අපගේ අත්හළ නොහැකි යුතු කමද වේ. අපගේ ශිෂ්‍යයන් හා ලිබරල්වාදීන් ආදී වූ කොටස් 'අපගේ දේශපාලන රාජ්‍ය පාලනය හා සමග මුහුණට මුහුණ ලා සිටින තත්වයට' ගෙන එන අරගලය ගැන බලාගන්නේ ඔවුන් පමණක් නොවේ; ප්‍රථමයෙන්ම හා අන් හැමටම පෙර, සර්වබලධාරී ඒකාධිපති ආණ්ඩුවේ පොලිසිය හා නිලධාරීන් ඒ ගැන බලාගන්නවා ඇත. එහෙත් 'අපි' ප්‍රථම පෙළේ ප්‍රජාතන්ත්‍රවාදීන් වීමට කැමැත්තෙමු නම්, විශ්වවිද්‍යාලයේ, නැතහොත් සෙම්ස්ත්වෝ දිස්ත්‍රික් සභාවේ පවතින තත්වයන් ගැන පමණක් අප්‍රසන්නව සිටින අයගේ කල්පනාවන්, සමස්ත දේශපාලන ක්‍රමයම වැඩකට නැතැයි යන අදහස වෙතට යොමු කිරීම අපගේ කාර්ය වශයෙන් භාරගත යුතු වේ. අප පක්ෂයේ නායකත්වය යටතේ සකලාංග සම්පූර්ණ දේශපාලන අරගලයක් සංවිධානය කිරීමේ කර්තව්‍යය අප භාර ගත යුතු වේ. එම අරගලය සංවිධානය කළ යුත්තේ, එම අරගලයටත්, අප පක්ෂයටත්, සියළුම විරුද්ධ පාර්ශවීය බලවේගයන්ගේ ආධාරය දීම ඒවාට කළ හැකිවන ආකාරයටය. මෙම සර්වපාර්ශවීය අරගලයේදී මතුවන සියළු තත්වයන් මෙහෙයවා ගැනීමෙහි සමත්වන හා කුපිත වූ ශිෂ්‍යයන්, අප්‍රසන්නවූ සෙම්ස්ත්වෝ ජනයා, ප්‍රකෝපවූ ආගමික නිකායයන්, අමනාපයට පත් ප්‍රාථමික පාඨශාලා ගුරුවරුන්, ආදීන් වෙනුවෙන්, නියම වේලාවට, 'නියත සටන් වැඩ පිළිවෙළක් නියම කිරීමෙහි' සමත්වන දේශපාලන නායකයන් බවට පත්වන සේ අපි අපගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රායෝගික කාරක වරුන් පුහුණු කළ යුත්තෙමු. ඒ නිසා 'මේ අය සම්බන්ධයෙන් අපට ක්‍රියා කළ හැක්කේ අක්‍රමික තාවයන් හෙළදරව් කරන්නන් වශයෙන් හුදෙක් නිශ්ක්‍රිය වූ කාර්ය කොටස ඉටුකිරීමෙනි..' අපට කළ හැක්කේ ආණ්ඩුවේ විවිධ කොමිසම් කෙරෙහි වූ ඔවුන්ගේ විශ්වාසය ක්ෂය කර හැරීම 'පමණකි' යනුවෙන් මර්තිනව් කරන ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍යය. (අවධාරණය අපගේය)'. මර්තිනවගේ මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ, විප්ලවවාදී 'පෙරටු බල ඇණිය' ඇත්ත වශයෙන් ඉටු කළ යුතු කාර්ය කොටස වටහා ගැනීමට ඔහු අත්‍යන්තයෙන්ම සමත් වී ඇති බවයි. පාඨකයා මෙය සිත්හි දරා ගන්නේ නම්, මර්තිනව් අවසාන වශයෙන් කියා තිබෙන

කරුණුවල නියම අර්ථය ඔහුට පැහැදිලි වනු ඇත. 'ජනගහනයේ විවිධ තම ස්ථරයන්ගේ උවමනාවන් කෙරෙහි බලපානතාක් දුරට අප රටේ තත්වය, විශේෂයෙන්ම, දේශපාලන තත්වය හෙළිදරව් කරන ''ඉස්ක්‍රා'' පත්‍රය විප්ලවවාදී විරුද්ධ පාර්ශවයේ පත්‍රයයි. කෙසේ හෝ වේවා, අපි කම්කරු පංතියේ යහපත පිණිස නිර්ධන පංති අරගලය හා සමග සමීප ඓන්ද්‍රිය සම්බන්ධය ඇතිව වැඩ කටයුතු කරමු; තවදුරටත් එසේ කරගෙන යන්නෙමු. අපගේ ක්‍රියාත්මක බලපෑමේ ක්ෂේත්‍රය සීමා කිරීමෙන් අපි ඒ බල පෑම වඩාත් අරුත්සරු කරන්නෙමු.' (63). මෙම අවුල් සහිත කියමනෙහි නියම අර්ථය මෙසේය: කම්කරු පංතියේ වෘත්තීය සමිතිවාදී දේශපාලනය (අපගේ ප්‍රායෝගික කාරකවරුන්ගේ වැරදි අවබෝධය, නුපුහුණුකම, නැතහොත් නොලත් වැටහීම නිසා නිතර පාහේ ඔවුන්ගේ කටයුතු ඊට සීමා කරති) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ මට්ටමට ඉහළට නැංවීමට ''ඉස්ක්‍රා'' පත්‍රය කැමතිය. එසේ නමුත්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය, වෘත්තීය සමිතිවාදී දේශපාලනයේ තත්වයට පිරිහෙළීමට ''රබෝචිය දියල'' පත්‍රය කැමතිය. එපමණක් නොව, මෙම ස්ථාවරයන් දෙකම 'පොදු ව්‍යාපාරය තුළදී සම්පූර්ණයෙන්ම එකිනෙකට ගැලපෙන' බවට එය ලෝකයාට සහතික වෙයි (63). O, sancta simplicitas!*

එපමණක් ද නොවේ. සියළුම සමාජ පංති අතර ප්‍රචාරය හා උද්ඝෝෂණය මෙහෙයවීමට තරම් වන බලවේග අප වෙත තිබේද? සත්තකින්ම තිබේ. නිතර මෙය ප්‍රතික්ෂේප කිරීමට කැමැත්තක් දක්වන අපගේ ආර්ථික වාදීහු, 1894 (පමණ) පටන් 1901 දක්වා අපගේ ව්‍යාපාරය ලබා ඇති දැවැන්ත ප්‍රගතිය නොදකිති. සැබෑ 'අන්තිමයන්' මෙන් ඔවුහු ව්‍යාපාරයේ අතීතය තුළ ජීවත් වෙති. මුල් කාලයේදී අපට තිබුණ බලවේග සංඛ්‍යාව ඇත්ත වශයෙන්ම විශ්මය ජනක තරම් අඩු ගණනක් විය. එනිසා, එම කාලයේ දී අපි තනිකරම පාහේ කම්කරුවන් අතර වැඩ කිරීමට කැප වුනිමු නම්, එම මාර්ගයෙන් පිට පැනීමක් සිදු වූ කලෙක එය තදින් හෙළා දුටුවෙමු නම්, එය එවකට සම්පූර්ණයෙන්ම ස්වාභාවික හා සාධාරණ දෙයක් විය. එවකට සම්පූර්ණ කර්තව්‍ය වී තිබුණේ කම්කරු පංතිය තුළ අපගේ තත්වය කහවුරු කරීමයි. එහෙත් වර්තමානයේ ඇත්තේ දැවැන්ත බලවේගයන් ව්‍යාපාරය වෙත ආකර්ෂණය වූ තත්වයකි. උගත් පංතිවල තරුණ පරම්පරාවේ ඉතාමත් හොඳ නියෝජිතයන් අප ව්‍යාපාරය වෙත එමින් සිටිති. (1894 දී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ගණන කෙනෙකුගේ ඇඟිලි ගණනින් ගණන් ගත හැකි වූ නමුත්) පසු කාලයේ ව්‍යාපාරයේ වැඩ කොටස් ඉටු කර ඇති, නැතහොත්, දැන් එසේ කිරීමට කැමති අය හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය වෙත ඇදී එන අය, විවිධ පළාත්වල සෑම තන්හිම, ඒ ඒ තැන්හි පවත්නා තත්වය අනුව පදිංචිව සිටිති. මේ සියළු බලවේගයන් උපයෝගි කරගනිමින් ඒවාට නිසි කාර්යයන් භාර දීමෙහි අපොහොසත්වීම අපගේ ව්‍යාපාරයේ මූලික සංවිධානමය දුර්වල කමකි. (මීළඟ පරිච්ඡේදයෙන් මේ ගැන වඩාත් සම්පූර්ණ ලෙස කරුණු දක්වමු). මෙම බලවේගයන් අතුරෙන් බහුතරයට 'කම්කරුවන් අතරට යාමට' අවස්ථා දුර්ලභ නිසා බලවේග අපගේ ප්‍රධාන කර්තව්‍යයෙන් වෙනත් අතකට හැරීයාමේ බියක් ඇති කරගැනීමට හේතුවක් අපට නැත. සැබෑ, අංග සම්පූර්ණ සහ ජීවමාන දේශපාලන දැනුමින් කම්කරුවන් සන්නද්ධ කිරීම පිණිස, ඔවුනට අපගේ රාජ්‍යයේ ඇතුළත ක්‍රියාකාරිත්වය ගැන දැනුමක් ලබා ගත හැකි වන සේ, 'අජේම ජනයා', සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්, සෑම තැනකම, සමාජයේ සියළු ස්ථරයන් අතරම හා සියළු තත්වයන්හිම සිටිනු දැකීමට අප වග බලා ගත යුතුය. එවැනි අය, ප්‍රචාරය හා උද්ඝෝෂණය සඳහා පමණක් නොව, ඊටත් වඩා, සංවිධාන කටයුතු සඳහා විශාල වශයෙන් අවශ්‍යව ඇත.

ජනගහනයේ සියළුම පංති අතර ක්‍රියාකාරී වීමට පදනමක් තිබේද? මේ ගැන සැක සිතන කිසියම් හෝ කෙනෙක් වෙත්නම්, ඔහු පොදු ජනතාවගේ සාංසිද්ධික පිබිදීම පසුපස ඇදී යන විඥානයක් ඇති තැනැත්තෙකි. කම්කරු පංති ව්‍යාපාරය විසින් සමහර අය අතර අප්‍රසාදයත්, තවත් අය අතර විරුද්ධ පාර්ශවයට සහයෝගය දිනා ගැනීමේ බලාපොරොත්තුවත්, තවත් වෙන අය අතර, සර්වබලධාරී ඒකාධිපතිත්වය නොඉවසිය හැක්කේයයිද, එය අනිවාර්ය ලෙසටම බිඳ වැටෙන්නේයයිද යන විශ්වාසයත් පුබුදුවන ලදී; තවදුරටත් පුබුදුවනු ලැබේ. අප්‍රසාදය මතුවන සෑම අවස්ථාවක්ම උපයෝගි කර ගැනීම හා කොතරම් කුඩා වූ හෝ සෑම විරෝධය ප්‍රකාශයක්ම පවා එක්කර ඉන් උපරිම වාසිය ලබා ගැනීම අපගේ කර්තව්‍ය වන බව අපි තේරුම් නොගන්නෙමු නම්, අප 'දේශපාලනඥයන්' හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වන්නේ වචනයෙන් පමණකි (සත්‍යලෙසම නිතර නිතර සිදුවන පරිදි). එපමණක් නොව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු වීමේ සුදුසු කම් ලත් තැනැත්තෙකුගේ කථාවට කන් දීමට නිතරම සූදනම් දශලක්ෂ සංඛ්‍යාත වැඩකරන ගොවිහු හස්ත කාර්මිකයෝ හා සුළු කාර්මිකයෝ සිටිති. අයිතිවාසිකම් නොමැති කමින් හා දූෂ්‍ය පාලනයෙන් අප්‍රසන්නව සිටින හා එනිසා, ඉතාමත් හදිසි

---

* අහෝ සරලත්වයේ සාන්තුවරයාණෙනි! සංස්කාරක

ප්‍රජාතන්ත්‍රවාදී අවශ්‍යතාවයන් වෙනුවෙන් ඉදිරිපත් වන කථිකයා ලෙසට කටයුතු කරන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාගේ ප්‍රචාරය මගින් ළඟාවිය නොහැකි පුද්ගලයන්, කණ්ඩායම් හා කව නොමැති එකම සමාජ පංතියක්වත් ඇත්තෙන්ම තිබේද? ජනගහනයේ සියළුම පංති හා ස්ථරයන් අතර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් ගෙන යායුතු උද්ඝෝෂණය කෙබඳුද යන්න ගැන පැහැදිලි අදහසක් ලබා ගැනීම අපේක්ෂා කරන අය මෙම උද්ඝෝෂණයේ ප්‍රධාන විධිය (එහෙත් එකම විධිය නොවේ) වශයෙන් දේශපාලන හෙළිදරව් කිරීම් එහි පුළුල් අර්ථයෙන් ගැනීම සුදුසු බව පෙන්වා දෙනු කැමැත්තෙමු.

“යම්තමින් හෝ දේශපාලන විඥනයක් ඇති සියළුම ජන කොටස් අතර දේශපාලන හෙළිදරව් කිරීම් ගෙනයාම සඳහා අනුරාගයක් ඉස්මතු කළ යුතු වෙමු” යි මම මගේ “පටන්ගත යුත්තේ කොතැනින්ද?” යන ලිපියෙහි ලිවෙමි (“ඉස්ක්‍රා” අංක 4, මැයි 1901). ඒ ගැන පසුව විස්තර සහිතව සඳහන් කරමි. “දේශපාලන හෙළිදරව් කිරීමේ හඬ අද මෙතරම් දුර්වල, බිය සුළු හා දුරාචාර වීම ගැන අපි අධෛර්යයට පත් නොවිය යුතු වෙමු. මෙය මුළුමනින්ම සිදුවී ඇත්තේ පොලිස් මර්දනයට යටත් වීම නිසාම නොවේ. හෙළිදරව් කිරීම් සඳහා හැකියාව සහ සූදනම ඇති අයට කථා කිරීමට මාධ්‍යයක්වත්, උනන්දුවක් හා ධෛර්ය ගන්වන සුළු ප්‍රේක්ෂකයන් පිරිසක්වත් නොමැති හෙයිනි; ‘සර්වබලධාරී’ රුසියානු ආණ්ඩුවට විරුද්ධව ස්වකීය පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් අර්ථ සිද්ධියක් අපේක්ෂා කළ හැකි ඒ බලවේගය ජනතාව අතර කොහේවත් ඔවුනට දකින්නට නොලැබුණ නිසාය... සාර් ආණ්ඩුව ජාති-ව්‍යාප්ත වශයෙන් හෙළිදරව් කිරීම සඳහා මාධ්‍යයක් සැපයීමට අපට දැන් තත්වයක් ඇත. මෙය ඉටු කිරීම අපගේ යුතුකමය. එම මාධ්‍යය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවෘත්ති පත්‍රයක් විය යුතුය.”*

දේශපාලන හෙළිදරව් කිරීම් සඳහා ඉතාමත් සුදුසු ප්‍රේක්ෂක සමූහයා නම් කම්කරු පංතිය යි. සකලාංග සම්පූර්ණ හා ජීවමාන දේශපාලන දැනුම ප්‍රථමව හා අන් සියල්ලන්ටම පෙර අවශ්‍ය වී සිටින ‘ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල’ බලාපොරොත්තුවිය නොහැකිව තිබිය දී පවා එම දැනුම ක්‍රියාශීලී අරගලය බවට පරිවර්තනය කර ගැනීමෙහි සමර්ථතම පංතිය එයයි. ජාති-ව්‍යාප්ත හෙළිදරව් කිරීම් සඳහා මාධ්‍ය විය හැක්කේ සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක් පමණකි. ‘දේශපාලන පත්‍රයක් නොමැතිව, අද යුරෝපයේ දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් හැඳින්විය හැකි ව්‍යාපාරයක් ගැන සිතිය නොහැකිය’ මේ හා සම්බන්ධයෙන් ගත් කල රුසියාවත් නිසැක ලෙසම අද යුරෝපයට ඇතුළත් කළ යුතුයි. පුවත්පත් අප රටේ බලවතෙක් බවට පත්වී බොහෝ කල්ය. නොඑසේ නම්, ඊට අල්ලස් දීමටත්, කත්කොව්ලාට හා මෙෂ්චර්ස්කිලාට ආධාර කිරීමටත් ආණ්ඩුව රූබල් දශ දහස් ගණන් වියදම් නොකරනු ඇත. පුවත් පාලනයේ පවුරු බිඳගෙන ආ රහසිගත පුවත්පත් විසින්, ඒවා ගැන විවෘත සේ කථා කරන ලෙසට නීත්‍යානුකූල හා ගතානුගතික පුවත්පත්වලට බලකරනු ලැබීම සර්වබලධාරී ඒකාධිපති රුසියාවට අළුත් දෙයක් නොවේ. එක්දහස් අටසිය හැත්තෑ ගණන්වල හා පණස් ගණන්වල පවා සිදුවූයේ එයයි. නීති විරෝධී රහසිගත පත්‍ර කියවීමටත් කම්කරුවෙක් “ඉස්ක්‍රා” අංක 7 පත්‍රයට ලියූ ලිපියක සඳහන් පාඨයක් යොදනොත්, ජීවත්වන්නේ කෙසේද සහ මැරෙන්නේ කෙසේද යනු එයින් උගෙන ගන්නටත් කැමති ජන කොටස් එකලට වඩා දැන් කොපමණ පුළුල් ද? කොපමණ ගැඹුරුද? ආර්ථික හෙළිදරව් කිරීම් ස්වාමි වරුන්ට විරුද්ධ යුද්ධ ප්‍රකාශයක් වන්නේ යම් සේද, දේශපාලන හෙළිදරව් කිරීම් ද එලෙසටම ආණ්ඩුවට විරුද්ධව යුද්ධ ප්‍රකාශයක් වන්නේය. හෙළිදරව් කිරීමේ ව්‍යාපාරය වඩාත් පුළුල් හා බලවත් වූ තරමටත්, යුද්ධාරම්භ කිරීම පිණිස යුද්ධ ප්‍රකාශ කළ සමාජ පංතිය පිරිසෙන් විශාල වූ තරමටත්, අධිෂ්ඨාන සහගත වූ තරමටත් එම යුද්ධ ප්‍රකාශයෙහි සදාචාර වැදගත් කමද තව තවත් වැඩි වේ. ඒ අනුව බලන කල, දේශපාලන හෙළිදරව් කිරීම් තනිව ගත් කළ, අප විරුද්ධවන ක්‍රමය කඩා ඉහිරවීමටත්, එහි අනියම් හා තාවකාලික මිතුරන් එයින් වෙනතකට හැරවීමටත්, ප්‍රයෝජනවත්වන ප්‍රබල අවියක් වශයෙන්ද සර්වබලධාරී ඒකාධිපතිත්වයේ ස්ථිර කොටස් කරුවන් අතර වෛරය හා අවිශ්වාසය පතුරුවා ලීමට මාධ්‍යයක් වශයෙන්ද එය ප්‍රයෝජනවත් වේ.

අපගේ කාලයේදී, විප්ලවවාදී බලවේගයන්ගේ පෙරටු බල ඇණිය විය හැක්කේ නියත වශයෙන්ම ජාති-ව්‍යාප්ත හෙළිදරව් කිරීම් කරන්නා වූ පක්ෂයකට පමණකි. කොටින් කියතොත් ‘ජාති-ව්‍යාප්ත’ යන්නෙහි ඉතා ගැඹුරු අර්ථයක් ඇත. (පෙරටු බල ඇණිය වීමට නම් අනෙකුත් පංති අප වෙත ආකර්ෂණය කරගත යුතු බව මතක තබා ගත යුතුය). කම්කරු පංති නොවන හෙළිදරව් කාරීන් අති බහුතරය බුද්ධිමත් දේශපාලනඥයන් හා තැන්පත් ඥුවනින් යුත් කාර්යවත් පුද්ගලයන් වෙති. ‘සර්වබලධාරී’ රුසියානු ආණ්ඩුවට විරුද්ධව තබා, සුළු නිලධාරියෙකුට පවා විරුද්ධව ‘පැමිණිලි කිරීම’ කොතරම්

---

* වි. අයි. ලෙනින් “පටන්ගත යුත්තේ කොතැනින්ද?” බලන්න. සංස්කාරක

අන්තරාදයකද යනු ඔවුන් දනිති. එසේ වූ කල ඔවුන් ස්වකීය පැමිණිලි රැගෙන අප වෙත එන්නේ, එම පැමිණිලි වලින් නියත වශයෙන්ම සෙතක් ලැබෙන බව පෙනෙන විට හා අප දේශපාලන බලවේගයක් නියෝජනය කරන විට පමණකි. පිටස්තර අයගේ බැල්මට හසුවන එවැනි බලවේගයක් බවට පත් වීමට නම්, අපගේම විඥනය, ක්‍රියාරම්භකතාවය හා ධෛර්‍ය උසස් තත්වයට ගෙන ඒම පිණිස අත් නොහැර හා ඉතා දැඩි ලෙස කළයුතු වැඩ බොහෝය. මෙය සාර්ථක කර හැනීම ‘පෙරටු බල ඇණිය’ යන ලේබලයක් ගෙන එය පසු බල ඇණි න්‍යායක් හා ව්‍යවහාරයක් මත ඇලවීම ප්‍රමාණවත් නොවේ.

එහෙත් නියත ලෙස හා ජාති-ව්‍යාප්ත වශයෙන් ආණ්ඩුව හෙළිදරව් කිරීමේ කටයුත්ත අප භාර ගත යුතු නම්, එවිට අපගේ පංති ස්වභාවය ප්‍රකාශ වන්නේ කුමන ආකාරයෙන්ද? යන ප්‍රශ්නය අති උද්‍යෝගී, ‘නිර්ධන පංතිය හා සමග සමීප එන්ද්‍රිය සම්බන්ධකම්’ පැවැත්වීමේ පක්ෂවාදියා අසනු ඇත. ඇත්ත වශයෙන්ම ඔහු එම ප්‍රශ්නය නගයි. ඊට පිළිතුරු කීපයකි. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වන අපි ජාති-ව්‍යාප්ත හෙළිදරව් කිරීම් සංවිධානය කරන්නෙමු; උද්ඝෝෂණය විසින් මතුකෙරෙන සියළු ප්‍රශ්න නොවෙනස් ලෙසටම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අර්ථයෙන් හා දැන හෝ නොදැන මාක්ස්වාදය විකෘති කිරීමට ඉඩක් නොදී, පැහැදිලි කරනු ලැබේ; සකලාංග සම්පූර්ණ දේශපාලන උද්ඝෝෂණය කරනු ලබන්නේ, සමස්ත ජනතාව වෙනුවෙන් ආණ්ඩුවට විරුද්ධව එල්ල කරන ප්‍රහාරයන්, නිර්ධන පංතිය විප්ලවවාදී ලෙස පුහුණු කිරීමත්, එහි දේශපාලන ස්වාධීනත්වය ආරක්ෂා කිරීමත්, සූරා කන්නවුන් සමග ඇතිවන සියළු සාංසිද්ධික ඝට්ටන කම්කරු පංතියේ ආර්ථික අරගලය පිණිස හා නිර්ධන පංතිකයන් වැඩි වැඩියෙන් අප කඳවුරට අද්දගනු පිණිස උපයෝගිකර ගැනීමත්, යන කටයුතු ඒකීය හා අභේද්‍ය සමස්තයකට එක්සත් කරන පක්ෂයක් විසිනි!

නිර්ධන පංතියේ ඉතාමත් වැදගත් අවශ්‍යතාවය (දේශපාලන උද්ඝෝෂණය හා හෙළිදරව් කිරීම් මගින් අංගසම්පූර්ණ දේශපාලන අධ්‍යාපනයක්) හා පොදු ප්‍රජාතන්ත්‍ර ව්‍යාපාරයේ අවශ්‍යතාවය අතර ඇති මෙම සම්බන්ධය හා ඊටත් වඩා සමගාමීත්වය වටහා ගැනීමට අසමත්වීම ‘ආර්ථිකවාදයේ’ ඉතාමත් ස්වභාව නිරූපී අංග ලක්ෂණයයි. අවබෝධය පිළිබඳ මෙම අඩු පාඩුව පෙනෙන්නේ මර්තිනව්වාදී’ වාක්‍ය ඛණ්ඩයන්ගෙන් පමණක් නොවේ. එම වාක්‍ය ඛණ්ඩ හා සමග එක සමාන අරුතක් ඇති පංති දෘෂ්ටි කෝනයන් ගැන කියමින් සඳහන් කරන කරුණුවලින්ද එය පෙනේ. ඒ අනුව ‘‘ඉස්ක්‍රා’’ අංක 12 හි ‘ආර්ථිකවාදී’ ලිපියේ කතෘවරු මෙසේ ලියති*: ‘‘විවිධ සමාජ පංති හා ප්‍රවණතාවයන් කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳ ප්‍රශ්නයේදී ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය දක්වන අස්ථිරත්වයටද හේතුවී ඇත්තේ එහි ඇති මෙම මූලික දුර්වලතාවය යි (දෘෂ්ටීය පිළිබඳ අධි තක්සේරුවයි). ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය අත්තනෝමතවාදයට විරුද්ධව අරගලය කරා පරිවර්තනය වීමේ ප්‍රශ්නය විසඳුවේ න්‍යායික තර්ක ඉදිරිපත් කිරීම මගිනි...’’ (‘පක්ෂය හා සමග වැඩෙන පක්ෂ කර්තව්‍යයන් වර්ධනය...’ වීමෙන් නොවේ). ‘‘වර්තමානයේ පවත්නා තත්වයන් යටතේ එවැනි කර්තව්‍යයක් ඉටු කිරීම කම්කරුවන්ට දුෂ්කර වන බව සමහරවිට එයට හැඟෙන්නේ යයි සිතීමට සියළු හේතු ඇත’’... (කිසි කලෙකත් අමතක නොකළයුතු මර්තිනව්ගේ භාෂාවෙන් කියතොත්, ‘ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තු විය’ නොහැකි ඉල්ලීම් සඳහා පවා සටන් කිරීමට කම්කරුවන් සූදනම් හෙයින්, කම්කරුවන් කෙරේ ආයම්මාගේ සැලකිල්ලක් දක්වන ‘ආර්ථිකවාදී’ බුද්ධිමතුන්ට තරම් කම්කරුවන්ට මෙම කර්තව්‍ය දුෂ්කර නොවන බවට හැඟීමක් පමණක් නොව හොඳ අවබෝධයක් ද ඇත)... ‘‘එහෙත් කම්කරුවන් මෙම අරගලය සඳහා අවශ්‍ය බලවේග රැස් කරගන්නා තෙක් සිටීමට තරම් ඉවසීමක් නොමැති නිසා ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය ලිබරල්වාදීන් හා බුද්ධිමතුන් අතරින් මිත්‍රයන් සොයන්නට පටන් ගනී...’’

එසේය, එසේය. ‘ආර්ථිකවාදීන්’, ඔවුන්ගේම නොදියුණුකම සම්බන්ධයෙන් කම්කරුවන්ට චෝදනා කිරීමත්, ඔවුන්ගේම ධෛර්‍ය හීනභාවය සාධාරණ බව පෙන්වීමට කම්කරුවන්ට ශක්තිය නොමැතියයි චෝදනා කිරීමත් නවත්වන කාලය විවිධ ‘සමාදන කාරීන්’ අපට පොරොන්දුවූ පරිදි එතැයි ‘බලා සිට’ ඇත්තෙන්ම අපගේ ‘ඉවසීම’ කෙළවරවී ඇත. අපි ‘ආර්ථිකවාදීන්’ගෙන් මෙසේ අසමු: ‘අරගලය සඳහා අවශ්‍ය කම්කරු පංති ශක්තිය රැස් කරගැනීම’ යනුවෙන් ඔවුන් අදහස් කරන්නේ කුමක්ද? මෙයින් අදහස් වන්නේ අපගේ අධම

---

* ‘ආර්ථිකවාදීන්’ගේ ස්වභාවය ඉතා හොඳින් නිරූපනය කෙරෙන මෙම ලිපියට ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය මගින් සවිස්තර පිළිතුරක් දීමෙන් අප වැලකුනේ ඉඩ මඳකම නිසාය. එම ලිපිය පළවීම ගැන අපි සතුටු වුනෙමු. ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය ස්ථිර පංති දෘෂ්ටි කෝනයක් මත නොපිහිටන්නේය යන චෝදනාව ඊට බොහෝ කලකට පෙර අපට අසන්නට ලැබුණි. එම නිසා ඊට පිළිතුරු දීමට සුදුසු අවස්ථාව, නැතහොත්, මෙම හැඩකාර චෝදනාව විධිමත් ලෙස ප්‍රකාශවන තෙක් බලාපොරොත්තුවෙන් සිටිමු. එපමණක් නොව, ප්‍රහාරයන්ට පිළිතුරු දීමට අප පුරුදුවී සිටින්නේ ප්‍රතිප්‍රහාරයෙන්ය.

සර්වබලධාරී ඒකාධිපතිත්වයේ සෑම පැත්තක් ගැනම කම්කරුවන්ට පැහැදිලිවනසේ ඔවුනට දේශපාලන පුහුණුවක් දීම බව නොපෙනේද? හරියටම මෙම කටයුත්තම ඉටුකරනු පිණිස, සෙම්ස්ත්වො දිස්ත්‍රික් සභාවලට,[75] ගුරුවරුන්ට, සංඛ්‍යා විද්‍යාඥයින්ට, ශිෂ්‍යයන්ට ආදීන්ට ගසන දේශපාලන පහර හෙළිදරව් කිරීම පිණිස, අප හා සමග එකතුවීමට සූදනම් ‘ලිබරල්වාදීන් හා බුද්ධිමතුන් අතරින් මිත්‍රයන්’ අපට අවශ්‍ය වන බව පැහැදිලි නොවේද? මෙම මවිතකාරී තරම් ‘පැටලිලි සහිත ක්‍රියාමාර්ගය’ තේරුම් ගැනීම ඇත්ත වශයෙන්ම ඔතරම්ම දුෂ්කරද? නිර්ධන පංති නොවන පංති අතරෙන් පාක්ෂිකයන් හා ඍජු සහ අනියම් මිතුරන් දිනාගැනීම සම්බන්ධයෙන් රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට මුහුණ පාන්නට සිදුවී ඇති කර්තව්‍ය විසඳෙනු ඇත්තේ ප්‍රධාන වශයෙන් හා මූලික වශයෙන් නිර්ධන පංතිය අතරම ගෙනයනු ලබන්නා වූ ප්‍රචාරක කටයුතුවල ස්වභාවයෙන් යයි පී. බී. අක්සල්රොඩ් 1897 න් පසු නිරතුරුවම යළි යළිත් කියා නැද්ද? එහෙත්, කම්කරුවන් ප්‍රථමයෙන් ‘ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව අරගලය මගින්’ (වෘත්තීය සමිතිවාදී දේශපාලනය සඳහා) ශක්තිය රැස්කර ගතයුතුයයිද, ඊළඟට — වෘත්තීය සමිති කටයුතු පුහුණුවීමෙන් පසු යන්න අදහස් කෙරේයයි සිතමු — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කටයුතුවලට ‘මාරු විය’ යුතුයයිද මර්තිනව්ලා හා වෙනත් ‘ආර්ථිකවාදීන්’ තවමත් කල්පනා කරති!

‘‘‘මිතුරන්’ගේ අප්‍රසාදයට හේතු සහ එහි මට්ටම බෙහෙවින් අසමාන වුවද, ‘‘ඉස්ක්‍රා’’ පත්‍රයේ මෙම ගවේෂනයේදී, එය ආණ්ඩුව කෙරෙහි වූ අප්‍රසාදයේ පොදු ස්වභාවය ඉදිරියට දමන්නේ නිතරම පාහේ පංති දෘෂ්ඨී කෝණයෙන් ඉවත යමින් හා පංති විරෝධතා අඳුරට තල්ලු කරමිනි. නිදර්ශනයක් වශයෙන්, ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය සෙම්ස්ත්වො සභා කෙරෙහි දක්වන ආකල්පය එබඳුය’’ යි ‘ආර්ථිකවාදීන්’ තවදුරටත් කියති. ‘ආණ්ඩුවෙන් දෙන ස්වල්ප වාසි ගැන අප්‍රසාදයට පත්ව සිටින වත්සක්කාරයිනට කම්කරු පංතියේ ආධාරය පොරොන්දු වන ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය, මෙම සමාජ ස්ථරයන් අතර තිබෙන පංති විරෝධතාවය ගැන වචනයක් හෝ කියන්නේ නැතැ’ යි චෝදනා කරනු ලැබේ. ලිපියේ කතෘවරු සඳහන් කරන්නේ ‘‘සර්වබලධාරී ඒකාධිපතිත්වය හා සෙම්ස්ත්වො සභා’’ යන (‘‘ඉස්ක්‍රා’’ අංක 2 හා 4) ලිපිය ගැන යයි බොහෝ දුරට සිතිය හැක. පාඨකයා ඒවා* පෙරළා බලන්නේ නම්, එහි ලියා ඇත්තේ ‘සමාජ වත්ස පදනමක් මත පිහිටුවා තිබෙන නිලධාරිවාදී සෙම්ස්ත්වො සභා ගෙනයන මොලොක් උද්ඝෝෂණය’ හා ‘දේපොල හිමි පංතිවල පවා ස්වාධීන ක්‍රියාකාරිත්වය’ කෙරෙහි ආණ්ඩුව දක්වන්නාවූ ආකල්පය ගැන බව ඔහුට පෙනෙනු ඇත. ආණ්ඩුව සෙම්ස්ත්වො සභාවලට විරුද්ධව අරගලයක් ගෙනයන විට කම්කරුවන්ට ඒ ගැන නොතකා සිටිය නොහැකි බවත්, විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය එහි මුළු ශක්තිය යොදා ආණ්ඩුවට මුහුණ දී ගැටෙන විට සෙම්ස්ත්වො සභා ඒවායේ මොලොක් කථා නවත්වා ස්ථිර ගතියෙන් හා අධිෂ්ඨාන සහගත ලෙස කථා කළ යුතු බවත් එම ලිපියෙන් කියා ඇත. ලිපියේ කතෘවරුන් එකඟ නොවන්නේ මෙයින් කුමකටද යන්න පැහැදිලි නැත. ‘දේපොල හිමි පංති’ හා ‘සමාජ වත්ස පදනමක් මත පිහිටුවා ඇති නිලධාරිවාදී සෙම්ස්ත්වො සභා’යන වාක්‍ය කොටස් කම්කරුවනට නොතේරෙතැයි ඔවුහු සිතතිද? මොලොක් කථා අත්හැර දමා ස්ථිරව කථා කරන ලෙස උනන්දු කිරීම ‘දෘෂ්ටියේ අධි තක්සේරුවක්’ වශයෙන් ඔවුහු සලකතිද? සර්වබලධාරී ඒකාධිපතිත්වය සෙම්ස්ත්වො සභා කෙරෙහි දක්වන ආකල්පය ගැනත් කම්කරුවන් කිසිවක් නොදැන සිටිත් නම්, ඒකාධිපතිත්වයට විරුද්ධව කරන අරගලය සඳහා කම්කරුවන්ට ‘ශක්තිය රැස් කර’ ගත හැකි වේයයි ඔවුහු කල්පනා කරතිද? මේ සියල්ලද දැනගන්නට නැත. එක කරුණක් පමණක් පැහැදිලිය. එය නම්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ දේශපාලන කර්තව්‍යයන් මොනවාද යන්න ගැන ලිපියේ කතෘවරුන්ට තිබෙන්නේ ඉතාමත් අනුමාන දැනුමක් බවයි. ‘‘‘ඉස්ක්‍රා’’ පත්‍රය ශිෂ්‍ය ව්‍යාපාරය කෙරෙහි දක්වන ආකල්පයද එබඳුමය’ (එනම්, එයින්ද ‘පංති විරෝධය අඳුරට තල්ලු කෙරෙන බවයි’) යන ඔවුන්ගේ කියමනෙන්ද ඒ බව තවත් හොඳින් පැහැදිලි වේ. රැහැන් මුදගත් හිංසනය, කලබල හා බලහත් කාරකම් බෝ කෙරෙන නියම ස්ථානය රුසියානු ආණ්ඩුව මිස විශ්වවිද්‍යාල තරුණ පෙළ නොවේයයි (‘‘ඉස්ක්‍රා’’ අංක 2*) යන්න ප්‍රසිද්ධ පෙළපාළි මගින් ප්‍රකාශ කරන ලෙස කම්කරුවන්ට හඬ නඟා කීම වෙනුවට සමහරවිට අප කළයුතුව තිබුණේ ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයේ අදහස් අනුව තර්ක ඇතුලත් කිරීම විය හැක! සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් එවැනි අදහස් ප්‍රකාශ කරන ලද්දේ 1901 පෙබරවාරි — මාර්තු සිදුවීම්

---

* මෙම ලිපි අතරතුර කාලයේ ගම්බද පෙදෙස්වල පංති විරෝධතා ගැන විශේෂයෙන් ලියන ලද (‘‘ඉස්ක්‍රා’’ අංක 3) එක් ලිපියක් විය. (වී. අයි. ලෙනින්. ‘‘කම්කරු පක්ෂය හා ගොවිජනතාව’’ බලන්න. සංස්කාරක)

* වී. අයි. ලෙනින්. ‘‘ශිෂ්‍යයින් 183 දෙනෙක් යුද හමුදාවට බලෙන් බැඳවීම’’ නැමැති ලිපිය බලන්න. සංස්කාරක

වලින් අනතුරුව, එම වර්ෂයේ ශරත් සමයේ ඇතිවූ නව ශිෂ්‍ය උත්සන්නියට පූර්වාසන්නවය. ව්‍යාපාරයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය, මෙම ක්ෂේත්‍රයෙහිදී පවා, සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව කරන 'සාංසිද්ධික' විරෝධ ප්‍රකාශයට වඩා පිටුපසින් සිටි බව එයින් හෙළිවේ. පොලිසියේ හා කොසාක්වරුන්ගේ පහරදීමට භාජනය වන ශිෂ්‍යයන් ආරක්ෂා කිරීමට කම්කරුවන් දරන සාංසිද්ධික ප්‍රයත්නය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයේ විඥත භාවය ඉක්මවා යන්නකි!

ලිපියේ කතෘවරු තවදුරටත් මෙසේ කියති: ' ' "ඉස්ක්‍රා" පත්‍රයේ තවත් ලිපියකින් සියළු ආකාරයේම බෛරුම් කර ගැනීම් තියුණු ලෙස හෙලාදක්නු ලබන අතර, ගෙඩ්වාදීන්ගේ ඉවසුම් නොදෙන හැසිරීම වැනි කටයුතු එය විසින් ආරක්ෂා කරනු ලැබේ". සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර තිබෙන වර්තමාන අසමථයන් අත්‍යාවශ්‍යයයිද, එනිසා භේදයක් වීම සාධාරණ නොවේයයිද එතරම් සාඩම්බරව හා නිස්සාර ලෙස දෙඩන අය මෙම වචන ගැන කල්පනා කර බැලීම සුදුසු බව ඔවුනට කියමු. විවිධ පංති කෙරෙහි සර්වබලධාරී ඒකාධිපතිත්වයේ ශත්‍රුභාවය ගැන එම පංතිවලට පැහැදිලි කර දීමටත්, විවිධ සමාජ ස්ථරයන් සර්වබලධාරී ඒකාධිපතිත්වය කෙරෙහි දක්වන විරුද්ධත්වය ගැන කම්කරු පංතියට දැන්වීමටත් අප කර තිබෙන කටයුතු ඉතාමත් අප්‍රමාණවත්යයි සංවිධානයක එක් කොටසක් තර්ක කරන අතර, ඒ ගැන පැහැදිලි කිරීම 'බෛරුම් කර ගැනීමක්' වශයෙන් — ඉන් අදහස් කෙරෙන්නේ 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන ආර්ථික අරගලය' පිළිබඳ න්‍යාය සමග බෛරුම් කර ගැනීමක් විය යුතුය — එම සංවිධානයේම තවත් කොටසක් හඳුන්වන විට ඒ අයට එකම සංවිධානයෙහි වැඩ කළ හැකිද?

ගොවිජන විමුක්තියේ හතළිස්වැනි සංවත්සරය නිමිති කරගෙන පංති අරගලය ගම්බද දිස්ත්‍රික්ක තුළට ගෙනයාම උනන්දු කෙළෙමු (කලාපය, අංක 3)[76]. ඒ සමගම, පළාත් පාලන මණ්ඩලත්, සර්වබලධාරී ඒකාධිපතිත්වයත් එකිනෙකට නොගැලපිය හැකි බව විත්තෙගේ රහස් ලියවිල්ල[77] හා සම්බන්ධයෙන් අපි කීවෙමු (අංක 4). නව නීතිය හා සම්බන්ධයෙන් අපි රදළ ස්වාමිවරුන්ට හා ඔවුන්ට සේවය කරන ආණ්ඩුවට පහර දුන්නෙමු (අංක 8)[78]. එමෙන්ම රහසිගත සෙම්ස්ත්වො සම්මේලනය පිළිගත්තෙමු. යටහත් පහත් පෙත්සම් යැවීම නවත්වා (අංක 8) අරගලයට බසින ලෙස සෙම්ස්ත්වො සභා උනන්දු කෙළෙමු. දේශපාලන අරගලයේ අවශ්‍යතාවය වටහා ගැනීමට පටන් ගෙන සිටි ශිෂ්‍යයන් එම අරගලය ආරම්භ කරන ලෙසට උනන්දු කෙළෙමු. ඒ අතරම, වීදි පෙළපාලිවලට සහභාගි වීමෙන් වැලකෙන ලෙස ශිෂ්‍යයන්ට හඬ නගා කී 'පිරිසිදු ශිෂ්‍ය' ව්‍යාපාරයේ අනුගාමිකයින්ගේ 'ප්‍රකෝපකාරි වටහා නොගැන්ම' සම්බන්ධයෙන් අපි ඔවුනට පහර දුනිමු (අංක 3, මොස්කව් ශිෂ්‍යයන්ගේ විධායක කාරක සභාව විසින් පෙබරවාරි 25 දින නිකුත් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙනි). "රසීයා"[79] කණ්ඩායමේ කපටි ලිබරල්වාදීන්ගේ 'තේරුමක් නැති සිහින' හා 'බොරුකාර කුහකත්වය' අපි හෙළිදරව් කෙළෙමු. ඒ අතරම, ආණ්ඩුවේ බන්ධනාගාර නිලධාරියා මොන තරම් නම් චන්ඩ වියරුවකින් 'සාමකාමී ලේඛකයින්, වයස්ගත මහාචාර්යවරු, විද්‍යාඥයන් හා සුප්‍රසිද්ධ සෙම්ස්ත්වො ලිබරල්වාදීන් පීඩනයට ගොදුරු කරන්නේද යනු පෙන්නුම් කෙළෙමු (අංක 5, "පොලිසියේ සාහිත්‍ය වැටලීම"). 'කම්කරුවන්ගේ ශුභසාධනයට පොලිස් ආරක්ෂාව' පිළිබඳ වූ වැඩ පිළිවෙළෙහි නියම අර්ථය අපි හෙළිදරව් කෙළෙමු. 'ප්‍රතිසංස්කරණ සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන තෙක් බලා සිටිනවාට වඩා, ඉහළින් ප්‍රතිසංස්කරණ දීමෙන්, එවැනි ප්‍රතිසංස්කරණ සඳහා ඉල්ලීම් පහළින් ඉදිරිපත් වීම අනවශ්‍ය වන ලෙසට කටයුතු කිරීම හොඳ බව' ට කළ 'අගනා පිළිගැනීම' අපි පිළිගත්තෙමු (අංක 6).* අපි, විරෝධය පෑමෙහි යෙදී සිටි සංඛ්‍යා විද්‍යාඥයන් උනන්දු කෙළෙමු (අංක 7). වැඩ වර්ජන කඩා කප්පල් කරන සංඛ්‍යා විද්‍යාඥයන්ට දෝෂාරෝපනය කෙළෙමු (අංක 9). මෙම උපක්‍රම තුළින්, නිර්ධන පංතියේ පංති විඥනය අඳුරට තල්ලු කිරීමක් හා ලිබරල් වාදීන් සමග බෛරුමකට එළඹීමක් දකින තැනැත්තෝ "Credo" ලියවිල්ලෙහි අඩංගු වැඩ පිළිවෙළෙහි නියම වැදගත්කම තේරුම් ගැනීමෙහි අන්ත අසාමාර්ථය පෙන්නුම් කරන අතරම, ඔහු එය කොතරම් ප්‍රතික්ෂේප කළත් de facto එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේය. මක්නිසාදයත්, එවැනි ප්‍රවේශනයක් තුළින් ඔහු 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය' දෙසට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය අදින හෙයින්ද, ලිබරල්වාදයට යටවන හෙයින්ද, සෑම 'ලිබරල්' ප්‍රශ්නයකටම ක්‍රියාශීලී ලෙස මැදිහත් වෙමින්, ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔහුගේම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ආකල්පයක් ඇතිකර ගැනීමේ කර්තව්‍යය අත්හැර දමන හෙයින්ද වේ.

---

* වි. අයි. ලෙනින් "අගනා පිළිගැනීම" බලන්න. සංස්කාරක

ඊ) නැවතත් ‘අපවාද කාරයෝ’, නැවතත් ‘ව්‍යාකූල කරන්නෝ’

මෙම ආචාර ශීලී කියමන් ‘‘රබෝචිය දියල’’ පත්‍රයට අයත් බව පාඨකයාට මතක ඇති. ‘කම්කරු පංති ව්‍යාපාරය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ උපකරණයක් බවට හැරවීම පිණිස පදනම අනියමින් සකස් කිරීම’ ගැන අප ‘‘රබෝචිය දියල’’ පත්‍රයට නැගූ චෝදනාවලට එය පිළිතුරු දෙන්නේ මේ ආකාරයටය. මෙම චෝදනාව හුදෙක් විවාදත්මක ප්‍රහාරයක්ම වන්නේයයි ‘‘රබෝචිය දියල’’ පත්‍රය අධෛර්‍ය සම්පන්න ලෙස නිගමනය කර ඇත. මෙම අගතිගාමී න්‍යාය ධර්මවාදීන් අප ගැන විවිධාකාර අප්‍රසන්න දේ කීමේ අභිප්‍රාය ඇතිව කටයුතු කරති. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ උපකරණයක් වීමට වඩා අප්‍රසන්න තවත් දෙයක් තිබිය හැකිද? එනිසා ඔවුන් ලොකු අකුරින් ‘නිෂ්ප්‍රභා කිරීමක්’ පළකරති: ‘මේ නම් ඒකාන්ත අපවාදයකි’, ‘ව්‍යාකූල කිරීමකි’, ‘කෝලම් කිරීමකි’. (සම්මේලන දෙකක්, පිටු 30, 31, 33). ‘‘රබෝචිය දියල’’ පත්‍රයට වැරදී තිබෙන නිසා, එය ජුපිටර් දෙවියා මෙන් (එම දෙවියාට කිසිම සමාන කමක් නැතත්) බලවත් කෝපයට පත්ව ඇත. එපමණක් නොව, එහි ඉක්මන්කාරී බැනවැදීම කරණ කොටගෙන එයට ප්‍රතිවාදියාගේ තර්ක පිළිවෙළ තේරුම් ගත නොහැකි වූ බවද ඔප්පුවේ. එසේ වුවත්, එය මඳක් හෝ කල්පනා කළේ නම්, පොදු ජන ව්‍යාපාරයේ සාංසිද්ධිකතාවයට කුමන ලෙසකින් හෝ වහල්වීම හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය කුමන ලෙසකින් හෝ වෘත්තීය සමිතිවාදී දේශපාලනයේ තත්වයට පිරිහෙළීම යනු කම්කරු පංති ව්‍යාපාරය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ උපකරණයක් බවට පත්කිරීම සඳහා පසුබිම සැකසීම වන්නේ කෙසේද යන්න එයට වැටහෙන්නට තිබිණි. සාංසිද්ධික කම්කරු පංති ව්‍යාපාරයට ස්වශක්තියෙන් නිර්මානය කරගත හැක්කේ (හා එය අනිවාරණීය ලෙස නිර්මානය කරන්නේ) වෘත්තීය සමිතිවාදය පමණකි. එමෙන්ම කම්කරු පංති වෘත්තීය සමිතිවාදී දේශපාලනය යනු නියත වශයෙන්ම කම්කරු පංතියේ ධනේශ්වර දේශපාලනයයි. කම්කරු පංතිය දේශපාලන අරගලයට සහභාගි වීමෙන් පමණක්, දේශපාලන විප්ලවයට වුවද සහභාගිවීමෙන් පමණක්, හුදෙක් එම හේතුවම නිසා, එහි දේශපාලනය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය බවට පත්වන්නේ නැත. ‘‘රබෝචිය දියල’’ පත්‍රය මෙය ප්‍රතික්ෂේප කිරීමට තරම් නිර්භීතද? එය ජාත්‍යන්තර හා රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ හදිසි ප්‍රශ්න තේරුම් ගන්නේ කෙසේද යන්න මෙතරම් කල් ගත වී හෝ, දැන්වත්, ප්‍රසිද්ධ ලෙස, පැහැදිලි ලෙස හා ඒකාන්ත ලෙස විස්තර කරයිද? එවැනි දෙයක් නම් එය කිසි කලෙකත් නොකරනු ඇත. ඊට හේතුව, එය ‘මෙහි නැත’ ක්‍රමය යනුවෙන් විස්තර කළ හැකි උප්පරවැට්ටිය අත නොහැර එහි එල්බ සිටීමයි. ‘ඒ මා නොවෙයි, ඒ මගේ අශ්වයා නොවෙයි, රියැදුරා මා නොවෙයි. අපි ආර්ථිකවාදීන් නොවෙමු. ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රය ආර්ථිකවාදයට පක්ෂපාත නැත; රුසියාවේ ආර්ථිකවාදයක් ඇත්තේම නැත’. මෙය බෙහෙවින් හුරුබුහුටි ‘දේශපාලන’ උප්පරවැට්ටියක්වන නමුත් එය භාවිතා කරන ප්‍රකාශනවලට ‘ඔබ වහන්සේගේ යටහත් සේවක’[80] යන විකට නාමය පට බැඳී තිබීම සුළු දුර්වලතාවයකි.

රුසියාවේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පොදුවේ ගත් කල එය ‘හොල්මනක්’ පමණකැයි ‘‘රබෝචිය දියල’’ පත්‍රය කල්පනා කරයි (‘‘සම්මේලන දෙකක්’’, පිටු 32)*. වාසනාවන්ත මිනිස්සු. පැස්බරු මෙන්, සිය හිස වැල්ලේ ඔබා ගෙන, අවට සියළු දේ අතුරු දහන් වියයි සිතති. මාක්ස්වාදයේ බිඳවැටීම ගැන හා මාක්ස්වාදය අතුරුදහන් වීම ගැන පවා මාස්පතා ලෝකයාට කියන ලිබරල් ප්‍රකාශනයන්ද, බ්‍රෙන්ටානෝ පංති අරගල සංකල්පය[81] හා වෘත්තීය සමිතිවාදී දේශපාලන සංකල්පය කම්කරුවන් වෙත ගෙන එන ලිබරල්වාදීන් උනන්දු කරන (‘‘සන්ත පිතිර්බූර්ග්ස්කිය වියදමස්ති’’, ‘‘රුස්කිය වියදමස්ති’’ හා වෙනත් බොහෝ) ලිබරල් පුවත්පත්ද, තමන්ගේ නියම ප්‍රවණතාවයන් “Credo” ලියවිල්ලෙන් ඉතාමත් හොඳින් හෙළිදරව් කෙරුණු හා රුසියාවේ කරදරයක් හිරිහැරයක් නොමැතිව ප්‍රචාරයවන එකම සාහිත්‍යයේ නිශ්පාදනයක් වන මාක්ස්වාදී විවේචනයන් සමූහයද, විශේෂයෙන්ම, පෙබරවාරි මාර්තු සිදුවීම් වලින් පසුව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන විප්ලවවාදී

---

* ‘කම්කරු පංති ව්‍යාපාරය ඉරණම්වාදී ලෙස විප්ලවවාදී මාවතට යොමු කරන රුසියාවේ යථා තත්වයන්’ ගැන සඳහනක් ඊළඟට ඇත. එහෙත්, කම්කරු පංති ව්‍යාපාරයේ විප්ලවවාදී මාවත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී මාවතක් නොවන්නට ඉඩ තිබෙන බව මෙම අය තේරුම් නොගනිති. අත්තනෝමතවාදය රජ කරන විට මුළු මහත් බටහිර යුරෝපීය ධනේශ්වර පංතියම කම්කරුවන් විප්ලවයේ මාවතට යොමු කළහ; උවමනාවෙන්ම එසේ කළහ. එසේ වුවද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වන අපට එයින් සතුටු වී සිටිය නොහැක. තවද, කුමන හෝ මාර්ගයකින්, අපි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය, සාංසිද්ධික වෘත්තීය සමිතිවාදී දේශපාලනයේ තත්වයට පිරිහෙළන්නමෝ නම්, අප ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ උගුලට හසුවන ලෙස කටයුතු කරන්නේ වෙයි.

ප්‍රවණතාවයන් පුනර්ජීවනයක් ලැබීමද, යන මේ සියල්ල නිකම්ම හොල්මන් වශයෙන් සලකන බව පෙනේ! මේ සියල්ලම ධනේශ්වර පංතිය සමග කිසිම සම්බන්ධක් නොමැත!

'වසන්ත කාලයේ සිදුවීම් වලින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අධිකාරය හා ගෞරවය වැඩිවනු වෙනුවට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන විප්ලවවාදී ප්‍රවණතාවයන් ඒ ආකාර පුනර්ජීවනයක් ලැබුවේ කුමන හේතුවක් නිසාද' යන්න ගැන ''රබෝචිය දියල'' පත්‍රයත්, ''ඉස්ක්‍රා'' අංක 12 හි පළකරන ලද ලිපියේ කතෘවරුනුත් 'කල්පනා කර' බැලිය යුතුය. ඊට හේතුවූයේ අප අපගේ කර්තව්‍යයන් සාර්ථක ලෙස ඉටු කිරීමට සමත් නොවීමයි. කම්කරු පොදු ජනතාව අපට වඩා ක්‍රියාශීලී බව ඔප්පු විය. විරුද්ධ පාර්ශවීය ස්ථරයන් සියල්ලම අතර පැවති මනෝ ස්වභාවය ගැන ඉතා හොඳ හැඟීමක් ඇති හා ව්‍යාපාරයට නායකත්වය දීමට සමත්, සාංසිද්ධික විරෝධය පැමක් දේශපාලන විරෝධය පැමක් බවට හරවාගැනීම හා එහි දේශපාලන ස්වරූපය පුළුල් කිරීම ආදියෙහි සමත්කම් ඇති, ප්‍රමාණවත් පුහුණුවක් ලැබූ විප්ලවවාදී නායකයන් හා සංවිධායකයන් අපට සිටියේ නැත. එවැනි තත්වයක් යටතේ, වඩාත් ජංගමශීලී වඩාත් ධෛර්යමත් හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන විප්ලවවාදීන් අනිවාරණීය ලෙස අපගේ නොදියුණුකමින් ප්‍රයෝජන ගනු ඇත; කම්කරුවන් කොතරම් ධෛර්යමත් ලෙස හා ආත්ම පරිත්‍යාගයෙන් පොලිසියටත්, යුද්ධ හමුදවටත් විරුද්ධ සටන් කළත් එයින් ඔවුන් පත්වන්නේ හුදෙක් ධනේශ්වර පසුබල ඇණිය වන ඒ විප්ලවවාදීන්ගේ ආධාරක බලවේගයක තත්වයට මිස සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණු බල ඇණියට ආධාරක වූ බලවේගයක තත්වයට නොවේ. නිදර්ශනයක් වශයෙන් ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ගනිමු. අපගේ ආර්ථිකවාදීන් ආශා කරන්නේ ඔවුන්ගේ දුර්වලකම් පමණක් ගෙන ඔවුන් හා තරහකාරී ලෙස ඒවා ක්‍රියාත්මක කිරීමටය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අධිකාරය හා ගෞරවය වැඩි යාමට හේතු නොවන එකද දේශපාලන සිදුවීමක්වත් ජර්මනිය තුළ ඇති නොවන්නේ මන්ද? එසේ වන්නේ, නිශ්චිත සැම සිදුවීමක්ම ගැන ඉතාමත් විප්ලවවාදී අය කිරීම ඉදිරිපත් කිරීමේදීත්, දූෂ්‍ය පාලනයට එරෙහිව කරන සැම විරෝධය පැමක්ම වෙනුවෙන් ඉදිරිපත්වී සටන් කිරීමේදීත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය අන් සියල්ලන්ටම වඩා ඉදිරියෙන් සිටින බව පෙනෙන හෙයිනි. කම්කරුවන්ට දේශපාලන අවබෝධය නැතැයි යන අවබෝධය ආර්ථික අරගලය විසින් ඔවුනට දෙනු ලැබෙයයිද, යථා තත්වය විසින් කම්කරු පංති ව්‍යාපාරය නොවැලැක්විය හැකි ලෙසට විප්ලවයේ මාවතට තල්ලු කරනු ලැබෙයයිද යන තර්ක වලින් එය තමන්ම නැලවිල්ලට පත්වන්නේ නැත. සමාජ හා දේශපාලන ජීවිතයේ සැම ක්ෂේත්‍රයකම, සැම ප්‍රශ්නයකටම එය මැදිහත් වෙයි; ධනේශ්වර ප්‍රගතිවාදියෙකු නගරාධිපති වශයෙන් පත්කිරීම අනුමත කිරීම විල්හෙල්ම් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම සම්බන්ධයෙන්ද (එවැනි කටයුත්තකට මැදිහත්වීම ඇත්ත වශයෙන්ම ලිබරල්වාදයට ඉඩ දීමක්ය යන වැටහීම ජර්මන් වරුන්ට ලැබෙන සේ ඔවුනට අධ්‍යාපනයක් දීමට අපගේ 'ආර්ථිකවාදීන්' තවමත් සමත් වී නැත), 'අසභ්‍ය' ප්‍රකාශන හා පින්තූර විරෝධී නීතිය සම්බන්ධයෙන්ද, මහාචාර්ය වරුන් තෝරා පත් කිරීම කෙරෙහි ආණ්ඩුවේ බලපෑම සම්බන්ධයෙන්ද යනාදී වශයෙන් මැදිහත් වෙයි. සැම තැනෙකම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ඉදිරි පෙරමුණෙහි සිටිනු දක්නා ලැබේ. ඔවුහු සියළුම පංති අතර දේශපාලන අප්‍රසාදය අවුස්සති; සෝමාරියන් පුබුදුවති; ගාටන්නන් උනන්දු කරති; නිර්ධන පංතියේ දේශපාලන විඥනය හා දේශපාලන ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම පිණිස කරුණු රාශියක් සපයති. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජවාදයේ බලවත් සතුරන් පවා දියුණු දේශපාලන සටන් කරුවාට මහත් ගෞරවයක් දක්වති. එමෙන්ම, කිසියම් අරුම පුදුම ආකාරයකින් ධනේශ්වරයන්ගේ වැදගත් ලියවිල්ලක් නිලධාරිවාදී රාජ්‍ය සභා කොටස් වලින් පවා "Vorwärts" පත්‍රයේ කතෘ මණ්ඩල කාර්යාලය වෙත ලැබෙන අවස්ථාද එමටය.

''රබෝචිය දියල'' පත්‍රයේ දෑත් අහසට නගා 'කෝලම් කිරීමකි' යි කෑගැසීම හැර වෙනත් දෙයක් කර කියා ගත නොහැකි වන තරමට එහි අවබෝධ ශක්තිය ඉක්මවන 'ප්‍රතිවිරෝධයක්' ලෙසින් එයට පෙනෙන කාරණයේ විසඳීම මෙ පරිදිය. ඇත්තෙන්ම ඒ ගැන මඳක් කල්පනා කරන්න: ''රබෝචිය දියල'' පත්‍රයේ අපි, පොදු ජන කම්කරු පංති ව්‍යාපාරය මුල්ගල වශයෙන් සලකමු (ඒ බව ලොකු අකුරෙන්ම කියමු!); සාංසිද්ධික ස්වභාවය ලඝු කොට නොතකන ලෙස සැම සියළු දෙනාටම අවවාද කරමු; ආර්ථික අරගලයටම — ඒ අරගලයටම — දේශපාලන ස්වරූපයක් දීමට අපි කැමැත්තෙමු; නිර්ධන පංති අරගලය හා සමග සමීප හා ඓන්ද්‍රිය සම්බන්ධකම් පැවැත්වීමට අපි කැමැත්තෙමු. එහෙත් කම්කරු පංති ව්‍යාපාරය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ උපකරණයක් බවට පරිවර්තනය කිරීම සඳහා අප පසුබිම සකස් කරතියි අපට කියනු ලැබේ! මෙසේ කීමට තරම් ගරුසරු නොමැත්තෝ කවරහුද? එසේ කියන්නේ සැම 'ලිබරල්' ප්‍රශ්නයක්ම සම්බන්ධයෙන් මදිහැත් වීමෙන් (නිර්ධන පංති අරගලය හා සමග

ඓන්ද්‍රීය සම්බන්ධකම් පැවැත්වීම ගැන මොනතරම් නම් බරපතල වැරදි අවබෝධයක්ද?) හා ශිෂ්‍යයන්ට හා සෙම්ස්ත්වෝ සභාවලට පවා (අහෝ භයංකරය) එතරම් අවධානයක් ලක් කිරීමෙන් ලිබරල්වාදයට ඉඩ සලසන අයයි! ('ආර්ථිකවාදීන්' හා සමග සංසන්දනය කරන විට) ජනගහනයේ නිර්ධන පංති නොවන පංති අතර කටයුතු සඳහා සාමාන්‍ය වශයෙන් ඔවුන්ගේ ප්‍රයත්නයන්ගෙන් සියයට වැඩි කොටසක් කැප කරන අයයි! මෙය 'කෝලම් කිරීමක්' මිස වෙන කුමක්ද?

අසරණ ''රබෝචිය දියල'' පත්‍රය! මෙම විස්මය ජනක ගැටළුව එයට කිසි කලෙකත් විසඳා ගත හැකි වේද?

IV

ආර්ථිකවාදීන්ගේ පැරණි තාලය හා විප්ලවවාදීන්ගේ සංවිධානය

ඉතාමත් පුළුල් ලෙස ක්‍රියාත්මක කළ හැකි දේශපාලන උද්ඝෝෂණ මාධ්‍යය ආර්ථික අරගලය වන්නේයයිද, දැන් අප ඉටු කළ යුතු කර්තව්‍යය ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දීමයයිද, ආදී වූ අප ඉහත විග්‍රහ කළ හා ''රබෝචිය දියල'' පත්‍රය තරයේ ඉදිරිපත් කරන කරුණු වලින් අපගේ දේශපාලන කර්තව්‍යයන් පමණක් නොව සංවිධානමය කර්තව්‍යයන්ද පිළිබඳව ප්‍රකාශ වන්නේ පටු අදහසකි. 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය' සඳහා මධ්‍ය ගත සමස්ත රුසියානු සංවිධානයක් අවශ්‍ය වන්නේ නැත; එනිසා දේශපාලන විරුද්ධත්වය, විරෝධය පෑම හා කෝපය පැන නගින සෑම අවස්ථාවක්ම එකට සම්බන්ධ කරන සංවිධානයක්, වෘත්තීය විප්ලවවාදීන්ගෙන් සමන්විත වන හා සමස්ත ජනතාවගේම සැබෑ නායකයන් විසින් මෙහෙයවනු ලබන සංවිධානයක් කිසිකලෙකත් මෙම අරගලයෙන් බිහි නොවනු ඇත. මෙය තර්කානුකූල දෙයකි. ඕනෑම සංවිධානයක ස්වභාවය අනිවාරණීය ලෙසටම තීරණය වන්නේ එහි ක්‍රියාකාරිත්වයෙහි අන්තර්ගතවන දෑ අනුවය. ඒ අනුව බලන කල, ඉහත විග්‍රහ කරන ලද ප්‍රකාශයන් මගින් ''රබෝචිය දියල'' පත්‍රය දේශපාලන ක්‍රියාකාරිත්වයේ පමණක් නොව සංවිධාන කාර්‍ය්‍ය විෂයෙහිද පටු ස්වභාවය උතුම් හා සුදුසු දෙයක් ලෙසට පෙන්වයි. අන් සෑම අවස්ථාවක දී මෙන්ම මෙහිදීද ''රබෝචිය දියල'' පත්‍රය ඔප්පු කර තිබෙන්නේ එය තමන්ගේ විඥානය සාංසිද්ධිකතාවයට යටපත් කරන පත්‍රයක් වන බවයි. එහෙත්, සාංසිද්ධික වශයෙන් ඇතිවන සංවිධාන ආකෘතිවලට වහල් වීමත්, අපගේ සංවිධාන කටයුතුවල පටු ස්වභාවය හා පැරණි තාලය මෙන්ම මෙම වැදගත් ක්ෂේත්‍රයෙහි අප අනුගමනය කරන 'හස්ත කර්මාන්ත' ස්වරූපී ක්‍රමද වටහා ගැනීමට අසමත් වීමත්, යන මේවා ගැන අවබෝධයෙන් තොරව සිටීම නම් අපගේ ව්‍යාපාරයට වැළඳී ඇති ව්‍යාධියක් හා සමානයයි මම කියමි. එය පිරිහීමත් සමග මතුවන ව්‍යාධියක් නොවේ; ඇත්තෙන්ම වර්ධනයක් සමග ඇති වන්නකි. එසේ වුවද, සාංසිද්ධික කෝපයේ රළවේගය අප මත්තෙන් පෙරළී ගෙන යන මෙම වර්තමාන කාලයේදී, නොදියුණුකම ආරක්ෂා කිරීම සඳහා කරන සියල්ලටමත්, මෙම කාරණය සම්බන්ධයෙන් වූ පටුස්වභාවය සුජාත කරනය සඳහා කරන සියල්ලටමත් විරුද්ධව නොසමහන් අරගලයක් කිරීම අත්‍යාවශ්‍යය; අප අතර බල පවත්නා ආධුනික ස්වභාවය ගැන අප්‍රසන්නතාවයක් හා අප එයින් නිදහස් වීම සඳහා වූ ස්ථිරසාර අධිෂ්ඨානයක් ද, ප්‍රායෝගික වැඩ කටයුතු වලට සහභාගි වන හෝ එම වැඩ භාරගැනීමට සූදානම් වන අය සියළු දෙනාම තුළ ඇතිකිරීම විශේෂයෙන්ම අවශ්‍යය.

අ) පැරණි තාලය යනු කුමක්ද?

1894—1901 කාලයේ පැවති නියම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අධ්‍යයන කවයක කටයුතු ගැන කෙටි විස්තරයක් කිරීමෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට අපි උත්සාහ කරන්නෙමු. එකල තරුණ ශිෂ්‍ය සමස්තයම මාක්ස්වාදයෙහි නිමග්නව සිටි බව අප සඳහන් කර ඇත. එහෙත්, ඇත්ත වශයෙන්ම මෙම ශිෂ්‍යයන් උනන්දුවක් ගත්තේ මාක්ස්වාදය ගැන පමණක් නොවේ.ඔවුනට උවමනා කර තිබුණේ සතුරන්ට විරුද්ධව සටන් බිමට එළඹීමට කැඳවීමක් වශයෙන් 'කළයුත්තේ කුමක්ද' යන ප්‍රශ්නයට පිළිතුරක් සොයා ගැනීමය. මෙම නව රණ ශූරීන් සටනට අවතීර්ණ වූයේ මවිත කර තරම් පැරණි තාලේ අවි ආයුධ හා පුහුණුවක් ඇතිවය. ඔවුනතුරෙන් අති විශාල පිරිසකට අවිආයුධ තිබුණේ නැත; කිසිම පුහුණුවක්ද තිබුණේ නැත. නගුල් හැර දමා එන ගොවීන් සේ, ආයුධ වශයෙන් පොළු මුගුරු පමණක් අතැතිව ඔවුන් සටන් බිමට වන්හ. ව්‍යාපාරයේ පැරණි සාමාජිකයන් සමග කිසිම සම්බන්ධයක් නැති, වෙනත් දිස්ත්‍රික්කවල හෝ එකම නගරයේ පවා අනිකුත් (නැතහොත් වෙනත් අධ්‍යාපන ආයතන වල) අධ්‍යයන කව සමග

කිසිම සම්බන්ධකමක් නොමැති, කිසියම් කාලසීමාවක් තිස්සේ ක්‍රියාත්මක වීම සඳහා කිසිම ක්‍රමානුකූල සැලැස්මක් නොමැති, ශිෂ්‍ය කවයක් කම්කරුවන් සමග සම්බන්ධකම් ඇති කරගෙන වැඩ ආරම්භ කරයි. මෙම කවය ක්‍රම ක්‍රමයෙන් එහි ප්‍රචාරය හා උද්ඝෝෂණය ව්‍යාප්ත කරයි. එහි කටයුතු මාර්ගයෙන් සැලකිය යුතු තරම් විශාල කම්කරු කොටස් වල හා උගත් ස්ථරයන්ගේ සමහර කොටස්වල ආධාරය එයට ලැබෙයි. එමගින් ඊට මුදල්ද ලැබෙයි. එම කොටස් අතරින් නව කණ්ඩායම් බඳවා ගැනීමට 'කමිටුව'ක්‍රියා කරයි.කමිටුවේ (අරගල සංගමයේ) ආකර්ෂණීය බලය වර්ධනය වෙයි; එහි ක්‍රියාකාරිත්වයේ ක්ෂේත්‍රය පුළුල් වෙයි. සම්පූර්ණයෙන්ම සාංසිද්ධික ලෙස කමිටුව මෙම කටයුතු ව්‍යාප්ත කරයි. අවුරුද්දකට හෝ මාස කීපයකට පෙර, ශිෂ්‍ය කව රැස්වීම් තුළ කථා කරමින් 'යන්නේ කොහේද?' යන ප්‍රශ්නය ගැන සාකච්ඡා කළ, එමෙන්ම කම්කරුවන් සමග සම්බන්ධකම් ඇති කරගෙන එම සම්බන්ධකම් පවත්වා ගෙන ගිය, පත්‍රිකා ලියූ හා පළකළ, ඒ අයම, දැන් වෙනත් විප්ලවවාදී කණ්ඩායම් සමග සම්බන්ධකම් ඇති කරගනිති; පොත්පත් ලබා ගනිති; ප්‍රාදේශිය ප්‍රවෘත්ති පත්‍රයක් පළ කිරීමට වැඩ කටයුතු කරති; පෙළපාලියක් සංවිධානය කිරීම ගැන කථා කිරීමට පටන් ගනිති; අවසානයේ දී (තත්වය අනුව ප්‍රථම උද්ඝෝෂණ පත්‍රිකාව හෝ පුවත් පතක ප්‍රථම කලාපය නිකුත් කිරීම, නැතහොත් ප්‍රථම පෙළපාලිය සංවිධානය කිරීම වැනි ස්වරූපයක් ගත හැකිවන) විවෘත යුද්ධය වෙත යොමු වෙති. සාමාන්‍ය වශයෙන් එවැනි සටන් ආරම්භයක් කෙළවර වන්නේ නොබෝ කලකින් හා සම්පූර්ණයෙන්ම ව්‍යර්ථ වීමෙනි. එය නොබෝ කලකින් හා සම්පූර්ණයෙන්ම ව්‍යර්ථ වන්නේ, එය විවෘත යුද්ධයක් වන අතරම, දීර්ඝ හා අත් නොහරින අරගලයක් කිරීම සඳහා සිතා බලා සුපරීක්ෂාකාරී ලෙස සකස් කරගත් සැලැස්මක ප්‍රතිඵලයක් නොවීමත්, හුදෙක් සම්ප්‍රදයික අධ්‍යයන කවයක සාංසිද්ධික වර්ධනයේ ප්‍රතිඵලයක් පමණක් වීමත් නිසාය; ප්‍රාදේශීය නායකයන් ඔවුන්ගේ ශිෂ්‍ය කාලයේදීම 'ප්‍රසිද්ධියක් ලබා' සිටි නිසා එම ව්‍යාපාරයේ සියළු තන්හිම පාහේ ප්‍රධාන නායකයන් කවුරුන්ද යන්න ස්වාභාවික ලෙසම දැනගත් පොලිසිය වැටලීම සඳහා බලා සිටියේ නියම අවස්ථාව එළඹෙන තෙක් පමණක් වූ හෙයිනි. ඔවුන් උවමනාවෙන්ම අධ්‍යයන කවයක වැඩ වර්ධනය කරගෙන යාමට සෑහෙන කාලයක් දුන්හ. එසේ කළේ නියත වශයෙන්ම (corpus delicti) නීතිවිරෝධීවූ ක්‍රියාවකට හසු කරගත හැකි වන තෙක්ය. එපමණක් නොව ඔවුන් දන්නා කීප දෙනෙකුට 'බෝවීම සඳහා' (මා දන්නා තරමට අපේ ජනයා මෙන්ම පොලිස් කාරයනුත් හාවිතා කරන වචනය එයයි) නිදහසේ හැසිරීමට ඔවුනට ඉඩ තබති. මෙම යුද්ධ ශිල්පය සමාන කළ හැක්කේ, නවීන යුද්ධ හමුදාවනට විරුද්ධව පොලු මුගුරු ගෙන යුද වැදුනු ගොවි ජනතාවන් කළ යුද්ධයකට ය. සටන් කරුවනට කිසිම පුහුණුවක් නොමැතිව තිබියදී, පැතිරී වර්ධනය වී ජයග්‍රහණ ලැබූ මෙම ව්‍යාපාරයේ ජීවන ශක්තිය ගැන අයෙක් සිතනු ඇත. ඓතිහාසික වශයෙන් බලන කල පැරණි තාලේ අවි ආයුධ පාවිච්චි කිරීමට සිදුවීම අනිවාර්යණීය පමණක් නොව පුළුල් ලෙස සටන් කරුවන් බඳවා ගැනීම සඳහා ද සුදුසු වන බව පවා ඇත්තය. එහෙත් බරපතල ලෙස යුද්ධ කටයුතු ආරම්භ වූ වහාම (ඇත්ත වශයෙන්ම 1896 ග්‍රීෂ්ම ඍතුවේදී වැඩ වර්ජන වලින් එම කටයුතු ආරම්භ විය) අපගේ සටන් සංවිධානයේ දුර්වලකම් එන්න එන්නම වැඩි වැඩියෙන් මතුවන්නට පටන් ගති. මුලින් අවුලට පත්ව මෝඩකම් ගණනාවක් කළ (නිදර්ශනයක් වශයෙන්, සමාජවාදීන්ගේ වැරදි ක්‍රියා ගැන නැතහොත් ප්‍රධාන නගරවලින් කම්කරුවන් ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට පිටුවහල් කිරීම ගැන ජනතාවට කරුණු විස්තර කරමින් ආයාචනා කළ) ආණ්ඩුව, ඉතා ඉක්මණින්ම, අරගලයේ අළුත් තත්වයකට අනුරූප වනසේ හැඩ ගැසී, මැනවින් සංවිධානය කරන ලද ප්‍රකෝපකාරී චරපුරුෂයින්, ඔත්තු කරුවන් හා පොලිස් කාර කණ්ඩායම් අවශ්‍ය ලෙස විහිදුවා ලීමට සමත් විය. වැටලීම් කොතරම් නිරන්තර වී දයත්, ඒවා විශාල ජනකායකට බල පෑවෙය; එපමණක් නොව, කම්කරු පොදු ජනතාවට ඔවුන්ගේ නායකයන් සියළු දෙනාම අහිමි වන තරමට ප්‍රාදේශීය අධ්‍යයන කවවල සාමාජිකයින් අත් අඩංගුවට ගන්නා ලදී. එනිසා විමතියක් උපදවන තරමටම ව්‍යාපාරය අතරින් පතර පැනනගින තත්වයක් ගත්තේය; එය නොකඩවා පවත්වාගෙන යාමත්, වැඩ කටයුතු එකට ගලපා ගැනීමත් අත්‍යන්තයෙන්ම දුෂ්කර වන තත්වයක් ඇතිවිය. ප්‍රාදේශීය නායකයන් හයානක ලෙස විසිර යාම, අධ්‍යයන කව සාමාජිකත්වයේ අස්ථිර ස්වහාවය, න්‍යායික, දේශපාලන හා සංවිධාන ප්‍රශ්න ගැන පුහුණුවක් නොමැතිකම හා පටු අදහස් යන මේ සියල්ලම ඉහත විස්තර කරන ලද තත්වයන්ගෙන් ඇතිවූ අනිවාර්යණීය ප්‍රතිඵල වෙති. අපගේ අහිංසක හාවය හා රහස් රැක ගැනීමට බැරි කම නිසා කීප තැනකදීම කම්කරුවන් බුද්ධිමතුන් කෙරේ විශ්වාස හංගත්වයෙන් ඔවුන් මග හැරීමට පටන්නා තරමට තත්වය නරක් විය. බුද්ධිමතුන් ඉතාමත් අපරීක්ෂාකාරී නිසා, ඔවුන් පොලිස් වැටලීම් ඇති කරතියි කම්කරුවන් කියති!

අන්තිමේදී, මෙම ආධුනික ක්‍රම රෝගයක් වශයෙන් සැලකීමට කල්පනාකාරී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සියළු දෙනාම පටන්ගෙන තිබෙන බව ව්‍යාපාරය ගැන යන්තමින් හෝ දන්නා ඕනෑම කෙනෙක් දනියි. අප ව්‍යාපාරයේ විශේෂ අවධියක් හෝ විශේෂ රෝගයක් 'නිර්මානය කරන්නේය' යන අදහස, ව්‍යාපාරය ගැන නොදන්නා පාඨකයා තුළ ඇතිවීමට ඉඩ නොතබනු පිණිස අප මීට පෙර උපුටා දැක්වූ කොටසක කතෘ වන සාක්ෂිකරුගේ තවත් ප්‍රකාශයක් ගෙන බලමු. මෙම ඡේදය දිර්ඝ වීම ගැන අපට සමාව ලැබෙතැයි කල්පනා කරමු:

''රබෝචිය දියල'' අංක 6 හි බී. මෙසේ ලියයි: ''රුසියානු කම්කරු පංති ව්‍යාපාරය දැනට පසු කරමින් සිටින පොදු පරිවර්තනීය කාල පරිච්ඡේදය මත කෙළින්ම රඳා පවත්නා පරිවර්තනයක් වන, වඩාත් ව්‍යාප්තවූ දේශපාලන ක්‍රියාකාරිත්වය කරා පරිවර්තනය වීම ස්වභාව නිරූපී අංග ලක්ෂණයක් වන නමුත් ඊට නොදෙවැනි උනන්දුවක් දනවන තවත් අංග ලක්ෂණයක් රුසියානු කම්කරු විප්ලවයේ පොදු ක්‍රියා පිළිවෙළෙහි ඇත. අප සඳහන් කරන්නේ සටනට සුදුසු තත්වයේ විප්ලවවාදී බලවේගයන් නොමැතිවීම පොදු* අංග ලක්ෂණයක් වීම ගැනයි. මෙය සාන්ත පීටර්ස්බර්ග් හි පමණක් නොව රුසියාවේ සෑම තන්හිම දක්නට ලැබෙන්නකි. කම්කරු පංති ව්‍යාපාරයේ පොදු පුනර් ජීවනයක් සමග, වැඩ කරන පොදු ජනතාවගේ පොදු වර්ධනයක් සමග, වැඩ වර්ජනවල නිරන්තර ස්වභාවය වැඩිවීමත් සමග, කම්කරුවන්ගේ පොදුජන අරගලය වැඩි වැඩියෙන් විවෘත තත්වයට පත්වීමත් සමග හා ඒ සමගම ආණ්ඩුවේ පීඩනයේ, හිරභාරයට ගැනීමේ, විදේශවලට නෙරපා හැරීමේ හා පිටුවාහල් කිරීමේ පියවරයන් උත්සන්න කරන විට, හොඳින් පුහුණු වූ විප්ලවවාදී බලවේගයන් නොමැතිකම වැඩි වැඩියෙන් පැහැදිලි වන්නට පටන් ගෙන තිබේ. එයින් ව්‍යාපාරයේ ගැඹුරු ස්වභාවයටත්, පොදු ස්වභාවයටත් නිසැක ලෙසම හානි පැමිණෙනු ඇත. විප්ලවවාදී සංවිධානවල කිසිම ශක්තිමත් හා සෘජු බලපෑමක් නොමැතිව බොහෝ වැඩ වර්ජන ඇතිවේ... උද්ඝෝෂණීය පත්‍රිකා හා නීතිවිරෝධී පොත්පත් ප්‍රමාණවත් තරම් නොමැති බව දැනේ... කම්කරුවන්ගේ අධ්‍යයන කවවල උද්ඝෝෂකයන් නොමැත... ඊට අමතරව මුදල් හිඟයද නිතරම දැනේ. කොටින් කියතොත්, කම්කරු පංති ව්‍යාපාරයේ වර්ධනය විප්ලවවාදී සංවිධානවල වර්ධනය හා දියුණුව ඉක්මවා යමින් පවතී. ක්‍රියාත්මකව සිටින විප්ලවවාදීන් සංඛ්‍යාව ඉතා කුඩා හෙයින්, අප්‍රසාදයටපත් ජනතාව කෙරෙහි ක්‍රියාත්මක කරනු ලබන බලපෑම තම අතෙහි රඳවා ගැනීමට හෝ මෙම අප්‍රසාදයට ඒකාබද්ධතාවයක හා සංවිධානයක ඡායාවක්වත් දීමට ඔවුහු සමත් නොවෙති... අධ්‍යයන කව හා වෙන් වෙන් විප්ලවවාදීන් විසිරී ගිය හා අසම්බන්ධ වූ කල, එයින්, අනුපාතික වශයෙන් සංවර්ධනය වූ කොටස් සහිත, ඒකීය හා විනය සම්පන්න සංවිධානයක් නියෝජනය නොවේ''... කඩා විසුරුවන ලද අධ්‍යයන කව වෙනුවට වහාම අළුත් කව සංවිධානය කිරීමෙන් ''ව්‍යාපාරයේ ජීව ශක්තිය පමණක් ඔප්පුවන බව'' පිළිගන්නා අතර ''...ප්‍රමාණවත් තරම් සුදනමක් ඇති විප්ලවවාදී කාරක වරුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටින බව එයින් ඔප්පු නොවේ'', කතෘ මෙසේ නිගමනය කරයි: ''සාන්ත පීටර්ස්බර්ග් විප්ලවවාදීන්ට පුහුණුවක් නොමැති බව ඔවුන්ගේ කටයුතු වල ප්‍රතිඵල වලින් පෙනේ. කම්කරු පංතියේ තත්වයන් ගැන විස්තර සහිත දැනුමක් නොමැතිවූ, එනිසාම, නියමිත පැක්ටරියක උද්ඝෝෂණය ගෙනයා හැක්කේ කුමන තත්වයන් යටතේ දැයි නොදන්නා, රහස්‍ය භාවයේ ප්‍රතිපත්ති ගැන දැනුමක් නොමැති, එමෙන්ම, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පොදු ප්‍රතිපත්ති පමණක් දන්නා'' (ඔහු ඒවා දන්නේ නම්) ''තරුණ උද්ඝෝෂකයාට ඔහුගේ වැඩ කටයුතු මාස හතරක් පහක් හෝ හයක් කරගෙන යා හැකි බව මෑතදී පැවැත්වුනු නඩු විභාග වලින්, විශේෂයෙන්ම, ''ස්වයං විමුක්ති කණ්ඩායම''ට හා ''ප්‍රාග්ධනයට විරුද්ධ ශ්‍රමය කණ්ඩායම''ට[82] විරුද්ධව පැවැත්වුනු නඩුවලින් පැහැදිලිව පෙනේ. ඊළඟට මුළු කණ්ඩායම නැතහොත් කෙසේ හෝ ඉන් කොටසක්වත් කඩා විසුරුවන ආකාරයේ සිරභාරයට ගැනීම් සිදුවෙයි. එම නිසා, කණ්ඩායමේ පැවැත්ම මාස ගණනින් මැණීමට සිදුවේ නම්, එම කණ්ඩායමට සාර්ථක ලෙස කටයුතු කළ හැකිද? පවත්නා කණ්ඩායම්වල දුර්වලකම් සියල්ලම පැන නගින්නේ පරිවර්තනීය කාල සීමාව නිසායයි කිව නොහැකි බව පැහැදිලිය... ක්‍රියාත්මක සංවිධානවල සංඛ්‍යාත්මක හා අන් සියල්ලටම වඩා ගුණාත්මක සැකැස්ම සුළු පටු සාධකයක් නොවන බව පැහැදිලි ලෙස පෙනේ. එනිසා අපගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් භාරගත යුතු ප්‍රථම කර්තව්‍ය වන්නේ... ඵලදායක ලෙස සංවිධාන ඒකාබද්ධ කිරීම හා ඒවායේ සාමාජිකත්වය ඉතා සුපරීක්ෂාකාරී ලෙස තෝරා ගැනීමයි''.

ආ) පැරණි තාලය හා ආර්ථිකවාදය

සෑම පාඨකයෙකුගේම සිතට නිසැකව නැගෙනු ඇති ප්‍රකාශයක් ගැන දැන් සඳහන් කළ යුතු වෙමු. සමස්ත ව්‍යාපාරයටම බලපාන වර්ධන වේදනාව වශයෙන් ගත හැකි පැරණිතාලයත්, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ එක ධාරාවක් ලෙස ආර්ථිකවාදයත් අතර සම්බන්ධයක් පෙන්විය හැකිද? හැකියයි අපි සිතමු. ආරම්භයේ පටන්ම

---

* අවධාරණය කිරීම් සියල්ලම අපගේය.

අචල ලෙස විප්ලවවාදී මාක්ස්වාදයට පක්ෂව සිටි අයද ඇතුළුව අප සියළු දෙනාටම පුහුණුවක් නොමැති කම හා සංවිධාන වැඩ කරගෙන යාමට හැකියාවක් නොමැති කම ඇත්ත වශයෙන්ම පොදු දෙයකි. අඩු පාඩුව තිබුණේ ඇත්ත වශයෙන්ම පුහුණුව පමණක් නම්, ප්‍රායෝගික කාරකවරුන්ට දෙස් පැවරීම කිසිවෙකුටත් කළ නොහැකිය. එහෙත් ‘පැරණිතාලය’ යන පාඨයෙහි පුහුණුව නොමැතිකමට වඩා යමක් අන්තර්ගතය. එයින් අදහස් වන්නේ විප්ලවවාදී කටයුතු වලදී පොදු වශයෙන් දක්නට ලැබෙන පටු ස්වභාවයකි; එවැනි පටු ක්‍රියාකාරිත්වයක් පදනම් කරගෙන විප්ලවවාදීන්ගේ හොඳ සංවිධානයක් ගොඩනැගිය නොහැකි බව අවබෝධ කර ගැනීමට නොහැකි බවකි. අන්තිම වශයෙන්, පටු ස්වභාවය යුක්ති සහගත බව පෙන්වීමට එය විශේෂ න්‍යායක මට්ටමට නැංවීමට ප්‍රයත්න දැරීමෙන් මෙම ප්‍රශ්නයේදීද සාංසිද්ධිකතාවයට යටපත් වීමයි. මෙහි ප්‍රධාන කාරණය එයයි. එවැනි ප්‍රයත්නයන් පැහැදිලිව පෙනී ගිය පසු පැරණි තාලය ආර්ථිකවාදය සමග සම්බන්ධ බව පැහැදිලි විය. එමෙන්ම අප පොදු වශයෙන් ආර්ථිකවාදයෙන් (එනම්, මාක්ස්වාදී න්‍යාය පිළිබඳව මෙන්ම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කාර්ය භාරය හා එහි දේශපාලන කර්තව්‍යයන් පිළිබඳවද පටු ආකල්පයෙන්) නිදහස් වන තෙක් අප අපගේ සංවිධාන කර්තව්‍යයන්ගේ පටු ස්වභාවයෙන් කිසිකලෙකත් නිදහස් නොවනු ඇත. මෙම ප්‍රයත්නයන් දෙ ආකාරව, දෙපැත්තකින් ප්‍රකට වෙයි. සමහරු කියන්නට වන්නේ, විප්ලවවාදී පොදු ජනතාව පිට ‘පටවන්නට’ උත්සාහ කරන පුළුල් සටන් කාමී දේශපාලන කර්තව්‍යයන් කම්කරු පොදු ජනතාවගෙන් තවමත් ඉදිරිපත් වී නොමැති බවත්, හදිසි දේශපාලන ඉල්ලීම් සඳහා අරගල* කිරීම හා ‘ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය’ කිරීම තවදුරටත් කරගෙන යා යුතු බවත් (ස්වාභාවික වශයෙන්ම, පොදු ජන ව්‍යාපාරයට ‘ළඟාවිය හැකි’ මෙම අරගලයට ගැලපෙන, ඉතාමත් නුපුහුණු තරුණයින්ට පවා ‘ළඟාවිය සැකි’ සංවිධානයක් තිබිය යුතු බවත්) ය. ක්‍රමික භාවය පිළිබඳ සෑම න්‍යායකින්ම ඉතාමත් දුරස්තර වූ අනිත් අය කීවේ ‘දේශපාලන විප්ලවයක් සිදු කිරීම’ කළ හැකි හා කිරීමට අවශ්‍ය දෙයක් බවත්, එසේ වුවත්, ඒ සඳහා දැඩිතර හා අත්නොහරින ලෙස අරගල කිරීම පිණිස නිර්ධන පංතිකයන් පුහුණු කිරීමට විප්ලවවාදීන්ගේ ශක්තිමත් සංවිධානයක් තිබීම අවශ්‍ය නොවන බවත් ය. අප කළයුත්තේ අපගේ පැරණි මිතුරා වන ‘ළඟාවිය හැකි’ මුගුර අතට ගැනීම පමණකි. උපමාවාක්‍ය පසෙකින් තැබුවහොත් එයින් අදහස් වන්නේ අප සමන්ත මහා වැඩ වර්ජනයක්* සංවිධානය කළයුතු බවයි; නැතහොත් ‘ඇවිස්සුම්කාරි ත්‍රස්තය’ ** මගින් කම්කරුවන්ගේ ‘ජීවගුණයෙන් තොර’ ප්‍රගතිය පණ ගැන්විය යුතු බවය. අවස්ථාවාදීන් හා ‘විප්ලවවාදීන්’ යන ප්‍රවණතාවයන් දෙකම දැනට පවත්නා ආධුනික ස්වභාවයට නමස්කාර කරති. එය ඉවත් කළ හැකියයි ඉන් එකක්වත් විශ්වාස නොකරයි. අපගේ මූලික හා අවශ්‍යතම කර්තව්‍ය වන්නේ දේශපාලන අරගලයට ධෛර්ය, ස්ථායි භාවය හා අවිච්ඡේදභාවය දිය හැකි විප්ලවවාදීන්ගේ සංවිධානයක් ගොඩ නැගීම බව ඉන් එකකටවත් වැටහෙන්නේ නැත.

‘කම්කරු පංති ව්‍යාපාරයේ වර්ධනය විප්ලවවාදී සංවිධානවල වර්ධනය හා දියුණුව ඉක්මවා යමින් පවතී’ යයි කියන බී. — ගේ වචන අපි උපුටා දැක්වුයෙමු. ‘සමීප නිරීක්ෂකයෙකුගේ මෙම අගනා කියමන’ (බී. — ගේ ලිපිය ගැන ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ විස්තරය) අපට දෙ ආකාරයකින් අගනේය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමාන අර්බුදයට ප්‍රධාන හේතුව වී ඇත්තේ, නායකයන් (‘දෘෂ්ටිවාදීන්, විප්ලවවාදීන්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්) පොදු ජනතාවගේ සාංසිද්ධික උත්සන්නිය පසුපස්සේ ඇදී යාමය යන අපගේ අදහස නිවැරදි බව එයින් පෙනේ. නීරස සැමද අරගලයේ සාංසිද්ධිකතාවය ලඝුකොට තැකීමේ අන්තරාය ගැනද, ක්‍රියාදමයක් වන උපක්‍රම ගැනද ආදී වූ දේ ගැන කියමින් ක්‍රිචේව්ස්කි හා මාර්තිනව් විසින් (‘‘ඉස්ක්‍රා’’ අංක 12 පත්‍රයේ) පළ කරන ලද ලිපියේ කතෘවරුන් ඉදිරිපත් කළ තර්ක සියල්ලම පැරණි තාලයට ප්‍රෞඪත්වයක් දීමක් හා එය ආරක්ෂා කිරීමක් හැර වෙනත් දෙයක් නොවන බවද එයින් පෙන්නුම් කෙරේ. විරිත්තන්නේ නැතිව ‘න්‍යායවාදියා’ යන වචන උච්ඡාරණය කළ නොහැකි, පොදු නුපුහුණු කමට හා නොදියුණු කමට කරන්නාවූ ස්වකීය දණ නමස්කාරය ‘ජීවිතයේ යථාර්ථය ගැන හැඟීමක්’ වශයෙන් විස්තර කරන මොවුන් භාවිතයෙන් හෙළිදරව් කරන්නේ ඔවුන් අපගේ අනිවාර්යතම ප්‍රායෝගික කර්තව්‍යයන් වටහා ගැනීමට අසමත් බවයි. ගාටන්නන්ට ඔවුන් මෙසේ කෑගසා කියති:

---

[*] ‘‘රබෝචය මිස්ල්’’ හා ‘‘රබෝචිය දියල’’, විශේෂයෙන්ම ප්ලෙහානව්ට ‘‘පිළිතුර’’.

[*] කීව් කම්ටුව විසින් යළිත් නිකුත් කරන ලද ‘‘නිර්ධන පංති අරගලය’’ යන නමින් වූ ලිපි එකතුවෙහි ‘‘දේශපාලන විප්ලවය ඇති කරන්නේ කවුද?’’ යන ලිපිය බලන්න.

[**] ‘‘විප්ලවවාදයේ පුනර් ජනනය’’ හා ‘‘ස්වබෝද’’ පත්‍රය.

හරියට පියවර තබන්න! ඉස්සරවී දුවන්න එපා! සංවිධාන කටයුතු වලදී ධෛර්‍ය හා ක්‍රියාරම්භකතාවය නොමැතිව සිටින හා පුළුල් හා නිර්භීත ක්‍රියාකාරිත්වය සඳහා ‘සැලසුම්’ නොමැතිව සිටින අයට ‘ක්‍රියාදමයක් වන උපක්‍රම’ ගැන නන් දෙඩති! අප කරන බලවත්ම පාපය නම් අපගේ දේශපාලනමය හා සංවිධානමය කර්තව්‍යයන්, සැමද ආර්ථික අරගලයේ හදිසි ‘ප්‍රත්‍යක්ෂ’, ‘පැහැදිලි’ උවමනාවන්ගේ තත්වයට පිරිහෙළීමයි. එහෙත් ඔවුහු ඒ තාලයට අපට ගායනා කරති. ආර්ථික අරගලයටම දේශපාලන ස්වරූපයක් දෙනු! මෙවැනි දෙයින් ප්‍රදර්ශනය වන්නේ, ජනප්‍රිය උපමා කථාවක සඳහන් පරිදි ගමන් කරන අවමංගල පෙරහැරකට ‘ශුභ උපන් දිනක් වේවා’ යි මහ හඬින් ප්‍රාර්ථනා කළ වීරයාගේ මෙන් වන ‘ජීවිතයේ යථාර්ථය ගැන වූ හැඟීම’ යි.

‘වචනයේ සැබෑ හා ප්‍රායෝගික අර්ථයෙන්, එනම්, දේශපාලන ඉල්ලීම් සඳහා කරන අවස්ථාවෝචිත හා සාර්ථක ප්‍රායෝගික අරගලයේ අර්ථයෙන් (“ ‘රබෝචිය දියල’ පත්‍රයේ පිළිතුරු”, පිටු 24) පොදු වශයෙන් ගත් කල දේශපාලන කර්තව්‍යයන් ඉටු කිරීම කම්කරු කව වලට (මේ වචනම) නුපුළුවන්’ බව ප්ලෙහානව්ට දේශනා කළ මෙම බොරු පණ්ඩිතයන්ගේ සැබෑ ‘නර්ට්සිස් ස්වරූපී’[83] අසම සම උද්ධච්ඡකම මතකයට නංවමු. මහත්වරුනි, නොයෙක් නොයෙක් කව තිබේ! ‘ආධුනිකයන්ගේ’ කව ගැන කියන්නේ නම්, ඒවා ඔවුන්ගේ ආධුනික ස්වභාවය ගැන වටහා නොගෙන සිටින තාක් කල්, දේශපාලන කර්තව්‍යයන් ඉටු කිරීමෙහි සමත් නොවෙති. එපමණක්ම නොව, සිය පැරණි තාලයට ඇළුම් කරන මෙම ආධුනිකයන් ‘ප්‍රායෝගික’ යන වචනය අවධාරණය කර ලිවීමෙහි දැඩි ලෙස එල්බ සිටින අතර, අයෙක් ප්‍රායෝගික වීමට ඔහුගේ කර්තව්‍යයන් ජනතාවගේ ඉතාමත් නොදියුණු ස්ථරයන්ගේ අවබෝධයේ මට්ටමට පහත දැමිය යුතුයයි කල්පනා කරති නම්, එවිට ඔවුන් පිළිසරණක්ද නොමැති ආධුනිකයන් වෙති. එසේ වූ කල පොදු වශයෙන් දේශපාලන කර්තව්‍යයන් කිසිවක් ඉටු කිරීම ඔවුන්ට ඒකාන්ත වශයෙන්ම නුපුළුවන් වන්නේය. එහෙත්, අලෙක්සේයිව් හා මීෂ්කින් වැනි, හල්තූරින් හා ෂෙලියාබව් වැනි අයගෙන් සමන්විත කවයක් නම්, සාංසිද්ධික ලෙස ප්‍රබෝධමත්වන පොදු ජනතාවගෙන් ඔවුන්ගේ ප්‍රචාරයට අනුකූල තාවයත්, ඔවුන්ගේ කාන්තිමත් ධෛර්‍යයට විප්ලවවාදී පංතියේ අනුබලය හා එම පංති ශක්තියේ ආධාරයත් ලැබෙන නිසා, ඒ තාක් දුරට වචනයේ නියම හා ප්‍රායෝගික අර්ථයෙන්ම දේශපාලන කර්තව්‍යයන් ඉටුකිරීමට එයට හැකි වෙයි. මෙම විප්ලවවාදී පංතිය හඳුන්වාදීමේදී සහ එය අනිවාරණීය ලෙසට සාංසිද්ධික වශයෙන් ප්‍රබෝධමත් වන බව පෙන්වා දීමේදී පමණක් නොව ‘කම්කරු කව වලට’ ශ්‍රෙෂ්ඨ හා උත්තුංග කර්තව්‍යයන් පැවරීමේදීද ප්ලෙහානව් කළේ නිවැරදි දෙයකි. එහෙත්, මෙම කර්තව්‍යය පිරිහෙළීම පිණිස ‘කම්කරු කව වල’ ධෛර්‍ය හා විෂය ප්‍රමාණය අඩු කිරීම පිණිස, ඉන් පසුව පැන නැගුනු පොදු ජන ව්‍යාපාරය ගැන ඔබ සඳහන් කරන්නෙහිය. ඔබ ඔබගේම පැරණි තාලයෙන් මෝහනය වූ ආධුනිකයන් නොවෙති නම් වෙන කවුරු වෙත්ද? ඔබ ප්‍රායෝගික වන බව පුරසාරම් දෙඩන නමුත්, සෑම රුසියානු කාරක වරයෙක්ම දන්නා දෙය ඔබට පෙනෙන්නේ නැත; එනම්, කවයක පමණක් නොව, පුද්ගලයෙකුගේ පවා ධෛර්‍යයෙන් විප්ලවවාදී ව්‍යාපාරයේදී ඉටු කළ හැකි ප්‍රාතිහාර්‍යයන් ඔබට පෙනෙන්නේ නැත. නො එසේ නම් ඔබ අදහස් කරන්නේ එක්දහස් අටසිය හැත්තෑ ගණන්වල සිටි වැනි නායකයන් ඉදිරිපත් කිරීමට අපගේ ව්‍යාපාරය අසමත් බවක්ද? ඒ අපට පුහුණුවක් නොමැති නිසාද? නමුත් අපි පුහුණු වෙමින් සිටිමු; අපි අපගේ පුහුණු වීම දිගටම ගෙනයමු; අපි පුහුණු වූ තත්වයට පැමිණෙන්නෙමු! අවාසනාවකට මෙන් ‘ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන ආර්ථික අරගලය’ නැමති පල්වෙන ජලයමත පාසි බැඳී තිබෙන බව ඇත්තය. රුසියානු නිර්ධන පංතියේ ‘පසු පැත්ත’ (ප්ලෙහානව්ගේ පාඨය අනුව) දෙස බිය වී බලා සිටිමින් සාංසිද්ධිකතාවය හමුවේ දනින්වැටී යාඥා කරන අය සමහර දෙනෙක් අප අතර පෙනී සිට ඇත. එහෙත් අපි මෙම පාසි ඉවත් කරන්නෙමු. රුසියානු විප්ලවවාදීන්, නියම විප්ලවවාදී න්‍යායකින් මගපෙන්වීම ලබමින්, සැබැවින්ම විප්ලවවාදී හා සාංසිද්ධික ලෙස ප්‍රබෝධමත් වන පංතිය කෙරෙහි විශ්වාසය තබමින්, ඔවුන්ගේ පූර්ණ පෞරුෂත්වයෙන් හා මුළු මහත් යෝධ ශක්තියෙන්ම යුතුව අන්තිමේදී — මෙතෙක් කලකට පසුව — නැගී සිටිය හැකි කාලය එළඹ තිබේ. අපගේ කාරක සමුහයාත්, ඊට වඩා විශාල පිරිසක් වූ පාසල් යන අවධියේ ප්‍රායෝගික වැඩ ගැන සිහින මවමින් සිටි ජනයාත් විසින් කෙරෙනු යුතුව ඇත්තේ, අපගේ දේශපාලන කර්තව්‍යයන් පිරිහෙළීමට හා අපගේ සංවිධාන වැඩ කටයුතුවල විෂය ප්‍රමාණය සීමා කිරීමට ඉදිරිපත් කරනු ලබන ඕනෑම යෝජනාවක් සමච්චල් කොට හා නිග්‍රහ කොට ඉවත දැමීම පමණකි. අපි එය කරන්නෙමු; ඒ ගැන සැක නොසිතන්න, මහත්වරුනි!

“පටන්ගත යුත්තේ කොතැනින්ද?” යන ලිපියෙහි මා “රබෝචිය දියල” පත්‍රයට විරුද්ධව මෙසේ ලියා ඇත: “කිසියම් අප්‍රධාන විශේෂ

ප්‍රශ්නයක් ගැන උද්ඝෝෂණය කිරීම හා සම්බන්ධ උපක්‍රම හෝ පක්ෂ සංවිධානයේ සුළු කාරණයක් ගැන වූ උපක්‍රම හෝ පැය විසි හතරකින් වෙනස් කිරීමට ඉඩ තිබේ. එහෙත් පොදු ජනතාව අතර අරගල ගෙනයන හා දේශපාලන උද්ඝෝෂණ කරන සංවිධානයක් පොදු වශයෙන්ද, අඛණ්ඩවද, අවිවාද ලෙසද අවශ්‍යය යන අදහස පැය විසිහතරකින් තබා මාස විසි හතරකින්වත් වෙනස් කළ හැක්කේ කිසිම ප්‍රතිපත්තියක් නැති අයට පමණකි.'' මෙයට ''රබෝචිය දියල'' පත්‍රය පිළිතුරු දුන්නේ මෙසේය: ''''ඉස්ක්‍රා'' පත්‍රයේ චෝදනා සියල්ලම අතුරෙන් කරුණු පදනම් කරගත් බවක් ව්‍යාජ ලෙස පෙන්නුම් කරන මෙම චෝදනාව සම්පූර්ණයෙන්ම පදනම් විරහිතය. ''ඉස්ක්‍රා'' පත්‍රය නිකුත්වන තෙක් සිටින්නේ නැතිව, ආරම්භයේ පටන්ම දේශපාලන උද්ඝෝෂණය සඳහා අප හඬනැඟූ බව පමණක් නොව''... (කම්කරු අධ්‍යයන කව තුළ පමණක් නොව 'පොදු ජන කම්කරු පංති ව්‍යාපාරයේද ප්‍රථම දේශපාලන කර්තව්‍ය වශයෙන් ගත හැක්කේ අත්තනෝමත වාදී පාලනය පෙරළා දැමීම නොව' හදිසි දේශපාලන ඉල්ලීම් සඳහා අරගලය වන බවත් 'එක වැඩ වර්ජනයකින් නැතහොත්, කුමන තත්වයක් යටතේ වුවත් වැඩ වර්ජන කීපයකින් පසුව පොදු ජනතාව හදිසි ඉල්ලීම් ගැන වටහා ගැනීමට පටන්ගන්නා' බවත් ඒ සමගම කියමින්)... ''විදේශයේ සිට රුසියාවේ වැඩ කරන සහෝදරවරුන් වෙත අප එවූ අපගේ ප්‍රකාශනය මගින් එකම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන හා උද්ඝෝෂණික පත්‍රය සැපයීමේ කටයුත්තද කළ බව ''රබෝචිය දියල'' පාඨකයින් හොඳින් දනිති''... (තවද, මෙම එකම පත්‍රය මගින් පුළුල්තම දේශපාලන උද්ඝෝෂණය නිතරම ආර්ථික අරගලයේ පදනම මත පිහිටුවීමට පමණක් නොව, 'පුළුල්තම ලෙස යොදගත හැක්කේ මෙම සීමා කළ උද්ඝෝෂණය යි' කීමට තරම් දුරට යාමද ඔබෙන් කෙරුනි. එපමණක් නොව, ඔබගේම — සපයන ලද්දේ මෙම එකම පත්‍රයයි යන — තර්කය අනුව, ''ඉස්ක්‍රා'' පත්‍රය නිකුත් කිරීමෙන්, ''රබෝචිය දියල'' පත්‍රයට විරුද්ධව කරන මෙම අරගලයේත් අවශ්‍යකම ඔප්පු වන බව ඔබට නොපෙනේද, මහත්වරුනි?)... ''අනික් අතට අපගේ ප්‍රකාශක කටයුතු මගින් ඇත්ත වශයෙන්ම පත්‍රයේ උපක්‍රමීය සමගිය සඳහා භූමිය සකස් විය''... (උපක්‍රම යනු පක්ෂය සමග වැඩෙන පක්ෂ කර්තව්‍යයන්ගේ ක්‍රියාදමය මත සමගියද? ඇත්ත වශයෙන්ම අගේ ඇති සමගියක්!)... ''එසේ කිරීමෙන් 'සටන්කාමී සංවිධානයක්' ඇති කිරීම පහසු කළ විදේශගත සංගමය, ඒ සඳහා විදේශගත සංවිධානයකට හැකි සැම දෙයක්ම කළේය'' (''රබෝචිය දියල'' අංක 10, පිටු 15). මේය මග හැරීමට

දරන අසාර්ථක ප්‍රයත්නයකි! ඔබට 'කළ හැකිව' තිබෙන දේ ඔබගේ අදහස් වල පටු ස්වභාවය නිසා සීමා වී තිබෙන බව මම ස්ථිරවම කියා ඇත්තෙමි; දැනුදු එසේ කියන්නෙමි. 'හදිසි දේශපාලන ඉල්ලීම්' සඳහා සටන් කිරීමට හෝ 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව ආර්ථික අරගලය' ගෙන යාම සඳහා 'සටන්කාමී සංවිධානයක්' ගැන කථා කිරීම මෝඩ කමකි.

එහෙත් 'ආර්ථික වාදීන්' ආධුනික ස්වභාවයෙන් මෝහනය වීම පිළිබඳව අගනා නිදර්ශන දැකීමට කැමති නම් පාඨකයා කළ යුත්තේ, හැම තැනින්ම කරුණු අවුලා ගන්නා හා වැනෙන සුලු ''රබෝචිය දියල'' පත්‍රය අත්හැර ස්ථිර හා අධිෂ්ඨාන සහගත ''රබෝචය මිස්ල්'' පත්‍රය වෙත හැරීමය. එහි ''විශේෂ අතිරේකයෙහි'' පිටු 13 හි එර්. එම්. මෙසේ ලිවීය:: ''ඊනියා විප්ලවවාදී බුද්ධිමතුන් ගැන වචන දෙකක් මෙහිදී කියමු. 'සාර්වාදයට විරුද්ධව අධිෂ්ඨාන සහගත ලෙස සටනට බැසීමට' තමන් සූදනම් බව ඔවුහු වරකට වඩා ඔප්පු කොට ඇත. එසේ වුවද අපගේ විප්ලවවාදී බුද්ධිමතුන් දේශපාලන පොලිසියේ දයානුකම්පා විරහිත පීඩාවට භාජනය කරනු ලබන අතර, දේශපාලන පොලිසියට විරුද්ධව අරගල කිරීම සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව අරගල කිරීමක් වශයෙන් බුද්ධිමතුන් කල්පනා කිරීම අවාසනාවන්තය. 'සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව කරන අරගලය සඳහා වූ බලවේගයන් ලබාගන්නේ කොහෙන්ද' යන්න එයට අද දක්වා වටහා ගත නොහැකි වී තිබෙන්නේ එහෙයිනි.

සාංසිද්ධික ව්‍යාපාරයට මෙම (වචනයේ නරකම අර්ථයෙන්) නමස්කාර කරන්නා පොලිසියට විරුද්ධව අරගලයට දක්වන උඩඟු පිළිකුල ඇත්තෙන්ම අසම සමය! සාංසිද්ධික පොදු ජන ව්‍යාපාරයේදී දේශපාලන පොලිසියට විරුද්ධව අරගල වැදගත් වන්නේ නැතැයි තර්ක කරමින් රහසිගත කටයුතු සංවිධානය කිරීමට අපගේ ඇති නොහැකියාව සාධාරන බව පෙන්වීමට ඔහු සූදනම්ය! මෙම භයානක නිගමනයට දයක වනු ඇත්තේ ස්වල්ප දෙනෙක් පමණකි. අපගේ විප්ලවවාදී සංවිධානවල අඩුපාඩුකම් එතරම්ම වැදගත් කාරණයක් වී තිබේ. එහෙත් මර්තිනව් මෙයට දයක වීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඔහු එසේ කරන්නේ එක්කෝ ස්වකීය අදහස් ගැන තර්කානුකූල නිගමනයක් දක්වා සිතා බැලීමට ඔහු අසමත් නිසාය; නැතහොත් එසේ කිරීමට ධෛර්යයක් ඔහුට නොමැති හෙයිනි. පොදු ජනතාවගේ පැහැදිලි ඉල්ලීම්, ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකි ඉල්ලීම් ඉදිරිපත් කිරීම පිළිබඳ 'කර්තව්‍ය' උදෙසා විප්ලවවාදීන්ගේ ස්ථායි,

මධ්‍යගත හා සටන්කාමී සංවිධානයක් ඇති කිරීමට විශේෂ ප්‍රයත්න දැරීමේ අවශ්‍යතාවයක් මතුවේද? ‘දේශපාලන පොලිසියට විරුද්ධව කිසිම අරගලයක්’ නොකරන පොදු ජනයාට පවා එවැනි ‘කර්තව්‍යයක්’ ඉටු කළ නොහැකිද? එපමණක් නොව, නායකයන් කීප දෙනාට අමතරව, ‘දේශපාලන පොලිසියට විරුද්ධව අරගල කිරීමේ’ හැකියාවක්නැති කම්කරුවන් (අති බහුතරය) මෙම කර්තව්‍ය භාර ගෙන ඉටු කරන්නේ නැත්නම් එය සාර්ථක කළ හැකි වේද? එවැනි කම්කරුවන් හා සාමාන්‍ය පොදු ජනයා වැඩ වර්ජන වලදී සහ පොලිසිය හා යුද්ධ භටයන් සමග වීදි ගැටුම්වලදී අතිමහත් ධෛර්යයක් හා ආත්ම පරිත්‍යාගයක් පෙන්වීමට සමත් වෙති; අපගේ සමස්ත ව්‍යාපාරයේම ප්‍රතිඵලය තීරණය කිරීමෙහි සමත් (ඇත්ත වශයෙන්ම සමත් එකම පිරිස) වෙති. එහෙත් දේශපාලන පොලිසියට විරුද්ධව අරගලය සඳහා වෘත්තීය විප්ලවවාදීන් අවශ්‍ය වේ. ඒ සඳහා වෘත්තීය විප්ලවවාදීන් අවශ්‍ය වේ. එනිසා පොදු ජනතාවගෙන් පැහැදිලි ඉල්ලීම් ‘ඉදිරිපත් වනු’ පිණිස පමණක් නොව, කම්කරු පොදු ජනතාවගෙන් එවැනි වෘත්තීය විප්ලවවාදීන් වැඩි වැඩියෙන් ‘ඉදිරිපත් වනු’ පිණිසද අප අවශ්‍ය කටයුතු කළ යුතුය. එනයින් වෘත්තීය විප්ලවවාදීන්ගේ සංවිධානයක් හා පිරිසිදු හා සරල කම්කරු ව්‍යාපාරයක් අතර සම්බන්ධය පිළිබඳ ප්‍රශ්නය වෙත අපි ළහාවී ඇත්තෙමු. මෙම ප්‍රශ්නය පොත පතෙහි පිළිබිඹු වී ඇත්තේ ස්වල්ප වශයෙන් වුවද, ආර්ථිකවාදය කෙරෙහි අඩු හෝ වැඩි ප්‍රමාණයෙන් නැඹුරුවන සහෝදරුන් සමග ඒ ගැන බොහෝ සාකච්ඡා නැතහොත් වාද විවාද කිරීමට ‘දේශපාලනඥයන්’ වන අපට සිදුවිය. මෙය විශේෂයෙන්ම සලකා බැලීමට සුදුසු වන ප්‍රශ්නයකි. එහෙත් ඒ ගැන කරුණු සඳහන් කිරීමට පෙර පැරණි තාලය හා ආර්ථිකවාදය අතර සම්බන්ධය පිළිබඳ අපගේ රචනයට අදල නිදර්ශනයක් වශයෙන් උපුටාගත් කොටසක් ගෙන හැර දක්වමු.

N.N. මහතා ඔහුගේ ‘‘පිළිතුරෙහි’’[84] මෙසේ ලීවේය: ‘‘අරගලයට අවශ්‍ය ද්‍රව්‍යමය බලවේගයන් ලබාගන්නේ කොහෙන්ද යන්න ප්‍රථමයෙන් සලකා බලන්නේ නැතිවම, අරගලයේ මාර්ගය දක්වන්නේ නැතිවම ආණ්ඩුවට විරුද්ධව සෘජු ලෙස අරගල කිරීම කම්කරු විමුක්ති කණ්ඩායම අපේක්ෂා කරයි.’’ අරගලයේ මාර්ගය යන වචන අවධාරණය කරන කතෘ ‘මාර්ගය’ යන වචනයට පහත සඳහන් පාසටහනද යොදයි: ‘‘වැඩ පිළිවෙළෙහි සඳහන්ව ඇත්තේ කුමන්ත්‍රණයක් ගැන නොව පොදුජන ව්‍යාපාරයක් ගැනය. එනිසා රහස්‍ය භාවයේ අරමුණු අනුව එය පැහැදිලි කළ නොහැකිය. එපමණක් නොව පොදු ජනයාට රහස් මාර්ග වලින් යාමටද නොපුළුවන. රහස් වැඩ වර්ජනයක් ගැන අපට සිතන්න පුළුවන්ද? රහස් පෙළපාලි හෝ පෙත්සම් ගැන අපට සිතන්න පුළුවන්ද?’’ (“Vademecum”, පිටු 59). මේ ලෙසට කතෘවරයා ‘ද්‍රව්‍යමය බලවේග’ (වැඩ වර්ජන හා පෙළපාලි සංවිධායකයින්) හා අරගලයේ ‘මාර්ග’ පිළිබඳ ප්‍රශ්නයට ඉතාමත් සමීප වන නමුත් ඔහු පොදුජන ව්‍යාපාරයට ‘වන්දනා’ කරන හෙයින්, එනම්, විප්ලවවාදී කටයුතු කිරීමේ අවශ්‍යතාවයෙන් අප නිදහස් කරන දෙයක් වශයෙන් එය සැලකීම නිසාද, අපගේ විප්ලවවාදී කටයුතු සඳහා අපට උනන්දුව හා දිරිගැන්වීම ගෙන දෙන්නක් ලෙසට එය වටහා නොගැනීම නිසාද ඔහු තවමත් චිත්ත වික්ෂෝප තත්වයෙන් පසුවෙයි. වැඩ වර්ජනයට සහභාගි වන අයට එය කිසිසේත් රහසක්ව තිබිය නොහැක. එහෙත්, වැඩ වර්ජනය සම්බන්ධයෙන් වූ සියළු තොරතුරු පැතිරී නොයන සේ යටපත් කිරීම සඳහා වැඩ වර්ජනයක් හා සමග පණිවුඩ හුවමාරු මාර්ග සියල්ලම කපා හැරීමට තරම් ආණ්ඩුව සුපරීක්ෂාකාරී වන නිසා එය රුසියානු කම්කරු පොදු ජනතාවට ‘රහසක්’ වී තිබෙන්නට පුළුවන. ‘දේශපාලන පොලිසියට විරුද්ධව’ විශේෂ ‘අරගලය’ ඇත්ත වශයෙන්ම අවශ්‍ය වන්නේ මෙහි දීය. එය වැඩ වර්ජනයට සහභාගි වන තරම් විශාල ජනකායක් විසින් ක්‍රියාශීලී ලෙස කරගෙන යාහැකි අරගලයක් නොවේ. මෙම අරගලය, වෘත්තියක් වශයෙන් විප්ලවවාදී කටයුතු වල යෙදී සිටින අය විසින් ‘කලාවේ සියළුම නීති රීති’ අනුව සංවිධානය කෙරෙනු අවශ්‍ය අරගලයකි. පොදු ජනතාව සාංසිද්ධික වශයෙන් අරගලයට ඇදී එන නිසා, එම කරුණම හේතු කොට ගෙන අරගලය සංවිධානය කිරීමේ අවශ්‍යතාවයෙහි අඩුවක් වන්නේ නැත. එපමණක් නොව, එයින් එම අවශ්‍යතාවය වැඩි වේ. සෑම වැඩ වර්ජනයක්ම, සෑම පෙළපාලියක්ම රහසක් කොට තබා ගැනීමෙන් පොලිසිය වැළැක්වීමට (එමෙන්ම, අපද කලින්කලට රහසිගත ලෙස වැඩ වර්ජන හා පෙළපාලි සූදානම් කිරීමටද) අප කටයුතු කරන්නේ නැත්නම්, සමාජවාදීන් වශයෙන් අපෙන් පොදු ජනතාවට ඉටුවිය යුතු යුතුකම අපි පැහැර හරින්නමෝ වෙමු. එපමණක් නොව සාංසිද්ධික ලෙස ප්‍රබෝධමත් වන පොදු ජනතාව විසින්ද වැඩි වැඩියෙන් ‘වෘත්තීය විප්ලවවාදීන්’ බිහිකරනු ලබන හෙයින් මෙම යුතුකම ඉටු කිරීමෙහි අපි සමත් වන්නෙමු (එය සිදුවන්නේ කල්බලමින් සිටින ලෙස කම්කරුවන්ට උපදෙස් දීමට අප අධිෂ්ඨාන කර නොගතහොත් පමණකි).

ඇ) කම්කරුවන්ගේ සංවිධානය සහ විප්ලවවාදීන්ගේ සංවිධානය

දේශපාලන අරගලය පිළිබඳ සංකල්පය හා 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන ආර්ථික අරගලය' පිළිබඳ සංකල්පය ඒකීභූත වශයෙන් සලකන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකුට, 'විප්ලවවාදීන්ගේ සංවිධානය' බොහෝ දුරට 'කම්කරුවන්ගේ සංවිධානය' ට එක සමාන වනු ඇතැයි අපේක්ෂා කිරීම ඉතාමත් ස්වාභාවිකය. ඇත්ත වශයෙන්ම සිදුවන්නේද එය මය. එනිසා අප සංවිධානය ගැන කථා කරන විට භාෂා දෙකකින් කථා කරනු වැනිය. නිදර්ශනයක් වශයෙන්, මා කලින් හඳුනාගෙන නොසිටි, තරමක් දුරට ස්ථිර වූ 'ආර්ථිකවාදියෙක්' සමග මා වරක් කළ සංවාදය මට හොඳට මතකය.[85] අප කථා කරමින් සිටියේ 'දේශපාලන විප්ලවය ඇති කරන්නේ කවුද' යන කුඩා පොත ගැනය. එම පොතෙහි ප්‍රධාන දුර්වලකම වූයේ එහි සංවිධානය පිළිබඳ ප්‍රශ්නය ගැන සඳහන් කර නොතිබීමය යන අදහසට වැඩිදුර යන්න මත්තෙන්ම එළඹියෙමු. අප දෙදෙනා අතර සම්පූර්ණ එකඟත්වයක් ඇතැයි යන අදහස පිළිගන්නට පටන්ගන්නා තැනට පැමිණ සිටියෙමු. එහෙත් සංවාදය තවදුර යත්ම, අප කථාකරන්නේ එකිනෙකට වෙනස් දේ ගැන බව පෙනී ගියේය. වැඩ වර්ජන අරමුදල්, අන්‍යෝන්‍ය යහ සාධක සමිති ආදිය ගැන අමතක කිරීම ගැන මගේ සංවාදකයා කතෘට චෝදනා කළ අතර, මා සිත්හි තිබුණේ දේශපාලන විප්ලවය 'ඇති කිරීම' සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වශයෙන් විප්ලවවාදීන්ගේ සංවිධානයක් පිළිබඳවය. අසමථය පැහැදිලි වීමෙන් පසු මට මතක හැටියට ආර්ථිකවාදියා සමග මා එකඟ වූ ප්‍රතිපත්තිමය ප්‍රශ්න එකක්වත් නොවීය!

අපගේ අසමථය ප්‍රභව වූයේ කුමකින්ද? ඊට කාරණා වූයේ සංවිධානය හා දේශපාලනය යන දෙ ආකාරයේම ප්‍රශ්න වලදී ආර්ථිකවාදීන් සදාකාලිකවම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයෙන් වෘත්තීය සමිතිවාදයට ඇද හැලෙමින් සිටීමයි. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ දේශපාලන අරගලය, කම්කරුවන් ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන ආර්ථික අරගලයට වඩා ඉතාමත් පෘථුලය; සංකීර්ණය. එමෙන්ම (ඇත්ත වශයෙන්ම එම හේතුව නිසාම) විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සංවිධානයද කම්කරුවන්ගේ එම අරගලය සඳහා අරමුණු කළ සංවිධානයට වඩා අනිවාරණීය වශයෙන්ම වෙනස් වූ වර්ගයේ එකක් විය යුතුය. කම්කරුවන්ගේ සංවිධානය ප්‍රථමයෙන්ම වෘත්තීය සමිති සංවිධානයක් විය යුතුය; දෙවැනිව එය හැකි තරම් දුරට පුළුල් විය යුතුය; තුන්වැනිව, පවත්නා තත්වයන් ඉඩ ලැබෙන තාක් දුරට එය හැකි තරම් ප්‍රසිද්ධ සංවිධානයක් විය යුතුය (මෙහිදී හා තවත් ඉදිරියේදී මා සඳහන් කරන්නේ අත්තනෝමතවාදී රුසියාව ගැනය). අනික් අතට විප්ලවවාදීන්ගේ සංවිධානය පළමුව හා ප්‍රධාන වශයෙන් සමන්විත විය යුත්තේ විප්ලවවාදී කටයුතු ස්වකීය වෘත්තිය වශයෙන් ගත් පුද්ගලයන්ගෙනි. (එහෙයින් මා කථා කරන්නේ, විප්ලවවාදීන්ගේ, එනම් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංවිධානය ගැනය). එවැනි සංවිධානයක සාමාජිකයන් අතර තිබිය යුතු මෙම පොදු ලක්ෂණය ගැන සලකා බලන කල ඔවුන් අතර කම්කරුවන් හා බුද්ධිමතුන් යන වැනි වෙනස් කම් සියල්ල මකා දැමිය යුතුය. වෘත්ති අතර වෙනස් කම්ද මකා හළ යුතු බව මේ අනුව කීම අවශ්‍ය නොවේ. එවැනි සංවිධානයක් අවශ්‍යයෙන්ම බොහෝ පුළුල් විය නොහැකිය; හැකි තරම් දුරට රහස්‍ය විය යුතුය, මෙම තුන්වැදෑරුම් වෙනස් කම් ගැන සලකා බලමු.

දේශපාලන නිදහස තිබෙන රටවල වෘත්තීය සංවිධානයක් හා දේශපාලන සංවිධානයක් අතර ඇති වෙනස ප්‍රමාණවත් තරමට පැහැදිලිය; වෘත්තීය සමිතිවාදය හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය අතර වෙනසද එසේම පැහැදිලිය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය හා වෘත්තීය සමිති අතර සම්බන්ධකම්, ස්වාභාවික වශයෙන්ම ඒ ඒ රටෙහි ඓතිහාසික, නීතිමය හා වෙනත් තත්වයන් අනුව වෙනස් වනු ඇත. ඒවා අඩු වශයෙන් සමීප හා සංකීර්ණ ආදී විය හැක. (අපගේ අදහසේ හැටියට ඒවා හැකිතාක් දුරට සමීප හා අවුලෙන් තොර විය යුතුය). එහෙත්, නිදහස් රටවල වෘත්තීය සමිති සංවිධානය, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සංවිධානය සමග එක සම වීම කිසිසේත් සිදු විය නොහැක. එසේ වුවද, රුසියාවේ කම්කරුවන්ගේ සියළු ආකාරයකම සම්ගම් හා අධ්‍යයන කව තහනම් කර තිබෙන නිසාද, කම්කරුවන්ගේ ආර්ථික අරගලය ප්‍රධාන වශයෙන් ප්‍රකාශ කෙරෙන ක්‍රමය වන වැඩ වර්ජනය සාපරාධී වරදක් ලෙස (සමහර විට දේශපාලන! වරදක් ලෙස පවා) සලකනු ලබන නිසාද, සර්ව බලධාරී ඒකාධිපතිත්වයේ විය ගස නිසාද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානය හා කම්කරුවන්ගේ සංවිධාන අතර සියළු වෙනස්කම් මැකී යන ආකාරයක් බැලූ බැල්මට පෙනෙන්නට තිබේ. එම නිසා අප රටේ පවත්නා තත්වයන් විසින්, එක් අතකින් ආර්ථික අරගලයේ යෙදී සිටින කම්කරුවන් දේශපාලන ප්‍රශ්න සම්බන්ධයෙන් සැලකිලිමත් වීමට 'පොළඹවනු' ලැබීමත්, අනික් අතට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය හා සමග වෘත්තීය සමිතිවාදය පටලවා ගැනීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් පොළඹවනු ලැබීමත් සිදුවේ. (තවද අපගේ ක්‍රිචෙව්ස්කි, මර්තිනව් සහ සමාගම ඉන් ප්‍රථම වර්ගයේ

'පෙළඹවීම' ගැන උත්සුක ලෙස සාකච්ඡා කරමින් සිටින අතර දෙවැනි වර්ගේ 'පෙළඹවීම නොම දකිති). සියයට අනූ නවයක්ම, 'ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන ආර්ථික අරගලයේ' ගිලී සිටින අය කෙබඳුද යනු ඇත්තෙන්ම සිතට නගා බලන්න. ඉන් සමහර දෙනෙක්, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයේ (මාස හතර සිට හය දක්වා වන) මුළු කාලය තුළම විප්ලවවාදීන්ගේ වඩාත් සංකීර්ණ සංවිධානයක අවශ්‍යතාවය ගැන කල්පනා කිරීමට කිසි කලෙකත් නොපෙළඹෙනු ඇත. අනික් අයට, සමහරවිට, වඩාත් පුළුල් ලෙස බෙදා හරිනු ලබන බර්න්ෂ්ටයින්වාදී පොත පත ලැබී, එයින් ඔවුනට 'සැමදා නීරස අරගලයේ' ඉදිරිගමනෙහි වැදගත් කම ගැන ගැඹුරු අවබෝධයක් ලැබෙනු ඇත. තවත් සමහර අය, 'නිර්ධන පංති අරගලය සමග සමීප ඓන්ද්‍රීය සම්බන්ධකම් පැවැත්වීම පිළිබඳව ලෝකයාට නව ආදර්ශයක් දීමේ අදහසින් මුළාවට පත් වනු ඇත. කිසියම් රටක් ධනේශ්වර පොරපිටියට පාතැබීමටත්, ඒ අනුව කම්කරු පංති ව්‍යාපාරයට පාතැබීමටත් ප්‍රමාද වූ තරමට, එරටේ සමාජවාදීන්ට වෘත්තීය සමිති ව්‍යාපාරයට සහභාගි වීමට හා ඊට ආධාර කිරීමට වැඩියෙන් ඉඩ තිබෙන බවත්, ඒතාක් දුරට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන සමිති පැවතීමට හේතු අඩුවන බවත් කියමින් එවැනි පුද්ගලයන් තර්ක කිරීමට පිළිවන. මේ දක්වා තර්කය සම්පූර්ණයෙන්ම නිවැරදිය. එහෙත්, අවාසනාවකට මෙන් සමහර අය ඊටත් එහා ගොස් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන්ම වෘත්තීය සමිතිවාදය සමග එකට සංකලනය කිරීම ගැන සිහින දකිති. එවැනි සිහින වලින් අපගේ සැලසුම් හා සංවිධානවල ඇතිවන හානි දයක ප්‍රතිඵලය කෙබඳුද යනු නිදර්ශනයක් වශයෙන් ''සාන්ත පීටර්ස්බර්ග් අරගල සංගමයේ'' ව්‍යවස්ථාවෙන් නුදුරේදීම අපට දක්ක හැකිය.

ආර්ථික අරගලය සඳහා වූ කම්කරුවන්ගේ සංවිධානය විය යුත්තේ වෘත්තීය සමිතිය ය. සෑම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කාරක වරයෙක්ම, හැකිතාක් දුරට, මෙම සංවිධාන වලට සහාය විය යුතුය; ඒවා තුළ ක්‍රියාශීලී ලෙස වැඩ කළ යුතුය. එසේ වුවත්, 'වෘත්තිය' සංගම්වල සාමාජිකත්වයට තෝරා ගත යුත්තේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් පමණක්ය යන ඉල්ලීම කිසිසේත් අපට යහපතක් ගෙන දෙන්නක් නොවේ. එයින් සිදු වන්නේ පොදු ජනතාව කෙරෙහි අප බලපාන ක්ෂේත්‍රය පටු කිරීමක් පමණකි. ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව අරගලය සඳහා එක්සත් විය යුතු බව වටහා ගත් සෑම කම්කරුවෙක්ම වෘත්තීය සංගම් වලට සම්බන්ධ කරගත මනාය. වෘත්තීය සංගම් මගින්, යටත් පිරිසෙයින් මෙම අවබෝධය ඇති අය සියළු දෙනාමවත් එක්සත් කරන්නේ නැති නම්, ඒවා ඉතා පුළුල් සංවිධාන නොවන්නේ නම්, ඒවායේම අරමුණු පවා කිසිසේත් ඉටු කරගත හැකි නොවේ. මෙම වෘත්තීය සංගම් පුළුල් වූ තරමට ඒවා කෙරෙහි අප පාන බලයද වැඩියෙන් පුළුල් වේ. එම බල පෑම ඇතිවන්නේ ආර්ථික අරගලයේ 'සාංසිද්ධික' සංවර්ධනය නිසා පමණක් නොව, සමාජවාදී සංගම් සාමාජිකයන් ඔවුන්ගේ සහෝදරයන් කෙරෙහි බල පෑමට දරන සෘජු හා විඥත ප්‍රයත්නයන් නිසා ද වේ. එහෙත්, පුළුල් සංවිධානයකට තදබල රහසිගත ක්‍රම යොදා ගත නොහැකිය. (ආර්ථික අරගලය සඳහා අවශ්‍ය වෙනවාට වඩා ඉතාමත් දැඩි පුහුණුවක් ඒ සඳහා අවශ්‍ය වන හෙයිනි). විශාල සාමාජිකත්වයක් අවශ්‍ය වීමත්, තදබල රහසිගත ක්‍රම අවශ්‍ය වීමත් අතර ප්‍රතිවිරෝධය විසඳා ගන්නේ කෙසේද? ඇත්ත ලෙසම කියතොත් මෙම අරමුණ ඉටු කර ගැනීමට ඇත්තේ මාර්ග දෙකක් පමණකි. එක්කෝ වෘත්තීය සංගම් නීති සහගත විය යුතුය. (සමහර රටවල සමාජවාදී හා දේශපාලන සංගම් නීත්‍යනුකූල කිරීම) නැතහොත්, සංවිධානය රහසිගතව තබා ගන්නා නමුත් බහුතර සාමාජිකත්වය සම්බන්ධයෙන් රහස්‍ය ක්‍රම අවශ්‍ය වීම ඉතාමත් අඩු වන සේ එය 'නිදහස්' හා නියමයක් නැති ලෙසට, ජර්මන් වරු කියන පරිදි lose තබාගත යුතුය.

රුසියාවේ සමාජවාදී නොවන, දේශපාලන නොවන සංගම් පවත්වා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීමට කටයුතු ආරම්භ කර තිබේ. වේගයෙන් වර්ධනය වන අපගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පංති ව්‍යාපාරය නිසා නීති සම්පාදනය කිරීමට දරන ප්‍රයත්නයන් ද වැඩි වන හා උනන්දු කෙරෙන බවට සැකයක් නැත. වැඩි වශයෙන්ම මෙම ප්‍රයත්න දරන්නේ පවත්නා ක්‍රමයේ ආධාර කරුවන් වන නමුත්, කම්කරුවන්ම අතරින්ද, ලිබරල්වාදී බුද්ධිමතුන් අතරින්ද ඒ සඳහා ප්‍රයත්න දරනු ලබන අවස්ථා ඇත. වසීලියව්ලා හා සුබාතව්ලා[86] දැනටමත් නීත්‍යානුකූල භාවයේ ධජය ඔසවා ඇත. ඕසිරව්ලා හා වෝර්ම්ස්ලා එයට සහයෝගය දීමට දැනටමත් පොරොන්දු වී ඇත. නව ප්‍රවණතාවයේ අනුගාමිකයින් දැන් කම්කරුවන් අතරද සිටිති. මෙතැන් පටන් මෙම ප්‍රවණතාවය ගණන් නොගෙන සිටීමට අපට පුළුවන් කමක් නොමැත. අප එය සැලකිල්ලට ගෙන කටයුතු කරන්නේ කොහොමද? මෙම කාරණය සම්බන්ධයෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර අදහස් දෙකක් තිබිය නොහැකිය. මෙම ව්‍යාපාරය තුළ සුබාතව්ලා සහ වසීලියව්ලාත්, පොලිස්කාරයන් හා පූජකවරුනුත් කරන ඕනෑම කටයුත්තක් ස්ථිරසාර ලෙස හෙළිදරව් කරමින් ඔවුන්ගේ සැබෑ බලාපොරොත්තු ගැන කම්කරුවන්ට විස්තර කර දීමට අපි කටයුතු

කළ යුතු වෙමු. කම්කරුවන්ගේ නීත්‍යානුකූල රැස්වීම් වලදී ලිබරල් දේශපාලනඥයන් කථා කරන්නේ, සාමකාමී පංති සහයෝගිතාවය සුදුසුය යන බලවත් විශ්වාසයෙන් හෝ, නැතහොත්, බලවතුන්ගේ ප්‍රසාදයට ලක් වීමේ කැමැත්තෙන් හෝ, එසේත් නැතහොත් හුදෙක්ම ඔවුන්ගේ අමන ස්වභාවය නිසාම හෝ වුවද ඒ ගැන නොතකා අපි ඔවුන්ගේ කථා වලින් ඇසෙන බේරුම්කාරී හා ‘සංගත’ තාල සියල්ලක්ම හෙළිදරව් කළයුතු වෙමු. අවසාන වශයෙන් එවැනි විවෘත රැස්වීම් වලදී හා අවසර ලත් සමිතිවලදී ‘උග්‍ර එවුන්’ සොයා ගැනීමටත්, නීති සහගත සංවිධාන ප්‍රයෝජනයට ගනිමින් නීති විරෝධී සංවිධාන තුළට කුපිතකාරී චර පුරුෂයන් රිංගවීමට දරන වෑයමක් වශයෙනුත්, පොලිස්කාරයන් නිතර අටවන උගුල් සම්බන්ධයෙන් අපි කම්කරුවන්ට අනතුරු හඟවමු.

මේ සියල්ල කිරීමෙන් අදහස් කරන්නේ, කම්කරු පංති ව්‍යාපාරය නීත්‍යානුකූල කිරීමෙන් සුබාතව්ලාට නොව කල්‍යාමේදී අපට වාසි වන බව අමතක කිරීම නොවේ. එපමණක් නොව, තිරිඟු පැල අතරින් වල් පැලෑටි වෙන්කර ගැනීමට උපකාර වන්නේ ද අපගේ හෙළිදරව් කිරීමේ ව්‍යාපාරය මය.වල්පැලෑටි මොනවාද යනු අපි දැනටමත් පෙන්වා දී ඇත්තෙමු. තිරිඟු පැල යනුවෙන් අප අදහස් කරන්නේ, ඉතාමත් නොදියුණු කොටසද ඇතුළුව, එන්න එන්නම වැඩිවන කම්කරු සංඛ්‍යාවන්ගේ අවධානය සමාජ හා දේශපාලන ප්‍රශ්න කෙරේ ආකර්ෂණය කිරීම හා විප්ලවවාදීන් වන අප අවශ්‍යයෙන්ම නීත්‍යානුකූල වන (නීත්‍යානුකූල පොත් බෙදා හැරීම, අන්‍යොන්‍ය ආධාර ආදී) කාර්‍යයන්ගෙන් නිදහස් වීමය. එම නීත්‍යානුකූල කාර්‍යයන් වර්ධනය වීමෙන් නිසැකවම අපගේ උද්ඝෝෂණය සඳහා වැඩි වැඩියෙන් කරුණු ලැබෙනු ඇත. මේ අර්ථයෙන් සුබාතව්ලාට හා ඕසිරව්ලාට අපි මෙසේ කිව මනාය; කිව යුතුය. එය කරගෙන යන්න මහත්වරුනි; පුළුවන් තරම් හොඳින් එය කරන්න! ඔබ (ඍජු ප්‍රකෝප කිරීමකින් හෝ ‘ස්ත්‍රුවේවාදයේ’[87] ආධාරය ඇතිව ‘අවංකව’ කම්කරුවන් දූර්මුඛ කිරීම මගින් හෝ) කම්කරුවන්ගේ මාර්ගයේ උගුලක් ඇටවූ විටෙක ඔබ හෙළිදරව් වන තැනට අපි කටයුතු කරන්නෙමු. එහෙත් සැබවින්ම ඔබ ඉදිරි පියවරක් ගත් විටෙක, එය ඉතාමත් ‘බියගුළු වටවංගුවක්’ වුවත් අපි මෙසේ කියමු: කරුණා කර නොනැවත ඉදිරියටම යන්න! තවද සැබෑ ඉදිරි පියවරක් විය හැකි එකම පියවර තැබීම වන්නේ යම්තමින් හෝ කම්කරුවන්ගේ සටන් ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීමයි. එවැනි සෑම ව්‍යාප්ත වීමක්ම අපගේ වාසියට හේතුවේ. එයින් නීත්‍යානුකූල සමිති ඇතිවීම ඉක්මන් කෙරෙන අතර, එම සමිති වර්ගය කුපිතකාරී චරපුරුෂයන් විසින් සමාජවාදීන් එහු බඳිනා භූමියක් නොව සමාජවාදීන් විසින් අනුගාමිකයින් දිනාගන්නා භූමියක් වන්නේය. කොටින් කියතොත්, අපගේ කර්තව්‍ය වී තිබෙන්නේ වල් පැලෑටි මර්දනය සඳහා සටන් කිරීමයි. අපගේ කර්තව්‍ය මල් පෝච්චිවල තිරිඟු වැවීම නොවේ. වල් පැලෑටි උදුරා දැමීමෙන් අප කරන්නේ තිරිඟු වැවෙනු පිණිස බිම ශුද්ධ කිරීමයි. අපනාසි ඉවානවිච්ලා හා පුල්හේරිය ඉවානව්නලා[88] ඔවුන්ගේ මල්පෝච්චි කෙත බලාගෙන සිටිද්දී අපි අද වල් නෙළීම සඳහා පමණක් නොව, හෙට අස්වැන්න නෙළීම සඳහාද නෙළුම් කරුවන් සූදානම් කළ යුතුවෙමු.*

එම නිසා, හැකි තරම් දුරට රහස්‍ය භාවය අඩු හා හැකි තරම් දුරට විශාල වූ වෘත්තීය සමිතියක් හැදීමේ ප්‍රශ්නය නීත්‍යානුකූල කිරීමේ මාර්ගයෙන් විසඳාගත නොහැකි බව අපට පෙනේ. (එහෙත් එවැනි විසඳීමක් කර ගැනීම අර්ධ හෝ අවස්ථාවක් පවා තිබෙන බව පෙන්වීමට සුබාතව්ලා හා ඕසිරව්ලා සමත් වෙති නම් අපි බෙහෙවින් සතුටු වෙමු!). රහසිගත වෘත්තීය සමිති තිබේ. (අප නිශ්චිත වශයෙන්ම දන්නා පරිදි) මෙම ක්‍රියාමාර්ගය අනුගමනය කරන කම්කරුවන්ට හැකි සෑම ආධාරයක්ම දිය යුතු වේ. වෘත්තීය සමිති සංවිධාන, ආර්ථික අරගලය සංවර්ධනය කිරීමේදී හා තහවුරු කිරීමේදී ඉතාමත් අගනා කොටසක් ඉටු කිරීමෙහි සමත් වෙනවා පමණක් නොව, දේශපාලන උද්ඝෝෂණයට හා විප්ලවවාදී සංවිධානයට ද ඉතා වැදගත් ආධාරකයන් විය හැක. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා සහ වැඩීගෙන එන වෘත්තීය සමිති ව්‍යාපාරය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂා කරන මාර්ගය ඔස්සේ මෙහෙයවනු සඳහා අප ප්‍රථමයෙන්ම කළ යුත්තක්

---

* වල් පැලෑටි වලට විරුද්ධව ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය ගෙන ගිය ව්‍යාපාරය ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ මෙම කෝපාවිෂ්ඨ ප්‍රකාශයට හේතුවිය: ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය කියන හැටියට මෙම කාලයේ සංකේතය හැටියට ගැනෙන්නේ (වසන්තයේ) ශ්‍රේෂ්ඨ සිදුවීම්වලට වඩා කම්කරු පංති ව්‍යාපාරය ‘නීත්‍යානුකූල කිරීමට’ සුබාතව් ඒජන්තලා දරන කාලකණ්ණි උත්සාහයන්ය. මෙම කරුණු එයට හරස් වන බව එයට නො පෙනෙයි; ආණ්ඩුවේ ඇසින් බලන කල කම්කරු පංති ව්‍යාපාරය තර්ජනාත්මක මට්ටමක් ගෙන ඇති බව තහවුරු වේ’’ (‘‘සම්මේලන දෙකක්’’, පිටු 27). මේ සියල්ලටම අප චෝදනා කළ යුත්තේ ‘ජීවිතයේ බලවත් ඉල්ලීම් වලට කන් නොදෙන විශුද්ධිවාදීන් ගේ ‘පොතේගුරුවාදය’ටයි. යාරයක් උස තිරිඟු දැකීම ප්‍රතික්ෂේප කරන ඔවුහු අඟලක් උස වල් පැලෑටි පිරති! ‘රුසියානු කම්කරු පංති ව්‍යාපාරය හා සම්බන්ධයෙන් අරමුණු පිළිබඳ විකෘති හැඟුමක්’ මෙයින් හෙළි නොවන්නේද (එම, පිටු 27) ?

පස් වසරකට ආසන්න කාලයක් තිසිසේ සාන්ත පීටර්ස්බර්ග් 'ආර්ථිකවාදීන්' විසින් පෝෂණය කරන ලද සැලැස්මෙහි අමනෝඥ ස්වභාවය පැහැදිලිව තේරුම් ගැනීමයි. එම සැලැස්ම (''රබෝචය මිස්ල්'' අංක 1 පත්‍රයෙහි හා 'ලිස්තොක් ''රබෝත්නික'''' අංක 9—10, පිටු 46 හි) 1897 ජූලි මාසයේ පළ කරන ලද ''කම්කරුවන්ගේ අන්‍යොන්‍ය යහසාධක අරමුදලක් සඳහා ව්‍යවස්ථා'' මගින් මෙන්ම, 1900 ඔක්තෝබරයේදී නිකුත් කළ (විශේෂ පත්‍රිකාවක් වශයෙන් පළ කරන ලදුව, ''ඉස්ක්‍රා'' අංක 1 හි සඳහන්) ''කම්කරු වෘත්තීය සමිති සංවිධානයක් සඳහා ව්‍යවස්ථා'' මගින්ද ඉදිරිපත් කර තිබේ. මෙම ව්‍යවස්ථා මාලා දෙකෙහිම එක ප්‍රධාන දුර්වලකමක් ඇත. අනම්‍යශීලී නියමිත ව්‍යුහයක් තුළ පුළුල් කම්කරු සංවිධානයක් රුවාලීම හා සමගම, එය විප්ලවවාදීගේ සංවිධානය සමග පටලවා ගැනීම ඒවායින් සිදුවේ. පසුව සඳහන් කළ ව්‍යවස්ථා ඉතාමත් සවිස්තර ලෙස කෙටුම්පත් කර ඇති හෙයින් ඒවා ප්‍රථමයෙන් ගෙන බලමු. මෙහි ව්‍යවස්ථා දක්වෙන කොටසෙහි ඡේද පණස් දෙකකි. ඉන් විසි තුනක සඳහන් වන්නේ ක්‍රියා කරන ක්‍රමය හා සෑම පැක්ටරියකම සංවිධානය කිරීමට අරමුණු කරන ලද ('දස දෙනෙකුගේ උපරිම සංඛ්‍යාවකින් යුත්') හා එමෙන්ම 'මධ්‍යම (පැක්ටරි) කණ්ඩායම්' තෝරා පත්කරන 'කම්කරු කව' ගැනය. 'පැක්ටරියේ නැතහොත් වැඩපලේ සිදුවන සියල්ල නිරීක්ෂණය කරන' මධ්‍යම කණ්ඩායම 'සියළු සිදුවීම් ගැන වාර්තාවක් තබා ගනියි,' යනුවෙන් 2 වැනි ඡේදයේ සඳහන් වේ. 'මධ්‍යම කණ්ඩායම දයකයන් වෙත මාසික මුදල් වාර්තාවක් ඉදිරිපත් කරයි (ඡේදය 17) ආදී වශයෙන් සඳහන්ව ඇති 'දිස්ත්‍රික්ක සංවිධානය' සඳහා ඡේද දහයක් වෙන්කර ඇත. ඡේද දහනමයක් වෙන් කර තිබෙන්නේ ''කම්කරුවන්ගේ සංවිධානයේ කාරක සභාව'' හා ''සාන්ත පීටර්ස්බර්ග් අරගල සංගමයේ කමිටුව අතර වන ඉතාමත් සංකීර්ණ සම්බන්ධකම් වෙනුවෙනි. (සාන්ත පීටර්ස්බර්ග් ''අරගල සංගමය'' සමන්විත වන්නේ සෑම දිස්ත්‍රික්කයකින්ම තෝරා පත් කරගත් නියෝජිතයන් ගෙන්ද, ''ප්‍රචාරක කණ්ඩායම්, පලාත් සමග හා විදේශගත සංගමය සමග සම්බන්ධකම් පවත්වන කණ්ඩායම් හා ගබඩා, ප්‍රකාශන සහ මුදල් පාලනය කරන කණ්ඩායම්'' යන ''විධායක කණ්ඩායම්'' වල නියෝජිතයන් ගෙන්ද වේ).

කම්කරුවන්ගේ ආර්ථික අරගල හා සම්බන්ධයෙන් වූ කල, සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය — 'විධායක කණ්ඩායම්'! 'ආර්ථිකවාදියා' ගේ අදහස්, සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයෙන් වෘත්තීය සමිතිවාදය කරා අපගමනය කරන බවත්, නිර්ධන පංතියේ සමස්ත විමුක්ති අරගලයටම මග පෙන්වීමෙහි සමත් විප්ලවවාදීන්ගේ සංවිධානයක් ගැන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා පළමුවෙන් හා ප්‍රධාන වශයෙන් ඔහුගේ සැලකිල්ල යොමු කළ යුතුය කියවෙන කිසියම් හෝ අදහසක් ඔවුනට කොතරම් අන්‍යතරද යනුත් මීට වඩා කැපී පෙනෙන ලෙසින් පෙන්වා දීම අපහසු දෙයක් වීමට ඉඩ තිබේ. 'කම්කරු පංතියේ දේශපාලන විමුක්තිය' ගැන හා 'සාර්වාදී දූෂ්ඨ පාලනයට' විරුද්ධව කරන අරගලය ගැන කථා කරනු හා සමගම මෙවැනි ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමෙන් අදහස් කෙරෙන්නේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ නියම දේශපාලන කර්තව්‍යයන් ගැන කිසිම වැටහීමක් නොමැති බවයි. පොදු ජනතාව අතර හැකි පුළුල්තම පරිමානයෙන් දේශපාලන උද්ඝෝෂණය කරගෙන යාමත්, රුසියානු අත්තනෝමතවාදයේ සෑම අංශයක්ම හා රුසියාවේ විවිධ සමාජ පංතිවල විශේෂ අංග ලක්ෂණයන්ද මතු කොට දක්වන උද්ඝෝෂණයක් ගෙනයාමත් අවශ්‍යය යන වැටහීම පිළිබඳ මන්දලෝකයක්වත් පණස් ගණනක් වූ ඡේද අතුරෙන් එකකින්වත් පෙනෙන්නේ නැත. වෘත්තීය සමිති සංවිධානය කරනු ලබන්නේ කර්මාන්ත පදනම් කරගෙන වන නමුත් ඒ ගැන කිසිම සඳහනක් කර නැත. එනිසා, මෙවැනි ව්‍යවස්ථා වලින් දේශපාලන අරමුණු තබා වෘත්තීය සමිති අරමුණු පවා ඉටු කර ගැනීමට ප්‍රයෝජනයක් සිදු නොවේ.

එහෙත් මෙම 'ක්‍රමයේ' ඉතාමත් ස්වභාව නිරූපී අංග ලක්ෂණය එහි දක්නට ලැබෙන පුදුමාකාර මුදුන බර ස්වභාවයයි. එකාකාර හා හාස්‍ය ජනක තරම් සුළු ස්ථිර ව්‍යවස්ථා වලියකින් හා මට්ටම් තුනකින් යුත් තෝරා පත්කිරීම් ක්‍රමයකිනුත් සෑම පැක්ටරියක්ම එහි 'කාරක සභාව' සමග එකට බැඳීමට එම ක්‍රමයෙන් උත්සාහ කෙරේ. 'ආර්ථිකවාදයේ' පටු අදහසින් කොටු වූ සිත, අනවශ්‍ය කාර්යයන් හා නිලධාරිවාදය පිළිබඳ දුර්ගන්ධය නිසැක ලෙසම විහිදුවන විස්තර අතරට වැදී මුළා වී ඇත. භාවිතයේදී ව්‍යවස්ථා ඡේදයන් අතුරෙන් හතරෙන් තුනක්ම කිසි කලෙකත් ක්‍රියාත්මක නොකෙරේ. අනිත් අතට, සෑම පැක්ටරියකම මධ්‍යම කණ්ඩායමක් සහිත මෙම වර්ගයේ 'රහස්' සංවිධාන කරණකොට ගෙන පොලිස්කාරයින්ට බොහෝ පහසුවෙන් ඉතා විශාල පරිමානයේ වැටලීම් කළ හැකි වේ. පොලන්ත සහෝදරවරුද ව්‍යාපාරයේ මීට සමාන අවධියක් පසු කළහ; පැතිරි ගිය පරිද්දෙන් කම්කරුවන්ගේ යහ සාධක අරමුදල් සංවිධානය කිරීම ගැන සෑම දෙනාම උදම් වූහ. එහෙත් එවැනි සංවිධාන වලින් සිදුවන්නේ පොලිස් කාරයිනට සරු අස්වැන්නක් ලබා දීම පමණක් වන බව ඔවුන් දුටු හෙයින් ඔවුන් ඉතා ඉක්මණින්ම මෙම අදහස ඉවත ලූහ. අප සිත තුළ තිබෙන්නේ සිර භාරයට ගැනීම බහුල කිරීම නොවේ නම්,

පොලිස් කාරයන් තෘප්තියට පත්කිරීමේ අදහසක් අපට නැත්නම්, අප කල්පනා කරන්නේ පුළුල් කම්කරු සංවිධාන ගැන නම්, එවිට එම සංවිධාන අනම්‍යශීලී විධිමත් ව්‍යුහයකින් තොරව පවත්වා ගැනීමට අපි වග බලාගත යුත්තෙමු. නමුත් එසේ වුවහොත් ඒවාට ස්වකීය කාර්යයන් ඉටු කළ හැකි වේද.

මෙම කාර්යයන් මොනවාදැයි බලමු. ''පැක්ටරියේ සිදුවන සියල්ල නිරීක්ෂණය කර සිදුවීම් ගැන වාර්තාවක් තබා ගැනීම' (ව්‍යවස්ථාවල 2 වැනි ඡේදය). මෙම කටයුත්ත සඳහා අපට විධිමත් ලෙස පිහිටුවන ලද කණ්ඩායමක් ඇත්ත වශයෙන්ම අවශ්‍ය වේද? විශේෂ කණ්ඩායම් පිහිටුවන්නේ නැතිව, නීති විරෝධී ප්‍රවෘත්ති පත්‍රවල කෙරෙන ලිපි හුවමාරුව මගින් මෙම කාරණය වඩාත් සාර්ථක ලෙස ඉටු කරගත හැකි නොවේද?''... කර්මාන්ත ශාලාවේ තත්වයන් වැඩි දියුණු කර ගැනීම සඳහා වූ කම්කරුවන්ගේ අරගලයට නායකත්වය දීම'' (3 වැනි ඡේදය). මේ සඳහා නියමිත සංවිධාන ආකෘතියක් අවශ්‍ය නොවේ. කම්කරුවන්ගේ ඉල්ලීම් මොනවාද යනු සාමාන්‍ය සංවාදයේදී වටහා ගෙන ඒවා පත්‍රිකාවකින් ප්‍රකාශයට පත්කිරීම පිණිස විප්ලවවාදීන්ගේ (පුළුල් නොවන) පටු සංවිධානයක් වෙත යැවීම ඕනෑම කල්පනාකාරී උද්ඝෝෂකයෙකුට කළ හැකි දෙයකි. ''...රූබලයකට කොපෙක් දෙක බැගින් දායක මුදල් ගෙවනු ලබන අරමුදලක් සංවිධානය කර (9 වැනි ඡේදය) ඊළඟට දායකයින්ට මාසික මුදල් වාර්තාවක් ඉදිරිපත් කිරීම'' (17 වැනි ඡේදය). තම දායක මුදල් නො ගෙවන සාමාජිකයන් නෙරපීම (10 වැනි ඡේදය) ආදී වශයෙනි. මෙයනම් පොලිසියට ස්වර්ගයක් බඳුය: ''මධ්‍යම පැක්ටරි අරමුදලේ'' රහස්‍ය භාවය පසාරු කරගෙන ගොස්, මුදල් රාජසන්තක කර, හොඳම අය සිරභාරයට ගැනීම තරම් ඔවුනට පහසු වන තවත් දෙයක් නොමැති වනු ඇත. කවුරුත් දන්නා (ඉතා පටු සහ ඉතා රහසිගත) සංවිධානයක නිල මුද්‍රාව සහිත කොපෙක් එකේ හෝ කොපෙක් දෙකේ කූපන් නිකුත් කිරීමෙන් හෝ කිසිම වර්ගයක කූපන් නොමැතිව හෝ මුදල් එකතු කිරීම හා නීතිවිරෝධී පුවත් පතක ගුප්ත ආකාරයෙන් වාර්තා පළකිරීමත් වඩාත් සරල නොවන්නේද? එමගින් අරමුණු ඉටු කර ගත හැක. එහෙත් එවිට පොලිසියේ හෝඩුවාවන් සොයා ගැනීමේ කටයුත්ත සිය ගුණයකටත් වැඩියෙන් දුෂ්කර වනු ඇත.

මට මෙසේ තවදුරටත් ව්‍යවස්ථා විග්‍රහ කළ හැකි නමුත් මෙතෙක් කියා තිබෙන කරුණු සෑහේයයි සිතමි. ප්‍රධාන දිස්ත්‍රික්ක වල වගකිව යුතු නියෝජිතයින් සිටින හා රහසිගත භාවයේ ඉතාමත් තදබල නීති සියල්ලෙන්ම විප්ලවවාදීන්ගේ සංවිධානය හා සමග බැඳුනු ඉතාමත් විශ්වාසදායක, වැඩිම පළපුරුද්දක් ඇති හා දැඩිතම කම්කරුවන්ගේ අරටු කොටස වශයෙන් ගත හැකි කුඩා හා මනාව ඒකාබද්ධ වූ මූලිකයන් කණ්ඩායමකට පොදු ජනතාවගේ පුළුල්තම සහයෝගය ලබාගත් විට, එයට විධිමත් සංවිධානයක් නොමැතිවම වෘත්තීය සමිති සංවිධානයකට අදාල සියළුම කාර්යයන් ඉටු කළ හැකි වනවා පමණක් නොව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට ගැලපෙන ආකාරයටද එය කළ හැකි වේ. පොලිස් කාරයන් කොතෙකුත් සිටියදී, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී වෘත්තීය සමිති ව්‍යාපාරයේ තහවුරු තාවය හා සංවර්ධනය ඇති කර ගත හැක්කේ මේ මාර්ගයෙන් පමණකි.

එතරම් lose*, නියමාකාරයෙන් පිහිටුවා නැති, ඒ තබා බඳවාගත් හා ලියා පදිංචි සාමාජිකත්වයක් පවා නැති සංවිධානයක්, කිසිසේත් සංවිධානය යන නමින් හැඳින් විය නො හැකි යයි කියමින් කෙනෙකුට විරුද්ධ වීමට පුළුවන. සමහර විට එය එසේ විය හැක. වැදගත් වන්නේ නම නොවේ. වැදගත් වන්නේ, අපේක්ෂා කරන සියළුම දේ ''සාමාජිකත්වයක් නැති සංවිධානයෙන්'' නියත ලෙසට ඉටුවීම හා අනාගත වෘත්තීය සමිති හා සමාජවාදය අතර දැඩි සම්බන්ධයක් නොපිරිහෙලා ඇති කිරීමය. සර්වබලධාරී ඒකාධිපතිත්වය යටතේ නිලවරණ, වාර්තා සහ සර්වජන ඡන්දය ආදිය සහිතව කම්කරුවන්ගේ පුළුල් සංවිධානයක් පවත්වනු ඇත්තේ හුදෙක්ම දුස්සාධ්‍ය මනෝරාජිකවාදියෙක් පමණකි.

මෙයින් ගත හැකි ආදර්ශය සරලය. විප්ලවවාදීන්ගේ ශක්තිමත් සංවිධානයකින් සැදුම්ලත් දැඩි පදනමක් ඇතිව අපි කටයුතු අරඹන්නමෝ නම්, අපට ව්‍යාපාරයේ ස්ථායී තාවය තහවුරු කළ හැකි වන අතරම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සහ නියම වෘත්තීය සමිතියේද යන දෙකෙහිම අරමුණුත් ඉටු කළ හැකි වේ. එසේ වුවද, පොදු ජනතාවට වඩාත් පහසුවෙන් ළඟා විය හැකියයි කියන (නමුත් ඇත්ත වශයෙන්ම පොලිස් ඔත්තුකරුවන්ට පහසුවෙන් ළඟා වෙනු හැකි හා පොලිස් කාරයින්ට විප්ලවවාදීන් වෙත ළඟාවීම ඉතාමත් පහසු කරන) පුළුල් කම්කරු සංවිධානයක් ඇතිව අපි කටයුතු කරන්නමෝ නම් අපට අරමුණු දෙකෙන් එකක්වත් ඉටු කර ගැනීම නුපුළුවන් වේ: අපට භාවිතයෙන් ලැබුණු ක්‍රම අත් හැරීම කළ නො හැකි වේ, එමෙන්ම අප විසිරී සිටින නිසා හා පොලිසිය අපගේ බලවේගයන් නිරතුරුවම කඩා කප්පල් කරන නිසා එවිට අප කරන්නේ සුබාතව් හා ඕසිරව්

---

* ලිහිල්. සංස්කාරක

වර්ගයේ වෘත්තීය සමිති වෙත ළඟා වීම පොදු ජනයාට වඩාත් පහසු කිරීම පමණකි.

හරි ආකාරව කථා කරතොත් විප්ලවවාදීන්ගේ සංවිධානයේ කාර්‍යයන් විය යුත්තේ මොනවාද? මේ ප්‍රශ්නය ගැන සවිස්තරව කරුණු ඉදිරිපත් කරන්නෙමු. එතෙකුදු වුවත් ස්වකීය ස්වභාවය මනාව පිළිබිඹු කරමින් අපගේ ත්‍රස්තවාදියා ඉදිරිපත් කරන තර්කයන් ප්‍රථමයෙන් පරීක්ෂා කර බලමු. මෙම කාරණය සම්බන්ධයෙන්ද ඔහු ‘ආර්ථිකවාදියා’ගේ යාබද නිවසේ සිටින අසල්වැසියා වන්නේය (ශෝක ජනක ඉරණමකි!). කම්කරුවන් සඳහා පළකරනලද ‘‘ස්වබෝද’’ පත්‍රයේ ප්‍රථම කලාපයෙහි ‘‘සංවිධානය’’ යන මාතෘකාව යටතේ එන ලිපියක් අන්තර්ගතය. එම ලිපියේ කතෘ, ඔහුගේ මිතුරන් වන ඉවානව-වස්නිසියන්ස්ක් හි ‘ආර්ථිකවාදී’ කම්කරුවන් ආරක්ෂා කිරීමට උත්සාහ දරයි. ඔහු මෙසේ ලියයි:

> ‘‘පොදු ජනයා නිහඬව හා අවබෝධයෙන් තොරව සිටින විට, ව්‍යාපාරය සාමාන්‍ය ජනතාව ගෙන් මතුවී නො එන විට, එය නරක දෙයකි. නිදර්ශනයක් වශයෙන් විශ්වවිද්‍යාල නගරයක ශිෂ්‍යයන් ග්‍රීෂ්ම ඍතුවේ හෝ වෙනත් නිවාඩුවක් සඳහා නිවෙස් බලා ගිය විට ඒ වහාම කම්කරු ව්‍යාපාරය ඇනහිටින්නේය. පිටතින් තල්ලු කිරීමට සිදුවී ඇති කම්කරු ව්‍යාපාරයක් සැබෑ බලවේගයක් බවට පත්විය හැකිද? නැත. ඇත්තෙන්ම... එය තවමත් ඇවිදින්නට උගෙන ගෙන නැත. එය තවමත් ගෝල තත්වයේ පසුවෙයි. සෑම කාරණයක්ම සම්බන්ධයෙන් එහි තත්වය එයයි. ශිෂ්‍යයන් යන්ට ගිය විට සියල්ලම ඇන හිටියි. ඉතාමත් දක්ෂ අය සිරභාරයට ගනු ලැබේ. යොදය ඉවත් කරනු ලැබේ — එවිට කිරි ඇඹුල් රස වෙයි. ‘‘කාරක සභාව’’ අත් අඩංගුවට ගතහොත් අළුත් කාරක සභාවක් පිහිටුවනු හැකි වන තෙක් සියල්ලම ඇනහිටියි. ඊළඟට පිහිටුවනු ලබන්නේ කුමන ආකාරයේ කාරක සභාවක්ද යනු කිසිවෙකුත් දන්නේ නැත. එය කලින් එකට කිසිසේත් සමාන නොවන්නට ඉඩ තිබේ. කලින් කාරක සභාව එක දෙයක් කීය; ඊළඟ එක ඊට හාත්පසින්ම විරුද්ධ දෙය කියන්නට ඉඩ ඇත. ඊයේ හා හෙට අතර සම්බන්ධය බිඳී ඇත. අතීත අත්දැකීම් අනාගත මාර්ග දේශකයෙක් වශයෙන් ප්‍රයෝජනවත් වන්නේ නැත. මේ සියල්ල සිදුවන්නේ පොදු ජනතාව අතර ගැඹුරට මුල් විහිදී නොමැති නිසායි. වැඩ කරගෙන යනු ලැබෙන්නේ මෝඩයන් සියයක් විසින් නොවේ; ඥානවන්තයන් දුසිමක් විසිනි. ඥානවන්තයින් දුසිමක් සැනෙකින් පිස දැමිය හැකිය. නමුත් සංවිධානය ජනතාව වැලඳ ගෙන සිටින කල, සියල්ල ඔවුන් කෙරෙන් ආරම්භ වන කල්හි, කවුරු කොතරම් උත්සාහ කළත් එම උත්තම ව්‍යාපාරය විනාශ කළ නොහැකිය.’’ (පිටු 63).

කරුණු නිවැරදි ලෙස විස්තර කර තිබේ. අපගේ ආධුනික ස්වභාවයේ පින්තූරය මැනවින් ඇඳ තිබේ. එහෙත් එම නිගමන, ඒවායේ අමන ස්වභාවය හා දේශපාලන උපක්‍රම විරහිත භාවය සලකා බලන කල, එය සුදුසු වන්නේ ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයටය. කතෘවරයා, ‘මුල්’ වල ගැඹුර ගැන වූ දර්ශනික හා සමාජ ඓතිහාසික ප්‍රශ්න හා සමග පොලිස් හමුද භටයින්ට විරුද්ධව සටන් කිරීමේ හොඳම ක්‍රමය ගැන වූ විධිමාත්‍ර හා සංවිධානමය ප්‍රශ්නයන් පටලවා ගන්නා හෙයින්, එම නිගමන වලින් අමන ස්වභාවයේ උච්ඡ ස්ථානය පිළිබිඹු කෙරෙයි. නරක නායකයන් කෙරෙන් හොඳ නායකයන් වෙත ආයාචනා කරනු වෙනුවට පොදුවේ නායකයන් කෙරෙන් ‘පොදු ජනතාව’ වෙත ආයාචනා කිරීම නිසා, එම නිගමනවලින් දේශපාලන උපක්‍රම විරහිත භාවයේ උච්ඡ අවස්ථාවද පිළිබිඹු කෙරෙයි. මෙය සංවිධානමය වශයෙන් අප ආපස්සට ඇදීමට දරන ප්‍රයත්නයකි: දේශපාලන උද්ඝෝෂණය වෙනුවට ඇවිස්සුම් කාරී ත්‍රස්තය ආදේශ කිරීමෙන් ආපස්සට අදිනවාට සමාන දෙයකි. ‘‘ස්වබෝද’’ පත්‍රයෙන් ඉදිරිපත් කර ඇති අවුල් ජාලයෙහි සදෙස් තැන් කොතරම් තිබේ දැයි කිවහොත්, එහි පටලැවිලි බේරුම් කිරීමට කොතැනින් පටන් ගනිම්ද යන්න තෝරා ගැනීමේ අපහසුවෙන් විමති වෙමි (embarras de richesses). පැහැදිලිකම තකා නිදර්ශනයක් ගැන සඳහන් කරමින් පටන්ගැනීමට අදහස් කරමි. ජර්මානුන් ගැන සිතා බලමු. ඔවුන්ගේ සංවිධානය පොදු ජන සංවිධානයක් බවත්, ජර්මනියේ සියළු දේම ආරම්භ වන්නේ පොදු ජනතාව කෙරෙන් වන බවත්, එහි කම්කරු පංති ව්‍යාපාරය ඇවිදින්නට උගෙන ගෙන තිබෙන බවත් ප්‍රතික්ෂේප නො කෙරෙනු ඇතැයි විශ්වාස කරමි. එහෙත් මෙම දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා, ඔවුන්ගේ විශ්වාසවත් නායකයන් ‘දුසිම’ අගය කරන ආකාරයත්, ඔවුන් කෙරෙහි තදින් එල්බ සිටින ආකාරයත් බලන්න. පාර්ලිමේන්තුවේ ඔවුනට විරුද්ධ පක්ෂවල මන්ත්‍රී වරු නොයෙක් වර මෙසේ කෑගසා කියා ඇත: ‘‘ඇත්තෙන්ම ඔබ නම් හරිම ප්‍රජාතන්ත්‍රවාදීන් වෙති! ඔබේ ව්‍යාපාරය කම්කරු පංති ව්‍යාපාරයක් වන්නේ නමින් පමණකි; සෑමවිටම සැබවින්ම පෙනෙන්නට සිටින්නේ එකම නායක කල්ලියමය; අවුරුදු පතාම, එකම බෙබෙල්ය; එකම ලිබ්ක්නෙහ්ටය. එය දශක ගණන් තිස්සේ වෙනස් නො වී පවතී. තෝරා පත්තර ගන්නවායයි කියන ඔබේ කම්කරු නායකයන් අධිරාජයා පත්කරන නිලධාරීන්ටත් වඩා ස්ථිර වෙති!’’ එහෙත් ‘නායකයන්ට’ විරුද්ධව ‘පොදු ජනයා’ උසිගැන්වීමට, පොදු ජනයා තුළ අයහපත් බල ලෝභී හැඟීම් ඇවිස්සීමට හා පොදු ජනතාවගේ ‘ඥානවන්ත මිනිසුන් දුසිම’ කෙරෙහි පොදු ජනයා තබා ඇති විශ්වාසය දුර්වල කිරීමෙන්, ව්‍යාපාරයේ දැඩි ස්වභාවය හා ස්ථායීත්වය

සොරාගැනීමට දරන මෙම කෛරාටික ප්‍රයත්නයන් බලා ජර්මානුන් කරන්නේ සිනාසීම පමණකි. ජර්මානුන් තුළ ප්‍රමාණවත් පමණින් දේශපාලත චින්තනය වර්ධනය වී ඇත. එමෙන්ම, ඔවුන් ප්‍රමාණවත් තරම් දේශපාලන අත්දැකීම්ද ලබා ඇත. එනිසා, වෘත්තීයමය පුහුණුවක් ලැබූ, දීර්ඝ පළ පුරුද්දෙන් ශික්ෂණය ලැබූ, මනා සංගතියෙන් වැඩ කටයුතු කරන, විශ්වාසවත් හා දක්ෂ නායකයන් ‘දූසිම’ (දක්ෂයන් සිය ගණනින් උපදින්නේ නැත) නොමැතිව, වර්තමාන සමාජයේ කිසිද පංතියකට අධිෂ්ඨාන සහගත අරගලයක් කළ නොහැකි බව ඔවුන් අවබෝධ කරගෙන සිටිති. ‘මෝඩයන් සියයට’ බොරු වර්ණනා කළා වූ, ඔවුන් ‘ඥානවන්ත මිනිසුන් දූසිමට’ වඩා උච්ඡස්ථානයේ ලූ, පොදු ජනයාගේ ‘ගොරෝසු අත්’ මහත්සේ පැසසූ හා (මොස්ට් හා හාසල්මාන් ලෙසට) වගවිභාගයක් නොමැතිව ඔවුන් ‘විප්ලවවාදී’ සටන් වලට පෙලඹ වූ, එමෙන්ම, ස්ථිර හා අචපල නායකයන් කෙරෙහි අවිශ්වාසය වගාකළ කෛරාටිකයන් ජර්මන් ජනයා අතරද සිටියහ. ජර්මන් සමාජවාදයට දැන් පවතින තත්වයේ තරමට ශක්තිමත් විය හැකි වූයේ සමාජවාදී ව්‍යාපාරය තුළ වූ සියළු කෛරාටික කොටස්වලට විරුද්ධව දැඩි ලෙස හා නිර්දය ලෙස සටන් කිරීමෙනි. එසේ වූ නමුත්, සාංසිද්ධික වශයෙන් ප්‍රබෝධමත් වන පොදු ජනයාට මග පෙන්වීමට ප්‍රමාණවත්වන තරම් පුහුණුවක් ඇති, දියුණු හා පළපුරුදුකම් ඇති නායකයන් නොමැතිවීම හේතුකොට ගෙන පැන නැගී තිබෙන අර්බුදයකට රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය මුහුණ දෙමින් සිටියදී, අපගේ බොරු පණ්ඩිතයින් මෝඩයන්ට උචිත ගාම්භීරත්වයෙන් හඬ නගා මෙසේ කියති: ‘‘සාමාන්‍ය ජනයා කෙරෙන් ව්‍යාපාරය ආරම්භ නොවන්නේ නම් එය නරක දෙයකි.’’

‘‘ශිෂ්‍යයින්ගේ කාරක සභාවකින් ඇති වැඩක් නැත; එය ස්ථායී නොවේ.’’ — සම්පූර්ණයෙන්ම සත්‍යය. එහෙත් මෙයින් බැසගත යුතු නිගමනය වන්නේ අපට වෘත්තීය විප්ලවවාදීන්ගේ කාරක සභාවක් තිබිය යුතුය යනුයි. වෘත්තීය විප්ලවවාදියෙකු වීමට හැකි තැනැත්තේ ශිෂ්‍යයෙක් හෝ කම්කරුවෙක් හෝ වන්නේ ද යන්න වැදගත් නොවේ. එසේ වුවද ඔබ එළඹෙන්නේ කම්කරු පංතිය පිටතින් තල්ලු කරනු නොලැබිය යුතුය යන නිගමනයටයි! ඔබගේ දේශපාලන අහිංසකභාවය නිසා, ඔබ අප ‘ආර්ථිකවාදීන්’ගේ උගුලට අසුවන ලෙසට කටයුතු කරන බවත්, ඔබ ආධුනිකවාදය පෝෂණය කරන බවත් ඔබට පෙනෙන්නේ නැත. අපගේ ශිෂ්‍යයන් කම්කරුවන් තල්ලු කළේ කුමක් සම්බන්ධයෙන්ද? යන්න අසනු කැමත්තෙමි. එය සිදු වූ බව ඔබ කියන්නේ, ශිෂ්‍යයාට අතරින් පතර ඇහිඳ ගැනීමට හැකිවූ බොහෝ අඩුපාඩු සහිත සමාජවාදී අදහස්, (වර්තමාන ශිෂ්‍යයාගේ ප්‍රධාන බුද්ධිමය ආහාරය වන නීත්‍යානුකූල මාක්ස්වාදයෙන් ලැබිය හැක්කේ ප්‍රාථමික දැනුම පමණකි; අංශුමාත්‍ර දැනුමක් පමණකි.) ශිෂ්‍යා සතු සුළු දේශපාලන දැනුම, ඔහු කම්කරුවා වෙත ගෙන ආ අර්ථයෙනි. පමණ ඉක්මවා එසේ ‘පිටතින් තල්ලු කිරීම‘‘ කිසි කලෙකත් සිදු වී නැත. සත්‍ය එහි අනිත් පැත්තය. මේ දක්වා අප ව්‍යාපාරය තුළ එය සිදු වී ඇත්තේ ඉතාමත් අඩුවෙනි. අපි මහත් ආයාසයෙන් අපගේම තෙලෙන් බැදෙමින් සිටියෙමු. අපි වහල් ස්වභාවයෙන් ‘ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන’ කම්කරුවන්ගේ ‘ආර්ථික අරගලයට’ පමණට වඩා නමස්කාර කරමින් සිටියෙමු. අප මෙතෙක් කළාට වැඩිය සිය ගුණයක් වැර යොදා මේ ආකාරයේ ‘තල්ලු කිරීමෙහි’ යෙදීම, වෘත්තීය විප්ලවවාදීන් වන අපේ කාර්‍ය්‍ය කොට ගත යුත්තෙමු; ස්ථිර වශයෙන්ම එය අපගේ කාර්‍ය්‍ය කර ගන්නෙමු. එනමුත්, ‘පිටතින් තල්ලු කරනු ලැබීම’ වැනි පාඨයක් තෝරා ගැනීමෙන්ම, දේශපාලන දැනුම හා විප්ලවවාදී පළපුරුද්ද පිටතින් ගෙන එන සියළුම අය කෙරෙහි කම්කරුවන් තුළ (යටත් පිරිසෙයින් ඔබ වැනි අඥානවත්, දේශපාලන දැනුම හා විප්ලවවාදී පළපුරුද්ද නොමැති කම්කරුවන් තුළවත්) අවිශ්වාස සහගත හැඟීමක් අවුස්සන, එවැනි සියළුම අයට විරුද්ධත්වය දැක්වීමේ නිරායාස අභිලාෂයක් අනිවාර්යයෙන්ම අවුස්සන පාඨයක් තෝරා ගැනීමෙන්ම ඔප්පුවන්නේ ඔබ කෛරාටිකයන් වන බවයි. ඒ අතරම, කෛරාටිකයන් කම්කරු පංතියේ දරුණුතම සතුරෝ වෙති.

දැන්, මගේ ‘සහෝදරත්වයට නැති’ විවාද ‘ක්‍රමය’ ගැන බෙරිහන් දෙන්න ඉක්මන් නොවන්න. ඔබගේ අපේක්ෂාවන්ගේ පාරිශුද්ධිය ගැන සැක කිරීමේ කිසිම අභිලාෂයක් මා තුළ නැත.මා කියා ඇති ලෙසට හුදු දේශපාලන අහිංසක කමින්ම කෙනෙකුට කෛරාටිකයෙකු වීමට පුළුවන. කෙසේ හෝ වේවා, ඔබ කපටි තත්වයට පහත වැටී සිටින බව පෙන්වා දී ඇත. එමෙන්ම කෛරාටිකයන් කම්කරු පංතියේ දරුණුතම සතුරන් වන බව කීවරක් කීවත්, නැවත නැවතත් කීවත් මා එයින් විඩාවට පත් නොවේ. ඔවුන් දරුණුම සතුරන් වන්නේ ඔවුන් ජනතාවගේ පහත් හැඟීම් අවුස්සන හෙයිනි; තමා නියෝජනය කරන, සමහරවිට ස්වකීය මිත්‍රයන් වැනිව අවංකවම තමා නියෝජනය කරන මිනිසුන් අතරින් සතුරන් හැදින ගැනීම ගැන අවබෝධයක් නැති කම්කරුවාට අපහසුවන හෙයිනි. අසමගිය හා වැනෙන සුලු භාවය පවතින කාලයක, අපගේ ව්‍යාපාරය එක්තරා ප්‍රමාණයකින් හැඩ ගැසී ඒම ආරම්භ වන විට, පොදු ජනතාව නොමග යැවීම කෛරාටික කම

තරම් පහසු වෙනත් ක්‍රමයක් නොමැති නිසාත්, එයින් නොමග ගියවුනට තමනට සිදුවූ වැරදීම ගැන තේරුම් ගැනීමට ඉඩ ලැබෙන්නේ, පසු කලෙක, අමිහිරි අත්දැකීම් ලැබීමෙන් අනතුරුව වන නිසාත් කෛරාටිකයන් දරුණුතම සතුරන් වෙති. කෛරාටික තත්වයට වැටී තිබෙන ‘‘ස්වබෝද’’ හා ‘‘රබෝචිය දියල’’ යන පත්‍ර දෙකටම විරුද්ධව දැඩි අරගලයක් කරමුයි යන්න රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමාන සටන් පාඨය විය යුත්තේ එහෙයිනි (මේ ගැන වඩාත් විස්තර සහිතව පසුව සඳහන් කරන්නෙමු*).

‘මෝඩයන් සියයට වඩා පහසුවෙන් ඥනවන්තයින් දුසිමක් පිස දැමිය හැක.’’ මෙම පුදුම සහගත සත්‍ය (ගැන මෝඩයන් සියය ඔබට අත් පොළසන් දෙනු ඇති) පැහැදිලි කරුණක ස්වරූපය ගන්නේ තර්කය මැදදී ඔබ එක ප්‍රශ්නයකින් තවත් ප්‍රශ්නයකට පැන තිබෙන නිසා පමණකි. ‘කාරක සභාවක්’ උගුල්ලා දැමීම ගැන, ‘සංවිධානයක්’ උගුල්ලා දැමීම ගැන කථා කරන්නට පටන් ගෙන, එ ගැන කථා කරගෙන ගිය ඔබ, දැන් ව්‍යාපාරයේ ‘මුල්’ ඒවා විහිදී තිබෙන ’ගැඹුරු තැන්’ වලින් උගුල්ලා දැමීමේ ප්‍රශ්නයට පනියි. සත්‍යය නම්, අපගේ ව්‍යාපාරය උගුල්ලා දැමිය නොහැකි බවයි. එසේ වීමට හේතුව, එහි නිමක් නැති දහස් ගණක් මුල් පොදු ජනතාව තුළ ගැඹුරට කිඳ බැස තිබීමයි. එහෙත් ප්‍රශ්නය එය නොවේ. ‘ගැඹුරට විහිදුනු මුල්’ ගැන කථා කරතොත්, කොතෙක් අපගේ ආධුනික ස්වභාවය තිබුණත්, දැනුදු, ඒවා ‘උගුල්ලා’ දැමිය හැකි නොවේ. එහෙත් ‘සංවිධාන’ උගුල්ලා දමනු ලබන බවත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපාරයේ අවිච්ඡේද භාවය රැක ගැනීම දුෂ්කර බවත් අපි කියමු. එය නොකියා බැරිය. එසේ වුවද, ‘සංවිධාන’ උගුල්ලා දමනු ලැබීම ගැන ප්‍රශ්නය මතු කර ඔබගේ අදහසෙහි ඔබ එල්බ සිටින හෙයින් ඥනවන්ත අය දුසිමක් උගුල්ලා දැමීම මෝඩයන් සියයක් උගුල්ලා දැමීමට වඩා බෙහෙවින් දුෂ්කර බව ස්ථිරවම ප්‍රකාශ කරමි. මගේ ‘ප්‍රජාතන්ත්‍ර විරෝධී’ අදහස් ආදිය ගැන කියා, ඔබ මට විරුද්ධව පොදු ජනතාව කොතරම් උසිගැන්නුවත්, මම මෙම ප්‍රතිඥාව රකින්නෙමි. මා නැවත නැවතත් කියා ඇති පරිදි, සංවිධාන සම්බන්ධයෙන් මා ‘ඥනවන්තයින්’ යනුවෙන් අදහස් කරන්නේ වෘත්තීය විප්ලවවාදීන්ය. ඔවුන් සංවර්ධනය වී ආවේ ශිෂ්‍යයන් අතරෙන්ද, නැතහොත් කම්කරුවන් අතරෙන්ද යන්න නො සලකා එම හැඳින්වීම කර තිබේ. 1) අවිච්ඡේදව පවත්වාගෙන යනු ලබන නායකයින්ගේ සංවිධානයක් නොමැතිව, කිසිම විප්ලවවාදී ව්‍යාපාරයකට පැවතිය නො හැකි බවත්, 2) ව්‍යාපාරයේ පදනම වන හා අරගලයට සාංසිද්ධික වශයෙන් ඇදී එන පොදු ජනකාය පුළුල් වූ තරමට, (විවිධ වර්ගයේ කෛරාටිකයන්ට වඩාත් නොදියුණු පොදු ජනකොටස් නොමග යැවීම ඉතා පහසු වන නිසා) එවැනි සංවිධානයක අවශ්‍යතාවය වඩාත් හදිසිවන හා එය වඩාත් ශක්තිමත් විය යුතු බවත්, 3) එවැනි සංවිධානයක් ප්‍රධාන වශයෙන් සමන්විත විය යුත්තේ වෘත්තියක් වශයෙන් විප්ලවවාදී කටයුතුවල යෙදී සිටින අයගෙන් වන බවත්, 4) සර්වබලධාරී ඒකාධිපති පාලනයක් තිබෙන විට එවැනි සංවිධානයක සාමාජිකත්වය වෘත්තියක් වශයෙන් විප්ලවවාදී කටයුතුවල යෙදී සිටින අයට වැඩි වශයෙන් සීමා කරන තරමට එම සංවිධානය උගුල්ලා දැමීම වඩාත් අපහසු වන බවත්, 5) එවිට, ව්‍යාපාරයට සම්බන්ධ වීමට හා එහි වැඩ කටයුතුවල ක්‍රියාශීලී ලෙස යෙදීමට හැකි වන කම්කරු පංතියේ හා අනෙකුත් සමාජ ස්ථරයන්ගේ ජන සංඛ්‍යාව වඩාත් විශාල වන බවත් මම ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කරමි.

හැකිනම් මෙම අදහස් වැරදි යයි ඔප්පු කරන ලෙස මම අපගේ ‘ආර්ථිකවාදීන්’ට, ත්‍රස්තවාදීන්ට හා ‘ආර්ථිකවාදී-ත්‍රස්තවාදීන්ට’*

---

* ‘පිටතින් තල්ලු කරනු ලැබීම’ හා සංවිධානය ගැන වූ ‘‘ස්වබෝද’’ පත්‍රයේ අනිතුක් දේශනා ගැන අප සඳහන් කර තිබෙන කරුණු සම්පූර්ණයෙන්ම ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ අනුගාමිකයන්ද ඇතුළුව, සියළුම ‘ආර්ථිකවාදීන්’ට අදාල වන බව පමණක් දැනට කියනු කැමැත්තෙමු. ඉන් සමහර දෙනෙක් ක්‍රියාශීලී ලෙස එවැනි අදහස් දේශනා කර හා ඒ වෙනුවෙන් කථා කර ඇති අතර අනික් අය එම අදහස් පිළිගන්නා තත්වයට පත්ව සිටිති.

* ‘ආර්ථිකවාදීන්’ට වඩා මෙම පාඨය සමහර විට ‘‘ස්වබෝද’’ පත්‍රයට ගැලපෙනු ඇත. එම පත්‍රය ‘‘විප්ලවවාදයේ පුනර් ජනනය’’ යන හිසින් යුත් ලිපියෙන් ත්‍රස්තවාදය රකියි. ඒ අතර මෙහි සමාලෝචනය කෙරෙන ලිපියෙන් ‘ආර්ථිකවාදය’ රකිනු ලැබේ. අයෙක් ‘‘ස්වබෝද’’ පත්‍රය ගැන මෙසේ කියනු ඇත: ‘‘එයට හැකියාව තිබුණා නම් එය කරනු ඇත. එහෙත් එයට නො හැකිය’’. එහි ප්‍රාර්ථනා හා අපේක්ෂාවන් ඉස්තරම්ය; එහෙත් ප්‍රතිඵල අන්ත අවුලකි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ, ‘‘ස්වබෝද’’ පත්‍රය සංවිධානයේ අඛණ්ඩ පැවැත්මට පක්ෂව කථා කරන අතරම, විප්ලවවාදී චින්තනයේ හා සමාජ-ප්‍රජාතන්තවාදී න්‍යායෙන් අඛණ්ඩ පැවැත්ම එය පිළිනොගැනීමයි. වෘත්තීය විප්ලවවාදියා යළි පණ ගැන්වීම (විප්ලවවාදයේ පුනර් ජනනය) එයට අවශ්‍ය වේ. එය පරමාර්ථ කරගෙන ප්‍රථමයෙන් ඇවිස්සුම්කාරී ත්‍රස්තවාදයත්, දෙවැනිව ‘පිටතින් තල්ලු කරනු ලැබීමට’

කියමි. මෙම අවස්ථාවේදී අන්තිම කරුණු දෙක ගැන පමණක් විස්තර විභාග දක්වමි. වඩාත් පහසු වන්නේ 'ඥානවන්තයින් දූසිමක්' පිස දැමීමද නැතහොත් මෝඩයන් සියයක් පිස දැමීමද යන ප්‍රශ්නය සරල කොට ගතහොත් මතු වන්නේ දැඩි රහසිගත භාවය අවශ්‍යව තිබියදී පොදුජන සංවිධානයක් ඇතිකරගත හැකිද යන ප්‍රශ්නයයි. ආණ්ඩුවට විරුද්ධව නොනවත්වා හා අවිච්ඡේද ලෙස අරගල කිරීම සඳහා අපට අවශ්‍ය වන මට්ටමේ රහසිගත ස්වභාවයක් කිසි කලෙකත් පුළුල් සංවිධානයක් තුළ ඇති කළ නොහැකිය. එම රහස්‍ය කාර්‍යයන් වෘත්තීය විප්ලවවාදීන් හැකි තරම් අඩු සංඛ්‍යාවක් වන ස්වල්ප දෙනෙක් අතර මධ්‍යගත කිරීමෙන් අදහස් කරන්නේ ඒ ස්වල්ප දෙනා 'සියළු දෙනාම වෙනුවෙන් සිතන' බවක් හෝ ව්‍යාපාරයේ ක්‍රියාත්මක කාර්‍ය කොටසක් ඉටු කරන බවක් හෝ නොවේ. එපමණක් නොව, සාමාජිකත්වය තම පිරිසේ වැඩි අය වැඩි වැඩියෙන් වෘත්තීය විප්ලවවාදීන් මට්ටමට උසස් කරනු ඇත; සාමාජිකත්වය එසේ කරන්නේ, 'කාරක සභාවක්' පිහිටුවීම පිණිස එකතුවීම සඳහා ශිෂ්‍යයන් කීප දෙනෙකු හා කම්කරුවන් කීප දෙනෙකු එක් වී ආර්ථික අරගලය ගෙනයාම ප්‍රමාණවත් නොවන බැවිනි, කෙනෙකුට වෘත්තීය විප්ලවවාදියෙක් වීමට අවශ්‍ය පුහුණුව ලැබීමට අවුරුදු ගණනක් අවශ්‍යවන බවත් ඔවුන් දන්නා බැවිනි. සංවිධානයේ රහස්‍ය කාර්‍යයන් සංකේන්ද්‍රණය කිරීමෙන් ව්‍යාපාරයේ සියළු කාර්‍යයන් මධ්‍යගත කිරීම කිසි සේත් අදහස් නොවේ. නීති විරෝධී පුවත් පත්වල කටයුතු හා සම්බන්ධ රහස්‍ය කාර්‍යයන් වෘත්තීය විප්ලවවාදීන් 'දූසිමක්' අත මධ්‍යගත කර ගැනීමෙන්, පුළුල්තම පොදුජන කොටස් එම කටයුතුවලට සම්බන්ධ වීම කිසි ලෙසකින් හෝ අඩු නොවේ. සිදුවන්නේ එහි අනිත් පැත්ත වන අතර, එම කටයුතු වලට පොදු ජන සහභාගිත්වය දස ගුණයෙන් වැඩි වේ. මේ ආකාරයෙන්, දහස් ගණනින් බෙදා හරිනු, ලබන ප්‍රකාශනයක සෑම පිටපතක්ම පාසා සවිස්තර ලෙස නීතිමය හා පරිපාලනමය ක්‍රියාදමයන් ක්‍රියාත්මක කිරීමේ නුසුදුසු කම හා නොහැකියාව ඉක්මනින්ම පොලිසියට වැටහෙනු ඇති හෙයින් නීති විරෝධී පත්‍ර කියවීම, ඒවාට ලිවීම හා එක්තරා දුරකට ඒවා බෙදාහැරීම පවා රහස්‍ය නොවන තරම් තත්වයකට ඉඳුරාම ගෙන එන්නෙමු. එය කළ හැක්කේ මේ මාර්ගයෙන් පමණකි. මෙම ක්‍රියා මාර්ගය පත්‍රවලට පමණක් නොව, ව්‍යාපාරයේ සෑම කාර්යයකට, පෙළපාලියකට පවා අදාල වේ. එපමණක්ද නොවේ, පොලිසියට නොදෙවෙනි වෘත්තීය පුහුණුවක් ලත් පළපුරුදු විප්ලවවාදී 'දූසිම', කටයුතු සියල්ලෙහිම සෑම රහස්‍ය අංශයක්ම ඔවුන් අත මධ්‍යගත කිරීමෙන් පත්‍රිකා සකස් කිරීම, දළ සැළසුම් සකස් කිරීම සෑම නාගරික දිස්ත්‍රික්කයක්ම සඳහා නායක මණ්ඩලයක් පත් කිරීම ආදිය කිරීමෙන්, ක්‍රියාශීලී හා පැතිරී ගිය පොදු ජන සහභාගිත්වයට හානියක් සිදු නොවේ; ඇත්ත වශයෙන්ම එයින් ඊට පහසුකම් සැලසෙනු ඇත. (මගේ 'ප්‍රජාතන්ත්‍රවාදී නොවන' අදහස් වලට විරෝධ ඇති බව මම දනිමි. එහෙත් කිසි සේත් බුද්ධිමත් විරෝධයක් නොවන මෙයට සම්පූර්ණ වශයෙන් පහත පිළිතුරු සපයමි). විප්ලවවාදී සංවිධානයක ඉතාමත් රහසිගත කාර්‍යයන් මධ්‍යගත කිරීමෙන් සිදුවන්නේ, වෙනත්, පුළුල් මහජන කොටස් සඳහා අරමුණු කර තිබෙන හා එනිසා හැකි තරම් දුරට ලිහිල් හා නොරහසිගත කම්කරුවන්ගේ වෘත්තීය සමිති, කම්කරුවන්ගේ ස්වයං-අධ්‍යාපන කව හා නීති විරෝධී පොත් පත් කියවීමේ කව සහ සියළු ජනතා කොටස් අතර තිබෙන වෙනත් සමාජවාදී මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී කව ආදිය වැනි වූ සංවිධානවල ක්‍රියාකාරිත්වයේ පරිමාණය හා සගුණත්වය අඩුවීම නොව තවත් වැඩි වීමයි. පුළුල්තම කාර්‍ය විවිධත්වයක් ඇති එවැනි කව වෘත්තීය සමිති හා සංවිධාන සෑම තන්හිම හැකි තරම් විශාල සංඛ්‍යාවක් තිබීම අපට අවශ්‍යය. එහෙත්, ඒවා විප්ලවවාදීන්ගේ සංවිධාන සමග පටලවා ගැනීම ද, ඒවා හා විප්ලවවාදීන්ගේ සංවිධාන අතර මායිම් රේඛාව මකා දැමීමද, දැනට ඉතාමත් සුළු වශයෙන් පමණක් පිළිගැනෙන කාරණා වන පොදු ජන ව්‍යාපාරයට 'සේවය' කිරීම සඳහා සම්පූර්ණයෙන්ම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට කැප වූ අය අපට සිටීමේ අවශ්‍යතාවය හා එම අය වෘත්තීය විප්ලවවාදීන් වීම සඳහා ඉවසිලිමත් වන ලෙස හා ස්ථිරසාර ලෙස පුහුණුවීමේ අවශ්‍යතාවය තව දුරටත් අපැහැදිලි කිරීමද අණුවන හා හානිදායක වේ.

එහෙත්, මෙම පිළිගැනීම දුර්වල තත්වයක පවතින හෙයින්, එය ඇදහිය නොහැකි වන තරම් අපැහැදිලිය. සංවිධානය සම්බන්ධයෙන් අප කර තිබෙන භයානකම පාපය නම් අපගේ පැරණි තාලේ වැඩ වලින් අප් රුසියාවේ විප්ලවවාදීන්ගේ ගෞරවනීය තත්වය පහත හෙළීමයි. න්‍යායික ප්‍රශ්න වලදී උදාසීන හා අස්ථිර ගතියක් දක්වන, පටු වැටහීමක් ඇති, තමන්ගේ ඔතැනි ගතියට හේතුව වශයෙන් පොදු ජනයාගේ සාංසිද්ධික තාවය පෙන්නුම් කරන, ජනතා නියෝජිතයාට

වැඩි ඉඩක් නැති සාමාන්‍ය කම්කරුවන්ගේ සංවිධානයත් යෝජනා කරයි. (''ස්වබෝද'' අංක 1, පිටු 66 පටන් ඉදිරියට) වෙනත් වචන වලින් කියතොත් ගෙය උනුසුම් කිරීම පිණිස එහි දැව පාවිච්චි කිරීම සඳහා ගෙය කඩා දැමීමට එය යෝජනා කරයි.

වඩා වෘත්තීය සමිති ලේකම්ට සමාන වන, විරුද්ධවාදීන්ගේ පවා ගෞරවයට හේතුවන ආකාරයේ පුළුල් හා නිර්භීත සැළසුමක් කල්පනා කර ගැනීමට නොහැකි හා ස්වකීය වෘත්තියට අදල කලාව වන පොලිසියට විරුද්ධව සටන් කිරීමේ කලාවෙහිදී නුපුරුදු කම් හා ඔලමොට්ටල කම් දක්වන තැනැත්තේ විප්ලවවාදියෙකු නොවේ. ඔහු කාලකණ්ණි ආධුනිකයෙකි!

මෙසේ අවංක ලෙස අදහස් ප්‍රකාශ කිරීම ගැන කිසිම ක්‍රියාශීලී කම්කරුවෙකු උරණ නොවිය යුතුය. පුහුණුව ප්‍රමාණවත් නොවීම ගැන මා පෙන්වූ කරුණු මා ප්‍රථමයෙන්ම අදල කරගන්නේ මටය. මා අධ්‍යයන කවයක්[89] තුළ වැඩ කර ඇත. එය නියම කරගත් කර්තව්‍යයන් ඉතාමත්ම පුළුල්ය; සර්වග්‍රාහීය. සුප්‍රසිද්ධ කියමනක් වෙනස් කර ගනිමින් ''අපට විප්ලවවාදීන්ගේ සංවිධානයක් දෙන්න. එවිට අපි රුසියාව කණපිට පෙරළන්නෙමු!'' යි කීමට ඉඩ කඩ තිබුණු අවස්ථාවක කවයේ අප සාමාජිකයන් සියළු දෙනාම කටයුතු කරන්නේ ආධුනික ස්වභාවයෙනැයි යන වැටහීමෙන් අපි වේදනා සහ බලවත් පීඩා වින්දෙමු. එවකට මා තුළ බලපැවැත්වූ මදිකම පිළිබඳ හැඟීමෙන් මා දැවුනු හැටි සිහිපත් වන කල 'විප්ලවවාදීන්ගේ වෘත්තියට නින්ද ගෙන දෙන' දේශනා පවත්වන්නාවූද, අපගේ කර්තව්‍ය වන්නේ ආධුනිකයින් විප්ලවවාදීන්ගේ තත්වයට උසස් කිරීම මිස, විප්ලවවාදියා ආධුනිකයකුගේ තත්වයට පිරිහෙළීම නොවන බව තේරුම් නොගන්නාවූද බොරු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් කෙරෙහි මගේ හැඟීම් වඩ වඩාත් අම්හිරි වේ.

ඇ) සංවිධාන කටයුතුවල විෂය ප්‍රමාණය

බී. ට හැඟුනු පරිදි 'සාන්ත පීටර්ස්බර්ග් හි පමණක් නොව සමස්ත රුසියාවේම සෑම තැනෙකමත් දැනෙන සටනට සුදුසු බලවේගයන් නොමැතිකම' ගැන ඔහු කී දෙය අපි ඇසුවෙමු. මෙම ප්‍රකාශයට විරුද්ධව කිසිවෙකු තර්ක නොකරනු ඇත. එහෙත්, මෙයට හේතුව කුමක්ද? යන ප්‍රශ්නය පැන නගියි. බී—ච් මෙසේ ලියයි:

''මෙම තත්වය ඇතිවීමට හේතු විස්තර කිරීමට අපි බලාපොරොත්තු නොවෙමු. දීර්ඝ කාලයක් තිස්සේ බල පැවැති ප්‍රතිගාමිත්වය නිසා අධෛර්යයට පත් හා අතීත හා වර්තමාන ආර්ථික වෙනස්කම් නිසා භේද භින්න වුණු සමාජයක්, ස්වකීයම වූ සාමාන්‍ය ජන කොටස් අතරින් බිහි කරන විප්ලවවාදී කටයුතු සඳහා සුදුසුවන පිරිස ඉතාමත් කුඩා සංඛ්‍යාවක් වන බවත් නීති විරෝධී සංවිධානවල සාමාජිකත්වය සංවිධානය කරන විප්ලවවාදී කම්කරුවන් කම්කරු පංතිය විසින් ඉදිරිපත් කරනු ලබන නමුත්, වකවානුවේ අවශ්‍යතාවයන් සපුරාලීමට එවැනි විප්ලවවාදීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බවත් පමණක් ප්‍රකාශ කරමු. මෙය වඩාත්ම එසේ වන්නේ, දිනකට පැය එකොළහ හමාරක් පැක්ටරියේ ගතකරන කම්කරුවා සිටින්නේ ප්‍රධාන වශයෙන් උද්ඝෝෂකයෙකුගේ කාර්යයන් පමණක් ඉටු කිරීමට හැකි වන තත්වයක වන හෙයිනි. එනිසා ප්‍රචාරක හා සංවිධාන කටයුතු, රහස්‍ය පොත පත බෙදහැරීම සහ ඒවායේ පිටපත් ගැනීම, පත්‍රිකා නිකුත් කිරීම ආදිය අවශ්‍යයෙන්ම බුද්ධිමතුන්ගෙන් ප්‍රධාන කොට සමන්විත වන ඉතාමත් කුඩා බල ඇණියක කර පිට පැවරෙනු යුතුය' (''රබෝචිය දියල'' අංක 6 පිටු 38—39)

බොහෝ කරුණු සම්බන්ධයෙන් අපි බී. හා සමග එකඟ නොවෙමු. (සිතා බලන සෑම ප්‍රායෝගික කාරක වරයෙක් මෙන්ම බී. ද අපගේ ආධුනික ස්වභාවයෙන් විඩාපත්ව සිටින නමුත්, ඔහුට මෙම ඉවසුම් නොදෙන තත්වයෙන් ගොඩ ඒමට මඟක් සොයාගත නොහැක්කේ ඔහු ආර්ථිකවාදයේ බරෙන් මිරිකී සිටින නිසාය. 'සත් ව්‍යාපාරයට' සුදුසුවන අය අති විශාල සංඛ්‍යාවක් සමාජයෙන් සැපයෙන බව සැබෑ වුවද, ඒ සියළු දෙනාම උපයෝගී කරගැනීමේ පුළුවන් කමක් අපට නැත. මේ හා සම්බන්ධයෙන් අප ව්‍යාපාරයේ තීරණාත්මක පරිවර්තනීය අවධිය මෙසේ විස්තර කිරීම අපහසුය: ජනයා නැත. එහෙත් විශාල පොදු ජනකායක් ඇත. විශාල පොදු ජනකායක් සිටින බව කියන්නේ කම්කරු පංතිකයන් හා වැඩිවන විවිධ සමාජ ස්ථරයන් ගණනකින්, ඒවායේ සාමාන්‍ය පිරිස් අතරින්, වැඩි වැඩියෙන් ඉදිරියට දමනු ලබන අප්‍රසාදයට පත් ජනයා විරෝධය පෑමට කැමති වන නිසාය; අත්තනෝමතවාදයට විරුද්ධව කරන අරගලයේදී තමන්ට හැකි ආධාරයක් කිරීමට ඔවුන් සූදානම්ව සිටින අතර, අත්තනෝමතවාදය ඉවසිය නොහැකිබව සියළු දෙනාම පිළිගන්නා තත්වය තවමත් උදවී නැතත්, ඒ බව වඩාත් තියුණු ලෙස හඟින පොදු ජනකාය වැඩිවෙමින් පවතින නිසාය. ඒ අතරම අපට ජනයා නැත. ඒ අපට නායකයින් නොමැති නිසාය; දේශපාලන නායකයින්ද, විශාල මෙන්ම ඒ අතරම ඒකාකාර හා සංගත වූත්, ඉතාමත්ම කුඩා බලවේග පවා ඇතුළත්ව, සියළුම බලවේග උපයෝගී කරගන්නාවූත්, ආකාරයෙන් වැඩ කටයුතු පිළියෙළ කිරීමේ හැකියාව ඇති, දක්ෂ සංවිධායකයින්ද අපට නොමැති නිසාය. ''විප්ලවවාදී සංවිධානවල වර්ධනය හා විකාශය'' පසුවී තිබෙන්නේ බී. ද පිළිගන්නා පරිදි කම්කරු ව්‍යාපාරයේ වර්ධනයට පමණක් නොවේ. සියළුම සමාජ ස්ථරයන් අතර ඇති පොදු ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයටද පසුවී ඇත. (මෙය බී—ච් ගේ නිගමනයට

ඌන පුනරයක් ලෙස සැලකීමට දුන් ඔහු කැමැති වනු ඇති බව මෙහි ලා කියනු කැමැත්තෙමි). ව්‍යාපාරයේ සාංසිද්ධික පදනමෙහි පැවුලත්වය හා සමග සසඳා බලන කල, විප්ලවවාදී කටයුතුවල විෂය ප්‍රමාණය ඉතා පටුය; 'ස්වාමිවරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන ආර්ථික අරගලය' පිළිබඳ වූ කාලකණ්ණි න්‍යායයෙන් එය බොහෝ දුරට කොටුවී ඇත. එසේ වී නමුත් මේ කාලයේදී සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී උද්ඝෝෂකයන් පමණක් නොව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධායකයන්ද 'ජනගහනයේ සියළුම පංති අතරට යා යුතුය'.* සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංවිධාන කටයුතු වලට අදල ඉතා සුළු දහසකුත් එකක් කාර්යයන් ඉතාමත් විවිධ පංතිවල එක් එක් නියෝජිතයන් අතර බෙද දීම සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට කළ හැකි වන බව ගැන අවිශ්වාස කරන එකද ප්‍රායෝගික කාරක වරයෙක්වත් නොමැති තරම්ය. විශේෂඥතා හීන කම අපගේ ශිල්ප ක්‍රමයෙහි දක්නට ලැබෙන බලවත් දුර්වලකම් වලින් එකකි. බී. මේ ගැන යුක්ති සහගත ලෙස මැසිවිලි කියයි. අපගේ පොදු සත් ව්‍යාපාරයේ එක් එක් වෙන්කොටගත් 'සටන් කටයුත්ත' කුඩා වූ තරමට එවැනි කටයුතු කිරීමට සමත් ජනයා සොයාගැනීම අපට පහසු වේ. (මේ අය අතුරෙන් වැඩි දෙනෙක් වෘත්තීය විප්ලවවාදීන් වීමට කිසි සේත් නොහැකි අය වෙති). මෙම 'සුළු කාරක වරුන්'' සියළු දෙනාම 'අල්ලා ගැනීම' පොලිසියට වඩාත් අපහසු වන්නේය; සිරභාරයට ගැනීමකින් පසුව කිසියම් සුළු කරුණක් පදනම් කරගෙන 'ආරක්ෂාව' සඳහා කරන ආණ්ඩුවේ වියදමට සරිලන ආකාරයේ නඩුවක් සකස් කිරීම ඊටත් වඩා දුෂ්කර වන්නේය. අප ආධාර කිරීමට සූදනම් ජනයාගේ සංඛ්‍යාව සම්බන්ධයෙන් පසුගිය පස් අවුරුද්දක පමණ කාලය තුළ සිදුවී තිබෙන දැවැන්ත වෙනස ගැන පසුගිය කාල පරිච්ඡේදයෙහි සඳහන් කළෙමු. අනික් අතට, මෙම ලේශමාත්‍ර කාර්යයන් සියල්ලම එක සමස්තයකට එක්සත් කිරීම සඳහාද, ව්‍යාපාරයේ කාර්යයන් කොටස් කර වෙන්කරන කල්හි, ව්‍යාපාරය කොටස්වලට වෙන් නොවනු සඳහාද, ඉතා කුඩා කාර්යයන් ඉටුකරන ජනයාට, එම කාර්යයන්හි වැදගත්කම ගැන අවබෝධයක් ඔවුන් තුළට කාවැදී නොතිබුණහොත් ඔවුන් කිසි කලෙකත් එම කාර්යයන් ඉටු නොකරන නිසා එම වැටහීම ඔවුන් තුළට කාවද්දනු* සඳහාද,සටනෙන් පන්නරය ලැබූ විප්ලවවාදීන්ගේ බලවත් සංවිධානයක් තිබීම අවශ්‍යය. එවැනි සංවිධානයක රහසිගත භාවය වැඩිවූ තරමට, පක්ෂය කෙරෙහි වූ විශ්වාසය වඩාත් ශක්තිමත් හා පැතිරී ගිය එකක් වනු ඇත. අප දන්නා පරිදි යුද්ධ කාලයේදී, තම හමුදවේ ශක්තිය ගැන තම හමුදවටම විශ්වාසයක් කාවැද්දීම අතිශයින්ම වැදගත්ය. එපමණක් නොව එම ශක්තිය ගැන සතුරාට හා මධ්‍යස්ථශීලී කොටස් වලටත් අවබෝධයක් දීමද වැදගත්ය.සමහර විට මිත්‍රශීලී මධ්‍යස්ථභාවය

---

* කම්කරුවන් හා ශිෂ්‍යයන් වැනි 'සතුරන්ට' විරුද්ධව වඩාත් නිරතුරු ලෙස වීදි සටන්වල යෙදීමද එක්තරා දුරකට හේතුකොට ගෙන යුද්ධ සේවයේ අය අතර ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයෙහි නිසැක පුණර්ජීවයක් මෑත කාලයේදී පෙනෙන්නට තිබුණු බව මේ අනුව පෙනේ. අප වෙත ඇති බලවේගයන් අනුව ඉඩ ලැබෙන වහාම සොල්දදුවන් හා යුද්ධ හමුද නිලධාරීන් සමග ප්‍රචාරක උද්ඝෝෂණ කටයුතුවල යෙදීමත්, පක්ෂයට අනුබද්ධ 'යුද්ධ සංවිධානයක්' ඇති කිරීමෙහි යෙදීමත් සඳහා නොවරදවාම ව්‍යාවෘත විය යුත්තෙමු.

* සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට ආධාර කිරීමට උවමනා කළ පැක්ටරි පරීක්ෂක වරයෙක් ගැන වරක් සහෝදරයෙක් කීවා මතකය. ඔහු ඇත්තෙන්ම ආධාර දුන් නමුත්, ඔහු සැපයූ තොරතුරු නිසි විප්ලවවාදී මධ්‍යස්ථානය වෙත ලැබුණේද යන්නත්, ඔහුගේ ආධාරය කොතරම් දුරට අවශ්‍ය ද යන්නත් ඔහුගේ කුඩා හා සුළු සේවාවන් උපයෝගී කර ගැනීමේ ඉඩ කඩ කොතරම් තිබේද යන්නත් ගැන ඔහු නොදන්නා බව ඔහු කනස්සළු ස්වභාවයෙන් කීවේය. අපගේ පැරණි තාලය නිසා, අපට මිතුරන් නැතිව ගිය එවැනි අවස්ථා රැසක් ගෙනහැර දැක්වීමට හැම ප්‍රායෝගික කාරක වරයෙකුටම පුළුවන් බව සත්‍යයකි. වෙන්කොට ගත්කල 'කුඩා' නමුත්, පොදු සමස්තයක් වශයෙන් ගත් කල ඉතාමත් වටිනා මෙම සේවාවන්, පැක්ටරිවල පමණක් නොව තැපැල් සේවයේද, දුම්රිය සේවයේද, රේගුවෙහිද, කාර්යාල සේවීන් හා නිලධාරීන් විසින්ද රදළ කොටස්, පූජක හා පොලිස් හා උසාවි ඇතුළු වෙනත් ජීවන වෘත්තීන්හියෙදී සිටින පිරිස් අතරින් එන අය විසින්ද, අපට ඉටුකර දෙනු හැකිය; ඉටුකර දෙනු ලැබේ. අපට නියම පක්ෂයක් සටන්කාමී විප්ලවවාදීන්ගේ සැබෑ සංවිධානයක් තිබුණේ නම්, මෙම 'සහායකයන්' සියළු දෙනා ගෙන්ම නොසැහෙන සේවයක් අපේක්ෂා කරන්නෙමු; නිතරම හා අනිවාර්ය වශයෙන් ඔවුන් අපගේ 'නීති විරෝධී භාවයේ' හදවත මධ්‍යයටම ගෙන ඒමට ඉක්මන් නොවන්නෙමු. එපමණක් නොව, අනිත් අතට, ඉතාමත් ප්‍රවේසම් සහිත ලෙස ඔවුන් රැක බලාගෙන දියුණු කර ගනිමින් එවැනි කාර්යයක් සඳහා ජනයා පුහුණු කිරීමට පවා කටයුතු කරන්නෙමු; එසේ කිරීමේදී,කිසියම් නිල තනතුරක් දරමින් සිටින බොහෝ ශිෂ්‍යයන්, එවැනි 'සහායකයන්' වශයෙන් කටයුතු කරතහොත් 'කෙටිකාලීන විප්ලවවාදීන්' වශයෙන් ඉටු කරනවාට වඩා ඉතා විශාල සේවයක් ඔවුන්ගෙන් පක්ෂයට ලැබෙනු ඇත. එවැනි උපක්‍රම ක්‍රියාත්මක කිරීමට අයිතියක් ඇත්තේ, ශක්තිමත් ලෙසට ස්ථාපිත වී තිබෙන හා ක්‍රියාශීලී බලවේගයෙන් අඩුවක් නැති සංවිධානයකට පමණක් බව මම නැවතත් කියමි.

නිසා ප්‍රශ්න තීරණය විය හැක. ශක්තිමත් න්‍යායික පදනමක් මත ගොඩනගන ලද හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පත්‍රයක් හිමි, එවැනි සංවිධානයක් ඇතොත්, එය වෙත ආකර්ෂණය වන බොහෝ 'පිටස්තර' කොටස් හේතුකොට ගෙන ව්‍යාපාරය එහි මාවතෙන් පිටතට යොමු වේ යයි යන බිය ඇතිකර ගැනීමට හේතුවක් නොමැත (එහෙත් අනික් අතට, ආධුනික ස්වභාවය ප්‍රබලව පවතින හෙයින්, "Credo" වැඩ පිළිවෙළ වෙත නැඹුරු වෙමින් මනෝරාජික වශයෙන් පමණක් තමන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් යයි සිතන අය බොහෝ දෙනෙක් අපට දක්නට ලැබෙන්නේද හරියටම මෙම වර්තමාන කාලයේදීමය). කොටින් කියතොත් විශෙෂඥතා වර්ධනය ඇතිවීමට, අවශ්‍යයෙන්ම මධ්‍යගත තීරණය පූර්ව කොන්දේසියක් වන අතර එය අනිවාර්යයෙන්ම කළ යුත්තක්ද වන්නේය.

විශේෂඥතා වර්ධනයේ අවශ්‍යතාවය ගැන එතරම් විශිෂ්ට ලෙස විස්තර කළ බී. ම එහි වැදගත්කම අවතක්සේරු කරන බව අප උපුටා දැක්වූ තර්කයෙහි දෙවැනි ඡේදයෙන් පෙනෙන්නේය යනු අපගේ අදහසයි. කම්කරු පංති විප්ලවවාදීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නැතැයි ඔහු කියයි. මෙය සම්පූර්ණයෙන්ම සත්‍යය ය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමාන අර්බුදයට හේතු පිළිබඳව අපගේ අදහස් 'සමීප නිරීක්ෂකයෙකුගේ අගනා පණිවුඩය' මගින් සම්පූර්ණයෙන්ම තහවුරු වන බවත්, ඒ අනුව එය ජය ගැනීමේ මාධ්‍ය පිළිබඳව අපගේ අදහස්ද තහවුරු වන බවත් අපි නැවතත් අවධාරණය කරමු. විප්ලවවාදීන් පොදු වශයෙන් පොදු ජනතාවගේ සාංසිද්ධික පිබිදීමට පිටුපසින් සිටිනවාත් හැර කම්කරු විප්ලවවාදීන්ද, කම්කරු පංති පොදු ජනතාවගේ සාංසිද්ධික පිබිදීමට පිටුපසින් සිටිති. කම්කරුවන්ට අපෙන් ඉටුවිය යුතු යුතුකම් ගැන සාකච්ඡා කිරීමේදී අපට බොහෝ විට දේශනා කරනු ලබන 'අධ්‍යාපන විද්‍යාව' ගැන ප්‍රායෝගික දෘෂ්ටි කෝනයෙන් සලකා බැලුවත්, එහි ඇති විකට ස්වභාවය පමණක් නොව දේශපාලන වශයෙන් තිබෙන ප්‍රතිගාමී ස්වභාවයද මෙම කරුණෙන් සාක්ෂි සහිතව ඔප්පු වේ. පක්ෂ කටයුතු හා සම්බන්ධයෙන් වූ කල බුද්ධිමතුන් අතරින් එන විප්ලවවාදීන් හා සමාන මට්ටමක සිටින සේ කම්කරු පංති විප්ලවවාදීන් පුහුණු කිරීමට ආධාර දීම අපේ ප්‍රථමතම යුතුකම බව මෙම කරුනෙන් ඔප්පු වේ. 'පක්ෂ කටයුතු සම්බන්ධයෙන්' යන වචන මෙහිදී අවධානය කරමු. අනිත් අංශ වලින්ද කම්කරුවන් බුද්ධිමතුන්ගේ මට්ටමට ගෙන ඒම අවශ්‍ය වුවත්, එය එතරම් පහසු හෝ බලවත් අවශ්‍යතාවයක් හෝ නොවේ). එබැවින්, ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුත්තේ කම්කරුවන් විප්ලවවාදීන්ගේ මට්ටමට උසස් කිරීමටය. ආර්ථිකවාදීන් අපේක්ෂා කරන ලෙසට, 'වැඩ කරන පොදු ජනතාවගේ' මට්ටමට පහත බැසීම හෝ ''ස්වබෝද'' පත්‍රය කැමති ලෙසට ''මධ්‍යපංතික-කම්කරුවන්ගේ තත්වයට පහත බැසීම (හා එමගින් ආර්ථිකවාදී 'අධ්‍යාපන විද්‍යාවේ' දෙවැනි ශ්‍රේනියට උසස් වීම) හෝ කිසිසෙත් අපගේ කර්තව්‍යා නොවේ. පොදු ජන භාවිතයට සුදුසු පොත් පත්, ඉතාමත් සරල (දියාරු කරන ලද ඒවා නම් නොවේ) පොත් පත්, කම්කරුවන්ට, විශේෂයෙන්ම නොදියුණු කම්කරුවන්ට සැපයීමේ අවශ්‍යතාවය මා කිසිසේත් ප්‍රතික්ෂේප කරන්නේ නැත. එහෙත් මා නුරුස්සන්නේ අධ්‍යාපන විද්‍යාව පිළිබඳ ප්‍රශ්න නිතරම දේශපාලනය හා සංවිධානය පිළිබඳ ප්‍රශ්න සමග පටලවා ගැනීමයි. මහත්වරුනි, 'සාමාන්‍ය කම්කරුවා' ගැන ඔතරම් උනන්දුවක් ගන්නා ඔබ කරන්නේ ඔවුන්ට යහපතක් නොව ඇත්ත වශයෙන්ම නින්ද කිරීමකි. බරපතල දේ ගැන බරපතල ලෙසට කථා කරන්න; අධ්‍යාපන විද්‍යාව හා සම්බන්ධ දේ දේශපාලනඥයන් හා සංවිධායකයන්ට! නොව අධ්‍යාපනඥයන්ට පවරන්න. බුද්ධිමතුන් අතර වුවද, දියුණු අය, 'සාමාන්‍ය අය' හා 'පොදු ජනයා' යන කොටස් නොමැතිද? පොදු ජනයාට සුදුසු පොත් පත් බුද්ධිමතුන්ට ද අවශ්‍ය බව සෑම කෙනෙක්ම පිළිගන්නා කරුණක් නොවේද? එවැනි පොත් පත් ලියනු නොලැබේද? විද්‍යාලීය නැතහොත් උසස් පාසල් ශිෂ්‍යයන් සංවිධානය කිරීම ගැන ලිපියක් ලියන කෙනෙක් තමා අළුත් ගවේශනයක් කළ කලෙක මෙන්, අප ප්‍රථමයෙන්ම 'සාමාන්‍ය ශිෂ්‍යයන්ගේ' සංවිධානයක් පිහිටුවා ගත යුත්තේමුයි පුන පුනා කියන තත්වයක් ගැන සිතා බලන්න. එවැනි ලිපියක කතෘ විහිළුවට ලක් වනු ඇත. එසේ වීමෙහි වරදක්ද නැත. සංවිධානය පිළිබඳ ඔබේ අදහස් අපට දෙන්න. 'සාමාන්‍ය' කවුද, ඊට වඩා උසස් හා පහත් කවුද යන්න අපි තීරණය කරගන්නේමුයි ඔහුට කියනු ලැබෙනු ඇත. ඒහෙත් සංවිධානය පිළිබඳව ඔබගේම අදහස් නොමැති නම්, එවිට 'පොදු ජනයා' හා 'සාමාන්‍ය ජනතාව' වෙනුවෙන් වෙහෙස දැරීම කන්දෝස්කිරියාවක් පමණකි. 'දේශපාලනය' හා 'සංවිධානය' සම්බන්ධයෙන් වූ ප්‍රශ්න ඒවායේ ස්වභාවය අනුවම බරපතල ප්‍රශ්න වන හෙයින් ඒවා ගැන බරපතල ආකාරයෙන් හැර වෙනත් ලෙසකින් කටයුතු කළ නොහැකි වන බවද ඔබට තේරුම් යා යුතුය. මෙම ප්‍රශ්න මතු කළ විටෙක ඔබට ඒවාට පිළිතුරු දීමට සිදුවේ. ආපස්සට ගොස් 'සාමාන්‍ය' හා 'පොදු ජනයා' පිටුපස මුවා වෙන්නට හදන්න එපා. කවටවදන් හා හිස්වාක්‍ය

බණ්ඩ යෙදීමෙන් ප්‍රශ්නයෙන් මග හරින්න උත්සාහ කරන්න එපා.*

ස්වකීය කර්තව්‍ය සඳහා පූර්ණ සූදනමින් සිටීමට නම්, කම්කරු විප්ලවවාදියා වෘත්තීය විප්ලවවාදියෙක් බවට පත්විය යුතුය. එබැවින්, කම්කරුවෙක් පැය එකොළහ හමාරක් පැක්ටරියෙහි ගත කරන බැවින් (උද්ඝෝෂණය හැර) අනිකුත් සියළුම විප්ලවවාදී කාර්යයන්ගේ බර 'මුළුමනින්ම මෙන් හා අවශ්‍යයෙන්ම වැටෙනු යුත්තේ බුද්ධිමතුන්ගේ කුඩා බල ඇණියක කර මතය'යි යන බී. ගේ කියමන වැරදිය. එහෙත් මෙම තත්වය පවතින්නේ ඉඳුරාම පැවතිය යුතු දෙයක් ලෙසින් නොවේ. එය පවතින්නේ අපගේ නොදියුණු කම නිසාය; සෑම දක්ෂ කම්කරුවෙක්ම, වෘත්තීය උද්ඝෝෂණයෙකුගේ, සංවිධායකයෙකුගේ, ප්‍රචාරකයෙකුගේ, පොත්පත් බෙදහරින්නෙකුගේ ආදී වශයෙන් වූ තත්වයන්ට පත්වීම පිණිස ඔවුනට ආධාර කිරීමට ඇති අපගේ යුතුකම අපි භාර නොගන්නා නිසාය. මේ සම්බන්ධයෙන් වූකල අපි නියත වශයෙන්ම හිතන ලෙස අපගේ ශ්‍රමය අපතේ හරිමින් සිටින්නෙමු. විශේෂ සුපරීක්ෂාකාරිත්වයකින් රැක බලා ගෙන ඇති දැඩි කළ යුතු අය දියුණු කර ගැනීමේ හැකියාව අපට නොමැත. ජර්මානුන් දෙස බලන්න. ඔවුන්ගේ ශක්තිය අපගේ මෙන් සිය ගුණයකටත් වැඩිය. එනමුත්, සැබවින්ම දක්ෂ උද්ඝෝෂණයන් ආදීන් බොහෝ විට උසස් කරනු ලබන්නේ 'සාමාන්‍ය' පිරිස් අතරින් නොවන බව ඔවුන් මනාව වටහා ගෙන සිටිති. මේ නිසා, වැඩ කරන සෑම දක්ෂයෙකුටම ඔහුගේ දක්ෂකම් සම්පූර්ණ වශයෙන්ම දියුණු කර ගතහැකි වන හා උපයෝගි කරගත හැකිවන තත්වයට ඔහු පත් කිරීම පිණිස ඔවුන් වහ වහා උත්සාහ දරති. ඔහු වෘත්තීය උද්ඝෝෂණයක් කරනු ලැබේ; ඔහු ක්‍රියාකාරී වන ක්ෂේත්‍රය පුළුල් කිරීමට, එය එක පැක්ටරියකින් සමස්ත කර්මාන්තයක්ම දක්වාත්, එක ප්‍රදේශයකින් මුළු රටටමත් පැතිරවීමට ඔහු උනන්දු කරනු ලැබේ. ඔහු ස්වකීය වෘත්තියෙහි නිපුනත්වය හා පළපුරුද්ද ලබා ගනියි. ඔහු ඔහුගේ අවබෝධය පුළුල් කර ගනියි; දැනුම වැඩි කර ගනියි. ඔහු වෙනත් ප්‍රදේශවල හා වෙනත් පක්ෂවල ප්‍රධාන දේශපාලන නායකයන් සමීප ලෙස අධ්‍යයනය කරයි. හේ ඔවුන්ගේ මට්ටමට දියුණු වීමටත්, වෘත්තීයමය හුරුබුහුටි කමකින් කම්කරු පංති වටපිටාව පිළිබඳ දැනුමත්, නැවුම් සමාජවාදී අදහසුත් තමන් තුළ ඒකාබද්ධ කිරීමට ප්‍රයත්න දරයි. එය නොමැතිව, මනා පුහුණුවක් ඇති සතුරන්ට විරුද්ධව සටන් කිරීම නිර්ධන පංතියට කළ නොහැකි වේ. කම්කරු පොදු ජනයා විසින් බේබෙල් හා අවුවර යන අයගේ වර්ගයේ පුරුෂයන් ඉදිරිපත් කරනු ලබන්නේ මේ මාර්ගයෙන් පමණකි. එසේ වුවද දේශපාලන නිදහස තිබෙන රටක බොහෝ දුරට නිරායාසයෙන් සිදුවන දෙය, රුසියාවේ අපේ සංවිධාන විසින් ආයාසයෙන් හා ක්‍රමාණුකූලව කළ යුතුව තිබේ. යම්තරමකින් හෝ කුසලතා ඇති හා බලාපොරොත්තු ඇති කරවන කම්කරු උද්ඝෝෂකයන් පැක්ටරියේ දිනකට පැය එකොළහක් වැඩ කිරීමට හැර දැමීම නොකළ යුතුය. ඔහුගේ පළපුරුද්ද විශාල කර ගැනීමට හා අවබෝධය පුළුල් කර ගැනීමට නම්, අවුරුදු කීපයක්වත්, පොලිස් භටයන්ට විරුද්ධව සටන් කිරීමේ හැකියාව ඔහුට ලැබීමට නම්, ඔහු පක්ෂය මගින් නඩත්තු කිරීමත්, කල් යල් ඇතිව සැඟවී සිටීමත්, ඔහු ක්‍රියාත්මක වන ප්‍රදේශය වෙනස් කිරීමත් සඳහා අපි පිළිවෙළ යෙදිය යුතු වෙමු. කම්කරු පංති පොදු ජනතාවගේ ව්‍යාපාරයේ සාංසිද්ධික නැගීම පුළුල් හා ගැඹුරු වීමත් සමග ඔවුන් විසින්, ඔවුන්ගේ පිරිස් අතරින් දක්ෂ උද්ඝෝෂකයන් පමණක් නොව, දක්ෂ සංවිධායකයන්, ප්‍රචාරකයන් හා වචනයේ යහපත්ම අර්ථයෙන් 'ප්‍රායෝගික කාරක වරුන්ද' උසස් කර ඉදිරිපත් කරනු ලැබේ (අපගේ බුද්ධිමතුන් අතර ප්‍රායෝගික කාරක වරුන් ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකි; රුසියානු සිරිත අනුව බලන කල ඔවුන්ගෙන්ද බොහෝ දෙනෙකුගේ හුරුපුරුදුකම් අපරීක්ෂාකාරීය; ප්‍රමාද සහිතය). ඉතාමත් පෘථුල සූදනම් කිරීමක් සහිත (එමෙන්ම සේවාවේ 'සෑම අංශයක්ම හුරු විප්ලවවාදීන්' වන) විශේෂ පුහුණුවක් ලත් බලවේග අපට සිටින විට, ඔවුන් හා සමග තරඟ කිරීමට මිහිපිට කිසිම පොලිසියකට නොහැකි වනු ඇත. එසේ වීමට හේතුව නම්, අසීමිත ලෙස විප්ලවයට කැපවී සිටින මෙම බලවේගයන් පුළුල්තම කම්කරු පොදු ජනතා කොටස්වල අසීමිත විශ්වාසයක් දිනා ගෙන සිටීමයි. කම්කරුවන්ටත්, 'බුද්ධිමතුන්ටත්' පොදු වූ මෙම මාර්ගය ගන්නා ලෙස කම්කරුවන් 'උනන්දු කිරීමට' අප කර තිබෙන කටයුතු ප්‍රමාණවත් නොවන නිසාද, 'සාමාන්‍ය

---

* ''ස්වබෝද'' අංක 1, පිටු 66 — ''සංවිධානය'' යන ලිපියෙහිය: ''රුසියානු කම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන සියළුම ඉල්ලීම් කම්කරුවන්ගේ බලවත් අඩි හැප්පීම නිසා ශක්තිමත් කෙරේ''. මෙහි කම්කරුවන් ගැන සඳහන් වන්නේ ලොකු අකුරෙන් වන බව කිව යුතුය. තවද කතෘ මෙසේ හඬ නගයි: ''මා බුද්ධිමතුන්ට කිසිසේත් විරුද්ධ නැත, නමුත්''... (නමුත් යන වචනයෙහි අර්ථය 'නළලට වඩා උසට කන් වැඩෙන්නේ නැත'! යනුවෙන් ෂෙද්‍රීන් පරිවර්තනය කළේය)... ''නමුත් ලස්සන හා සිත් අලවන වචන කියමින් මා වෙත එන අයෙක් ඒවායේ (ඔහුගේ?) ලස්සන හා වෙනත් හොඳ ගුණ සලකා භාරගන්නා ලෙස කියන සෑම විටෙකම මට භය ජනක තරමට නොරිස්සුම ඇතිවේ'' (පිටු 62). ඔව්, මටද 'නිතරම භය ජනක තරම් නොරිස්සුම ඇති වේ'...

කම්කරුවන්' ආදීන්ට 'ළඟාවිය හැක්කේ' කුමක් වෙතද යනාදිය සම්බන්ධයෙන් කරන කථාවලින් ඔවුන් ආපසු අදිනු ලබන නිසාද වරද කෙළින් අප කර පිට වැටේ.

මෙම අංශයෙහි හා අනිකුත් අංශවලත්, අපගේ සංවිධාන කටයුතුවල විෂය ප්‍රමාණය පටුවීමට ඉඳුරාම හේතුවන කාරණය අපගේ න්‍යාය හා දේශපාලන කර්තව්‍යයන් පටු ක්ෂේත්‍රයකට සීමා කිරීම බව කිව හැක ('ආර්ථිකවාදීන්' හා ප්‍රායෝගික කටයුතුවල යෙදී සිටින නවකයන් බහුතරය මෙය වටහා ගෙන නැතත් සත්‍ය එයම වේ). සාංසිද්ධිකතාවයට වහල් වීම නිසා, පොදු ජනතාවට 'ළඟා වියහැකි' දෙයින් බැහැරව එකම පියවරක්වත් ගැනීමට බිය වන බවත්, පොදු ජනතාවගේ හදිසි හා සෘජු අවශ්‍යතාවයන් ඉක්මවා පමණට වඩා ඉහළට නැගෙතියි යන බියක් ඇතිවන බවත් පෙනේ. බිය නොවන්න, මහත්වරුනි! අප සංවිධානය පිළිබඳ තලයේ ඉතාමත් පහළ මට්ටමක සිටින හෙයින් පමණ ඉක්මවා ඉහළ නැගීම සම්බන්ධයෙන් වූ අදහස පවා විහිළුවකි!

ඉ) 'රහස් කුමණ්ත්‍රනකාරී' සංවිධානය සහ 'ප්‍රජාතන්ත්‍රවාදය'

මිහි පිට තිබෙන අන් සියල්ලටමත් වඩා, 'ජීවිතයේ හඬ'ට බිය වන ආකාරයෙන් එය හමුවේ සසලවෙන බොහෝ දෙනෙක් තවමත් අප අතර සිටිති. මෙහි විස්තර කෙරෙන අදහස් දරන අය ''නරෝද්නය වෝලිය'' පිළිවෙත අනුගමනය කරන බවත්, ඒ අය 'ප්‍රජාතන්ත්‍රවාදය' වටහා ගැනීමෙහි අසමත් වන බවත් යනාදිය ඔවුන් කියති. ''රබෝචිය දියල'' පත්‍රයෙන් දෝංකාරදී ඇති මෙම චෝදනාව ගැන සලකා බැලීම අවශ්‍ය වන්නේය.

සාන්ත පීටර්ස්බර්ග් 'ආර්ථිකවාදීහු' ''රබෝචය ගසියත'' පත්‍රයටත් විරුද්ධව ''නරෝද්නය වෝලිය'' ප්‍රවණතා අනුගමනය කිරීම පිළිබඳ චෝදනා කළහයි මෙම වැකි වල කතෘ හොඳින් දනියි (''රබෝචය මිස්ල්'' පත්‍රය හා සමග සසඳන කල මෙය තේරුම් ගත හැකි දෙයකි). ''ඉස්ක්‍රා'' පත්‍රය නිකුත් වූ වහාම, නගරයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්, එය ''නරෝද්නය වෝලිය'' සංවිධානයේ පත්‍රයක් ලෙස හඳුන්වන බව එක් සහෝදරයෙක් අපට දන්වූ නමුත් අප එයින් පුදුමයට පත් නොවූයේ එහෙයිනි. ඇත්තෙන්ම අපි එම චෝදනාවෙන් උදම් වුනෙමු. ''නරෝද්නය වෝලිය'' ආධාර කරුවෙකියි යනුවෙන් 'ආර්ථිකවාදීන්' විසින් චෝදනා කරනු නොලැබූ හොඳ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා කවුද?

මෙම චෝදනාව දෙ ආකාර දුර්මතවල ප්‍රතිඵලයකි. ප්‍රථමයෙන්, අප අතර විප්ලවවාදී ව්‍යාපාරයේ ඉතිහාසය ගැන පවතින දැනුම ඉතා අල්ප නිසා, සාර්වාදයට විරුද්ධව අධිෂ්ඨාන සහගත ලෙස යුද්ධ ප්‍රකාශ කරන ඕනෑම සටන්කාමී මධ්‍යගත සංවිධානයක් හැඳින් වීමට ''නරෝදනය වෝලිය'' නම පාවිච්චි කරනු ලැබේ. එහෙත් එක් දහස් අටසිය හැත්තෑ ගණන්වල පැවති හා අපට ආදර්ශයක් විය යුතු, විශිෂ්ට සංවිධානය පිහිටුවන ලද්දේ ''නරෝද්නය වෝලිය'' විසින් නොව ''සිම්ලියා ඊ වෝලිය''[90] විසිනි. එම සංවිධානය හේදවී ''චෝර්නි පිරිදියල්'' හා ''නරෝද්නය වෝලිය'' යන සංවිධාන ඇතිවිනි. ඒ අනුව බලන කල සටන්කාමී විප්ලවවාදී සංවිධානයක් ස්වරූපයෙන් ''නරෝද්නය වෝලිය'' හා සමාන සේ සැලකීම ඓතිහාසික මෙන්ම තාර්කික වශයෙන්ද අමන කමකි. අරගල කිරීම ගැන බරපතල ලෙස කල්පනා කරන ඕනෑම විප්ලවවාදී ප්‍රවණතාවයකට එවැනි සංවිධානයක් නැතිවම බැරිය. ''නරෝද්නය වෝලිය'' කළ වරද, අප්‍රසාදයට පත් සියළු දෙනාම සංවිධානයට බඳවා ගැනීමටත්, සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව එම සංවිධානය ධෛර්‍ය සම්පන්න ලෙස මෙහෙයවීමටත් උත්සාහ දැරීම නොවේ. එය කළ වරද වූයේ සාරාර්ථ වශයෙන් කිසිසේත් විප්ලවවාදී නොවන න්‍යායක් කෙරෙහි විශ්වාසය තැබීමයි. එම නිසා, දියුණු වෙමින් පැවති ධනවාදී සමාජයේ පංති අරගලය හා සමග ව්‍යාපාරය අභේද්‍ය ලෙස ගලපා ගැනීමේ හැකියාව ''නරෝද්නය වෝලිය'' සාමාජිකයින්ට නොතිබිනි. කම්කරු පංතියේ සාංසිද්ධික නැගී ඒම විසින්, ''සිම්ලියා ඊ වෝලිය'' සංවිධානයට තිබුණු වමේ හෝ ඇත්තෙන්ම ඊට වඩා අතිශයින්ම හොඳ විප්ලවවාදීන්ගේ සංවිධානයක් නිර්මාණය කිරීමට අප වෙත පැවරී ඇති යුතුකම ඉටු කිරීමේ වගකීමෙන් අප නිදහස් කරනු ලැබේය යන අදහස සිතට නැගෙනු ඇත්තේ මාක්ස්වාදය තේරුම් ගැනීමට අත්‍යන්තයෙන්ම අසමත් වීම (නැතහොත් එය 'ස්ත්‍රෑවේවාදයේ' ප්‍රවනතාවෙන් වටහා ගැනීම) නිසා වන්නේය. සිදුවන්නේ එහි අනික් පැත්තය. මෙම ව්‍යාපාරය අප වෙත යුතුකමක් පවරයි. ඊට හේතුව කම්කරු පංතියේ සාංසිද්ධික අරගලයට විප්ලවවාදීන්ගේ ශක්තිමත් සංවිධානයක නායකත්වය නොලැබුණහොත් එය එම පංතියේ සැබෑ 'පංති අරගලය' බවට පත් වන්නේ නැති වීමයි.

දෙවැනිව, දේශපාලන අරගලය පිළිබඳ 'රහස් කුමණ්ත්‍රනකාරී' අදහසට විරුද්ධව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් නිරතුරුව ගෙන ගිය විවාදය බී. ක්‍රිචේව්ස්කි (''රබෝචිය දියල'' අංක 10, පිටු 18) ඇතුළු බොහෝ දෙනෙක් වරදවා වටහා ගනිති. දේශපාලන අරගලය රහස්

කුමණ්ත්‍රනයකට සීමා කිරීම ගැන අපි නිතරම විරෝධය ප්‍රකාශ කෙළෙමු; අනාගතයේදීද තවදුරටත් ඊට විරෝධය පාන්නෙමු.* ශක්තිමත් විප්ලවවාදී සංවිධානයක අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කරන බවත් අපි මෙයින් කිසිසේත් අදහස් නොකරන බව ඉඳුරාම ප්‍රකාශ කරමු. ඒ අනුව, අත්තනෝමතවාදයට විරුද්ධව, එය පොඩි පට්ටම් වන ආකාරයට පහරක් දීම පිණිස. 'කැරළි ගැසීම... ට' හා 'වෙනත් සෑම ආකාරයකම පහර දීමකට'ත් සමත් වන තරම් ශක්තිමත්වන (සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ අභිප්‍රාය වන) සංවිධානයක විස්තරයක්, පසුගිය පා සටහනෙහි සඳහන් පත්‍රිකාවේ එන දේශපාලන අරගලය රහස් කුමණ්ත්‍රනයක තත්වයට පහත හෙළීමට විරුද්ධව ඉදිරිපත් කෙරෙන තර්ක විතර්කවලින් අනතුරුව, එහි සඳහන් කර ඇත.** 'කොන්ස්පිරසියොන්' යන ප්‍රංස වචනය 'සගොවෝර්' ('රහස්කුමණ්ත්‍රනය) යන වචනයට සමාන හෙයින්ද, සර්වබලධාරී ඒකාධිපති පාලනයක් තිබෙන රටක පවතින, එවැනි විප්ලවවාදී සංවිධානයක උපරිම රහස්‍ය භාවය තිබිය යුතු නිසාද, එවැනි සංවිධානයක් ආකෘතියෙන් 'රහස්කුමණ්ත්‍රනකාරී' වශයෙන් විස්තර කළ හැකි වේ. මෙම වර්ගයේ සංවිධානයක රහස්‍ය භාවය ;ඊට අත්‍යාවශ්‍යම කොන්දේසියක් වන හෙයින්, එහි අනිත් සියළු කොන්දේසිද (සාමාජිකයන් ගණන හා ඔවුන් තෝරාගන්නා ක්‍රමය, කාර්‍යයන්, ආදිය) ඊට ගැලපෙන ලෙස සකස් කළ යුතු වේ. එනිසා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් රහස් කුමණ්ත්‍රනකාරී සංවිධානයක් නිර්මාණය කිරීමට කැමැත්ත දක්වතියි යනුවෙන් කරන චෝදනාවට බිය වීම සැබෑම අන්ත නෝන්ජල් කමකි. නරෝද්නය වෝලිය පිළිවෙත අනුගමනය කරන බවට චෝදනා කරන කල්හි මෙන්ම, එවැනි චෝදනා ඉදිරිපත් වන විටද, ආර්ථිකවාදයට එරෙහි සෑම කෙනෙක්ම උද්දමයට පත්වේ.

රහස්‍ය කටයුතුවල සියළුම නූල් තම අතට සංකේන්ද්‍රනය කරගත් එබඳු බලවත් හා තදබල ලෙස රහස්‍ය වන සංවිධානයක්, අවශ්‍යයෙන්ම මධ්‍යගත කරන ලද සංවිධානයක්, සමහරවිට පහසුවෙන්ම අකාලයේ පහර දීම කරා දිවයාමට ඉඩ ඇති බවත්, එවැනි ප්‍රහාරයක් දීමට හැකි වීම පිණිස අවශ්‍ය තත්වයන් ඇති කිරීමට පෙර, කම්කරු පංතියේ දේශපාලන අප්‍රසාදය, උත්සන්නතාවය හා කෝපය වර්ධනය වීමට පෙර, සිතා නොබලා ව්‍යාපාරය වේගවත් කිරීමට ඉඩ තිබෙන බවත් යනාදිය කියමින් විරුද්ධ මතයක් ඉදිරිපත් කිරීමට පුළුවන. ඊට අපේ පිළිතුර මෙයයි: කල්පිත වශයෙන් කථා කරනහොත් තම, සටන්කාමී සංවිධානයක් සමහරවිට සිතා නොබලා සටන් වදිනු ඇතැයිද, වෙනත් තත්වයන් යටතේ වලක්වා ලිය හැකි පරාජයකින් එම සටන සමහරවිට කෙළවරවීමට ඉඩ ඇතැයිද යන්න ප්‍රතික්ෂේප කළ නොහැකිය. එහෙත් එවැනි ප්‍රශ්නයක් ගැන කාල්පනික තර්කවලට පමණක් සීමාවී අපට බලා සිටිය නොහැක. පරාජය වීමේ කල්පිත ඉඩ කඩ සෑම සටනකම ආවේනික වශයෙන් ඇත. සටන සඳහා සංවිධානාත්මක ලෙස සූදනම් වීම හැර මෙම ඉඩකඩ අඩුකිරීමේ වෙනත් මගක් නොමැත. කෙසේ හෝ වේවා, දැනට රුසියාවේ පවතින යථා තත්වයෙන් පටන්ගෙන අපි ඉදිරියට යන්නමෝ නම්, ව්‍යාපාරයට ස්ථාවරත්වය දීමත්, සිතා නොබලා පහර දීමේ ඉඩකඩ හේතු කොටගෙන ඇතිවන අන්තරායෙන් එය ආරක්ෂා කිරීමත් සඳහාම ශක්තිමත් විප්ලවවාදී සංවිධානයක් අවශ්‍යය යන නියත තීරණයට බැසගත යුත්තෙමු. එවැනි සංවිධානයක් තවමත් නොපවතින මේ අවස්ථාවෙම, විප්ලවවාදී ව්‍යාපාරය සීඝ්‍ර ලෙස හා සාංසිද්ධික ලෙස වර්ධනය වෙමින් තිබියදී, (බලාපොරොත්තු විය හැකි ලෙසට එකිනෙකට 'මුණගැසෙන') ප්‍රතිවිරෝධී අන්තයන් දෙකක් අපට දැනටමත් පෙනෙන්නට තිබේ: මෙම අන්තයන් නම්, බෙහෙවින් දෝෂහරිත ආර්ථිකවාදය හා සංයමය සඳහා කරන දේශන ද' 'සංවර්ධනය වෙමින් හා ශක්තිමත් වෙමින් තිබෙන හා අවසානයට වඩා තවමත් ආරම්භයට ආසන්නව පවතින ව්‍යාපාරයේ නිමා ලක්ෂණ කෘතිම වශයෙන් ඇති කිරීමට' (වි. සසූලිච්, ''සර්යා'' අංක 2—3, පිටු 353 හි) උත්සාහ දරන එලෙසින්ම දෝෂහරිත 'ඇවිස්සුම්කාරී ත්‍රස්තය' ද වෙති. එමෙන්ම, මෙම සීමාන්තයන්

---

* ''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍යයන්'', පිටු 21, පි. ල. ලව්රෝව්ට විරුද්ධව විවාදය.

** ''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍යයන්'', පිටු 23. මේ සම්බන්ධයෙන් ''රබෝචිය දියල'' පත්‍රය එක්කෝ එයම කථා කරන දෙය ගැන එයට වැටහීමක් නොමැති බවට, එසේ නැතහොත් එය 'සුලභ හමන අතට' එහි අදහස් වෙනස් කරන බවට තවත් නිදර්ශනයක් දෙන්නෙමු. ''රබෝචිය දියල'' අංක 1 හි පහත සඳහන් කොටස අවධාරණය සහිතව සඳහන්ව ඇති බව අපට දැක්ක හැකිය. 'පොතෙන් ඉදිරිපත් කර ඇති කරුණු සම්පූර්ණයෙන්ම ''රබෝචිය දියල'' පත්‍රයේ කතෘ මණ්ඩලයේ ප්‍රතිපත්තිය හා සමග ගැලපෙයි'' (පිටු 42). ඇත්තෙන්ම? සර්වබලධාරී ඒකාධිපතිත්වය පෙරළා දැමීම පොදු ජන ව්‍යාපාරයේ ප්‍රථම ඉල්ලීම වශයෙන් නියම නොකළ යුතුය යන අදහස, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍යයන් යන පත්‍රිකාවෙහි එන අදහස් හා සමග ගැලපේද? 'අදහස් අතින් ගැලපීම' යන්න මෙම අමුතු ආකාරයට වටහා ගන්නා පත්‍රයකට ස්ථිර ප්‍රතිපත්ති තිබිය හැකිද යන්න නිගමනය කිරීම පාඨකයට භාර කරමු.

දෙකටම ඉඩ දෙන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් සිටින බව ''රබෝචිය දියල'' ආදර්ශයෙන් පෙන්නුම් කෙරේ. මෙය පුදුමයට කාරණයක් නොවේ. ඊට හේතුවන කරුණු පසෙක තිබියදී, 'ස්වාමි වරුන්ට හා ආණ්ඩුවට විරුද්ධව කරන ආර්ථික අරගලයෙන්' විප්ලවවාදීන් කිසි කලෙකත් නොසැනසෙන නිසා ප්‍රතිවිරුද්ධ අන්තයන්, නිරතුරුවම, තැනින් නැන මතුවනු ඇත. සිතා නොබලා කරන ප්‍රහාරයන්ගෙන් ව්‍යාපාරය ආරක්ෂා කරගනිමින්, ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තු ඇති කරන ප්‍රහාරයන් සූදනම් කළ හැකි වන්නේ, සියළුම විප්ලවවාදී හැඟීම් හා පරිශ්‍රමයන් සතුටු කරන්නේයයි කිව හැකි, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති නිතිපතා ක්‍රියාත්මක කරන මධ්‍යගත සටන්කාමී සංවිධානයකට පමණකි.

තවත් විරෝධතාවයක් මතු කිරීමට ඉඩ ඇත. එනම් මෙහි විස්තර කර තිබෙන සංවිධානය පිළිබඳ වූ අදහස් 'ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තියට' පටහැනි බවයි.කලින් චෝදනාව නිශ්චිත රුසියානු ප්‍රභවයක් ඇති එකක් වූ අතර, මෙය නියමිත විදේශීය ස්වරූපයක් ගත් එකකි. එමෙන්ම තමන්ගේ කතෘ මණ්ඩලයට පහත සඳහන් වැනි උපදෙස් දීමට හැකි වූයේ (රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විදේශගත සංගමය) විදේශගත සංගමයකට පමණකි.

''සංවිධාන ප්‍රතිපත්තිය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථක සංවර්ධනය හා එක්සත් කරණය ඇති කර ගැනීම උදෙසා පක්ෂ සංවිධානය පිළිබඳ පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය අවධාරණය කළ යුතුය; විකාශ කළ යුතුය; ඒ සඳහා සටන් කළ යුතුය. අපගේ පක්ෂ සාමාජිකත්වය තුළ පෙනෙන්නට තිබෙන ප්‍රජාතන්ත්‍ර — විරෝධී ප්‍රවණතාවයන් ගැන සලකා බලන කල මෙය විශේෂයෙන්ම අවශ්‍ය වන්නේය'' (''සම්මේලන දෙකක්'', පිටු 18).

''ඉස්ක්‍රා'' පත්‍රයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රවණතාවයන්ට විරුද්ධව ''රබෝචිය දියල'' පත්‍රය සටන් කරන්නේ කෙසේද යන්න මීළඟ පරිච්ඡේදයෙන් බලමු. දැනට, ආර්ථිකවාදීන් ඉදිරිපත් කරන 'ප්‍රතිපත්තිය' වඩාත් සමීප ලෙස පරීක්ෂා කර බලන්නෙමු. 'පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය' ක්‍රියාත්මක වීම සඳහා පහත සඳහන් කොන්දේසි දෙක ඉටු විය යුතු බව සැම කෙනෙක්ම පිළිගනු ඇතැයි සිතමු: ප්‍රථමයෙන් ප්‍රචාරයද, දෙවැනිව සියළුම නිල සඳහා තෝරා පත් කිරීමද එම කොන්දේසි වෙති. ප්‍රචාරයක් නොමැතිව, එපමණක් නොව, සංවිධානයේ සාමාජිකයන්ට පමණක් සීමා නොවන ප්‍රචාරයක් නොමැතිව, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කිරීම විහිළුවකි. අප ජර්මන් සමාජවාදී පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයක් ලෙසට හඳුන්වන්නේ එහි කටයුතු සියල්ලම ප්‍රසිද්ධියේ කෙරෙන හෙයිනි. එහි පක්ෂ සම්මේලන පවා පැවැත්වෙන්නේ ප්‍රසිද්ධියේය. සංවිධානයක කටයුතු එහි සාමාජිකයින්ගෙන් හැර අන් සැම කෙනෙකුගෙන්ම තිරයකින් වැසූ කලෙක මෙන් සඟවන ලද විට එම සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදී එකකැයි කිසිවෙකු නොකියනු ඇත. එසේනම්, 'පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය'ට අවශ්‍ය මූලික කොන්දේසිය ඉටුකිරීම රහස් සංවිධානයකට නුපුළුවන්ව තිබියදී එම ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් සිදුවන ප්‍රයෝජනය කුමක්ද? 'පුළුල් ප්‍රතිපත්තිය' නිකම්ම දෝංකාර දෙවන එහෙත් හිස් වාක්‍ය ඛණ්ඩයක් බවට පත් වෙයි. එපමණක් නොව, සංවිධානය හා සම්බන්ධයෙන්, දැනට අවශ්‍ය ඉතාමත් හදිසි කර්තව්‍යයන් ගැන සම්පූර්ණ අනවබෝධයක්ද එයින් අනාවරණය වේ. අපගේ විප්ලවවාදීන්ගේ 'පුළුල්' පොදු ජනතාව අතර රහස්‍යභාවය කොතරම් බරපතල ලෙස අඩුද යනු කවුරුත් දනිති. මෙම කරුණ සම්බන්ධයෙන් බී. ගේ කටුක පැමිණිලිත් 'ඉතා සුපරීක්ෂාකාරිව සාමාජිකයන් තෝරා ගැනීම' සඳහා වූ ඔහුගේ ඉතා සාධාරණ ඉල්ලීමත් (''රබෝචිය දියල'' අංක 6, පිටු 42) අපි අසා ඇත්තෙමු. එහෙත් තියුණු 'යථාර්ථය පිළිබඳ හැඟුමක්' ඇතැයි කියමින් උදම් අනන අය මෙවැනි තත්වයක් යටතේ බලකර කියන්නේ දැඩි තම ලෙස රහස්‍යභාවය රැකීම හා දැඩි තම ලෙස සුපරීක්ෂාවෙන් (ඒ අනුව වඩාත් සීමා සහිත ලෙස) සාමාජිකයන් තෝරා ගැනීම අවශ්‍ය බව නොව, 'පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය' ගැනය! මෙය ගව් ගණනකින් ඉලක්කය වරද්ද ගැනීමකි.

ප්‍රජාතන්ත්‍රවාදයේ දෙවැනි අංගලක්ෂණය වන තෝරා පත් කිරීමේ ප්‍රතිපත්තිය හා සම්බන්ධයෙන්ද තත්වය ඊට වඩා යහපත් නොවේ. දේශපාලන නිදහස ඇති රටවල මෙම කොන්දේසිය සාමාන්‍යයෙන් පවතින්නක් ලෙස පිළිගනු ලැබේ. 'පක්ෂ වැඩ පිළිවෙළෙහි ප්‍රතිපත්ති පිළිගන්නා සහ පක්ෂයට හැකි සැම ආධාරයක්ම දෙන අය පක්ෂයේ සාමාජිකයන් වෙති'යි ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ව්‍යවස්ථාවල 1 වැනි වගන්තියෙන් කිය වේ. වේදිකාවක් ප්‍රේක්ෂක සමූහයාට පෙනෙන ලෙසින් විවෘතව තිබෙන සේ සමස්ත දේශපාලන පොර පිටියම මහජන දෘෂ්ටියට විවෘතව ඇති නිසා මෙම පිළිගැනීම හෝ නොපිළිගැනීමත් දක්වන ආධාරය හෝ විරෝධයත්, පුවත්පත්වලින් හා මහජන රැස්වීම්වලින් සියළු දෙනාටම දැනගත හැකිය. කිසියම් දේශපාලනඥයෙකු ඔහුගේ කටයුතු පටන්ගත්තේ අසුවල් ආකාරයටය, ඔහු පරිනාම වූයේ අසුවල් ආකාරයටය, දුෂ්කර අවස්ථාවල හැසුරුනේ අසුවල් ආකාරයටය, ඔහුගේ ගතිගුණ අසුවල් පිළිවෙළය යන්න සියළු දෙනාම දනිති. ඒ අනුව ඔහු කිසියම් නිලයකට

පත් කර ගැනීම හෝ පත් කිරීමට ප්‍රතික්ෂේප කිරීමට සියළුම කරුණු දන්නා සියළුම පක්ෂ සාමාජිකයිනට පුළුවන. පක්ෂයේ අයෙකුගේ සෑම ක්‍රියාවක්ම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන පොදු පාලනය (වචනාර්ථයෙනි) විසින් ජීව විද්‍යාවේ 'සවිමත් එකා ආරක්ෂා වීම' යනුවෙන් හැදින්වෙන නිර්මානය කෙරෙන ක්‍රියාදමයක් ජනිත කරනු ලැබේ. පූර්ණ ප්‍රසිද්ධිය මගින් කෙරෙන ස්වභාවික තේරීම තෝරා පත් කිරීම හා පොදු පාලනය මගින් අවසාන විනිශ්චයේදී සෑම දේශපාලනඥයෙකුම 'ඔහුට නිසි තැනට', ඔහුගේ හපන්කම් හා හැකියාවන් අනුව ඔහුට ඉතාමත් හොදින් ගැලපෙන කාර්යයන්හි ඔහු යොදනු ලැබීම, ඔහුගේ වැරදිවල ඵල විපාක ඔහුට විදින්නට සිදුවීම හා සමස්ත ලෝකයාම හමුවේ වැරදි පිළිගෙන ඒවා මහ හැරීමේ හැකියාව පිළිබඳ සහතිකය සැපයේ.

මේ පින්තූරය අපගේ සර්වබලධාරී ඒකාධිපතිත්වයේ රාමුවට ගැලපීමට උත්සාහ කරන්න! රහසේ කෙරෙන විප්ලවවාදී කටයුතු හා සම්බන්ධ සෑම කාර්යයක්ම 'පක්ෂ වැඩ පිළිවෙළෙහි ප්‍රතිපත්ති පිළිගන්නා හා පක්ෂයට හැකි සෑම ආධාරයක්ම දෙන' සියළු දෙනාම විසින් පාලනය කරනු ලැබීම ගැන සිතන්න පුළුවන්ද? නිලතල සඳහා තේරීමේදී කැමැත්ත ප්‍රකාශ කරන 'සියළු' දෙනා අතුරෙන් දහයෙන් නම දෙනෙකුට දැන ගත නොහැකි වන සේ, විප්ලවවාදී කටයුත්තෙහි යහපත උදෙසාම, අවශ්‍යයෙන්ම සැහවී සිටීමට සිදුවන විප්ලවවාදීන්ගෙන් කෙනෙකු තෝරා පත් කිරීම සියළු දෙනා විසින්ම කළ හැකි දෙයක්ද? ‘‘රබෝචිය දියල’’ පත්‍රය නගන මහාශබ්දික වාක්‍ය ඛණ්ඩවල නියම අර්ථය ගැන ටිකක් සිතා බලන්න. සර්වබලධාරී ඒකාධිපතිත්වයේ අඳුරත්, පොලිස්භටයන්ගේ අධිපතිත්වයත් මධ්‍යයේ පක්ෂ සංවිධාන කටයුතු සඳහා 'පුළුල් ප්‍රජාතන්ත්‍රවාදය' යොදා ගැනීම වැඩකටනැති එහෙත් හානිදයක කෙළිබඩුවක්ම මිස වෙනත් යමක් නොවන බව එවිට ඔබට වැටහෙනු ඇත. කැමැත්ත කොතරම් තිබුණත්, කිසිම විප්ලවවාදී සංවිධානයක් විසින් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදය ඇත්ත වශයෙන්ම ව්‍යවහාරයට ගන්නා ලද්දේ හෝ ගත හැකි වන්නේ හෝ නැති බැවින් එය ප්‍රයෝජනයක් නැති කෙළිබඩුවකි. 'පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය' ක්‍රියාත්මක කිරීමට දරන ඕනෑම ප්‍රයත්නයක් වෙතොත් එය පුළුල් පරිමානයේ වැටලීම් කිරීමට පොලිසියට දෙන ලොකු උදව්වක් වනු ඇත; පවත්නා පැරණි තාලය චිරස්ථායී කිරීමක් වනු ඇත; ප්‍රායෝගික කාරක වරුන්ගේ බරපතල හා හදිසි කර්තව්‍යය වන ඔවුන් වෘත්තීය විප්ලවවාදීන් වශයෙන් පුහුණුවීමේ කර්තව්‍යයෙන් ඔවුන්ගේ අවධානය නිලවරණ වෙතට, 'කඩදසි' රෙගුලාසි පිළියෙළ කිරීම වෙතට හැරවීමක් වනු ඇත. නියත වශයෙන් ක්‍රියාත්මක ලෙස වැඩෙහි යෙදීමට ඉඩ ප්‍රස්තා නොමැති අය එක් රැස්වන විදේශයෙහි පමණක්, විශේෂයෙන්ම කුඩා කණ්ඩායම් වශයෙන් සෑදී මෙම 'ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රීඩාවෙහි යෙදෙනු හැකිය.

පෙනුමෙන් හොඳ 'ප්‍රතිපත්තියක්' වන ප්‍රජාතන්ත්‍රවාදය විප්ලවවාදී කටයුතුවලදී ඉදිරිපත් කිරීමෙන් ‘‘රබෝචිය දියල’’ පත්‍රය ගෙන යන සුපුරුදු ප්‍රයෝගයෙහි අශෝභනත්වය පෙන්නුම් කිරීමට අපි නැවතත් සාක්ෂිකාරයෙක් කැඳවමු. ‘‘නකනූනිය’’ නම් ලන්ඩන් සහරාවේ කර්තෘ තැන්පත් වයි. සෙරියබ්‍රියකෝව් වන සාක්ෂිකරු ‘‘රබෝචිය දියල’’ පත්‍රයට ඇල්මක් දක්වන අතර ප්ලෙහානව් සහ ‘‘ප්ලෙහානව්වාදීන්’’ කෙරෙහි දැඩි වෛරයෙන් පිරී සිටී. විදේශ ගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ භේදය ගැන ලිපියක් පළ කළ ‘‘නකනූනිය’’ සහරාව, එයින් ස්ථිර වශයෙන්ම ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ පැත්ත ගනිමින් ප්ලෙහානව් වෙත පහත් අපවාද රාශියක් එල්ල කළේය. එබැවින් සාකච්ඡා කෙරෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු වඩාත් වැදගත් වන්නේය. බරපතල විප්ලවවාදී ව්‍යාපාරයක් තුළ 'ආත්ම වංචනය, නායකත්වය හා ඊනියා ඒරියෝපාගුස් වැනි ඉහළ මණ්ඩල' වැනි දේ ගැන කථා කිරීම 'කැත' දෙයකැයි ‘‘නකනූනිය’’ 1899 ජූලි (අංක 7) කලාපයේ 'කම්කරුවන්ගේ ස්වයං විමුක්ති කණ්ඩායමේ ප්‍රකාශය ගැන' යන මාතෘකාවෙන් යුත් ලිපියෙන් තර්ක කරන සෙරියබ්‍රියකෝව් වෙනත් කරුණු සඳහන් කළ අතර පහත දැක්වෙන පරිදිද ලීවේය:

> ‘‘මීශ්කින්, රගචෝව්, ෂෙලියාබව්, මීහායිලව්, පෙරෝව්ස්කයා, පිග්නර් හා තවත් අය තමන් නායකයන් යයි කිසි කලෙකත් නොසිතූහ: කිසිවෙකු ඔවුනට එවැනි පත්වීම් නොදුන්හ. එහෙත් ඇත්ත වශයෙන්ම ඔවුන් නායකයන් වූහ. එසේ වූයේ, වැඩ කටයුතුවල ප්‍රධාන කොටස ඔවුන් කරට ගත් හෙයිනි; ඔවුන් ඉතාමත් අන්තරාදයක තැන්වලට ගිය හෙයිනි; ඔවුන්ගේ වැඩ කටයුතු වඩාත්ම ප්‍රතිඵලදයක වූ හෙයිනි. ඔවුන් නායකයන් වූයේ ඔවුන් එය අපේක්ෂා කළ නිසා නොව, ඔවුන් වට කොට ගෙන සිටි ඔවුන්ගේ සහෝදරවරු, ඔවුන්ගේ ඥානවන්තභාවය, ධෛර්ය හා පක්ෂපාත භාවය කෙරෙහි විශ්වාසය තැබූ හෙයිනි. සිතූ මතයට ව්‍යාපාරය පාලනය කරන ඒරියෝපාගුස් වැනි කිසියම් වර්ගයක මණ්ඩලවලට බියවීම (නොබිය නම් ඒ ගැන ලියන්නේ මන්ද?) පමණට වඩා නොන්ජල් වීමකි. ඒ ගැන තකන්නේ කවුද?’’

‘‘ඒරියෝපාගුස්’’ වැනි මණ්ඩල 'ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රවණතාවයන්ගෙන්' වෙනස් වන්නේ කුමණ ආකාරයකින්ද යනු පාඨකයාගෙන් විමසනු කැමැත්තෙමු. තවද ‘‘රබෝචිය දියල’’ පත්‍රයේ

‘පෙනුමෙන් හොඳ’ සංවිධාන ප්‍රතිපත්තිද ඒ සමානවම නෝන්ජල් හා කැත බව පැහැදිලි නොවේද? ‘‘ඒරියෝපාගුස්’’ නැතහොත් ‘ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රවණතාවයන්’ ඇති අය ‘වට කොට ගෙන සිටින සහෝදරවරු’ ඔවුන්ගේ ‘ඥානවන්තභාවය, ධෛර්ය පක්ෂ පාත භාවය ගැන විශ්වාසයක් නැතිව සිටියෝ’ නම්, එවිට කිසිවෙක් ඔවුන් ගැන සැලකිල්ලක් නොදක්වන නිසා එය නොන්ජල්ය; සමහර දෙනෙකුගේ අහංකාර කමත්, අප ව්‍යාපාරයේ නියම තත්වය ගැන අනිත් අයගේ නොදන්නා කමත්, තවත් අයගේ නුපුහුණු තම හා විප්ලවවාදී ව්‍යාපාරයේ ඉතිහාසය ගැන නොදනුවත් කමත් වාසියට හරවා ගැනීමේ අරමුණ ඇතිව කරන කෛරාටික කඩා වැදීමක් වන බැවින් එය කැතයි. අප ව්‍යාපාරයේ ක්‍රියාකාරක වරුන් සඳහා සුදුසු එකම සංවිධාන ප්‍රතිපත්තිය විය යුත්තේ දැඩි තම ලෙස රහස්‍ය භාවය රැකීම, දැඩි සුපරීක්ෂාකාරීත්වයෙන් සාමාජිකයන් තෝරාගැනීම හා වෘත්තීය විප්ලවවාදීන් පුහුණු කිරීමයි. මෙම ගුණාංගයන් ඇතිවූ කල, ‘ප්‍රජාතන්ත්‍රවාදයටත්’ වඩා අගනා දෙයක් වන සම්පූර්ණ සහෝදරාත්මක අන්‍යෝන්‍ය විශ්වාසය විප්ලවවාදීන් අතර ඇති වීම සහතික වන්නේය. මෙය අපට අනිවාර්ය ලෙසටම අත්‍යාවශ්‍යය. එසේ වන්නේ රුසියාව තුළ ඒ වෙනුවට පොදු ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ආදේශ කිරීම පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගිය නොහැකි හෙයිනි. නියම ‘ප්‍රජාතන්ත්‍රවාදී’ පාලනයක් ඇති කිරීමට නොහැකි වීම නිසා, විප්ලවවාදී ව්‍යාපාරයේ සාමාජිකයන් සම්පූර්ණයෙන්ම පාලනයෙන් බැහැර වන්නේයයි විශ්වාස කිරීම වරදකි. සෙල්ලම් බඩු ආකාර ප්‍රජාතන්ත්‍රවාදය (සමීප ලෙස ඒකාබද්ධවුනු සහෝදරයන්ගෙන් සමන්විත, අන්‍යෝන්‍ය විශ්වාසය බලපවත්නා මණ්ඩලයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදය) සඳහා ඔවුනට කාල වේලා නොමැත. එහෙත් සැබෑ විප්ලවවාදීන්ගේ සංවිධානයක්, නොතරම් වන සාමාජිකයෙක් එයින් ඉවත්කර පිරිසිදු වීමට හැකි සෑම දෙයක්ම කරන බව පළපුරුද්දෙන් දන්නා ඔවුන් තුළ වගකීම පිළිබඳව ඇත්තේ උත්සුක්ත හැඟීමකි. දීර්ඝ ඉතිහාසයක් ඇති රුසියානු (හා ජාත්‍යන්තර) විප්ලවවාදී පිරිස් අතර තරමක් හොඳින් සංවර්ධනය වුනු ජනමතයක් වෙයි. සහෝදරත්වයේ යුතුකම් කෙරෙන් බැහැරයන සෑම අවස්ථාවක්ම සම්බන්ධයෙන් එය තදබල දඬුවම් පමුණුවයි. (ඒමෙන්ම සෙල්ලම් භාණ්ඩ ප්‍රජාතන්ත්‍රවාදය නොව නියම ‘ප්‍රජාතන්ත්‍රවාදය’ ස්ථිරවම සහෝදරත්වය පිළිබඳ සංකල්පයේ අඩංගු කොටසක් වන්නේය). මේ සියල්ලම සැලකිල්ලට ගත් කල, ‘ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රවණතාවයන්’ ගැන වූ මෙම කථා වලින් හා මෙම යෝජනා කෙරෙන්, දැනට විදේශවල කෙරෙන සේනාපති ක්‍රීඩාවෙහි පුස්හඳ වහනය වන බව ඔබට වැටහෙනු ඇත.

මෙම සංවාදයේ අනික් ප්‍රභව මූලය වන නෝන්ජල්කම පැවැත්ම ලබන්නේ ප්‍රජාතන්ත්‍රවාදය යන්නෙහි අර්ථය ගැන තිබෙන අවුල් සහගත තත්වයෙනි. වෙබ් මහතා සහ එම මහත්මිය ඉංග්‍රීසි වෘත්තීය සමිති ගැන ලියූ පොතෙහි ‘පෞරාණික ප්‍රජාතන්ත්‍රවාදය’ යන මාතෘකාව යටතේ එන ඡේදය සැලකිල්ල අවුස්සන්නකි.ඉංග්‍රීසි වෘත්තීය සමිතිවල මුල් කාලයේදී, සමිති කළමණාකරනයට අදාල සියළුම කටයුතු සියළුම සමාජිකයින් විසින් කරනු ලැබීම ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යාවශ්‍ය ලක්ෂණයක් වශයෙන් ඉංග්‍රීසි කම්කරුවන් සැලකූ හැටි කර්තෘවරු එහි විස්තර කරති. සියළුම ප්‍රශ්න සියළුම සාමාජිකයන්ගේ ඡන්දයෙන් තීරණය කළා පමණක් නොව, සෑම නිල කාර්යයන්ද වටයෙන් වටය සියළුම සාමාජිකයින් විසින් ඉටු කරන ලදී. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ එවන් සංකල්පයක විකල් ස්වභාවය අවබෝධ කර ගැනීමටත්, එක් අතකින් නියෝජන බලැති ආයතන හා අනික් අතින් පූර්ණ කාලීන නිලධාරීන් අවශ්‍ය බව අවබෝධ කර ගැනීමටත් කම්කරුවන්ට දීර්ඝකාලයක ඓතිහාසික අත්දැකීම් අවශ්‍ය විය. දයක මුදල් ප්‍රමාණයන් හා යහසාධක ගෙවීම් ගැන හුදු ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දයෙන්ම තීරණය කළ නොහැකි බවත්, ඒ සඳහා රක්ෂණ විශේෂඥයන්ගේ උපදෙස්ද අවශ්‍ය බවත්,කම්කරුවන්ට තේරුම් ගියේ සමිති ගණනාවක භාණ්ඩාගාර මුදල් අතින් බංකොලොත් වීමෙන් පසුවය. පාර්ලිමේන්තුවාදය හා ජනතාව විසින් නීති සම්පාදනය කිරීම ගැන වූ කෞට්ස්කිගේ පොත ගැන ද සලකා බලමු. එහිදී මාක්ස්වාදී න්‍යායවාදියා බැසගන්නා නිගමනයන්ද, ‘සාංසිද්ධික ලෙස’ සංවිධානවූ කම්කරුවන් අවුරුදු බොහෝ ගණනක් තිස්සේ ලැබූ ප්‍රායෝගික අත්දැකීම් වලින් උගත් පාඩම්ද එක සමාන බව අපට පෙනේ. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ රිටින්ග්හවුසෙන් පැරණි සංකල්පය ගැන කෞට්ස්කි තදින් විරෝධය පළ කරයි; ‘පොදු ජන පුවත්පත කෙළින්ම ජනතාව විසින් සංස්කරණය කරනු ලැබිය යුතුය’ යනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ඉල්ලන අය ඔහුගේ සමච්චලයට ලක්වෙති; නිර්ධන පංතියේ පංති අරගලයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය සඳහා වෘත්තීය පුවත්පත් කලාවේදීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ආදීන් අවශ්‍ය බව ඔහු පෙන්වාදෙයි; නූතන සමාජයේ ජනතාව විසින් නීති සම්පාදනය කිරීම පිළිබඳ අදහස ක්‍රියාත්මක කළ හැක්කේ සාපේක්ෂ වශයෙන් පමණක් වන බව වටහා ගැනීමට අසමත්ව, ‘ප්‍රතිඵල අපේක්ෂාවෙන් ප්‍රයත්න දරමින්’ ජනතාව විසින් කෙළින්ම නීති සම්පාදනය කරනු ලැබීම

ගැන ප්‍රසංගාත්මකව කථා කරන 'අරාජිකවාදීන්ගේ හා උගතුන්ගේ සමාජවාදය'ට ඔහු පහර දෙයි.

පොදු ශිෂ්‍ය හා ජනතා කොටස් අතර 'පූරාණාකාර' ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය කොතරම් විශාල ලෙස පැතිරී තිබේද යනු අප ව්‍යාපාරය තුළ ප්‍රායෝගික වැඩ කටයුතු කළ අය දනිති. මෙම සංකල්පය සංවිධානයේ ව්‍යවස්ථා හා සාහිත්‍ය තුළට රිංගීම පුදුමයක් නොවේ. බර්න්ෂ්ටයින්වාදී පන්නයේ ආර්ථිකවාදීහු ඔවුන්ගේ ව්‍යවස්ථාවල මෙය ඇතුළත් කර තිබේ. '§10. සමස්ත සංගම් සංවිධානයේම උවමනාවන් කෙරෙහි බලපාන සියළුම කටයුතු එහි මුළු සාමාජිකත්වයේ වැඩි ඡන්දයෙන් තීරණය කරනු ලැබේ'. ඔවුන් අනුවම ත්‍රස්තවාදී පන්නයේ ආර්ථික වාදීහුද මෙසේ පුනරුච්චාරණය කරති. 'කාරක සභාවේ තීරණ වලංගු වන්නේ ඒවා සියළුම කව වෙත යොමු කර කැමැත්ත විමසීමෙන් පසුව පමණකි'. (''ස්වබෝද'' අංක 1, පිටු 67). පුළුල් ලෙස ක්‍රියාත්මක කෙරෙන විශේෂ ඡන්දය සඳහා වූ මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ සමස්ත සංවිධානයම තෝරාපත් කිරීමේ පදනමකින් ගොඩනැගිය යුතුය යන යෝජනාවට අමතරව බව සටහන් කර ගන්න! එසේ වුවද, නියම ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයක න්‍යාය හා භාවිතය අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් තරම් අවස්ථා නොලද ප්‍රායෝගික කාරකවරුන් මෙම කරුණ නිසා හෙළා නොදකිමු. එහෙත්, නායකත්වයට අයිතිවාසිකම් කියන ''රබෝචිය දියල'' පත්‍රය, එවැනි තත්වයන් යටතේ පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති ගැන වූ යෝජනාවට පමණක් සීමා වන කල, එය හුදෙක්ම 'ප්‍රතිඵල අපේක්ෂාවෙන් ප්‍රයත්න දැරීම' පිළිබඳ අවස්ථාවක් ලෙසට හැර වෙනත් කිසිද ආකාරයකින් විස්තර කළ හැකිද?

ඊ) ප්‍රාදේශීය සහ සමස්ත රුසියානු වැඩ

මෙහි සටහන් කර තිබෙන සංවිධාන සැලැස්ම ප්‍රජාතන්ත්‍රවාදී නොවේයයිද, රහස් කුමන්ත්‍රනකාරී වේයයිද යන හේතු පදනම් කරගෙන එයට දක්වන විරුද්ධත්වය ඉතාමත් දුර්වල එකකි. එසේ වුවද, අසනු ලබන හා විස්තර විභාග කිරීම සුදුසු වන, ප්‍රශ්නයක් ඇත. එනම් ප්‍රාදේශීය හා සමස්ත රුසියානු වැඩ පිළිබඳ ප්‍රශ්නය ය. මධ්‍යගත සංවිධානයක් පිහිටුවීමෙන්, ප්‍රාදේශීය සංවිධාන කෙරෙන් ගුරුත්වාකර්ශනය මධ්‍යගත සංවිධානය වෙතට යොමු වනු ඇතැයිද, එමගින්, කම්කරු පංතිය සමග පවත්නා සම්බන්ධකම් හා ප්‍රාදේශීය උද්ඝෝෂණයේ අවිච්ඡේද ස්වභාවය පොදු වශයෙන් දුර්වල වීමෙන් ව්‍යාපාරයට හානි පැමිණෙතැයිද යන සැකය පළ කරනු ලැබේ. පසුගිය අවුරුදු කීපය තුළ අපගේ ව්‍යාපාරයට හානි පැමිණියේ ප්‍රාදේශීය කාරකවරුන් පමණ ඉක්මවා ප්‍රාදේශීය වැඩ කටයුතු කෙරෙහි ඇලීගැලී සිටි නිසාම බව මෙම සැක පහළ කිරීමට පිළිතුරු වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමු. එනිසා මෙම ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය තරමක් දුරට සමස්ත රුසියානු වැඩ කරා ගෙනයාම අවශ්‍ය වේ. එසේ කිරීමෙන් අපගේ සම්බන්ධකම් හා ප්‍රාදේශීය උද්ඝෝෂණයේ අවිච්ඡේද ස්වභාවය ශක්තිමත් වනු මිස කිසිසේත් දුර්වල නොවනු ඇති බවද සඳහන් කරමු. මධ්‍යම සහ ප්‍රාදේශීය පුවත්පත් පිළිබඳ ප්‍රශ්නය ගෙන බලමු. අප පුවත්පත් ගැන සඳහන් කරන්නේ පමණ කළ නොහැකි තරම් පුළුල් හා ඉතාමත් විවිධ පොදු විප්ලවවාදී වැඩ කටයුතු සම්බන්ධයෙන් උදුහරණයක් ගෙන හැර දැක්වීමට පමණක් වන බව අමතක නොකරන ලෙස පාඨකයාගෙන් ඉල්ලමු.

බහුජන ව්‍යාපාරයේ මුල් කාලය (1896—1898) තුළ සමස්ත රුසියානු පත්‍රයක්, ''රබෝචය ගසියත'' පත්‍රය පළ කිරීමට ප්‍රාදේශීය කාරක වරු ප්‍රයත්න දැරූහ. ඊළඟ කාල පරිච්ඡේදයේදී (1898—1900) ව්‍යාපාරය දැවැන්ත ඉදිරි පියවරක් තැබූ නමුත්, නායකයන්ගේ අවධානය සම්පූර්ණයෙන්ම ප්‍රාදේශීය පත්‍ර ප්‍රකාශනය වෙත ඇදී තිබිණි. පළ කරන ලද ප්‍රාදේශීය පත්‍ර මුළු ගණන බැලුව හොත් සාමාන්‍ය වශයෙන් මසකට පත්‍රයක් බැගින් පළ කරන ලදී.* මෙය අපගේ ආධුනික ස්වභාවය පිළිබඳ පැහැදිලි නිදර්ශනයක් නොවේද? අපගේ විප්ලවවාදී ව්‍යාපාරය, ව්‍යාපාරයේ සාංසිද්ධික වර්ධනය පසුපස ඇදී යන බව මෙයින් පැහැදිලිව පෙන්නුම් නොකෙරේද? විසිරිගිය ප්‍රාදේශීය කණ්ඩායම් මගින් නොව, එකම සංවිධානයක් මගින් එම කලාප ගණනම පළ කරන ලද්දේ නම්, එවිට අති මහත් ශ්‍රමයක් ඉතිරි කර ගැනීමට පමණක් නොව, අපගේ වැඩ කටයුතු විෂයෙහි අපමණ ස්මෘද්ධි භාවයක් හා අවිච්ඡේද ස්වභාවයක් ඇති කරගැනීමට ද හැකිව තිබුණි. ක්‍රියාශීලී ලෙස හා බොහෝ විට ප්‍රාදේශීය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ වැඩ පමණක් කරන, ඒ ප්‍රායෝගික කාරක වරුන් බොහෝ විට මෙම සරල කාරණය නොදනිති. (අවාසනාවකට මෙන් ඔවුන් වැඩි දෙනා සම්බන්ධයෙන් දැනුදු මෙම කාරණය සත්‍ය වේ).

---

* ''පැරිස් සම්මේලන වාර්තාව''[91] බලන්න — පිටු 14: ''එතැන් (1897) පටන් 1900 වසන්තය දක්වා විවිධ ස්ථානවල විවිධ පත්‍ර වලින් කලාප 30 ක් නිකුත් කරන ලදී... සාමාන්‍ය වශයෙන් මසකට පත්‍ර එකකට වැඩි ගණනක් නිකුත් කරන ලදී''.

එමෙන්ම, මෙම ප්‍රශ්නය හා සම්බන්ධයෙන් පුදුම සහගත මෝඩ වීරත්වයක් පෙන්වන ප්‍රකාශකයන්ද මෙම කාරණය නොදනිති. සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක් සංවිධානය කිරීමේ කටයුත්ත ඉටු කිරීම ප්‍රායෝගික කාරක වරුන්ට 'දුෂ්කර'* බවත්, පුවත්පත් නොමැති තත්වයට වඩා ප්‍රාදේශීය පුවත්පත් තිබීම හොඳ බවත් කියමින් තර්ක කර සැනසීමට ප්‍රායෝගික කාරකවරු සාමාන්‍ය වශයෙන් පුරුදුව සිටිති. මෙම තර්කය සාධාරණ බව පිළිගනිමු. ඕනෑම ප්‍රායෝගික කාරක වරයෙකු මෙන්ම අපිද ඇත්ත වශයෙන්ම ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍රවල ඇති ඉමහත් වැදගත්කම අගේ කරමු. එහෙත් කාරණය එය නොවේ. අවුරුදු දෙක හමාරක කාලය තුළ රුසියාවේ සෑම තන්හිම පළ කරන ලද ප්‍රාදේශීය ප්‍රවෘති පත්‍ර කලාප තිහෙන් ඇස් පනා පිට පෙන්නුම් කෙරෙන කොටස්වලට වෙන්වී සිටීම හා පැරණි තාලය අපට ජය ගත නොහැකිද? කාරණය එයයි. ප්‍රාදේශීය ප්‍රවෘති පත්‍රවල පොදු ප්‍රයෝජනවත්කම පිළිබඳ ප්‍රතික්ෂේප කළ නොහැකි එහෙත් ඉතා පොදු ප්‍රකාශයට සීමා නොවන ලෙස ඔබට කියමු. අවුරුදු දෙක හමාරක කාලයක් තුළ ලැබූ අත්දැකීම් වලින් හෙළිදරව් වී ඇති ඒවායේ අවාසි පැත්තද අකුටිලව පිළිගැනීමට තරම් ධෛර්‍යමත් වන්න. අප වැඩ කරන තත්වයන් යටතේ, ප්‍රාදේශීය ප්‍රවෘති පත්‍ර වලින් බහුතරය, ඒවායේ ප්‍රතිපත්ති අතින් අස්ථාවර වන බවත්, ඒවා දේශපාලන වැදගත් කමෙන් තොර බවත්, විප්ලවවාදී බලවේගයන් වැය වීම අතින් ඉතාමත් අලාභදායක බවත්, ශිල්පීය ක්‍රියා පිළිවෙළ අතින් (මා අදහස් කරන්නේ මුද්‍රණශිල්පය ගැන නොව, පළ කිරීමේ නිරන්තර භාවය හා නිත්‍යතාවය ගැනය) ඉතාමත් අසතුටුදායක බවත් මෙම අත් දැකීමෙන් පැහැදිලි වී තිබේ. මෙම දුර්වල තාවයන් අහම්බෙන් ඇති වූ ඒවා නොවේ. එම දුර්වල කම් ඇති වූයේ කොටස්වලට වෙන්වී සිටීමේ අනිවාර්‍ය ප්‍රතිඵලයක් වශයෙන් වූ අතර, සමාලෝචනය කෙරෙන කාලය තුළ ප්‍රාදේශීය ප්‍රවෘති පත්‍ර ප්‍රබලවීමට එක් අතකින් හේතු වූ කරුණද එය විය. අනික් අතට එසේ කොටස් වලට වෙන්වීම උනන්දුමත් කරන ලද්දේද මෙම ප්‍රබලත්වය විසිනි. වෙන්වී සිටින ප්‍රාදේශීය සංවිධානයක පත්‍රය, ප්‍රතිපත්තිමය ස්ථිරත්වයක් පවත්වාගන්නා දේශපාලන පක්ෂයක පත්‍රයක් තත්වයට නංවා ගැනීම නියත වශයෙන්ම එම සංවිධානයේ ශක්තිය ඉක්මවා යන්නකි. අපගේ මුළු දේශපාලන ජීවිතයටම එළිය දීම සඳහා ප්‍රමාණවත් තරම් කරුණු රැස්කර, ඒවා උපයෝගී කර ගැනීම එහි ශක්තිය ඉක්මවා යන කර්තව්‍යයකි. නිදහස තිබෙන රටවල ප්‍රාදේශීය පත්‍ර රැසක් තිබීමේ අවශ්‍යතාවය ඒත්තු ගැන්වීමට ඉදිරිපත් කෙරෙන සුපුරුදු තර්කය නම් ප්‍රාදේශීය කම්කරුවන් මගින් අඩුවියදමින් මුද්‍රණ කටයුතු කරවා ගත හැකි වීම හා ජනතාව වෙත වඩාත් අංග සම්පූර්ණ ලෙස හා වඩාත් සීඝ්‍ර ලෙස තොරතුරු ගෙනයා හැකි වීමයි. පළ පුරුද්දෙන් පෙන්නුම්කර ඇති අන්දමට මෙම තර්කයෙන් සනාථ වන්නේ රුසියාවේ ප්‍රාදේශීය ප්‍රවෘති පත්‍ර පැවැත්වීමට විපක්ෂ අදහසය. එම පත්‍ර සඳහා වැය වන විප්ලවවාදී බලවේග අනුව ඒවායේ මිළ ඉතාමත් අධිකය. එමෙන්ම ඒවා නිකුත්වන්නේ ඉතාමත් කලාතුරකිනි. මෙසේවීමට පැහැදිලි හේතුව නම්, කොතරම් කුඩා වූ හෝ නීතිවිරෝධී පත්‍රයක් පළ කිරීම සඳහා ඉතා විශාල රහස් සංවිධානයක් අවශ්‍යවීමයි. එබඳු සංවිධානයක් විය හැක්කේ මහාපරිමාන පැක්ටරි නිෂ්පාදනයක් ඇතොත් පමණකි. එවැනි සංවිධානයක් කුඩා හස්ත කාර්මික කර්මාන්ත ශාලාවක ඇති කළ නොහැක. රහස් සංවිධානයේ පැරණිතාලය නිසා, සෑම විටෙකම පාහේ, කලාප එකක් හෝ දෙකක් නිකුත් කළ පසු, එයින් ප්‍රයෝජන ගනිමින් තොග ගණනින් සිරභාරයට ගැනීම් කිරීමේ හැකියාව පොලිසියට ලැබේ. එහි ප්‍රතිඵලය සංවිධානය මුළුමනින්ම අතු ගා දැමීමකට සමාන වන හෙයින් නැවතත් මුල සිටම කටයුතු ඇරඹීමට සිදුවේ. හොඳින් සංවිධානය කළ රහස් සංවිධානයකට හොඳින් පුහුණු වූ වෘත්තීය විප්ලවවාදීන් හා උසස්තම මට්ටමක ස්ථිරත්වයකින් ක්‍රියාත්මක කෙරෙන ශ්‍රම විභජනයක්ද අවශ්‍ය වේ. වෙන්වූ ප්‍රාදේශීය සංවිධානයක් නිශ්චිත එක් අවස්ථාවක කොතරම් බලවත් වුවත්, මෙම අවශ්‍යතාවයන් දෙකම සපුරාලීමට අවශ්‍ය ශක්තිය එයට නොමැත. සමස්තයක් වශයෙන් අපගේ ව්‍යාපාරයේ පොදු උවමනාවන් (ස්ථිර සමාජවාදී හා දේශපාලන ප්‍රතිපත්ති විෂයෙහි නිපුන වනසේ කම්කරුවන් පුහුණු කිරීම) පමණක් නොව නියම ප්‍රාදේශීය උවමනාවන් පවා වඩා හොඳින් ඉටු කෙරෙන්නේ ප්‍රාදේශීය නොවන ප්‍රවෘති පත්‍රයක් මගිනි. බැලූ බැල්මට මෙය තේරවිල්ලක් ලෙස පෙනෙන්නට පුළුවන. එහෙත්, ඉහත සඳහන් අවුරුදු දෙක හමාරක අත්දැකීමෙන් මෙය සම්පූර්ණයෙන්ම ඔප්පුවී තිබේ. පත්‍ර කලාප තිහ පළ කිරීමට යෙදුනු සියළුම ප්‍රාදේශීය බලවේග එක පත්‍රයක් පළ කිරීමට කටයුතු කළෝ නම් ඉන් කලාප සියයක් නොවේ නම් හැටක්වත්

---

* මෙම දුෂ්කර තාවය යතාර්ථයයට වඩා පෙනුමෙන් පවතින්නකි. ඇත්ත වශයෙන්ම සමස්ත රුසියානු වැඩ කටයුතු සම්බන්ධයෙන් මොනයම් හෝ කාර්‍යයක් භාර ගැනීමට අවස්ථාවක් නොමැති එකද ප්‍රාදේශීය අධ්‍යයන කවයක් නොමැත. 'මට නොහැකිය නොකියන්න. මා කැමති නැහැ කියන්න'.

පහසුවෙන් පළ කළ හැකිව තිබුණු බවත්, ඒ අනුව, ව්‍යාපාරයේ ප්‍රාදේශීය අංග ලක්ෂණ වඩාත් අංග සම්පූර්ණ ලෙස ප්‍රකාශයට පත් කළ හැකිව තිබුණ බවත් සැම කෙනෙක්ම පිළිගනු ඇත. එබඳු මට්ටමක සංවිධාන තත්වයක් ඇති කරගැනීම පහසු නොවන බව ඇත්තකි. එහෙත් එහි අවශ්‍යතාවය අපි අවබෝධ කොටගත යුත්තෙමු. පිටතින් දිරි දීමක් ගැන බලාපොරොත්තුව නොසිට, අපගේ විප්ලවවාදී අත්දැකීමෙන් පෙනී ගොස් ඇති පරිදි, බොහෝ දුරට මායාවක් බවට පත්වන ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍රයක ජනප්‍රියත්වයෙන් හා සමීපතාවයෙන් නොමුළාව, සැම ප්‍රාදේශීය සංවිධානයක්ම ඒ ගැන කල්පනා කළ යුතුය; එය සාර්ථක කර ගැනීමට ක්‍රියාශීලී ලෙස වැඩ කළ යුතුය.

තමන් ප්‍රායෝගික කාරක වරුන්ට ඉතාමත් සමීපව සිටිතියි සිතන්නා වූද, මෙම මායා ස්වභාවය නොදන්නා වූද, අපට ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර තිබිය යුතුය, අපට දිස්ත්‍රික්ක ප්‍රවෘත්ති පත්‍ර තිබිය යුතුය, එමෙන්ම, අපට සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍ර තිබිය යුතුය යනුවෙන් උපායශීලී ලෙස කියමින් මවිතකාරී හා පහත් තර්ක ඉදිරිපත් කරන්නාවූද ඒ ප්‍රකාශකයන් ප්‍රායෝගික වැඩ කටයුතු වලට කරන්නේ අයහපතක්මය. පොදු වශයෙන් කථා කරතොත් මේ සියල්ලම අවශ්‍යය. නමුත් නිශ්චිත සංවිධාන ප්‍රශ්නයක් විසඳීමට පටන් ගත් කල, ඊට අදල කාලය හා වාතාවරණය ගැන සැලකිල්ල ගත යුතු බව ඇත්තෙන්ම පැහැදිලි කරුණක් විය යුතුය. ''ස්වබෝද'' (අංක 1, පිටු 18) පත්‍රයෙහි 'ප්‍රවෘත්ති පත්‍රයක් පිළිබඳ ප්‍රශ්නය ගැන කටයුතු කිරීම' යන ලිපියෙහි මෙසේ ලිවීම බොරු වීරත්වය පෙන්වීමක් නොවේද? 'සැලකිය යුතු කම්කරුවන් සංඛ්‍යාවක් සිටින සැම ප්‍රදේශයකටම තමන්ගේම ප්‍රවෘත්ති පත්‍රයක් තිබීම අවශ්‍යය යනු අපගේ හැඟීමයි; පිටතින් ආනයනය කළ ප්‍රවෘත්ති පත්‍රයක් නොව, එම ප්‍රදේශයටම අයත් එකක් තිබිය යුතුය'. මෙම වචන ලියූ ප්‍රකාශකයා ඒවායේ අර්ථය ගැන කල්පනා නොකරන්නේ නම් යටත් පිරිසෙයින් පාඨකයාවත්, ඔහු වෙනුවෙන් ඒ ගැන සිතා බැලීම වටී. 'සැලකිය යුතු කම්කරුවන් සංඛ්‍යාවක් සිටින ප්‍රදේශ' දුසිම් කීයක්, එසේ නැතහොත් කී සියයක් රුසියාවේ තිබේද? එසේම සැම ප්‍රාදේශීය සංවිධානයක්ම, තමන්ගේම ප්‍රවෘත්ති පත්‍රයක් පළ කිරීමට කටයුතු කිරීම කොතරම් දුරට අපගේ ආධුනික භාවය චිරස්ථායී කිරීමක් වන්නේද! මෙම විසිරුවීම හේතු කොට ගෙන අපගේ විප්ලවවාදී කාරකවරුන්ගේ කාර්ය ආරම්භයේදීම, 'සැලකිය යුතු' වෙහෙසක් හෝ නොදරා ඔවුන් දැලට හසු කර ගැනීම සඳහා පොලිස් භටයිනට ලොකු පහසුවක් සැලසෙන අතර, එම කාරක වරුන් නියම විප්ලවවාදීන් වශයෙන් සංවර්ධනය වීම ද වැලකේ. 'තමන්ගේම නගරය නොවන, විවිධ නගරවල' පැක්ටරි හිමියන්ගේ අක්‍රමිකතාවයන් ගැන විස්තර හා 'පැක්ටරි ජීවිතය ගැන විස්තර තොරතුරු' ගැන සමස්ත රුසියානු පුවත්පතක පාඨකයා දක්වනු ඇත්තේ මඳ උනන්දුවකැයි කර්තෘ තවදුරටත් කියයි. එහෙත් 'ඔරල්හි වැසියෙකුට ඔරල් ගැන තොරතුරු කියවීම නීරස දෙයක් නොවනු ඇත. 'තඩිබෑමට අල්ලා ගන්නා ලද්දේ' කවුද, 'පහරදී' තිබෙන්නේ කාටද යනු සැම කලාපයකින්ම ඔහු දැනගනු ඇත. එවිට ඔහු උදම් වනු ඇත' (පිටු 69). ඇත්තෙන්ම ඔරල්හි පාඨකයා උදම්ව සිටී.එහෙත් අපගේ ප්‍රකාශකයාගේ මනෝරාජික සිතුවිලිද ඉහළය — පමණට වඩා ඉහළය. ඉතා සුළු දේ ගැන එතරම් සැලකිලිමත් වීම උපක්‍රමීය වශයෙන් නිවැරදිද යනු ඔහු තමාගෙන්ම විමසිය යුතුව තිබුණි. පැක්ටරි කටයුතු හෙළිදරව් කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාවය අගය කිරීමේදී අපි අන් කිසිවෙකුට දෙවෙනි නොවෙමු. එහෙත් සාන්ත පීටර්ස්බර්ග් නගරයේ පළ කරන ''රබෝචය මිස්ල්'' පත්‍රයේ සාන්ත පීටර්ස්බර්ග් ලිපි කියවීම සාන්ත පීටර්ස්බර්ග් ජනයාට නීරස වන අවධියට අප පත්ව සිටින බව සිතෙහි දරා ගත යුතු වේ. පැක්ටරි කටයුතු හෙළිදරව් කිරීමේ දී ඒ සඳහා මාධ්‍ය වශයෙන් නිතරම යොදා ගන්නා ලද්දේ හා තවදුරටත් යොදා ගත යුත්තේ පත්‍රිකාය. එහෙත් අප කටයුතු කළ යුත්තේ ප්‍රවෘත්ති පත්‍රයේ මට්ටම උසස් කිරීමට මිස, එය පැක්ටරි පත්‍රිකාවක මට්ටමට පහත හෙළීමට නොවේ. අප ප්‍රවෘත්ති පත්‍රයකින් බලාපොරොත්තු වන්නේ 'සුළු' හෙළිදරව් කිරීම් රැසක් නොව, පැක්ටරි ජීවිතය නිරූපිත මහා අධම කම් හෙළිදරව් කිරීමය; එයින් බලාපොරොත්තු වන්නේ ඉතාමත් සිත්කාවදින, එනිසාම ව්‍යාපාරයේ සියළුම කම්කරුවන්ගේ හා නායකයන්ගේ කුතුහලය ඇවිස්සීමෙහිත්, ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ දැනුම පෝෂණය කිරීමෙහිත්, අවබෝධය පුළුල් කිරීමෙහිත්, සමත් වන හා එමෙන්ම අළුත් දිස්ත්‍රික්කවල හා වැඩි වැඩියෙන් අළුත් ක්ෂේත්‍රවල කම්කරුවන් අවදි කරවා ගැනීමේ ආරම්භයක් ලෙස උද්‍යෝගිමත් කරගත හැකි වන හෙළිදරව් කිරීම්ය.

''එපමණක් නොව, පැක්ටරි පාලනයේ හා වෙනත් අධිකාරීන්ගේ අක්‍රමිකතාවයන්, ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍රයක් මගින් එකෙනෙහිම හා එතැනදීම දෝෂ දර්ශනයට ලක් කළ හැකිය. ඈත තිබෙන පත්‍රයක් වෙත ආරංචි ළඟා වන විට ඊට අදාළ කරුණු, එම ආරංචි හා සම්බන්ධ පෙදෙස්වල අයට අමතකවී ගොස්ය. පත්‍රය ලැබුණු පසු පාඨකයා මෙසේ කියනු ඇත: 'ඒ කොයි කාලයකද? ඕවා මතක තිබෙන්නේ කාටද?' '' (එම ලිපිය).ප්‍රශ්නය එයමය. ඒවා මතක තිබෙන්නේකාටද! අවුරුදු දෙක හමාරක කාලයක් තුළ පලකරන ලද පත්‍ර කලාප 30

නිකුත් වූයේ නගර හයකින් බව එම ආරංචි මාර්ගයෙන්ම දැනගත්තෙමු; සාමාන්‍ය වශයෙන් ගත් කල එක නගරයකට අඩ වසරකට එක පත්‍රයක් බැගිනි! අපගේ විකට ප්‍රකාශකයා, ප්‍රාදේශීය වැඩ කටයුතු පිළිබඳ ඔහුගේ ඇස්තමේන්තු තුන් ගුණයකින් වැඩි කළත් (සාමාන්‍ය නගරයක් සම්බන්ධයෙන් මෙය කළ නොහැකිය; අපගේ සුපුරුදු ක්‍රම අනුව නිෂ්පාදනත්වය සැලකිය යුතු පමණින් වැඩි කළ නොහැකිය) එවිටද අපට ලැබෙන්නේ මාස දෙකකට එක කලාපයකි. මෙය කිසිසේත් ‘එතැනදීම,එකෙනෙහිම දෝෂ දර්ශනයට ලක් කිරීමක් නොවන්නේය. එහෙත් සෑම දෙසතියකට වරක්ම, මුළු රුසියාව පුරාම සුළු අධම කම් නොව, කැපී පෙනෙන හා තත්ව නිරූපී අධමකම් ‘දෝෂ දර්ශනයට ලක් කිරීම’ අපට කළ හැකි වනු පිණිස, පොදු ප්‍රවෘත්ති පත්‍රයක් සංවිධානය කිරීමේ කටයුත්තට එක්වන ප්‍රාදේශීය සංවිධාන දහයකින් නියෝජිතයන් එවූව හොත් එය ප්‍රමාණවත් වන්නේය. අපගේ සංවිධානවල පවත්නා තත්වය දන්නා කිසිවෙකුට ඒ ගැන සැක සිතීමට පුළුවන් කමක් නැත. සතුරා අපරාධය කරද්දීම අල්ලා ගැනීම පිළිබඳව, සුපුරුදු වාක්‍ය ඛණ්ඩයක් වශයෙන් නොව, ඒ ගැන අප බරපතල ලෙස කථාකරතොත්, එය පත්‍රිකාවක් මගින් බව කිව යුතුය. ඒ ස්වභාවයේ (නිදර්ශනයක් වශයෙන්, සුපුරුදු කෙටි වැඩ වර්ජන, වේගවත් පැක්ටරි ගැටුම්, පෙළපාලි අදිය) හෙළිදරව් කිරීම සඳහා ඇති උපරිම කාල සීමාව දිනක් හෝ දින දෙකකට වැඩි නොවේ.

බරිස් ක්‍රිචෙව්ස්කිට පවා ගෞරවයක් විය හැකි තරම් දැඩි ස්ථිරත්වයක් දක්වන කතෲ විශේෂත්වයේ සිට පොදු ස්වභාවය දක්වා ඉහළ නගිමින් ‘කම්කරුවන් පැක්ටරියෙහි පමණක් නොව නගරයෙහිද ජීවත්වෙති’ යි තව දුරටත් ලියයි. ඒ සමගම මහ නගර සභා රෝහල් හා නාගරික පාසල් පිළිබඳ සඳහන් කරමින්, පොදු වශයෙන් නාගරික සභා කටයුතු අමතක නොකරන ලෙස කම්කරු පුවත්පත්වලින් ඉල්ලයි. ඉල්ලීමක් වශයෙන් නම් මෙය විශිෂ්ඨය. එහෙත් ප්‍රාදේශීය පුවත්පත් පිළිබඳව කෙරෙන සාකච්ඡා බොහෝ විට සීමා වන්නේ කුමණ ආකාරයේ හිස් මන්ත්‍රණ මාත්‍රයන්ට ද යන්න ගෙන හැර දැක්වීමට මෙය පැහැදිලි නිදර්ශනයක්ද වේ. ‘‘ස්වබෝද’’ පත්‍රයේ කැමැත්ත ලෙසට, මහනගර සභා පිළිබඳව එසේ විස්තර තොරතුරු ඇතුලත් කර, ‘සැලකිය යුතු කම්කරුවන් සංඛ්‍යාවක් සිටින සෑම ප්‍රදේශයකම’ පුවත්පත් නිකුත් කිරීම ඇත්ත වශයෙන්ම සිදු වුව හොත්, අපගේ රුසියානු තත්වයන් යටතේ එයින් අනිවාරණීය වශයෙන් සිද්ධ වන්නේ නියත ලෙසටම ඉතාමත් නොවැදගත් දේගැන සැලකිල්ල දක්වන තත්වයට පහත වැටීමත්, සාර්වාදී සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව කෙරෙන සමස්ත රුසියානු විප්ලවවාදී පහර දීමක වැදගත්කම සම්බන්ධයෙන් විඥනභාවය දුර්වල වීමකට මඟ පෑදීමත්, නොපවත්නා පාර්ලිමේන්තු ගැන බොහෝ වැඩියෙන් කථා කරන හා පවත්නා මහනගර සභා[92] ගැන බොහෝ අඩුවෙන් කථා කරන විප්ලවවාදීන් ගැන වූ කියමනෙන් හඳුනා ගනු ලැබූ ප්‍රවණතාවයෙහි — උදුරා දමා නැති, එහෙත් වසංවූනු හෝ තාවකාලිකව යටපත් ස්වභාවයෙන් පවතින — ඉතාමත් ප්‍රබල රිකිලි ශක්තිමත් කිරීමත්ය. අප ‘අනිවාරණීය වශයෙන්’යයි කියන්නේ මෙය සිදුවෙනවාට ‘‘ස්වබෝද’’ පත්‍රය පැහැදිලි ලෙසම නොකැමති බව අවධාරණය කිරීමේ අදහසිනි. එහෙත් හොඳ අපේක්ෂාවන් පමණක් ප්‍රමාණවත් නොවේ. අපගේ වැඩ කටයුතු මුළුල්ල හා සමග ඇති සම්බන්ධයට අනුකූලව නාගරික සභා කටයුතු ගැන නිසි අරමුණින් යුතුව කටයුතු කිරීම සඳහා ප්‍රථමයෙන් එම අරමුණු පැහැදිලිව තේරුම් ගෙන, ඒවා සම්ප්‍රදයක් වැනි ස්ථාවරයකට පත්වනයේ, තර්කයෙන් පමණක් නොව, බොහෝ උදහරණද මගින් ශක්තිමත් ලෙස ස්ථාපිත කළ යුතුවේ. අප තවමත් සිටින්නේ මෙම තත්වයට බොහෝ ඈතිනි. එහෙත්, ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර ගැන කල්පනා කිරීමට හෝ කථා කිරීමට යොමුවීමට පෙර, අපි ප්‍රථමයෙන් මෙම කාර්‍ය්‍ය ඉටු කළ යුත්තෙමු.

දෙවැනිව, නාගරික කටයුතු ගැන ඉතා හොඳට හා උනන්දු කාරක ලෙස ලිවීමට නම් අයෙකුට අදල ප්‍රශ්න ගැන පොතේ දැනුම නොව අත් දුටු දැනුමක් තිබීම අවශ්‍යය. එහෙත් එවැනි දැනුමක් ඇති සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් රුසියාවේ කිසිම නැතක නැති තරම්ය. නාගරික සභා හා රාජ්‍ය කටයුතු ගැන (ජනප්‍රිය පත්‍රිකාවල නොව) පුවත්පත් වල ලිවීමට, දක්ෂ අය විසින් රැස් කරන ලද හා ලේඛන ගත කරන ලද, අළුත් හා විවිධ කරුණු තිබිය යුතුය. එවැනි කරුණු රැස් කර ගැනීමට හා ලිවීමට නම්, සෑම දෙනාම සෑම දේම කරන හා පොදු කැමැත්ත විමසීමේ ක්‍රීඩාවෙහි යෙදීමෙන් සියල්ලෝම ප්‍රීති වන පැරණිතාලේ කවයක ‘පෞරාණික ප්‍රජාතන්ත්‍රවාදය’ ට වැඩිමනත් වන යමක් අවශ්‍ය වේ. ඒ සඳහා විශේෂඥ ලේඛකයන් හා ලිපි සපයන්නන් හමුදවක් සිටිය යුතුය; ඈත එපිට සම්බන්ධකම් ඇති කර ගන්නා, නොයෙක් නොයෙක් වර්ගයේ ‘රාජ්‍ය රහස්’ (ඒ ගැන දැනුම නිසා රුසියානු ආණ්ඩු නිලධාරියා එතරම් පිම්බෙන, එහෙත්, ඒ ගැන දෙඩීම ඉතා පහසුවන රහස්) අවබෝධ කර ගැනීමෙහි සමත් වන හා ‘තිරයෙන් පිටු පසට’ කා වැදීමට සමත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී වාර්තා කරුවන් හමුදවක්, තමන්ගේ ‘නිල රාජකාරිය වශයෙන්’ සෑම තැනම සිටින හා සියළු දේ ම දන්නා අයගේ හමුදවක් සිටිය යුතුය. එනිසා සියළු ආර්ථික,

දේශපාලන, සමාජමය හා ජාතික පීඩනයට විරුද්ධව සටන් කරන පක්ෂය වන අපට එවැනි සියළු දේ දන්නා හමුදුවක් සඳහා අය සොයා ගැනීමට, එකතු කිරීමට, පුහුණු කිරීමට, සංවිධානය කිරීමට හා එම හමුදුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැකිය; අප එය කළයුතුය. මේ සියල්ල තවමත් කිරීමට තිබෙන දේය. ප්‍රදේශයන් අති බහුතරයකම මේ උදෙසා තවමත් එකද පියවරක්වත් ගෙන නැතිවා පමණක් නොව බොහෝ විට එහි අවශ්‍යතාවය පිළිගැනීම හෝ නොකෙරේ. යමෙක් අපගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පත්‍රවල අපගේ ලොකු කුඩා කටයුතු ගැනද, රාජ්‍ය තන්ත්‍රික, යුද්ධමය, පූජකයින් පිළිබඳ නාගරික හා මුදල් ආදී වූ කාරණා ගැනද, ලියන ලද ප්‍රාණවත් හා කුතූහලය අවුස්සන ලිපි වාර්තා හා හෙළිදරව් කිරීම් සොයන්නේ නම් එය නිරර්ථක සෙවීමක් වනු ඇත. එම කරුණු සම්බන්ධයෙන් එහි කිසි දෙයක් නොමැති තරම්ය; ඇතත් ඒ ඉතා අල්ප වශයෙනි.* අයෙක් මා වෙත පැමිණ 'සැලකියයුතු කම්කරු සංඛ්‍යාවක් සිටින සෑම ප්‍රදේශයකම' පැක්ටරි, නාගරික හා ආණ්ඩුවේ අධමකම් හෙළි කරන ප්‍රවෘත්ති පත්‍රයක් තිබීමේ අවශ්‍යතාවය ගැන 'ලස්සන හා චිත්තාකර්ෂණීය වචන කියන විට මා තුළ බිය ජනක තරම් නොරිස්සුම ඇතිවන්නේ' එහෙයිනි.

මධ්‍යම පත්‍රවලට වඩා ප්‍රාදේශීය පත්‍ර ප්‍රබලවීම එක්කෝ දුප්පත් කමේ නැතහොත් ආඪ්‍ය සම්පන්න කමේ ලක්ෂණයක් විය හැක. මහා පරිමාන නිෂ්පාදනයට අවශ්‍ය බලවේගයන් සංවර්ධනය කර ගැනීමේ කටයුත්ත ව්‍යාපාරයට තවමත් සාර්ථක කරගත නොහැකිව තිබිය දී, එය ආධුනික ස්වභාවයේ එරී දඟලන කල හා 'පැක්ටරි ජීවිතය පිළිබඳ නොවැදගත් විස්තර' වල බොහෝ දුරට ගිලී පවතින විට එය දුප්පත් කමේ ලක්ෂණයකි. ව්‍යාපාරය, අංග සම්පූර්ණ හෙළිදරව් කිරීම හා අංග සම්පූර්ණ උද්ඝෝෂණය යන කර්තව්‍යයන්හි සම්පූර්ණ නිපුණත්වය ලබා තිබෙන විටද, මධ්‍යම පත්‍රයට අමතරව බොහෝ ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර පළ කිරීම අවශ්‍යව තිබෙන විටද එය ආඪ්‍ය සම්පන්න කමේ ලක්ෂණයකි. වර්තමාන රුසියාවේ ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර ප්‍රබලත්වයට පත් වීමෙන් අදහස් වන්නේ කුමක්ද යන්න එක් එක් පාඨකයා තමාම තීරණය කර ගැනීම මැනවි. අපගේ ප්‍රාදේශීය සංවිධාන අතුරෙන් බහුතරය මේ දක්වාම, නිතරම පාහේ, කල්පනා කළේ ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර සම්බන්ධයෙන් පමණකි. මෙය අසාමාන්‍ය දෙයකි; සිදුවිය යුතුව තිබුණේ එහි අනික් පැත්තය. ප්‍රාදේශීය සංවිධාන බහුතරය සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක් පළ කිරීම ගැන ප්‍රධාන වශයෙන් කල්පනා කළ යුතුය. මෙය කරන තෙක් අංග සම්පූර්ණ පුවත්පත් උද්ඝෝෂණයක් මගින් ව්‍යාපාරයට කිසියම් පමණකින් හෝ ආධාර කිරීමට සමත් වන එක ප්‍රවෘත්ති පත්‍රයක්වත් ස්ථාපිත කිරීම අපට කළ නොහැකි වන්නේය. එහෙත් මෙය කළ පසු අවශ්‍ය මධ්‍යම ප්‍රවෘත්ති පත්‍රයත්, අවශ්‍ය ප්‍රාදේශීය පත්‍රත් අතර සාමාන්‍ය සම්බන්ධකම් නිරායාසයෙන්ම ස්ථාපිත වනු ඇත.

* * *

ප්‍රාදේශීය වැඩ කටයුතුවල සිට ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය සමස්ත රුසියානු වැඩ කටයුතු වෙත ගෙන යාමේ අවශ්‍යතාවය විශේෂයෙන්ම ආර්ථික අරගලයට අවශ්‍ය නොවන්නේය යි බැලූ බැල්මට පෙනෙන්නට පිළිවන. මෙම අරගලයේදී කම්කරුවන්ගේ ආසන්නතම සතුරන් වන්නේ එක් එක් ස්වාමි වරුන් හෝ ස්වාමි වරුන්ගේ කණ්ඩායම්ය. දේශපාලන අරගලයේදී අපගේ ආසන්නතම සතුරා වන, තදබල ලෙස මධ්‍යගත කරනු ලැබූ හා සියළුම නොවැදගත් විස්තර කරුණු පවා ඒකීය අධිෂ්ඨානයකින් මෙහෙයවනු ලබන, රුසියානු ආණ්ඩුවේ, නියත යුද්ධමය සංවිධානයට යම්තමින් හෝ සමාන වන කිසිම සංවිධානයකින් එම ස්වාමි වරු එකට බැඳී නැත.

එහෙත් නියම තත්වය එය නොවේ. අප නැවත නැවතත් පෙන්වාදී ඇති පරිදි ආර්ථික අරගලය කර්මාන්ත හා සම්බන්ධ අරගලයකි. ඒ හේතුව නිසාම, රැකියා ස්ථානය පදනම් කරගෙන පමණක් නොව, කර්මාන්ත පදනම් කරගෙනද කම්කරුවන් සංවිධානය කිරීම අවශ්‍ය වේ. සමාගම් හා ඒකාබද්ධ සමාගම් වශයෙන් අපගේ ස්වාමි වරුන් සංවිධානය වීම ඉක්මන්වූ තරමට, කර්මාන්ත

---

* ඉතාමත් හොඳ ප්‍රාදේශීය පුවත්පත්වල නිදර්ශනයෙන් පවා අපගේ අදහස සනාථ වන්නේ එහෙයිනි. උදාහරණයක් වශයෙන්, ප්‍රතිපත්තිමය අස්ථිරත්වයෙන් සම්පූර්ණයෙන්ම නිදහස් "යූෂ්නි රබෝචි"[93] පත්‍රය දැක්විය හැක. එහෙත් එයට එහි කලාප නිතිපතා නිකුත් කිරීමට නොහැකි විය; විශාල පොලිස් වැටලීම් නිසා ප්‍රාදේශීය ව්‍යාපාරයට අවශ්‍ය දේ සැපයීම කළ නොහැකි විය. අප ව්‍යාපාරයේ මූලික ප්‍රශ්න ප්‍රතිපත්තියානුකූලව ඉදිරිපත් කිරීම හා පුළුල් දේශපාලන උද්ඝෝෂණය අප පක්ෂයට ඉතාමත් හදිසි අවශ්‍යතාවයක් වී ඇති නමුත්, එම කටයුත්ත ප්‍රාදේශීය පත්‍රයට කළ නොහැකි තරම් විශාල එකකි. එහි පළ කරන ලද, පතල් හිමියන්ගේ සම්මේලනය ගැන හා විරැක්ෂාව ගැනවූ විශේෂ වටිනාකමකින් යුත් ලිපි නියම වශයෙන්ම ප්‍රාදේශීය ඒවා ලෙසටද ගත නොහැකිය. දකුණේ ජනයාට පමණක් නොව ඒවා මුළු රුසියාවට ම අවශ්‍ය විය. එවැනි ලිපි කිසිවක් අපගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පත්‍රවල පළවී නැත.

අනුව සංවිධානය වීම වඩ වඩාත් හදිසි කර්තව්‍යයක් බවට පත්වේ. අප කොටස්වලට වෙන්වී සිටීම මෙයට ඒකාන්ත බාධාවකි. මෙම සංවිධාන කටයුත්ත සඳහා සියළුම රුසියානු වෘත්තීය සමිති වලට නායකත්වය දීමෙහි සමත් විප්ලවවාදීන්ගේ එකම සමස්ත රුසියානු මණ්ඩලයක් අවශ්‍යය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන්නේ කුමණ වර්ගයේ සංවිධානයක්ද යන්න අපි ඉහත විස්තර කෙළෙමු. මේ හා සම්බන්ධයෙන් අපගේ ප්‍රවෘති පත්‍ර ගැන පමණක් වචන කීපයක් මෙහිදී එකතු කරන්නෙමු.

සෑම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පුවත් පතකටම, වෘත්තීය සමිති (ආර්ථික) අරගලය සඳහා වෙන්කළ *විශේෂ දෙපාර්තුමේන්තුවක්* තිබීමේ අවශ්‍යතාවය ගැන අනුමාන කරන කිසිවෙක් නැති තරම්. එපමණක් නොව, වෘත්තීය සමිති පත්‍ර පටන් ගැනීම ගැන කල්පනා කිරීමටද වෘත්තීය සමිති වර්ධනය විසින් අපට බල කෙරෙයි. එසේ වුවද ව්‍යතිරේක කීපයක් හැරුණු විට, මෙම කාලය තුළ රුසියාවේ වෘත්තීය සමිති පත්‍ර පටන් ගැනීමට කොහෙත්ම පුළුවන් කමක් නැත. ඒවා අඪ්‍ය සම්පන්න කමට සමාන වන අතර අප සිටින්නේ දෛනික ආහාරයවත් නොමැති තත්වයකය. අපගේ නීති විරෝධී තත්වයට ගැලපෙන, මෙම කාලයේ දැනටමත් අවශ්‍ය වී තිබෙන වෘත්තීය සමිති පත්‍ර අනෙකක් නොව *වෘත්තීය සමිති පත්‍රිකා* ය. මෙම පත්‍රිකා මගින්, නිශ්චිත කර්මාන්තයක පවතින සේවා තත්වයන් ගැනද, එම සේවා තත්වයන් සම්බන්ධයෙන් රුසියාවේ විවිධ ප්‍රදේශවල පවතින වෙනස්කම් ගැනද, ඒ නියමිත කර්මාන්තයේ කම්කරුවන් ඉදිරිපත් කරන ප්‍රධාන ඉල්ලීම් ගැනද, කර්මාන්තයට බලපාන නීති ප්‍රමාණවත් නොවීම පිළිබඳවද, කර්මාන්තයෙහි කම්කරුවන් අරගලයෙහි යෙදුනු වැදගත් අවස්ථා ගැනද, ඔවුන්ගේ වෘත්තීය සමිති සංවිධානයේ ආරම්භය, වර්තමාන තත්වය හා අවශ්‍යතාවයන් ගැනද, ආදී වූ, *නීත්‍යානුකූල** හා නීති විරොධී කරුණු ක්‍රමාණුකූලව රැස් කොට තැබිය යුතු වේ. ප්‍රථමයෙන්ම, එවැනි පත්‍රිකා පළ කිරීමෙන්, නිශ්චිත එක කර්මාන්තයක කම්කරුවන් පමණක් උනන්දු කරවන ආකාරයට කර්මාන්තය පිළිබඳ සවිස්තර කරුණු රාශියක් පළ කිරීමේ කාර්‍යයෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පත්‍ර නිදහස් වේ. දෙවැනිව, අපගේ වෘත්තීය සමිති අරගලයේ අත්දැකීම්වල ප්‍රතිඵල එමගින් වාර්තාගත වනු ඇත; එමෙන්ම පත්‍රිකා හා අසම්පූර්ණ විස්තර අඩංගු ලිපි මහාරාශියක් අතර සැඟවීයන තොරතුරු — විස්තර එයින් ආරක්ෂා වේ; එමගින් මෙම කරුණු වඩාත් සම්පිණ්ඩනය කෙරේ. තුන්වැනිව, සේවා තත්වයන් වෙනස් වීමට සාපේක්ෂ වශයෙන් බොහෝ කල් ගතවන නිසාත්, නිශ්චිත කර්මාන්තයක කම්කරුවන්ගේ ප්‍රධාන ඉල්ලීම් ඉතාමත් ස්ථාවර වන නිසාත්, (නිදර්ශනයක් වශයෙන් 1885 දී[95] මොස්කව් දිස්ත්‍රික්කයේ පේෂ කාර්මිකයන්ද, 1896 දී සාන්ත පීටර්ස්බර්ග් දිස්ත්‍රික්කයේ අයද, ඉදිරිපත් කළ ඉල්ලීම් බලන්න) එයින් උද්ඝෝෂණ සඳහා මාර්ගෝපදේශකතත්වය ලබා ගත හැකි වේ. එවැනි ඉල්ලීම් හා අවශ්‍යතාවයන් එක්රැස්කර සංගෘහිත කරගත හොත්, නොදියුණු ප්‍රදේශවල නැතහොත් නොදියුණු කම්කරු ස්ථරයන් අතර, ආර්ථික

---

* නීත්‍යානුකූල ලියවිලි මේ හා සම්බන්ධයෙන් විශේෂයෙන්ම වැදගත්ය. ඒවා ක්‍රමාණුකූල ලෙස රැස්කර උපයෝගී කර ගැනීමේ හැකියාව අතින් අපි විශේෂයෙන්ම පසුබා සිටිමු. නීත්‍යානුකූල කරුණු පමණක් පදනම් කරගෙන අයෙකුට කෙසේ හෝ වෘත්තීය සමිති පත්‍රිකාවක් සකස් කළ හැකියයි කීම අතිශයෝක්තියක් නොවේ. එහෙත් නීති විරෝධී කරුණු පමණක් පදනම් කරගෙන එය කළ නොහැක. ''රබොචය මිස්ල්'' ප්‍රකාශන මගින් විවරණය කෙරෙන වැනි ප්‍රශ්න[94] ගැන කම්කරුවන්ගෙන් නීති විරෝධී තොරතුරු රැස් කිරීම විප්ලවවාදීන්ගේ (ඔවුන් වෙනුවට නීත්‍යානුකූල කාරක වරුන්ට ඉතා පහසුවෙන් ඒ තැන ගත හැකිය) අතිමහත් පරිශ්‍රමයක් වැය වන නමුත් අපට කිසි කලෙකත් හොඳ තොරතුරු ලබාගත නොහැකිය. ඊට හේතුව මේයයි. විශාල පැක්ටරියක බොහෝ විට එක දෙපාර්තමේන්තුවක් ගැන පමණක් දන්නා, නිතරම පාහේ ස්වකීය සේවයේ ආර්ථික ප්‍රතිඵල මිස පොදු තත්වයන් හා ප්‍රමිති ගැන නොදන්නා, කම්කරුවෙකුට, කාර්‍යාල හෝ පැක්ටරි නිලධාරීන්, පරීක්ෂකවරුන් හා දෙස්තරවරුන් ආදීන් සතුවූද, සුළු පත්‍රවාර්තා හා විශේෂ කාර්මික, වෛද්‍ය, සෙම්ස්ත්ව සහ වෙනත් ප්‍රකාශන අතර විසිරී තිබෙන්නා වූද දැනුම රැස්කර ගත හැකි නොවේ.

මා 'ප්‍රථම වතාවට කළ' හා නැවත කිසිදක කිරීමට අකැමති 'පරික්ෂණයක්' ගැන මට හොඳට මතකය.මා හමුවීමට නිතර පැමිණි කම්කරුවෙකු වැඩ කළ අති විශාල පැක්ටරියේ බලපවත්නා තත්වයන් හා සම්බන්ධ සෑම අංශයක්ම ගැන ඔහුගෙන් 'විභාග' කිරීමට මම සති කීපයක් ගත කෙළෙමි. මහත් පරිශ්‍රමයකින් පසුව (එක පැක්ටරියක් පමණක් ගැන) විස්තරයක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට මට පුළුවන්වූ බව ඇත්ත නමුත්, සාකච්ඡාව අවසානයේ ඔහු නළලේ ඩාබිඳු පිස දමා මද සිනහවක් පාමින් මට මෙසේ කීය. ''ඔබගේ ප්‍රශ්නවලට උත්තර දෙනවාට වඩා අතිකාල වැඩ කිරීම මට පහසුය.''

අපගේ විප්ලවවාදී අරගලය වඩාත් ධෛර්‍යමත් ලෙස කරගෙන ගිය තරමට, අපගේ 'වෘත්තීය සමිති' කටයුතු වලින් කොටසක් නීත්‍යානුකූල නොකර බැරි තත්වයට ආණ්ඩුව පත්වේ. ඒ අනුව අපගේ බරෙන් කොටසකින් නිදහස්වීමේ ඉඩ අපට ලැබේ.

ප්‍රශ්න ගැන උද්ඝෝෂණය කරන අයට එය අවුරුදු ගණනාවක් ප්‍රයෝජනවත් වන මැහැඟි අත් පොතක් විය හැකිය. එක් නිශ්චිත පළාතක සාර්ථක වූ වැඩ වර්ජන එක් ප්‍රදේශයක පවතින උසස් ජීවන තත්වයන් හා වැඩි දියුණු වූ සේවා කොන්දේසි, පිළිබඳ නිදර්ශන වලින් අනිකුත් ප්‍රදේශ වල කම්කරුවන් නැවත නැවතත් සටනෙහි යෙදීම සඳහා ධෛර්යමත් කෙරේ. සිව්වැනිව, වෘත්තීය සමිති අරගලය පොදු අරගලයක් බවට පත් කිරීමේ කටයුතු ආරම්භ කර එමගින් රුසියානු වෘත්තීය සමිති ව්‍යාපාරය සහ සමාජවාදය අතර සම්බන්ධය ශක්තිමත් කරන අතරම, අපගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කාර්ය සමස්තය තුළ, වෘත්තීය සමිතිවාදී කටයුතු ගන්නා තැන පමණට වඩා කුඩා හෝ විශාල නොවන බවට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වග බලාගන්නවා ඇත. අනිකුත් නගරවල සංවිධාන සමග සම්බන්ධකම් නොමැතිව පවතින ප්‍රාදේශීය සංවිධානයකට මෙම නිවැරදි අනුපාතය පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීම දුෂ්කරය; සමහරවිට කෙහෙත්ම නොහැකිය. (මොන තරම් දුරට භයානක ලෙස වෘත්තීය සමිතිවාදය කෙරේ වැඩියෙන් නැඹුරු විය හැකිද යන්න ''රබෝචය මිස්ල්'' පත්‍රයේ නිදර්ශනයෙන් පෙන්නුම් කෙරේ). එහෙත් අවලාය ලෙස මාක්ස්වාදයේ පදනම මත පිහිටා සිටින්නාවූද, වෘත්තීය උද්ඝෝෂකයින් පිරිසක් සිටින්නාවූද විප්ලවවාදීන්ගේ සමස්ත රුසියානු සංවිධානයකට නිසි අනුපාතය නිගමනය කර ගැනීම කිසි කලෙකත් දුෂ්කර කටයුත්තක් නොවේ.

V

සමස්ත රුසියානු දේශපාලන ප්‍රවෘත්ති පත්‍රයක් සඳහා 'සැලැස්ම'

'න්‍යාය ව්‍යවහාරය කෙරෙන් ඇත් කිරීමෙන් එය ජීවයෙන් තොර ධර්මයක් බවට හැරවීමේ' ප්‍රවණතාවයක් දක්වීම ගැන අපට චෝදනා කරන (''රබෝචිය දියල'' අංක 10, පිටු 30) බී. ක්‍රිචෙව්ස්කි 'මේ සම්බන්ධයෙන් ''ඉස්ක්‍රා'' පත්‍රය කළ බරපතලම මෝඩකම පොදු පක්ෂ සංවිධානයක් සඳහා 'සැලැස්මක්' ඉදිරිපත් කිරීමය' යි ලිවේය. (එසේ සඳහන් කර ඇත්තේ 'පටන් ගත යුත්තේ කොතැනින්ද? යන ලිපිය ගැනය) 'දීප්තිමත් හා පරිපූර්ණ අදහස් ප්‍රචාරය හා සමග සසඳන විට සැමද නීරස අරගලයේ ඉදිරි ගමන සුළු කොට තැකීමට 'ඉස්ක්‍රා'' පත්‍රය අනුගමනය කරන ප්‍රවණතාවය... උච්ඡස්ථානයට පත් වූයේ එහි 4 වැනි කලාපයෙන් ඉදිරිපත් කළ ''පටන් ගත යුත්තේ කොතැනින්ද'' යන ලිපිය මගින් එය ඉදිරිපත් කරන පක්ෂ සංවිධානය සඳහා වූ සැලැස්මෙනි' යි (එම, පිටු 61) කීමෙන් මර්තිනව්ද එම අදහසම දෝංකාර නංවයි. අන්තිමේදී, 'සැලැස්මට' (උපුටා දක්වීමේ ලකුණු යොදා තිබෙන්නේ උපහාසය අදහස් කිරීමටය) විරුද්ධව බලවත් උදහස ප්‍රකාශ කරන්නන්ගේ තාලය ඇල්ලීමට එල්. නදියෂ්දින් මැතදී එකතුවී සිටී. (අප දැන හැදින ගෙන සිටින ''ස්වබෝද'' 'විප්ලවවාදී-සමාජවාදී කණ්ඩායම' විසින් පළකරන ලද) 'විප්ලවයේ පූර්වාසන්නය' යන මේ දැන් අපට ලැබුණු පොතෙහි (පිටු 126) ඔහු මෙසේ ප්‍රකාශ කරයි. 'සමස්ත රුසියානු ප්‍රවෘති පත්‍රයකින් එකට සම්බන්ධ කරගන්නා සංවිධානයක් ගැන දැන් කථා කිරීම යනු හාන්සි පුටු අදහස් හා හාන්සි පුටු වැඩ ප්‍රචලිත කිරීමක් වන' අතර 'පොත් ගුළු' ස්වභාවය පෙන්නුම් කිරීමක්ද මේ යනාදී වශයෙනි.

අපගේ ත්‍රස්තවාදියා, 'නීරස දිනපතා අරගලයේ ඉදිරි ගමනේ' වීරයන් සමග එකඟත්වයෙන් පසුවීම ගැන අපි පුදුම නොවෙමු. ඔවුන් අතර දක්නට ලැබෙන මෙම සමීප මිත්‍රත්වයේ මූලාශ්‍රයන් ගැන දේශපාලනය හා සංවිධානය පිළිබඳ පරිච්ඡේද වලින් සෙව්වෙමු. එහෙත් තමන් නොකැමති ලිපියක චින්තා දමය වටහා ගෙන හිතට එකඟව ඊට එක එල්ලේ පිළිතුරු සැපයීමට උත්සාහ ගත් එකම පුද්ගලයා නදියෂ්දින් බව මෙහිදී සඳහන් කළ යුතුය. ''රබෝචිය දියල'' පත්‍රය කර තිබෙන්නේ කාරණයට අදාල කිසිවක් නොකියා, නොහොබනා කෛරාටික පහරදීම් මගින්, ප්‍රශ්නය ව්‍යාකූල කිරීමට වෙර දැරීම පමණකි. අව්ගී ඉස්තාලය සුද්ධ කිරීම[96] අප්‍රසන්න කර්තව්‍යයක් වුවද අපි ප්‍රථමයෙන් ඒ සඳහා කාලය ගෙවිය යුතු වෙමු.

අ) ''පටන් ගත යුත්තේ කොතැනින්ද'' යන ලිපියෙන් අමනාප වූයේ කවුද?

''රබෝචිය දියල'' පත්‍රය අප වෙත දමා ගැසූ ගැරහුම් සහ මචිත—ස්වර වදන් අතුරෙන් තෝරාගත් ස්වල්පයක් ඉදිරිපත් කරමු. ''පක්ෂ සංවිධානයක් නිර්මාණය කළ හැක්කේ ප්‍රවෘති පත්‍රයකට නොව, සිදුවිය යුත්තේ එහි අනික් පැත්තය''... ''එයට තමන්ගේම නියෝජිතයන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටීමට ස්තුති වන්නට, පක්ෂයට ඉහළින්, එහි පාලනයෙන් බැහැරව හා එයින් නිදහස්ව පවතින ප්‍රවෘතිපත්‍රයක්''...''ඉස්ක්‍රා''පත්‍රය හිමි පක්ෂයට ඇත්ත

වශයෙන්ම අයත්ව පවත්නා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන ගැන එම පත්‍රයට අමතක වූයේ මොන ප්‍රාතිහාර්යයක් නිසාද?''... ''පක්ෂයේ නියම අරගලයේ උත්තරීතර නයමුවන් වන්නේ ස්ථිර ප්‍රතිපත්ති හා ඊට ගැලපෙන සැලැස්මක් ඇති අයයි. ඔවුන් එම අරගලය සැලැස්මට කැප කරති''... ''අපගේ ක්‍රියාශීලී සහ පුරුෂවත් සංවිධානය සෙවනැලි රාජ්‍යයකට පලවා හරින සැලැස්ම, ඒජන්ත වරුන්ගේ අද්භූත දැල් ගෙත්තම් සංවිධානයක් උත්පාදනය කිරීමේ අභිලාෂයක් දන්වයි''... '' 'ඉස්ක්‍රා' පත්‍රයේ සැලැස්ම ක්‍රියාත්මක කළ තැන, දැනට සකස් වෙමින් පවතින රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ පක්ෂයේ සියළු සලකුණු පවා මැකී යනු ඇත''...''ප්‍රචාරක පත්‍රයක්, සමස්ත ප්‍රායෝගික විප්ලවවාදී ව්‍යාපාරයටම බලපාන, පාලනයකට යටත් නැති, සර්ව බලධාරී නීති සම්පාදකයෙක් වන්නේය''... ''ස්වෛරී කර්තෘ මණ්ඩලයකට පක්ෂය සම්පූර්ණයෙන්ම යටත් කළ යුතුය යන යෝජනාව සම්බන්ධයෙන් පක්ෂය දැක්විය යුතු ප්‍රතික්‍රියාව කුමක්ද?'' මේ ආදියයි.

ඉහත සඳහන් උපුටාගත් කොටස්වල අන්තර්ගත කරුණු වලින් හා ඒවායේ ස්වරයෙන්, පාඨකයාට පෙනෙනු ඇති ලෙසටම ''රබෝචිය දියල'' පත්‍රය උදහස් වී තිබේ. එය උදහස් වී තිබෙන්නේ තමන් වෙනුවෙන්ම නොවේ; එය චෝදනා කරන පරිදි සෙවනැලි රාජ්‍යයට පලවා හැරීමටත්, සලකුණු පවා මකා දැමීමටත් ''ඉස්ක්‍රා'' පත්‍රය අභිප්‍රාය කරන අප පක්ෂයේ සංවිධාන හා කාරක සභා වෙනුවෙනි. ඉතාමත් භයානකය! එහෙත් අරුම පුදුම දෙයක් සටහන් කර ගත යුතු වේ. 'පටන් ගත යුත්තේ කොතැනින්ද' යන ලිපිය පළ වූයේ 1901 මැයි මාසයේය. ''රබෝචිය දියල'' පත්‍රයේ ලිපිය පළ වූයේ 1901 සැප්තැම්බර් මාසයේය. දැන් අපි 1902 ජනවාරි මාසයේ මැද්දට පැමිණ සිටිමු. (සැප්තැම්බරයෙන් පෙර හා පසු) මෙම පස් මාසයම තුළ, තමන් සෙවනැලි රාජ්‍යයට පලවා හැරීමට උත්සාහ කරන මෙම රාක්ෂයාට විරුද්ධව පක්ෂයේ එකම කාරක සභාවක්වත්, එකම සංවිධානයක්වත් විධිමත් ලෙස විරෝධය පළ කළේ නැත. එහෙත් මෙම කාලය තුළ ප්‍රාදේශීය හා ප්‍රාදේශීය නොවන ප්‍රකාශන අතිවිශාල ගණනක මෙන්ම ''ඉස්ක්‍රා'' පත්‍රයේද රුසියාවේ සියළුම පෙදෙස් වලින් එවුනු සන්දේශ පළවිය. සෙවනැලි රාජ්‍යයට පළවා හරිනු ලබන අය ඒ ගැන නොදන්නා හා උරණ නොවූ තත්වයක්ද, එහෙත් තුන්වැනි පිරිසක් උදහස් වූ තත්වයක්ද ඇති වූයේ කෙසේද?

මෙම තත්වය උදා වී තිබෙන්නේ කාරක සභා හා වෙනත් සංවිධාන 'ප්‍රජාතන්ත්‍රවාදය' ක්‍රීඩා කිරීමෙහි නොයෙදී නියත කාර්යයන්හි නියැලී

සිටීමේ හේතුවෙනි.''පටන්ගත යුත්තේ කොතැනින්ද''යන ලිපිය කාරක සභා කියවූහ. එයින් නියෝජනය වන්නේ, 'සංවිධානයක් පිහිටුවීම සඳහා සියළුම අංශවලින් කටයුතු කරනු පිණිස නිශ්චිත සැලැස්මක් විස්තර කර දැක්වීමේ' උත්සාහයක් වන බව ඒවාට පෙනිනි. සංවිධානය පිහිටුවීමේ අවශ්‍යතාවය හා එහි නිර්මාන සැලැස්මේ නිරවද්‍යතාවය ගැන අවබෝධයක් ඇතිවන තෙක් මෙම 'පාර්ශවයන්ගෙන්' කිසිම එකක් හෝ 'එය ගොඩ නැගීමේ කටයුතු ආරම්භ කිරීම' සම්බන්ධයෙන් සිහිනෙනුදු නොසිතන බව එම කාරක සභා හා සංවිධාන හොඳින් දත් නිසාත්, දුටු නිසාත්, ''ඉස්ක්‍රා'' පත්‍රය මගින් පහත සඳහන් පරිදි කී අයගේ නිර්භීත කම ගැන උරණ වීම පිළිබඳ අදහසක් ඒවා තුළ ඇති නොවීම ස්වාභාවිකය. 'දැනට මුද්‍රණය සඳහා සූදනම් කෙරෙමින් පවතින පොතක් මගින් විස්තර සහිතව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සැලැස්මක සැකිල්ලක්, ප්‍රශ්නයේ බලවත් වැදගත්කම සලකා, අප විසින් ඉදිරිපත් කරනු ලැබීමේ වරදක් නැතැයි අපි හඟිමු'. සහෝදරවරුන් වෙත ඉදිරිපත් කරන ලද සැලැස්ම ඔවුන් පිළිගත හොත්, එවිට ඔවුන් 'යටත්' නිසා නොව, එය අපගේ පොදු ව්‍යාපාරයට අවශ්‍ය බව අවබෝධ වූ නිසා ඔවුන් එය ක්‍රියාත්මක කරනු ඇතැයිද, ඔවුන් එය පිළි නොගතහොත් එවිට 'සැකිල්ල' (උඩඟු වචනයක් නොවේද?) නිකම්ම සැකිල්ලක්ව පවතිනු ඇතැයිද යනුවෙන් මිස, අවංකව වැඩ කටයුතු කෙරේ ළඟාවීමේ හැඟීමෙන් කල්පනා කළ හැකි වෙනත් ආකාරයක් වීද? සැලැස්මක සැකිල්ලට විරුද්ධව සටන් කිරීමේදී, 'එය සුණු විසුණු කර දැමීම' හා එය ප්‍රතික්ෂේප කරන ලෙස සහෝදරවරුන්ට උපදෙස් දීම පමණක් කරනවා වෙනුවට, එහි කර්තෘවරුන් 'නීති සම්පාදනය කිරීමට' හා 'උත්තරීතර නියමුවන්' වශයෙන් ඉදිරිපත් වීමට තරම් නිර්භීතවීම පමණක් පදනම් කරගෙන, එනම්, සැලැස්මක දළ සටහනක් යෝජනා කිරීමට තරම් නිර්භීත වූ බැවින්, විප්ලවීය කටයුතු වල පළපුරුද්දක් නොමැති අය ඔවුනට විරුද්ධව පෙළඹවීම කෛරාටික කමක් නොවේද? පුළුල් අදහස්, පුළුල් කර්තව්‍යයන්, පුළුල් සැලසුම් ආදිය දක්වා ප්‍රාදේශීය කාර්යයන් උසස් කිරීමට දරන ප්‍රයත්නයකට විරුද්ධ වන්නේ මෙම අදහස් වැරදි බව කියමින් පමණක් නොව, අප 'උසස්' කිරීමට දක්වන 'අභිලාෂයම' 'උදහස්' අවුස්සන්නක් වන බවද කියමින් නම් අප පක්ෂයට වර්ධනය වී ප්‍රගතියක් ඇති කර ගත හැකිද? නදියෂ්දින් අපගේ සැලැස්ම 'සුනු විසුනු කළේය'. එහෙත් එසේ කිරීමේදී, ඊට හේතුව නෝන්ජල් කම නැතහොත් දේශපාලන අදහස් වල පැරණි තාලය වන්නේයයි කීමට බැරිවන තරම් පහත් කෛරාටික

තත්වයකට ඔහු වැටුනේ නැත. අප ‘පක්ෂය මත පරීක්ෂකත්වයක්’ ඇති කිරීමට අදහස් කරතියි යන චෝදනාව ඔහු මුල සිටම ප්‍රතික්ෂේප කළේය. සැලැස්ම ගැන වූ “රබෝචිය දියල” පත්‍රයේ විවේචනයන්ට දක්විය යුත්තේ පිළිකුල් කිරීමේ සැලකිල්ල පමණක් වන අතර, නදියෂ්දින්ගේ විවේචනයෙහි අගය අනුව එයට පිළිතුරු සැපයිය යුත්තේ එබැවිනි.

එහෙත් ‘සර්වබලධාරී ඒකාධිපතිත්වය’ හා ‘යටත් කිරීම’ ගැන ඝෝෂා කරන ලේඛකයෙකු කෙරේ පිළිකුල පළ කළ පමණින්, එවැනි අප ඔවුන්ගේ පාඨකයන්ගේ සිත් තුළ ඇති කරන අවුල් නිරවුල් කිරීමට අපට තිබෙන යුතු කමෙන් අප නිදහස් නොවේ. මෙහිදී ‘පුළුල් ප්‍රජාතන්ත්‍රවාදය’ වැනි සිත් ගන්නා වචනවල ස්වභාවය ගැන ලෝකයාට පැහැදිලි ලෙස පෙන්නුම් කර දීමට අපට හැකි වේ. කාරක සභා අමතක කිරීම නැතහොත් ඒවා සෙවනැලි රාජ්‍යයට පලවා හැරීමට ප්‍රයත්න දැරීම ආදිය ගැන අපට චෝදනා කර ඇත. රහසිගත භාවය සම්බන්ධයෙන් දක්විය යුතු සැලකිල්ල නිසා කාරක සභා සමග වන අපගේ සම්බන්ධය ගැන කරුණු කිසිවක්ම පාහේ පාඨකයාට දීමට අපට නොහැකිව තිබිය දී මෙම චෝදනාවලට අපි කෙසේ පිළිතුරු දෙමුද? පිරිස ප්‍රකෝප කිරීමේ අදහසින් අප වෙත තද පරුෂ චෝදනා දමා ගසන අය අපට වඩා ඉදිරියෙන් සිටින ආකාරයක් පෙනෙන්නේ ඔවුන්ගේ අලජ්ජී ස්වභාවයත්, විප්ලවවාදියෙකු පවත්වාගෙන යන, ඇති කිරීමෙහි යෙදී සිටින නැතහොත් ඇති කිරීමට බලාපොරොත්තුවන සම්බන්ධකම් හා දන ඇඳුනුම් කම් සුපරීක්ෂාකාරී ලෙස ලෝකයාගේ ඇසෙන් වසං කිරීමට ඇති ඔහුගේ යුතු කම ගැන ඔවුන් දක්වන නොසැලකිල්ලත් නිසාය. ස්වාභාවික වශයෙන්ම, එවැනි අය සමග ‘ප්‍රජාතන්ත්‍රිකවාදය’ පිළිබඳ ක්ෂේත්‍රයෙහි තරඟ කිරීම අපි ඉඳුරාම ප්‍රතික්ෂේප කරමු. පක්ෂ කටයුතු සියල්ල ගැන පළපුරුද්දක් නොමැති පාඨකයා ගැන සලකා බලන කල ඔහු වෙනුවෙන් අපගේ යුතුකම ඉටු කළ හැකි එකම මාර්ගය වන්නේ, im Werden* පවත්නා දෙය හා තත්වාකාර දෙය ගැන ඔහුට පැහැදිලි කිරීමෙන් නොව සිදුවී ඇති දෙයින් හා ගත වූ කාලයේ සිදුවූ දෙයක් වශයෙන් කිව හැකි කරුණු වලින් බිඳක් විස්තර කිරීමෙනි.

බුන්ඩ් සංවිධානය, අප ‘වෙස් වලාගත්තවුන්’** ලෙස හැඳින්වීමේ

---

* බිහිවීමේ හා ගොඩනැගීමේ ක්‍රියාදාමය තුළ. සංස්කාරක

** “ඉස්ක්‍රා” අංක 8. ජාතික ප්‍රශ්න ගැන අපගේ ලිපියට රුසියාවේ හා පෝලන්තයේ පොදු යුදෙව් සංගමයේ මධ්‍යම කාරක සභාවේ පිළිතුර.

ඉඟියක් කරයි; අප පක්ෂයේ සියළු සලකුණු මකා දැම්මට තැත් කරතියි විදේශගත ‘සංගමය’ අපට චෝදනා කරයි. මහත්වරුනි, අතීතය ගැන කරුණු හතරක් මහජනයාට විස්තර කළ පසු ඔබට සම්පූර්ණ තෘප්තිය ලැබෙනු ඇත.

ප්‍රථම කාරණය.* අප පක්ෂය පිහිටුවීමේදී හා ආරම්භක පක්ෂ සම්මේලනයට නියෝජිතයන් එවීමේදී ඊට කෙළින්ම සම්බන්ධ වුණු “අරගල සංගම්” අතුරෙන් එකක සාමාජිකයින්, සමස්ත ව්‍යාපාරයටම ප්‍රයෝජනවත් වන පරිදි කම්කරුවන් සඳහා පොත් පෙළක් පළ කිරීම සම්බන්ධයෙන් “ඉස්ක්‍රා” කණ්ඩායමේ සාමාජිකයෙක් සමග එකඟත්වයක් ඇති කරගත්තේය.එය සඳහා ලියන ලද“රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍යයන්” හා “නව පැක්ටරි නීතිය” යන කුඩා පොත් වට වංගු මාර්ගයකින් හා තුන්වැනි පාර්ශවයක් මගින් විදේශයට ගෙන යන ලදුව, එහිදී පළ කෙරිණි.

දෙවැනි කරුණ. එවකට ‘සාහිත්‍ය පර්යේෂණාගාරය’ යනුවෙන් බුන්ඩ් සංවිධානය විසින් හඳුන්වන ලද්ද සංවිධානය කිරීම සඳහා වූ යෝජනාවක් ද සමග එම සංවිධානයේ සාමාජිකයින් “ඉස්ක්‍රා” කණ්ඩායමේ සාමාජිකයන් වෙත ආහ. මෙය නොකළහොත් ව්‍යාපාරය බොහෝ සෙයින් පසු බසිනු ඇතැයි ඔවුන් යෝජනාව ඉදිරිපත් කරමින් කීහ. මෙම සාකච්ඡාවල ප්‍රතිඵලය වූයේ “රුසියාවේ කම්කරු පංති ව්‍යාපාරය** යන පොත නිකුත් වීමයි.

තුන්වැනි කරුණ. ප්‍රාදේශීය නගරයක් මගින් “ඉස්ක්‍රා” කණ්ඩායමේ සාමාජිකයෙක් වෙත ළඟාවුණු බුන්ඩ් මධ්‍යම කාරක සභාව, පුනරුත්ථාපනය කරන ලද “රබෝචය ගසියත” පත්‍රයේ සංස්කරණය භාර ගන්නා ලෙස ඉල්ලා ඒ සඳහා ඔහුගේ කැමැත්තද ලබා ගත්තේය. මෙම ඉල්ලීම පසුව වෙනස් කරන ලදුව, කර්තෘ මණ්ඩලය සකස් වන ආකාරය ගැන වූ නව සැලැස්මක් ඇති හෙයින් එම පත්‍රයට ලිපි සපයන්නෙකු ලෙස කටයුතු කරන ලෙස ඔහුගෙන්

---

* මෙම කරුණු විස්තර කිරීමේදී ඒවායේ අනු පිළිවෙළ අනුගමනය නොකරන්නේ උවමනාවෙන්ය.[97]

** කතෘගේ කලින් පොත් පොඩි මෙන්ම මෙයද විදේශගත “සංගමය” වෙත යවන ලද්දේ, එහි ප්‍රකාශන “ශ්‍රම විමුක්ති කණ්ඩායම” විසින් සංස්කරණය කෙරෙන්නේය යන (එකල කතෘ මණ්ඩලයේ වෙනස ගැන — 1899 පෙබරවාරි — කිසියම් තත්වයක් නිසා ඔහුට දන ගත නොහැකි විය) විශ්වාසයෙන් බව සඳහන් කරන ලෙස කතෘ මගෙන් ඉල්ලයි. ලීගය[98] විසින් මෙම පොත ළඟදීම නැවත මුද්‍රණය කරනු ලැබේ.

ඉල්ලන ලදී. ලිපි යවන ලදී. (අපට ඒවා ආරක්ෂා කරගත හැකි විය). ''අපේ වැඩ පිළිවෙළ'' — මෙය බර්න්ෂ්ටයින්වාදයට විරුද්ධවත්, නිත්‍යානුකූල සාහිත්‍යයේ සහ ''රබෝචය මිස්ල්'' පත්‍රයේ ප්‍රතිපත්ති වෙනස් කිරීමට විරුද්ධවත් එක එල්ලේ ලියන ලද විරෝධය ප්‍රකාශයකි; ''අපගේ ක්ෂණික කර්තව්‍යය'' ('නිතිපතා නිකුත්වන හා සියළුම ප්‍රාදේශීය කණ්ඩායම් සමග සමීප සම්බන්ධකම් ඇති පක්ෂ පත්‍රයක් පටන් ගැනීමට';බල පවත්නා'ආධුනික ස්වභාවයේ' දුර්වලකම්); ''හදිසි ප්‍රශ්නයක්'' (පොදු පක්ෂ පත්‍රයක් පටන් ගැනීමට පෙර,ප්‍රථමයෙන් ප්‍රාදේශීය කණ්ඩායම් වල කටයුතු සංවර්ධනය කළ යුතුය යනුවෙන් ඉදිරිපත් වූ විරුද්ධත්වය පරීක්ෂා කර බැලීම;විප්ලවවාදී සංවිධානයෙහිත්, 'සංවිධානය, විනය හා රහස්‍ය කාර්‍ය විධි උසස්තම අංග සම්පූර්ණ තත්වයට සංවර්ධන කිරීමේ' අවශ්‍යතාවයෙහිත් ඇති ඉමහත් වැදගත්කම ගැන බලකිරීම). ''රබෝචය ගසියත'' පත්‍රය යළිත් පළ කිරීමේ යෝජනාව ක්‍රියාත්මක නොකරන ලදින් මෙම ලිපිද පළ නොකරන ලදී.

හතරවැනි කාරණය. අප පක්ෂයේ දෙවැනි විධිමත් සම්මේලනය සංවිධානය කරමින් සිටි කාරක සභාවේ සාමාජිකයෙක්, සම්මේලනයේ වැඩ පිළිවෙළ ''ඉස්ක්‍රා'' කණ්ඩායමේ නියෝජිතයෙකු වෙත එවා, පුනරුත්ථාපනය කරන ලද ''රබෝචය ගසියත'' පත්‍රයේ කර්තෘ මණ්ඩලය ලෙසට එම කණ්ඩායම පත්කිරීමට යෝජනා කළේය. ප්‍රාථමිකයැයි කිව හැකි මෙම පියවර, එම සාමාජිකයා අයත් කමිටුව හා බුන්ඩ් මධ්‍යම කාරක සභාව විසින්ද පසුව අනුමත කරන ලදී. සම්මේලනය පවත්වන ස්ථානය හා වේලාව ''ඉස්ක්‍රා'' කණ්ඩායමට දැන්විනි. ඒ අනුව (යම් යම් හේතු කරණ කොට ගෙන නියෝජිතයෙකු යැවීමේ ස්ථිර හැකියාවක් නොවූ නිසා) එය සම්මේලනය සඳහා ලිඛිත වාර්තාවක් සකස් කළේය. වර්තමානය මෙන්, සම්පූර්ණ අවුල් සහගත තත්වයක් බල පවත්නා කාලයක, හුදෙක් මධ්‍යම කාරක සභාවක් පමණක් තෝරා පත් කිරීමෙන් එක්සත් කිරීම පිළිබඳ ප්‍රශ්නය නොවිසඳෙනවා පමණක් නොව,රහසිගත භාවය නොපවත්නා තත්වයක්ද බලපවත්වන හෙයින්, සිදුවීමට බොහෝ ඉඩ තිබෙන පරිදි, ඉක්මණින් හා අංග සම්පූර්ණ පොලිස් වැටලීමක් සිදුවුවහොත්,පක්ෂයක් පිහිටුවීමේ උදුර අදහස් පවා අනතුරට ලක්විය හැකිය යන අදහස වාර්තාවෙන් ඉදිරිපත් කර තිබුණි. එනිසා, සියළුම කාරක සභා අතර සැබෑ සම්බන්ධකම් ඇති කිරීමට හා සමස්ත ව්‍යාපාරයම සඳහා නායකයින් කණ්ඩායමක් සැබැවින්ම පුහුණු කිරීමට හැකි වනු පිණිස,පුනරුත්ථාපනය කරන ලද පොදු පත්‍රයට ආධාර කරන ලෙස සියළුම කාරක සභාවලට ආරාධනා කිරීමෙන් කටයුතු ආරම්භයක් කළ යුතු බවත්, එවැනි කණ්ඩායමක් වර්ධනය වී ශක්තිමත් වූ පසු එය මධ්‍යම කාරක සභාවක් බවට පරිවර්තනය කරගැනීම කාරක සභාවලටත්, ඉතා පහසුවනු ඇති බවත් එම වාර්තාවෙහි සඳහන් කර තිබුණි.ආරක්ෂාව හා සම්බන්ධ හේතුන් නිසා, එක් කාරක සභාවක නියෝජිතයන් ඇතුළු සහෝදරවරු ස්වල්ප දෙනෙකුන් විසින් එම වාර්තාව කියවන ලද පසු එය විනාශ කරන ලදී.

අප වෙස් වලා ගත්තවුනැයි හැඟවීමට බුන්ඩ් සංවිධානයද, කාරක සභා සෙවනැළි රාජ්‍යයට යැවීමට හා පක්ෂ සංවිධානය වෙනුවට එක ප්‍රවෘත්ති පත්‍රයකින් ඉදිරිපත් කෙරෙන අදහස් පතල කරන සංවිධානයක් ආදේශ කිරීමට අප උත්සාහ කරතැයි චෝදනා කරන ''රබෝචිය දියල'' පත්‍රයද ඒ සඳහා යොදගන්නා ක්‍රමවල ස්වභාවය ගැන නිගමනයකට එළඹීම පාඨකයාට භාර කරමු. ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා නිශ්චිත සැලැස්මක් අනුමත කරගැනීමේ අවශ්‍යතාවය ගැන අප වාර්තා කළේ කාරක සභාවලටය; ඒ, ඒවා නැවත නැවතත් කළ ඉල්ලීම් අනුවය. ''රබෝචය ගසියත'' පත්‍රයට යැවූ ලිපි වලින් මෙම සැලැස්ම පැහැදිලි කරන ලද්දේ පක්ෂ සංවිධානයටය; නැවත පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කළ වාර්තාවෙන් එසේ කළේ, පක්ෂය (ඇත්ත වශයෙන්ම) පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාරම්භකතාවය ගත්, එපමණටම පක්ෂය තුළ බලපෑමක් ඇති අයගේ ආරාධනා අනුවය. ප්‍රධාන පක්ෂ පත්‍රය යළිත් පටන් ගැනීමට සහෝදරවරුන් දරන තුන්වැනි ප්‍රයත්නයේදී, ඔවුන් හමුවේ හුදු අනුමාන සහගත යෝජනා පමණක් නොව, අත්දැකීමේ ප්‍රතිඵලද තිබෙනු සඳහා නිලනොවන පක්ෂ පත්‍රයක් පළ කිරීම අපගේ වැදගත් යුතුකම ලෙස සැලකුවේ, අපගේද සහභාගිත්වය ඇතිව, ඒ සඳහා පිට පිටම දෙවරක් පක්ෂ සංවිධානය විසින් දරන ලද නිල ප්‍රයත්නයන් අසාර්ථක වීමෙන් පසුව පමණකි. දැන් මෙම අත් දැකීමේ යම් යම් ප්‍රතිඵල සියල්ලන්ටම බලා ගත හැකිව තිබේ. අප, අපගේ යුතු කම් හරි හැටි අවබෝධ කර ගෙන තිබේද යනුත්, සමහර අය 'ජාතික' ප්‍රශ්නය සම්බන්ධයෙන් දක්වන අස්ථිරත්වය ඔවුන්ටද, තවත් සමහර අය ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් දක්වන වැනෙන සුලු භාවය පිළිගත නොහැකි බව ඒ අයට ද, අප විසින් පෙන්වා දෙනු ලැබීමෙන් සරොස් වී, එනිසා, ආසන්න අතීතය ගැන නොදත් අය නොමග යැවීමට තැත් කරන පුද්ගලයන් ගැන කෙසේ සිතනු යුතු ද යනුත්, දැන් සියළුම සහෝදරවරුන්ට නිගමනය කළ හැක.

ආ) ප්‍රවෘත්ති පත්‍රයකට සාමූහික සංවිධායකයෙක් විය හැකිද?

''පටන් ගත යුත්තේ කොතැනින්ද'' යන ලිපියෙන් මෙම ප්‍රශ්නයම සාකච්ඡා කර ඊට ඔව් යනුවෙන් පිළිතුරු සැපයීම එම ලිපියේ වැදගත්ම ස්වභාව ලක්ෂණයයි. අප දන්නා තරමට, මෙම ප්‍රශ්නය, එහි වැදගත්කම අනුව පරීක්ෂාකර බලා එයට නැත යනුවෙන් පිළිතුරු දීමට තැත් කළ එකම තැනැත්තා එල්. නදියෂ්දින්ය. ඔහුගේ තර්කය සම්පූර්ණයෙන්ම පහත පළ වේ:

''...සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක අවශ්‍යතාවය පිළිබඳ ප්‍රශ්නය ''ඉස්ක්‍රා'' (අංක 4) පත්‍රය විසින් ඉදිරිපත් කරනු දකීමෙන් අපි බෙහෙවින් සතුටු වූනෙමු. එහෙත් එම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන ආකාරය ''පටන් ගත යුත්තේ කොතැනින්ද'' යන එහි මාතෘකාවට ගැලපේයයි අපට එකඟ විය නොහැක. නිසැක වශයෙන්ම මෙය ඉතාමත් වැදගත් කරුණකි. එහෙත්, විප්ලවවාදී කාල වලදී, සටන්කාමී සංවිධානයක පදනම වශයෙන්, ප්‍රවෘත්ති පත්‍රයක් හෝ ජන ප්‍රිය පත්‍රිකා මාලාවක් හෝ එසේ නැතහොත් කන්දක් තරම් විශාල ප්‍රකාශන ගොඩක් වුවද යොදා ගත නොහැක්කේය. අපට එවැනි සංවිධාන නොමැත. පොදු ජනතාව තනිකරම පාහේ ආර්ථික අරගලයෙහි යෙදී සිටියදී, අපගේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් කරගෙන ගොස් ඇත්තේ අවබෝධය ලැබූ කම්කරුවන් අතරය. ප්‍රාදේශීය දේශපාලන සංවිධාන ශක්තිමත් වශයෙන් පුහුණු නොකරන්නේ නම්, ඉතාමත් විශිෂ්ඨ ලෙස සංවිධානය කළ සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක වුවද ඇති වැදගත්කම කුමක්ද? එය දල්වෙන පඳුරක් හා සමානය; එය නොපිළිස්සී දල්වෙන නමුත් එයින් කිසිවෙකු පත්තු නොවෙනු ඇත! එය වටා සහ එය කරන කටයුතු වලදී ජනයා එකතුවී සංවිධානය වනු ඇතැයි ''ඉස්ක්‍රා'' පත්‍රය කල්පනා කරයි. එහෙත් වඩාත් නිශ්චිත කටයුතු වටා එකතු වීම හා සංවිධානය වීම ඊට වඩා බොහෝ පහසු බව ඔවුනට පෙනෙනු ඇත. ප්‍රාදේශීය පත්‍ර පුළුල් ලෙස සංවිධානය කිරීම, පෙළපාලි සඳහා කම්කරු බලවේග වහවහා සූදනම් කිරීම, විරක්ෂා ගත අය අතර ප්‍රාදේශීය සංවිධාන කරගෙන යන නිරන්තර කටයුතු (වෙහෙස නොබලා පොත්පොඩි හා පත්‍රිකා බෙදා හැරීම, රැස්වීම් කැඳවීම, ආණ්ඩුවට විරුද්ධව විරෝධය ප්‍රකාශ කිරීමේ සටන් සඳහා ආයාචනා කිරීම, ආදිය) මේ වඩාත් නිශ්චිත දේ වනු ඇත; විය යුතුය. අපි ප්‍රදේශවල ජීවමාන දේශපාලන කටයුතු ආරම්භ කළ යුතු වෙමු. ඒ අනුව එක්සත් වීමට කාලය පැමිණෙන විට එය කෘත්‍රිම කඩදසි සමගියක් නොවන්නේය. සමස්ත රුසියානු ව්‍යාපාරයක් සඳහා ප්‍රාදේශීය වැඩ එසේ එක්සත් කළ හැකි වන්නේ ප්‍රවෘත්ති පත්‍රයක් මගින් නොවේ!'' (''විප්ලවයේ පූර්වාසන්නය'', පිටු 54).

කර්තෘ අපගේ සැලැස්ම වැරදි ලෙස වටහා ගත් බවත්, ඔහු ''ඉස්ක්‍රා'' පත්‍රයට විරුද්ධව පොදුවේ හුවා දක්වන ඔහුගේ අදහස වැරදි බවත් ඉතා පැහැදිලි ලෙස පෙන්නුම් කෙරෙන, මෙම චතුර වදන් ප්‍රහාරයෙහි ඇතුලත් කොටස් අපි අවධාරණය කර ඇත්තෙමු. අපි ප්‍රදේශවල ශක්තිමත් සංවිධාන පුහුණු නොකරන්නමෝනම්, ඉතා විශිෂ්ඨ ලෙස සංවිධාන කළ සමස්ත රුසියානු පුවත් පතකින් පවා ප්‍රයෝජනයක් නොවේ. මෙයට විරුද්ධ විය නොහැක. එහෙත් සැලකිය යුත්ත නම්, සමස්ත රුසියානු පුවත්පතක මාධ්‍යයෙන් මිස ශක්තිමත් දේශපාලන සංවිධාන පුහුණු කිරීමේ වෙනත් මාර්ගයක් නොමැති වීමයි. ''ඉස්ක්‍රා'' පත්‍රය එහි 'සැලැස්ම' විස්තර කිරීමට පටන් ගැනීමට පෙර එය කර තිබුණු ප්‍රකාශය කර්තෘට ඇස ගැසී නැත. 'සියළුම බලවේග එක්සත් කිරීමෙහි හා නමින් පමණක් නොව යථා ව්‍යාපාරයෙහිදී ද ව්‍යාපාරය මෙහෙයවීමෙහි සමත් වන විප්ලවවාදී සංවිධානයක්, එනම්, සෑම විරෝධය ප්‍රකාශයකටම, සෑම කැරැල්ලකටම ආධාර දීමට හා තීරණාත්මක අරගලය සඳහා සුදුසු වන සටන් බලවේග ගොඩ නැගීමට ඒවා උපයෝගි කර ගැනීමට නිතරම සූදනම් වූ සංවිධානයක් පිහිටුවන ලෙස කියා හඬ නැගීම' අවශ්‍ය බව එහි කියා තිබුණි. එහෙත් පෙබරවාරි මාර්තු සිදුවීම් වලින් පසුව සෑම කෙනෙක්ම මෙම ප්‍රතිපත්තියට එකඟ වනු ඇතැයිද ''ඉස්ක්‍රා'' පත්‍රය තවදුරටත් සඳහන් කරයි. එහෙත් අපට අවශ්‍යව තිබෙන්නේ ප්‍රශ්නය ප්‍රතිපත්තියක් වශයෙන් විසඳීම නොවේ; එය ප්‍රායෝගික වශයෙන් විසඳීමටය. සෑම පැත්තකින්ම, සෑම දෙනාටම, වහාම ගොඩනැගීම් කටයුතු ආරම්භ කිරීමට හැකි වන සේ අපි වහාම නිශ්චිත නිර්මානශීලී සැලැස්මක් ඉදිරිපත් කළ යුත්තෙමු. දැන් නැවතත්, අප ප්‍රායෝගික විසඳුමෙන්, වෙනත්, ප්‍රතිපත්තියක් වශයෙන් නිවැරදි, විරුද්ධ විය නොහැකි හා ශ්‍රෙෂ්ඨ,එහෙත්, කිසිසේත් ප්‍රමාණවත් නොවන හා පුළුල් පොදු ජනතාවට නොවැටහෙන දෙයක්, එනම් 'ශක්තිමත් දේශපාලන සංවිධානයක් ඇති කිරීම' දෙසට, බැහැර ඇදගෙන යනු ලැබේ! සම්භාවනීයතම කර්තෘ තුමනි, ප්‍රශ්නයට භාජන වූ කරුණ මෙය නොවේ. ඇතිකිරීමට කටයුතු කරන්නේ කොහොමද? එය සාර්ථක කරන්නේ කොහොමද?

'පොදු ජනතාව තනිකරම පාහේ ආර්ථික අරගලයෙහි යෙදී සිටිය දී, ප්‍රධාන වශයෙන් අපගේ වැඩ කටයුතු කරගෙන ගොස් ඇත්තේ අවබෝධය ලැබූ කම්කරුවන් අතරය' යි කීම ඇත්ත නොවේ. තීසිසය මේ ආකාරයෙන් ඉදිරිපත් කළ විට, එය ''ස්වබෝද'' පත්‍රයට සුපුරුදු, එහෙත්, මූලික වශයෙන්ම අසත්‍ය බෙදීමක් වන අවබෝධය ලත් කම්කරුවන් හා 'පොදු ජනතාව' ප්‍රති විරුද්ධ පැතිවලට දැමීමේ තත්වයට වැටේ. මෑත අවුරුදු වලදී අවබෝධය ලත් කම්කරුවන්

පවා යෙදී සිටියේ 'තනිකරම පාහේ ආර්ථික අරගලයෙහි'ය. ප්‍රථම කරුණ එයයි. අනිත් අතට, අවබෝධය ලත් කම්කරුවන් හා බුද්ධිමතුන් යන දෙකොටසම අතරෙන් දේශපාලන අරගලය සඳහා නායකයන් පුහුණු කිරීමට අප උදව් කරන තෙක් පොදු ජනතාව එම අරගලය ගෙන යාමට ඉගෙන ගන්නේ නැත. එවැනි නායකයන්ට පුහුණුව ලැබිය හැක්කේ, අපගේ දේශපාලන ජීවිතයේ සියළුම එදිනෙද අංගයන්ද, විරෝධය පෑමට හා අරගල කිරීමට, විවිධ හේතු අනුව, විවිධ පංති දරන සියළුම ප්‍රයත්නයන්ද ක්‍රමානුකූල ලෙස අගය කිරීමෙන් පමණකි. එනිසා දේශපාලන ප්‍රවෘත්ති පත්‍රයක 'කඩදාසි වැඩ' හා 'ප්‍රදේශවල ජීවමාන දේශපාලන වැඩ' අසමාන කර දැක්වීම විහිළුවක් බව පැහැදිලිය. ප්‍රවෘත්ති පත්‍රයක් සඳහා වූ "ඉස්ක්‍රා" පත්‍රයේ සැලැස්ම, විරක්ෂා ව්‍යාපාරයටත්, ගොවි කැරළි වලටත්, සෙම්ස්ත්වො ජනයා අතර අප්‍රසාදයටත්, 'උවදුරු කිරීමෙහි යෙදී සිටින සාර්වාදී කුලී හේවායෙකුට විරුද්ධව පැන නගින ජනතා කෝපයට' ත් යනාදියට ආධාර දීමට 'සටන්කාමී සූදානමක්' ඇති කිරීමේ 'සැලැස්මට' ගලපා ගෙන තිබේ. ප්‍රාදේශීය සංවිධාන අතුරෙන් අති බහුතරය මේවා ගැන කිසි කලෙකත් සිතන්නේ නැති බවත්, එකම සංවිධානයක් හෝ මෙහි සඳහන් 'ජීවමාන දේශපාලන වැඩ' කිසි කලෙකත් ඉෂ්ට කර නොමැති බවත්, නිදර්ශනයක් වශයෙන් සෙම්ස්ත්වො බුද්ධිමතුන් අතර අප්‍රසාදය හා විරෝධය වර්ධනය වීම කෙරෙහි අවධානය යොමු කිරීමට තැත්කළහොත් එයින් නදියෂ්දින් තුළ ('අහෝ දෙවියනි, මෙම ප්‍රවෘත්ති පත්‍රය සෙම්ස්ත්වො ජනයා සඳහා පළ කිරීමට අදහස් කරන්නක්ද? "පූර්වාසන්නය", පිටු 129), 'ආර්ථිකවාදීන්' තුළ ("ඉස්ක්‍රා" පත්‍රයට ලිපිය, අංක 12) හා වෙනත් ප්‍රායෝගික කාරක වරුන් බොහෝ දෙනෙක් තුළද භීතිය හා විමතිය ඇවිස්සෙන බවත්, ව්‍යාපාරය ගැන යම්තම් හෝ වැටහීමක් ඇති කෙනෙක් දනියි. මෙම තත්වයන් යටතේ, ජනතාව මේ සියල්ලම ගැන කල්පනා කිරීමටත්, කැළඹීම් හා අරගල පිළිබඳ සංඥා ලක්ෂණ සියල්ලම සම්පිණ්ඩනය කිරීමටත්, ඉන් පොදු නිගමන වලට එළඹීමටත් උනන්දු කිරීමෙන් පමණක් පටන් ගැනීම කළ හැකිද? අපගේ කාලයේදී, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් පිරිහෙළනු ලබද්දී 'ජීවමාන දේශපාලන කටයුතු' පටන්ගත හැක්කේ ජීවමාන දේශපාලන උද්ඝෝෂණයෙන් පමණකි. නිතර නිතර නිකුත් කෙරෙන හා නිතිපතා බෙද හරිනු ලබන සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක් නොමැතිව නම් එය කළ නොහැකිය.

"ඉස්ක්‍රා" 'සැලැස්ම' 'පොත් ගුළු භාවය' පෙන්නුම් කරන්නකැයි සලකන අය, එහි හරය කිසිසේත් වටහා ගනු බැරිව, වර්තමාන කාලයට ඉතාමත් සුදුසු මාර්ගය සේ දක්වා ඇති දෙය අරමුණ ලෙසට ගනිති. සැලැස්ම පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම් වශ් විස්තර කරන ලද උපමා දෙක ගැන අධ්‍යනය කිරීමට තරම් මොවුන් උවමනාවක් දක්වා නැත. "ඉස්ක්‍රා" පත්‍රය මෙසේ ලිවේය. අපට නොපැකිල සංවර්ධනය වීමටත්, ගැඹුරු ස්වභාවයක් ඇති කරගැනීමටත්, සංවිධානය (එනම් සෑම විරෝධය ප්‍රකාශයකටම හා සටනාරම්භයකටම ආධාර දීමට නිතරම සූදනම් සංවිධානය) ව්‍යාප්ත කර ගැනීමටත් අදල වන ප්‍රධාන ක්‍රියා මාර්ගය සමස්ත රුසියානු දේශපාලන ප්‍රවෘත්ති පත්‍රයක් පළ කිරීම විය යුතුය. අති දැවැන්ත හා පෙර නොවූ විරූ ගොඩ නැගිල්ලක් තැනීමට ගඩොල් තබන කම්කරුවන්ට, නිවැරදි ලෙස ගඩොල් තැබීමට උදව් වනු පිණිස ලඹය ඇල්ලීමත්, පොදු කාර්‍යයෙහි අවසාන අරමුණ කුමක්ද යනු ඔවුන්ට දැන්වීමත්, සෑම ගඩොලක්ම පමණක් නොව, සෑම ගඩොල් කැබැල්ලක්ම පවා ඊට පෙර හා පසුව තබන ලද ගඩොල් හා සමග සිමෙන්තියෙන් බද්ධ කළ විට එකම අවිච්ඡින්න පේලියක් වන සේ උපයෝගී කර ගැනීමේ හැකියාව ලබා දීමත් 'කඩදාසි' වැඩද? යනු කරුණාකර මට කියන්න. එපමණක් නොව, පක්ෂ ජීවිතයේ, දැන් අප ගත කරමින් සිටින්නේ එබඳු කාලයක්, ගඩොල් හා ගඩොල් තබන කම්කරුවන් ඇති, එහෙත්, සෑම දෙනාටම බලාගත හැකි හා අනුගමනය කළ හැකි ලඹයක් නොමැති කාලයක් නොවේද? ලඹය දිග හැරීමේදී අණ දීමේ කාර්‍ය තමනට අවශ්‍යයයි කියමින් ඔවුන් ඝෝෂා කළා වේ. අණ දීමේ ආශාවක් අපට වී නම්, සමහර සහෝදරවරු අපට ආරාධනා කළ පරිදි "ඉස්ක්‍රා" අංක 1 පත්‍රයේ මුල් පිටුවේ නම "රබෝචය ගසියත", අංක 3 යන්න ලියන්න තිබුණි. මහත්වරුනි, ඉහත විස්තර කරන ලද සිදුවීම් වලින් පසුව එසේ කිරීමේ සම්පූර්ණ අයිතියක් අපට තිබුණේය. එහෙත් අපි එසේ නොකෙළෙමු. සියළුම ව්‍යාජ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට විරුද්ධව අසමාන අරගලයක් කිරීමට අපගේ අත් නිදහස්ව තබා ගැනීම අපට උවමනා විය. අපගේ ක්‍රියා මාර්ගය හරි ආකාරව ඉදිරිපත් කර තිබේ නම්, එය නිල පත්‍රයකින් ඉදිරිපත් කළ නිසා නොව, එහි නිවැරදි භාවය නිසා ඊට ගරු කිරීම අපි බලාපොරොත්තු වෙමු.

'ප්‍රාදේශීය කටයුතු මධ්‍යම මණ්ඩල තුළට එක්සත් කිරීම පිළිබඳ ප්‍රශ්නය අගක් මුලක් නොමැති කවය දිවෙන්නාක් වැනිය' යි නදියෂ්දින් අපට චෝදනා කරයි. 'එක්සත් කිරීම සඳහා අංගෝපාංගයන්ගේ වර්ග-සම ස්වභාවය අවශ්‍ය වේ. එමෙන්ම වර්ග-සම ස්වභාවය නිර්මාණය කළ හැක්කේද කිසියම් එක්සත්කාරී සාධකයක් විසිනි. එමෙන්ම එක්සත්කාරී අංගය ශක්තිමත් ප්‍රාදේශීය

සංවිධානවලින් හටගන්නා දෙයක් විය හැකි නමුත් මෙම කාලයේදී එම සංවිධාන වර්ග-සම තාවය අතින් කිසිද විශිෂ්ඨත්වයක් ලබා නැත'. අප ශක්තිමත් සංවිධාන පුහුණු කළ යුතුය යන්න මෙන්ම මෙම සත්‍යයද ගරු කොට සැලකෙන හා ප්‍රතික්ෂේප කළ නොහැකි එකකි. එපමණක් නොව, එමෙන්ම නිසරුය. සමස්තයක් වශයෙන් ගත් කල දේශපාලන ජීවිතය නිමක් නැති පුරුක් සහිත, කොනක් නැති දම්වැලක් හා සමාන හෙයින් සෑම ප්‍රශ්නයක්ම ‘අගක් මුලක් නැති කවයක දිවෙන්නාක් වැනිය’. දේශපාලනයේ මුළු කලාවම රඳා පවත්නේ, අපගේ අතින් ගසා දැමීම අපහසු තම, නියමිත අවස්ථාවේදී ඉතාමත් වැදගත් වන හා එක පුරුකක් අල්ලාගත් අයට මුළු දම්වැලෙහිම හිමිකම සහතික කෙරෙන පුරුක සොයාගැනීම හා අපට හැකි පමණ තදින් එය අල්ලා ගැනීම තුළය.* මග පෙන්වීමක් නොමැතිව, හරියටම අවශ්‍ය ආකාරයට ගඩොල් තැබීමෙහි සමත්, ඉතා හොඳින් එක්ව වැඩ කිරීමට ඉගෙනගත්, පළ පුරුදු ගඩොල් තබන්නන් කණ්ඩායමක් අපට සිටියේ නම්, (කාල්පනික වශයෙන් කියතොත්, මෙය කිසිසේත් සිදුවිය නොහැක්කක් නොවේ), — එසේ නම්, සමහරවිට අපි වෙනත් පුරුකක් අල්වාගත යුත්තෙමු. එහෙත් කණ්ඩායම් වැඩට පුහුණු කරන ලද පළපුරුදු ගඩොල් තබන්නන් අපට නොසිටීම අවාසනාවකි. එනිසා ගඩොල් කිසිසේත්ම අවශ්‍ය නැති තැන්වල තබනු ලැබේ; ඒවා පොදු ක්‍රියාමාර්ගයට අනුකූලව තබනු නොලැබේ; ගොඩනැගිල්ල ගඩොලින් නොව වැල්ලෙන් තනන ලද කලෙක මෙන් සතුරාට සුනු විසුනු කළ හැකි වන ලෙසට ගඩොල් විසුරුණු තත්වයෙන් තබා ඇත.

තවත් උපමාවකි: ‘‘ප්‍රවෘත්ති පත්‍රයක් යනු සාමූහික ප්‍රචාරකයෙක් හා සාමූහික උද්ඝෝෂකයෙක් පමණක් නොව, සාමූහික සංවිධායකයෙක්ද වේ. මේ නයින් බලන කල, එය, තනන ගොඩනැගිල්ල වටා ඉදි කරන පලංචියට උපමා කිරීම උචිතය. එයින් ගොඩනැගිල්ලේ උස් මිටි තැන් සලකුණු වීමත්, ගොඩනැගිලි කරුවන් අතර අදහස් හා භාණ්ඩ හුවමාරුවට හා ඔවුන්ගේ සංවිධිත ශ්‍රමයෙන් ලබන ප්‍රතිඵල බලා ගැනීමටද පහසුකම් සැපයීමක් සිදුවේ’’.* මෙය ස්වකීය කාර්‍ය්‍ය කොටස අතිශයෝක්තියෙන් හුවා දැක්වීමට හාන්සිපුටු කර්තෘවරයෙක් දරන උත්සාහයක් ලෙසට කිසිසේත් සැලකිය හැකිද? නිවස්නය සඳහා පලංචිය කිසිසේත් අවශ්‍ය නොවේ. එය තනා ඇත්තේ අගයෙන් අඩු ද්‍රව්‍ය වලිනි; ඉදිකර ඇත්තේ ද තාවකාලික වශයෙන් පමණකි. ගොඩනැගිල්ලේ සැකිල්ල සම්පූර්ණ කළ වහාම එය ඉවත්කර දර සඳහා ගනු ලැබේ. විප්ලවවාදී සංවිධාන ගොඩනැගීම සම්බන්ධයෙන් වූ කල, එක් දහස් අටසිය හැත්තෑ ගණන්වල දක්නා ලද පරිදි, සමහර විට පලංචිය නොමැතිව ඒවා ගොඩනැගීමට සිදුවේ. එහෙත් මේ කාලයේ අපට අවශ්‍ය වන ගොඩනැගිල්ල නම් පලංචිය නොමැතිව නැගීම ගැන සිතීමට පවා නොහැකිය.

මෙසේ කියමින් නදියෂ්දින් මෙයට විරුද්ධ වෙයි: ‘එය වටා සහ එය වෙනුවෙන් කරන කටයුතු වලදී ජනයා එකතු වී සංවිධානය වනු ඇතැයි ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය කල්පනා කරයි. එහෙත් වඩාත් නිශ්චිත කටයුතු වටා එකතුවීම හා සංවිධානය වීම ඊට වඩා බොහෝ පහසු බව ඔවුනට පෙනෙනු ඇත!’ රුසියානු ආප්තෝප දේශයකින් මෙසේ කියවේ: ‘ලිඳට කෙළ ගසන්නට එපා; ඔබට එයින් දිය බොන්නට උවමනා විය හැක’. එහෙත් කෙළ ගසනු ලැබූ ලිඳකින් දිය බීමට විරුද්ධ නොවන අය සිටිති. අපගේ ශ්‍රේෂ්ඨ, නීත්‍යානුකූල ‘මාක්ස්වාදයේ විවේචකයන්’ හා ‘‘රබෝචය මිස්ල්’’ පත්‍රයේ නීති විරෝධී ආවඩන්නන් වඩාත් නිශ්චිත යමක් නාමයෙන් කොතරම් නම් තුච්ඡ දේවල් කියා තිබේද! ‘වඩාත් නිශ්චිත යමක් වටා එකතු වීම ඊට වඩා බොහෝ පහසු’ බව පෙනෙතියි කියන සම්ප්‍රදයික තර්කයෙන් සාධාරණ කර පෙන්වනු ලබන අපගේම පටු ස්වභාවයෙන්, ක්‍රියාරම්භක තාවය නොමැති කමෙන් හා පැකිලීමෙන් අපගේ ව්‍යාපාරය කොතරම් සීමා වී තිබේද! එමෙන්ම, ‘ජීවිතයේ යථාර්ථයන්’ පිළිබඳ තියුණු හැඟීමක් තමන්ට ඇතැයි සිතන, හාන්සි පුටු කර්තෘවරුන් තදින් හෙළා දකිමින් සෑම තැනෙකම ආර්ථිකවාදීන් දකින්නේයයි (බොරු උජාරුවද ඇතිව) ‘‘ඉස්ක්‍රා’’ පත්‍රයට චෝදනා කරන විශුද්ධි හා විවේචන යන දෙක අතර භේදයට වඩා බොහෝ ඉදිරියෙන් තමන් සිටින බව සිතන නදියෂ්දින්ට, ඔහුගේ උදහසට හේතු වන

---

* ක්‍රිචෙව්ස්කි සහෝදරය, මර්තිනව් සහෝදරය! මෙම කුපිතකාරී ‘සර්වබලධාරී ඒකාධිපතිත්වය’, ‘පාලනයක් නැති අධිකාරය’, ‘උත්තරීතර මෙහෙයවීම’ ආදිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි! මොහොතක් ඒ ගැන සිතන්න. මුළු දම්වැලම අයිති කර ගැනීමේ ආශාවක්! වහාම පැමිණිල්ලක් කරන්න. ‘‘රබෝචිය දියල’’ අංක 12 පත්‍රයේ ප්‍රධාන ලිපි දෙකකට සුදුසු සේ සකස් කළ මාතෘකා දෙකක් මෙහි ඇත.

* මෙම ඡේදයේ මුල් වාක්‍ය ‘‘රබෝචිය දියල’’ (අංක 10, පිටු 62) පත්‍රයෙහි උපුටා දැක්වීමේදී, මර්තිනව්, දෙවැනි වාක්‍ය අත් හරින ලද්දේ ප්‍රශ්නයේ අවශ්‍යම කොටස් සාකච්ඡා කිරීමට අකැමැත්ත නැතහොත් අවබෝධ කර ගැනීමේ නොහැකියාව හඟවමිනි.

පටු ස්වභාවයට ඔහුගේම තර්කවලින් ආධාර කෙරෙන බව හෝ ඔහු දිය බොන්නේ වැඩියෙන්ම කෙළ ගසනු ලැබූ ලිඳෙන් වන බව හෝ නොපෙනේ! පටු ස්වභාවය ගැන උදහසට පත් තැනැත්තේම, රුවල හෝ සුක්කානම හෝ නොමැතිව, එක්දහස් අටසිය හැත්තෑ ගණන් වල විප්ලවවාදීන් මෙන්ම 'සාංසිද්ධික ලෙස' ගසාගෙන යන්නේ නම්, 'ඇවිස්සුම්කාරී ත්‍රස්තය', 'ගොවිජන ත්‍රස්තය', 'අනතුරු හැඟවීමේ සන්ටාව නාදකිරීම' ආදියෙහි එල්බගන්නේ නම්, ඔහුගේ අදහස අවංකතම වුවද, පටු ස්වභාවයට දනින්වැටී නමස්කාර කරන්නවුන් නැගිටුවා තැබීමේ ආවේගී ආශාවක් ඔහුට තිබුණේ වී නමුත්, එය ප්‍රමාණවත් නොවේ. එකතුවීම හා සංවිධානය වීම 'වඩාත් බොහෝ පහසු' වන්නේයයි ඔහු කියන්නේ කුමන නම් 'වඩාත් නිශ්චිත' කටයුතු වටාද යන්න ගැන බලමු. (1) ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර; (2) පෙළපාළි සඳහා සූදනම් වීම; (3) විරක්ෂාගත අය අතර කටයුතු; යමක් කීමට කරුණු වශයෙන් දක්වීම පිණිස මේවා එහෙන් මෙහෙන් අල්ලාගත් බව ක්ෂණයෙන්ම පැහැදිලි වේ. ඊට හේතුව, ඒවා ගැන කොතරම් සලකා බැලුවත් ඒවා තුළ 'එකතුකර සංවිධානය කිරීම' සඳහා සුදුසු වන විශේෂ යමක් ඇතැයි දැකීම මෝඩකමක් වීමයි. තවත් පිටු කීපයකින් පසුව එම නදියෂ්දින්ම මෙසේ කියයි: 'ප්‍රදේශවල කටයුතු කෙරෙන්නේ ඉතාමත් කණගාටුදායක ආකාරයකින් බවත්, කාරක සභාවලට කළ හැකි වැඩ වලින් දහයෙන් එකක්වත් නොකෙරෙන බවත්, අප පැහැදිලිව කිවයුතු කාලය එළඹ තිබේ. ...දැනට අපට තිබෙන සම්බන්ධිකරන මධ්‍යස්ථාන යනු පවිත්‍ර තම මිථ්‍යාවක් වන අතර ඒවා එක්තරා ආකාරයක විප්ලවවාදී නිලධාරි පැලැන්තියක් නියෝජනය කරති; ඒවායේ සාමාජිකයන් අන්‍යොන්‍ය වශයෙන් සේනාධිපති කම් ප්‍රදානය කරගනිති. එමෙන්ම, ශක්තිමත් ප්‍රාදේශීය සංවිධාන ගොඩනැගෙන තෙක් තත්වය තවදුරටත් එසේම පවතිනු ඇත'. මෙම අදහස් වලින් තත්වය තරමක් දුරට අතිශයෝක්තියෙන් දක්වා ඇතත්, ඒවා තුළ අමිහිරි සත්‍යයන් රැසක් ගැබ්ව තිබෙන බව නිසැකය. එහෙත්, ප්‍රදේශවල කටයුතු කණගාටුදායක ආකාරයකින් සිදු වීමත්, ප්‍රාදේශීය සංවිධානවලට සීමාවී සිටින පක්ෂ කාරක වරුන් පුහුණු කිරීමක් නොමැති තත්වයන් යටතේ නොවැලැක්විය හැකි ලෙස ඇතිවන පක්ෂ කාරක වරුන්ගේ පටු මානසික දර්ශනය හා ඔවුන්ගේ කටයුතුවල පරිමානයේ පටු ස්වභාවයත් අතර සම්බන්ධය නදියෂ්දින්ට නොපෙනේ යයි කිව හැකිද? (1898 පටන්) පුළුල් ප්‍රාදේශීය පත්‍ර කරා පරිවර්තනය වීම හා සමාගම්ව ආර්ථිකවාදය හා 'පැරණිතාලය' තදින් උත්සන්න වූ බව ''ස්වබෝද'' පත්‍රයේ පළකරන ලද සංවිධානය ගැන වූ ලිපියෙහි කර්තෘට මෙන්ම මොහුටත් අමතක වී තිබේද? කිසියම් ලෙසකින් 'පුළුල් ප්‍රාදේශීය පත්‍ර' සතුටුදායක ලෙස පිහිටුවීමට හැකි වුවත් (ඉතාමත් විශේෂ අවස්ථාවක හැර මෙය කිසිසේත් කළ නොහැක්කක් බව අප පෙන්වා දී ඇත) එවිටද, සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව පොදු ප්‍රහාරයක් දීම සඳහා සියළුම විප්ලවවාදී බලවේග 'එකතුකර සංවිධානය කිරීම' ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍රවලට කළ හැකි නොවේ. මෙහිදී අප සාකච්ඡා කරන්නේ ප්‍රවෘත්ති පත්‍රයේ ඇති 'ඒකරාශී කිරීමේ' සංවිධානමය වැදගත්කම ගැන පමණක් බව අමතක නොකරමු. ඒ අතර කොටස් කිරීමට පක්ෂව කරුණු කියන නදියෂ්දින් උපහාසාත්මකව නගන ප්‍රශ්නයම අපට ඔහුගෙන් ඇසිය හැකිය: 'සංවිධායකයින් 2,00,000 මුදලයක් අපට ඉතිරි කර තිබේද?' එපමණක්ද නොව පෙළපාළි සඳහා කටයුතු සූදනම් කිරීම ''ඉස්ක්‍රා'' පත්‍රයේ සැලැස්මට ප්‍රතිවිරුද්ධ දෙයක් ලෙසට ඉදිරිපත් කිරීම ද කළ නොහැක. එයට හේතුව, හැකි තරම් පුළුල් පෙළපාළි සංවිධානය කිරීම, එම සැලැස්මේ එක් අරමුණක් වශයෙන් එහිද අන්තර්ගත කර තිබීමයි. සාකච්ඡා වෙමින් පවතින්නේ ඒ සඳහා ප්‍රායෝගික මාධ්‍යයක් තෝරා ගැනීම පිළිබඳ ප්‍රශ්නයයි. මේ කාරණය සම්බන්ධයෙන්ද නදියෂ්දින් අවුලට පත්ව සිටී. එසේ කියන්නේ, පෙළපාළි (මේ දක්වා ඉන් අතිබහුතරය ඇති වූයේ සාංසිද්ධික වශයෙනි) සඳහා 'සූදනම් විය හැකි වන්නේ' 'එකතුවී හා සංවිධානයවී' සිටින බලවේගයන්ට පමණක් බවත්, අපට නැත්තේද ඒකරාශී කිරීමේ හා සංවිධානය කිරීමේ හැකියාව බවත් ඔහුට අමතක වී තිබෙන හෙයිනි. 'විරක්ෂා ගත අය අතර කටයුතු' — නැවතත් එම අවුලමය. මෙයද සංවිධානය කළ බලවේගයන්ගේ කටයුතු සඳහා ක්ෂේත්‍රයක් මිස බලවේගයන් සංවිධානය කිරීම සඳහා සැලැස්මක් නොවේ. අප කොටස් වලට වෙන් වී සිටීම නිසා, අපට 'සංවිධායකයින් 2,00,000' ක් නොමැති නිසා, වන හානිය ගැන මෙහිදී ද නදියෂ්දින් තක්සේරු කරන්නේ කොතරම් අඩුවෙන්ද යන්න පහත සඳහන් කරුණෙන් දැක්ක හැකිය: ''ඉස්ක්‍රා'' පත්‍රය විරක්ෂාව ගැන සපයන පුවත් අප්‍රමාණවත් වීම ගැන හා ග්‍රාමීය ජීවිතයේ ඉතාමත් සාමාන්‍ය සිදුවීම් ගැන පලකරන ලිපිවල අනියම් ස්වභාවය ගැන (නදියෂ්දින් ඇතුළුව) බොහෝ දෙනෙක් එයට දෝෂාරෝපනය කළහ. දෝෂාරෝපනය යුක්ති යුක්තය. නමුත්, ''ඉස්ක්‍රා'' පත්‍රය එයට 'වැරදි කරු වුවත්, එය පවක් කර නැත'. ගම් ප්‍රදේශ හරහාද 'ලඹයක් දිග හැරීමට' අපි තැත් කරන්නෙමු. එහි කිසිම තැනක ගඩොල් තබන්නන් ඇත්තේම නැති තරම්ය. එනිසා, ඉතාමත් සාමාන්‍ය කරුණු ගැන පවා අපට දැනුම්

දෙන සෑම කෙනෙක්ම ධෛර්යමත් කිරීම අපගේ යුතු කමක් වශයෙන් අප සලකන්නේ, එයින්, මෙම ක්ෂේත්‍රයේ අපගේ දයකයන් වැඩි වෙතියිද, අවසානයේදී ඉතාමත් වැදගත් කරුණු තෝරාගැනීම පිළිබඳව අප හැම දෙනාටම පුහුණුවක් ලැබෙනු ඇතැයිද යන බලාපොරොත්තු වෙනි. එහෙත් පුහුණු වීම සඳහා අපට ලැබෙන කරුණු කොතරම් අඩුද යත්, ඒවා මුළු රුසියාවටම පොදු තත්වයට සකස් කර නොගතහොත් අපට පුහුණුවක් ලැබීම සඳහා ඒවා කොහෙත්ම ප්‍රමාණවත් නොවනු ඇත. නදියෂ්දින් කෙරේ දක්නට ලැබෙන තරමටවත්, උද්ඝෝෂකයෙකු වශයෙන් හැකියාවද, පාදඩයාගේ ජීවිතය ගැන දැනුමද ඇති කෙනෙකුට විරක්ෂාගත අය අතර උද්ඝෝෂණය ගෙන යාමෙන් ව්‍යාපාරයට මිළ නොකළහැකි තරම් සේවයක් කළ හැකි බවට සැකයක් නැත. එහෙත්, රුසියාවේ සිටින සහෝදරවරු පිරිසක් වශයෙන් ගත් කල තවමත් අළුත් වැඩ භාරගෙන කිරීමේ හැකියාව නොමැතිව සිටින නිසාත්, එවැනි කෙනෙකුගේ උදහරණයෙන් ඔවුනට අධ්‍යාපනයක් ලැබීමට ඉඩ තිබෙන නිසාත්, ඔහු කරන වැඩ කටයුතු වලදී ඔහු ගත් සෑම පියවරක්ම ගැන එම සහෝදරවරු සියළු දෙනාටම නොදැන්වුව හොත් ඔහු නිසැක වශයෙන්ම ස්වකීය සුදුසු කම් සඟවා තබාගන්නා තැනැත්තෙක් වේ.

එක්සත් කමෙහි වැදගත්කම හා ‘එකතු වීමේ හා සංවිධානය වීමේ’ වැදගත් කම ගැන දැන් කථා නොකරන කෙනෙක් නැත. එසේ වුවද, එක්සත් කම ඇති කිරීමට පටන්ගත යුත්තේ කොතැනින්ද; එය කරන්නේ කෙසේද යන්න ගැන වැඩි දෙනෙක් තුළ අදහසක් නැත. නිදර්ශනයක් ගතහොත්, කිසියම් නිශ්චිත නගරයක දිස්ත්‍රික් කව ‘එක්සත්’ කරත හොත්, එම කටයුත්ත සඳහා පොදු ව්‍යවස්ථාවක්, එනම්, ‘සංගමයට’ පොදු නමක් පමණක් නොව, සැබවින්ම පොදු වූ වැඩ, ද්‍රව්‍ය, පළපුරුද්ද සහ අන්‍යොන්‍ය වශයෙන් බලවේග හුවමාරු කර ගැනීමද, දිස්ත්‍රික්ක පදනමෙන් පමණක් නොව, නගර ව්‍යාප්ත පරිමානයෙන්, විශේෂඥතා වර්ධනය අනුව කාර්ය බෙදහැරීමද, අවශ්‍ය වන බවට සමහරවිට සියළු දෙනාම එකඟ වනු ඇත. විශාල රහස් සංවිධානයක වැඩ කටයුතු වලදී (වාණිජ පාඨයක් යොදතොත්) දරන්නට සිදුවන වියදම් එකම දිස්ත්‍රික්කයක සම්පත් වලින් වැය නොකරන බවත්, මෙම පටු ක්ෂේත්‍රයෙන් විශේෂඥයෙකුගේ කුසලතා වර්ධනයට ප්‍රමාණවත් වන තරම් අවකාශ නොලැබෙන බවත් සියළු දෙනාම පිළිගනු ඇත. එමෙන්ම, නිශ්චිත ප්‍රදේශයක් වුවද, ඉතාමත් පටු ක්ෂේත්‍රයක් වන නිසාත්, ඒ බව අපගේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයෙන් ඔප්පු වී ඇති නිසාත්, නගර කීපයක කටයුතු ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන්ද එම කරුණු අදල වේ. දේශපාලන උද්ඝෝෂණ සහ සංවිධාන වැඩ හා සම්බන්ධයෙන් අපි මෙය සවිස්තරව ඉදිරිපත් කර ඇත්තෙමු. ප්‍රථමයෙන්ම හා අත්‍යාවශ්‍ය ලෙසටම අපට උවමනා කරන්නේ ක්ෂේත්‍රය පුළුල් කිරීම හා නිතිපතා කරන පොදු වැඩ කටයුතු පදනම් කරගෙන නගර අතර නියම සම්බන්ධකම් ඇති කර ගැනීමය. කොටස්වලට වෙන්වී සිටීම ජනතාවට අවහිරයක් වන අතර, ලෝකයේ සිදුවන්නේ කුමක්ද, ඉගෙන ගන්නේ කාගෙන්ද, පළපුරුද්ද ලබන්නේ කෙසේද, පුළුල් ක්‍රියාකාරිත්වයෙහි යෙදීමට ඇති ආශාව ඉටු කරගන්නේ කෙසේද යන කරුණු නොදැන ඔවුන් (‘‘ඉස්ක්‍රා’’ පත්‍රයේ ලියුම් කරුවෙකුගේ පාඨයක් උපයෝගි කර ගත හොත්) ‘වලකට වැටී එහි හිරවී සිටිති’. අපට නියම සම්බන්ධකම් ඇති කරගැනීමට පටන් ගත හැකි වන්නේ පොදු ප්‍රවෘත්ති පත්‍රයක ආධාරයෙන් පමණක් වන බව මම තවදුරටත් නැවත නැවතත් කියමි. ඉතාමත් විවිධාකාර වූ කටයුතුවල ප්‍රතිඵල සම්පිණ්ඩනය කරන්නා වූද, සියළුම මාර්ග රෝමයට වැටෙන්නා සේ, විප්ලවය කරා යන අප්‍රමාණ මාර්ග ඔස්සේ වෙහෙස නොතකා ඉදිරියට යන සේ ජනතාව කුළුගන්වන්නාවූද නිතිපතා ක්‍රියාත්මක වන එකම සමස්ත රුසියානු ව්‍යාපාරය, පොදු ප්‍රවෘත්ති පත්‍රයයි.අප බලාපොරොත්තු වන්නේ හුදෙක් නාමික වූ එක්සත් කමක් නොවේ නම්, සෑම ප්‍රාදේශීය අධ්‍යයන කවයකම බලවේගයන්ගෙන් හතරෙන් එකක් බැගින් පොදු ව්‍යාපාරයේ ක්‍රියාශීලී වැඩ කටයුතුවල යෙදෙනු සඳහා වහාම වෙන් කිරීමට අපි පිළියෙළ යෙදිය යුත්තෙමු. එවිට, ව්‍යාපාරයේ පොදු රටාව, විෂය ප්‍රමාණය හා ස්වභාවය ගැන ප්‍රවෘත්ති පත්‍රය විසින් ඔවුන්*වෙත නොපමාව දන්වනු ලැබේ. එමගින්, සමස්ත රුසියානු ක්‍රියාකාරීත්වයේ ඉතාමත් තදින් දැනෙන අඩුපාඩු කම ගැනද, උද්ඝෝෂණය නොකෙරෙන හා සම්බන්ධකම් දුර්වල තැන් ගැනද අධ්‍යයන කව වලට අදහසක් ලැබෙන අතර, අතිවිශාල පොදු යන්ත්‍රයේ කුමණ නම් කුඩා රෝද නියමිත

---

* එක විශේෂයක්: මෙසේ වන්නේ නියමිත අධ්‍යයන කවයක් ප්‍රවෘත්ති පත්‍රයේ ප්‍රතිපත්තියට සහයෝගය දක්වතොත් හා සහායක වීම, එනම් ලිපි ලේඛන කටයුතුවලදී පමණක් නොව, පොදු විප්ලවීය කටයුතුවලදීද සහායක වීම ප්‍රයෝජනවත් යයි සලකතොත් පමණකි. ‘‘රබෝචිය දියල’’ සඳහා සටහන: ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රීඩාවෙහි යෙදෙනුවට වඩා ව්‍යාපාරය අගේ කරන, සහයෝගය දැක්වීමත්, ඉතාමත් ක්‍රියාශීලී සහ ප්‍රාණවත් සහභාගිත්වයත් අතර වෙනසක් නොදකින විප්ලවවාදීන් කෙරෙහි මෙම විශේෂත්වය ඇතැයි සලකනු ලැබේ.

අධ්‍යයන කවයක් මගින් අළුත් වැඩියා කරනු සුදුසුද, නැතහොත් ඒ වෙනුවට වඩා හොඳ රෝද යොදනු යුතුද යන්නද පෙන්නුම් කෙරේ. එවිට, තවමත් වැඩ ආරම්භ කර නැති, එහෙත් ක්‍රියාකාරීත්වයෙහි යෙදීමට ප්‍රථම වරට අරමුණු කරන අධ්‍යයන කවයකට, 'කර්මාන්තයේ' පසුගිය සංවර්ධනයන් ගැන නොදන්නා, නැතහොත් කර්මාන්තයේ බලපවත්නා, පොදු නිෂ්පාදන ක්‍රමවල මට්ටම ගැන නොදන්නා, කුඩා කර්මාන්ත ශාලාවක තනිවී සිටින කම්කරුවෙකු මෙන් කටයුතු නොකර, සර්වබලධාරී ඒකාධිපතිත්වයට දෙන සමස්ත මහා විප්ලවවාදී ව්‍යාපාරය පිළිබිඹු කරන පැතිරීගිය ව්‍යාපාරයක කොටස් කරුවෙකු වශයෙන්, එහි වැඩ කටයුතු පටන් ගත හැකි වේ. සෑම කුඩා රෝදයකම, නිමාව වඩාත් විශිෂ්ඨ වූ තරමට, පොදු ව්‍යාපාරයේ යෙදුනු විස්තර කාරක වරුන් සංඛ්‍යාව වැඩි වූ තරමට, අපගේ දැල් ආකාර සංවිධානය වඩාත් බලවත් වන අතර, අනිවාරණීය වශයෙන්ම සිදුවන පොලිස් වැටලීම් කරණ කොට ගෙන සාමාජිකත්වය අතර පැන නගින අපිළිවෙළද අඩු වන්නේය.

ප්‍රවෘත්ති පත්‍රයක් (එසේ හැඳින්වීමට තරම්වන පත්‍රයක් නම්, එනම් සඟරාවක් මෙන් මසකට වරක් නිකුත් කෙරෙන පත්‍රයක් නොව, නිතිපතා, මසකට හතරවරක් වත් නිකුත් කෙරෙන එකක් නම්) බෙද හැරීමේ හුදු කාර්යයෙන්ම සැබෑ සම්බන්ධකම් ඇති කර ගැනීමට ඉඩ සැලසේ. දැනට විප්ලවවාදී කටයුතු සම්බන්ධයෙන් නගර අතර තොරතුරු හුවමාරුව ඉතාමත් විරළය. එය කොතැනක හෝ සිදුවුවත්, එය විශේෂ දෙයක් මිස සාමාන්‍යයෙන් සිදුවන්නක් නොවේ. එසේ වුවත් අපට ප්‍රවෘත්ති පත්‍රයක් තිබුණේ නම්, එම තොරතුරු හුවමාරුව සාමාන්‍ය දෙයක් බවට පත්වී, ප්‍රවෘත්ති පත්‍රය බෙද හැරීම පමණක් නොව (ඊට වඩා වැදගත් වන) අත්දැකීම්, ද්‍රව්‍යමය දේ බලවේග හා සම්පත්ද හුවමාරුව සාර්ථක ලෙස කරගත හැකි වේ. එමගින් සංවිධාන කටයුතුවල පරිමාණය ඉතා ඉක්මණින් ඉතාමත් විශාල වීමට ඉඩ තිබේ;එක ප්‍රදේශයක ලබන සාර්ථකත්වය,තවදුර අංග සම්පූර්ණත්වය ලැබීම සඳහා කෙරෙන සදාචාර දිරි දීමක් වශයෙන් ප්‍රයෝජනවත් වේ; රටේ වෙනත් පෙදෙස්වල වැඩ කරන සහෝදරවරුන් ලබන අත්දැකීම් උපයෝගි කර ගැනීමේ ආශාව එයින් කිති කැවේ එනයින්, ප්‍රාදේශීය වැඩ දැන් පවතින තත්වයට වඩා බෙහෙවින් ගුණාත්මක හා විවිධාකාරවන ස්වභාවයක් ගනු ඇත. මුළු මහත් රුසියාවේ සියළුම පෙදෙස්වලින් එකතු කරගත් දේශපාලන හා ආර්ථික හෙළිදරව් කිරීම් වලින් සියළුම කර්මාන්තවල සෑම සංවර්ධන මට්ටමකම සිටින කම්කරුවන්ගේ මනස පෝෂණය වේ. එමගින් ඉතාමත් විවිධාකාර මාතෘකා ගැන කථා පැවැත්වීමට හා කියවීමට අවශ්‍ය කරුණු හා අවස්ථාවන්ද සැපයේ. එපමණක් නොව ඊට අමතරව නීත්‍යානුකූල පත්‍රවල ඇඟවීම් මගින්ද, ජනතාව අතර කෙරෙන කතා බහෙන්ද, ආණ්ඩුවේ 'කොහොල්' ප්‍රකාශන වලින්ද එම මාතෘකා පිළිබඳ අදහසක් ඇති කෙරේ. සෑම කැරැල්ලක් ගැනම, සෑම පෙළපාලියකම සෑම අංශයක් ගැනම අගය කිරීම හා සාකච්ඡා කිරීම රුසියාවේ සෑම පෙදෙසකම හා ඔවුන් අභිබවා යාමේ පවා (සමාජවාදීන් වන අපි, අභිබවා යාමේ සියළු ප්‍රයත්න හෝ 'තරඟය' සම්පූර්ණයෙන්ම! හෝ ප්‍රතික්ෂේප නොකරමු) අභිලාෂයද, එනිසාම ඇතිවන, කලින් සාංසිද්ධික ආකාරයෙන් මෙන් පැන නැඟී දේ විඥනීය ලෙස සූදනම් කිරීමේ අභිලාෂයද, ප්‍රහාරයේ සැලැස්ම සුදුසු ලෙස වෙනස් කරගැනීම සඳහා නියමිත දිස්ත්‍රික්කයක හෝ නියමිත අවස්ථාවක පවතින වාසිදයක තත්වයන්ගෙන් ප්‍රයෝජන ගැනීමේ අභිලාෂයද යනාදිය කුළු ගැන් වේ. ඒ අතරම ප්‍රාදේශීය වැඩ කටයුතු මෙසේ පුණර්ජීවනය ලැබීමෙන් පසු, දැන් මෙන් පවත්වන සෑම පෙළපාලියකදීත් ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍රයක සෑම කලාපයක්ම පළ කිරීමෙහිදීත්, බොහෝ විට සියළු අවදනම් සහගත හා 'වෙවුළුම් නංවන ප්‍රයත්නයන් දරන්නට සිදුවීම හා සියළුම බලවේගයන් පරදුවට තැබීමද අවශ්‍ය නොවේ. ඒවායේ 'මුල්' සොයා ගැනීමට හාරා අවුස්සා බැලිය යුත්තේ කුමණ දිස්ත්‍රික්කයෙහිද යන්න පොලිසිය නොදන්නේ නම්, ඒවා සොයා ගැනීම ඔවුනට ඉතා අපහසු වන්නේය. අනිත් අතට, නිති පතා පොදු වැඩ කටයුතුවල යෙදීම හේතු කොට ගෙන, නියමිත ප්‍රහාරයකට අදල බලවේගය, පොදු හමුදවේ නියමිත බල ඇණියෙහි ශක්තියට ගැලපෙන ආකාරයට සකස් කර ගැනීමටද අපගේ අය පුහුණු වෙති. (දැනට එසේ කිරීම ගැන සිහිනෙනුදු සිතන අය විරළය. ඊට හේතුව අවස්ථා දහයකින් නමයකදීම ප්‍රහාරය දෙන්නේ සාංසිද්ධික වශයෙන් වීමය). එසේ පොදු වැඩ කටයුතු කිරීම නිසා එක තැනක සිට තවත් තැනකට පොත් පමණක් නොව විප්ලවීය බලවේගයන්ද 'ප්‍රවාහණය කිරීමේ' හැකියාව ලැබේ.

සීමා සහිත ප්‍රාදේශීය වැඩ සඳහා ශක්තිය ක්ෂය කිරීමෙන් බලවේගයන් බෙල හීන තත්වයට පත් කෙරෙන අවස්ථා දැන් බොහෝ ඇත. එහෙත් අප සාකච්ඡා කරන තත්වයන් යටතේ දක්ෂ උද්සෝෂකයෙකු හෝ සංවිධායකයෙකු රටේ එක කොනක සිට තවත් කොනකට මාරු කිරීමට හැකි වේ. එසේ කිරීම අවශ්‍ය වන අවස්ථාද බොහෝ පැන නගිනු ඇත. පක්ෂ කටයුතු සඳහා පක්ෂ වියදමින් යන කෙටිකාලීන ගමන්වලින් පටන් ගෙන, කල්යාමේදී

පක්ෂය විසින් නඩත්තු කරනු ලැබීමටද, වෘත්තීය විප්ලවවාදීන් වීමටද, තමන් දේශපාලන නායකයන් වශයෙන් පුහුණුවීමටද සහෝදරවරු පුරුදු වෙති.

එමෙන්ම, ප්‍රාදේශීය කාරක සභා, ප්‍රාදේශීය කණ්ඩායම් හා අධ්‍යයන කව සියල්ලම නැතහොත් යටත් පිරිසෙයින් ඉන් සැලකිය යුතු තරම් වැඩි කොටසක් වත් පොදු ව්‍යාපාරයේ වැඩ කටයුතු ක්‍රියාශීලී ලෙස ඉටු කරන තත්වයක් ඇති කර ගත හැකි වුවහොත්, නුදුරු අනාගතයේදීම, රුසියාවේ සෑම තැන්හිම දස දහස් ගණනින් බෙද හරිනු ලබන සතිපතා පුවත්පතක් අපට පිහිටුවිය හැකි වේ. මෙම ප්‍රවෘත්ති පත්‍රය, පංති සටනේ සහ පොදු ජන කෝපයේ සෑම පුලිඟුවක්ම පොදු ගිනි ජාලයක් බවට පත් වන සේ ඊට හුළං පිඹින දැවැන්ත කම්මල් මයින හමක කොටසක් බඳු වනු ඇත. තනිකර ගත්කල තවමත් ඉතා අහිංසක හා ඉතා කුඩායයි කිව හැකි, එහෙත් නිතිපතා සහ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම පොදුවේ දරනු ලබන එම ප්‍රයත්නය වටා පළපුරුදු සටන් කරුවන්ගෙන් සමන්විත ස්ථිර හමුදවක් ක්‍රමානුකූල ලෙස එක් රැස්වෙති; ඔවුන්ගේ පුහුණුව ලබා ගනිති. මෙම පොදු සංවිධාන ව්‍යුහයේ ඉණිමං හා පලංචි මත, අපගේ විප්ලවවාදීන් අතරින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ෂෙලියාබව්ලාත්, අපගේ කම්කරුවන් අතරින් රුසියානු බෙබෙල්ලාත්, කල් නොයවාම සංවර්ධනය වී ඉදිරිපත්ව, සංවිධිත හමුදවේ තමනට හිමි නිසි තැන ගෙන, රුසියාවේ අවමානය හා ශාපය සමග ගනු දෙනු බේරීමට සමස්ත ජනතාවම කළම්ඹනු ඇත.

අප සිහින දැකිය යුත්තේ මෙය ගැනය!

* * *

අපි 'සිහින දැකිය යුතු' වෙමු! මම මේ වචන ලියා ඉන් පසු තැති ගත්තෙමි. මා 'සමගි සාකච්ඡාවකට' වාඩි වී සිටින සැටියක්ද, මා ඉදිරියෙන් ''රබෝචිය දියල'' කතෘවරු හා එහි ලියුම් කරුවන් වාඩි ගෙන සිටින සැටියක්ද මම සිහියට නැඟුවෙමි. මර්තිනව් සහෝදරයා නැඟී සිට මා දෙසට හැරී තදින් මෙසේ කියයි: ''පක්ෂ කාරක සභාවල අදහස ප්‍රථමයෙන් ලබා නොගෙන සිහින දැකීමේ අයිතියක් ස්වෛරි කතෘ මණ්ඩලයකට තිබේද? යි ඔබෙන් ප්‍රශ්න කිරීමට මට අවසර දෙන්න''ඔහුට අනතුරුව නැගී සිටින ක්‍රිචේව්ස්කි සහෝදරයා (බොහෝ ඉහතදී ප්ලෙහානව් සහෝදරයාගේ අරුත්සරු බව වැඩි කළ මර්තිනව් සහෝදරයාගේ අරුත්සරු කම දර්ශනික වශයෙන් වැඩි කරමින්) වඩාත් තදින් තවදුරටත් මෙසේ කියයි: ''මම ඉන් ඔබ්බට යන්නෙමි. මාක්ස් කියන ලෙසට මනුෂ්‍ය වර්ගයා නිතරම තමන් සඳහා නියම කර ගන්නේ තමන්ට විසඳිය හැකි කර්තව්‍යයන් බවත්, උපක්‍රම යනු පක්ෂය හා එක්ව වැඩෙන පක්ෂ කර්තව්‍යයන් වර්ධනය වීමේ ක්‍රියාදමයක් වන බවත් දැන දැනම මාක්ස්වාදියෙකුට සිහින දැකීමේ අයිතියක් තිබේද?''

මෙම තදබල ප්‍රශ්න ගැන කල්පනා මාත්‍රයක් ඇති වූ පමණින්ම මට සීතලක් දැනී මා සසල වෙයි; එයින් සැඟවෙන්නට තැනක් හැර අන් සියල්ලම මට එපා වෙයි. මම පීසරියව් පිටුපස සැඟවෙන්නට උත්සාහ ගන්නෙමි.

'නොයෙක්, නොයෙක් භේද ඇතැ' යි පීසරියව් ලීවේය. ඔහු එසේ ලීවේ සිහින හා යථාර්ථය අතර භේදය සම්බන්ධයෙනි. ''මගේ සිහින ස්වාභාවික සිදුවීම්වලට වඩා ඉදිරියෙන් ගමන් කිරීමට ඉඩ තිබේ. එසේ නැතහොත් ඒවා ස්වාභාවික සිදුවීම් කිසිකලෙකත් ගමන් නොගන්නා බැහැර දිසාවකට ඉගිල යාමට ඉඩ තිබේ... ශ්‍රම ශක්තිය විකෘති කරන හෝ අප්‍රාණික කරන කිසිවක් එම සිහිනවල නැත. එපමණක් නොව, අනික් අතට, මේ ආකාරයෙන් සිහින දැකීමේ හැකියාව කිසිසේත් මිනිසාට නොතිබුණි නම්, ස්වකීය අත්වලින් හැඩ ගැස්මේ ආරම්භක තත්වයේ පමණක් තවමත් පවතින නිෂ්පාදනයෙහි නිමි ස්වභාවයේ සමස්ත හා සම්පූර්ණ පින්තූරය ගැන, කලින් කල ඉදිරියට දිවගොස් මානසික වශයෙන් සිතා ගැනීමට ඔහුට නොහැකිවිනි නම්, එවිට, කලා විද්‍යා ප්‍රායෝගික අධ්‍යාසයේ ක්ෂේත්‍රයන්හි විශාල හා බලවත් ලෙස වෙහෙස වීම අවශ්‍ය වන වැඩ ආරම්භ කර සම්පූර්ණ කිරීම සඳහා ඔහු පොළඹවන කුමණ නම් උනන්දු කාරකයක් තිබිය හැකි දැයි මට සිතා ගත නොහැකිය... සිහින හා යථාර්ථය අතර භේදයෙන් හානියක් සිදු නොවන්නේ සිහින දකින තැනැත්තේ ඔහුගේ සිහින ගැන බරපතල ලෙස විශ්වාස කරන්නේ නම්, ඔහු අවධානයෙන් යුතුව ජීවිතය නිරීක්ෂණය කර, ඔහුගේ නිරීක්ෂණ ප්‍රතිඵල ඔහුගේ අහස් මාළිගා සමග සසඳා බලන්නේ නම් හා පොදු වශයෙන් කියතොත්, ඔහු ඔහුගේ මනස්කාර සාර්ථක කිරීමට අවංකව වැඩ කරන්නේ නම් පමණකි. සිහින හා ජීවිතය අතර කිසියම් සම්බන්ධයක් තිබේ නම් එවිට සියල්ල යහපති''.

අවාසනාවකට මෙන් අප ව්‍යාපාරය තුළ මෙවැනි සිහින දැකීම ඇත්තේ ඉතා ස්වල්ප වශයෙනි. ඊට වග කිව යුත්තේ ස්වකීය කල්පනාකාරී අදහස් හා 'නියම ස්වභාවයට' තමන්ගේ ඇති 'ආසන්නභාවය' ගැන පුරසාරම් දොඩන අයවන නීත්‍යානුකූල විවේචනයේ හා නීත්‍යානුකූල 'වල්ගාවාදයේ' නියෝජිතයෝ වෙති.

ඇ) අපට අවශ්‍ය කුමන වර්ගයේ සංවිධානයක්ද?

අපගේ ‘සැලැස්මක් වන උපක්‍රම’ සංයුක්ත වන්නේ වහාම ප්‍රහාරය දීම සඳහා හඬ නැගීම ප්‍රතික්ෂේප කිරීමෙන් බවත්, ‘සතුරු බලකොටුව සාර්ථක ලෙස වැටලීමට’ කරන ඉල්ලීමෙන් බවත්, නැතහොත් වෙනත් වචනවලින් කියතොත් ස්ථිර යුද්ධ හමුද රැස්කිරීම, සංවිධානය කිරීම හා සටනට සූදානම් කිරීම වෙත සියළුම ප්‍රයත්නයන් එල්ල කළ යුතුයයි කියන ඉල්ලීමෙන් වන බවත් ඉහත කියා ඇති කරුණු වලින් පාඨකයාට පෙනෙනු ඇත. ආර්ථිකවාදයේ සිට, ප්‍රහාරයක් දෙන ලෙස කරන ඉල්ලීම දක්වා පිම්මක් පැනීම ගැන අප ‘‘රබෝචිය දියල’’ පත්‍රයට (‘‘ලිස්තොක් ‘‘රබෝචිව දියල’’’’[99] අංක 6 පත්‍රයෙන් එය ඒ සඳහා 1904 අප්‍රේල්හිදී සෝෂා කළේය) සමච්චල් කළ විට එය අප වෙත කඩා පැන්නේ අප ‘න්‍යායධර්මීවාදීන්’ වන බවටද, අපගේ විප්ලවවාදී යුතුකම තේරුම් ගැනීමට අප අසමත් වී ඇති බවටද, අප ප්‍රවේසම් සහිත වන සේ කියා හඬ නගන බවටද ආදී වශයෙන් අපට චෝදනා කරමිනි. කිසිම ප්‍රතිපත්තියක් නොමැති, ‘‘සැලැස්මක් වන උපක්‍රම’’ ගැන ගාම්භීර ලෙස සඳහන් කරමින් සියළුම තීරණවලින් මගහරින අයගෙන් චෝදනා අසන්නට සිදුවීම ගැන අප සැබැවින්ම පුදුම නොවෙමු; කල්පවත්නා වැඩ පිළිවෙළවල් හා උපක්‍රම පිළිබඳ මූල ධර්මයන් තදින්ම පිළිකුල් කරන නදියෂ්දින් මෙම චෝදනා පුනරුච්ඡාරණය කළ කල්හි මෙන්ම මෙහිදීද අපි පුදුම නොවෙමු.

ඉතිහාසය යළිත් නොඑතැයි කියා තිබේ. එහෙත්, එය යළිත් පෙන්වා ගැනීමට සෑම උත්සාහයක්ම දරන නදියෂ්දින්, ‘‘විප්ලවවාදී සංස්කෘතිකවාදය’’ බලවත් ලෙස හෙළා දැකීමෙන්ද, ‘‘අනතුරු හඟවන සන්ටාව නාද කිරීම සහ ‘‘විප්ලවයේ පූර්වාසන්න අදහසක්’’ ගැන සෝෂා කිරීමෙන්ද මහත් උනන්දුවෙන් ත්කචියෝව් අනුගමනය කරයි. ඉතිහාසයේ මුල් සිදුවීම ශෝකාලාපයක් වන අතර එහි ප්‍රතිමූර්තිය විහිළුවක්[100] වන්නේය යන සුප්‍රසිද්ධ සිද්ධාන්තය ඔහුට අමතක වී ඇති සේය. ත්කචියෝව්ගේ දේශනා මගින් සූදනම් කරන ලද හා ත්‍රස්ත නොවන ත්‍රස්තය ‘‘ත්‍රස්ත කිරීමෙන්’’ ක්‍රියාත්මක කරන ලද බලය අල්වා ගැනීමේ ප්‍රයත්නයේ ප්‍රබල පෙනුමක් තිබුණ නමුත් සුළු ත්කචියෝව් කෙනෙකුගේ ‘ඇවිස්සුම් කාරී’ ත්‍රස්තය විහිළුවක් පමණකි; සාමාන්‍ය ජනතාවගේ සංවිධානයක් පිළිබඳ අදහස ඌණ පූරණ වශයෙන් ඊට එකතු කරගත් කල එය මහා විහිළුවක් වේ.

‘‘‘‘ඉස්ක්‍රා’’ පත්‍රය එහි පොත්ගුළු ස්වභාවයේ ක්ෂේත්‍රයෙන් පිටතට ඇදෙන්නේ නම්, මෙවැනි (‘‘ඉස්ක්‍රා’’ අංක 7 පත්‍රයේ පළවූ කම්කරුවාගේ ලිපිය වැනි) අවස්ථාවලින් පෙන්නුම් කෙරෙන්නේ ‘ප්‍රහාරය’ ඉක්මණින්, ඉතා ඉක්මණින්ම ආරම්භ කිරීමේ ලකුණු බව එයට අවබෝධ වනු ඇත. එසේ වූකල දැන් (එම වචන) සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක් ගැන කථා කිරීම යනු හාන්සි පුටු අදහස් හා හාන්සි පුටු ක්‍රියාකාරිත්වය ප්‍රචලිත කිරීමකි’’යි නදියෂ්දින් ලීවේය. මෙය ඇදහිය නොහැකි තරම් මහා අවුලකි. එක් අතකින් ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍රයක් වැනි ‘වඩාත් නිශ්චිත’ යමක් වටා එකතුවීම වඩාත් ‘බොහෝ පහසුය’ යන අදහස හා සමග එක් වූ ඇවිස්සුම්කාරී ත්‍රස්තය හා සමග ‘සාමාන්‍ය ජනතාවගේ සංවිධානය’කි අනිත් අතින්, ‘දැන්’’ සමස්ත රුසියානු සංවිධානයක් ගැන කථා කිරීම හාන්සි පුටු කල්පනා ප්‍රචලිත කිරීමකි; නො එසේ නම්, කෙළින්ම කියතොත් ‘දැන්’ නම් ප්‍රමාද වූනා වැඩිය! එනමුත් ‘ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර පුළුල් ලෙස සංවිධාන කිරීම’ ගැන කියන්නේ කුමක්ද? මෙය ‘‘ඉස්ක්‍රා’’ පත්‍රයේ අදහස හා උපක්‍රමීය ක්‍රියා මාර්ගය සමග සසඳා බලන්න. ඇවිස්සුම්කාරී ත්‍රස්තය යනු තේරුමක් නොමැති දෙයකි; සාමාන්‍ය ජනතාවගේ සංවිධානයක් හා ‘පුළුල් ලෙස’ ප්‍රාදේශීය ප්‍රවෘත්ති පත්‍ර පළ කිරීම ගැන කථා කිරීම ආර්ථිකවාදයට දොර සම්පූර්ණයෙන්ම විවෘත කර දීමකි. විප්ලවවාදීන්ගේ ඒකීය සමස්ත රුසියානු සංවිධානයක් ගැන අපි කථා කළ යුත්තෙමු; කඩදසි ප්‍රහාරයක් නොව සැබෑ ප්‍රහාරයක් ආරම්භ වන තෙක් ඒ ගැන කථා කිරීම සඳහා පමා වූනා වැඩි නැත.

‘‘එසේය. සංවිධාන කටයුතු සම්බන්ධයෙන් නම් පවතින තත්වය වෙන කවර ආකාරයෙන් විස්තර කළත්, දීප්තිමත් තත්වයක් ලෙස විස්තර කළ නොහැකිය’යි නදියෂ්දින් තවදුරටත් ලියයි. ‘අපගේ සටන්කාරී බලවේග සමූහය ස්වෙච්ඡා සටන් කරුවන්ගෙන් හා කැරළිකරුවන්ගෙන් සමන්විත වන බව කියන විට ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය සම්පූර්ණයෙන්ම නිවැරදි බව ඇත්තය... අපගේ බලවේගයන් ගැන එතරම් නිවැරදි පිංතූරයක් දීම ඔබගේ හපන් කමකි. නමුත්, ඒ අතරම, ජනතාව කිසිසේත් අපගේ නොවන බවත්,එනිසාම යුද්ධ කටයුතු ආරම්භ කිරීමට සූදුසු වේලාව ගැන අපගෙන් නොවිමසනු ඇති බවත් ඔබ අමතක කරන්නේ මන්ද? ඔවුන් නිකම්ම ගොස් කැරළිගසනු ඇත... ජනකායගේ විනාශකාරී බලවේගය ද සහිතව, එය ස්වේච්ඡාවෙන්ම කැරළි ගසන විට, ‘ස්ථිර හමුදව’ යට වී අතුගෑවී යාමට ඉඩ තිබේ. මෙම ස්ථිර හමුදව අතර ඉතාමත් ක්‍රමාණුකූල සංවිධාන ඇති කිරීමට අප සැමදමත් උත්සාහ කළ නමුත් කිසි කලෙකත් එය සාර්ථක කර ගැනීමෙහි සමත් නොවූයෙමු’’. (අවධාරණය අපගේය).

විශ්මයාකුල තර්ක! ‘ජනතාව අපගේ නොවන’ හේතුව නිසාම, වහාම ‘ප්‍රහාරයක්’ දීම ගැන කථා කිරීම අඥානය; නොහොබනේය. එයට හේතුව’ ‘ප්‍රහාරයක් යනුවෙන් අදහස් කරන්නේ ස්ථිර හමුදව ගසන පහරක් මිස සාංසිද්ධික පොදු ජන උත්සන්නියක් නො වීමයි. පොදු ජනතාව විසින් ස්ථිර හමුදව පෙරලාගෙනගොස් පසෙකට අතුගා දැමීමට ඉඩ තිබෙන නිසාම අපි නොවරදවාම ස්ථිර හමුදව තුළ ‘ඉතාමත් ක්‍රමානුකූල සංවිධාන ඇති කිරීමට’ වැඩ කිරීමෙන් සාංසිද්ධික උත්සන්නියට පසු නොවී සිටීමට සමත් විය යුත්තෙමු. අප එවැනි සංවිධාන ඇති කිරීමෙහි ‘සමත්’ වූ තරමට පොදු ජනතාවට යට නොවී සිටීමේ හැකියාව ස්ථිර හමුදවට වැඩියෙන් ලැබීමටත්, එපමණක් නොව, පෙරමුණේ නිසි තැනට ඔවුන් පත්වීමේ හැකියාව වැඩි වීමටත් ඉඩ තිබේ. නදියෂ්දින් අවුලට පත් වී සිටින්නේ, හමුදවන් ක්‍රමානුකූල ලෙස සංවිධානය වීමේදී, ඔවුන් යෙදී සිටින්නේ ජනතාවගෙන් කොන්වන දෙයකයයි ඔහු කල්පනා කරන හෙයිනි. එහෙත් ඔවුන් එම කටයුත්තෙහි යෙදී සිටින වකවානුවේදී ඇත්ත වශයෙන්ම ඔවුන් මුළුමනින්ම යෙදී සිටින්නේ සෑම පැත්තකින්ම හා සර්ව ග්‍රාහී ලෙස කරන දේශපාලන උද්ඝෝෂණයෙහිය; එනම්, පොදු ජනතාවගේ විනාශකාරී බලවේගයත්, විප්ලවවාදීන්ගේ සංවිධානයේ විඥාත විනාශ කාරී බලවේගයත්, එකිනෙකට ළං කර ඒකීය සමස්තයක් වනසේ එකටෙක සංයෝග කරන කටයුත්තෙහිය. මහත්වරුනි, ඔබට දෝෂාරෝපනය කරන්නට උවමනා වී තිබෙන්නේ දොස් පැවරිය යුතු අයට නොවේ. ස්වකීය වැඩ පිළිවෙළෙහි ත්‍රස්තය ඇතුලත් කිරීමෙන්, ත්‍රස්තවාදීන්ගේ සංවිධානයක් ඇති කිරීමට හඩ නගන්නේ අන් කවරෙක් හෝ නොව ‘ස්වබෝද’ කණ්ඩායම ම වන අතර එවැනි සංවිධානයකින් සිදුවන්නේ අවාසනාවකට මෙන් තවමත් අපගේ නොවන හා අවාසනාවකට මෙන් ඔවුන්ගේ යුද්ධාරම්භය පිළිබඳ අවස්ථාව හෝ ආකාරය ගැන අපෙන් නොවිමසන නැතහොත් කලාතුරකින් පමණක් විමසන පොදු ජනතාව සමග වූ සම්බන්ධකම් ඇති කරගැනීමේ කටයුත්තෙන් අපගේ හමුදව වැලකීමය.

‘‘ඉස්ක්‍රා’’ පත්‍රය බිය වැද්දීමට නදියෂ්දින් දරන ප්‍රයත්නයේදී ඔහු තවදුරටත් මෙසේ කියයි: ‘‘අහසින් එන අකුණක් මෙන් අප මත කඩා වැටුණු මෑත සිදුවීම් අපට මග හැරුණු ලෙසටම, අපට විප්ලවයත් මග හැරෙනු ඇත’’. ඉහත උපුටා දක්වන උද කොටස සමග මෙම වාක්‍ය ගත් කල, එයින් පෙනෙන්නේ ‘‘ස්වබෝද’’* පත්‍රය නිර්මානය කරගත් ‘‘විප්ලවයේ පූර්වාසන්න අදහස’’ කිසිම අර්ථයක් නැති එකක් බවයි. සරල බසින් කියතොත්, මෙම විශේෂ ‘අදහසෙහි’ අවසාන අර්ථය වන්නේ, ‘දැන්’ සාකච්ඡා කිරීමට හා සූදනම් වීමට කල්ගත වුනා වැඩි බවයි. ‘පොත්ගුළු ස්වභාවයේ’ ප්‍රතිපක්ෂිකයානෙනි, තත්වය එසේනම්, ‘න්‍යාය* හා උපක්‍රම පිළිබඳ ප්‍රශ්න’ ගැන පිටු 132 ක පොතක් ලිවීමෙන් තිබුණු ප්‍රයෝජනය කුමක්ද ‘ඔවුන් පුපුරුවා හරිනු — ඔවුන් ගසා දමනු’ යන ලුහුඬු හඩ නැගීම ඇතුලත් පත්‍රිකා 1, 32, 000 ක් නිකුත් කළේ නම් ‘‘විප්ලවයේ පූර්වාසන්න අදහස’’ අනුව වඩාත් සුදුසු වන්නට තිබුණු බව ඔබ කල්පනා නොකරන්නෙහිද?

‘‘ඉස්ක්‍රා’’ පත්‍රය මෙන්, ජාතිව්‍යාප්ත දේශපාලන උද්ඝෝෂණය සිය වැඩ පිළිවෙළෙහි, සිය උපක්‍රමවල හා සිය සංවිධාන කටයුතුවල මුල්ගල වශයෙන් ගන්නා අය කෙරෙහි විප්ලවය මගහැරී යාමේ අනතුරු බලපාන්නේ අන් අයට වඩා ඉතාමත් අඩුවෙනි. සමස්ත රුසියානු ප්‍රවෘත්ති පත්‍රයෙන් විසිරී යන සම්බන්ධකම් දැල් ආකාරයෙන් ගෙතීමේ කටයුත්තෙහි රුසියාව සෑම තැනකම යෙදී සිටින ජනයාට වසන්තයේ සිදුවීම මග නොහැරුනා පමණක් නොව, අනික් අතට, එම සිදුවීම ඇති වන බවට අනාගත වාක්‍ය කීමට අවස්ථාවද ඔවුන් අපට සලසා දුන්හ. ‘‘ඉස්ක්‍රා’’ අංක 13 හා 14 හි විස්තර කරන ලද පෙළපාලිද[101] ඔවුනට මග හැරුනේ නැත. එපමණක් නොව, සාංසිද්ධික වශයෙන් නැගී සිටින පොදු ජනතාවට ආධාර කිරීමත්,

---

* ‘‘විප්ලවයේ පූර්වාසන්නය’’ — පිටු 62.

* නදියෂ්දින්ගේ ‘න්‍යාය පිළිබඳ ප්‍රශ්න පුනරාවලෝකනය යන පොතෙහි එන විප්ලවයේ පූර්වාසන්න අදහස අනුව බලන කල ඉතාමත් අමුතු ස්වභාවයක් ගන්නා පහත සඳහන් ඡේදය හැරුණු විට න්‍යාය පිළිබඳ සාකච්ඡා කෙරෙන වෙන කිසිම දෙයක් සඳහන් නොවූ තරම් වන බව මෙහිලා සඳහන් කළ යුතුය: ‘විප්ලවයට නිසි කනිසම වැදී ඇති නිසා, මේ අවස්ථාවේ බර්න්ෂ්ටයින්වාදයේ අපට ඇති වැදගත් කමෙහි තියුණු ස්වභාවය අඩු වී ගෙන යන්නේය. එමෙන්ම, ස්ත්‍රුවේ මහතා කස පහර ලැබීමට දැනටමත් සුදුසු කම් ලබා ඇතැයි අදමෝවිච් මහතා ඔප්පු කරයිද, එසේ නැතහොත් ස්ත්‍රුවේ මහතා අදමෝවිච් මහතාගේ මතය වැරදි බව ඔප්පු කර ඉල්ලා අස්වීම ප්‍රතික්ෂේප කරයිද යන ප්‍රශ්නයෙහිද වැදගත් කම හීන වේ’’ (පිටු 110). ඇත්ත වශයෙන් එයින් වෙනසක් සිදු නොවේ. න්‍යාය ගැන නදියෂ්දින් දක්වන අන්ත නොසැලකිල්ල ගැන මීට වඩා පැහැදිලි නිදර්ශනයක් සිතීම කෙනෙකුට අපහසුය. ‘අපි විප්ලවයේ පූර්වාසන්නය ප්‍රකාශයට පත්කර ඇත්තෙමු.’ එනිසා විවේචනයන් දරන ප්‍රතිෂ්ඨාවන්ගෙන් ඔවුන් ඉවත් කිරීමට විශුද්ධිවාදීන් සමත් වුනත් නැතත් ‘එහි වෙනසක් නොමැත’! විවේචකයින්ගේ ප්‍රතිෂ්ඨාවන් පරාජය කිරීම සඳහා ඔවුන් සමග අප කරන න්‍යායික සටන්වල ප්‍රතිඵල අපට අවශ්‍ය වන්නේ හරියටම විප්ලවය අතර තුර බව අපගේ බොරු පණ්ඩිතයින් නොදනිති.

ඒ අතරම රුසියාවේ සිටින සහෝදරවරුන් සියළු දෙනාටම පෙළපාලි ගැන දැන ගැනීමට හා ඒවා මගින් රැස්කළ අත්දැකීම් උපයෝගි කර ගැනීමට පත්‍ර මාධ්‍යයෙන් උපකාර කිරීමත් සිය යුතු කම වන බවට පැහැදිලි අවබෝධයකින් යුතුව ඔවුන් එම පෙළපාලි වලටද සහභාගි වූහ. එමෙන්ම ඔවුන් ජීවත්ව සිටිනතාක් ඔවුනට විප්ලවය මග නොහැරෙනු ඇත. තවද අන්කවර දෙයකටත් වඩා විප්ලවය අපෙන් ප්‍රථමයෙන්ම බලාපොරොත්තු වන්නේ, උද්ඝෝෂණය කිරීමේ පළ පුරුද්දත්, විප්ලවය මිතුරන්ගේ ප්‍රමාද දෝෂවලින් හා සතුරන්ගේ උගුල්වලින් ආරක්ෂා කර ගැනීමේ හා ඒ අතරම සාංසිද්ධික ව්‍යාපාරයට මග පෙන්වීමේ මෙන්ම සෑම විරෝධය ප්‍රකාශයකටම (සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන්) ආධාර දීමෙත් හැකියාවකි.

පොදු ප්‍රවෘත්ති පත්‍රයක් සඳහා කරන පොදු වැඩ තුළින් සමස්ත-රුසියානු ප්‍රවෘත්ති පත්‍රයක් කේන්ද්‍ර කොට ගෙන ඒ වටා ගෙතුනු සංවිධානයක් සඳහා වූ සැලැස්ම ගැන එතරම් තදබල ලෙස හා දැඩිව කියා සිටීමට අපට බල කරන අවසාන කාරණයට අපි පැමිණ සිටිමු. සටන්කාමී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයකට තිබිය යුතු නම්‍යශීලීභාවය ඇති වීම සහතික කළ හැක්කේ එවැනි සංවිධානයකට පමණකි. එම නම්‍යශීලීභාවයෙන් බලාපොරොත්තු වන්නේ, අරගලයේ ඉතාමත් විවිධාකාර හා වේගයෙන් වෙනස් වන තත්වයන්ට ගැලපෙන සේ ක්ෂණික ලෙස හැඩ ගැසීමට ඊට හැකියාව තිබීම හා ''එක් අතකින් අති දැවැන්ත සතුරෙක් ඔහුගේ සියළුම බලවේගයන් එක තැනකට යොමු කර තිබියදී, ඔහුට විරුද්ධව විවෘත සටන මඟ හැරීමටත්, එහෙත් අනිත් අතට, ඔහුගේ හසුරුවා ගත නොහැකි විශාලත්වයෙන් ප්‍රයෝජන ගනිමින් අඩුවෙන්ම බලාපොරොත්තු වන විට තැනට පහර දීමටත් හැකියාව තිබීමය.* කැරලි හා වීදි සටන් ඇතිවීම පමණක් බලාපොරොත්තුවෙන් හෝ එසේ නැතහොත් 'නීරස සැමද අරගලයේ ඉදිරිගමන' පමණක් පදනම කරගෙන පක්ෂ සංවිධානය ගොඩ නැගීම ඉතාමත් බරපතල වරදක් වනු ඇත. කැරලි සහිත කාලයක් ගෙවී සන්සුන් කාලයක් ඇති වන්නේ කවදාද යනු කල්තියා දැන ගැනීම බොහෝ විට කොහෙත්ම නොහැකිවන තරම් දෙයක් හෙයින්, අපි නිතරම අපගේ සැමද වැඩ කටයුතු කිරීමටත්, සෑම තත්වයකටම මුහුණදීමටත් සූදානම්ව සිටිය යුතු වෙමු. එසේ වුවත්, එම අනාගත දැනුම ලබා ගත හැකි අවස්ථාවල, අපගේ සංවිධානය යළිත් ගොඩ නගා ගැනීම සඳහා එයින් ප්‍රයෝජන ගත හැකි වේ. එසේ කළ යුතු වන්නේ, සර්වබලධාරී ඒකාධිපති රටක වෙනස්වීම ඇදහිය නොහැකි තරම් වේගයකින්, සමහර විටෙක, සාර්වාදී යනිවාර්[102] වරුන්ගේ එක් රැයක වැටලීමක් හේතු කොට ගෙන පවා, වෙනස් වීම ඇති වන හෙයිනි. එමෙන්ම (නදියෂ්දින් කල්පනා කරන්නේයයි පෙනෙන්නට තිබෙන ලෙසට) විප්ලවය එක ක්‍රියාවක් ලෙස සැලකීම කිසි ලෙසකින්වත් නොකටයුත්තකි. එය සලකා ගත යුත්තේ සම්පූර්ණ සන්සුන්තාවය බොහෝ දුරට බල පවත්නා කාලසීමා හා සමග සීඝ්‍ර ලෙස මාරුවෙන් මාරුවට පැන නගින බොහෝ දුරට බලවත් කැරලි මාලාවක් වශයෙනි. එම හේතුව නිසා අප පක්ෂ සංවිධානයේ කටයුතු වලට ප්‍රධාන වශයෙන් අඩංගු විය යුත්තේද, එම කටයුතුවල එල්ලය විය යුත්තේද, ඉතාමත් බලවත් කැරැල්ලක් පවතින කාලයක මෙන්ම සම්පූර්ණ සන්සුන්තාවය පවතින කාලයක ද කළ හැකි වන හා අත්‍යාවශ්‍ය වන කටයුතුය. එනම්, රුසියාව සෑම තන්හිම, එකට සම්බන්ධ වූ ආකාරයෙන් ගෙන යන, ජීවිතයේ සෑම අංශයක්ම ආලෝකමත් කරන හා පොදු ජනතාවගෙන් හැකි තරම් පුළුල් තම කොටස් අතර ගෙන යනු ලබන දේශපාලන උද්ඝෝෂණ කටයුතු යි. එසේ වුවද නිතර නිකුත් කෙරෙන සමස්ත රුසියානු පුවත්පතක් නොමැතිව වර්තමාන රුසියාවේ මෙම කටයුත්ත කිරීම ගැන සිතන්නට පවා නොහැකිය. මෙම ප්‍රවෘත්ති පත්‍රය වටා ගොඩ නැගෙන සංවිධානය එහි අනුග්‍රාහක වරුන්ගේ (වචනයේ පුළුල් අර්ථයෙනි, එනම්, ඒ සඳහා වැඩ කරන සියළු දෙනාගේම) සංවිධානය තියුණු විප්ලවවාදී 'අවපාත' කාලවලදී පක්ෂයේ ගෞරවය, ප්‍රසාද ජනක

---

*''ඉස්ක්‍රා'' අංක 4, 'පටන් ගත යුත්තේ නොතැනින්ද?' දීර්ඝකාලයක් තිස්සේ වැඩ කිරීමට සිදුවෙතිය බලාපොරොත්තුවෙන් විප්ලවයේ පූර්වාසන්න අදහස පිළිනොගන්නා විප්ලව වල්ගාවාදීන් කිසිසේත් නොකැලඹෙති''යි නදියෂ්දින් ලියයි (පිටු 62). මේ ගැන අපගේ නිරීක්ෂණය මෙසේය: ඉතා දීර්ඝ කාලයක් තිස්සේ වැඩ කිරීම සඳහා දේශපාලන උපක්‍රම හා සංවිධානමය සැලැස්මක් සකස් කර ගැනීමට අප සමත්වන්නේ නම් හා ඒ සමගම, සිදුවීම ඇතිවීමේ වේගය ඉක්මන් වූ හැම විටෙකම පැන නගින සෑම හදිසි තත්වයන්ම යටතේ ස්වකීය වගකීම් පැහැර නොහැර, ස්වකීය යුතුකම් ඉටු කිරීමට පක්ෂයේ තිබෙන සූදානම් මෙම වැඩ කිරීමේ ක්‍රියාදාමය තුළින්ම සහතික කිරීමට අප සමත් වන්නේ නම් මිස, අප කාලකණ්ණි දේශපාලන අතිධාවනකාරීන් වන බව ඔප්පු වනු ඇත. සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ අරමුණ වී ඇත්තේ සමස්ත මිනිස් වර්ගයාගේම ජීවන තත්වයන් මූලික වශයෙන් පරිවර්තනය කිරීම බවත්, මේ හේතුව නිසා වැඩ කිරීමට සිදුවන කාලයේ දීර්ඝකම නිසා 'කැලඹීමට' පත්වීමට සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකුට ඉඩක් නොමැති බවත් අමතක කළ හැක්කේ ඉතා මැතදී පටන් තමා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස හඳුන්වා ගැනීමට පටන් ගත් නදියෂ්දින්ට පමණකි.

තත්වය හා අඛණ්ඩතාවය රැකීමේ පටන් ජාති — ව්‍යාප්ත අවිගත් නැගිටීම සූදනම් කිරීම, ඊට කල්යල් නියම කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම දක්වා වූ සියළුම දේ සඳහා සූදනම්ව සිටිනු ඇත.

රුසියාවේ සිදුවන ඉතාමත් සාමාන්‍ය දෙයක් වන එක් හෝ කීප ප්‍රදේශයක අපගේ සහෝදරවරු වටලා අල්ලා ගනු ලැබීම ගැන ඇත්තෙන්ම සිතට නගා බලන්න සියළුම ප්‍රාදේශීය සංවිධාන ඒකාබද්ධ කරන ඒකීය, පොදු නිතිපතා ක්‍රියාකාරිත්වයක් නොමැති වීම නිසා, බොහෝ විට එවැනි වැටලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් මාස ගණනක් තිස්සේ වැඩ නැවතී යන්නේය. එහෙත් සියළුම ප්‍රාදේශීය සංවිධානවලට එක පොදු කටයුත්තක් තිබුණේ නම්, ධෛර්යමත් දෙතුන් දෙනෙකුට, සති කීපයක් ඇතුලත, පොදු මධ්‍යස්ථානය හා, අප දන්නා පරිදි, දැනුදු ඉතා ඉක්මණින් පැන නගින, අළුත් තරුණ කව අතර සම්බන්ධය ගොඩ නැගිය හැකි වේ. තවද, සිරභාරයට ගැනීම නිසා පොදු ක්‍රියාකාරිත්වය අවහිර වී තිබෙන බව සැම දෙනාටම පැහැදිලි වූ විට, අළුත් කව ඇති වී මධ්‍යස්ථානය හා සමග වඩාත් සීඝ්‍රයෙන් සම්බන්ධකම ඇති කර ගැනීමටද හැකි වේ.

අනිත් අතට පොදු ජන නැගිටීමක් සිතටනගා බලන්න. අපි මේ ගැන සිතා බලා, සූදනම් විය යුතු වෙමුයි සමහර විට දැන් සියළු දෙනාම එකඟ වනු ඇත. එහෙත් එය කරන්නේ කෙසේද? නැගිටීම සූදනම් කිරීම සඳහා සියළුම ප්‍රදේශවලට ඒජන්ත වරුන් පත් කර යැවීම ඇත්තෙන්ම මධ්‍යම කාරක සභාවට කළ නොහැකිය. අපට මධ්‍යම කාරක සභාවක් තිබුණත්, අද රුසියාවේ පවතින තත්වයන් යටතේ එවැනි පත් කිරීම් මගින් ලබා ගත හැකි කිසිම සේවයක් නොමැත. එහෙත් පොදු ප්‍රවෘත්ති පත්‍රයක් ආරම්භ කිරීමේදී හා බෙද හැරීමේදී ගොඩ නැගෙන එහි ඒජන්තවරුන්* ගේ සංවිධානයට, නැගිටීමක් සඳහා හඬ නැගෙන තෙක් 'වාඩි වී බලා සිටීමට සිදු නොවේ. නැගිටීමක් ඇතිවුව හොත් එය සාර්ථක වීමෙ හැකියාව ඉතාමත්ම ඉහළින් සහතික කිරීම පිණිස එයට නිති පතා කටයුතු කරගෙන යාහැකි වේ. නැගිටීමකදී ඉතා වැදගත් වන, වැඩ කරන ජනතාවගේ පුළුල් තම ස්ථරයන්ද සර්වබලධාරී ඒකාධිපතිත්වය සමග අප්‍රසාද වී සිටින සියළුම සමාජ ස්ථරයන්ද, සමග වූ අපගේ සම්බන්ධකම් එවැනි කටයුතු වලින් ශක්තිමත් වේ. විශේෂයෙන්ම, පොදු දේශපාලන තත්වය හරි ආකාර තක්සේරු කිරීමේ හැකියාවත්, ඒ අනුව නැගිටීම සඳහා නිසි වේලාව තෝරා ගැනීමේ හැකියාවත් නිපුණ කිරීම සඳහා එම කටයුතු විශේෂයෙන්ම ප්‍රයෝජනවත් වේ. සමස්ත රුසියාව උද්ඝෝෂණයට පත් කරන, එකම දේශපාලන ප්‍රශ්න, ගැටුම් හා සිදුවීම්වලට එක්වරම පිළිතුරු දීමටත්, එවැනි ගැටුම් සම්බන්ධයෙන් ඉතාමත් බලවත්, ඒකාකාර හා අවස්ථාවෝචිත ලෙස ප්‍රතික්‍රියාකාරී වීමටත්, සියළුම ප්‍රාදේශීය සංවිධාන පුහුණු කෙරෙන්නේද එවැනි කටයුතු වලින්මය; නැගිටීමක් යනු සමස්ත ජනතාවම ආණ්ඩුවට දෙන ඉතාමත් ශක්තිමත් ඉතාමත් ඒකාකාර හා ඉතාමත් අවස්ථාවෝචිත පිළිතුරය. අවසාන වශයෙන්, රුසියාවේ සැම තන්හිම ඇති, විප්ලවවාදී සංවිධාන වලට ඉතාමත් අඛණ්ඩ ලෙසත්, ඒ අතරම ඉතාමත් රහසි ගත ලෙසත්, අන්‍යොන්‍ය සම්බන්ධකම් පවත්වා ගැනීමට හා එමගින් සැබෑ පක්ෂ සමගිය ඇති කිරීමට අවශ්‍ය පුහුණුව ලැබෙන්නේද එවැනි කටයුතු වලින්මය. එවැනි සම්බන්ධකම් නොමැති කල, නැගිටීම සඳහා සාමූහික ලෙස සැලැස්ම සාකච්ඡා කිරීමත්, අවසාන අවස්ථාවේ ගත යුතු හා ඉතාමත් රහසි ගත ලෙස තබා ගත යුතු සූදනම් කිරීමේ පියවරයන් ගැනීමත් කිසිසේත් කළ නොහැකි වේ.

කොටින් කියතොත්, 'සමස්ත රුසියානු දේශපාලන ප්‍රවෘත්ති පත්‍රයන් සඳහා වූ සැලැස්ම' යනු (ඒ ගැන හොඳින් කල්පනා කර නොබැලූ අයට පෙනෙනු හැකි සේ) කිසිසේත් පොතේගුරුවාදී, පොත්ගුළු ස්වභාවයේ රෝග වැළඳුනු හාන්සි පුටු කාරක වරුන්ගේ ශ්‍රමය නියෝජනය කරන්නක් නොවේ. වහාම හා සැම පැත්තෙන්ම නැගිටීම සූදනම් කිරීම සඳහාත් ඒ අතරම එදිනෙද හදිසි වැඩ කටයුතු මොහොතකට හෝ අත් නොහැර කරගෙන යැම සඳහාත් ඉතාමත් ප්‍රායෝගික සැලැස්ම එයයි.

---

* අහෝ, අහෝ! මර්තිනව්ගේ ප්‍රජාතන්ත්‍රවාදී කන්වලට අමිහිරි 'ඒජන්තවරුන්' යන වචනය මෙහි ඇතුල්වීමට මා නැවතත් ඉඩදී තිබේ! මෙම වචනය ගැන හැත්තෑ ගණන්වල වීරයන් අමනාප නොවුයේ මන්ද යනුත්, අනූ ගණන්වල ආධුනිකයන් අමනාප වන්නේ මන්ද යනුත් කල්පනා කරමි. මා මෙම වචනයට කැමති වන්නේ සියළුම නියෝජිතයන්ගේ සිතුම් පැතුම් හා කටයුතු කැප කෙරෙන පොදු ව්‍යාපාරය එයින් පැහැදිලි ලෙස හා කාවදින ලෙස හැඟෙන හෙයිනි. ඒ වචනය වෙනුවට වෙනත් වචනයක් යෙදීමට මට සිදු වුවහොත් මා තෝරා ගන්නා එකම වචනය 'අනුග්‍රාහකවරුන්'යන වචනයයි. ඒද, කිසියම පොත් ගුළු ස්වභාවයක් හා නොපැහැදිලිතාවයක් එයින් ප්‍රකාශ නොවෙන තාක් දුරට පමණකි. අපට අවශ්‍යව තිබෙන්නේ ඒජන්ත වරුන්ගේ යුද්ධමය සංවිධානයකි. කෙසේ හෝ වේවා, 'අන්‍යොන්‍ය වශයෙන් සේනාපති කම් ප්‍රදානය කර ගැනීමේ' ඔවුන්ගේ ප්‍රියතම විනෝද ක්‍රීඩාවෙහි යෙදී සිටින නිමක් නැති (විශේෂයෙන් විදේශ ගත) මර්තිනව්ලාට 'විදේශ ගමන් බලපත්‍ර ඒජන්ත' කියනවාට වඩා 'විප්ලවවාදීන්ට විදේශ ගමන් බලපත්‍ර සැපයීමේ විශේෂ දෙපාර්තුමෙන්තුවේ අධිපති තැන' ආදී වශයෙන් කීමට ඉඩ ඇත.

අවසානය

රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතිහාසය පැහැදිලි කාල පරිච්ඡේද තුනකට බෙදිය හැකිය.

ඉන් ප්‍රථම කාල පරිච්ඡේදය දළ වශයෙන් 1884 සිට 1894 දක්වා වූ දශ වර්ෂය අයත් වේ. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ න්‍යාය හා වැඩ පිළිවෙළ මතුවී තහවුරු වූයේ මේ කාලයේදීය. රුසියාව තුළ වූ නව ප්‍රවණතාවයේ අනුගාමිකයන් ඉතා අල්ප විය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය පැවතියේ කම්කරු පංතියකින් තොරව ය. එය දේශපාලන පක්ෂයක් වශයෙන් පැවතියේ සංවර්ධනයේ බීජාංකුර අවධියේය.

දෙවැනි කාල පරිච්ඡේදයට 1894—1898 අවුරුදු තුන හතර අයත්ය. මෙම කාලය තුළ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සමාජ-ව්‍යාපාරයක් වශයෙන් පොදු ජන කොටස්වල උත්සන්නිය වශයෙන් හා දේශපාලන පක්ෂයක් වශයෙන් කළඑළි බැස්සේය. මෙය එහි ළමා හා යෞවන කාලය විය. නරෝද්නික්වාදයට විරුද්ධව අරගලය හා ජනතාව අතරට යාම සඳහා වූ විශාල පොදු උනන්දුවකින් බුද්ධිමත්හු පණගැන්වී සිටියහ; කම්කරුවෝ වැඩ වර්ජන සඳහා පොදු උනන්දුවක් දැක්වූහ. ව්‍යාපාරය දැවැන්ත පියවරක් තැබීය. නායකයන් බහුතරය, කිසියම් ස්වාභාවික සීමා රේඛාවක් මෙන් ඇන්.මිහයිලෝව්ස්කි මහතාට පෙනුනු 'අවුරුදු තිස් පහේ වයසට' වත් පැමිණ සිටියේ නැත. ඔවුන්ගේ යෞවනභාවය නිසා ඔවුහු ප්‍රායෝගික කටයුතු ගැන පුහුණුවක් නොමැතිව සිටි අතර, විශ්මයාකූල සීඝ්‍රතාවයකින් දර්ශන පථයෙන් ඉවත් වූහ. එහෙත් ඔවුන් වැඩි දෙනෙකුගේ ක්‍රියාකාරිත්ව පරිමානය ඉතා පුළුල් විය. ඉන් බොහෝ දෙනෙක් ඔවුන්ගේ විප්ලවවාදී සංකල්පනා ආරම්භ කර තිබුණේ "නරෝද්නය වෝලියා" සංවිධානයේ අනුගාමිකයන් ලෙසටය. ඔවුන් සියළු දෙනාම පාහේ ඔවුන්ගේ මුල් තරුණ කාලයේදී ත්‍රස්තවාදී වීරයන්ට උද්යෝගිමත් ලෙස නමස්කාර කළහ. එම වීර සම්ප්‍රදයන් පිළිබඳ මත්මත් කරවන හැඟීම් අත් හැරීමට අරගලයක් කිරීම අවශ්‍ය විය. නරෝද්නයා වෝල්යා සංවිධානයට අධිෂ්ඨාන සහගත ලෙස පක්ෂපාතව සිටි තරුණ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියාගේ මහත් ගෞරවයට පාත්‍රවූ අය සමග පෞද්ගලික සම්බන්ධකම් බිඳ දැමීමක්ද එම අරගලය හා සමග සිදුවිය. මෙම අරගලය හේතුකොට ගෙන, තම අධ්‍යාපනය දියුණු කර ගැනීමටත්, සෑම ප්‍රවණතාවයකම නීති විරෝධී පොත් පත් කියවීමටත්, නීත්‍යානුකූල නරෝද්නික්වාදයේ ප්‍රශ්න සමීප ලෙස අධ්‍යයනය කිරීමටත් තරුණ නායකයන්ට බල කෙරිණ. මෙම අරගලයෙන් පුහුණුව ලත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු ඔවුන්ගේ මහ දීප්තිමත් ලෙස හෙළි කළ මාක්ස්වාදී න්‍යාය හෝ සර්වබලධාරී ඒකාධිපතිත්වය පෙරළා දැමීමේ කර්තව්‍ය හෝ 'මොහොතකටවත්' අමතක නොකරම කම්කරු පංති ව්‍යාපාරයට වන්හ. මෙම කාළය තුළ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් කළ ඉතාමත් සිත් කාවදින හා අවසාන කටයුත්ත නම් 1898 වසන්තයෙදී පක්ෂය පිහිටුවීමය.[103]

තුන්වැනි කාල පරිච්ඡේදය, අප දුටු පරිද්දෙන් 1897 දී සූදනම් කරන ලදුව නිශ්චිත වශයෙන්ම 1898 දී (1898—?) දෙවැනි කාල පරිච්ඡේදයෙන් බෙදී වෙන් විය. මෙය අසමගියේ, විසිරීමේ හා වැනෙන සුලු භාවයේ කාල සීමාව විය. යෞවන කාලයේ තරුණයාගේ කට හඬ ගොරෝසු වේ. එමෙන්ම රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ හඬද වෙනස් වන්නට පටන් ගති. එක් අතකින් ස්ත්‍රුවේ හා ප්‍රකපෝවිච් මහතුන්ගේද බුල්ගාකව් හා බෙර්දියායිව් මහතුන්ගේද ලියවිලි වලිනුත්, අනිත් අතින් ව්. ඉ. ගේ හා එර්. එම්. ගේද, බී. ක්‍රිචෙව්ස්කි හා මර්තිනව්ගේද ලියවිලි මගිනුත් ව්‍යාජ රාවයක් නිකුත්වීමට පටන් ගති. එහෙත් ඔවුන් වෙන වෙනම ඉබාගාතේ ගොස් ආපස්සට ඇදුනු නායකයන්ය. ව්‍යාපාරය නොනැවතීම වැඩී ගිය අතර දැවැන්ත පියවර තබමින් පෙරට ගමන් ගත්තේය. නිර්ධන පංති අරගලය අළුත් කම්කරු ස්ථරයන් අතර පැතිර ගියේය. එය සමස්ථ රුසියාවෙහිම ව්‍යාප්ත විය. ඒ අතරම, ශිෂ්‍යයන් හා වෙනත් ජනතා කොටස් අතර ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණයද එයින් අනියම් ලෙසට පණ ගැන්විනි. එසේ වුවද සාංසිද්ධික උත්සන්නියේ පෘථුල භාවය හා බලවත් කම හමුවේ නායකයන්ගේ දේශපාලන විඥනය යටත් විය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර වෙනත් වර්ගයක ක්‍රියාකාරක වරුන් ප්‍රබලත්වයට පත්ව සිටියහ; එනම්, පොදු ජනතාවගේ සාංසිද්ධික ස්වභාවය විසින් වැඩි වැඩියෙන් නායකයන්ගේ විඥන භාවය අපේක්ෂා

කරනු ලැබූ තරමටම එය වඩ වඩාත් නොසෑහෙන තත්වයක පවතින බව ඔප්පු කළ, 'නීත්‍යානුකූල මාක්ස්වාදී' සාහිත්‍යයෙන් පමණක් නිතරම පුහුණුව ලැබූ අයයි. නායකයන් න්‍යායය සම්බන්ධයෙන්ද (විවේචනය කිරීමේ නිදහස) ව්‍යවහාරය සම්බන්ධයෙන්ද (පැරණි තාලය) පසුබා සිටියා පමණක් නොව, ඔවුන් සියළු ආකාරයේ මහා ලොකු තර්ක ඉදිරිපත් කරමින් ස්වකීය නොදියුණුකම නිවැරදි දෙයක් බව පෙන්වීමටද උත්සාහ ගත්හ. නීත්‍යානුකූල සාහිත්‍යයේ බ්‍රෙන්ටානො අනුගාමිකයින් හා නීති විරෝධී සාහිත්‍යයේ අන්තිමයන් විසින් සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය වෘත්තීය සමිති වාදයේ මට්ටමට පිරිහෙළන ලදී. "Credo" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. එය විශේෂයෙන්ම සිදුවූයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ 'පැරණිතාලේ ක්‍රම නිසා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නොවන විප්ලවවාදී ප්‍රවනතාවයන් පුනර්ජීවනයට පත්වූ කල්හිය.

''රබෝචිය දියල'' නැමැති පත්‍රයක් ගැන මා ප්‍රමාණය ඉක්මවා දීර්ඝ ලෙස කරුණු ඉදිරිපත් කර ඇතැයි යන විවේචනාත්මක හැඟීමක් පාඨකයාට ඇතිවන්නේ නම්, එම පත්‍රය තුන්වැනි කාල පරිච්ඡේදයේ 'ජීවගුණය' මහත් ප්‍රමුඛතාවයකින් පිළිබිඹු කළ හෙයින් එය 'ඓතිහාසික' වශයෙන් වැදගත් තත්වයකට පත්වූ බව මට කිව හැක.* අසමගිය හා වැනෙන සුලු භාවයත්, 'විවේචනයට', 'ආර්ථිකවාදයට' හා ත්‍රස්තවාදයට ඉඩ සැලසීමේ සූදනමත් නිසි ලෙස ප්‍රකාශ කිරීමෙහි සපන් වූයේ ස්ථිරත්වයක් දක්වන එර්. එම්. නොව නිතර වෙනස්වන ක්‍රිචෙව්ස්කිලා හා මර්තීනව්ලාය. මෙම කාල සීමාවේ ස්වභාව ලක්ෂණය වූයේ 'අත්තනෝමතියට' නමස්කාර කරන්නෙකු ප්‍රායෝගික වැඩ කෙරෙහි දක්වූ උඩඟු පිළිකුළ නොව සුළු දේ ගැන ආරාවුල් කිරීමේ පුරුද්ද හා සමග න්‍යාය ගැන දක්වන සැලකිල්ල ඒකාබද්ධ වීමයි. එය නිරූපනය වූයේ එකල සිටි වීරයන්ගේ 'විරාජිත පාඨ' එක එල්ලේ ප්‍රතික්ෂේප කිරීමට වඩා ඒවා දියාරු ස්වභාවයට පත් කිරීමෙනි. අංග සම්පූර්ණ ඒකීය න්‍යායක තත්වයෙන් වෙනස් වූ විද්‍යාත්මක සමාජවාදය, නිකුත් වූ සෑම අළුත් ජර්මන් පාඩම් පොතකම අන්තර්ගත දේ සමග 'නිදහස් ලෙස' සංකලනය කරන ලද පඹ ගාලක් බවට පත්විය. 'පංති අරගලය'යන සටන් පාඨය වඩාත් පුළුල් හා ධෛර්‍යමත් ක්‍රියාකාරිත්වය සඳහා උනන්දුව ජනිත කරවන්නක් නොව, 'ආර්ථික අරගලය අභේද්‍ය ලෙස දේශපාලන අරගලය හා සමග සම්බන්ධ වී තිබෙන' හෙයින් සමහන් කාරි ආලේපයක් බඳු දෙයක් බවට පත් විය. පක්ෂය පිළිබඳ අදහස විප්ලවවාදීන්ගේ සටන්කාමී සංවිධානයක් සඳහා කෙරෙන හඬ නැඟීමක් වශයෙන් නොගන්නා ලද අතර, කිසියම් ආකාරයක 'විප්ලවවාදී නිලධාරිවාදයක්' ද ප්‍රජාතන්ත්‍රවාදී ආකෘති හැදීමේ ළදරු ක්‍රීඩාවක යෙදීමද සාධාරන බව පෙන්වීමට උපයෝගී කරගන්නා ලදී.

තුන්වැනි කාල පරිච්ඡේදය කෙළවර වී (දූනට පෙරනිමිති ගණනාවකින්ම එහි සම්ප්‍රාප්තිය ප්‍රකාශයට පත්කර ඇති) හතරවැනි කාල පරිච්ඡේදය ආරම්භ වන්නේ කිකලදැයි අපි නොදනිමු. අපි ඉතිහාසයේ ක්ෂේත්‍රයේ සිට, වර්තමානයේ ක්ෂේත්‍රයට අර්ධ වශයෙන් අනාගතයේ ක්ෂේත්‍රයටද සංක්‍රමණය වෙමින් සිටිමු. එසේ වුවත්, හතරවැනි කාල පරිච්ඡේදයේදී සටන්කාමී මාක්ස්වාදය තහවුරු වීමට මඟ හෙළි වෙතියිද, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පූර්ණ පෞරුෂත්වය මල් ගනිමින් එය අර්බුදයෙන් ගොඩ එතියිද, අවස්ථාවාදී පසු බල ඇණිය 'වෙනුවට' ඉතාමත් විප්ලවීය පංතියේ සැබෑ පෙරමුණු බලඇණියක් 'ආදේශ කෙරෙතියිද අපි තදින්ම විශ්වාස කරමු.

එවැනි 'ආදේශ කිරීමක්' සඳහා හඬ නැගීමේ අර්ථයෙන්ද ඉහත විස්තර කරන ලද කරුණු පිඩුකොට දැක්වීමක් වශයෙන්ද, කළ යුත්තේ කුමක්ද යන ප්‍රශ්නයට මෙසේ උත්තර දෙමු.

තුන්වැනි කාල පරිච්ඡේදය කෙළවර කරමු.

---

* ජර්මන් ප්‍රස්ථාව පිරුළ මගින් මට පිළිතුරු දිය හැක. Den Sack schlägt man, den Esel meint man, ඔබ තලන්නේ ගෝනියට නමුත් අදහස් කරන්නේ බූරුවාට තැලීමය. ''රබෝචිය දියල'' පමණක් නොව ප්‍රායෝගික කාරකවරුන්ගෙන් යුත් පුළුල් ජනකායක් හා න්‍යායවාදීන්ද මෝස්තරයක් වී පැවැති 'විවේචනය' සමග පාවී ගියහ; සාංසිද්ධිකතාවය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් අවුලට පත් වෙමින්, අපගේ දේශපාලන හා සංවිධාන කර්තව්‍ය වලදී සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයේ සිට වෘත්තීය සමිතිවාදී සංකල්පයට ඇද හැලෙමින් සිටියහ.

පරිශිෂ්ටය

“ඉස්ක්‍රා” පත්‍රය “රබෝචිය දියල” පත්‍රය හා සමග එක්සත් කිරීමේ පරිශ්‍රමය

“රබෝචිය දියල” පත්‍රය සමග වූ ස්වකීය සංවිධානමය සම්බන්ධකම් වලදී ‘ඉස්ක්‍රා’ පත්‍රය පිළිගත් හා ස්ථිර ලෙස අනුගමනය කළ උපක්‍රම ගැන විස්තර කිරීම අප විසින් කළ යුතුව තිබේ. ‘විදේශගත රුසියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ භේදය’ යන හිසින් යුක්තව “ඉස්ක්‍රා” අංක 1 පත්‍රයේ පළ කරන ලද ලිපියෙන් මෙම උපක්‍රම සම්පූර්ණයෙන්ම ප්‍රකාශ කෙරිනි. ආරම්භයේ පටන්ම අප පිළිගත් අදහස වූයේ, අප පක්ෂයේ විදේශගත නියෝජිතයන් වශයෙන් එහි ප්‍රථම සම්මේලනයේදී පිළිගන්නා ලද සැබෑ ‘විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය’ සංවිධාන දෙකක් වන සේ භේදවී තිබුණු බවය; භේද වූ විදේශගත සංගමයේ කොටස් දෙකෙන් එකකින් එක් අයෙකු බැගින් සාමාජිකයින් දෙදෙනෙකු, ජාත්‍යන්තර සමාජවාදී බියුරෝ සභාව[104] තුළ රුසියාව නියෝජනය කිරීමට පැරිසියේ ජාත්‍යන්තර සම්මේලනයේදී තෝරා පත් කිරීමෙන් තාවකාලිකව හා කොන්දේසි සහිතව පමණක් බේරුම් කරන ලද පක්ෂයේ නියෝජිතත්වය පිළිබඳ ප්‍රශ්නය විවෘතව පැවැතුනු බවය. “රබෝචිය දියල” මූලික වශයෙන්ම වැරදි සහිත බව අපි ප්‍රකාශ කළෙමු. ප්‍රතිපත්තියක් වශයෙන් අපි තදින්ම ශ්‍රම විමුක්ති කණ්ඩායමේ පැත්ත ගෙන, ඒ අතරම, භේදයේ විස්තර කරුණු සාකච්ඡාවට සහභාගි වීම ප්‍රතික්ෂේප කළෙමු; එමෙන් ම හුදු ප්‍රායෝගික වැඩ පිළිබඳ ක්ෂේත්‍රයෙහිදී විදේශගත සංගමයෙන් ඉටුවූ සේවයද සටහන් කර ගත්තෙමු.*

---

* භේදය සම්බන්ධයෙන් වූ අපගේ නිගමනය පදනම් වූයේ එම කාරණය පිළිබඳ සාහිත්‍යය අධ්‍යයනය කිරීම මත පමණක් නොව අපගේ සංවිධානයේ සාමාජිකයන් කීප දෙනෙක් විදේශයේදී එක් රැස් කරගත් තොරතුරුද මතය.

ඒ අනුව එක්තරා දුරකට අපගේ ප්‍රතිපත්තිය වූයේ ප්‍රමාදවී සිටීමය. විදේශගත සංගමය, න්‍යාය හා ව්‍යාපාරය පිළිබඳ මූලික ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් ප්‍රකාශිත ස්වාධීන ස්ථාවරයක් නොගනිමින්, එය ප්‍රතිපත්තියක් වශයෙන් “ශ්‍රම විමුක්ති කණ්ඩායම” සමග එකඟ වන බව නිතර නිතර ප්‍රකාශ කර තිබුන හෙයින් ආර්ථිකවාදයේ ඉතාමත් අධිෂ්ඨාන සහගත ප්‍රතිපාක්ෂිකයන්ට එම “සංගමය” සමග අතිනත් ගෙන කටයුතු කළ හැකිය යනුවෙන් වූ රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් බහුතරය අතර බලපැවැත්වූ අදහසට අප ඉඩ දුන්නෙමු. “ඉස්ක්‍රා” පත්‍රයේ (1900 දෙසැම්බර්) පළමුවන කලාපය නිකුත්වීමත් හා සමග මෙන්ම, “සංගමයේ” සාමාජිකයන් තිදෙනෙක් ඉන් වෙන්වී, ඊනියා ‘මූලාරම්භකයන්ගේ කණ්ඩායම’ නමින් සකස්වී 1) “ඉස්ක්‍රා” සංවිධානයේ විදේශ කොටසත්, 2) විප්ලවවාදි “සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා”[105] සංවිධානයත්, 3) ‘සංගමය’ ත් අතර සමගි සංධානයක් ඇතිකර ගැනීමට සාකච්ඡා පැවැත්වීම පිණිස මැදිහත් වන්නන් ලෙස කටයුතු කිරීම සඳහා ඔවුන්ගේ සේවය ප්‍රදානය කිරීමට ඉදිරිපත් වීමෙන් අපගේ ස්ථාවරයෙහි නිරවද්‍යතාවය අනියමින් ඔප්පු විය. මෙයින් මුල් සංවිධාන දෙක ස්වකීය එකඟත්වය එක්වරම ප්‍රකාශයට පත් කළහ. ඉන් තුන් වැන්න, යෝජනාව ප්‍රතික්ෂේප කළේය. පසුගිය අවුරුද්දේ පවත්වන ලද ‘සමගි’ සම්මේලනයේදී[106], කථිකයෙක් මෙම කරුණු විස්තර කළ අවස්ථාවේදී ‘සංගමයේ’ පාලන කාරක සභාවේ සාමාජිකයෙක් ඒ ගැන කථා කරමින් එම ප්‍රතික්ෂේප කිරීමට මුථමනින්ම හේතු වූයේ මූලාරම්භකයන්ගේ කණ්ඩායම සකස් වී තිබුණු ආකාරය ගැන විදේශගත සංගමය නොසතුටු වූ නිසායයි කී බව ඇත්තය. මෙම පැහැදිලි කිරීම ගෙනහැර දක්වීම මගේ යුතුකමක් ලෙස මා සලකන නමුත් එය අසතුටුදායක පැහැදිලි කිරීමක් බව නිරීක්ෂණය කිරීමෙන් මට වැලකී සිටිය නොහැක. සංවිධාන දෙකක් සාකච්ඡාවලට එකඟ වූ බව දත් විදේශගත ‘සංගමයට’ වෙනත් මැදිහත් වන අයෙක් මගින් හෝ කෙළින්ම එම සංවිධානවලට හෝ තම අදහස දන්විය හැකිව තිබුණි.

1901 වසන්තයේදී “සර්යා” (අංක 1, අප්‍රේල්) සහ “ඉස්ක්‍රා” (අංක 4, මැයි) යන පත්‍ර දෙකම “රබෝචිය දියල” පත්‍රය සමග විවෘත විවාදයට බටහ. “ඉස්ක්‍රා” පත්‍රය විශේෂයෙන්ම පහර දුන්නේ “රබෝචිය දියල” පත්‍රය එහි අප්‍රේල් අතිරේකයෙහි පළ වුනු, වසන්තයේ සිදුවීම් වලින් පසුව ත්‍රස්තය පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් එහි අස්ථිරත්වය විහිදු දැක්වූ හා ඒ කාලයේ බොහෝ දෙනෙකු මුළා වීමට හේතු භූත වුනු එමෙන්ම ‘ලේ’ ඉල්ලා හඬ නැගූ ‘ඓතිහාසික

නව නැම්මක්' යන මාතෘකාවෙන් යුත් ලිපියටය. විවාද එසේ තිබියදී, සමගි සන්ධානයක් ඇති කර ගැනීම සඳහා අළුත් 'බෙරුම්කාරීන්' කණ්ඩායමක[107] උපකාරයෙන් යාළිත් සාකච්ඡා ඇරඹීමට 'සංගමය' එකඟ විය. ඉහත සඳහන් කරන ලද සංවිධාන තුනෙහි නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් ජූනි මාසයේ පැවැත්වුනු ප්‍රාථමික සම්මේලනයකදී ඇතිකරගත් ඉතාමත් විස්තර සහිත 'ප්‍රතිපත්ති පිළිබඳ එකඟත්වය' පදනම් කරගෙන කෙටුම්පත් ගිවිසුමක් සකස් කරන ලදින්, එය විදේශගත 'සංගමය' විසින් 'සම්මේලන දෙකක්' යන පොතෙහිද 'සමගි සම්මේලනයේ ලියවිලි' යන පොතෙහිද පළකරන ලදී.

දක්නට ලැබෙන සෑම අවස්ථාවාදයක්ම, විශේෂයෙන්ම රුසියානු අවස්ථාවාදය ඉතාමත්ම තීරණාත්මක ලෙස ප්‍රතික්ෂේප කළ යුතු බව එක්සත්වීම සඳහා අනිවාර්‍ය කොන්දේසියක් හැටියට අප ඉදිරිපත් කළේය යන්න ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වූ (ජූනි සම්මේලනයේ යෝජනා වශයෙන් බොහෝ විට හඳුන්වනු ලබන) එකඟත්වයෙන් මනාව පැහැදිලි වේ. එහි පළමුවැනි ඡේදයෙන් මෙසේ කියවේ "නිර්ධන පංති අරගලය තුළට අවස්ථාවාදය ඇතුළත් කිරීම සඳහා දරන සියළුම ප්‍රයත්නයන්ට අපි විරුද්ධ වෙමු. මෙම ප්‍රයත්න ඊනියා ආර්ථිකවාදයෙන්ද, බර්න්ෂ්ටයින්වාදයෙන්ද මිලෙරන් වාදයෙන්ද ප්‍රකට වී ඇත". "විප්ලවවාදී මාක්ස්වාදයේ ප්‍රතිපාක්ෂිකයන් සියල්ලන්ටම විරුද්ධව කරන දෘෂ්ටිමය අරගලයද... සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු ක්ෂේත්‍රයට ඇතුළත් වේ." (4, සී) "රුසියානු නිර්ධන පංතියේ හදිසි කර්තව්‍ය වන්නේ සර්වබලධාරී ඒකාධිපතිත්වය පෙරලා දැමීමය යන්න සංවිධානමය හා උද්ඝෝෂණික කටයුතුවල සෑම ක්ෂේත්‍රයකදීම සමාජ ප්‍රජාතන්ත්‍රවාදය විසින් කිසි කලෙකත් මොහොතකට හෝ අමතක නොකරනු ලැබිය යුතුය. (5, ඒ) "...වැටුප් ශ්‍රමය හා ධනය අතර සැමද අරගලය මත පදනම් වූ අරගලය පමණක් නොවේ." (5, බී) "පිරිසිදු ආර්ථික අරගලයක හා අර්ධ දේශපාලන ඉල්ලීම් සඳහා අරගලයක... අවධියක් තිබෙන බව අප පිළිගන්නේ නැත" (5,සී) "ව්‍යාපාරයේ පහළ සංවිධාන ආකෘතිවල සරල ස්වභාවය... හා පටු ස්වභාවය ප්‍රතිපත්තියක් බවට පරිවර්තනය කර ගැනීමේ ප්‍රවණතාවයක් විවේචනය කිරීම ව්‍යාපාරයට වැදගත් වන බව අපි සලකන්නෙමු." (5, ඩී) මෙම යෝජනා එල්ල කර තිබෙන්නේ මොහොතකට හෝ සර්වබලධාරී ඒකාධිපතිත්වය අමතක කළ අවධි පිළිබඳ න්‍යායය පිළිගත්, පටු ස්වභාවය ප්‍රතිපත්තියක මට්ටමට නංවාගත්, ආදී වූ අවස්ථාවාදීන්ට හා 'ආර්ථික වාදීන්ට' විරුද්ධව බව ඒවා මද අවධානයකින් හෝ කියවූ පසු, ඒවා සකස් කර තිබෙන ආකාරයෙන්ම, සම්පූර්ණ පිටස්තරයෙකුට වුවද තේරුම් යනු ඇත. මෙම යෝජනා වලින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ "රබෝචිය දියල" පත්‍රය කළ ඒ වැරදිම බව, එම පත්‍රයට විරුද්ධව 'ශ්‍රම විමුක්ති' කණ්ඩායමත්, "සර්යා" හා "ඉස්ක්‍රා" පත්‍රත් ගෙන ගිය විවාදය ගැන ඉතාමත් ස්වල්ප වශයෙන් හෝ දන්නා ඕනෑම කෙනෙකුට මොහොතකට හෝ නොඅදහා සිටිය හැකි තත්වයක් ඇතිවිය නොහැක. "රබෝචිය දියල" අංක 10 පත්‍රයේ පළ කළ ලිපි ලිවීමට හේතු වූයේ විදේශගත 'සංගමයේ' නව 'ඓතිහාසික නැම්මක්' නිසා නොවන බවත්, යෝජනාවල* අතිශය අනියත ස්වභාවය නිසා බවත්, විදේශගත සංගමයේ සාමාජිකයෙක් 'එක්සත් සම්මේලනයේදී ප්‍රකාශ කිරීමටත්, සත්ත කරමින් කියන ලද එම ප්‍රකාශයට එක් කථිකයෙක් යුක්ති යුත්ත ලෙස සමච්චල් කිරීමටත් යෙදුනේ එනිසාය. එම යෝජනා කෙසේවත් අනියත නොවන අතර ඒවා ඇදහිය නොහැකි තරම් නියත ස්වභාවයක් දරන බවත් ඒවායින් 'යම් කිසිවෙකු අල්ලා ගැනීමට තැත් කෙරෙන' සැටියක් කෙනෙකුට බැලූ බැල්මට පෙනෙන බවත් එම කථිකයා කීවේය.

මෙම කීම නිසා, සම්මේලනයේ ඇතිවූයේ ස්වභාව-නිරූපී සිදුවීමකි. එක් අතකින් "අල්ලා ගැනීම" යන වචන දිව පැටලීමෙන් අපගේ නපුරු බලාපොරොත්තු ('උගුලක් ඇටවීම') හෙළිදරව් විනියයි සිතාගෙන 'ඔවුන් අල්ලා ගැනීමට උත්සාහකරන්නේ කවුරුද" යි ක්‍රිචේව්ස්කි ශෝකාත්මක ලෙස වේග ස්වරයෙන් ඇසීය... "ඇත්තෙන්ම කවුද" යි කියමින් ප්ලෙහානව් උපහාසාත්මක ලෙස පිළිතුරු දුන්නේය. "ප්ලෙහානව් සහෝදරයාට විනිවිද දක්නා බුද්ධිය නොමැති නිසා ඔහුට ආධාර වන්නෙමු"යි කී ක්‍රිචේව්ස්කි "උගුල අටවන ලද්දේ "රබෝචිය දියල" කර්තෘ මණ්ඩලය ඇල්ලීමටය [සියල්ලෝම සිනාසෙති] එහෙත් අපි අසු නොවන්නෙමු" යි පිළිතුරු දුන්නේය. (වම් පැත්තෙන් අදහසක්: ඔබට එහෙම වෙලා මදි")! අනිත් අතට (බේරුම්කාරයින්ගේ කණ්ඩායමක් වූ) 'බර්බා' කණ්ඩායමේ සාමාජිකයෙක්, විදේශගත 'සංගමය' ඉදිරිපත් කළ යෝජනා සංශෝධන වලට විරුද්ධ වෙමින් අපගේ කථිකයා රැකීමේ අදහසින් 'අල්ලා ගැනීම' යන වචනය විවාදයේ උනුසුම මැද්දේ අහම්බෙන් කියවුනක් බව පැහැදිලි යයි ප්‍රකාශ කළේය.

---

* මෙම සත්ත කළ ප්‍රකාශය "සම්මේලන දෙකක්" හි යළිත් දක්වා ඇත, පිටු 25.

මෙම 'රැකීම' සම්බන්ධයෙන් එම වචනය කී කථිකයා සතුටු නොවනු ඇතැයි මම මගේ පැත්තෙන් කියනු කැමැත්තෙමි. මා කල්පනා කරන්නේ 'යම් කිසිවෙකු අල්ලා ගැනීමට තැත්කරන' යන වචන විහිළුවෙන් කියන ලද සැබෑ වචන බවයි. වැනෙන සුලු භාවය ගැන අප නිතරම "රබෝචිය දියල" පත්‍රයට චෝදනා කර ඇත්තෙමු. ඒ අනුව එහි වැනෙන සුලු භාවය කෙළවරක් කිරීමට එය අල්ලා ගැනීම අපට අවශ්‍ය විය. මෙහි නපුරු බලාපොරොත්තුවක සේයාවක්වත් නොවීය. එසේ කියන්නේ අප සාකච්ඡා කරමින් සිටියේ ප්‍රතිපත්තිවල අස්ථිර භාවය ගැනම වන හෙයිනි. එපමණක් නොව අපි විදේශගත 'සංගමය' 'අල්ලා ගැනීමට' සමත් වීමු. එය කොතරම් සහෝදරාත්මක ලීලාවකින්* කරන ලද්දේද යත්, එම සංගමයේ පාලක කාරක සභාවේ තවත් සාමාජිකයෙකු සමග ක්‍රිචෙව්ස්කිම ජූනි යෝජනා වලට අත්සන් තැබීය.

ග්‍රීෂ්ම සෘතුව හා සරත් සෘතුව අතර තුර කාලයේදී විදේශගත සංගමය තුළ නව නැම්මක් ඇතිවූ බව "රබෝචිය දියල" අංක 10 ලිපිවලින්, (අප සහෝදරවරු ප්‍රථම වතාවට සම්මේලනයට පැමිණීමෙන් පසුව,රැස්වීම පටන් ගැනීමට දින කීපයකට පෙර ය) මනාසේ පැහැදිලිව පෙනින. ආර්ථිකවාදීන් නැවතත් බලයට පත්වූහ. ඒ අනුව, සෑම සුලං රැල්ලක් සමගම නැමී ගිය කර්තෘ මණ්ඩලය නැවතත් 'ඉතාමත් ප්‍රකට බර්න්ෂ්ටයින්වාදීන්' හා විවේචනය කිරීමේ නිදහස' ආරක්ෂා කිරීමටත්, 'සාංසිද්ධික තාවය' ආරක්ෂා කිරීමටත් අපගේ දේශපාලන බලපෑම (එම බලපෑම වඩාත් සංකීර්ණ කිරීමේ ප්‍රකාශිත අරමුණ ඇතිව) පිළිබඳ ක්ෂේත්‍රය 'සීමා කිරීමේ න්‍යාය' මර්තීනව්ගේ කටින් දේශනා කරවීමටත්, කටයුතු ආරම්භ කර තිබේ. නිවැරැදි බව ඔප්පු කර තිබෙන සාමාන්‍ය නීතියකින් අවස්ථාවාදියෙක් අල්ලා ගැනීම දුෂ්කරය යනුවෙන් වූ පාර්වුස්ගේ උචිත නිරීක්ෂණය නැවත වරක් යෙදේ. අවස්ථාවාදය යනුවෙන් අදහස් කෙරෙන්නේ නිශ්චිත හා ස්ථිර ප්‍රතිපත්ති නොමැතිකමම වන හෙයින්, අවස්ථාවාදියෙක් ඕනෑම සාමාන්‍ය නීතියකට කැමැත්තෙන් සිය නම අත්සන්කර එසේම කැමැත්තෙන් එය අත්හැර දමයි. අද අවස්ථාවාදීන් අවස්ථාවාදය ඉදිරිපත් කිරීමට දරන සියළු ප්‍රයත්නයන් ප්‍රතික්ෂේප කර ඇත; සියළු ආකාරයේම පටු ස්වභාවය ප්‍රතික්ෂේප කිරීමටත්, 'සර්වබලධාරී ඒකාධිපතත්වය පෙරළා දැමීමේ කර්තව්‍ය ගැන මොහොතකට හෝ අමතක නොකිරීමට'ත් වැටුප් ශ්‍රමය හා ධනය අතර දිනපතා අරගලය පමණක් පදනම වශයෙන් නොගෙන උද්ඝෝෂණය'ගෙනයාමටත් උදුරම් ලෙස පොරොන්දුවීම ආදිය කර ඇත. එහෙත් හෙට ඔවුන්ගේ කරුණු ප්‍රකාශ කිරීමේ විධිය වෙනස් කරමින් සාංසිද්ධික තාවයත්, නිරස සැමදු අරගලයේ ඉදිරි ගමනත් ආරක්ෂා කිරීම හා ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකි ඉල්ලීම් හුවා දැක්වීම යනාදිය දඩමීමා කරගෙන ඔවුන්ගේ පරණ ප්‍රයෝග නැවතත් ක්‍රියාත්මක කරනු ඇත. අංක 10 කලාපයේ පළ කරන ලද ලිපි නිසා 'සම්මේලනයේදී අනුමත කරගන්නා ලද පොදු ප්‍රතිපත්ති කෙරෙන් කිසිම මිථ්‍යා දෘෂ්ටික අපගමනයක් වන බව විදේශගත සංගමය දුටුවේ හෝ දැනුදු දක්නේ හෝ නැතැ'යි (සම්මේලන දෙකක් පිටු 26) තව දුරටත් සත්ත කර ප්‍රකාශ කිරීමෙන් සිදු වන්නේ, අසමථයන්ට හේතු වූ වැදගත් කරුණු වටහා ගැනීමට විදේශගත 'සංගමයේ' සම්පූර්ණ නොහැකියාව නැතහොත් නොකැමැත්ත හෙළිදරව් වීම පමණකි.

"රබෝචිය දියල" පත්‍රයේ 10 වැනි කලාපයෙන් පසුව අපට දැරිය හැකිව තිබුණේ එකම ප්‍රයත්නයක් පමණකි. එයනම්, එහි ලිපි සමග හා කර්තෘ මණ්ඩලය සමග 'සංගමයේ' සියළුම සාමාජිකයන් එකඟ වී දැයි නිශ්චය ලෙස දැන ගැනීම පිණිස විවෘත පොදු සාකච්ඡාවක් ඇති කිරීමයි. 'සංගමය' විශේෂයෙන්ම මේ නිසා අප සමග අමනාප වී තිබේ. එනිසා, එහි සාමාජිකත්වය තුළ අසමගිය ඇති කිරීමට තැත් කිරීම හා අන් අයගේ කටයුතු වලට ඇඟිලි ගැසීම ආදිය ගැන එය අපට චෝදනා කරයි. මෙම චෝදනාව පදනම් විරහිත බව පැහැදිලිය. හමායන සෑම සිහින්තම සුලං රැල්ලක් සමගම

---

* රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය, පොදු වශයෙන් නිතරම "ශ්‍රම විමුක්තියේ" මූල ධර්ම වලට අනුකූලව ක්‍රියාකළ බවද ප්‍රකාශක හා සංවිධානාත්මක ක්‍රියාකාරිත්වය "සංගමයෙහි" ඵලදායක කටයුත්තක් වූ බවද අපි ජූනි යෝජනාවල සංඥපනයෙහි සඳහන් කළෙමු. වෙනත් වචන වලින් කියතොත්, පසුගිය කාලය අමතක කිරීමටද; "අල්ලා ගැනීමේ" මාර්ගයෙන් අපි එළිකළ වැනෙනසුලු භාවය සම්පූර්ණයෙන්ම නවත්වන බවට වූ කොන්දේසිය යටතේ "සංගමයේ" අපේ සගයින්ගේ වැඩ කටයුතු පිළිගැනීමටද (සත් ව්‍යාපාරය සඳහා) අපි සූදනම් බව සඳහන් කළෙමු. ජූනි යෝජනා කියවූ ඕනෑම යුක්තිගරුක මිනිසෙක් ඒවා ඒ අනුව පමණක් තේරුම් ගනු ඇත. දැන් "සංගමය" ආර්ථිකවාදය කරා කරා වූ තම නව නැම්ම (අංක 10 ලිපියෙහි සහ සෝදු පත්‍රයෙහි) නිසා කඩාගෙන යෑම සිදුවූ පසු ඔවුන්ගේ ඵලදායි වැඩකටයුතු පිළිබඳ අපේ එම වචන අසත්‍ය බවට ("සම්මේලන දෙකක්" 30 පිටුව) උත්සවාකාර ලෙස අපට චෝදනා කරන්නේ නම්, එවැනි චෝදනාවක් ඇත්ත වශයෙන්ම සිනහ උපදවීමට පමණක් සමර්ථ වේ.

'නැමීයන' තෝරා පත්කළ කර්තෘ මණ්ඩලයක් සිටිනකල සියළු දෙයක්ම රඳා පවතින්නේ සුලභ හමන පැත්ත මතය. එක්සත් වීමට බලාපොරොත්තු වන සංවිධානවල සාමාජිකයන් හැර, වෙනත් කිසිවෙක් පැමිණ නොසිටි අප්‍රසිද්ධ රැස්වීම් වලදී, මෙම සුලං හමන පැත්ත අපි පැහැදිලි කළෙමු. විදේශගත 'සංගමයේ' නාමයෙන් ජූනි යෝජනා වලට ඉදිරිපත් කෙරුණු සංශෝධනයන් කරනකොට ගෙන සමගියක් වෙත එළඹීම සම්බන්ධයෙන් තිබුණු බලාපොරොත්තුවක් පිළිබඳ අන්තිම සේයාවද ඉවත් විය. ආර්ථිකවාදය වෙතට යොමු වූ නව නැම්ම හා 'සංගමයේ' සාමාජිකයන් බහුතරය ''රබෝචිය දියල'' අංක 10 සමඟ එකඟ වන බව ඔප්පු කරන ලිඛිත සාක්ෂියක් වශයෙන් මෙම සංශෝධන ගත හැකිය. ආර්ථික වාදයේ ප්‍රකට ස්වභාවයන් ගැන කෙරෙන සඳහනෙන්, 'ඊනියා ආර්ථිකවාදය' යන වචන (ඒවායේ අර්ථය නොපැහැදිලි යයි කියා) ඉවත් කිරීමටත් (එසේ නොපැහැදිලි නම් කළ යුතුව තිබුණේ මෙම පුළුල් ලෙස පැතිරී ගිය වරදෙහි වඩාත් පැහැදිලි විස්තරයක් දීම පමණකි) 'මිලෙරන් වාදයත් යන වචන (''රබෝචිය දියල'' අංක 2—3, පිටු 83—84 න් හා ඊටත් වඩා විවෘත ලෙස එයට පක්ෂව ක්‍රිචෙව්ස්කි "Vorwärts"* හි ලියා තිබුණේත්) ඉවත් කිරීමටත් යෝජනා කරන ලදී. සෑම ආකාරයකම, දේශපාලන, ආර්ථික හා සමාජ පීඩනයන්ට විරුද්ධව නැග එනු පෙනෙන සෑම නිර්ධන පංති අරගලයකටම මග පෙන්වීම හා දක්නට ලැබෙන අරගල සියල්ලෙහිම ක්‍රමානුකූලතාවයක් හා සමගියක් එමගින් ඇතිකරන ලෙස හඬ නැගීම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍ය වන බව ජූනි යෝජනාවල ස්ථිරවම සඳහන් කර තිබුණේ වී නමුත්, විදේශගත 'සංගමය' ''ආර්ථික අරගලය පොදු ජන ව්‍යාපාරයට බලවත් උනන්දු කාරකයක් වේ'' යන සම්පූර්ණයෙන්ම අනවශ්‍ය වචන එකතු කළේය (තනිවශයෙන් ගත් කළ මෙම ප්‍රකාශයෙහි වරදක් දක්විය නොහැකි නමුත්, පටු ආර්ථිකවාදය පවත්නා කල එය නියත වශයෙන්ම බොරු අර්ථ නිරූපනයන් කිරීමට හේතුවනු ඇත). එපමණක් නොව, (සර්වබලධාරී ඒකාධිපතිත්වය පෙරළා දැමීමේ

---

* මෙම විෂය ගැන "Vorwärts" පත්‍රයේ වර්තමාන කර්තෘ වන කෞට්ස්කි හා සර්යා පත්‍රයේ කර්තෘ මණ්ඩලය අතර විවාදයක් ආරම්භ විය. මෙම මතභේදය ගැන රුසියනු කියවන්නාට කරුණු දැක්වීමට අමතක නොකරන්නෙමු.[108]

අරමුණ අමතක කිරීම) 'මොහොතකට හෝ' (නොකළ යුතුය) යන වචන ලොප් කිරීමෙන් හා 'පොදු ජනතාව ක්‍රියාශීලී දේශපාලන අරගලයට ඇදගැනීම සඳහා ඉතාමත් පුළුල් ලෙස යොදගත හැකි මාධ්‍යය ආර්ථික අරගලය වේ' යන වචන එකතු කිරීමෙන් 'දේශපාලනය' එක එල්ලේම අවහිර කොට තැබීම ජූනි යෝජනාවලට ඇතුළත් කිරීමේ අදහස පවා ඉදිරිපත් කරන ලදී. මෙම සංශෝධන ඉදිරිපත් කිරීමෙන් පසුව තව දුරටත් කථා කිරීම අපගේ පැත්තේ කථිකයන් එක දිගටම ප්‍රතික්ෂේප කළහ. නැවතත් ආර්ථිකවාදය වෙත හැරෙමින් සිටින, ඒ මේ අත වැනීම සඳහා නිදහස ලබාගැනීමට උත්සාහ කරන අය සමග තවත් සාකච්ඡා කිරීමෙන් ප්‍රයෝජනයක් නොවන බව ඔවුහු කල්පනා කළහ.

'''ඉස්ක්‍රා'' පත්‍රය එකඟත්වයට බාධකය වශයෙන් සැලකුවේ, අපගේ අනාගත පැවැත්ම සඳහා Sine qua non (නැතිවම බැරි) දෙයක්වන ''රබෝචිය දියල'' පත්‍රයේ ස්වාධීන අංග ලකෂණ හා ස්වෛරී භාවය පවත්වා ගැනීම මයි' (සම්මේලන දෙකක්, පිටු 25). මෙය ඉතාමත් සාවද්‍ය කියමනකි. ''රබෝචිය දියල'' පත්‍රයේ ස්වෛරී භාවයට* විරුද්ධ අරමුණක් අප තුළ කිසි කලෙකත් තිබුණේ නැත. එහෙත් 'ස්වාධීන අංග ලක්ෂණ' යනුවෙන් අදහස් කරන්නේ න්‍යාය හා ව්‍යවහාරය සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිමය ප්‍රශ්න ගැන වූ ස්වාධීනත්වය නම් එවැනි ස්වාධීන අංග ලක්ෂණ පිළිගැනීම අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමු. අප පෙන්වාදී තිබෙන පරිදි, ව්‍යවාහාරික වශයෙන් නිතරම මෙම ස්වාධීන අංග ලක්ෂණවල අර්ථය වන්නේ අප අතර පවතින අසමගිය වැඩි දියුණු කරන හා පක්ෂ අදහස අනුව නොඉවසිය හැකි නොයෙක් ආකාර වැනෙන සුළු තත්වයන් ගැනීම වන හෙයින් එවැනි ස්වාධීන අංග ලක්ෂණ බලවත් ලෙස ප්‍රතික්ෂේප කිරීමත් ජූනි යෝජනාවල අඩංගුය. එහි සංශෝධන හා සමග ගත්කල ''රබෝචිය දියල'' පත්‍රය එහි දහවැනි කලාපයේ පළ කළ ලිපි වලින් පෙනී ගියේ මෙම ආකාරයේ ස්වාධීන අංග ලක්ෂණ තබා ගැනීමට එය කැමතිබවයි. එවැනි කැමැත්තක් නිසා ස්වභාවික වශයෙන්ම භේදයක් ඇතිවීමටත්, යුද්ධ ප්‍රකාශයකටත් මඟ විවෘත

---

* මෙසේ වන්නේ ඒකාබද්ධ සංවිධාන සඳහා ඒකාබද්ධ උත්තර මණ්ඩලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කර්තෘ මණ්ඩලය මගින් තොරතුරු විමසීම සෛවරී භාවය සීමා කිරීමක් ලෙස නොසලකතොත්ය. එහෙත් ජූනි මාසයේදී ''රබෝචිය දියල'' පත්‍රය මීට එකඟ විය.

විනි. එසේ වුවද, “රබෝචිය දියල” නිශ්චිත සාහිත්‍යමය කර්තව්‍යයන් කෙරෙහි අවධාරනය යොද කටයුතු කිරීමේ අර්ථයෙන් එහි ස්වාධීනත්වය පිළි ගැනීමට අපි සියළු දෙනාම සූදනම්ව සිටියෙමු. මෙම කාර්යයන් නිසි ලෙස බෙද හැරීම සඳහා 1) න්‍යායික සඟරාවක්; 2) දේශපාලන ප්‍රවෘති පත්‍රයක්; 3) ජනප්‍රිය ලිපි එකතුවක් හා ජනප්‍රිය පත්‍රිකා පළ කිරීමක් අවශ්‍ය විය. ජූනි යෝජනාවල ඉලක්කය වූ ස්වකීය වැරැදි අවසාන වශයෙන්ම අත් හැරීමට “රබෝචිය දියල” පත්‍රය කැමති බව ඔප්පු කිරීමට තිබුණු එකම ක්‍රමය එවැනි කාර්ය බෙදගැනීමකට එකඟ වීමය. ගැටුම් ඇතිවීමේ සියළුම හැකියාවන් ඉවත් කිරීමට හා කල් පවත්නා එකඟත්වය සාර්ථක වශයෙන් සහතික කිරීමටත්, ඒ අතරම, අප ව්‍යාපාරයේ පූර්ණ ජීවනයකට හා නව ජයග්‍රහණයන්ට උපස්ථම්භක වීමටත් ඉඩ තිබුණේ එවැනි කාර්ය බෙද ගැනීමකින් පමණකි.

විප්ලවවාදී හා අවස්ථාවාදී ප්‍රවනතාවයන් අතර අවසාන භේදය ඇතිවූයේ ‘සංවිධානමය’ හේතු නිසා නොව, අවස්ථාවාදයේ ස්වාධීන අංග ලක්ෂණ තහවුරු කර ගැනීමට හා ක්‍රිචෙව්ස්කිලාගේ සහ මාර්තීනව්ලාගේ විවරණ මගින් තව දුරටත් සිත් අවුල් කිරීමට අවස්ථාවාදීන් දක්වන කැමැත්ත නිසා වන බව අනුමාන කිරීමට දැන් එකද රුසියනු සමාජ-ප්‍රජාවාදියෙකුටවත් ඉඩක් නොමැත.

“කළ යුත්තේ කුමක් ද?” නිදෙස් කිරීම

විදේශගත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගමය යළි එක්සත් කිරීම සඳහා දරන ලද ප්‍රයත්නයේදී, ඒ සම්බන්ධයෙන් මූලාරම්භකයන්ගේ කණ්ඩායම ඉටු කළ කාර්ය කොටස ගැන “කළ යුත්තේ කුමක්ද?” නැමැති පොතෙහි කර ඇති විස්තරය පහත සඳහන් පරිදි නිදෙස් කරන ලෙස එම කණ්ඩායම මගෙන් ඉල්ලා ඇත. ‘මෙම කණ්ඩායමේ සාමාජිකයන් තිදෙනා අතුරෙන් එක් අයෙක් පමණක් 1900 අගදී විදේශගත ‘සංගමයෙන්’ ඉවත් විය. අනිත් දෙදෙනා ඉවත්වූයේ මූලාරම්භකයන්ගේ කණ්ඩායම යෝජනා කළ ලෙසට විදේශගත “ඉස්ක්‍රා” සංවිධානයත්, විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයත් සමග සාකච්ඡාවක් කිරීමට සංගමයේ එකඟත්වය ලබා ගැනීම කිසි සේත් කළ නොහැකි බව අවබෝධ වීමෙන් පසුව 1901 දීය. මූලාරම්භකයන්ගේ කණ්ඩායමට ඇතුළත් අය මැදිහත් වන්නන් ලෙස කටයුතු කිරීමට සුදුස්සන් නොවන බවට තර්ක කරමින් ප්‍රථමයෙන් යෝජනාව ප්‍රතික්ෂේප කළ සංගමයේ පාලක කාරක සභාව, විදේශගත “ඉස්ක්‍රා” සංවිධානය සමග කෙළින්ම සම්බන්ධකම් ඇතිකර ගැනීමේ කැමැත්ත ප්‍රකාශ කළේය. එසේ වුවද, ඒ නොබෝ කලකින්ම, සංගමයේ පාලක කාරක සභාව මූලාරම්භකයන්ගේ කණ්ඩායම වෙත දන්වා එවූයේ, සංගමයේ භේදය ගැන වාර්තාව ඇතුළත් “ඉස්ක්‍රා” පත්‍රයේ ප්‍රථම කලාපය පළ කිරීමෙන් පසුව, එය ස්වකීය තීරණය වෙනස් කළ බව හා “ඉස්ක්‍රා” පත්‍රය සමග සම්බන්ධකම් පැවැත්වීමට තව දුරටත් කැමැත්තක් නොමැති බවය. මෙයින් පසුව මූලාරම්භකයන්ගේ කණ්ඩායම සකස්වී ඇති ආකාරය ගැන නොසතුටුව නිසාම පමණක් විදේශගත සංගමය සාකච්ඡාවක් කිරීම ප්‍රතික්ෂේප ළේක යැයි කියන එම සංගමයේ පාලක කාරක සභාවේ

සාමාජිකයෙකුගේ කථාව කෙනෙක් වටහා ගන්නේ කෙසේද? එමෙන්ම පසුගිය අවුරුද්දේ ජූනි මාසයේදී විදේශගත 'සංගමයේ' පාලන කාරක සභාව සාකච්ඡාවට එකඟවූයේ මන්ද යන්නද තේරුම් කිරීම දුෂ්කරය. ඒ අවස්ථාව වන විටද ''ඉස්ක්‍රා'' ප්‍රථම කලාපයේ ලිපි බල පැවැත්තේය. ''ඉස්ක්‍රා'' පත්‍රය විදේශගත 'සංගමය' කෙරෙහි දැක්වූ 'නොසතුටු ආකල්පය ඊටත් වඩා තදින් ''සර්යා'' අංක 4 පත්‍රයෙන් ප්‍රකාශිතව තිබුණි. මේ දෙකම නිකුත් කර තිබුණේ ජූනි සම්මේලනයට ප්‍රථමයෙනි.

එන්. ලෙනින්

''ඉස්ක්‍රා'' අංක 19, 1902 අප්‍රියෙල් 1.

සටහන්

[1] ''කළ යුත්තේ කුමක්ද? අප ව්‍යාපාරයේ දැවෙන ප්‍රශ්න'' නැමැති කෘතිය ලෙනින් විසින් ලියන ලද්දේ 1901 අග භාගය සහ 1902 මුල් භාගය අතර කාලය තුළදීය. 1901 දෙසැම්බර් මාසයේ ''ඉස්ක්‍රා'' පත්‍රයේ අංක 12 කලාපයේ ''ආර්ථිකවාදය ආරක්ෂකයින් සමග සාකච්ඡාවක්'' යන මැයෙන් ලිපියක් පළකළ ලෙනින් පසුව එය ''කළ යුත්තේ කුමක්ද?'' නැමැති කෘතියේ සාරාංශය වශයෙන් හැඳින් විය. 1902 පෙබරවාරියේදී ලෙනින් මෙම පොතට පෙරවදන ලියුවේය. මාර්තු මාසයේ ආරම්භයේදී ''කළ යුත්තේ කුමක්ද?'' පොත ෂ්ටුට්ගාර්ට් නගරයේ දීට්ට්ස් ප්‍රකාශන ආයතනය විසින් මුද්‍රණයෙන් පිටකරන ලදී. මෙම පුවත 1902 මාර්තු මස 10 වැනි දින පළවූ ''ඉස්ක්‍රා'' පත්‍රයේ පළ විය.

''කළ යුත්තේ කුමක්ද කෘතිය රුසියානු කම්කරු පංතියේ විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයක් සඳහා කරන සටනේදීද, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ (රු. ස. ප්‍ර. ක. ප.) කමිටු තුළ හා සංවිධාන තුළ ලෙනින්වාදී-ඉස්ක්‍රා අරමුණු ජයග්‍රහණය කිරීම සඳහාද, පසුව, 1903 එහි දෙවැනි සම්මේලනයේදීද අතිමහත් කාර්ය කොටසක්ක් ඉටුකළේය.

1902—1903 අවුරුදුවලදී මෙම කෘතිය රුසියාවේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන තුළ පුළුල් ලෙස පැතිර ගියේය.

[2] ''ඉස්ක්‍රා'' පත්‍රයේ අංක 4 කලාපයේ මුල් පිටුවේ පලවූ ළෙනිගේ ''පටන් ගත යුත්තේ කොතැනින්ද?'' නැමති ලිපිය, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ එම කාලයේ වැදගත් ප්‍රශ්නවලට, එනම් දේශපාලන උද්ඝෝෂනයේ ස්වරූපය හා ප්‍රධාන හරය

පිළිබඳවද සටන්කාමී සමස්ත රුසියානු මාක්ස්වාදී පක්ෂයක සංවිධානාත්මක කර්තව්‍ය හා එය ගොඩනැගීමේ සැලැස්ම පිළිබඳවද පිළිතුරු සපයයි. ‘‘පටන්ගත යුත්තේ කොතැනින්ද?’’ නැමැති ලිපිය ‘‘කළ යුත්තේ කුමක්ද?’’ කෘතියෙහි වඩාත් සවිස්තරාත්මකව ඇති සැලැස්මේ ලුහුඬු සටහන ලෙස ලෙනින් හැඳින් වූයේය.

එම ලිපිය විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ලේඛන ගත වැඩ පිළිවෙළ වූ අතර එය රුසියාවේ හා විදේශිය රටවලද පුළුල් ලෙස පැතිර ගියේය.

3 ‘‘ඉස්ක්‍රා’’ — ලෙනින් විසින් 1900 දී ආරම්භ කරන ලද පළමුවැනි නීතිවිරෝධී සමස්ත රුසියානු මාක්ස්වාදී පත්‍රයයි. මෙම පත්‍රය රුසියාවේ කම්කරු පංතියේ විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයක් බිහිකිරීමේදී තීරණාත්මක කර්තව්‍යයක් ඉටු කළේය.

පොලිසියේ ලුහු බැඳීම් නිසා රුසියාව තුළ විප්ලවවාදී පත්‍රයක් පළ කිරීමට ඇති අපහසුතාවය හේතුකොට ගෙන, විදේශීය රටක එය මුද්‍රණය කිරීම පිළිබඳ සැලැස්ම ලෙනින් සයිබීරියාවේ පිටුවහල්ව සිටියදීම පිළියෙළ කළේය. පිටුවහල් කාලය අවසන් වීමෙන් පසු (1900 ජනවාරි) ඔහු එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේය.

පළමුවැනි ලෙනින්වාදී ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය 1900 දෙසැම්බර් මස ලියිප්සිග් නගරයේදී එළිදැක්කේය. පසුව එය මියුනික් නගරයේද, 1902 ජූලිමාසයේ සිට ලන්ඩන් හිද, 1903 සරත් සමයේ සිට ජිනීවාහිද මුද්‍රණය කරන ලදී. ලෙනින් එහි ප්‍රධාන සංස්කාරක වරයා හා මාර්ගොපදේශකයා වශයෙන් මූලික වශයෙන් කටයුතු කළේය.

පාක්ෂික බලවේගයන් ඒකරාශීකරන මධ්‍යස්ථානය බවට පත්‍රය පත්විය. රුසියාවේ නගර ගණනාවකම රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ ඉස්ක්‍රාවාදය පෙරදැරිකොටගත් කණ්ඩායම් හා කමිටු බිහි විය.

‘‘ඉස්ක්‍රා’’ කතෘ මඬුල්ල, සාකච්ඡාවට භාජනය කිරීම සඳහා, පක්ෂයේ වැඩ පිළිවෙළ කෙටුම් පත් කර පළකළ අතර රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයටද (1903) සූදනම් වූහ. රුසියාවේ සියළුම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයන් එකම පක්ෂයකට ඒකරාශී කිරීමේදී ‘‘ඉස්ක්‍රා’’ පත්‍රය කළ මහඟු සේවය පිළිගත් රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනය එය එහි මධ්‍යම නිල පත්‍රය බවට ප්‍රකාශ කළාය.

එහෙත්, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයට පසුව ඉක්මනින්ම ලෙනින් සහ අවස්ථාවාදී නියෝජිතයින් — මෙන්ෂෙවිකයින් — අතර අරගලය පැණනැගිණ. පත්‍රයේ කතෘ මඬුල්ලෙන් ලෙනින් ඉවත් වූ පසු පත්‍රයේ 52 වැනි කලාපයේ සිට (1903 නොවැම්බර් මාසය) විප්ලවවාදී මාක්ස්වාදයේ නිල පත්‍රය වශයෙන් ‘‘ඉස්ක්‍රාවට’’ තිබූ ස්ථානයද අහිමි විය.

4 1901 වසන්තයේදී හා ග්‍රීෂ්ම සෘතුවේදී විදේශගත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගමය’’, විදේශගත බූන්ඩ් කමිටුව, ‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා’’ විප්ලවවාදී සංවිධානය සහ ‘‘ඉස්ක්‍රා’’–‘‘සර්යා’’විදේශගත සංවිධාන අංශය) අතර ‘‘අරගල’’ කණ්ඩායමේ මූලිකත්වයෙන් එකඟතාවය හා ඒකාබද්ධවීම පිළිබඳ සාකච්ඡා ඇති විය. ඒකාබද්ධවීම සිදුවිය යුතුව තිබූ සම්මේලනයට සූදනම්වීම සඳහා 1901 ජූනි මස ජිනීවා නුවරදී ඉහත සංවිධානවල නියෝජිතයින් විසින් සම්මේලන සභාවක් කැඳවන ලදී (‘ජූනි’ නොහොත් ‘ජිනීවා’ සම්මේලනය යන හැඳින්වීම මේ අනුව ලැබිණි). එම සම්මේලන සභාවේදී සියළුම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානවල සමගිය අත්‍යවශ්‍ය යැයි පිළිගන්නා සහ අවස්ථාවාදය එහි සියළුම ඉස්මතුවීම් හා ස්වරූපයන් වන ‘ආර්ථිකවාදය’ බර්න්ෂ්ටයින්වාදය ආදිය විවේචනයට භාජනය කරන යෝජනාවක් (‘‘ප්‍රතිපත්තිමය එකඟතාවය’’) සම්මත කරගන්නා ලදී. එහෙත් ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ’’ හා එහි නිල පත්‍රය වන ‘‘රබෝචිය දියල’’ හි අවස්ථාවාදය කරා ඇතිවූ නවතම ආපසු යෑම නිසා ඒකාබද්ධවීමේ උත්සාහය කලින්ම අසාර්ථක විය.

රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ විදේශගත සංවිධානවල ඒකාබද්ධවීමේ සම්මේලනය 1901 සැප්තැම්බර් 21—22 දී (ඔක්තෝබර් 4—5) සූරිච් නගරයේදී පවත්වන ලදී. එම සම්මේලනයට ‘‘ඉස්ක්‍රා’’–‘‘සර්යා’’ සංවිධානයත්, ‘‘සමාජ–ප්‍රජාතන්ත්‍රිකයා’’ විප්ලවවාදී සංවිධානයත්, ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය’’ සහ ‘‘අරගල කණ්ඩායමත්’’ යන සංවිධානවල නියෝජිතයෝ සහභාගි වූහ.

සම්මේලනයේදී අවස්ථාවාදී තීරණ ගැනීම නිසා ඒකාබද්ධවීමේ අසීරුතාවය පිළිබඳ ප්‍රකාශනයක් නිකුත්කළ සම්මේලනයේ විප්ලවවාදී කොටස (‘‘ඉස්ක්‍රා’’-‘‘සර්යා’’ හා ‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය’’ යන සංවිධානවල සාමාජිකයෝ) සම්මේලනයෙන් ඉවත්ව ගියහ.

5 ''රබෝචිය දියල''—''විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය'' විසින් කලින් කල පළ කරන ලද නිල සහරාවයි. එය 1899 අප්‍රේල් මාසයේ සිට 1902 පෙබරවාරි දක්වා ජිනීවා හි මුද්‍රණය කර පළකරන ලදී. එම කාලය තුළදී කලාප 12 ක් (පොත් 9 ක්) පළ විය. ''රබෝචිය දියල'' සහරාවේ සංස්කාරක අංශය 'අර්ථිකවාදීන්ගේ' විදේශගත මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කළේය. මාක්ස්වාදය 'විවේචනය කිරීමේ නිදහස' යන සටන්පාඨයට සහයෝගය දැක්වූ ''රබෝචිය දියල'' රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රමික හා සංවිධානාත්මක ප්‍රශ්නවලදී අවස්ථාවාදී ස්ථානයක් ගත්තේය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී ''රබෝචිය දියල'' නියෝජිතයෝ අති දක්ෂිණාන්ශික අවස්ථාවාදී අංශය නියෝජනය කළහ.

6 ආර්ථිකවාදය — 19 වැනි සිය වසඅවසානයේදී සහ විසිවැනි සියවසේ මුලදී රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඇති වූ අවස්ථාවාදී ප්‍රවනතාවයකි. දේශපාලන සටන ලිබරල්වාදී ධනපති පංතියට අයත් කාර්යක් බව කියා සිටි 'ආර්ථිකවාදීහු' කම්කරු පංතියේ කර්තව්‍යයන් වැටුප් වැඩිකර ගැනීම, ශ්‍රම තත්වයන් යහපත් කර ගැනීම ආදී ආර්ථික අරගලයන්ට පමණක් සීමා කළහ. පක්ෂය කම්කරු පංති ව්‍යාපාරයේ සාංසිද්ධික ක්‍රියාදමය විමර්ශනයට භාජනය කිරීම හා ඒ ඒ සිද්ධීන් ලේඛනගත කිරීම පමණක් කළ යුතු යැයි පිළිගත් ඔවුහු කම්කරු පංතියේ දේශපාලන පක්ෂයේ නායකත්වය ප්‍රතික්ෂේප කළහ. දෘෂ්ටිය හා විඥානය ඇති විය හැක්කේ සාංසිද්ධික කම්කරු ව්‍යාපාරයක් තුළින් පමණකැයි පිළිගත්'ආර්ථිකවාදීහු'එය ඉදිරියේ වන්දනමාන කරමින් විප්ලවවාදී න්‍යාය හා විඥානය පහත් කොට තැකූහ.

7 ''රබෝචය ගසියත'' — කීයෙව් සමාජප්‍රජාතන්ත්‍රවාදීන් නීති විරෝධී ලෙස පළ කල නිල පත්‍රය යි. පළවූයේ පත්‍ර කලාප දෙකක් පමණකි: පළමුවැන්න 1897 අගෝස්තු මාසයෙදීත් දෙවැන්න දෙසැම්බර් මාසයේදීත් (නොවැම්බර් දතම ඇතිව) පිට විය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ පළමුවැනි සම්මේලනය (1898 මාර්තු) ''රබෝචය ගසියත'' පක්ෂයේ නිල පත්‍රය ලෙස පිළිගත්තාය. සම්මේලනයට පසුව පක්ෂයේ මධ්‍යම කාරක සභිකයින් සහ ''රබෝචස ගසියත'' කතෘ මණ්ඩලය සිරභාරයට ගැනීමේ හා මුද්‍රණාලය සුණු විසුණු කර දැමීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුද්‍රණය සඳහා පිළියෙළ කර තුබූ පත්‍රයේ තුන්වැනි කලාපය එළි නොදැක්කේය.1899 දී ''රබෝචය ගසියත'' නැවත පළ කිරීමේ උත්සාහයක් ගන්නා ලදී;''කළ යුත්තේ කුමක්ද?'' කෘතියේ පස්වැනි පරිච්ඡේදයේ ''අ'' ඡේදයෙහි එම උත්සාහය පිළිබඳ විස්තරයක් ලෙනින් ඉදිරිපත් කරයි. (මෙම මුද්‍රණයේ 185—205 වැනි පිටු බලන්න).

8 ලසාල්වාදීන් සහ එයිසෙනාහ්වරුන් — 1860 ගණන්වල සහ 1870 ගණන්වල ජර්මන් කම්කරු ව්‍යාපාරය තුළ පැවති පක්ෂ දෙකකි. මෙම පක්ෂ දෙක අතර, ප්‍රධාන වශයෙන්, උපක්‍රමීය ප්‍රශ්න පිළිබඳව සහ ප්‍රථමයෙන්ම, එම කාලයේදී ජර්මනියේ දේශපාලන ජීවිතයේ තියුණුම ගැටළුව වූ එහි නැවත එක්සත් වීමේ මාර්ගය පිළිබඳ සටන් පැවතියේය.

ලසාල්වාදීන් — ජර්මානු සුළු ධනවාදී සමාජවාදී ලසාල්ගේ අනුගාමිකයන් සහ පාක්ෂිකයින්, 1863 දී ලිප්සිග්හි පැවැත්වූ කංකරු සංගම් සම්මේලනයේදී ආරම්භ කරන ලද සමස්ත ජර්මානු කම්කරු සංගමයේ සාමාජිකයින් මේ නමින් හඳුන්වන ලදී. සංගමයේ වැඩ පිළිවෙළ සහ උපක්‍රම ක්‍රමවත් ලෙස ඉදිරිපත් කළ ලසාල් එහි ප්‍රථම සභාපති ධුරයට පත්විය. ලසාල් සහ ඔහුගේ අනුගාමිකයෝ තම ප්‍රායෝගික ක්‍රියා පිළිවෙළේදී බිස්මර්ක්ගේ බලවත් අධිපත්‍යයේ ප්‍රතිපත්ති පිළිගත්හ. ''සාධාරන ලෙස, එය මුළු කම්කරු ව්‍යාපාරයම ප්‍රුසියන්වරුන්ට වාසිදයක ලෙස පාවාදීමක් සහ අර්ථසුන්‍ය ක්‍රියාවක්'' බව ප්‍රෙඩරික් එංගල්ස් සහ කාල් මාක්ස් ලිවෝය. මාක්ස් සහ එංගල්ස් නිතරම ලසාල්වාදී න්‍යායයන්ද උපක්‍රම සහ සංවිධානාත්මක මූලධර්මද ජර්මන් කම්කරු ව්‍යාපාරයේ අවස්ථාවාදී ප්‍රවනතාවයක් ලෙස ගෙන හැර දක්වමින්එය විවේචනයට භාජනය කළහ.

එයිසෙනාහ්වරුන් — 1869 දී එයිසෙනාහ් වල පැවැත්වූ ව්‍යවස්ථාදයක සම්මේලනයේදී ආරම්භ කරන ලද ජර්මානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ සාමාජිකයින් මෙනමින් හැදින්වූහ. එයිසෙනාහ්වරුන්ගේ නායකයින් වූයේ කාල් මාක්ස්ගේ සහ ප්‍රෙඩරික් එංගල්ස්ගේ දෘෂ්ටිමය බලපෑම යටතේ හැඩගැසුණු අ. බේබෙල් හා ව. ලීබ්ක්නෙහ්ට් ය. එයිසෙනාහ් වැඩ පිළිවෙළේ මෙසේ සඳහන් විය: ''ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වයේ කොටසක් සහ එහි

අපේක්ෂාවන්ගේ කොටස් කරුවෙක් වේ.” ජර්මනිය නැවත එක්සත් කිරීමේ ප්‍රශ්නයේදී, එයිසෙනාහ්වරු “සුළු වශයෙන් හෝ මතුවූ ප්‍රුසියන්වාදී, බිස්මර්ක්වාදී, ජාතිවාදී වාසිදයක තත්වයන් සමග සටන් කරමින් ප්‍රජාතන්ත්‍රවාදී මග සහ නිර්ධන පංතික මග දැඩිව ආරක්ෂා කළහ” (වි. අයි. ලෙනින්).

1871 දී ජර්මන් අධිරාජ්‍ය පිහිටුවීම නිසා සොල්වාදීන් සහ එයිසෙනාහ් වරුන් අතර පැවති ප්‍රධාන උපක්‍රමීය ප්‍රතිවිරුද්ධකම් මග හැරිණි; 1875 දී කම්කරු ව්‍යාපාරයේ බලපෑම සහ රජයේ තර්ජන ගර්ජන වැඩි වීම නිසා ගොත් සම්මේලනයේදී එක්සත් ජර්මන් සමාජවාදී කම්කරු පක්ෂයකට දෙපක්ෂයම එකතු වූහ (එහි ප්‍රතිඵලයක් වශයෙන් ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය බිහි විය).

9 ගෙඩ්වාදීන් සහ පොසිබිලිස්ට්වරු 1882 දී සෙන්ත්-එතියෙන් සම්මේලනයේදී සිදුවූ ප්‍රංශ කම්කරු පක්ෂය පක්ෂ දෙකකට බෙදී යාමට පසු ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරය තුළ ඇතිවූ විප්ලවකාරී හා අවස්ථාවාදී ප්‍රවනතාවයකි.

ගෙඩ්වාදීන් — ජේ. ගෙඩ් ගේ සහ පී. ලපාර්ග් ගේ අනුගාමිකයින් මෙනමින් හඳුන්වන ලදී. නිර්ධනයින්ගේ සාංසිද්ධික විප්ලවකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කළ වාමාංශික මාක්ස්වාදී ප්‍රවනතාවයකි. ගෙඩ්වාදීන් ‘ප්‍රංශ කම්කරු පක්ෂය’ යන හැදින්වීම ආරක්ෂා කරගත් අතර කාල් මාක්ස් විසින් න්‍යායාත්මක කොටස ලියනලදුව 1880 දී හාවර්හිදී ස්ථිර කරගත් පක්ෂයේ වැඩ පිළිවෙළ ඔවුහු අනුගමනය කළහ. ප්‍රංශයේ කර්මාන්ත මධ්‍යස්ථානවල මහත් බලපෑමක් ඇතිකළ ඔවුහු කම්කරු පංතියේ පුරෝගාමී කොටස් එකරාශී කළහ. ගෙඩ්වාදීන් 1901 දී ප්‍රංශයේ සමාජවාදී පක්ෂය ආරම්භ කළහ.

පොසිබිලිස්ට්වරු — (පී. බ්‍රුස්, බී. මැලන් හා වෙනත් පුදිගලයෝ) නිර්ධන පංතිය විප්ලවවාදී අරගල මාර්ගයෙන් ඉවත් කළ සුළු ධනවාදී, ප්‍රතිසංස්කරණවාදී ප්‍රවනතාවයකි. පොසිබිලිස්ට්වරු ‘කම්කරු සමාජ-විප්ලවකාරී පක්ෂය’ ආරම්භ කළහ. විප්ලවවාදී වැඩ පිළිවෙළ සහ නිර්ධන පංතියේ විප්ලවවාදී උපක්‍රම ප්‍රතික්ෂේප කළ ඔවුහු කම්කරු ව්‍යාපාරයේ සමාජවාදී අරමුණු ලිහිල් කළ අතර කම්කරු පංතියේ අරගලය ‘විය හැකි’ (Possible) රාමුවක් තුළ සීමාකිරීමට යෝජනා කළහ. පොසිබිලිස්ට්වරු නැමැති නාමය ඔවුන්ට ලැබුනේ මේ නිසාය.

පොසිබිලිස්ට්වරුන්ගේ බලපෑම ප්‍රධාන ලෙස පැතිර ගියේ ප්‍රංශයේ අර්ථික වශයෙන් වඩාත් නොදියුණු පලාත්වල සහ කම්කරු පංතියේ මද දියුණුවක් ලැබූ කම්කරු ස්ථර තුළ ය. 1902 දී පොසිබිලිස්ට්වරු වෙනත් ප්‍රතිසංස්කරණවාදී කණ්ඩායම් සමග එකතුව ජේ. ජොරේස්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රංශ සමාජවාදී පක්ෂය පිහිටුවා ගත්හ.

1905 දී ප්‍රංශයේ සමාජවාදී පක්ෂය සහ ප්‍රංශ සමාජවාදී පක්ෂය ඒකාබද්ධ වී ‘ප්‍රංශ සමාජවාදී පක්ෂය’ පිහිටුවා ගත්හ. 1914—1918 අවුරුදුවල ඇතිවූ අධිරාජ්‍යවාදී ලෝක යුද්ධයේදී එම පක්ෂයේ නායකයෝ (ගෙඩ්,සම්බා සහ වෙනත් අය) කම්කරු පංතියේ කර්තව්‍ය වෙනස් කර සමාජ-ජාත්‍යොන්මාද වාදයට කරා පිල් මාරු කළහ.

10 ජේබියන්වරු — 1884 දී පිහිටුවන ලද ඉංග්‍රීසි ප්‍රතිසංස්කරණවාදී සංවිධානයේ, ජේබියන් සමාජයේ සාමාජිකයෝ මෙම නමින් හඳුන්වන ලදහ.නූතන පූර්ව තුන්වැනි ශතවර්ෂයේ රෝම අධිරාජයේ, හැනිබාල් සමග යුද්ධයේදී ඔහුගේ හෙමින් හෙමින් උපක්‍රම සහ තීරණාත්මක සටන්වලදී ඉන් ඉවත්ව යෑම නිසා ‘කුන්ක්තතොර්’ (‘සුනංගුවා’) නැමැති පටබැදි නාමය ලත් ජේබි මැක්සිම් සෙන්පතියාගේ නාමය මෙම සමාජයේ නම ලෙස යොදන ලදී. මේ සමාජයේ සාමාජිකයින්ගෙන් වැඩි දෙනා ධනපති බුද්ධිමත්හු — විද්‍යාඥයෝ, ලේඛකයෝ දේශපාලන නායකයෝ (සිඩ්නි වෙබ් හා බියට්රිස් වෙබ්, බර්නාඩ් ෂෝ, රැම්සේ මැක්ඩොනල්ඩ් ආදී) වූහ. නිර්ධන පංතියේ පංති සටනේ හා සමාජවාදී විප්ලවයේ අත්‍යාවශ්‍යතාවයන් ප්‍රතික්ෂේප කළ ඔවුහු ප්‍රතිසංස්කරණවාදී ක්‍රියා මගින් ක්‍රම ක්‍රමයෙන් සමාජය වෙනස් කරමින් සමාජවාදය වෙත යා හැකි බව කියා සිටියහ. ජේබියන්වාදය “අන්ත අවස් අවස්ථාවාදී මාර්ගයක්” ලෙස ලෙනින් විසින් හඳුන්වන ලදී. 1900 දී ජේබියන් සමාජය ලිබරල් පක්ෂය සමග එකතු විය. ‘ජේබියන් සමාජවාදය’ ලිබරල්වාදී දෘෂ්ටියේ එක් උල්පතක සුවච සේවකයෙකි.

සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෝ — 1884 දී පිහිටුවන ලද ඉංග්‍රීසි ප්‍රජාතන්ත්‍රවාදී සංගමය මෙයින් අදහස් කෙරේ. ප්‍රතිසංස්කරණවාදීන් (ගයින්ද්මාන් සහ වෙනත් අය) සහ අරාජිකවාදීන් සමග ඉංග්‍රීසි සමාජවාදී ව්‍යාපාරයේ වාමාංශික පිළ නියෝජනය කළ, විප්ලවකාරී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ, මාක්ස්වාදී

අනුගාමිකයින්ගේ කණ්ඩායමක් (ග. ක්වියල්ච්, ටී. මාන්, ඒ. එව්ලංග්, එලියනෝරා මාක්ස් සහ වෙනත් අය) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගමයට අයත් විය. සිද්ධාන්තවාදය සහ නිකායවාදය නිසාද, එංගලන්තයේ සමස්ත කම්කරු ව්‍යාපාරයෙන් වෙන්වීම සහ එහි විශේෂත්වයන් නොසලකා හැරීම නිසාද ෆ්‍රෙඩ්රික් එන්ගල්ස් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගමය දැඩි ලෙස විවේචනයට භාජනය කළේය. 1907 දී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගමය, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යන නමින් හඳුන්වනු ලැබීය; නැවතත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ස්වාධීන කම්කරු පක්ෂයේ වාමාංශික කොටස් සමග එකතුව බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය පිහිටුවා ගත්තේය; 1920 දී එම පක්ෂයේ බහු සමාජික සංඛ්‍යාවක් මහා බ්‍රිතාන්‍යයේ කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමට මූලික වූහ.

11 ‘‘නරෝද්නය වෝලිය’’ (ජනතා අභිලාෂය) — 1876 අගෝස්තු මස පිහිටුවන ලද නරෝද්නික්-ත්‍රස්තවාදීන්ගේ රහසිගත විප්ලවකාරී සංවිධානය මේ නමින් හඳුන්වන ලදී.

සර්වබලධාරි ඒකාධිපති ක්‍රමය පෙරළා දමා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් පිහිටුවීම නරෝද්නය වෝලිය වරුන්ගේ ක්ෂණික අරමුණ විය. ඔවුහු නරෝද්නික්වාදී ඉතිහාසයේ ප්‍රථම වරට දේශපාලන අරගලය පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කළහ. නමුත් එය කතාවට හා පෞද්ගලික ත්‍රස්තවාදයට පමණක් සීමා විය.

1881 මාර්තු මස 1 වැනි දින අසාර්ථක වලිකෑම් කීපයකට පසු 2 වැනි ඇලෙක්සාන්දර් සාර් රජ මරාදමන ලදී. කුමන්ත්‍රණයේ සංවිධායකයින් මරණීය දංඩණයට පත්කරනු ලැබූ අතර, පසුව අධිකරන නඩු විභාග ගණනාවක්ම පවත්වන ලදී. ඉක්මනින්ම ‘‘නරෝද්නය වෝලිය’’ ක්‍රියාකාරිත්වය ඇනහිටිණි. වීරත්වයෙන් හා අධිෂ්ඨානයෙන් නරෝද්නය වෝලියවරු පිරිපුන්ව සිටියත්, වැරදි න්‍යායය හා උපක්‍රමද, බහු ජනතාව සමග පුළුල් සම්බන්ධකම් නොතිබීමද නිසා සංවිධානය විනාශයට පත්විය.

සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෝ — මෙහි සඳහන් වන්නේ 19 වැනි ශතවර්ෂයේ අග දශක දෙක තුළ තම කෘතීන්වලින් හා ලිපිවලින් නරෝද්නය වෝලියවරුන්ගේ චින්තනයන් හා උපක්‍රම විවේචනයට භාජනය කළ රුසියානු මාක්ස්වාදීන් වන ගි.ව. ප්ලෙහානව්, ව්. අයි. ලෙනින් හා වෙනත් අය ගැනය.

12 ප්‍රංශ ආණ්ඩු පාක්ෂිකයෝ (මිලෙරාන් වාදියෝ) — 1899 දී වල්ඩෙක්-රුසෝගේ ප්‍රතිගාමී ධනවාදී ආණ්ඩුවට ඇතුළු වූ ප්‍රංශ සමාජවාදියෙකු වන ඒ. මිලෙරන්ගේ අනුගාමිකයෝ මේ නමින් හඳුන්වනු ලැබූහ.

13 බර්න්ෂ්ටයින්වාදියෝ — 19 වැනි ශතවර්ෂයේ අවසානයේදී ජර්මානු හා ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්වාදය තුළ බිහි වූ, සංශෝධනවාදයේ න්‍යායාචාර්ය වරයා වූ එඩ්වඩ් බර්න්ෂ්ටයින්ගේ නමින් හඳුන්වන ලද, මාක්ස්වාදය විරෝධී ප්‍රවනතාවයේ අනුගාමිකයෝ මේ නමින් හඳුන්වනු ලැබූහ.

1896—1898 අවුරුදුවලදී බර්න්ෂ්ටයින්, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නිල සහරාව වූ “Die Neue Zeit” (නව කාලය) හි ‘‘සමාජවාදයේ ගැටළු’’ යන මැයෙන් ලිපි පෙළක්ම පළ කළේය. ‘විවේචනය කිරීමේ නිදහස’ නැමැති ධජය යටතේ විප්ලවවාදී මාක්ස්වාදයේ දේශපාලන, ආර්ථික හා දර්ශනවාදී පදනම් නැවත සලකා බලා (සංශෝධනය, එයින් සංශෝධනවාදය) පංති විරෝධීතාවයන්ගේ සහ පංති සහයෝගීතාවයේ එකඟ බවක් පෙන්වන ධනවාදී න්‍යායයන් ඒ වෙනුවට ආදේශ කිරීමට එම ලිපිවලින් ඔහු උත්සාහ දරන ලදී. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ දක්ෂිණාංශික පිළ සහ දෙවැනි ජාත්‍යන්තරයේ වෙනත් පක්ෂවල අවස්ථාවාදී කොටස් බර්න්ෂ්ටයින් දෘෂ්ටියට සහයෝගය දැක්වූහ.

14 රුසියානු විවේචකයෝ — ‘විවේචනය කිරීමේ නිදහස’ නැමැති පාඨය යටතේ, මාක්ස්වාදී න්‍යායන් නැවත සලකා බලා, සමාජවාදය සඳහාද, සමාජවාදී විප්ලවය සඳහා හා නිර්ධන පංතියේ ආඥාදායකත්වයක් සඳහා ද සටන ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටි රුසියානු බර්න්ෂ්ටයින්වාදීන්, ‘නිත්‍යනුකූල මාක්ස්වාදීන්’ (ස්ත්‍රුවේ, බුල්ගාකව්, බෙර්දියායිව් හා වෙනත් අය) මේ නමින් හඳුන්වන ලදී.

15 ජුපිටර් සහ මිනර්වා — පැරණි රෝමානු දෙවි වරුය. ජුපිටර් අහසට අධිපති ගෙරවීම් ඇතිකරන දෙවියා සහ රෝමානු අධිරාජ්‍යයේ අති මහෝත්ම දේවත්වය ලෙස සලකන ලදී.මිනර්වා — යුද්ධයට සහ කර්මාන්තයට, විද්‍යාවට, කලාවට අධිපති දේව දූතිකාවයි.

16 ‘‘විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය’’ — 1894 දීශ්‍රම විමුක්තිය’’කණ්ඩායමේ පුරෝගාමිත්වය ඇතිව පිහිටුවාගන්නා

ලදී. ''සයූස්'' ප්‍රකාශන සංස්කරණය කිරීම මෙම සංගමයේ කාර්යභාරය විය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ පළමු වැනි සම්මේලනය (1898 මාර්තු) විසින් ''සයූස්'' රු. ස. ප්‍ර. ක. පක්ෂයේ විදේශගත නියෝජිතයා හැටියට පිළිගන්නා ලදී. පසුව අවස්ථාවාදී කොටස්වල — 'ආර්ථිකවාදියෝ' නොහොත් 'යෞවනයෝ' නමින් හඳුන්වාගත්තෝ — බලය 'සයූස්' තුළ තහවුරු විය. 1899 අප්‍රේල් මස සිට ''සයූස්'' 'ආර්ථිකවාදීන්ගේ' සඟරාව වන ''රබෝචිය දියල'' පළ කිරීමට පටන් ගත්හ.

ශ්‍රම විමුක්තිය'' කණ්ඩායම ''සයූස්'' හි අවස්ථාවාදී මාර්ගයට විරුද්ධ වූ අතර එහි ප්‍රකාශන සංස්කරණය කිරීමද ප්‍රතික්ෂේප කළේය.

''සයූස්'' දෙවැනි සම්මේලනයේදී (1900) භේද පැන නැගිණි. ''ශ්‍රම විමුක්තිය'' කණ්ඩායම සහ ඔවුන්ට සහයෝගය දක්වන්නෝ සම්මේලනයෙන් පිටව ගිය අතර වෙනමම සංවිධානයක් වූ ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා'' පිහිටුවා ගත්හ. 1903 දී රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවැනි සම්මේලනය විසින් ''සයූස්'' විසුරුවා හැරීමට තීරණය කරන ලදී.

17 කන්ද සහ ජිරොන්ඩ — දහ අට වැනි සියවසේ අවසාන භාගයේදී, ප්‍රංශ ධනපති විප්ලවය සමයේ පැවති ධනපති පංතියේ දේශපාලන කණ්ඩායම් දෙකකි.

කන්ද — ජැකොබින්වරු — අතනෝමත සහ රදළවාදය නැතිකර දැමීමේ අවශ්‍යතාවය පිළිගත්, එම කාලයේ විප්ලවවාදී පංතියේ වඩාත් තීරණාත්මක නියෝජිතයින් — ධනවාදීන් — මේනමින් හඳුන්වන ලදී. ජිරොන්ඩවරු, විප්ලවය හා ප්‍රතිවිප්ලවය අතර වැනෙමින්, රාජාණ්ඩුව සමග සම්මුති ඇතිකර ගැනීමේ මාවත ගත්හ.

සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ අවස්ථාවාදී ප්‍රවනතාවය 'සමාජවාදී ජිරොන්ඩා' ලෙසද; විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්, නිර්ධන පංතික ජැකොබින්වරුන් 'කන්ද' ලෙසද ලෙනින් හැඳින් වීනි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය බොල්ෂෙවික් හා මෙන්ෂෙවික් කණ්ඩායම්වලට භේද වීමෙන් පසු, මෙන්ෂෙවික්වරුන් කම්කරු ව්‍යාපාරය තුළ ජිරොන්ඩවාදී ප්‍රවණතාවයේ නියෝජිතයින් ලෙස පෙනී සිටින බව ලෙනින් නිතරම සඳහන් කළේය.

18 ''සර්යා'' — මාක්ස්වාදී විද්‍යාත්මක-දේශපාලන සඟරාවකි. එය ''ඉස්ක්‍රා'' කර්තෘ මණ්ඩලය විසින් ජර්මනියේ ස්ටුට්ගාට්හි 1901—1902 වසරවලදී පළ කරන ලදී. පළ වූයේ කලාප හතරක් (පොත් තුනක්) පමණකි.

19 කැඩට්වරු — ව්‍යවස්ථාදයක-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයින් මෙනමින් හැඳින් විණි. එය රුසියාවේ ලිබරල්-රාජාණ්ඩුවාදී ධනපතීන්ගේ ප්‍රධාන පක්ෂය වූයේ ය. කැඩෙට්වරුන්ගේ පක්ෂය පිහිටුවන ලද්දේ 1905 ඔක්තෝබර් මාසයේදීය. ධනපති පංතියේ නියෝජිතයෝ, ඉඩම් හිමියෝ සහ ධනවාදී බුද්ධිමත්හු මෙම පක්ෂයේ සාමාජිකයන්ට අයත් වූහ. කැඩෙට්වරු, ගොවිජනතාව තමන් වෙත නම්මවා ගැනීමේ අරමුණ ඇතිව අසත්‍ය 'ප්‍රජාතන්ත්‍රවාදී' වාක්‍යවලට මුවා වෙමින්, සාර්වාදය සමග සම්මුති ඇතිකර ගත්හ. ව්‍යවස්ථාදයක රාජාණ්ඩුවක් පිහිටුවීමට හඬ නගමින් ජනරජයක් නැමැති සටන් පාඨයට විරුද්ධව කටයුතු කළ අතර ඉඩම් හිමි රදළවාදය ආරක්ෂා කිරීමට බලකර සිටියහ.

20 බිස්සග්ලාවිවරු — 1905—1907 අවුරුදුවලදී විප්ලවයේ වැටීම ආරම්භ වූ කාලය තුළ දී බිහිවූ රුසියානු ධනපති බුද්ධිමතුන්ගේ අර්ධ කැඩට්වාදී, අර්ධ මෙන්ෂෙවික්වාදී කණ්ඩායමකි. 1906 දී පීටර්ස්බර්ග්හිදී ප්‍රකපෝවිච්ගේ සංස්කරණය යටතේ පළ කරන ලද ''බීස් සග්ලාවියා'' (''මාතෘකවකින් තොර'') නැමැති සතිපතා දේශපාලන පත්‍රය ඇසුරෙන් ඔවුන්ට එම නම පටබැඳිණි. තම හුදෙක් වාරිත්‍රානුකූල අපාක්ෂිකභාවයට මුවාවෙමින්, බිස්සග්ලාවිවරු ධනවාදී ලිබරල්වාදය සහ අවස්ථාවාදය ආරක්ෂා කළහ; රුසියානු හා ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සංශෝධනවාදීන්ට අනුග්‍රහ දැක්වූහ.

21 මෙන්ෂෙවික්වරු — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාවාදී ප්‍රවණතාවයකි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී පක්ෂයේ මධ්‍යම සංවිධානවලට ඡන්දය විමසීමේදී ලෙනින්ගේ නායකත්වයෙන් යුත් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට බහුතර ඡන්ද සංඛ්‍යාවක්ද අවස්ාවාදීන්ට අල්පතර ඡන්ද සංඛ්‍යාවක්ද ලැබුණේය. එතැන් සිට බොල්ෂෙවික්වරු (බහුතර) හා මෙන්ෂෙවික්වරු (අල්පතර) යන හැඳින්වීම් ලැබිණි. 1905—1907 විප්ලව සමයේදී මෙන්ෂෙවික්වරු

විප්ලවය සමයේ කම්කරු පංතියේ ආධිපත්‍යයට විරුද්ධවද, කම්කරු පංතියේ සහ ගොවි ජනතාවගේ සමගියට විරුද්ධවද නැගී සිටියහ. විප්ලවයේ පරාජයෙන් පසු, ප්‍රතිගාමිත්වය පැන නැගී සමයේදී (1907—1910) මෙන්ෂෙවික්වරු ලික්විඩේටර්වරු බවට පත් වූහ. නිර්ධන පංතියේ නීති විරෝධී විප්ලවවාදී පක්ෂය විසුරුවා හැරීමට උත්සාහ ගත්හ. පළමුවැනි ලෝක යුද්ධ සමයේදී (1914—1918) මෙන්ෂෙවික්වරු සමාජ-සංශෝධනවාදීන් බවට පත්වූහ. 1917 පෙබරවාරි මාසයේදී ඇතිවූ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් ඉක්බිතිව, ධනපති තාවකාලික ආණ්ඩුවට සමාජවාදී-විප්ලවවාදීන් සමග ඇතුළු වූ මෙන්ෂෙවික්වරු එම ආණ්ඩුවේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිවලට ආධාර දෙමින්, උග්‍රවෙමින් පැවති නිර්ධන පංතික විප්ලවයට විරුද්ධව සටන් කළහ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව, සෝවියට් බලය පෙරළා දැමීම සඳහා කුමන්ත්‍රණ සහ කැරළි සංවිධානය කරන ප්‍රතිවිප්ලවවාදී පක්ෂයක් ලෙස මෙන්ෂෙවික්වරු විවෘතවම පෙනී සිටියහ.

22 පැරිස් කොමියුනය 1871 — පැරිසියේ නිර්ධන පංතික විප්ලවය විසින් නිර්මාණය කරන ලද ඉතිහාසයේ පළමුවැනි අත්හද බැලීම වූ නිර්ධන පංති යේ අඥදයකත්වය ය; කම්කරු පංතියේ විප්ලවවාදී ආණ්ඩුවය. 1871 මාර්තු 18 ද සිට මැයි 28 වැනිද දක්වා දින 72 ක් එම ආණ්ඩුව පැවතිණි.

23 සමාජවාදීන්ට විරුද්ධ අතිවිශේෂ නීතිය — කම්කරුවන්ට සහ සමාජවාදී ව්‍යාපාරයට විරුද්ධව සටන් කිරීමේ අරමුණ ඇතිව 1878 දී ජර්මනියේ බිස්මාර්ක් රජය විසින් පනවන ලද්දකි. සමාජ-ප්‍රජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සියළුම සංවිධානද, සමස්ත කම්කරු සංවිධානද, කම්කරු ප්‍රකාශනද එම නීතිය මගින් තහනම් කෙරිණි; සමාජවාදී සාහිත්‍ය රාජසන්තක කෙරිණි; සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් පිටුවහල් කෙරිණි.

1890 දී සමස්ත කම්කරු ව්‍යාරයේ ප්‍රබල බලපෑම යටතේ සමාජවාදීන්ට විරුද්ධ අතිවිශේෂ නීතිය අහෝසි කරන ලදී.

24 "Vorwärts" (ඉදිරියට) — ජර්මානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක් පක්ෂයේ මධ්‍යම නිල පත්‍රය වූ මෙය 1891 සිට 1933 දක්වා බර්ලින්හි පළ විය. මෙම පත්‍රයේ මාර්ගයෙන් ෆ්‍රෙඩ්රික් එංගල්ස් අවස්ථාවාදයට විරුද්ධව සටන මෙහෙයවීය. එංගල්ස්ගේ මරණයෙන් පසු, 19 වැනි ශතවර්ෂයේ අවසාන දශකයේ අගභාගයේදී "Vorwärts" පත්‍රය තම අතට ගත් ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ දක්ෂිනාංශිකයෝ නොකඩවාම ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ බලය ලබා සිටි අවස්ථාවාදීන්ගේ ලිපිද පළ කළහ. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී "Vorwärts" පත්‍රය සමාජ-පටුජාතිවාදී පිළ ගත්තේය.

25 1877 මැයි 27—29 වැනි දිනවලදී ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඊළඟ සම්මේලනය පවත්වන ලදී. එම සම්මේලනයේදී පක්ෂයේ ප්‍රකාශනවලට සම්බන්ධ ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කිරීමේදී ඩූරිංග්ට විරුද්ධව එංගල්ස්ගේ ලිපි පළ කිරීම නිසා (1878 දී වෙනම දොතක් ලෙස පළ වූ ''ඇන්ටි-ඩූරිංග්. ඉව්ජින් ඩූරිංග් මහතා විසින් නිර්මාණය කරන ලද විද්‍යාවේ පෙරළිය'') පක්ෂයේ මධ්‍යම නිල පත්‍රය වන "Vorwärts" (''ඉදිරියට'') ටද, එංගල්ස්ගේ තියුණු තර්ක නිසා ඔහුටද චෝදනා කිරීමට සමහර නියෝජිතවරුන් (මොස්ට්, වල්ටෙයිහ්) ගත් උත්සාහය නිශ්ප්‍රභා විය.

26 කතීඩර-සමාජවාදියෝ — 1870—1880 අවුරුදුවලදී ධනපති දේශපාලන ආර්ථික විද්‍යාව තුළ පැවැති එක් ප්‍රවණතාවයක නියෝජිතයින් මෙනමින් හැදින් විනි. මොවුහු සමාජවාදයේ මුවාවෙන් ධනපති-ලිබරල් ප්‍රතිසංස්කරණවාදී දෘෂ්ටිය විශ්වවිද්‍යාල පීඨවල (ජර්මන් බසින් Katheder) පතුරුවා හැරියහ.

ධනපතීන්ගේ අවශ්‍යතාවයන්ට අත නොගසමින් හා වැඩ කරන ජනතාවගේ ඉල්ලීම් හැකි ආකාර ලෙස සලකා බලමින්, ප්‍රතිවිරුද්ධ පංති සමගිකර ක්‍රමයෙන් සමාජවාදය ගොඩනැගීමට පංතිවලින් තොර ධනපති ආණ්ඩුවට හැකියයි කතීඩර්-සමාජවාදියෝ පැවසූහ.

මාක්ස්, එංගල්ස් සහ ලෙනින් සෑම විටම කතීඩර්-සමාජවාදයේ ප්‍රතිගාමී ස්වරූපය පෙන්වා දුන්හ.

රුසියාව තුළ කතීඩර්-සමාජවාදී දෘෂ්ටිය විසුරුවා හරින ලද්දේ 'නීත්‍යානුකූල මාක්ස්වාදීන්' විසිනි.

27 නස්ද්‍රියෝව් — ගෝගොල්ගේ ''මළගිය ආත්ම'' පොතේ වංචාකාර නින්දිත ඉඩම් හිමියෙකි. නස්ද්‍රියෝව් පෙනී සිටි සෑම ස්ථානයකම 'ඓතිහාසික' කෝලාහල හා ආරාවුල් ඇති වූ නිසා ඔහු 'ඓතිහාසික' පුද්ගලයෙක් යැයි ගෝගොල් හැදින් විය.

28 ලෙනින් අදහස් කරන්නේ 1899 ඔකතෝබර් මස 9 වැනිද සිට 14 වැනිද දක්වා හැනෝවර් හිදී පැවැත්වූ ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සම්මේලනයේ "පක්ෂයේ ප්‍රධාන න්‍යායට සහ උපක්‍රමයන්ට පහර ගැසීම" යන යෝජනාවය. එම කරුණ ගැන අ. බේබෙල් නිල වශයෙන් දේශනයක් පැවැත්විය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ න්‍යායාත්මක හා උපක්‍රමීය පදනම් සංශෝධනය කිරීමට ගත් උත්සාහයන් ප්‍රතික්ෂේප කරමින් බේබෙල් ඉදිරිපත් කළ යෝජනාවට සම්මේලනයේ ඡන්ද වැඩි සංඛ්‍යාවක් ලැබිණි. එසේ වුවත් එම යෝජනාවෙහි බර්න්ෂ්ටයින් වාදීන් දැඩි ලෙස විවේචනයට භාජනය කර නොතිබූ නිසා බර්න්ෂ්ටයින් සහ ඔහුගේ සගයෝද එයට පක්ෂව ඡන්දය දුන්හ.

29 ලෙනින් අදහස් කරන්නේ ලූබෙක් හි පවත්වන ලද ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සම්මේලනයේදී (1901 සැප්තැම්බර් මස 22—28) සම්මත කරගත් යෝජනාව ය. මෙම යෝජනාව සම්මත කරගන්නා ලද්දේ හැනෝවර් සම්මේලනයට අනතුරුව ද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වැඩ පිළිවෙළට සහ උපක්‍රමවලට පහර ගැසීම නොනැවැත්වූ පමණක් නොව, වඩාත් ශක්තිමත් කළ, පාක්ෂික නොවන්නන් අතරට පවා එය ගෙන ගිය බර්න්ෂ්ටයින්ට විරුද්ධවය. විවාදයේදී හා බේබෙල් විසින් ඉදිරිපත් කර සම්මේලනයේ ඡන්ද වැඩි සංඛ්‍යාවකින් සම්මත වූ යෝජනාවෙන් බර්න්ෂ්ටයින්ට අවවාද කරන ලදී. 'විවේචනය කිරීමේ නිදහස' ඉල්ලමින් හා බර්න්ෂ්ටයින් පිළිබඳ ප්‍රශ්නය නොසලකා හරිමින් අවස්ථාවාදී හෙයිනේ ඉදිරිපත් කළ ප්‍රතියෝජනාව සම්මේලනයේදී නිෂ්ප්‍රභා විය. එහෙත්, මාක්ස්වාදය සංශෝධනය කිරීම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය තුළ සිටීම සමග නොගැලපීම පිළිබඳ ප්‍රශ්නය ලූබෙක් සම්මේලනයේදී ප්‍රතිපත්තියක් ලෙස ඉදිරිපත් කරනු නොලැබිණි.

30 1898 ඔක්තෝබර් මස 3 වැනිද සිට 8 වැනිද දක්වා ස්ටුට්ගාට්වල පවත්වන ලද ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සම්මේලනයේදී ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ පවතින සංශෝධනවාදය පිළිබඳ ප්‍රශ්නය පළමුවතාවට සාකච්ඡා කරන ලදී. සම්මේලනයේදී, එයට සහභාගි නොවූ බර්න්ෂ්ටයින්ගේ යෝජනාවක් විවාදයට භාජනය විය. බර්න්ෂ්ටයින් එම යෝජනාවෙන් ඔහු විසින් ඊට පෙර ලිපි මාලාවෙන් ඉදිරිපත් කරන ලද, තම අවස්ථාවාදී අදහස් ඉදිරිපත් කළ අතර ඒවා ආරක්ෂා කළේය. සම්මේලනයේ සිටි බර්න්ෂ්ටයින් විරෝධීන් අතර එකඟතාවයක් නොතිබිණි. ඒ. බේබෙල්. කේ. කවුට්ස්කි සහ වෙනත් අය දෘෂ්ටිමය අරගලයට සහ බර්න්ෂ්ටයින්ගේ වැරදි විවේචනය කිරීමට සහයෝගය දුන් නමුත් ඔහුට පටහැනිව සංවිධානාත්මකව කටයුතු කිරීමට විරුද්ධ වූහ. පී. ලුක්සෙම්බුර්ගේ ප්‍රධානත්වයෙන් යුත් අල්පතර කොටස බර්න්ෂ්ටයින්වාදයට විරුද්ධව වඩාත් තීරණාත්මකව කතාකළහ.

31 නීත්‍යානුකූල මාක්ස්වාදය — 1890 ගණන්වලදී රුසියාවේ ධනපති-ලිබරල්වාදී බුද්ධිමතුන් අතර බිහිවූ සමාජ-දේශපාලනමය ප්‍රවනතාවයකි. තමන් මාක්ස්වාදීන් යැයි කියාගත් ස්ත්‍රුවේ, බුල්ගාකව්, තුගාන්-බරනොව්ස්කි සහ වෙනත් අය මාක්ස්වාදී න්‍යායයේ 'විප්ලවවාදී අධ්‍යාත්මය' වන ධනපති ක්‍රමයේ නොවැළැක්විය හැකි විනාශය පිළිබඳවද, සමාජවාදී විප්ලවය පිළිබඳවද උගැන්වීම සම්පූර්ණයෙන්ම අමතක කර, රදළ වැඩවසම් සමාජ-ආර්ථික සැකැස්ම නොවැලැක්විය හැකි ලෙස ධනවාදී සැකැස්මක් දක්වා වෙනස්වීම පිළිබඳ මාක්ස්වාදී න්‍යාය පමණක් වෙන්කර ගත්හ. රුසියාවේ ධනපති ක්‍රමය සංවර්ධනයවීමේ නොවැලැක්විය හැකි භාවය ප්‍රතික්ෂේප කළ නරෝද්නික්වරුන් විවේචනය කළ "නීත්‍යානුකූල මාක්ස්වාදියෝ" ධනවාදී ක්‍රමය වර්ණනා කළහ. අනතුරුව නීත්‍යානුකූල මාක්ස්වාදීහු, මාක්ස්වාදයේ සතුරන් වූවෝ ධනපති කැඩෙට් පක්ෂයේ නායකයන් බවට පත් වූහ.

32 "හිස උදම්මාගත් ලේඛකයා ගැන..." මක්සිම් ගෝර්කිගේ පළමුවැනි කෙටිකතාවලින් එකක හැඳින්වීම.

33 ලෙනින් අදහස් කරන්නේ 1895 අප්‍රේල් මස නීත්‍යානුකූලව පිටපත් 2000 ක් මුද්‍රණය කර පළ කරන ලද "අප ආර්ථිකයේ තොරතුරු සහ ස්වභාව නිරූපිකතාව" යන කෘතිය ය. "නරෝද්නික්වාදයේ ආර්ථික හරය සහ ස්ත්‍රුවේමහතාගේ පොතේ ඒ පිළිබඳ විවේචනය (ධනේශ්වර සාහිත්‍යය තුළ පෙනෙන මාක්ස්වාදයේ පිළිබිඹුව)" නැමැති ලෙනින්ගේ 'නීත්‍යානුකූල මාක්ස්වාදීන්'ට විරුද්ධ ලිපිය එම කෘතියෙහි පළ විය.

එම කෘතිය බෙදා හැරීම තහනම් කළ සාර්වාදී රජය, අවුරුද්දක්ම එය රජය යටතේ තබාගෙන සිට, පසුව රාජ්‍ය සන්තක කර පුළුස්සා දමන ලදී. පිටපත් 100 ක් පමණක් ආරක්ෂාකර ගත හැකි විය. එම පිටපත් 100 පසුව පීටර්ස්බර්ග්හි හා වෙනත් නගරවල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර බෙදා හරින ලදී.

34 මෙහි අදහස් කරන්නේ විප්ලවවාදී මාක්ස්වාදය ධනපති ප්‍රතිසංස්කරණවාදී අධ්‍යාත්මයක් මත සංශෝධනය කර ඇති. එ. බර්න්ෂ්ටයින්ගේ ‘‘සමාජවාදයේ පූර්ව අවශ්‍යතා සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍යයන්’’ නැමති පොතය.

බර්න්ෂ්ටයින්ගේ මෙම පොත 1901 දී රුසියානු භාෂාවට පරිවර්තනය කර විවිධ හැඳින්වීම් යටතේ පළ කරන ලදී: 1) ‘‘ඓතිහසික භෞතිකවාදය’’, 2) ‘‘සමාජමය ගැටළු’’, 3) ‘‘සමාජවාදයේ ගැටළු සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍යයන්’’

35 ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විරුද්ධත්වය’’ලෙනින් විසින් ලියන ලද්දේ 1899 අගෝස්තු මය පිටුවහලේ සිටියදීය. එය ‘‘ආර්ථිකවාදී’’ කණ්ඩායමේ (සෙ. නි. ප්‍රකපෝවිච්, යෙ. දි. කුස්කෝවා සහ වෙනත් අය) “Credo” ප්‍රකාශනයට විරුද්ධව ලියන ලද්දකි. මිනුසින්ස්ක් පලාතේ යෙර්මකොව්ස්කය ගමෙහි ලෙනින්ගේ ප්‍රධානත්වයෙන් රැස්වූ පිටුවහලේ සිටි මාක්ස්වාදීන් 17 දෙනෙක් එම ‘‘විරුද්ධත්වය’’ සාකච්ඡා කර ඒකමතිකව පිළිගත්හ. තුරුහාන්ස්ක්වල සහ ඔර්ලෝව් වල (වියාත්ස්කයා ගුබේර්නියා) පිටුවහලේ සිටියහුද මෙම ‘‘විරුද්ධත්වයට’’ සම්බන්ධ වූහ.

ලෙනින් ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විරුද්ධවය’’ විදේශගත ‘‘ශ්‍රම විමුක්තිය’’ කණ්ඩායම වෙත පිටත්කර හැරියේය. 1900 මුල් භාගයේදී ගි. ව. ප්ලෙහානව් විසින් එය “Vademecum” ‘‘රබෝචිය දියල’’ ‘‘ප්‍රකාශනය සඳහා’’ නැමැති කෘතින් එකතුවේ පළ කරන ලදී.

36 ‘‘රබෝචය’’මිස්ල් — ‘ආර්ථිකවාදීන්ගේ’නිල පත්‍රය වන මෙය 1897 ඔක්තෝබර් මාසයේ සිට 1902 දෙසැම්බර් මාසය දක්වා පළ විය. එළි දුටුවේ කලාප 6 කි.

ජාත්‍යන්තර අවස්ථාවාදයේ රුසියානු ලක්ෂණයක් ලෙස ‘‘රබෝචය මිස්ල්’’දෘෂ්ටිය,ලෙනින් විසින්,විශේෂයෙන්ම ‘‘ඉස්ක්‍රා’’ හි පළ කරන ලද ලිපි මාගීයෙන්ද, මෙම කෘතියෙන්ද විවේචනයට ලක් කරන ලදී.

37 “Vademecum” ‘‘රබෝචය මිස්ල්’’ ප්‍රකාශන සඳහා’’, ගි. ව. ප්ලෙහානව්ගේ පෙරවදනක් සහිතව ‘‘ශ්‍රම විමුක්තිය’’ කණ්ඩායම විසින් පළකරන ලද ලිපි එකතුවකි (ජිනීවා, 1900 පෙබරවාරි මාසය). මෙය රු. ස. ප්‍ර. ක. පක්ෂයේ සාමාජිකයින් අතර ඇති අවස්ථාවාදයටද, ප්‍රධාන වශයෙන්, විදේශගත ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ’’ ‘ආර්ථිකවාදයට’ සහ එහි නිල ප්‍රකාශනය වන ‘‘රබෝචිය දියල’’ සඟරාවටද විරුද්ධව පළ කරන ලදී.

38 “Profession de foi” (සංකේතය, වැඩ පිළිවෙළ, දෘෂ්ටිය පිළිබඳ ප්‍රකාශනය) 1899 යේ අවසානයේදී රු. ස. ප්‍ර. ක. පක්ෂයේ කීයෙව් කමිටුවේ අවස්ථාවාදී චින්තනය පෙන්නුම් කරන පත්‍රිකාවකි.

මෙම පත්‍රිකාවේ අන්තර්ගත හරය ‘අර්ථිකවාදීන්ගේ’ අප දන්නා “Credo” සමග සියළු අතින්ම ගැලපේ.

39 ‘‘රබෝචය මිස්ල්’’ අතිරේකය’’. ආර්ථිකවාදීන්ගේ ‘‘රබෝචය මිසල්’’ ප්‍රකාශන අංශය විසින් 1899 සැප්තැම්බර් මස පළ කරන ලද පොත් පිංචකි. මෙම පොත් පිංචෙහි, විශේෂයෙන්ම ආර්. එම්. ගේ අත්සන සඳහා වූ ‘අපගේ නියම ස්වභාවය’ නැමති ලිපියෙහි විවෘත ලෙසම අවස්ථාවාදී අදහස් ප්‍රකාශ කර ඇත.

40 ‘‘ශ්‍රම විමුක්තිය’’ කණ්ඩායම — ගි.ව. ප්ලෙහානව් විසින් 1883 දී ස්විට්සර්ලන්තයේ දී පිහිටුවන ලද පළමුවැනි රුසියානු මාක්ස්වාදී කණ්ඩායමය.

‘‘ශ්‍රම විමුක්තිය’’ කණ්ඩායම රුසියාවේ මාක්ස්වාදය ප්‍රචාරය කිරීමේදී අතිමහත් කර්තව්‍යයක් ඉටු කළේය. කාල් මාක්ස්ගේ හා ප්‍රෙඩ්රික් එංගල්ස්ගේ කෘතීන් රුසියානු භාෂාවෙන් විදේශීය රටවලදී මුද්‍රණය කර රුසියාවේ පතුරුවා හැරියේය. එසේම තම ප්‍රකාශනවලද මාක්ස්වාදය පිළිබඳ ලිපි පළ කළේය.‘‘ශ්‍රම විමුක්ති’’ කණ්ඩායම නරෝද්නික්වාදයට දැඩි ලෙස පහර ගැසීය. ප්ලෙහානව් විසින් ලියා ‘ශ්‍රම විමුක්තිය’ කණ්ඩායම විසින් ප්‍රකාශයට පත් කරන ලද රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ වැඩපිළිවෙළවල් කෙටුම්පත් දෙක, (1883 සහ 1885) රුසියාවෙහි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය පිහිටුවීමේ හා එයට සූදානම් වීමේ වැදගත් පියවරක් විය.

ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයත් සමග සම්බන්ධකම් ඇතිකරගත් ‘‘ශ්‍රම විමුක්තිය’’ කණ්ඩායම 1889 දී පැවැත්වූ දෙවැනි ජාත්‍යන්තරයේ පළමුවැනි සම්මේලනවාරයේ සිට එහි සියළුම සම්මේලන වාරවලදී රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය

නියෝජනය කළේය. ඒ කෙසේ වෙතත් ''ශ්‍රම විමුක්තිය'' කණ්ඩායමද බරපතල වැරදි කීපයක්ම කළේය: එය ලිබරල්-ධනපතීන්ගේ ක්‍රියාකාරිත්වය අවශ්‍ය පමණට වඩා සැලකිල්ලට යොමු කළ අතර නිර්ධන පංතික විප්ලවයේ අතිරේක හමුදව මෙන් ගොවි ජනතාවේ ඇති විප්ලවවාදී ස්වභාවය සැලකිල්ලට නොගත්තේය. මෙම වැරදි ප්ලෙහානව්ගේ සහ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ගේ අනාගත මෙන්ෂෙවික්වාදී දෘෂ්ටියේ බීජාංකුරය විය.

41 ''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ'' තුන්වැනි සම්මේලනය — 1901 සැප්තැම්බර් මස අග භාගයේදී සූරිච් නගරයේදී පවත්වන ලදී. 1901 ජූනි මස පවත්වන ලද ජිනීවා සම්මේලනයේදී සැලසුම් කළ, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විදේශගත සංවිධාන ඒකාබද්ධ වීම පිළිබඳ ගිවිසුම් කෙටුම්පතට සශෝධන සහ යෝජනා මෙම සම්මේලනයේදී ස්ථිර කරගන්නා ලදී. එසේම සශෝධනවාදීන් උද්‍යෝගිමත් කළ, ''රබෝචිය දියල'' ප්‍රකාශන සඳහා උපදේශ මාලාවක්ද සම්මේලනයේදී ස්ථිර කරගන්නා ලදී. ''සංගමයේ'' ක්‍රියාකාරී නායකයින් අවස්ථාවාදී මනෝභාවයෙන් යුත් බවටද ඔවුන් ජූනි සම්මේලන සභාවේ තීරණයන් ප්‍රතික්ෂේප කරන බවටද සම්මේලනයේ තීරණයන් සාක්ෂි දැරීය.

42 1875 මැයි මස කාල් මාක්ස් ඩී. බ්‍රාක්කෙට ලියූ ලිපිය බලන්න.

43 'ගොතා වැඩ පිළිවෙළ' — 1875 දී ගොත් සම්මේලනයට පෙර ජර්මනියේ වෙන් වශයෙන් පැවති සමාජවාදී පක්ෂ දෙකක් වූ එයිසෙනාහ්ට් සහ ලසාල්වාදීන් එක්සත් වීම නිමිතිකොට එම සම්මේලනයේදී පිළිගන්නා ලද ජර්මනියේ සමාජවාදී කම්කරු පක්ෂයේ වැඩ පිළිවෙළ ගොතා වැඩ පිළිවෙළ යනුවෙන් හැඳින්වේ. වැඩ පිළිවෙළ සාරසංග්‍රහවාදයෙන් පෙළුනු අතර, එයිසෙනාහ්ට්වරු වැදගත් ප්‍රශ්නවලදී ලසාල්යාන් වරුන්ට පක්ෂවී ලාසල්යාන් සූත්‍ර පිළිගත් නිසා එය අවස්ථාවාදී ස්වරූපයක් ගත්තේය. 1868 දී එයිසෙනාහ්වරු සම්මත කරගත් වැඩ පිළිවෙළ හා සසඳන විට ඉහත වැඩ පිළිවෙළ එක් පියවරක් ආපසු තැබීමක් ලෙස සැලකූ කාල් මාක්ස් සහ එංගල්ස් ගොතා වැඩ පිළිවෙළේ කෙටුම් පත දැඩි විවේචනයට භාජනය කළහ.

44 ප්රූඩොන්වාදය — මාක්ස්වාදයට විරුද්ධ සුළු ධනපති-සමාජවාදයේ ප්‍රවණතාවයකි. එය ප්‍රංශ ජාතික න්‍යායාචාර්යවරයෙකු ආරාජිකවාදියෙකු වූ ප්රූඩොන්ගේ නමින් හඳුන්වනු ලැබිණි. ප්රූඩොන් ඉතා දැඩි ලෙස ධනවාදය විවේචනය කළ මුත්, එයින් ගැලවීම ඔහු දුටුවේ දිළිඳුකම, අසමානාත්මතාවය, වැඩ කරන ජනතාව සූරාකෑම ආදිය නොවැලැක්විය හැකි ලෙස උග්‍ර කරන ධනවාදය, විනාශ කිරීම තුළ නොව, ධනවාදයට 'හරිමග පෙන්වීම' එහි ආක්‍රමිකතාවයන් ප්‍රතිසංස්කරණ මාර්ගයෙන් ඉවත්කිරීම තුළය. කම්කරුවන්ට තම නිෂ්පාදන මාධ්‍යයන්ගේ ආධාරයෙන් ඉපයිය හැකි වූද, හස්ත කර්මාන්ත කරුවන් බවට පත්වී තම නිෂ්පාදන භාණ්ඩ 'සාධාරන' මිළකට විකිනීම සහතික කළ හැකි වූද 'මහ ජන' හා 'හුවමාරු' බැංකු සංවිධානය කිරීමේ මාර්ගයෙන් සුළු පරිමාණ පෞද්ගලික අයිතිය අමරණීය කිරීමට ප්රූඩොන් සිහින දිටිය. නිර්ධන පංතියේ ඓතිහාසික කාර්යභාරය තේරුම් නොගත් ප්රූඩොන් පංති අරගලයට ද, නිර්ධන පංතික විප්ලවයට හා නිර්ධන පංතියේ ආඥාදායකත්වයටද පටහැනි විය, ආරාජිකවාදී අදහස් ඇතිව රජයේ අවශ්‍යතාවයන් ප්‍රතික්ෂේප කළේය. තම දෘෂ්ටිය පළමුවැනි ජාත්‍යන්තරය තුළ පැතිරවීමට ප්රූඩොන් ගත් උත්සාහයන්ට විරුද්ධව කාල් මාක්ස් සහ එංගල්ස් විසින් ක්‍රමවත් සටනක් මෙහෙයවන ලදී. පළමුවැනි ජාත්‍යන්තරය තුළ කාල් මාක්ස්, එංගල්ස් සහ ඔවුන්ගේ අනුගාමිකයන් ප්රූඩොන්වාදයට විරුද්ධව ගෙන ගිය තීරණාත්මක සටනින් මාක්ස්වාදයට පූර්ණ ජයග්‍රහණය හිමිවිය.

45 ලෙනින් අදහස් කරන්නේ 1896 දී පිටර්ස්බර්ග් නගරයේ ඇතිවූ පේශකාර්මික කම්කරුවන්ගේ සමන්ත මහා වැඩ වර්ජනය ය. කම්කරුවන්ට සම්පූර්ණ වැටුප් ගෙවීමට කම්මල් හිමියන් ප්‍රතික්ෂේප කිරීම මෙම වැඩ වර්ජනයට හේතු විය. මැයි මස 23 වැනිද කලින්කීන්ස්ක් කර්මාන්ත ශාලාවේ කම්කරුවෝ වැඩ වර්ජනය ආරම්භ කළහ. එය ඉක්මනින්ම පීටර්ස්බර්ග් නගරයේ ප්‍රධාන පේශකාර්මික කම්හල්වලද පැතිර ගිය අතර ඉනික්බිතිව ලියවන පට්ටල්, යන්ත්‍ර සූත්‍ර නිපදවන යෝධ කම්හල්වල සහ වෙනත් ව්‍යවසායන්වලද පැතිර ගියේය. පීටර්ස්බර්ග් නිර්ධනයෝ පළමුවැනි

වරට සූරාකන්නන්ට එරෙහිව පුළුල් පෙරමුණක් ඇතිව සටනට බැස්සාහ. කම්කරුවන් තිස්දහසකට අධික පිරිසක් වැඩ වර්ජනය කළ අතර වැඩ වර්ජනය සිදුවූයේ පීටර්ස්බර්ග් හි ‘කම්කරු පංති විමුක්ති අරගල සංගමයේ’ නායකත්වය යටතේය.

පීටර්ස්බර්ග් වැඩ වර්ජනය මොස්කව් හා රුසියාවේ වෙනත් නගරවල කම්කරු ව්‍යාපාරයට මහත් රුකුලක් වූ අතර එය කර්මාන්ත ශාලා පිළිබඳ නීති මාලාව නැවත සලකාබැලීම කඩිනම් කිරීමටද කම්හල්වල වැඩ කාලය පැය $11^{1}/_{2}$ දක්වා අඩු කිරීම පිළිබඳ නීතිය (1897 ජූනි මස 2(14) වැනි දින) ප්‍රකාශයට පත් කිරීමටද සාර් රජයට බල කර සිටියේය.

46 ‘‘කම්කරු පංති විමුක්ති අරගල සංගමය’’— වී.අයි. ලෙනින්, ඒ. ඒ. වනෙයෙව්, පී. කේ. සපරොෂියෙට්ස්, ජී. ඇම්. ක්‍රිෂිෂනොව්ස්කි, ඇන්. කේ, කෲප්ස්කයා. යූ. ඕ. මර්තිනව් හා වෙනත් අය විසින් 1895 සරත් සමයේදී පීටර්ස්බර්ග් හිදී පිහිටුවන ලද නීතිවිරෝධී සංවිධානයකි. ‘‘අරගල සංගමය’’ මාක්ස්වාදී කව 20 ක් පමණ ඒකාබද්ධ කළාය. ආරම්භයේදී දැඩි විනය හා මධ්‍යගත කිරීම මත එහි සියළුම ක්‍රියාකාරිත්වය සකස් වී තිබිණි.‘‘අරගල සංගමය’’ කම්කරුවන්ගේ ආර්ථික අරගලය දේශපාලන අරගලය හා ඒකාබද්ධ කරමින් කම්කරු ව්‍යාපාරය සාරසංග්‍රහවාදයට විරුද්ධව මෙහෙයවීය. ‘‘අරගල සංගමය’’ කම්කරු පංතියේ විප්ලවකාරී පක්ෂයේ බීජාංකුරය වූ බව ලෙනින් සඳහන් කළේය.

1895 දෙසැම්බර මාසයේදී ලෙනින් ඇතුළු ‘‘අරගල සංගමයේ’’ වෙනත් නායකයින් සාර් රජය විසින් සිරභාරයට ගෙන සයිබීරියාවට පටුවහල් කරන ලදී. ඉනික්බිතිව‘‘අරගල සංගමයේ’’ නායකත්වයට ‘ආර්ථිකවාදය’ දේශනා කළ ඊනියා ‘යෞවනයෝ’ පත්වූහ.

47 ‘‘රුස්කය ස්තරිනා’’ (රුසියානු ඉතිහාසය) 1870 සිට 1918 දක්වා පීටර්ස්බර්ග් නගරයේ පළ කළ ඉතිහාසය පිළබඳ සඟරාවකි. ‘‘රුස්කය ස්තරිනා’’ සඟරාවේ පළවූ ලිපිවලින් ප්‍රධාන ස්ථානය හිමිවූයේ, සැමරුම්, දින පොත්, සටහන්, රුසියානු රාජ්‍ය සේවකයින්ගේ හා සංස්කෘතික සේවකයින්ගේ ලිපි ආදියට සහ විවිධ ලේඛනගත තොරතුරු ආදියටය.

48 මෙහි අදහස් කරන්නේ 1895 අප්‍රේල් මස 27 වැනි දින (මැයි 9) යරස්ලාවල්වල මාහා කර්මාන්ත ශාලාවේ වැඩ නැවත්වූවන් මර්ධනය කිරීම ය. කම්කරුවන් 4000 ක් පමණ සහභාගි වූ මෙම වැඩ වර්ජනයට හේතු වූයේ පාලකයින් විසින් කම්කරුවන්ගේ වැටුප් අඩුවන සේ නව නියමයන් පැනවීමය. වැඩ වර්ජනය බිහිසුණු ලෙස මැඩපවත්වන ලදී.

1895 යරස්ලාවල්වල සිදුවූ එම වැඩ වර්ජනය පිළිබඳ ලෙනින් විසින් ලියන ලද ලිපිය මේ වන තුරුම සොයාගෙන නැත.

49 ‘‘සී.–පීටර්ස්බර්ග් ‘‘රබෝචි ලිස්තොක්’’ (‘‘කම්කරු පත්‍රිකාව’’) — පීටර්ස්බර්ග් ‘‘කම්කරු පංති විමුක්ති අරගල සංගමයේ’’ නිල පත්‍රිකාව ය. පළ වූයේ කලාප දෙකකි: පළමුවැන්න 1897 පෙබරවාරි (ජනවාරියැයි සඳහන්වේ) මස රුසියාවේදීද, දෙවැන්න 1897 දෙසැම්බර් මස ජිනීවාහිදී ද පළ විය.

50 මෙහි සඳහන්වන්නේ රු. ස. ප්‍ර. ක. පක්ෂයේ පළමුවැනි සම්මේලනයේ තීරණය පරිදි එය වෙනුවෙන් රු. ස. ප්‍ර. ක. පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් 1898 දී ප්‍රසිද්ධ කරනලද ‘‘රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ ප්‍රකාශනය’’ පිළිබඳවය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රධාන කර්තව්‍ය ලෙස දේශපාලන අරගලය හා සර්වබලධාරී ඒකාධිපතිවාදය පෙරළා දැමීම සඳහා සටන දිරිගැන් වූ ‘ප්‍රකාශනය’ දේශපාලන අරගලය කම්කරු ව්‍යාපාරයේ පොදු කර්තව්‍ය සමග ඒකාබද්ධ කළේය.

51 ලෙනින් සඳහන් කරන ‘පෞද්ගලික සභාව’ රැස්වූයේ 1897 පෙබරවාරි 14 හා 17 අතර (පෙබරවාරි 26 හා මාර්තු 1 අතර) පීටර්ස්බර්ග්හිදීය. සයිබීරියාවට පිටුවහල් කිරීමට පෙර දින තුනකට සිර අඩස්සියෙන් නිදහස් වූ වි. අයි. ලෙනින්, ඒ. ඒ වනෙයෙව්, ජ. එම්. ක්‍රිෂිෂනොව්ස්කි හා පීටර්ස්බර්ග් ‘‘කම්කරු පංති විමුක්ති අරගල සංගමයේ’’ වෙනත් සාමාජිකයෝ — ‘මහල්ලෝ’ සහ ලෙනින් සිර අඩස්සියට පත්වූවාට පසු අරගල සංගමය පාලනය කළ ‘යෞවනයෝ’ මෙම රැස්වීමට සහභාගි වූහ.

52 ‘‘ලිස්තොක් ‘‘රබෝත්නික’’ ‘සේවකයාගේ පත්‍රිකාව’ — විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ප්‍රකාශනයක් වන මෙය 1896 සිට 1898 දක්වා ජිනීවාහිදී කලින් කල පළ විය. කලාප 10 ක් එළි දුටු අතර ඉන් පළමුවැනි කලාප 8 පළ වූයේ‘‘ශ්‍රම විමුක්තිය’’

කණ්ඩායමේ සංස්කරණය යටතේය. ''සංගමයේ'' සාමාජිකයන්ගෙන් බහුතර කොටස 'ආර්ථිකවාදය' කරා නැඹුරුවීම නිසා ''ශ්‍රම විමුක්තිය'' කණ්ඩායම පත්‍රිකාව සංස්කරණය කිරීම ප්‍රතික්ෂේප කළේය. පත්‍රිකාවේ 9—10 කලාප ආර්ථිකවාදීන්ගේ සංස්කරණය යටතේ පළ විය.

53 ව. ඉ. ගේ ලිපිය — 'ආර්ථිකවාදයේ' එක් නායකයෙකු වන ව්ලදිමීර් පාව්ලවිච් ඉවාන්ෂින්ගේ ලිපිය මෙයින් අදහස් කෙරේ.

54 සාර්වාදී පොලිස් භටයෝ නිල්පාට කබා ඇන්දහ.

55 ව. ව.—දහනවවැනි ශතවර්ෂයේ අවසාන දශක දෙකේදී ලිබරල් නරොද්නික්වාදයේ එක් න්‍යායාචාර්ය වරයෙකු වූ වසීලි පාව්ලොවිච් වරන්ට්සෝව්ගේ ව්‍යාජ නාමය ය. 'රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ව.ව.' යනුවෙන් ලෙනින් අදහස් කරන්නේ එහි අවස්ථාවාදී ප්‍රවනතාවය වන 'ආර්ථිකවාදීන්ය'.

56 "Die Neue Zeit" (''නූතන කාලය'') — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ න්‍යායාත්මක සඟරාව වන මෙය 1883 සිට 1923 දක්වා ෂ්ටුට්ගාර්ට්වල පළ විය. මෙම සඟරාවල කාල් මාක්ස්ගේ සහ ප්‍රෙඩ්රික් එංගල්ස්ගේ ලිපි ගණනාවක්ම පළ විය. එංගල්ස්, සඟරාවේ කතු මඩුල්ලට නිතරම උපදෙස් දුන් අතර සඟරාව සුළු වශයෙන් හෝ මාක්ස්වාදයෙන් ඉවතට නැඹුරු වූ විට එය විවේචනය ද කළේය. 1890 ගණන්වල අගභාගයේ සිට එහි ඒ. බර්න්ෂ්ටයින්ගේ, මාක්ස්වාදයට විරුද්ධ ක්‍රියා පිළිවෙළ ආරම්භ කළ, 'සමාජවාදයේ ගැටළු' ලිපි මාලාව ඇතුළු සංශෝධනවාදීන්ගේ ලිපි නිතරම පළවන්නට විය.

57 1901 නොවැම්බර් මස 2—6 දක්වා පවත්වන ලද අවුස්ත්‍රියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වියනා සම්මේලනයෙදී ගයින්පෙල්ඩ් වැඩ සටහන වෙනුවට (1888) පක්ෂයේ නව වැඩ පිළිවෙළක් සම්මත කරගන්නා ලදී. 1889 දී බ්‍රියුන්ස්ක් සම්මේලනයේ උපදෙය් පිට විශේෂ කමිටුවක් විසින් පිළියෙළ කරන ලද මෙම වැඩ පිළිවෙළවල් කෙටුම් පතේ බර්න්ෂ්ටයින්වාදයට විශාල ඉඩ කඩක් සලසා තිබිණි.

58 මෙහි අදහස වන්නේ, සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව කම්කරු පංතියේ සටන වෙනත් අතකට යොමුකරවීමේ අරමුණු ඇතිව පොලිසියේ හෙන්වයින්ගේ නායකත්වයෙන් 'කම්කරු සමාජය' පිහිටුවීමට ගත් උත්සාහය ය. මෙවැනි සංවිධාන පිහිටුවීමේ උද්යෝගීමත් මූලාරම්භකයා වූයේ පොලිස් කර්නල් වරයෙකු වූ සී. වී. සුබාතව් ය. සුබාතව්ගේ පළමුවැනි සංවිධානය 1901 මැයි මස මොස්කව්වල පිහිටුවන ලදී. එසේම සුබාතව් සංවිධාන මින්ස්ක්, කියෙව් හා වෙනත් නගරවලද බිහි විය.

සුබාතව්වාදයේ ප්‍රතිගාමී ස්වරූපය එළිදරව් කළ විප්ලවකාරී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු කම්කරු පංතියේ පුළුල්තම ස්ථර සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධ අරගලය කෙරෙහි යොමුකරවීම සඳහා මෙම නීත්‍යානුකූල කම්කරු සංවිධාන ප්‍රයෝජනයට ගත්හ. විප්ලවවාදී ව්‍යාපාරයේ වැඩී එන බලපෑම නිසා 1903 දී සුබාතව් සංවිධාන විසුරුවා හැරීමට සාර් රාජාණ්ඩුවට සිදු විය.

59 හිර්ෂ්-දූන්කෙර් වෘත්තීය සමිති — ජර්මනියේ ධනපති ප්‍රගතිශීලී පක්ෂයේ නායකයින් වන එම්. හිර්ෂ් සහ එෆ්. දූන්කෙර් විසින් 1868 දී පිහිටුවන ලද ප්‍රතිසංස්කරණවාදී වෘත්තීය සංවිධාන මෙනමින් හඳුන්වන ලදී. ශ්‍රමයේ සහ ප්‍රාග්ධනයේ අවශ්‍යතාවයන්ගේ ඒකාබද්ධතාවය දේශනා කළ හිර්ෂ්-දූන්කෙර් වෘත්තීය සමිතිවල සංවිධායකයෝ, කම්කරුවන් හැරුනු විට ධනපතීන්ද සමිතිවලට බඳවා ගත යුතුයයි සැලකූහ, වැඩ වර්ජන අරගලයේ වැදගත්කම ප්‍රතික්ෂේප කළහ. කම්කරු පංතියට ප්‍රාග්ධනයේ පීඩනයෙන් සහනයක් ලබාගත හැක්කේ, වෘත්තීය සමිති සංවිධාන ආධාරයෙන් ධනපති රජය ව්‍යවස්ථාදයක රජයක් කිරීමේ මාර්ගයෙන් ධනවාදී සමාජමය රාමුවක් තුළ' යයි ඔවුහු ප්‍රකාශකර සිටියහ. වෘත්තීය සමිතිවල මූලික කර්තව්‍ය ඔවුන් දුටුවේ කම්කරුවන් හා හාම්පුතුන් අතර මැදිහත්ව කටයුතු කිරීම සහ මුදල් මාධ්‍යයන් සමුච්චය කිරීම තුළය. ප්‍රධාන වශයෙන් අන්‍යොන්‍ය ආධාර සමිති හා සංස්කෘතික -අධ්‍යාපනික කටයුතුවලට පමණක් ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය සීමා විය.

60 'කම්කරු පංතියේ ස්වයං විමුක්ති කණ්ඩායම' — 'ආර්ථිකවාදීන්ගේ, සුළු සංවිධානයකි; 1898 සරත් සමයේදී පීටර්ස්බර්ග් හි බිහිවූ මෙය මාස කීපයක් පමණක් පැවැත්තේය.

කණ්ඩායම තම අරමුණුද, ව්‍යවස්ථාවද කම්කරුවන්ට ප්‍රකාශකර පත්‍රිකාද ඉදිරිපත් කළේය. (1899 මාර්තු දතම ඇතිව 1899 ජූලි මස‘නකනුනි’ (‘පූර්වාසන්නය’) සඟරාවේ මුද්‍රණය කරන ලදී).

61 ‘‘නකනුනි’’ (පූර්වාසන්නය) — නරෝද්නික්වාදී මාසික සඟරාවකි. 1899 ජනවාරි මස සිට 1902 පෙබරවාරි දක්වා ලන්ඩන් හිදී රුසියන් භාෂාවෙන් මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී. එළි දැක්කේ කලාප 37 ක් පමණකි.

62 නරෝද්නික්වාදය — 1860—1870 අවුරුදුවලදී රුසියානු විප්ලවවාදී ව්‍යාපාරය තුළ පැන නැගි සුළු ධනවාදී ප්‍රවණතාවයකි.සර්වබලධාරී ඒකාධිපතිත්වය විනාශ කිරීම සහ රදළ ඉඩම් හිමියන්ගේ ඉඩම් ගොවීන්ට බෙද දීම සඳහා නරෝද්නික්වාදීහු සටන් කළහ.

රුසියාව තුළ ධනපති සබඳකම්වල වර්ධනයේ ක්‍රමානුකූල භාවය ප්‍රතික්ෂේප කළ නරෝද්නික්වරු එයට අනුකූලව ප්‍රධානතම බලවේගය වන්නේ නිර්ධන පංතිය බව නොපිළිගත් අතර, ගොවි ජනතාව තුළ හා ගම්බද ගොවි ජනපද තුළ සමාජවාදයේ කලල රූපය දුටහ. ඓතිහාසික ක්‍රියාදමය තුළ ඇති බහු ජනතාවගේ කාර්යභාරය නොපිළිගත් ඔවුහු නරෝද්නික්වාදයේ චින්තනය අනුව, අක්‍රියාකාරිත්වයට ප්‍රතිවිරුද්ධව නැගී සිටින ශ්‍රෙෂ්ඨ පුද්ගලයින් විසින් ඉතිහාසය නිර්මාණය කරනු ලබන බව කියා සිටියහ. සර්වබලධාරී ඒකාධිපතිත්වයට විරුද්ධව සටන සඳහා ගොවිජනතාව පෙළඹවීමට නිරෝද්නික්වරු ගම්බද ගොවි ‘ජනතාව වෙතට’ (‘නරෝද්නූ’) ගියහ (ඔවුන්ට ‘නරෝද්නික්වරු’ යන හැඳින්වීම ලැබුණේ එයිනි). එහෙත් ජනතාවගේ සහාය ඔවුන්ට නොලැබුණේය.

නරෝද්නික්වාදය විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ සිට ලිබරල් වාදය දක්වා වූ පරිවර්තන අවධි කීපයකටම මුහුණ පෑවේය.

1880, 1890 ගණන්වලදී සාර්වාදය සමග සමාදන වීමේ මග ගත් නරෝද්නික්වාදය කුලාකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් මාක්ස්වාදයට විරුද්ධව සටන මෙහෙයවිය.

63 මෙහි අදහස් කරන්නේ සමාජවාදීන්ට විරුද්ධ අති විශේෂ නීතිය ක්‍රියාත්මක කළ කාලයේ ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පුවත් පත වූ ‘‘Der Sozial ‘‘Demokrat” (‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා’’) පත්‍රය ගැනය.එය 1879 සැප්තැම්බර් මස සිට 1888 සැප්තැම්බර් මාසය දක්වා සූරිච් හිදීද 1888 ඔක්තෝබර් මාසයේ සිට 1890 සැප්තැම්බර් දක්වා ලන්ඩන්හිදීද මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

64 ගියෝර්ගි වලෙන්තිනවිච් ප්ලෙහානව්, නිකලායි බෙල්තව්ගේ ආරූඪ නාමයෙන් 1895 දී, ‘‘ඉතිහාසය කෙරෙහි අද්වෛතවාදී චින්තනයේ වර්ධනය පිළිබඳ ගැටළු’’ නැමැති කෘතිය, පීටර්ස්බර්ග් හිදී නීතියෙන් අවසර දී ඇති මුද්‍රණාලයක මුද්‍රණය කර ප්‍රසිද්ධ කළේය.

65 මෙහි සඳහන් වන්නේ නර්ට්සිස් තුපරීලව්ගේ අත්සන සහිතව ‘‘සර්යා’’ පළමුවැනි කලාපයේ පළ කරන ලද ‘නූතන රුසියානු සමාජවාදියාගේ ගීතිකාව, නැමැති උපහාසාත්මක පද්‍යය ගැනය. සාංසිද්ධික ව්‍යාපාරය කෙරෙහි හැඩගැසීමට ‘ආර්ථිකවාදීන්ට’ ඇති හැකියාව එහි උපහාසයට ලක්කර තිබිණි. පද්‍ය රචකයා යූ. ඕ. මාර්තව් ය.

66 මෙහි අදහස් වන්නේ ‘‘විදේශගත රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය’’ ය (අංක 16 සටහන බලන්න.)

67 1889 දී ගොවි ජනතාව මත රදළ ඉඩම් හිමියන්ගේ ආධිපත්‍ය තහවුරු කිරීමේ අරමුණ ඇතිව සාර් රාජාණ්ඩුව විසින් ගම් පරිපාලක ධූරයක් ආරම්භ කරන ලදී. ඒ ඒ ප්‍රදේශවලම රදළ-ඉඩම්හිමියන් අතරින් පත් කරන ලද ප්‍රාදේශීය නිලධාරීන්ට අතිමහත් පරිපාලන බලය පමණක් නොව. ගොවි ජනතාව සිරභාරයට ගැනීම කස පහර දීම හැරුනු විට ගොවීන් හා සම්බන්ධ අධිකරන බලය පවා හිමි විය.

68 බුන්ඩ් — 1894 දී විල්නො හි පැවැත් වූ යුරෝපීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කණ්ඩායම්වල ව්‍යවස්ථාදයක සම්මේලනයේදී සංවිධානය කරන ලද, ලිතුවේනියාවේ පෝලන්තයේ හා රුසියාවේ සමස්ත යුරෝපීය කම්කරු සංගමය මෙනමින් හැඳින්විණි. මෙය වැඩි වශයෙන්ම රුසියාවේ අපරදිග ප්‍රදේශවල යුරෝපීය හස්ත කර්මාන්ත කරුවන්ගේ අර්ධ නිර්ධන පංතික කොටස ඒකරාශී කළේය. රුසියානු කම්කරු ව්‍යාපාරය තුළ ජාතිවාදය හා සෙපරේට්වාදය (කාණ්ඩවාදය) බෝකරන්නන් වූ බුන්ඩ්වාදීහු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් ප්‍රශ්නවලදී අවස්ථාවාදී පැත්ත ගත්හ.

69 මුක්ති ගෙවීම් — 1861 පෙබරවාරි මස 19 වැනි දින ප්‍රවේනිදාස අයිතිය ඉවත්කර ගැනීම පිළිබඳ ‘කොන්දේසි’ වලට එකඟව ගොවීන් විසින් ලබාගන්නා ලද වගා බිම් කොටස් බේරා ගැනීම සඳහා ඉඩම් හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් මුක්ති ගෙවීම් ලෙස හැඳින්වේ. මුක්ති ගෙවීම් මුදල බිම් කොටස්වල වටිනාකමට වඩා කීප ගුණයකින් වැඩි විය. මුක්ති ගෙවීම් කිරීමේදී, ඇත්ත වශයෙන්ම, ගොවියෝ නුදුරු අතීතයේදී ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා තුබූ ඉඩම් සඳහා පමණක් නොව, තම පෞද්ගල නිදහස සඳහාද ගෙවූහ. ගොවීන්ට ඉසිලිය නොහැකි එම මුක්ති ගෙවීම් නිසා ඔවුහු මහත් විනාශයට හා දිළිඳු භාවයට මුහුණ දුන්හ.

1905—1907 පළමුවැනි රුසියානු විප්ලවය සමයේදී ගොවි ව්‍යාපාරයේ බලපෑම නිසා 1907 ජනවාරි මාසයේ සිට මුක්ති ගෙවීම් ඉවත් කිරීමට සාර්වාදී රජයට සිදු විය.

70 1891—1892 මහා දුර්භික්ෂයට පසු සාර්වාදී රුසියාවේ දුර්භික්ෂ ගණනාවක්ම ඇති විය. නිරාහාරයෙන් පෙළෙන්නන්ට ආධාර දීම වෙනුවට, ප්‍රධාන වශයෙන්, මුදල් එකතු කිරීමෙන් හා ආහාරපාන එකතු කිරීමෙන්ද, කුසගින්නෙන් හා රෝගවලින් පෙළෙන්නන් සඳහා ආපනශාලා, බෙහෙත්ශාලා පිහිටුවීමෙන් ආදී වශයෙන්ද ආධාර කිරීමට ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වූ සමාජසේවා සංවිධානවලට, සෙම්ස්ත්වොවරුන්ට වෛද්‍යවරුන්ට හා විවිධ පුද්ගලයින්ට විරුද්ධව සාර්වාදී රජය කටයුතු කළේය. 1901 දී නැවතත් ගුබේර්නියා ගණනාවකම දුර්භික්ෂය පැතිරගිය විට සාර් රජයේ ස්වදේශීය කටයුතු භාර ඇමති සිපියාගින් 1901 දී අඩු අස්වැන්නක් ලැබූ ගුබේර්නියාවල ‘නිලධාරීන්ට’ චක්‍ර ලේඛනයක් නිකුත් කළේය. කුසගින්නෙන් පෙළෙන්නන් සඳහා සමාජ සේවා සංවිධාන සහ විවිධ පුද්ගලයින් දෙන ආධාර සැලකිල්ලට භාජනය කළ එම චක්‍ර ලේඛනය, එහි සඳහන් පරිදි, ‘‘සම්පූර්ණයෙන්ම සමතයකට පත්ව නැති අවශ්‍යතාවයන්ද ඒ යටතේ ආර්ථිකයේ රෝගවල හා පැටලිලිසහිත භාවයද නොවැලැක්විය හැකි ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයන්ට මහත් රුකුලක් ලබාදෙන’’ නිසා එම සමාජ සේවා සංවිධානවල සහ විවිධ පුද්ගලයන්ගේ ක්‍රියාකාරිත්වය සීමා කරන ලෙසත් ඒ මත දැඩි පාලනයක් යොදවන ලෙසත් ගුබේර්නියා ආණ්ඩුකාරවරුන්ට දන්වා සිටියේය. සාගින්නෙන් පෙළෙන්නන් සඳහා ආපන ශාලා පිහිටුවීම හා වෙනත් ආධාර දීම, දුර්භික්ෂය පැවැති ගුබේර්නියාවල ආණ්ඩුකාර වරු සමාජ සේවා සංවිධානවලට හා විවිධ පුද්ගලයින්ට තහනම් කළහ.

71 මෙහි අදහස් කරන්නේ දුර්භික්ෂය පැවැති ගුබේර්නියාවල ගොවීන් දුම්රිය මාර්ග තැනීම හා වෙනත් වැඩ සඳහා යවන ලෙස සාර් රජය ප්‍රාදේශීය පලකයින් වෙත නිකුත්කළ ‘තාවකාලික නියෝගය’’ ය. එම නියෝගය අනුව අයිතිවාසිකම් අහිමි ගොවීන්ගේ අයිතිවාසිකම් ක්ෂණික ලෙස සීමා විය. කම්කරු හමුද, සිරකරුවන් සිරකඳවුරු කරා ගෙන යන ආකාරයට, විශේෂ නිලධාරීන් යටතේ වැඩ පළවල් කරා පිටත්කර හරින ලදී.

72 මෙහි අදහස් කරන්නේ 1901 පෙබරවාරි මාසයේ මොස්කව්, කියෙව්, හාර්කොව්, කසාන් තෝම්ස්ක් හා රුසියාවේ වෙනත් නගරවල ශිෂ්‍යයන් විසින් හා කම්කරුවන් විසින් ඇතිකරන ලද විප්ලවකාරී කැළඹිලි වන දේශපාලන පෙළපාලි, රැස්වීම්, වැඩ වර්ජන ආදිය ගැනය.

අධ්‍යයන තත්වයන්ගේ පදනම මත 1900—1901 අධ්‍යයන වර්ෂයේදී පැන නැග ශිෂ්‍ය ව්‍යාපාරය අනතුරුව සර්වබලධාරී ඒකාධිපතිත්වයේ ප්‍රතිගාමීත්වයට විරුද්ධ විප්ලවවාදී දේශපාලන ව්‍යපාරයක ස්වරූපයක් ගත්තේය. දියුණු කම්කරුවන්ගේ සහයෝගය එයට ලැබුණු අතර රුසියානු සමාජයේ සියළුම ස්ථරවල ආධාරයද ලැබිණි. ශිෂ්‍ය රැස්වීමකට සහභාගි වීම නිසා කියෙව් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් 183 දෙනෙක් යුද හමුදවට බලෙන් බැන්දවීම 1901 පෙබරවාරි, මාර්තු මාසවල සිදුවූ පෙළපාලිවලට හා වැඩ වර්ජන වලට මූලික හේතුව විය. රජය විප්ලවකාරී කැළඹිලිවලට සහභාගි වූවන්ට විරුද්ධව මර්දනකාරී ක්‍රියා පිළිවෙළක් ගෙන ගියේය: පොලිසිය හා කොසාක්වරු පෙළපාලි විසුරුවා හැරි අතර පෙළපාලිවලට සහභාගි වූවන්ට පහර දුන්හ. සිය ගණනක් ශිෂ්‍යයින් සිරභාරයට පත්වූ අතර උසස් අධ්‍යාපන ආයතනවලින්ද නෙරපා හැරිණි. විශේෂයෙන්ම, පීටර්ස්බර්ග්හි කසාන්ස්ක් දේවස්ථානය ඉදිරිපිට චතුරශ්‍රයේ 1901 මාර්තු මස 4 (17) වැනි දින පැවැති පෙළපාලිය, ඉතා බිහිසුණු ලෙස මැඩ පැවැත් විනි.

73 ‘‘ස්වබෝද’’ (නිදහස) — 1901 මැයි මාසයේදී බිහිවූ ‘ස්වබෝද’ නැමැති කණ්ඩායම විසින් 1901 සිට 1902 දක්වා ස්විට්සර්ලන්තයේ

මුද්‍රණය කර පළ කරන ලද සඟරාවකි. පසුව මෙම කණ්ඩායම තමන් විසින්ම 'විප්ලවවාදී-සමාජවාදී' කණ්ඩායම යනුවෙන් හඳුන්වාගන්නා ලදී. 1901 දී හා 1902 දී එක් එක් කලාපය බැගින් කලාප දෙකක් පමණක් පළ විය. තම සඟරාවේ පළවූ ලිපි මාර්ගයෙන් ''ආර්ථිකවාදයට' සහයෝගය දැක්වූ 'ස්වබෝද' කණ්ඩායම රුසියාවේ ''ඉස්ක්‍රා'' විරෝධීන්ට අනුග්‍රහය දක්වන ලිපිද පළ කළේය. 1903 දී මෙම කණ්ඩායම විසුරුවා හරින ලදී.

74 කාල් මාක්ස් හා ප්‍රෙඩරික් එංගල්ස්, කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය බලන්න. (වෙළුම් දෙකකින් යුත් තෝරාගත් කෘතීන්, පළමුවැනි වෙළුම, 1955, පිටු 39).

75 සෙම්ස්ත්වොවරු — සෙම්ස්ත්වොවාදයේ නායකයෝ.

සෙම්ස්ත්වොවාදය — 1864 දී රුසියාවේ මධ්‍යම ගුබෙර්නියා වල රදළ වංශාධිපතීන්ගේ පාලනය යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය ස්වයං පාලන සංවිධාන මේ නමින් හඳුන්වන ලදී. සෙම්ස්ත්වොවාදීන්ගේ නීත්‍යානුකූල බලය ස්වකීය ප්‍රදේශයේ ආර්ථික ගැටළු මත පමණක් සීමා විය: (අරෝග්‍යශාලා ගොඩනැගීම, මහා මාර්ග තැනීම, රක්ෂනය හා වෙනත් කටයුතු.) රාජ්‍ය විරෝධී සියළුම කටයුතු තහනම් කිරීමේ බලය සතු ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ හා ගුබෙර්නියා ආණ්ඩුකාරවරුන්ගේ පාලනය යටතේ සෙම්ස්ත්වො සංවිධාන ක්‍රියා කළහ.

සෙම්ස්ත්වො නායකයින්ගෙන් වැඩි දෙනා ලිබරල්වාදී බුද්ධිමතුන් වූ වෛද්‍යවරු, කෘෂි විද්‍යාඥයෝ හා ගුරුවරු වූහ. විසිවැනි සියවසේ ආරම්භය වන විට සෙම්ස්ත්වො-ලිබරල්වාදීන්ගේ විරුද්ධ පාක්ෂික ව්‍යාපාරය වඩාත් ශක්තිමත් විය. සෙම්ස්ත්වොවරු තම රැස්වීම්වලදී තමන්ගේ බලය තවතවත් පුළුල්කර ගැනීමේ යෝජනා කෙටුම්පත් ඉදිරිපත් කළ අතර ප්‍රතිසංස්කරණය ඉල්ලා සාර් රජය වෙත පිළිගැන්වීම සඳහා පෙත්සම්ද සම්මත කරගත්හ.

76 දෙවැනි අලෙක්සාන්දර් සාර්රජුගේ රුසියාවේ ප්‍රවේණිදස අයිතිය ඉවත් කිරීමේ පනත ප්‍රකාශයට පත් කරන ලද්දේ 1861 පෙබරවාරි 19 වැනිදය. එම සිද්ධිය පිළිබඳ හතලිස් වැනි සංවත්සරය නිමිත්තෙන් වී. අයි. ලෙනින් විසින් ''ඉස්ක්‍රා'' පත්‍රයේ තුන්වැනි කලාපයේ ''කම්කරු පක්ෂය හා ගොවි ජනතාව'' යන මැයෙන් ලිපියක් පළ කරන ලදී.

77 මෙහි සඳහන් වන්නේ 1901 දී ෂ්ටුට්ගාට් හිදී ''සර්යා'' කර්තෘ මණ්ඩලයේ ආර්. එන්. සී. ගේ (පී.බී. ස්ත්‍රැවේ) පෙරවදනක් සමග ''සර්වබලධාරී ඒකාධිපතිත්වය සහ සෙම්ස්ත්වොවාදය'' යන හිසින් පළවූ, මුදල් ඇමැති සී. යූ. වීත්තේ විසින් සාර් රජ වෙත ඉදිරිපත් කිරීම සඳහා ලියන ලද රහස්‍ය ලිපිය පිළිබඳවය. සෙම්ස්ත්වොවාදය සම්බන්ධව ගත් කල එයට දැඩි විරුද්ධවාදීකමක් දක්වමින් සෙම්ස්ත්වො වරුන්ගේ පැවැත්ම සර්වබලධාරී ඒකාධිපතිත්වය සමග නොගැළපෙන බව තම ලිපියෙන් කියා සිටි වීත්තේ, සෙම්ස්ත්වොවාදය නීතිගත කළ දින සිටම සාර් රජය ඔවුන්ගේ අයිතිවාසිකම් හා ආධිපත්‍යය සීමාකිරීමේ හා අඩුකිරීමේ පිළිවෙතක් ගෙනගිය බව පෙන්නුම් කරන ලිපි ලේඛන විශාල සංඛ්‍යාවක්ද ඉදිරිපත් කළේය. ධනපති-ලිබරල්වාදී පදනමක් මත ලියන ලද ස්ත්‍රැවේගේ පෙරවදන 'ලිපිය' විවේචනයට භාජනය කරයි. වීත්තේගේ 'ලිපිය' හා ස්ත්‍රැවෙගේ පෙරවදන පිළිබඳ වී. අයි. ලෙනින්ගේ ''සෙම්ස්ත්වොවාදය ලුහුබඳින්නෝ හා ලිබරල්වාදයේ අනිබාල්වරු'' නැමැති ලිපිය බලන්න.

78 මෙහි අදහස් කරන්නේ 1901 ජූනි 8 වැන දින, සයිබීරියාවේ ඉඩම් මිළයට හා බද්දට ගන්නා රදළ වංශාධිපතීන්ට මහත් ලාභ ගෙන දෙන සේ සයිබීරියාවේ පිහිටි රජයේ ඉඩම් ඔවුන්ට ලබාදීම පිළිබඳ සාර් රජය විසින් ප්‍රකාශයට පත් කළ පනත පිළිබඳවය.

79 ''රසියා'' (රුසියාව) — 1899 සිට 1902 දක්වා පීටර්ස්බර්ග් හි පළවූ අර්ධ ලිබරල්වාදී දිනපතා පුවත් පතකි.

80 ''යටහත් සේවක'' යන යෙදුම රුසියානු සාහිත්‍යයෙහි භාවිතා කරනු ලබන්නේ ප්‍රතිපත්තියක් නොමැතිකම, වාසිය තැකීම, උසස් පැළැන්තියට දසකම් කිරීමට හීන මාන ලෙස සූදානම්ව සිටීම පෙන්නුම් කිරීමටය.

81 පංති අරගලය පිළිබඳ බ්‍රෙන්ටානො අර්ථ නිරූපනය, 'බ්‍රෙන්ටානොවාදය' — පැක්ටරි ව්‍යවස්ථා මාලා මගින් හා කම්කරු වෘත්තීය සමිති සංවිධානය කිරීම මගින් ධනවාදී රාමුවක් තුළ කම්කරු ප්‍රශ්න විසඳිය හැකියයි දේශනා කළ ලිබරල් ධනවාදී ඉගැන්වීමකි. කැතීඩර්-සමාජවාදයේ ප්‍රධානතම නියෝජිතයින්ගෙන් එකකු වන මියුනික් විශ්ව වශ්ව විද්‍යාලයේ ආර්ථික දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්යළුල්. බ්‍රෙන්ටානොගේ නාමය මෙයට ලැබිණි.

82 ''ප්‍රාග්ධනයට විරුද්ධ සටන සඳහා කම්කරු කණ්ඩායම''කම්කරුවන් හා බුද්ධිමතුන් කීපදෙනෙකුගෙන් සමන්විතව 1899 දී වි. අ. ගුතොව්ස්කි විසින් පීටර්ස්බර්ග්හි පිහිටුවන ලද සංවිධානයකි. පීටර්ස්බර්ග් කම්කරු ව්‍යාපාරය සමග කිට්ටු සම්බන්ධකම් නොපැවැත්වූ මෙය, 1899 ග්‍රීෂ්ම සෘතුවේදී එහි සියළුම සාමාජිකයන් සිරභාරයට ගැනීමෙන් පසු විසුරුවා හරිනු ලැබීය. එම සංවිධානය තම දෘෂ්ටිය අනුව ආර්ථිකවාදයට වඩාත් කිට්ටු විය.

83 නර්ට්සිස් — ජලය මත දිස්වූ තම රූපය දැක තමාටම ආලය කිරීමට ගත් ග්‍රීක දේව පුරාණයේ කඩවසම් තරුණයෙකි.

84 අක්සෙල්රොද් විසින් පළකරන ලද ''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නවතම කර්තව්‍යයන් හා උපක්‍රම පිළිබඳ ප්‍රශ්න'' නැමැති පොතට එන්. එන්. (සි. එන්. ප්‍රකපෝවිච්ගේ රහස් නාමය) 'ආර්ථිකවාදී 'පදනමක් මත සිට අක්සෙල්රොද් විවේචනය කරමින් දුන් පිළිතුර මෙයින් අදහස් කෙරේ. මෙය ගි.ව. ප්ලෙහානව් විසින් "Vademecum ''රබෝචිය දියල'' සඳහා'' (1900) පත්‍රයෙහි මුද්‍රණය කරන ලදී.

85 අප දන්නා පරිදි මෙහි සඳහන් වන්නේ 1901 දී සිදුවූ වි. අයි. ලෙනින්ගේ හා අ. ස. මර්තිනව්ගේ පළමුවන හමුවීම පිළිබඳව ය

86 සුබාතව්වාදය පිළිබඳ 58 වැනි සටහන බලන්න.

87 ස්ත්‍රුවේවාදය — පි. බ. ස්ත්‍රුවේ නියෝජනය කළ 'නීත්‍යානුකූල මාක්ස්වාදය, ධනපති ලිබරල්වාදය මෙනමින් හැඳින්වේ.

88 අපනාසි ඉවානවිච් හා පුල්හේරිය ඉවානව්නා — රුසියන් ගත්කරුවකු වන නි.ව.ගෝගොල් විසින්''ආදිකාලෙ ඉඩම්හිමියෝ'' නැමැති නවකතාවෙහි නිර්මාණය කරන ලද ඉතාමත්ම පටු උවමනාවන් පෙරදැරි කරගත් ඉඩම් හිමි යුවලකි.

89 ලෙනින් මෙහි අදහස් කරන්නේ ඔහු විසින් නායකත්වය දෙන ලද පීටර්ස්බර්ග් සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ('මහල්ලන්ගේ') කවය පිළිබඳවය. එම කවයේ අත්තිවාරම මත 1895 දී ''කම්කරු විමුක්ති අරගල සංගමය'' පිහිටුවන ලදී.

90 ''සිම්ලියා ඊ වෝලිය'' වරු — විප්ලවවාදී නරෝද්නික්වරුන් විසින් 1876 දී පීටර්ස්බර්ග්හිදී පිහිටුවන ලද''සිම්ලියා ඊ වෝලිය'' ('ඉඩම් හා නිදහස') නැමැති රහස් සංවිධානයේ සාමාජිකයෝ මෙනමින් හඳුන්වනු ලැබූහ.

දැඩි විනයගරුකකම හා මධ්‍යගතභාවය පදනම් කරගෙන සංවිධානය ගොඩ නැගිණි. තම අවසාන අරමුණ ලෙස සමාජවාදය ප්‍රතික්ෂේප නොකළ''සෙම්ලියා ඊ වෝලිය''තම ක්ෂණික ඉලක්කය ලෙස ජනතා ඉල්ලීම් පමණක් සැලකුවේය. එනම් එම අවස්ථාවේ පැවති අවශ්‍යතාවයන් වන 'ඉඩම් හා නිදහස' පිළිබඳ ඉල්ලීම් පමණක් ඉදිරිපත් කළේය.

රුසියාවේ ප්‍රධානම විප්ලවවාදී බලවේගය ගොවි ජනතාව යැයි පිළිගත් ''සිම්ලියා ඊ වෝලිය'' වරු, සාර්වාදයට විරුද්ධ කැරළි ගැසීම් සඳහා ගොවීන් දිරිගැන්වීමට උත්සාහ ගත්හ, රුසියාවේ ගුබේර්නියාවල උද්ඝෝෂණ කටයුතු ගෙන ගියහ.

ගොවීන් අතර සමාජවාදී උදඝෝෂණ ගෙනයෑම අසාර්ථකවීම හා ආණ්ඩුවේ මර්ධනකාරී පීඩනය උග්‍රවීම නිසා 1879 දී''සිම්ලියා ඊ වෝලිය'' සංවිධානය තුළ ත්‍රස්තවාදී කණ්ඩායමක් බිහිවිය. සාර්වාදයට විරුද්ධ විප්ලවවාදී අරගලයේ ප්‍රධානතම මාධ්‍යය වන්නේ සාර් රාජාණ්ඩුවේ නායකයින්ට විරුද්ධව ත්‍රස්තවාදී ලෙස කටයුතු කිරීම බව පිළිගත් ඔවුහු ගොවීන් අතර විප්ලවවාදී උද්ඝෝෂණ ගෙනයෑම ප්‍රතික්ෂේප කළහ. එම අවුරුද්දේම වරෝනිෂ්වල පවත්වන ලද සම්මේලනයේදී ''සිම්ලියා ඊ වෝලිය'' ත්‍රස්තවාදී මාගීය ගත් ''නරෝද්නය වෝලිය'' හා ''සෙම්ලියා ඊ වෝලිය' පදනම මතම ඉතුරු වූ''චෝර්නි පිරිදියල්'' ('කළු බෙදීම') නමින් කොටස් දෙකකට බෙදිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ''චෝර්නි පිරිදියල්'' කණ්ඩායමෙන් කොටසක් — ප්ලෙහානව්, අක්සෙල්රොද්, සසූලිච්, ඉග්නාතව්, ආදීහු මාක්ස්වාදය පිළිගෙන, 1883 දී විදේශීය රටකදී පළමුවැනි රුසියානු මාක්ස්වාදී සංවිධානය වන ''ශ්‍රම විමුක්තිය'' කණ්ඩායම පිහිටවූහ.

91 මෙහි අදහස් කරන්නේ 1901 දී ''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය''විසින් ජිනීවාහිදී පළකරන ලද,''1900 පැරිස් ජාත්‍යන්තර සම්මේලනය සඳහා රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය පිළිබඳ වාර්තාව'' නම් පොත් පිංච පිළිබඳවය. 'සංගමයේ' නියමය පරිදි ''රබෝචිය දියල'' කර්තෘ මණ්ඩලය විසින් මෙම වාර්තාව පිළියෙළ කරන ලදී.

92 ලෙනින් මෙයින් අදහස් කරන්නේ තුන්වැනි පරිච්ඡේදයේ ආ. ඡේදයෙහි උපුටා දක්වන ''රබොචය මිස්ල්'' සඟරාවේ වෙනම

අතිරේකයක (1899 සැප්තැම්බර්) මුද්‍රණය කරන ලද එර්. එම්ගේ "අපගේ සත්‍ය ස්වභාවය" නැමැති ලිපිය පිළිබඳ විද්‍යාත්මක විමර්ශණය ගැනය. (මෙම කෘතියේ 87 පිටු බලන්න)

93 "යුෂ්නි රබෝචි" ("දකුණු පලාතේ කම්කරුවා") — 1900 ජනවාරි මාසයේ සිට 1903 අප්‍රේල් මාසය දක්වා "යුෂ්නි රබෝචි" නම් සංවිධානය විසින් නීතිවිරෝධී ලෙස පළ කරන ලද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පුවත් පතකි. කලාප 12 ක් පළ විය. ප්‍රධාන වශයෙන් රුසියාවේ දකුණු පලාත්වල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන අතර මෙම පුවත්පත බෙදා හරින ලදී.

94 ලෙනින් මෙහි අදහස් කරන්නේ "රබෝචය මිසල්" කර්තෘ මඬුල්ල විසින් "රුසියානු කම්කරු පංතියේ තත්වය පිළිබඳ ප්‍රශ්න" යන හිසින් පළ කරන ලද පත්‍රිකාව (1898) හා "රුසියානු කම්කරු පංතියේ තත්වය පිළිබඳ තොරතුරු රැස්කිරීම සඳහා ප්‍රශ්න" (1899) නැමැති පොත් පිංච පිළිබඳවය. කම්කරුවන්ගේ ශ්‍රම තත්වය හා ජීවන තත්වය පිළිබඳ ප්‍රශ්න 17 ක් පත්‍රිකාවේද, ප්‍රශ්න 158 ක් පොත් පිංචේද පළ විය.

95 1885 දී මොස්කව්, වලදිමිර්, ත්වෙර් හා වෙනත් ගුබේර්නිවල නිෂ්පාදන මධ්‍යස්ථානයන්හි බොහෝ පේශකර්මාන්ත ව්‍යවසායන් වල වැඩ වර්ජන පැතිර ගියේය. 1885 ජනවාරි මස සිදුවූ නිකොල්ස්කය සාව්ව මරෝසව් කර්මාන්තායතනයේ වැඩ වර්ජනය (මරෝසව් වැඩ වර්ජනය) ඉන් වඩාත් ප්‍රසිද්ධියක් ඉසිලීය. කම්කරුවන්ගේ මූලික ඉල්ලීම් වූයේ දඩ ගෙවීම් අඩු කිරීම හා වැටුප්, ශ්‍රම තත්වයන් උසස් කිරීම අදියය. පුරෝගාමී කම්කරුවෝ වැඩ වර්ජනය මෙහෙය වූහ. කම්කරුවන් 8 දහසක් පමණ සහභාගි වූ මරෝසව් වැඩ වර්ජනය හමුදා ආධාරයෙන් මැඩ පවත්වන ලදී; වැඩ වර්ජනයට සහභාගි වූ කම්කරුවන් 33 දෙනෙක් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අතර කම්කරුවන් 600 ක් රැකියාවෙන් නෙරපන ලදී. 1885—1886 වැඩ වර්ජනයේ බලපෑම නිසා 1886 ජුනි මස 3(15) දින 'දඩ පනත' ප්‍රකාශ කිරීමට සාර් රජයට සිදුවිය.

96 අව්ගී ඉස්තාලය — ග්‍රීක් ජාතික වීරයෙකු වන හර්කියුලස් විසින් එක දිනකදී සුද්ධ පවිත්‍ර කරන ලද ග්‍රීක දේව පුරාණයේ අව්ගී රජතුමාගේ අශ්ව ඉස්තාලය.

97 මෙම සටහන ලෙනින් දෙන ලද්දේ රහස් අරමුණක් ඇතිවය. මෙහි සඳහන් කරුණු සත්‍යලෙසම ඒවා සිදුවූ ආකාරයටම දක්වා ඇත.

98 "රුසියානු විප්ලවකාරී-ප්‍රජාතන්ත්‍රවාදයේ විදේශගත ලීගය" ලෙනින්ගේ පුරෝගාමීත්වයෙන් 1901 දී ආරම්භ කරන ලදී. "ඉස්ක්‍රා" සංවිධානයේ විදේශගත අංශය හා "සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා" විප්ලවවාදී සංවිධානය ("ශ්‍රම විමුක්ති කණ්ඩායම" ඇතුළු) මෙම ලීගයට ඇතුලත් විය. ලීගයේ කර්තව්‍ය වූයේ විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ටිය පතුරුවා හැරීම හා සටන්කාමී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයක් පිහිටුවීමට ආධාරෝපකාර වීම ය. ලීගය "ඉස්ක්‍රා" සංවිධානයේ විදේශගත නියෝජිතයාද විය. විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ "ඉස්ක්‍රා" අනුගාමිකයන් ඒකරාශී කළ එය "ඉස්ක්‍රා" වට ආර්ථික වශයෙන් ද ආධාර කළ අතර, පත්‍රය රුසියාවට ගෙනයාම සංවිධානය කිරීම හා ජනප්‍රිය මාක්ස්වාදී සාහිත්‍යය පළ කිරීමද කළේය. එය බුලටින් හා පොත් කීපයක්ද පළ කළේය. ලීගය එකම විදේශගත පාක්ෂික සංවිධානය බවට පිළිගත් රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවැනි සම්මේලනය රු.ස. ප්‍ර. ක. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නායකත්වය හා පාලනය යටතේ වැඩ කිරීමටද එයට නියම කළාය.

රු.ස.ප්‍ර.ක. පක්ෂයේ දෙවැනි සම්මේලනයට පසු "විදේශගත ලීගය" තුළ බලය ශක්තිමත් කරගත් මෙන්ෂෙවික්වාදීහු ලෙනින්ට විරුද්ධවද බොල්ෂෙවික්වරුන්ට විරුද්ධවද සටන් මෙහෙයවූහ. 1903 ඔක්තෝබර් මස පැවත්වූ ලීගයේ දෙවැනි සම්මේලනයේදී ඔවුහු බොල්ෂෙවික්වරුන්ට නිග්‍රහ කරමින් කතා කළෝය. අනතුරුව ලෙනින් හා ඔහුගේ අනුගාමිකයෝ සම්මේලනයෙන් ඉවත්ව ගියහ. රු. ස. ප්‍ර. ක පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී සම්මත කරගත් පක්ෂයේ ව්‍යවස්ථාවට පටහැනිව ලීගයේ අළුත්ම ව්‍යවස්ථාවක් මෙන්ෂෙවික්වරු සම්මත කරගත්හ. එතැන් සිට මෙන්ෂෙවික්වාදයේ බල කොටුව බවට පත්වූ එය 1905 දක්වා පැවැත්තේය.

99 "ලිස්තොක් 'රබෝචිව දියල' " ("රබෝචිය දියල" පත්‍රිකාව) — "රබෝචිය දියල" සඟරාවේ අතිරේකයක් ලෙස කලින් කල පළවූ මෙය 1900 ජුනි මාසයේ සිට 1901 ජුනි දක්වා ජිනීවාහිදී මුද්‍රණය කෙරිණි. එළිදැක්කේ කලාප 8 ක් පමණකි.

100 ලෙනින් මෙහි අදහස් කරන්නේ කාල් මාක්ස්ගේ කෘතීන්වල එන කොටසක් වන "ලුයී බොනපාට්ගේ බ්‍රියුමර් දහ අටවැන්න": ..."සියළුම ශ්‍රේෂ්ඨ ජගත්-ඓතිහාසික සිද්ධීන් හා පුද්ගලයියෝ දෙවරක් ජීවය ලබති" යයි හේගෙල් සඳහන් කරයි. එහෙත් ඔහු මෙසේ කීමට අමතක කළේය: "පළමුවැනි වතාවට දුඃ ඛදයක ලෙසද දෙවැනි වතාවට විහිළුවක් ලෙසද වේ." (කාල් මාක්ස්, ෆ්‍රෙඩරික් එංගල්ස් වෙළුම් දෙකකින් යුත් "තෝරාගත් කෘතීන්," පළමුවැනි වෙළුම, 1955, පිටු 212).

101 1901 නොවැම්බර් — දෙසැම්බර් මාසවලදී රුසියාව පුරාම ශිෂ්‍ය පෙළපාලි පැතිර ගියේය. මෙයට කම්කරුවන්ගේ සහයෝගයද ලැබිණි.

102 'යනිචාර්' — දහහතරවැනි ශතවර්ශයේ පිහිටුවන ලද තුර්කි සුල්තාන්වරයාගේ පාබල හමුදව මෙනමින් හැඳින්විණි. මෙම හමුදව සුල්තාන් පාලන යන්ත්‍රයේ පොලිසිය ලෙසද ක්‍රියා කළේය. යනිචාර්වරු කෲර පාලකයෝ වූහ. ලෙනින් සාර්වාදී පොලිස් හමුදව යනිචාර්වරුන්ට සම කළේය.

103 රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ පළමුවැනි සම්මේලනය 1898 මාර්තු මස 1—3 (13—15) පවත්වන ලදී. සංවිධාන හයකින් නියෝජිතයෝ නවදෙනෙක් සම්මේලනයට සහභාගි වූහ. පක්ෂයේ මධ්‍යම කාරක සභාව තෝරා පත් කළ සම්මේලනය එහි "ප්‍රකාශනයද" ප්‍රසිද්ධ කළාය. සම්මේලනය අවසානයේදී මධ්‍යම කාරක සභාවේ නියෝජිතයන් සිරභාරයට ගන්නා ලදී. එම නිසා ප්‍රාදේශීය සංවිධාන එක් පක්ෂයකට ඒකරාශී වීම ප්‍රායෝගික ලෙස සිදු නොවීය.

104 ජාත්‍යන්තර සමාජවාදී බියුරෝව (ජාසබි) සියළුම රටවල සමාජවාදී පක්ෂවල නියෝජිතයින්ගෙන් සමස්විත වූ, දෙවැනි ජාත්‍යන්තරයේ ස්ථාවර පාලක මණ්ඩලය ය. ජාසබි හි රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නියෝජිතයින් ලෙස ගී. ප්ලෙහානව් හා බ. ක්‍රිචෙව්ස්කි තේරී පත්වූහ. 1905 සිට රු. ස. ප්‍ර. ක. පක්ෂයේ නියෝජිතයා ලෙස වි. අයි. ලෙනින් පත්විය. 1914 දී ජාසබි විසුරුවා හරින ලදී.

105 " 'සමාජ–ප්‍රජාතන්ත්‍රවාදියා' විප්ලවවාදී සංවිධානය" විදේශගත "රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ" දෙවැනි සම්මේලනයේදී,එය භේද වීමෙන් පසු"ශ්‍රම විමුක්තිය"කණ්ඩායමේ සාමාජිකයින් හා ඔවුන්ගේ අනුගාමිකයින් විසින් 1900 මැයි මස පිහිටුවා ගන්නා ලදී. මාක්ස්වාදයෙන් පිට පැනීමට ගත් සියළුම ආකාරයේ අවස්ථාවාදී උත්සාහයන්ට විරුද්ධව "සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා," සංවිධානය සටන් කළේය. මෙම සංවිධානය "කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය" සළ කළ අතර ප්ලෙහානව්ගේ හා කවුට්ස්කිගේ පොත් කීපයක්ද ප්‍රසිද්ධ කළේය. 1901 ඔක්තෝබර් මාසයේදී, ලෙනින්ගේ පුරෝගාමීත්වය ඇතිව "ඉස්ක්‍රා" සංවිධානයේ විදේශගත අංශය සමග එකතුවී, එය "රුසියානු විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය" පිහිටුවා ගත්තේය.

106 හතරවැනි සටහන බලන්න.

107 මෙහි ලෙනින් අදහස් කරන්නේ විදේශගත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම වන "බර්බා" (අරගල) ය. 1900 දී පැරිස්හි බිහිවූ මෙම කණ්ඩායමට 1901 දී 'අරගල කණ්ඩායම' යන හැඳින්වීම ලැබිණි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ විප්ලවවාදී හා අවස්ථාවාදී ප්‍රවනතාවයන් බේරුම් කිරීමට උත්සාහ ගත් 'අරගල' කණ්ඩායම, "ඉස්ක්‍රා" හා "සර්යා" ප්‍රකාශන අංශය, 'සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා' සංවිධානය, 'බුන්ඩ්' හා 'රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමය' ආදී සංවිධානවල නියෝජිතයින්ගේ ජිනීවා සම්මේලනයේ සැසිවාරය (1901 ජූනි) තුළ උද්යෝගීමත්ව කටයුතු කළ අතර "බේරුම් කිරීමේ" සම්මේලනයටද (1901 ඔක්තෝබර්) සහභාගි විය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය හා උපක්‍රම ඉවත දැමීම, අසංවිධානාත්මක ක්‍රියාකාරීත්වය හා රුසියාවේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් සමග සම්බන්ධකම් නොපැවැත්වීම නිසා රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවැනි සම්මේලනයට සහභාගිවීමට අරගල කණ්ඩායමට ඉඩ නොදෙන ලදී. දෙවැනි සම්මේලනයේ තීරණය පරිදි 'අරගල' කණ්ඩායම විසුරුවා හැරිණි.

108 1902 මාර්තු මස 10 වැනි දින පළවූ "ඉස්ක්‍රා" 18 වැනි කලාපයේ "පක්ෂයෙන්" නම් කොටසෙහි, "Vorwärts" සංස්කරණයකින් යුතුව "සර්යා තර්ක" නමින් ගුණදෙස් විවේචනයක් පළ විය. එම තර්ක ගැන "ඉස්ක්‍රා" හා "සර්යා" ප්‍රකාශකයින්ගේ අදහස් එම ගුණදෙස් විවේචනයෙහි අඩංගු විය.

නාමාවලිය

අක්සෙල්රොද්, පාවෙල් බරිසවිච් (1850—1928) — 1870 සිට විප්ලවවාදී ව්‍යාපාරයට සහභාගි වූවෙකි. 1883 දී ‘‘ශ්‍රම විමුක්තිය’’ කණ්ඩායම පිහිටුවීමට සහභාගි විය. 1900 සිට ‘ඉස්ක්‍රා’’ හා ‘‘සර්යා’’ පුවත් පත්වල කර්තෘ මණ්ඩලයේ සේවය කළේය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයට පසු මෙන්ෂෙවිකයෙක් බවට පත්විය. — 36,59—60,83,96,114 වැනි පිටු.

අලෙක්සේයිව්, පියෝතර් අලෙක්සේයිවිච් (1849—1891)—1870 ගණන්වල සිට රුසියානු විප්ලවවාදියෙකි. වෘත්තියෙන් පේශකාර්මික කම්කරුවෙකි. — 130 වැනි පිටුව.

අවුවර (Auer) ඉග්නට්ස් (1846—1907) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සම්භාවනීය නායකයෙකි. — 38වැනි පිටුව.

ඉවාන්ෂින්, ව්ලදිමීර් පාව්ලවිච් (ව්. ඉ.) (1869—1904) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියකි, ‘ආර්ථිකවාදයේ’ එක් නායකයෙකි. —48, 58, 59, 60, 215 වැනි පිටු.

ඉලවායිස්කි, දිමිත්රි ඉවානවිච් (1832—1920) — රුසියානු ඉතිහාසඥයෙක් හා ප්‍රකාශකයෙකි. පූර්ව විප්ලවීය රුසියාවේ ප්‍රාථමික හා ද්විතිය පාඨශාලාවල භාවිතා කළ ඉතිහාස පාඩම් පොත්වල කර්තෘවරයාය. සාර් රජවරු හා කර්නල්වරු පිළිබඳ ඉතිහාස එම පොත්වල අඩංගු විය.—22 වැනි පිටුව.

එංගල්ස් (Engels) ප්‍රෙඩ්රික් (1820—1895) විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ එක් මූලාරම්භකයෙකි. ජාත්‍යන්තර නිර්ධන පංතික ව්‍යාපාරයේ නායකයෙකු හා ගුරුවරයෙකු වන මොහු කාල් මාක්ස්ගේ මිතුරා හා සගයාය.—22,34–40,43,71 වැනි පිටු.

එර්. එම්. — ‘‘රාබෝචය මිස්ල්’’ (1899 සැප්තැම්බර්) ‘‘අතිරේකයේ’’ පළ වූ ‘‘අපගේ නියම ස්වභාවය’’ නැමති ලිපියේ කර්තෘවරයාය. මෙම ලිපියෙහි ‘ආර්ථිකවාදීන්ගේ’ අවස්ථාවාදී දෘෂ්ටිය විවෘත ලෙසම පෙන්නුම් කරන ලදී.—63, 81, 87, 133, 215, 216 වැනි පිටු.

ඕසිරව් ඉවාන් හරිස්තපෝරවිච් (1862—1942)—රුසියානු ධනපති ආර්ථික විද්‍යාඥයෙකි. මොස්කව් හා පීටර්ස්බර්ග් විශ්ව වද්‍යාලවල මාහාචාර්ය වරයෙකි.—139,140,141 වැනි පිටු.

ඕවන් (Owen) රෝබට් (1771—1858)—ශ්‍රේෂ්ඨ ඉංග්‍රීසි මනෝරාජ්‍යවාදී-සමාජවාදියෙකි. — 38 වැනි පිටු.

කරේයිව්, නිකලායි ඉවානවිච් (1890—1931)—රුසියානු ලිබරල්-ධනපති ඉතිහාසඥයෙක් හා ප්‍රකාශකයෙකි. සමාජ විද්‍යාවේ විෂයීගත අංශයේ එක් නියෝජිතයෙකි.—66 වැනි පිටුව.

කත්කොව්, මිහයිල් නිකිපරවිච් (1818—1887)—රුසියානු ප්‍රතිගාමී ප්‍රකාශකයෙකි.—111 වැනි පිටුව.

කෞට්ස්කි (Kautsky) කාල් (1894—1938)—ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ එක් නායකයෙකි. මොහු ආරම්භයේදී මාක්ස්වාදියෙකු වුවද අනතුරුව මාක්ස්වාදී ද්‍රෝහියෙකු බවට පත්විය. කම්කරු ව්‍යාපාරයේ අවස්ථාවාදී ප්‍රවනතාවයේ — මධ්‍යවාදයේ එක් න්‍යායාචාර්ය වරයෙකි. —52–53, 85, 86, 171 වැනි පිටු.

ක්‍රිචේව්ස්කි, බරිස් නවුමවිච් (1866—1919)—රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකි, ප්‍රකාශකයෙකි, ‘‘රබෝචිය දියල’’ සඟරාවේ එක් සංස්කාරක වරයෙකි.—20–23, 62, 66, 82, 102, 137,163, 178, 184, 196, 204, 215, 216, 221, 222, 224, 226 වැනි පිටු.

කුස්කෝවා, යෙකතිරිනා දිමිත්‍රියව්නා (1869—1959)—රුසියානු සමාජ සේවිකාවක හා ප්‍රකාශක වරියකි. බර්න්ෂ්ටයින්වාදී අධ්‍යාත්මයන් ඇතිව කුස්කෝවා විසින් ලියනලද, “Credo” ලේඛනය ආර්ථිකවාදයේ අවස්ථාවාදී හරය වඩාත් විවෘත්තව පෙන්නුම් කළේය. — 30 වැනි පිටුව.

ගෙඩ් (Guesde) ෂූල් (1845 — 1922) — ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ සංවිධායකයින්ගෙන් සහ නායකයින්ගෙන් අයෙකි.—85 වැනි පිටුව.

ගෙර්ට්සන්, අලෙක්සාන්දර් ඉවානවිච් (1812—1870) — රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රිකයෙකි, භෞතිකවාදී දර්ශනවාදියෙකි. ප්‍රකාශකයෙක් සහ ලේඛකයෙකි.—37 වැනි පිටුව.

චෙර්නිෂේව්ස්කි නිකලායි ගව්රීලවිච් (1828—1889)—රුසියාවේ ශ්‍රේෂ්ඨ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රිකයෙකු වූ මොහු විද්‍යාඥයෙකි, ලේඛකයෙකි, සාහිත්‍ය විචාරකයෙකි.—37 වැනි පිටුව.

ඩේවිඩ් (David) එඩ්වඩ් (1863—1930) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ දක්ෂිණාංශික පිළේ නායකයෙකි. වෘත්තියෙන් ආර්ථික විද්‍යාඥයෙකි.—24 වැනි පිටුව.

ඩූරිං (Dühring) යෙව්ගේනි (1833—1921) — ජර්මන් ජාතික සාරසංග්‍රහවාදී දර්ශනවාදියෙක් හා අවිශේෂ ආර්ථික විද්‍යාඥයෙකි, දර්ශනවාදය තුළ විඥානවාදය, දියාරු භෞතිකවාදය සහ ප්‍රත්‍යක්ෂවාදය සම්බන්ධ කළේය; අධ්‍යාත්මවාදියෙකි.—22වැනි පිටුව.

ත්කචියෝව්, පියෝතර් නිකීතිච් (1844—1885) — විප්ලවවාදී නරෝද්නික්වාදයේ එක් න්‍යායාචාර්ය වරයෙකි, ප්‍රකාශකයෙකි, සාහිත්‍ය විචාරකයෙකි.—206 වැනි පිටුව.

නදියෂ්දින් එල්. (සෙලෙන්ස්කි යෙව්ගේනි ඕසිපවිච් (1874—1905) — 1898 සිට නරෝද්නික්වාදියෙකු ලෙස තම දේශපාලන ජීවිතය ආරම්භ කළ සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකි. 1900 දී ස්විට්සර්ලන්තයට විදේශගත විය. තම ලිපි මගින් ඔහු ආර්ථිකවාදීන්ට ආධාර දුන් අතර ත්‍රස්තවාදය දේශනා කළේය. ලෙනින්වාදී ‘‘ඉස්ක්‍රා’’ පුවත්පතට විරුද්ධව ක්‍රියා කළේය.—185, 187, 188, 192, 194, 195,

197, 198, 199, 200, 206, 207, 208, 209, 210 වැනි පිටු.

නයිට් (Knight) රොබට් — ඉංග්‍රීසි වෘත්තීය සමිති ව්‍යාපාරයේ ප්‍රමුඛ නායකයෙකි.—101,102 වැනි පිටු.

නර්ට්සිස් තුපරිලව් — මාර්තව් එල්. බලන්න.

පාර්වුස් (හෙල්පන්ද් අලෙක්සාන්දර් ලාසරවිච්) (1869—1924)—රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. රු. ස. ප්‍ර ක පක්ෂයේ දෙවැනි සම්මේලනයට පසු මෙන්ෂෙවිකයෙකු බවට පත්විය.—223 වැනි පිටුව.

පීසරියව්, දිමිත්‍රි ඉවානවිච් (1840—1868)—රුසියානු ප්‍රජාතන්ත්‍රිකයෙකි. විප්ලවවාදියෙකි. සාහිත්‍ය විචරකයෙක් හා ප්‍රකාශකයෙකි. භෞතිකවාදී දර්ශනිකයෙකි.--205 වැනි පිටුව.

ප්ලෙහානව්,ගියෝර්ගි වලෙන්තිනවිච් (බෙල්තව් එන්.) (1856—1918)—රුසියානු හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකු වන මොහු රුසියාවේ මාක්ස්වාදය ප්‍රචාරය කළ පුරෝගාමියාය. 1883 දී ජිනීවාහිදී පළමුවැනි මාක්ස්වාදී සංවිධානය වන ශ්‍රම විමුක්තිය' කණ්ඩායම පිහිටුවීය. ලෙනින් සමග ''ඉස්ක්‍රා'' හා ''සර්යා'' පුවත් පත්වල කර්තෘ මණ්ඩලයේ සේවය කළේය. ඉක්බිතිව මෙන්ෂෙවිකයෙක් බවට පත්විය.—20,59,83-86,103,128, 130,131,169,204 වැනි පිටු.

පොත්රෙසව්, අලෙක්සාන්දර් නිකලායිවිච් (ස්තරවේර්) (1869—1934)—1890 ගණන්වලදී මාක්ස්වාදීන් සමග එකතුවී ''ඉස්ක්‍රා'' හා ''සර්යා'' පුවත්පත් ආරම්භ කර පළ කිරීමට සහභාගී විය. අනතුරුව මෙන්ෂෙවික්වාදයේ නායකයෙක් බවට පත් විය.—25 වැනි පිටුව.

ප්‍රකපෝවිච්, සෙර්ගේයි නිකලායිවිච් (NN) (1871—1955) — රුසියානු ධනපති ආර්ථික විද්‍යාඥයෙකි, ප්‍රකාශකයෙකි, ''ආර්ථිකවාදයේ'' ප්‍රධාන නියෝජිතයෙකි.—29, 30, 55, 81,134,215 වැනි පිටු.

ප්රුධෝන් (Proudhon) පියර් ෂොසේප් (1809—1865)—ප්‍රංශ ජාතික ප්‍රකාශකයෙකි, ආර්ථික විද්‍යාඥයෙක් හා සමාජවිද්‍යාඥයෙකි, සුළු ධනපති න්‍යායාචාර්ය වරයෙකි, ආරාජිකවාදයේ එක් මූලාරම්භකයෙකි. 53 වැනි පිටුව.

පූරියේ (Fourier) ෂාර්ල් (1772—1837)—ශ්‍රේෂ්ඨ ප්‍රංශ ජාතික මනෝරාජ්‍යවාදී සමාජවාදියෙකි.—38 වැනි පිටුව.

බ. ක්‍රි. — ක්‍රිචේව්ස්කි බී. එන්. බලන්න.

බී. — සාවින්කව්, බී. වී. බලන්න.

බකූනින්, මිහයිල් අලෙක්සාන්ද්‍රවිච් (1814—1876) — රුසියානු විප්ලවවාදීයෙකි,ප්‍රකාශකයෙකි.1848—1849 අවුරුදුවල ජර්මනියේ සිදුවූ විප්ලවයට සහභාගි විය; නරෝද්නික්වාදයේ සහ ආරාජිකවාදයේ න්‍යායාචාර්යවරයෙකි. පළමුවැනි ජාත්‍යන්තරයට මාක්ස්වාදයේ පරම හතුරෙකු ලෙස සහභාගි විය. 1872 හාග් සම්මේලනයේදී කඩාකප්පල්කාරී ක්‍රියා නිසා ජාත්‍යන්තරයෙන් නෙරපන ලදී. — 38 වැනි පිටුව,

බාල්හෝන් (Ballhorn) ඉඹහන් — XVI ශතවර්ෂයේ විසූ ජරමන් ජාතික පොත් ප්‍රකාශකයෙකි. — 86 වැනි පිටුව.

බේබෙල් (Bebel) අව්ගුස්ට් (1840—1913) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ සම්භාවනීය නායකයෙකි. — 24,85,147,161,204 වැනි පිටු.

බෙලීන්ස්කි විසරිඹන් ග්‍රිගෝරියවිච් (1811—1848) — රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රිකයෙකි, සහිත්‍ය විචාරකයෙක් සහ ප්‍රකාශකයෙකි, දර්ශනවාදී-භෞතිකවාදියෙකි. — 37 වැනි පිටුව.

බෙල්තව් එන්. — ප්ලෙහානව් ගි. ව. බලන්න.

බෙර්දියායිව්, නිකලායි අලෙක්සාන්ද්‍රවිච් (1874—1948). — රුසියානු විඥනවාදී-දර්ශනවාදියෙක් සහ භාවයෝගියෙකි. 1890 වැනි දශකයේ අවසානයේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට සහයෝගය දැක්වූ නමුත්, ඉක්මනින්ම මාක්ස්ගේ උගැන්වීම් සංශෝධනය ආරම්භ කර පසුව මාක්ස්වාදයේ විවෘත හතුරෙක් බවට පත්විය. —215 වැනි පිටුව.

බර්න්ෂ්ටයින් (Bernstein) එඩ්වඩ් (1850—1932)—ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ අන්ත අවස්ථාවාදී පිළේ නායකයාය. සංශෝධනවාදයේ හා ප්‍රතිසංස්කරණ වාදයේ න්‍යායාචාර්යවරයාය. — 16,17,23,24,29,32,64,66,79,80, 138 වැනි පිටු.

බ්‍රෙන්ටානො (Brentano) ලූයෝ. (1844—1931) — ජර්මන් ජාතික ධනවාදී ආර්ථික විද්‍යාඥයෙකි, ‘රාජ්‍ය සමාජවාදය’ නමින් හඳුන්වන ලද්ද පිළිගත්තෙකි. ප්‍රතිසංස්කරණයේ මාර්ගයෙන් සහ ධනපතින්ද කම්කරුවන්ද සමගි කරවීමේ මාර්ගයෙන් ධනවාදී රාමුව තුළ සමාජමය සමානාත්මතාවය තහවුරු කළ හැකියැයි මොහු කියා සිටියේය. බ්‍රෙන්ටානො සහ ඔහුගේ අනුගාමිකයෝ මාක්ස්වාදී වාග්ශෛලියට මුවා වෙමින් ධනවාදයේ උවමනාවන් සඳහා කම්කරු ව්‍යාපාරය යෙදවීමට උත්සාහ ගත්හ. — 216 වැනි පිටුව.

බුල්ගාකව්, සෙර්ගේයි නිකලායිවිච් (1871—1944) — රුසියානු ධනවාදී ආර්ථික විද්‍යාඥයෙක් හා විඥානවාදී-දර්ශනිකයෙකි. —33, 215 වැනි පිටු.

මාක්ස් (Marx) කාල් (1818—1883) — විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ මූලාරම්භකයාය, ජාත්‍යන්තර නිර්ධන පංතියේ නායකයා හා ගුරුවරයාය.—9, 17, 36, 43, 205 වැනි පිටු.

මාර්තව්, ලෙව් (ට්සෙදෙර්බාවුම් යූලි ඕසිපවිච්, නර්ට්සිස් තුපරිලව්) (1873—1923) — මෙන්ෂෙවික් නායකයෙකි. දහනව වැනි ශත වර්ෂයේ අවසාන දශකයේ සිට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ නියැලුනේය. 1895 දී පීටර්ස්බර්ග් “කම්කරු විමුක්ති අරගල සංගමය” සංවිධානය කිරීමට සහභාගි විය. “ඉස්ක්‍රා” පුවත් පත පිළියෙළ කිරීමට සහ එය පළ කිරීමට සහභාගි වූ මොහු එහි කර්තෘ මණ්ඩලයේ සාමාජිකයෙකුද විය. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවැනි සම්මේලනයට පසු (1903) මෙන්ෂෙවික් නායකයෙක් බවට පත් විය.—67, 81 වැනි පිටු.

මර්තීනව් අ. (පීකෙර් අලෙක්සාන්දර් සමෝයිලවිච්) (1865—1935)—‘ආර්ථිකවාදයේ’ එක් නායකයෙකි, මෙන්ෂෙවික්වාදයේ ප්‍රමුඛ නායකයෙකි. — 62, 70–87, 88, 90, 91, 96, 99, 101, 102, 106–108, 113, 114, 133, 137, 185, 196, 197, 204, 212 215, 216, 223, 226 වැනි පිටු.

මේරින්ග් (Mehring) ප්‍රාන්ස් (1846—1919)—ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වාමාංශික පිළේ එක් නායකයෙක් හා න්‍යායාචාර්ය වරයෙකි.—64 වැනි පිටුව.

මෙෂේර්ස්කි ව්ලදීමීර් පෙත්රෝවිච් (1839—1914)—රුසියානු ප්‍රතිගාමී ප්‍රකාශකයෙකි.—111 වැනි පිටුව.

මිලෙරාන් (Millerand) ඇලෙක්සාන්දර් එතියෙන් (1899—1943) — ප්‍රංශ ජාතික දේශපාලනඥයෙකි. පසුගියශත වර්ෂයේ අවසාන දශකයේදී සමාජවාදීන්ට හේත්තු වූ මිලෙරාන් ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ අවස්ථාවාදී ව්‍යාපාරය මෙහෙය වීය. 1899 දී ප්‍රංශයේ ප්‍රතිගාමී ධනපති රජයට ඇතුළ් වූ මොහු ජෙනරාල් හලිපේ සමග පැරිස් කොමියුනය විනාශ කිරීමට සහභාගි විය.—16, 17 වැනි පිටු.

මිහයිලෝව්ස්කි නිකලායි කන්ස්තන්තීනවිච් (1846—1906)—ලිබරල් නරෝද්නික්වාදයේ ප්‍රමුඛ නායකයෙකි, ප්‍රකාශකයෙකි, සාහිත්‍ය විචාරකයෙකු හා ප්‍රත්‍යක්ෂවාදී දර්ශනිකයෙකි. — 66 වැනි පිටුව.

මොස්ට් (Most) ඉඔහන් ඉඔසිප් (1813—1849)—ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකි, පසුව ආරාජිකවාදියෙකි.—64, 148 වැනි පිටු.

මිෂ්කින් ඉපලීත් නිකීතිච් (1848—1885)—නරෝද්නික්වාදී ව්‍යපාරයේ ප්‍රමුඛ නායාකයෙකි.—130,169 වැනි පිටුව.

මුල්බර්ගර් (Mülberger) ආර්ටූර් (1847—1907) — ජර්මන් ජාතික ධනපති ප්‍රකාශකයෙකි, ප්රූඩොන් අනුගාමිකයෙකි. — 22 වැනි පිටුව.

රිටින්ග්හවුසෙන් (Rittinghausen) මෝරිස් (1814—1890)—ජර්මන් ජාතික ප්‍රජාතන්ත්‍රිකයෙකි.—136 වැනි පිටුව.

ලව්රෝව් පියෝතර් ලව්රෝවිච් (1823—1900)—නරෝද්නික් වාදයේ සම්භාවනීය චින්තකයෙකි, සමාජ විද්‍යාවේ විෂයීගත අංශයේ එක් සාමාජිකයෙකි.—164 වැනි පිටුව.

ලසාල් (Lassalle) පෙර්ඩිනන්ඩ් (1825—1864) — ජර්මන් ජාතික සුළු ධනපති ප්‍රකාශකයෙක් සහ අධිනීතිඥවරයෙකි. සමස්ත

ජර්මානු කම්කරු ව්‍යාපාරයේ එක් මූලාරම්භකයෙකි; ප්‍රුසියන් ආධිපත්‍යය යටතේ ජර්මනිය එක්සත් කිරීමේ ප්‍රතිපත්තියට 'ඉහළින්' අනුග්‍රහ දක්විය; ජර්මන් කම්කරු ව්‍යාපාරය තුළ අවස්ථාවාදී ප්‍රවනතාවයට මුල් ගල තැබීය.—9, 22, 55 වැනි පිටු.

ලපාර්ග් (Lafargue) පෝල් (1842—1911)—ගෙඩ් සමග ශංප්‍රයේ කම්කරු ව්‍යාපාරය ආරම්භ කිරීමට සහභාගි වූ ලපාර්ග් ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ පළමුවැනි අනුගාමිකයින්ගෙන් එකෙකු වන මොහු මාක්ස්ගේ හා එංගල්ස්ගේ මිතුරෙකු හා සගයෙකුද වේ.—85 වැනි පිටුව.

ලීබ්ක්නෙහ්ට් (Liebknecht) විල්හෙල්ම් (1826—1900)—ජර්මානු හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නයකයෙකුවූ මොහු මාක්ස්ගේ හා එංගල්ස්ගේ මිතුරකු හා සහායකයකු වූ අතර ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ එක් මූලාරම්භකයෙකු හා නායකයෙකුද විය.—64,101,102,147 වැනි පිටු.

ව. ව. — වරන්ත්සොව් ව. පා. බලන්න.

වි. ස. — සසුලිච් වි. ඉ. බලන්න.

ව්. ඉ. — ඉවාන්ෂින් ව්. ප. බලන්න.

වාල්ටයිහ් (Vahlteich) කාල් යූලිවුස් (1893—1915)—ජර්මන් ජාතික දක්ෂිනාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. — 22 වැනි පිටුව.

වනේයෙව් අනතෝලි අලෙක්සාන්ද්‍රවිච් (1872—1899) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. 1895 දී පීටර්ස්බර්ග්හි "කම්කරු පංති විමුක්ති අරගල සංගමය" පිහිටුවීමේදී උද්යෝගිමත්ව එයට සහභාගි විය. කම්කරු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කවවල උද්ඝෝෂකයෙකි. 1897 දී සයිබීරියාවට පටුවහල් කරන ලදී. — 44 වැනි පිටුව.

වසීලියව් න. ව. (උපත 1855) — පොලිස් කර්නල්වරයෙකි. සුබාතව්වාදී 'පොලිස් සමාජවාදයේ' ආධාර කරුවෙකි. — 139 වැනි පිටුව.

වෙබ් (Webb) බියට්‍රිස් (1858—1943) සහ සිඩ්නි (1899—1947) සුප්‍රසිද්ධ ඉංග්‍රීසි ජාතික සමාජ සේවකයන් දෙදෙනෙකි, ප්‍රතිසංස්කරණවාදීන් දෙදෙනෙකි. මොවුහු එංගලන්තයේ කම්කරු ව්‍යාපාරය පිළිබඳ පොත් ගණනාවක්ම ප්‍රසිද්ධ කළහ. —171 වැනි පිටුව.

වෙයිට්ලින්ග් (Weitling) විල්හෙල්ම් (1808—1871)—ජර්මන් කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. මනඃකල්පිත හා සමානාත්මක කොමියුනිස්ට්වාදයේ න්‍යායාචාර්ය වරුන්ගෙන් එක් අයෙකි. — 53 වැනි පිටුව.

විල්හෙල්ම් II (හොහෙන්ට්සොල්ලෙර්න්) (1859—1941)—ජර්මානු අධිරාජ්‍යවාදියා සහ ප්‍රුසියානු රජතුමාය. (1888—1918) — 121 වැනි පිටුව.

විත්තෙ සෙර්ගේයි යුලියවිච් (1849—1915)—19 වැනි ශත වර්ෂයේ අවසානයේ සහ 20 වැනි ශත වර්ෂයේ ආරම්භයේ විසූ රුසියානු ප්‍රතිගාමී රාජ්‍ය නායකයෙකි.—116 වැනි පිටුව.

වොල්ට්මන් (Woltmann) ලුඩ්විග් (1871—1907)—ජර්මානු ප්‍රතිගාමී සමාජ විද්‍යාඥයෙක් සහ මානව විද්‍යාඥයෙකි; කම්කරු ව්‍යාපාරයේ ප්‍රධානතම කර්තව්‍ය වන්නේ ආර්ථික අරගලය බව ඔහු කියා සිටියේය.—62 වැනි පිටුව.

වොර්ම්ස් අල්පොන්ස් එර්නෙස්තවිච් (1868—1937)—මොස්කව් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකි; ලිබරල් වාදියෙකි.—139 වැනි පිටුව.

වරන්ත්සොව්, වසීලි පාව්ලවිච් (1847—1918)—රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි, ප්‍රකාශකයෙකි. 1880—1890 අවුරුදුවල ලිබරල් නරෝත්නික්වාදයේ නායකයෙකි. ඔහු රුසියාවේ තුඹු ධනවාදී සංවර්ධනය පිළි නොගත්තේය.ගොවි විරෝධී සාර්වාදී ආණ්ඩුවත් සමග සමාදාන වීම දේශනා කළ ඔහු මාක්ස්වාදයට විරුද්ධව දැඩි ලෙස කටයුතු කළේය.—49, 50, 51, 62, 65 වැනි පිටු.

වෝල්මර් (Vollmar) ගෙඕර්ග් හෙන්රිහ් (1850—1922) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අවස්ථාවාදී පිළේ එක් නායකයෙකි. පත්‍ර කලාවේදියෙකි.—17 වැනි පිටුව.

ශ්වයිට්සර් (Schweitzer) ඉඔහන් බප්ටිස්ට් (1833—1875) —ජර්මන් ජාතික සමාජ සේවකයෙකි, ලේඛකයෙකි. එජ්. ලසාල්ගේ අනුගාමිකයෙකු වන මොහු වෘත්තියෙන් අධිනීතිඥයෙකි. — 64 වැනි පිටුව.

ශ්‍රාම් (Schramm) කාර්ල් අව්ගුස්ට් — ජර්මන් ජාතික ආර්ථික විද්‍යාඥයෙකි.—64 වැනි පිටුව.

ෂුල්ට්සෙ-ඩෙලිට්ෂ් (Schulze-Delitzsch) හේර්යන් (1808—1883)—ජර්මන් ජාතික මන්ද බුද්ධික ආර්ථික විද්‍යාඥයෙකි, සමාජ සේවකයෙකි. ධනපතීන්ගේ සහ කම්කරුවන්ගේ පංති උවමනාවන්ගේ එකමුතුකම ගැන දේශනා කළේය. — 55 වැනි පිටුව.

ෂෙද්‍රීන් — සල්තිකෝව්-ෂෙද්‍රීන් එම්. යෙ. බලන්න.

ෂෙලියාබව්, අන්ද්‍රෙයි ඉවානවිච් (1850—1881) — රුසියානු විප්ලවවාදියෙකි, ‘‘නරෝද්නයා වෝලිය’’ (‘මහජන පැතුම’) පක්ෂයේ සංවිධායකයා සහ නායකයා ය.—130, 169, 204 වැනි පිටු.

සසූලිච්, වියරා ඉවානව්නා (වි. ස.) (1849—1919) — රුසියානු නරෝද්නික්වාදී ව්‍යාපාරයේ සහ පසුව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සම්භාවනීය සාමාජිකාවකි. — 165 වැනි පිටුව.

සුබාතව්, සෙර්ගේයි වසීලියවිච් (1864—1917)—පොලිස් කර්නල් වරයෙකි. කම්කරුවන් විප්ලවවාදී අරගලයෙන් ඉවත්කරවීමෙ අරමුණ ඇතිව 1901—1903 අවුරුදුවලදී පොලිස් කම්කරු සංගම් සංවිධානය කළේය.—29, 55, 139, 140, 141 වැනි පිටු.

සාවින්කව්, බරිස් වික්තරවිච් (බී) (1879—1925)—එස් එර් පක්ෂයේ ප්‍රමුඛ නායකයෙකි. ත්‍රස්තවාදියෙකි. —129, 154—156, 158, 160, 167 වැනි පිටු.

සල්තිකෝව්-ෂෙද්‍රීන් මිහයිල් යෙව්ග්‍රාපවිච් (ෂෙද්‍රීන්) (1826—1889)—රුසියානු ලේඛකයෙකි, උපහාසාත්මක රචකයෙකි, විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රිකයෙකි.—160 වැනි පිටුව.

සෙන්-සිමෝන් (Saint-Simon) අන්රි ක්ලෝඩ් (1760—1825) — ශ්‍රේෂ්ඨ ප්‍රංශ ජාතික මානෝරාජ්‍යවාදී සමාජවාදියෙකි. — 38 වැනි පිටුව.

සෙරියබ්‍රියකෝව්, යෙස්පෙර් අලෙක්සාන්දරවිච් (1854—1921) — රුසියානු විප්ලවවාදියෙකි, නරෝද්නික්වරයෙකි. 1879 දී ‘‘නරෝද්නයා වෝල්ය’’ පක්ෂයට සම්බන්ධ වූ ඔහු 1883 දී විදේශ ගත විය. 1899—1902 දක්වා ලන්ඩන් හිදී ‘‘නකනූනිය’’ (‘‘පූර්වාසන්නය’’) සඟරාව පළ කළේය.—169 වැනි පිටුව.

ස්තරවේර් — පොත්‍රෙසව් අ. එන්. බලන්න.

ස්ත්‍රුවේ, පියෝතර් බෙර්න්ගාර්දවිච් (1870—1944) —රුසියානු ධනපති ආර්ථික විද්‍යාඥයෙකි, ප්‍රකාශකයෙකි. 1890 ගණන්වලදී ‘නීත්‍යානුකූල මාක්ස්වාදයේ’ ප්‍රමුඛ නායකයෙකි. — 27,55,81,209, 215 වැනි පිටු.

හාසල්මාන් (Hasselmann) විල්හෙල්ම් (උපත 1844)—ජර්මන් ජාතික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, පසුව ආරාජිකවාදියෙකු බවට පත්විය.—64, 148 වැනි පිටු.

හල්තුරින්, ස්තිපාන් නිකලායිවිච් (1856—1882)—රුසියාවේ පළමුවැනි කම්කරු විප්ලවවාදියෙකි.—130 වැනි පිටුව.

හෝහ්බර්ග් (Höchberg) කාර්ල් (1853—1885)— ජර්මන් ජාතික දක්ෂිනාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකි. පත්‍ර කලාවේදියෙකි. —64 වැත් පිටුව.

හේගල් (Hegel) ගෙඕර්ග් විල්හෙල්ම් (1770—1831)—ජර්මානු මුල් දර්ශනවාදයේ ප්‍රධාන නියෝජිතයෙකි. සාධාරන විඥානවාදියෙකි. ඔහු විඥානවාදී දයලෙක්තිකවාදය සවිස්තරාත්මක ලෙස විශ්ලේෂණයට භාජනය කළේය.—38 වැනි පිටුව.

හෙර්ට්ස් (Hertz) ෆ්‍රෙඩ්රික් ඔට්ටො (උපත 1878)—ඔස්ට්‍රියානු ජාතික ආර්ථික විද්‍යාඥයෙකි, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධනවාදියෙකි.—33 වැනි පිටුව.

හිර්ෂ් (Hirsch) මාක්ස (1832—1905) — ජර්මන් ජාතික ආර්ථික විද්‍යාඥයෙක් සහ ප්‍රකාශකයෙකි. ශ්‍රමය සහ ධනය ‘එකමුතු’ කිරීමේ දෘෂ්ටිය තම කෘතිවලින් ඉදිරිපත් කළ ඔහු ප්‍රතිසංස්කරණවාදය ආරක්ෂා කළේය. — 50 වැන් පිටුව.

මුද්‍රණයෙන් පිට වී ඇත

වි. අයි. ලෙනින්

අධිරාජ්‍යවාදය ධනවාදයේ උසස් අවධිය ය

1916 ජනවාරි — ජූනි මාසවලදී ලියන ලද මෙම කෘතියෙහි ධනවාදයේ උසස්තම එසේම අවසාන අවධිය වන අධිරාජ්‍යවාදයේ සාමාසික විශ්ලේෂණයක් අඩංගු වේ. ධනපති සමාජයේ සියළු ප්‍රතිවිරුද්ධතාවන් ගැඹුරු වන බවත්, අධිරාජ්‍යවාදය පරපෝෂිත, දිරාපත් වන, මිය යන ධනවාදය වන බවත්, එය “නිර්ධන පංතියේ සමාජ විප්ලවයේ පූර්ව අවධිය” වන බවත් අයිරාජ්‍යවාදයේ වකවානුව එළිදරව් කරන්නේ යයි ලෙනින් මෙම කෘතියෙන් පෙන්වා ඇත. අධිරාජ්‍යවාදය ගැන ලෙනින්ගේ ඉගැන්වීම් පළමුවෙන්ම එක්, වෙන්ව ගත් රටක සමාජවාදය ජයග්‍රහණය කිරීමේ හැකියාව පිළිබඳ න්‍යාය වූ සමාජවාදී විප්ලවයේ නව න්‍යායේ පදනම විය.

පොත අවසානයේ සටහන්ද ඇත.

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

වි. අයි. ලෙනින්

ප්‍රජාතන්ත්‍රික විප්ලවයේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙකක්

මේ කෘතිය 1905 ජූනි — ජූලි මාසවලදී ලියන ලදී. මාක්ස්වාදී පක්ෂයක මූලික උපක්‍රම වි. අයි. ලෙනින් විසින් සකස් කළ අතර මෙන්ෂෙවිකයින්ගේ සුළු ධනවාදී උපක්‍රමය දෘෂ්ටිමය වශයෙන් පරාජය කළේය. ධනපති ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ නිර්ධන පංතියේ ආධිපත්‍යය පිළිබඳවද, සාර්වාදය පරදවා ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් දිනාගැනීමේ ඉතාම වැදගත් මාධ්‍යය වන පොදුජන අවිගත් නැගිටීමක් පිළිබඳවද, තාවකාලික විප්ලවවාදී ආණ්ඩුවක් සහ නිර්ධන පංතියේ හා ගොවි ජනතාවගේ විප්ලවීය-ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයක් පිළිබඳවද න්‍යාය වර්ධනය කළ වි. අයි. ලෙනින් සමාජවාදී විප්ලවය පිළිබඳව නව න්‍යායද, ධනපති ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ සිට සමාජවාදී විප්ලවය දක්වා වැඩීමේ න්‍යායද නිර්මාණය කළේය.

පොත අවසානයේ සටහන්ද ඇත.

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

පාඨකයින් වෙතටයි

මෙම පොතෙහි අඩංගු කරුණු අනුවාදය හා මුද්‍රණය පිළිබඳව ඔබගේ අදහස් දන්වා එවීමෙන් ප්‍රගති ප්‍රකාශක මන්දිරයේ කෘතඥතාවය ඔබට හිමිවේ. ඔබගේ වෙනත් යෝජනා ඇතොත් අපි එය කරුණාවෙන් බාර ගනිමු.

අපේ ලිපිනය:

Progress Publishers,
21,Zubovsky Boulevard,
Moscow, USSR.

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: කළ යුත්තේ කුමක්ද?
කතෘ/පරිවර්තක: වී. අයි. ලෙනින්/ උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2011-11-06
ඩිජිටල් සංස්කරණයන්: V1:2011-11-06, V2:2019-05-30
පිටු ගණන: 279
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com